විගණකාධිපති

වාර්ෂික වාර්තාව

2021

ජාතික විගණන කාර්යාලය

අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මූල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.

3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය
නවෝත්පාදනය
නායකත්වය

ජාතික විගණන ආයතනයේ නිල ලාංඡනය

මෙම නිල ලාංඡනය සඳහා භාවිතා කළ සංකේතවලින් පහත සඳහන් අර්ථයන් පිළිබිඹු කෙරේ.

- **ලාංඡනය ඉහළින්ම දක්වා ඇති සිංහයා මගින් ශ්‍රී ලංකාව නිරූපනය කෙරේ.**
- **එහි මැද ඇති තරාදිය මගින් ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබිඹු කෙරේ.**
- **එය වටා ඇති ඔලිව් ඉති ද්විත්වය මගින් සාමය හා සෞභාග්‍යය පිළිබිඹු කෙරේ.**
- **එය වටා ඇති පලා පෙති රටාව මගින් ජාතික සංස්කෘතිය නිරූපනය කෙරේ.**

විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන රාජ්‍ය මූල්‍ය පාලනය ඵලදායිව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම හා එය පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යය වේ. එම කර්තව්‍යය ඉටු කිරීම සම්බන්ධව 2021 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර, අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ දහය යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

පළමුවන කාණ්ඩය	-	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු
දෙවන කාණ්ඩය	-	රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල හා ව්‍යවස්ථාපිත අරමුදල්
තුන්වන කාණ්ඩය	-	ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
හතරවන කාණ්ඩය	-	විදේශ ආධාර ව්‍යාපෘති
පස්වන කාණ්ඩය	-	පළාත් සභා
හයවන කාණ්ඩය	-	පළාත් පාලන ආයතන
අටවන කාණ්ඩය	-	කාර්යසාධන හා පාරසරික විගණන පැවරුම්
නවවන කාණ්ඩය	-	රාජ්‍ය සමාගම්
දහවන කාණ්ඩය	-	විශේෂ විගණන පැවරුම්
එකොළොස්වන	-	ත්‍රෛවාර්ෂික වාර්තා

විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍යය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් අපේක්ෂා කර තිබුණි. ජාතික විගණන පනත අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණත්, ජාතික විගණන කාර්යාලයේ කාර්යභාරයන් ඉටු කිරීමට අත්‍යාවශ්‍ය වූ විගණන කාර්ය මණ්ඩලයට අදාළ රාජ්‍ය විගණන සේවා ව්‍යවස්ථාව මේ වන තෙක් ස්ථාපිත කර ගැනීමට නොහැකි වී ඇත. විගණන කාර්යයන් ඉටු කර ගැනීමට එය බාධාකාරී වී ඇති අතර, කාර්ය මණ්ඩලයට උසස්වීම් ලබා ගැනීමට පැවැති අවස්ථා සීමා වි ඇත. විගණකාධිපති සභාපතිත්වය දරන ලද විගණන සේවා කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය තුළින් අහෝසිවීම තුළ විගණකාධිපතිවරයා එතෙක් බුක්තිවිඳි තම කාර්ය මණ්ඩලයේ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය විගණකාධිපතිවරයාගෙන් ඉවත් වි ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එම බලතල පැවරීම තුළ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එම බලතල විගණකාධිපතිවරයාට පැවරීමට

ඇති නීතිමය බාධාව තුළ විගණකාධිපතිවරයාගේ ස්වාධීන විගණන ක්‍රියාවලියට බාධා පැමිණ ඇත. මෙම තත්ත්වය ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී සළකා බැලීම සුදුසුයැයි මම යෝජනා කරමි.

ජාතික විගණන කාර්යාලයේ රාජ්‍ය විගණන සේවය ස්ථාපිත නොවීම නිසා කාර්යමණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වීම පිළිබඳව සලකා බැලූ අමාත්‍ය මණ්ඩලය විසින් යෝජිත සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට යෝජනා කර තිබුණු කාර්යමණ්ඩලයට අනුරූපව ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීමට ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකගත්වය මත අන්තර්ග්‍රහණය කිරීමට හා පුරප්පාඩුව පවතින තනතුරු සඳහා පත්කිරීමට හෝ උසස් කිරීම 2021 සැප්තැම්බර් 13 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එම අනුමැතිය මත අන්තර්ග්‍රහනණය කිරීමේ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කර අවසන් කර ඇතත් උසස් කිරීමේ හා පත්කිරීමේ කටයුතු මේ වන විට මාස 13 ක් ගතවී ඇතත් එම කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත.

ඉහත සඳහන් පරිදි වූ අමාත්‍ය මණ්ඩලය අපෙක්ෂා කළ පරිදි කාර්ය මණ්ඩලය, පුරප්පාඩු වූ තනතුරුවලට පත්කිරීම හා උසස් කිරීම මගින් පිරවීමට නොහැකිවීමෙන්ද, 2021 වර්ෂයේ පැවැති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලය රාජකාරියේ යෙදවීමේ දුෂ්කරතාවයද, එයට සමගාමීව රජය විසින් 2021 වර්ෂයේදී කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීමද සැලැකිල්ලට ගත් විට 2021 වර්ෂයේ විගණන කටයුතු ඉටු කිරීම බාධාකාරී විය. එම සීමා කිරීම් විගණිත ආයතනවලද පැවැතීම නිසා විගණනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවලටද මැදි වීමට සිදු විය. එම බාධකයන් අපගේ කාර්යභාරය ඉටු කිරීමට අභියෝගාත්මක වුවද, මාගේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපකිරීම හේතුවෙන් විගණන කාර්යභාරයන් නියමිත කාලසීමාවන් තුළ අවසන් කර නියමිත වාර්තා ඉලක්කගත කාල පරිච්ඡේදයන් තුළදී ඉදිරිපත් කිරීමට උපරිම වශයෙන් කටයුතු කරන ලදී. ජාතික විගණන කාර්යාලයේ වැදගත් කාර්යභාරය සැලැකිල්ලට ගැනීම මෙන්ම රාජ්‍ය අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටළු හොඳින් අවබෝධ කර ගැනීම සහතික කිරීමට හැකි වන පරිදි ජාතික විගණන කාර්යාලය ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාවට නංවා ඇත. විගණන වාර්තා කාර්යක්ෂව හා ඵලදායීව බෙදා හැරීම උදෙසා කාර්යාලයේ ක්‍රියාකාරීත්වය අඛන්ඩව වර්ධනය කිරීමට හා සමාලෝචනය කිරීමට ජාතික විගණන කාර්යාලය බැඳී සිටී. අවසානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති විගණන ස්වාධිනත්වය කාර්යාලයේ ඵලදායිත්වයේ ප්‍රධාන සාධකය ලෙස ඉතා පැහැදිලි ලෙසම හඳුනාගෙන ඇත.

ජාතික විගණන කාර්යාලයේ රාජකාරියට කැප වූ කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කිරීමට ලැබීම මා ලද ගෞරවයක් වන අතර ඔවුන්ගේ රාජකාරී කටයුතු කාර්යක්ෂව ඉටු කිරීමට ඔවුන් දක්වන කැපවීම සම්බන්ධයෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමන්ලාට සහ සාමාජිකයන්, පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදු කළ වරළත් ගණකාධිකාරීවරුන්ගෙන් සමන්විත ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, විගණිත ආයතන, ජනාධිපති ලේකම් ඇතුළු එම

කාර්ය මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික වැටුප් කොමිෂන් සභාව, නීතිපතිවරයා හා පරිපාලන කටයුතු වලදී සහාය වූ අනෙකුත් රාජ්‍ය ආයතන, කාර්යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ ජාත්‍යන්තර සංවර්ධන සමායාතනයේ සහ යුරෝපා හවුලේ සහයෝගීතාවයට ස්තූති කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි.

මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ පොදු මහජනතාවගේ හා පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන් ඉටුකරලීම උදෙසා දැඩි කැපවීමෙන් යුතුව මම ඉදිරියටත් කටයුතු කරමි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2022 ඔක්තෝබර් 18 දින

පටුන

	පිටුව		පිටුව
අපගේ සංවිධානය	01	වරාය හා නාවික කටයුතු	279
අපගේ සංවිධාන සටහන	15	මහාමාර්ග අංශය	299
කාර්ය මණ්ඩල පුහුණුව	21	විදුලිබල අංශය	309
සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම	24	බලශක්ති අංශය	319
		වාරිමාර්ග හා ජල සම්පත්	343
පාර්ලිමේන්තුවට සහායවීම	25	ජලසම්පාදනය හා සනීපාරක්ෂාව	353
විගණකාධිපති විසින් පනවන ලද අධිභාර	28	අධ්‍යාපනය	371
		උසස් අධ්‍යාපනය	383
මහජන නියෝජන පරීක්ෂා කිරීම	29	නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය	391
විගණකාධිපතිවරයා විසින් සිදුකරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය	33	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු	405
		කම්කරු අංශය	419
විමර්ශන විගණනය	77	සෞඛ්‍යය අංශය	431
ජාතික විගණන කාර්යාලයේ 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන	81	ක්‍රීඩා කටයුතු	453
		විදේශ කටයුතු	461
2021 වර්ෂය තුළ නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා	87	විදේශ රැකියා ක්ෂේත්‍රය	467
		ගුවන් සේවා අංශය	477
ඒකාබද්ධ අරමුදල	99	සංචාරක කටයුතු	487
රජය සතු සීමිත වගකීම් සමාගම්	121	වෙළඳ කටයුතු	497
විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්	127	කාන්තා හා ළමා කටයුතු සංවර්ධනය	507
විගණනයට යටත් වන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්	133	ජනමාධ්‍යය අංශය	515
		පරිසර අංශය	533
දිස්ත්‍රික් ලේකම් කාර්යාල	137	වනජීවී හා වන සංරක්ෂණය	543
පළාත් පාලනය	149	නාගරික සංවර්ධනය හා නිවාස	551
විදේශාධාර ව්‍යාපෘති	155	පළාත් සභා පිළිබඳ හැඳින්වීම	575
බැංකු අංශය	163	බස්නාහිර පළාත් සභාව	579
ජාතික ආරක්ෂාව	187	මධ්‍යම පළාත් සභාව	585
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපනය	201	දකුණු පළාත් සභාව	595
		උතුරු පළාත් සභාව	601
භාණ්ඩාගාරයේ කටයුතු	209	නැගෙනහිර පළාත් සභාව	607
කෘෂිකර්මය	225	උතුරු මැද පළාත් සභාව	613
ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය	235	වයඹ පළාත් සභාව	625
කර්මාන්ත අංශය	243	සබරගමුව පළාත් සභාව	633
ඉඩම් කටයුතු	257	ඌව පළාත් සභාව	639
ප්‍රවාහන අංශය	265		

අපගේ සංවිධානය

අපගේ ඉතිහාසය

විගණකාධිපති ධූරයේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1796 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 3 කට පසුව එනම්, 1799 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරිවරයෙකු හා විගණකාධිපතිවරයෙකුව සිටි බව පැරණි ලිපිවල සඳහන්ව ඇත. එතැන් පටන් විගණකාධිපතිවරු 41 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස 2018 දක්වා විගණකාධිපති දෙපාර්තමේන්තුව වශයෙන්ද, 2018 වර්ෂයෙන් පසු එය ජාතික විගණන කාර්යාලය වශයෙන්ද අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

අපගේ විගණන අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් රාජ්‍ය අංශයේ ආයතන විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය මූලික වශයෙන් ලැබී ඇති අතර විසිවන වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් එය වඩාත් පුළුල් වී ඇත.

"විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, 44 වන හෝ 45 ව්‍යවස්ථා යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, පාර්ලිමේන්තු සභාව, 41 (අ) ව්‍යවස්ථාවේ I උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම්ද ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය." යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව යටතේ දක්වා ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පවරා ඇති එම බලය පහත සඳහන් අණපනත්වල තවදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

- රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සළසන 2018 අංක 19 දරන ජාතික විගණන පනත
- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය.
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය.
- ප්‍රාදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය.
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය.
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව මගින්, පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි ඉටුකිරිම විගණකාධිපතිවරයා විසින් කළ යුතු බවට දක්වා ඇත. විගණකාධිපතිවරයාගේ කාර්යයා හා කර්තව්‍ය ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනිමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධානද එමගින් සලසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරිම විගණිත ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිස විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සලසා ඇත.

අපගේ සේවා ග්‍රාහකයෝ

ඉහතින් දක්වා ඇති ආකාරයට විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කර ඇති අතර තවදුරටත් එය දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම වගුව 01 පරිදි වේ.

සේවාලාභියා	ආයතන ගණන
අමාත්‍යාංශ	30
රාජ්‍ය අමාත්‍යාංශ	40
දෙපාර්තමේන්තු	105
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	25
රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි හා රජයට පවරාගත් ව්‍යාපාර	204
රාජ්‍ය සමාගම්	125
රාජ්‍ය බැංකු	09
ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්	64
විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති	123
අනෙකුත් ස්වාධීන ආයතන	11
පළාත් සභා	09
පළාත් පාලන ආයතන	341
ගොවිජන සේවා මධ්‍යස්ථාන	565
ක්‍රීඩා සංගම්	66
පළාත් සභාවල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක	269
පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන	77
එකතුව	2,063

වගුව 01 – 2021 වර්ෂයේදී අපගේ සේවාලාභී පදනම පහත

අපගේ විෂය පථය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ I කොටසේ 3 වන වගන්තියේ සිට 5 වන වගන්තිය දක්වා වගන්තිවලින් විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන විගණනවල විෂය පථය සඳහන් කර ඇත. ඒ අනුව,

- විගණකධිපතිවරයා විසින්,
  - ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියළුම ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියළු වියදම් විගණනය කරනු ලැබිය යුතුය.
  - විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකරගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නිත්‍යානුකූලව ලබාගෙන සහ අදාළ කර ගෙන තිබේ ද යන්න පිළිබඳ විමසා දැනගත යුතුය.
  - වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳ තීරණය කළ යුතු ය; සහ

- එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය.

- විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද විගණනයක විෂය පථයට විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්, මූල්‍යයන්, මූල්‍ය තත්ත්වය සහ රාජ්‍ය මූල්‍යවල සහ දේපළ විචක්ෂණ කළමනාකරණය පරීක්ෂා කිරීම ඇතුළත් වන්නේය.

- විගණකාධිපතිවරයා මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතුය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණු සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. ඒ අනුව

- විගණන පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටවන ලද ජාතික විගණන කාර්යාලය විසින් කරනු ලබන විගණන සඳහා, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අදාළ විය යුතුය.

- කාර්යසාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු වන පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.

අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය සඳහා පදනම් වූ

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග අනුගතවීමට කටයුතු කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව,

- විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර 41(අ) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේය.

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හීදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධූරයෙන් ඉවත් කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන අතර ඔහුගේ ධුර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වයට ඇති සීමාවන්

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මෙතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර තිබුණද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම්වලට ලක් කල අවස්ථා විය. නමුත් 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් එම සීමාකිරිම් ඉවත් කර ඇත. විගණකාධිපතිවරයා සියලු පුද්ගලික හා ආයතනික බැඳීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික සීමාකිරීම්වලින්ද තොරවිය යුතුය. මූල්‍ය හා පරිපාලනය යන දෙවර්ගයෙන් දැක්වෙන සම්පත් සඳහා විගණකාධිපතිවරයා විධායකය මත රදාපැවතීම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරනු ලබන විගණනයේ ස්වාධීනත්වයට අහිතකර ලෙස බලපාන බව සාමාන්‍ය පිළිගැනීමයි. මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. 2018 වර්ෂය දක්වා විගණකාධිපතිවරයාට ඔහුගේ වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය මත යැපීමට සිදු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල මෙන් ශ්‍රී ලංකාවේ විගණකාධිපති, ඔහුගේ කාර්ය මණ්ඩලය ඇතුළත් ජාතික විගණන

කාර්යාලය සඳහා වූ අයවැය, පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන අතර ඔහුගේ අයවැය පිළිබඳව විධායක පාලනයෙන් බැහැරව තීරණය කරනු ලැබේ. ඒ අනුව විගණකාධිපතිගේ අයවැය පාර්ලිමේන්තුව විසින් වෙනම තීරණය කිරීමට විධිවිධාන සලසා තිබීම මගින් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය ඉටු කිරීමේදී මූල්‍යමය ස්වාධීනත්වය තහවුරු කර ඇත.

විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම, කාර්ය මණ්ඩලයේ උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය විගණන සේවා කොමිෂන් සභාව විසින් සිදු කර තිබුණත්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි වීම නිසා එම කටයුතු නැවතත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවැරී ඇත. මෙම තත්ත්වය මත නැවතත් විගණකාධිපතිවරයාට අවශ්‍ය මානව සම්පත් ලබා ගැනීම සඳහා ඔහු සාමාජිකත්වය නොදරන කොමිෂන් සභාවක් මත යැපීමට සිදු වීම තුළින් ඔහුගේ පරිපාලන ස්වාධීනත්වයට බාධා පැමිණ ඇත. මෙම තත්ත්වය තවදුරටත් තිව්‍ර කරමින් විගණකාධිපතිවරයාට රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් වෙනත් ආයතන ප්‍රධානීන් වෙත කරනු ලබන යම් යම් බලතල පැවැරීම් පවා සිදු නොකිරීම තුළ තම ව්‍යවස්ථාපිත කාර්යයභාරය ඉටු කිරීමට බාධා පැමිණ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවත විගණන සේවා කොමිෂන් සභාව විධිමත් පරිදි බලතල සහිතව ස්ථාපනය වීම තුළ මෙය නිවැරදි වේය යන්න අපේක්ෂා කරයි.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් නොවන විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර ඇත. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා පනවන ලද ප්‍රතිපාදනයකි.

එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

1 ප්‍රතිපත්තිය - යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

2 ප්‍රතිපත්තිය - උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධුරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය

පහත සඳහන් තත්ත්වයන්ට යටත්වන උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන්ගේ සහ විද්‍යායතනික ආයතනවල සාමාජිකයන්ගේ පත්වීම්, නැවත පත්කිරීම්, සේවා නියුක්තිය, සේවයෙන් ඉවත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම පිළිබඳ කොන්දේසි අදාළ නීති සම්පාදනය මගින් විශේෂයෙන් දැක්විය යුතුය.

- ව්‍යවස්ථාදායකයෙන් සහතික කෙරෙන ක්‍රියාවලියක් මගින් ස්වාධීනත්වය තහවුරු කෙරෙන පත්කිරීම්, නැවත පත් කිරීම් හෝ සේවයෙන් ඉවත් කිරීම් (උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනත්වය හා සම්බන්ධ ISSAI II මාර්ගෝපදේශ සහ යහපත් පරිචයන්)

- නීතිමය රාමුව (Mandate) මත ස්වකීය කාර්යයන් හේතු කොටගෙන විධායකයෙන් සිදුවන ප්‍රතිවිරෝධවලට බියකින් තොරව කටයුතු කිරීමට ඉඩ ලැබෙන පරිදි ප්‍රමාණවත් තරම් දීර්ඝ සහ නිශ්චිත කාල සීමාවක් සහිතව කරනු ලබන පත්වීම් ; සහ

- ස්වකීය රාජකාරී නිසියාකාරයෙන් සාමාන්‍ය පරිදි ඉටු කිරීමේදී අතීතයේදී හා වර්තමානයේදී සිදුකරන ලද කවර හෝ කාර්යයක් හේතු කොට ගෙන සිදු කරනු ලබන පැමිණිල්ලකදී නිර්මුක්ත තිබීම. (Immune)

3 ප්‍රතිපත්තිය - උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නීතිමය රාමුවක් (Mandate) සහ පූර්ණ අභිමතය

පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.

- රජයට හෝ රජයේ ආයතනවලට ලැබිය යුතු ආදායම් එකතු කිරීම.

- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතාව

- මූල්‍ය කළමනාකරණයේ හා වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ

- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය.

නීති මඟින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්ති විගණනය නොකළ යුතු බැවින් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතනවලට අදාළ වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට එම ආයතන ගරු කළ යුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදුකරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරා ගැනීම ;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩ සටහන්කරණය, වැඩසටහන් පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නීතිමය රාමුවේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම ;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරීත්වය තුළ කිසිඳු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

උත්තරීතර විගණන ආයතන, ස්වකීය විගණිත ආයතන සමඟ වඩා සමීප සම්බන්ධතා ඇති කර නොගන්නා බවට සහතික විය යුතුය. ඒ අනුව ඔවුන් අරමුණුවලට අනුකූලව කටයුතු කරමින් සිටින බව විදහා දැක්විය යුතුය.

ස්වකීය වගකීම් ඉටු කිරීමේදී උත්තරීතර විගණන ආයතනවලට පූර්ණ අභිමතය අනුව ක්‍රියා කළහැකි විය යුතුය. ඔවුන් රාජ්‍ය අරමුදල් භාවිතය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට වෙහෙසෙන රාජ්‍ය හෝ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ද ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ ද අනෙකුත් පිළිගත් ප්‍රමිති නියම කරන ආයතනවලද නිල ලේඛන පදනම් කරගත් යෝග්‍ය වූ වැඩ සහ විගණන ප්‍රමිතීන් ද ආචාර ධර්ම සංග්‍රහයක් ද උත්තරීතර විගණන ආයතන විසින් භාවිත කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මඟින් නියම කර ඇති ආකාරයට වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍යආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

4 ප්‍රතිපත්තිය - සීමාවකින් තොරව තොරතුරු ලබා ගතහැකි වීම

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, නිවැරදිව, සෘජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතනය සතු විය යුතුය.

5 ප්‍රතිපත්තිය -ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

6 ප්‍රතිපත්තිය - විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.

- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු විය යුතුය.

- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමක් නීති මගින් කළ යුතුය.

- වාර්තා කිරීමට අවශ්‍ය කරුණු නිශ්චිත වශයෙන් නීතියෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර ස්වකීය විගණන වාර්තාවල කාල නියමය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.

- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.

- උත්තරීතර විගණන ආයතනවල වාර්තා නීතියෙන් නියම වී ඇති පරිදි අදාළ බලධාරීන්ට විධිමත්ව ඉදිරිපත් කිරීමෙන් හෝ භාරදීමෙන් පසු ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරිය යුතුය.

7 ප්‍රතිපත්තිය - උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසු විපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත

හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මෙවායේ නිරීක්ෂණ සහ නිර්දේශ නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.

- පසු විපරම් කටයුතු සහ අනුමත කිරීම් සඳහා ස්වකීය වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබිය දී පවා එකී විගණන ආයතන ස්වකීය පසු විපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

8 ප්‍රතිපත්තිය - මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍යකරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අය වැය ඔවුන් විසින්ම කළමනාකරණය කරගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.

- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නීතිමය රාමුවට (Mandate) අනුව කාර්යයන් සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉඳුරාම ලබාදෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.

- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නීතිමය රාමුවට අනුව කාර්යයන් (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තරාත්මකව දක්වා තිබීමේ අවශ්‍යතාවය 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් 2018 අගෝස්තු 01 දින සිට සම්පූර්ණ කර ඇත.

2018 අංක 19 දරන ජාතික විගණන පනත

ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් සලසා ඇත.

ජාතික විගණන පනතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක්, පාරිසරික විගණනයක්, තාක්ෂණික විගණනයක් සහ වෙනත් විශේෂ විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂයපථය පුළුල් කර තිබීම.

- විගණනය කරනු ලබන ආයතනයකට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණ සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනයා අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය පිළිගනු ලබන අතර එය විගණනයන්ට අදාළ වේ.

- රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් හැර යම් විගණනය කරනු ලබන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආයතනයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන්වීමෙන් පසු මාස පහක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු වීම.

- රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන හා තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.

- අදාළ විගණනය කරනු ලබන ආයතනය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරනු ලබන ආයතනයන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික

විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.

- රජයේ මුල්‍ය ප්‍රකාශන රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඉකුත්වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වීම.

- විගණනය කරනු ලබන රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත අරමුදල් හෝ මණ්ඩල, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගම්වලින් ගාස්තුවක් අය කළ යුතුවීම.

- ජාතික විගණන කාර්යාලයට බඳවා ගනු ලබන තැනැත්තන්ගේ වැටුප් සහ වෙනත් දීමනා සහ වෙනත් යම් ප්‍රතිලාභ ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතුය.

- සියළුම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන් විසින් විගණකාධිපතිවරයාට සහ ඔහු විසින් සේවයේ යොදවා ඇති යම් නිලධරයෙකුට සහයෝගය දැක්විය යුතු අතර ඵලදායි විගණනයක් සිදු කිරීමට පහසුකම් සැලැසීම සඳහා වැඩ කිරීමට අවශ්‍ය සුරක්ෂිත සහ රැකවරණ සහිත පරිසරයක් සකස් කර දිය යුතුය.

- මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු අතර කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී එය ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඇස්තමේන්තුව දින 10 ක් ඇතුළත මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ කථානායකවරයා ලබා ගෙන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ඇස්තමේන්තුව ජාතික අයවැයට ඇතුළත් කිරීම සඳහා කථානායකවරයා විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සලසා තිබේ.

- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සලසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.

- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන

පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.

- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කර තිබීම.
- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කථානායකවරයා විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- මේ පනත මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නිශ්චය කර තිබේ.
- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරීත්වය අවධාරණය කර තිබේ.
- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.
- විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව වෙත තම වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු ඒවා පොදු මහජනතාවට ලබා ගැනීම සඳහා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවියේ ඒවා පල කළ යුතුය.
- විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිඳු කටයුත්තකින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පූර්ව නීතිමය කටයුත්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මකවීමත් සමඟ විගණන සේවා කොමිෂන් සභාව අහෝසි වූ අතර එහි ප්‍රධානතම කාර්යය වූ රාජ්‍ය විගණන සේවාවේ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරනු ලැබීය. එසේ වුවද, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පහත සඳහන් කාර්යයන්ද, විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති අතර, එම කාර්යයන් ඉටු කිරීම සඳහා විගණකාධිපතිට බලය පවරමින් ජාතික විගණන පනත සංශෝධනය කිරීමට පියවර ගත යුතුව ඇත.

ජාතික විගණන පනතේ වගන්තිය	වගන්තිය
5(2) වගන්තිය	කාර්යසාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණ විගණන ගැන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවල කිසිඳු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන්ව නොමැති අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් උත්තරීතර විගණන

	ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වන විගණන ප්‍රමිත දේශීය අවශ්‍යතාවයට සරිලන පරිදි සංශෝධන සහිතව අදාළ විය යුතුවන පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පල කරන ලද නියමයන් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය. එහෙත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි වීමත් නිසා එම කටයුතු අක්‍රියවී ඇත.
19(1)(අ) වගන්තිය	වෙනත් යම් ලිඛිත නීතියක අන්‍යාකාරයකට විශේෂිතව දක්වා ඇත්නම් මිස, විගණනය කරනු ලබන ආස්ථිතයක යම් ගනුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, නොසැලැකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණන සේවා කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, යම් ගනුදෙනුවක් හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවයකටම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, විගණන සේවා

	කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවයකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, එම විගණනය කරනු ලබන ආස්ථිත‍ය‍ෙය් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත වාර්තා කළ යුතුය. එහෙත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි වීමත් නිසා එම කටයුතු අක්‍රියවී ඇත.
34 වගන්තිය	මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විසින් නියමිතව සඳහනක් කරනු ලබන කාලසීමාවත් ඇතුළත, විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු විගණන සේවා කොමිෂන් සභාව විසින් සකස් කළ යුතුය. ඒහෙත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි වීමත් නිසා එම කටයුතු පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ එකගතාවය මත විගණකාධිපතිවරයා විසින් සකස් කර කතානායකවරයා වෙත ඉදිරිපත් කරනු ඇත.

අපගේ සංවිධාන සටහන

ජාතික විගණන කාර්යාලයේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර කාර්යාලයේ මුල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. ජාතික විගණන කාර්යාලයේ වර්තමාන සංවිධාන ව්‍යුහය මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලයට අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වලට ඇතුළත් කර ඇති නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 5 කින් සමන්විත වේ.

පළමු මට්ටම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. දෙවන මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් රාජ්‍ය විගණන කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිමය හා සමස්ථ රාජ්‍ය විගණනය අධීක්ෂණය කිරීම සිදු කරන ලබයි. නියෝජ්‍ය විගණකාධිපතිවරුන් යටතේ අංශ 72 ක් ස්ථාපිත කර ඇති අතර එම එක් එක් අංශය භාරව සිටින ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු තෙවන මට්ටම නියෝජනය කරනු ලබයි. එම ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ රජයේ හා පළාත් සභාවල විගණන කටයුතුද සිදු කරනු ලැබේ. අංශ ප්‍රධානීන් වෙත පැවරෙන අංශයක ඇති විගණන “ශාඛා”වන්හි ප්‍රධානත්වය “ශාඛා ප්‍රධානී” ලෙස සහකාර විගණකාධිපතිවරයෙකු හෝ විගණන අධිකාරිවරයෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් සිව්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවැරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති සහකාර විගණන අධිකාරීන් හා විගණන නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කිරීම ශාඛා ප්‍රධානීන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් පස්වන මට්ටමට අයත් වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වීම විගණන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. ඉහත සඳහන් තෙවන මට්ටමට අයත්වන අංශ 72 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් 24 දෙනෙකු දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය විගණනය භාරව කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ අධීක්ෂණයට නියෝජ්‍ය විගණකාධිපතිවරුන් තිදෙනෙකු විසින් ඉටුකරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලයේ සමස්ථ මූල්‍ය හා පරිපාලන කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය

විගණකාධිපතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) විසින් ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී විසින් ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

මුදල් රෙගුලාසි 133 සඳහන් පරමාර්ථ ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර, ඔහු සෘජුව විගණකාධිපතිවරයාගේ මෙහෙයවීමට හා අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ.

ජාතික විගණන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරිම සඳහා අවශ්‍ය සේවා ව්‍යවස්ථාවක් අනුමත කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා යම් කාලයක් ගත වන බැවින්, විගණන කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙනයාම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින්, රාජ්‍ය විගණන සේවය සඳහා ජාතික වැටුප් කොමිෂම විසින් නිර්දේශිත වැටුප්තල, සේවා නාමයන් හා සේවක සංඛ්‍යාව ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ වැටුප් තලයන්ට, සේවා නාමයන්ට හා සේවක සංඛ්‍යාවට ආදේශ කර ජ්‍යෙෂ්ඨතාවයට නිලධාරීන් බඳවා ගැනීමට හා උසස් කිරීමට 2021 සැප්තැම්බර් 13 දින අනුමත කර ඇති බැවින් එම කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඉටු කරමින් පවතී. විගණන සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ දීර්ඝ කාලීනව පැවැති උසස්වීම් ලබා ගැනීමේ අවස්ථාව මෙම අන්තර්කාලීන විධිවිධාන තුළින් යම්තාක් දුරකට විසඳීමට හැකියාව ලැබෙනු ඇත.

ඒ අනුව 2021 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික විගණන කාර්යාලයේ විගණනය ක්‍රියාත්මක කිරීමට අදාළ සංවිධාන ව්‍යුහය සංශෝධනයන්ට ලක් කළ අතර නව සංවිධාන ව්‍යුහය පහත දැක්වේ.

ජාතික විගණන කාර්යාලයේ සංවිධාන ව්‍යුහය

විගණකාධිපති

අතිරේක විගණකාධිපතිවරු / ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරු	නියෝජ්‍ය විගණකාධිපතිවරු	ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු	
මධ්‍යම රජයේ විගණනය හා සහතික කිරීමේ සේවා (CGSA)	රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන විගණනය (BAF)	බැංකු	(BAN)
		මූල්‍ය හා කල්බදු	(FAL)
		රක්ෂණය	(INS)
	විශේෂිත ව්‍යාපාර ආයතන විගණනය (SBE)	මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය ණය	(TPD)
		රාජ්‍ය ආදායම	(PUR)
	රාජ්‍ය සමාගම් විගණනය (COM)	වෙළඳ හා වාණිජ්‍යය	(TAC)
		සන්නිවේදනය හා මාධ්‍ය	(CAM)
		සංස්කෘතිය හා කලා	(CAA)
		ක්‍රීඩා හා තරුණ කටයුතු	(SYA)
	විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති විගණනය (FFP)	මහා මාර්ග හා මාර්ග	(RAH)
		ඉදිකිරීම් හා ඉංජිනේරු	(CAE)
		නිවාස හා නාගරික සංවර්ධන	(HUD)
	පළාත් සභා විගණනය (PRC)	ආරක්ෂක	(DEF)
		අධිකරණ, නීතිය හා සාමය	(JLO)
	විශේෂ විගණන පැවරුම් (SPR)	අධ්‍යාපන	(EDU)
		උසස් අධ්‍යාපන	(HED)
		වෘත්තීය පුහුණු	(VOT)
	ව්‍යවස්ථාපිත අරමුදල් හා අනෙකුත් අරමුදල් විගණනය (SOF)	විදුලිබල	(PWR)
		බලශක්ති	(ENR)
		වරාය හා නාවික කටයුතු	(PAS)
		ගුවන්තොටුපල හා සිවිල් ගුවන් සේවා	(AAV)
	පළාත් මට්ටමින් මධ්‍යම රජයේ අරමුදල් උපයෝජනය විගණනය (CGL)	කෘෂිකර්ම හා ආශ්‍රිත නිශ්පාදන	(ARI)
		වාරිමාර්ග, ජල සම්පත් හා පතල් කැණීම්	(IWR)
		ජලය හා සනීපාරක්ෂාව	(WAS)
		වන සංරක්ෂණ, වන ජීවී සහ පරිසර	(FWL)
		ඉඩම් හා වැවිලි	(PAL)
		ධීවර හා පශු සම්පත්	(FLS)
	විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විගණනය (UPG)	රාජ්‍ය පරිපාලන හා විදේශ කටයුතු	(PAF)
		කම්කරු, සේවක සුභසාධන හා සමාජ ආරක්ෂණ	(LSW)
		පාර්ලිමේන්තු කටයුතු හා ස්වාධීන කොමිෂන් සභා	(PIC)
	අමාත්‍යාංශ විගණනය (MIN)	ඖෂධ සැපයීම්	(MSU)
		ශික්ෂණ රෝහල්	(THO)
		වෛද්‍ය පරිපාලන	(MED)
	දෙපාර්තමේන්තු විගණනය (DEP)	මගී ප්‍රවාහන	(COT)
		කර්මාන්ත, නිෂ්පාදන හා කාර්මික	(IMT)
		සංචාරක හා ආයෝජන ප්‍රවර්ධන	(TIP)
	විශේෂිත ව්‍යාපාර සහ විශ්ව විද්‍යාල නොවන අනෙකුත් සංස්ථා, මණ්ඩල සහ අධිකාරී විගණනය (CBA)	විදේශ මුදල් සම්පාදිත ව්‍යාපෘති	(FOP)
		ආපදා කළමනාකරණය	(DMG)
	මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය ණය (TPD)	විශේෂිත විගණනය (විමර්ෂණ හා වෝහාරික)	(SIF)
		කාර්යසාධන හා පරිසර විගණනය	(PEA)
පරිපාලනය, ආයතනික උපායමාර්ග හා සංවර්ධන (ACSD)	පරිපාලනය (ADM)	පුහුණු, පර්යේෂණ හා සංවර්ධන	(TRD)
		තත්ත්ව සහතිකකරණය	(QUA)
		නීති	(LEG)
		තොරතුරු තාක්ෂණ විගණනය	(ITA)
		බදුකරණය	(TAX)
		අනුකූලතා	(COM)
		පාර්ලිමේන්තු වාර්තාකරණය හා සම්බන්ධීකරණය	(PRO)
පළාත් පාලන හා පළාත් සභා විගණන හා සහතික වීම (PDSA)	පළාත් පාලන ආයතන විගණනය (MUP)	අධිභාර, පළාත් සභා හා පළාත් පාලන ආයතන	(PLG)
		කොළඹ	(COA)
		කොළඹ	(COB)
		ගම්පහ	(GMP)
		කළුතර	(KLU)
		ගාල්ල	(GAL)
		මාතර	(MTR)
		හම්බන්තොට	(HMB)
		ත්‍රිකුණාමලය	(TRC)
		අම්පාර	(AMP)
		මඩකලපුව	(BTC)
		යාපනය	(JAF)
		කිලිනොච්චි, මුලතිව්, වව්නියා හා මන්නාරම	(KVM)
		පුත්තලම	(PTL)
		කුරුණෑගල	(KRG)
		මාතලේ	(MTL)
		මහනුවර	(KDA)
		මහනුවර	(KDB)
		නුවරඑළිය	(NUE)
		අනුරාධපුරය	(ANP)
		පොළොන්නරුව	(POL)
		රත්නපුර	(RAT)
		කෑගල්ල	(KGL)
		බදුල්ල	(BDU)
		මොණරාගල	(MNG)

සහකාර විගණකාධිපතිවරු / විගණන අධිකාරීවරු

සහකාර විගණන අධිකාරීවරු/ විගණන නිලධාරීන්

ජාතික විගණන කාර්යාලයේ වගකීම හා කාර්යභාරය පිළිබඳ ඇගැයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2021 සැප්තැම්බර් 13 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 545 ක්ද, විගණන පරීක්ෂක සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 1450 ක්ද වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනය අනුව ස්ථාපිත කළ ශ්‍රී ලංකා විගණන සේවා කොමිෂන් සභාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත බලාත්මක කර තිබුණි. කෙසේ වුවද, ජාතික විගණන කාර්යාලයට රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට කෙටුම්පත් කර ඇති සේවා ව්‍යවස්ථාව 2022 අගෝස්තු 31 දින වන විටත් සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණු අතර ඇති වන පුරප්පාඩු පිරවීමට පැරණි සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මේ වන විට කටයුතු කරමින් සිටී.

ජාතික විගණන කාර්යාලයේ 2021 වර්ෂය ආරම්භයට, 2021 වර්ෂය අවසානයට හා 2022 ජුනි 30 දිනට ඒ ඒ තනතුරුවල අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පැවැති පුරප්පාඩු හා අතිරික්ත සංඛ්‍යාව වගුව 02 හි දැක්වේ.

තනතුර	2021ජනවාරි 01 දිනට			2021දෙසැම්බර් 31 දිනට			2022 ජුනි 30 දිනට			
	අනුමත කාර්ය මණ්ඩලය	තථ්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	තථ්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	තථ්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අතිරික්ත
විගණන කාර්ය මණ්ඩලය										
විගණකාධිපති	1	1	0	1	1	0	1	1	0	0
අතිරේක විගණකාධිපති	3	0	3	3	3	0	3	3	0	0
නියෝජ්‍ය විගණකාධිපති	15	10	5	15	10	5	15	10	5	0
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති	0	0	0	72	0	72	72	23	49	0
සහකාර විගණකාධිපති	44	22	22	455	24	254	455	57	278	0
විගණන අධිකාරි	288	199	89		177			120		0
සහකාර විගණන අධිකාරි	0	0	0	360	353	7	360	350	10	0
විගණන පරීක්ෂක	1200	992	208	0	0	0	0	0	0	0
විගණන නිලධාරි	0	0	0	1090	787	303	1090	783	307	0
එකතුව	1551	1224	327	1996	1355	641	1996	1347	649	0
විගණන නොවන කාර්ය මණ්ඩලය										
විධායක හා මාණ්ඩලික නිධාරීන්										
අධ්‍යක්ෂ (පාලන)	1	1	0	1	1	0	1	1	0	0
ප්‍රධාන ගණකාධිකාරී	1	1	0	1	1	0	1	1	0	0
ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	1	0	1	1	0	1	1	0	0
සහකාර අධ්‍යක්ෂ (පාලන)	1	0	1	1	0	1	1	1	0	0
ගණකාධිකාරී	1	1	0	1	1	0	1	1	0	0
පරිපාලන නිලධාරී	3	2	1	3	2	1	3	2	1	0

තොරතුරු හා සන්නිවේදන නිලධාරී	1	1	0	1	1	0	1	1	0	0
තාක්ෂණ නිලධාරී විශේෂ	1	0	1	1	0	1	1	0	1	0
භාෂා පරිවර්තක	10	8	2	10	8	2	10	8	2	0
නීති නිලධාරී	0	0	0	1	0	1	1	0	1	0
එකතුව	**20**	**15**	**5**	**21**	**15**	**6**	**21**	**16**	**5**	**0**
මාණ්ඩලික නොවන ශ්‍රේණි										
සංවර්ධන නිලධාරී	3	2	1	3	3	0	3	55	0	52
පුස්තකාලයාධිපති	1	1	0	1	1	0	1	1	0	0
තාක්ෂණ නිලධාරී - I	1	0	1	1	0	1	1	0	1	0
කළමණාකරණ සේවා නිලධාරී	121	108	13	121	106	15	121	112	9	0
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	1	1	0	1	1	0	1	1	0	0
ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	0	0	0	1	0	1	1	0	1	0
වාර්තා සැකැසුම්කරු	**41**	**41**	**0**	**41**	**41**	**0**	**41**	**41**	**0**	**0**
එකතුව	**168**	**153**	**15**	**169**	**152**	**17**	**169**	**210**	**11**	**52**
කණිෂ්ඨ සේවකයින්										
රියදුරු	48	47	1	48	46	2	48	47	1	0
සංචාරක බංගලා භාරකරු	13	7	6	13	7	6	13	7	6	0
විදුලි කාර්මික	1	1	0	1	1	0	1	1	0	0
ජලනල කාර්මික	1	1	0	1	1	0	1	1	0	0
කාර්යාල කාර්යය සහයක	148	135	13	148	137	11	148	138	10	0
දෙපාර්තමේන්තු කම්කරු	2	2	0	2	2	0	2	2	0	0
එකතුව	**213**	**193**	**20**	**213**	**194**	**19**	**213**	**196**	**17**	**0**
මුළු එකතුව	**1952**	**1585**	**367**	**2399**	**1716**	**683**	**2399**	**1769**	**682**	**52**

වගුව 02 - කාර්ය මණ්ඩල තත්ත්වය 2021 ජනවාරි 01 දිනට, 2021 දෙසැම්බර් 31 දිනට හා 2022 ජුනි 30 දිනට

ජාතික විගණන කාර්යාලය ශක්තිමත් කිරීම සඳහා අංක. 21/1274/301/017 හා 2021.09.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික විගණන කාර්යාලයේ කාර්යයන් වඩාත් ඵලදියීව ඉටුකිරීමට අවශ්‍ය වන කාර්යමණ්ඩලය පුළුල් කර ඇති අතර එම අවශ්‍යතාවන් සපුරා ගැනීමට රාජ්‍ය විගණන සේවය විධිමත්ව පිහිටුවන තෙක් නව කාර්යයමණ්ඩලය ජොෂ්ඨතාවය මත උසස් කිරීම මගින් සපුරා ගැනීම අමාත්‍ය මණ්ඩල අනුමතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් කටයුතු කරමින් පවතියි.

රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව

ජාතික විගණන කාර්යාලයේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්ගෙන් සමන්විත වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා

වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සලකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව එවකට හිටපු විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන්, හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" නමින් නව සේවයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කෙරෙමින් පවතින අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනත සම්මත වීමෙන් පසු විගණන සේවා කොමිෂන් සභාව විසින් එය අනුමත කර ගැනීමේ කාර්යයෙහි නියැලී ඇත. නව සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම තුළින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. විගණන පනත ක්‍රියාත්මක වී වර්ෂ හතරක පමණ කාලයක් ගතවී තිබුණත්, 2022 අගෝස්තු 31 දින වන විටත් එම සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වුවද, 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ රාජ්‍ය විගණන සේවයේ පැවැත්ම සම්බන්ධයෙන් පැනනැගී තිබුණු නීතිමය බාධාවන් සමනය කරමින් අමාත්‍ය මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය 2021 සැප්තැම්බර් 13 දින නැවත බලාත්මක කිරීම හේතුවෙන් හා රාජ්‍ය විගණනයේ විශේෂිත කාර්යභාරය සැලැකිල්ලට ගෙන සුදුසු වැටුප් ව්‍යුහයක් සකස් කිරීම සඳහා ජාතික වැටුප් කොමිසමෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව මෙම සේවාව පිහිටුවීම සඳහා කටයුතු කරමින් පවතී.

ජාතික වැටුප් කොමිසම විසින් අවස්ථා කිහිපයකදී දෙන ලද වැටුප් ව්‍යුහයන්ට, නිලධාරීන් සාමාජිකත්වය දරන ප්‍රධාන වෘත්තීය සමිති දෙක එකඟ නොවීම මත හා සාකච්ඡා දිගින් දිගටම එකඟතාවයකින් තොරව පැවතීම තුළ නව සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම ප්‍රමාද වී ඇත. කෙසේ වුවද, රාජ්‍ය විගණන සේවයට සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් හා වෘත්තීය සමිතිවල සහභාගීත්වයෙන් කමිටුවක් පත් කර ඇති අතර එය විසින් මෙම කාර්යය ඉටු කරමින් පවතියි.

කාර්ය මණ්ඩල පුහුණුව

රාජ්‍ය සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය දායකත්වය හා මගපෙන්වීම ලබාදීම තුළින් ශ්‍රී ලාංකික ජාතියට ගුණාත්මක හා විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැලසීම තහවුරු කිරීම පිණිස ජාතික විගණන කාර්යාලය විසින් රාජ්‍ය ආයතන වල මූල්‍ය හා කාර්යසාධන කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳ ගණන්දීමේ වගකීම නිවැරදි ලෙස ඉටුකර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

මෙම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1355 කින් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 361 කින් සමන්විත කාර්යමණ්ඩලයක දායකත්වය වර්තමානයේ ජාතික විගණන කාර්යාලය විසින් ලබා ගනී.

එකී ව්‍යවස්ථාපිත කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම පිණිස ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ වර්තමානයට සරිලන ලෙස දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

- දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- කළමණාකරන හැකියාවන් වර්ධනය
- රාජකාරී ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- යහපත් ආකල්ප වර්ධනය කිරීම

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් යුක්තව ජාතික විගණන කාර්යාලයේ සෑම නිලධාරියෙකු විසින්ම අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (Continuous Professional Development – CPD) සඳහා වර්ෂයකට පැය 100 කට නොඅඩු න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය ජාතික විගණන කාර්යාලය විසින් අවධාරණය කර තිබේ.

2018 වර්ෂයේ සිදු කරන ලද පුහුණු අවශ්‍යතා අධ්‍යයනය (Training Need Assessment) අනුව නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ලබාදිය යුතු බවට හඳුනාගත් පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීමේ කාර්යභාරය ජාතික විගණන කාර්යාලය සිදු කරමින් පවතී.

- මූල්‍ය විගණනය
- විමර්ශන විගණනය
- කාර්යසාධන විගණනය
- පරිසර විගණනය
- ව්‍යෝහාරික විගණනය
- ප්‍රසම්පාදන හා ඉදිකිරීම් විගණනය

- ව්‍යාපෘති විගණනය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිත
- විසර්ජන ගිණුම් විගණනය
- පලාත් පාලන ආයතන ගිණුම් හා විගණනය
- අධිභාර ක්‍රියාවලිය
- විගණන වාර්ථාකරණය
- පරිගණක හැකියාව සංවර්ධනය
- භාෂාමය හැකියාවන් සංවර්ධනය

ඒ අනුව නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි වෘත්තීය මට්ටමින් සිදු කිරීමට අවශ්‍ය දක්ෂතාවයන් අත්පත් කරගත හැකි පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සංවිධානය කිරීමත්, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙමින් ඔවුන්ව දිරිගැන්වීමටත් කටයුතු කරනු ලැබේ. එහිදී සම්පත් දායකයන් ලෙස ජාතික විගණන කාර්යාලයේ සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරීන්ගේ සහය මෙන්ම අවශ්‍ය පරිදි බාහිර දේශකවරුන්ගේ සහායද ලබා ගැනීමට කටයුතු කරන අතර පුහුණු වැඩසටහන් සඳහා දේශන, සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර චාරිකා ආදිය යොදා ගැනීම තුළින් අදාළ පුහුණු අවශ්‍යතාවයන් සපුරා ගැනීම සිදු කරණු ලැබේ.

දේශීය වශයෙන් පුහුණුව ලබා දීම

ඉහත අරමුණු සපුරාගැනීම උදෙසා 2021 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය මගින් විගණන නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මාතෘකා 2 ක් යටතේ පුහුණු වැඩසටහන් 7 ක් ද 2021 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයට බඳවාගත් නවක විගණන නිලධාරීන් සඳහා සමාරම්භක පුහුණු වැඩසටහන් 3 ක් ද පවත්වා ඇති අතර විගණන නොවන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහාද පුහුණු පහසුකම් ලබා දී තිබේ.

2020 හා 2021 වර්ෂ තුළදී කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වීම නිසා වරින් වර රට වසා තැබීම හා නිලධාරීන් ඒකරාශි කිරීමට පැවති බාධාවන් හේතුවෙන් මෙම පුහුණු සැසි පැවැත්වීම විශාල ලෙස සීමා කිරීමට සිදු වූ අතර එය හේතුකොටගෙන නිලධාරීන්ගේ පුහුණුවීම් දැඩි ලෙස සීමා වී තිබුණි.

ඡායාරූපය: දේශීය පුහුණු වැඩසටහන්

ඡායාරූපය: දේශීය පුහුණු වැඩසටහන්

ඡායාරූපය: දේශීය පුහුණු වැඩසටහන්

විදේශීය පුහුණුවීම්

2021 වර්ෂයේදී ද නිලධාරියකු උත්තරීතර විගණන ආයතනයන්ගේ ආසියානු සංවිධානය (ASOSAI) විසින් සංවිධානය කළ මාර්ගගත වැඩමුළුවක් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගී කරවා ඇත.

2021 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳව විස්තර වගුව 03 හි දක්වා ඇත.

වැඩසටහන් විස්තරය	වැඩසටහන් ගණන	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව				පුහුණු පැය ගණන
		අංශ ප්‍රධානීන්	විගණන අධිකාරී	විගණන පරීක්ෂක	එකතුව	
දේශීය පුහුණු වැඩසටහන්						
(1) මූල්‍ය විගණන පුහුණුව	6	38	101	149	288	2,088
(2) නවක නිලධාරීන් සඳහා සමාරම්භක පුහුණු වැඩසටහන	3	-	-	134	134	4,857
(3) විදේශ ව්‍යාපෘති විගණන පුහුණුව	1	6	28	30	64	464
එකතුව	8				486	7,409
විදේශීය පුහුණු වැඩසටහන්						
(1) "වඩා ඵලදායී විගණනය සඳහා විගණන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම" සම්බන්ධ වැඩමුළුව (මාර්ගගත)	1	-	1	0	1	22.5

වගුව 03 : 2021 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්

මූලාශ්‍රය: ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය

බාහිර ආයතන සඳහා සම්පත්දායකත්වය ලබාදීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිළධාරීන් 7 දෙනෙකු 2021 වර්ෂය තුළ දී ජාතික විගණන පනත හා විගණනයට සමගාමී ක්ෂේත්‍ර පිළිබඳ වෙනත් රාජ්‍ය සේවයේ නියුතු නිළධාරීන්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය සඳහා තම සම්පත්දායකත්වය ලබා දීමට කටයුතු කර තිබේ.

එසේ නමුත් 2021 වර්ෂයේදී ගෝලීය වශයෙන් මුහුණදුන් Covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි දේශිය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් සීමා කිරීමට සිදුවූ අතර විදේශීය පුහුණු අවස්ථාද මෙම හේතුව නිසා සීමා කිරීමට සිදුවිය.

සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

විගණන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇති වන සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා සහ රාජ්‍ය සමාගම්, රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4)(අ) ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

ඒ අනුව සේවයේ යොදවන ලද විගණන සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවාව වෙනුවෙන් 2021 හා 2020 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 31.94 ක් හා රු.මිලියන 35.6 ක් ගෙවා ඇත. සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව යනාදි සාධක සලකා බලන ලදී. ඊට අමතරව විගණන සමාගමට ඇති ජාත්‍යන්තර සම්බන්ධතා හා ඔවුන් සලසන වෘත්තීය සේවාවන්වල ස්වභාවය යනාදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකවලට ඇතුළත් වී තිබුණි. ඒ අනුව විගණකවරුන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකළ අතර සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 05 ක කාලයක් සඳහා අඛණ්ඩව එක් එක් විගණන කාර්යභාරය පවරන ලදී.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් 125 කින් සමාගම් 17 ක් විගණනය කිරීම සඳහා පමණක් ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් 02 ක් මට සහය විය. ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව සහ ක්‍රීඩා සංගම් 35 ක් විගණනය කිරීම සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් 15 දෙනෙකුගේ සහය ලබා ගන්නා ලදී.

විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීම නිසා ජාතික විගණන කාර්යාලය විසින් අදාළ සමාගම් සෘජු විගණනයට භාජනය කිරීම සහ ප්‍රධාන වාණිජ බැංකු දෙකක ශාඛාවන් විගණන සඳහා, සුදුසුකම්ලත් විගණකවරුන් පත් නොකිරීමට ගත් තීරණ හේතුවෙන් 2017

වර්ෂයේ සිට යොදවා ගත් සහාය විගණන සමාගම් ප්‍රමාණය අඩුවී තිබුණි.

රාජ්‍ය බැංකු විගණනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාගැනීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් සහාය ලබා ගන්නා ලදි.

පාර්ලිමේන්තුවට සහාය වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. රාජ්‍ය ගණන්දීමේ වගකීම් පද්ධතිය පිළිබඳ ප්‍රධාන දායකත්වයක් සලසන ජාතික විගණන කාර්යාලය විසින්, මූල්‍ය භාරකාරත්වය හා රාජ්‍ය ආයතනවල මෙහෙයුම් හි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ සෘජුවම පාර්ලිමේන්තුවට වාර්තා කරන රජයේ බාහිර විගණක ලෙස කටයුතු කරයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හා 120 යටතේ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තුවේ කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ. මෙම කාරක සභා දෙකෙහි කාර්ය භාරය වනුයේ රාජ්‍ය ගිණුම් පරීක්ෂා කිරීම් මගින් රාජ්‍ය අරමුදල් හා සම්පත් නිසියාකාරව භාවිත කෙරේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට ව්‍යවස්ථාදායකයට සහාය වීමයි. එබැවින් රාජ්‍ය අංශයේ ගණන්දීමේ වගකීම හා ඵලදායී පාලනය තහවුරු කර ගැනීම සඳහා ඉතා වැදගත් කාර්ය භාරයක් මෙම කමිටු දෙක මඟින් සිදු කරනු ලැබේ.

ස්ථාවර නියෝග 119 යටතේ පිහිටුවන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය වනුයේ මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යයනයන්, මූල්‍ය පරිපාටි, කාර්ය සාධනය සහ කළමණාකරනය පරීක්ෂා කිරීම හා ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 120 යටතේ පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථා, මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පැවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික

ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පරිපාටිය, කාර්යය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය හා ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් පවතී.

පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 16 දෙනෙකු බැගින් වන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ ද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේ ද යන්න පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා සහ/ හෝ ඔහුගේ නියෝජිතයින් සෘජුවම එම කමිටුවලට සහාය වේ. එහි දී සාකච්ඡාවට භාජනය වන ආයතනයට අදාළ විගණන වාර්තාවේ ඇතුළත් වැදගත් නිරීක්ෂණවල වර්තමාන තත්ත්වය පරීක්ෂා කර යාවත්කාලීන කරන ලද නිරීක්ෂණය සමඟ වර්තමාන කාර්යය සාධනයට අදාළ කමිටුවේ සාකච්ඡා කිරීමට යෝග්‍ය නිරීක්ෂණ ඇතුළත් සාකච්ඡා සටහනක් පිළියෙල කර කමිටුව වෙත ඉදිරිපත් කරන අතර ඒ මත පදනම්ව කමිටු සභාපතිවරයා සාකච්ඡාව පවත්වාගෙන යනු ලබයි.

සාකච්ඡාවට භාජන වීමට නියමිත විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් කරුණු වලට අදාළ වර්තමාන තත්ත්වය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ ලිඛිත තොරතුරු ඇතුළත් වාර්තාවක් සැපයීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කමිටුව විසින් ලබා දේ. විගණකාධිපතිට පිටපතක් සහිතව ඉදිරිපත් කරන එම වාර්තාව පදනම් කරගෙන විගණකාධිපතිවරයා විසින් යථෝක්ත සාකච්ඡා සටහන පිළියෙල කරනු ලබන අතර පෙර පවත්වන ලද රැස්වීම් වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කර ඒ පිළබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු ද එම සාකච්ඡා සටහනේ වෙනම

ඇතුළත් කෙරේ. සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර එහි පිටපත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරියට ලබා දෙන බැවින් ඒ මත පදනම්ව සාකච්ඡාව පවත්වාගෙන යාම කමිටුවට පහසුවේ.

කාරක සභා අවස්ථාවේදී විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ සාකච්ඡාවට බඳුන් වන කරුණු පිළිබඳව පසුබිම් තොරතුරු සැපයීම හා සලකා බලන විෂය පිළිබඳව අදහස් දැක්වීම මඟින් කමිටුවට සහාය වීමයි. එහිදී අදාළ කරුණු පිළිබඳව මෙන්ම කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට සහ සාකච්ඡාවට කැඳවූ ආයතනයේ නිලධාරීන් ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අදහස් දැක්වීම ද විගණකාධිපතිවරයා විසින් බොහෝදුරට සිදු කරනු ලබයි.

ඒ අනුව, 2021 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 20 ක් පරීක්ෂා කිරීම සඳහා කැඳවා තිබුණු අතර එහිදී 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 19 ක්, විශේෂ විගණන වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 08 ක් හා කාර්යය සාධන වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 04 ක් වශයෙන් පැවැත්වූ සභාවාර 31 ක් සඳහා විගණකාධිපතිවරයා එම කාරක සභාවට සහාය වී ඇත. එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 26 ක් පරීක්ෂා කිරීම සඳහා කැඳවා තිබුණු අතර එහිදී 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 30 ක් හා විශේෂ විගණන වාර්තා සාකච්ඡා කිරීම සඳහා කමිටු සභාවාර 06 වශයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවාර 36 ක් සඳහා විගණකාධිපතිවරයා සහාය වී තිබේ. ඒ අනුව, කමිටු දෙකම 2021 වර්ෂය තුළ ආයතන 46 කට අදාළ විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීම සඳහා කැඳවූ සභාවාර 67 කට විගණකාධිපතිවරයා සහාය වී ඇත.

ඊට අමතරව විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ස්වාධීන කොමිෂන් සභාවල මූල්‍ය පාලනය සහ කාර්යය සාධනය ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් පිළියෙල කිරීම සඳහා 2021 වර්ෂයේ දී ජාතික විගණන කාර්යාලයීය නිලධාරින් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වී ඇත. තවද, ඒ එක් එක් ආයතන විසින් එම ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර ඒ බව වාර්තා කිරීම මගින් අදාළ ඇගයීම් කටුයුතු සාර්ථකව නිම කිරීමට විගණකාධිපතිවරයා තවදුරටත් එම කමිටුවට සහාය වේ.

එමෙන්ම මුදල් පිළිබඳ කාරක සභාව, අයවැය කාරක සභා යනාදී විවිධ පාර්ලිමේන්තු කාරක සභා සඳහා විගණකාධිපති නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවීම තුළින් ද යනාදී වශයෙන් විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යය භාරයට අමතරව නන් අයුරින් පාර්ලිමේන්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපතිවරයා සහාය වී ඇත.

සති 8 ක් ඇතුළත සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර පිළිබඳව වාර්තා කිරීම සඳහා මුදල් විෂයභාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයාට යොමු කරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳව පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 114 ට අදාළව පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තා පරීක්ෂා කර නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම වර්ෂය තුළ විගණකාධිපතිවරයා විසින් ඉටුකරන ලද තවත් සුවිශේෂී වූ කර්තව්‍යයක් වේ.

විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

2018 අංක 19 දරන ජාතික විගණන පනත 2018 අගෝස්තු 01 දින සිට බලාත්මක වීමත් සමඟම එහි 19 වගන්තිය පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපති විසින් විගණනය කරනු ලබන අස්ථිත්‍යයක යම් ගණුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණන සේවා කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, යම් ගනුදෙනුවක් හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවයකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, එම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධානගණන් දීමේ නිලධරයා වෙත වාර්තා කළ යුතු වේ.

එලෙස වාර්තා කරනු ලබන වටිනාකම එම ඌනතාවයට හෝ පාඩුවට වගකිවයුතු තැනැත්තන්ගෙන් එක්ව හෝ වෙන් වෙන්ව අය කරගැනීමේ වගකීම අදාළ ප්‍රධාන ගනන්දීමේ නිලධාරී වෙත පවරා ඇත.

එසේ වුවද විගණකාධිපතිවරයාට තම කාර්යය ඉටුකිරීමේදී තමාට දැනගැනීමට ලැබුණු තොරතුරු වෙනත් පාර්ශවයකට හෙළි කිරීමට ජාතික විගණන පනතේ 09 වගන්තිය පරිදි සීමා පනවා තිබීම සහ විගණන පනතේ 19 වගන්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විගණන තොරතුරු විගණකාධිපතිගෙන් විගණන සේවා කොමිෂන් සභාවට ලැබිය යුතු ආකාරය පිළිබඳ නෛතික ප්‍රතිපාදන නොමැතිවීම මත අධිභාර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා එලෙස නෛතික ප්‍රතිපාදන ඇතුළත් වන පරිදි විගණන පනත සංශෝධනය කළ යුතු බවට නීතිපතිවරයා විසින් මතයක් ප්‍රකාශ කර ඇත.

එම තත්ත්වය තුළ විගණන පණත මගින් හඳුන්වාදී ඇති අධිභාර ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ නොහැකිව තිබුණි.

එසේ තිබියදී 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්වාධීන කොමිෂන් සභා අහෝසි වීමත් සමඟම විගණන සේවා කොමිෂන් සභාවද අහෝසි වූ අතර එහිදී විගණන සේවා කොමිෂන් සභාවේ අධිභාර ක්‍රියාවලිය ඇතුලු කාර්යන් ඉටුකිරීම සඳහා විකල්ප ක්‍රම වේදයන් හඳුන්වා දී නොමැති වීම

හේතුවෙන් විගණන පනත මඟින් හඳුන්වා දී ඇති අධිභාර ක්‍රියාවලිය පිළිබඳ කටයුතු කිරීම ජාතික විගණන කාර්යාලයට නතර කිරීමට මේ වන විට සිදු වී ඇත.

එසේ වුවද ජාතික විගණන පනත බලාත්මක වීමටද ප්‍රථම සිට විශ්වවිද්‍යාල සහ පළාත් පාලන ආයතනවලට අදාළව අධිභාර පැනවීමට විගණකාධිපතිට වෙනත් ලිඛිත නීති මඟින් පවරා තිබූ බලතල මත එම අධිභාර ක්‍රියාවලිය විගණකාධිපතිගේ මැදිහත් වීම මත පෙර පරිදිම සිදුවෙමින් පවතී.

ඒ අනුව මෙම අධිභාර ක්‍රියාවලිය සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර ඒ සඳහා අධිභාර පැනවීමේ මූලික ක්‍රියාමාර්ග විගණකාධිපතිවරයා විසින් අවසන් කර ඒ බව විගණන සේවා කොමිෂන් සභාවට නිර්දේශ කිරීමෙන් අනතුරුව ඉදිරි අධිභාර පැනවීම අනුමත කිරීම සහ අධිභාර සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය ඉදිරියේදී සම්මත කිරීමට බලාපොරොත්තු වන 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලාත්මක වන විගණන සේවා කොමිෂන් සභාවට පැවරීම වඩාත් සුදුසු බව නිර්දේශ කෙරේ. මේ සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 19 වන ඡේදය සඳහා සුදුසු සංශෝධන සිදු කළ යුතුව ඇත.

පළාත් පාලන ආයතනවල අධිභාර අයකිරීම්

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් පවතින අතර මහා නගර සභා 24 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 276 ක් ඊට අයත් වේ. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥාපනත් හා පනත්වලින්, නිතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදු වූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත බලය පවරා ඇත. එකී බලය අනුව 2012 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වසර 10 ක් තුළ පළාත් පාලන ආයතනවල පාර්ශවකරුවන් 388 ක් වෙත රු. මිලියන 33.37 ක අධිභාර සහතික 64 ක් නිකුත් කර තිබුණි.

ඉන් පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු.මිලියන 9.82 ක් වටිනා අධිභාර සහතික 08 ක් නිදහස් කර තිබුණු අතර ඔවුන්ගේ නිර්දේශ මත රු.912,513 ක් අයකර ගෙන තිබුණි.

ඉතිරි අධිභාර සහතිකවලින් 2022 ජුනි 30 දින වනවිට අය වී තිබුණේ රු.මිලියන 3.86 ක් හෙවත් සියයට 16 ක් පමණක් වූයෙන් අදාළ බලධාරීන් විසින් අධිභාර අයකර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි නිසි අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ.

මහජන නියෝජන පරීක්ෂා කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන

ආස්ථීත්වයන්ට අදාළව ඕනෑම කාරණයක් පිළිබඳව, සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතුරින් යම් අයෙකු විසින් විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුම් දීමක් කර තිබෙන විට ඒ පිළිබඳව පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය වෙත මහජනතාව පෞද්ගලිකව හෝ මහජන නියෝජිතයන් හා විවිධ සංවිධාන හරහා ලැබෙන ලිඛිත නියෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කාර්යාලය තුළ වෙනම ඒකකයක් ස්ථාපනය කර ඇත. එම ඒකකය මගින් ආයතනයට ලැබෙන නියෝජන ලියාපදිංචි කර වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා එහි විශේෂ විමර්ශන හා වෝහාරික විගණන ඒකකයට සහ/හෝ විවිධ විගණිත ආයතනවල පිහිටුවා තිබෙන විගණන ශාඛාවලට හෝ ප්‍රාදේශීයව පිහිටුවා තිබෙන විමර්ශන ඒකක වලට එම තොරතුරු ප්‍රේෂණය කරනු ලබයි. ප්‍රේෂණය කරන එම තොරතුරු පාදක කරගෙන පවත්වනු ලබන විගණනයන්ගෙන් මතුකර ගනු ලබන නිරීක්ෂණ ඒවායේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අදාළ විගණන ආස්ථීත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති වාර්තාවලට ඇතුළත් කිරීමට හෝ විශේෂ වාර්තා/ කාර්යසාධන වාර්තා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හෝ ජාතික විගණන ආයතනය කටයුතු කරනු ලබයි. කෙසේ වෙතත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 09 වගන්තියෙහි පවත්නා සීමාකාරී විධිවිධාන පිළිබඳ අවධානය යොමුකර එම විගණනයන්ගේ ප්‍රතිඵල සෘජුව අදාළ නියෝජනයන් ඉදිරිපත් කරනු ලැබූ පාර්ශවයන් වෙත දැනුම් දෙනු නොලැබේ. එහෙත් නිර්නාමික නියෝජන හැරුණු විට අනෙකුත් නියෝජන සම්බන්ධයෙන් එය ලද බව හා ඒවා පරීක්ෂා කර සුදුසු පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව ඒවා එවන ලද පාර්ශවයන් වෙත දන්වා යවනු ලැබේ.

2021 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලය වෙත මහජන නියෝජනයන් 1696 ක් ලැබී තිබුණු අතර එම නියෝජනයන්ගෙන් 884 ක් රජයේ හෝ රාජ්‍ය ආයතනවල පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් වූ අතර 124 ක් විවිධ පාර්ශවයන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විය. තවත් නියෝජන 662 ක් ආයතනික වංචා හා දූෂණ සම්බන්ධයෙන් වූ අතර 26 ක් විවිධ පාර්ශවයන්ගේ පෞද්ගලික කරුණු සම්බන්ධයෙන් විය. එසේම මෙම නියෝජනයන් අතුරින් 318ක් යොමු කරන්නාගේ අනන්‍යතාවය සහිතව ඉදිරිපත් කර තිබුණු අතර, නියෝජනයන් 1378 ක් නිර්නාමිකව ඉදිරිපත් කර තිබුණි. මේ අතුරින් වැඩි ප්‍රමාණයක් ප්‍රමාණවත් හෝ යම් තරමක හෝ සාක්ෂි සහිතව ඉදිරිපත් කර තිබුණි. සාක්ෂි කිසිවක් නොමැතිව වුවද ලැබෙන පැමිණිලි ද පරීක්ෂාවන්ට ලක් කරනු ලැබේ.

වැඩිදුර විමර්ශන කටයුතු සඳහා යොමුකරන ලද ලිඛිත නියෝජනයන් පිළිබඳ ආංශික වර්ගීකරණයක් සිදුකිරීමේදී ප්‍රධාන වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා 193 ක් ද, පළාත් පාලන අංශය සඳහා 191 ක් ද, සෞඛ්‍ය ක්ෂේත්‍ර

සඳහා නියෝජනයන් 160 ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් නියෝජනයන් 148 ක් ද කෘෂිකර්ම පාරිසරික හා සේවක සුභ සාධනය යන ක්ෂේත්‍ර සඳහා පිළිවෙලින් 98ක් 72ක් සහ 65 ක්ද වශයෙන් නියෝජනයන් ලැබී තිබුණු අතර රජයේ විවිධ ආයතන සඳහා තවත් නියෝජනයන් 769 ක් ජාතික විගණන කාර්යාලය වෙත ලැබී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ලැබුණු මහජන නියෝජනයන් 216 ක් සහ පසුගිය වර්ෂයේදී ලැබුණු නියෝජනයන් 219ක් සම්බන්ධයෙන් විගණන කටයුතු 2021 වර්ෂයේ දී නිමකර නියෝජනයන් 68කට අදාළව නිරීක්ෂණ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද විගණකාධිපති වාර්තාවලට ඇතුළත් කිරීමට මේ වනවිට යෝජනා කර ඇත.

විගණකාධිපතිවරයා විසින් සිදුකරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය

විෂයයන්

- කාර්යසාධන විගණනය
- පරිසර විගණනය

නිකුත් කරන ලද කාර්යසාධන හා පරිසර විගණන වාර්තා

- කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය
- පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පූරනැගුම)
- දේශීය වෙළඳපොල තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය
- රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය
- ශ්‍රී ලංකාවේ බෝ නොවන නිදන්ගත රෝග වැලැක්වීම හා පාලන ක්‍රියාවලිය නියාමනය
- හම්බන්තොට, අනුරාධපුර, වවුනියාව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ඛණිජ ද්‍රව්‍ය (කළුගල්) කැණීම සඳහා රජයේ ඉඩම් බදුදීම, පාලනය සහ රාජ්‍ය භාගය අයකිරීම පිළිබඳ කාර්ය සාධනය
- ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම
- නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම
- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු වීමේ කාර්යසාධනය
- නැව් මඟින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය
- ශ්‍රී ලංකාවේ වෙරළ හා සමුද්‍රීය ජාතික උද්‍යාන සංරක්ෂණය
- ශ්‍රී ලංකාවේ භූගත ජල කළමණාකරණයේ නීතිමය යාන්ත්‍රණය හා එහි ක්‍රියාකාරීත්වය ඇගයීම

විගණකාධිපතිවරයා විසින් සිදුකරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 5(2) වගන්තිය යටතේ කාර්ය සාධන හා පරිසර විගණනය ඇතුළු විශේෂිත විගණනයන් මූල්‍ය විගනනයට අමතරව සිදු කරනු ලැබේ. ඒ අනුව යම් තෝරා ගත් ක්ෂේත්‍රයක් ඔස්සේ සිදුකරනු ලබන මෙම විගණනයන් සම්බන්ධයෙන් වූ වාර්තාද ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

කාර්යසාධන විගණනය මඟින් අපේක්ෂා කරනුයේ රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ යම් වියදම් ඒකකයක තෝරාගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එහි ක්‍රියාකාරීත්වයේ ආර්ථික බව, කාර්යක්ෂම බව, ඵලදායී බව හා පාරිසරික බලපෑම ඇගයීමට ලක් කිරීමයි. එහිදී අදාළ නිරීක්ෂණයන්ට අමතරව ඒවා නිවැරදි කර ගැනීමට අවශ්‍ය නිර්දේශද මෙම වාර්තාවන්හි දක්වා ඇත.

ජාතික විගණන කාර්යාලයේ ස්ථාපිත කොට ඇති කාර්යසාධන හා පාරිසරික විගණන ඒකකය මගින් සිදුකරන විගණනයන්ට අමතරව ජාතික විගණන කාර්යාලයේ විගණන ශාඛා මට්ටමින් සිදුකරන එකී විගණනයන්ද මීට අදාළ වේ.

2021 වර්ෂයේ නිමකර පාර්ලිමේන්තුවේ සභාගත කල එම කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවල ප්‍රධාන කරුණු ඇතුළත් සාරාංශගත වාර්තා පහත පරිදි ඉදිරිපත් කර ඇත.

කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් 4.57% ක් නියෝජනය කරනු ලබන වැවිලි ප්‍රජාව මුහුණුදුන් සමාජ විෂමතාවන් තුරන් කොට අන් ජන කොටස් හා සමාන සමාජ තත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරිමේ අදිටනින් 2015 සැප්තැම්බර් 25 දින ප්‍රකාශයට පත්කරන ලද අංක 1933 / 13 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් කඳුරට නව ගම්මාන ,යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදි. මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය භාරයක් වූ රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි පේලි නිවාසවල ජීවත්වන ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සැපයිමේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පෙර පැවති යටිතල පහසුකම් හා පශු සම්පත් ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේද, තරුණ අභිවෘද්ධි හා සමාජ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද කටයුතු කර තිබුණි. තවද, මෙම කාර්යයන් සාක්ෂාත් කරගැනීමට 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති වැවිලි

මානව සංර්ධන භාරයේ සහයෝගය ලබාගැනිමට 2006 දෙසැම්බර් 7 දිනැති අංක.අමප/06/2249/240/005 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.

ප්‍රජා සවිබල ගැන්වීම් හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යන් යටතේ දක්වා තිබූ වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරිමේ අරමුණින් නව ගම්මාන හා නගර නිර්මාණ කිරීම ක්‍රියාත්මක කිරීම යටතේ නිවාස ඉදිකිරීම් හා යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති සඳහා 2013 සිට 2019 දක්වා පමණක් අමාත්‍යාංශය මඟින් වැයකල මුළු මුදල රු. මි.7,600.13 ක් විය. එසේ තිබියදීත් වතු සේවයේ නියුතු පවුල් අතරින් සියයට 93 ක් සඳහා නිවාස අවශ්‍යතාවය පවතින බව නිරීක්ෂණය විය.ඒ අනුව මෙම ව්‍යාපෘතිය සකසුරුවම්ව, කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීම පිළිබඳව අඛණ්ඩව අධීක්ෂණය හා විගණනය සිදුවිය යුතු බැවින් මෙම මාතෘකාව කාර්යසාධන විගණනය සඳහා තෝරාගැනීම සිදු කරන ලදී.

නිවාස පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අනුමැතිය ලබාදී තිබූ කළමනාකරණ සේවය සැපයීමට අමතරව ප්‍රතිලාභීන් තෝරා ගැනීම, කොන්ත්‍රාත් ප්‍රදානය අනුමැතියකින් තොරව වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබා දී අමාත්‍යාංශය මඟින් ඉටුවිය යුතු අධීක්ෂණ කාර්යයද එම භාරයට පවරා තිබුණි.

වැවිලි කලාපයේ නිවාස සංවර්ධනය උදෙසා නව ගම්මාන සංවර්ධන අධිකාරිය නමින් ආයතනයක් 2018 ඔක්තෝබර් 05 දින පිහිටවා තිබූ අතර එම ආයතනය සඳහා 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 8.84 ක් වැය කර තිබුණද එහි කාර්ය භාරයද එවකට යටිතල පහසුකම් හා ප්‍රජාසංවර්ධන අමාත්‍යාංශයේ කාර්යභාරය වීමත් නිසා මෙම ආයතනය මඟින් අමතර විශේෂිත කාර්ය භාරයක් ඉටුනොවූ බව නිරීක්ෂණය විය.

මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කර තිබුණේ වතුවල සේවයෙන් නියුතු පවුල් සඳහා පමණක් පහසුකම් සැපයීම වුවත් එසේ නොවන අය වෙතද වතුවල පදිංචිවීමට පහසුකම් ලබාදී තිබූ අතර එම තත්ත්වය දිගුකාලීනව වතු ඉඩම් ප්‍රමාණය අඩුවීමට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

නිවාස සඳහා සුදුසු ඉඩම් තෝරා ගැනීමේදී අදාළ අමාත්‍යමණ්ඩල තීරණයට අනුව වගා නොකළ ඉඩම් නිවාස යෝජනා ක්‍රමය සඳහා සපයා ගත යුතු වුවද නුවරඑළිය හා හැටන් කලාපවල අක්කර 56.48 ක ප්‍රමාණයක වගාකල තේ ගලවා ඉවත්කර තිබුණි.

ප්‍රතිලාභින් තෝරා ගැනීම නිවැරදිව සිදුවේද යන්න අමාත්‍යාංශය මඟින් අධීක්ෂණය කළයුතු කාර්යයක් වන්නේය. එසේ වුවද ඒ සම්බන්ධ පරීක්ෂා කිරීමේදී නිවාස ප්‍රතිලාභීන්ගේ ලයිස්තුව හැරුණු විට වෙනත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

ඉදිකරනු ලැබූ නිවාස සඳහා නිවසේ අත්තිවාරමට කොන්ක්‍රීට් බීම්වල අවශ්‍යතාවය අදාළ ඇස්තමේන්තුවල නොතිබීම, ඒවායේ වහලයට ගැල්වනයිස් ඇණ අවශ්‍යතාවය ඇස්තමේන්තු නොකිරීම යන අඩුපාඩු නිසා එම නිවාස ඉදිකිරීම්වල දුර්වලතා පැවති අතර

ශ්‍රී ලංකාවේ දේශගුණික හා භූගෝලීය වශයෙන් වෙනස් වූ ප්‍රදේශ සියල්ලන්ටම එකම පිරිවිතර ඇතුළත් ඇස්තමේන්තු අදාළ කර ගැනීම, සම්මත ගොඩනැගිලි ඇස්තමේන්තුවට අනුව ඇස්තමේන්තු නොකිරීම හා විශේෂයෙන් වතුනිවාස 184ක් ඉදිවූ කොටියාගල වතුයායේ නායයාම් අවදානම සලකා නොබලා හා ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය භාවිතා කිරීම යන අඩුපාඩු නිසා නිවාසවල ප්‍රමිතිය අපේක්ෂිත මට්ටමක නොමැති විය.

නිවාස හිමිකම් ලබාදීමේදී ගිවිසුම් අත්සන් නොකිරීම නිසා පැරණි නිවාස ඉවත් කිරීමට පෙළඹීමක් ඇති නොවීම හා හිමිකම් ලබාදීමේ ප්‍රමුඛතා පිළිවෙල අමාත්‍ය මණ්ඩල තීරණවලින් අනුමත කර තිබුණද වැවිලි මානව සංවර්ධන භාරය විසින් එවැනි අවශ්‍යතා හඳුනාගෙන නොතිබීම,නිවාස සඳහා ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේදී ඒ සඳහා පොළිය අයකර ගැනීමට අදාළ විධිමත් වාර්තා නොපැවැත්වීම, වලංගු හා නීත්‍යානුකූල ගිවිසුම් වල අවශ්‍ය විස්තර ඇතුළත්ව සකසා අත්සන් නොකිරීම නිරීක්ෂණය විය. වැවිලි මානව සංවර්ධන භාරය විසින් එකතුකර අමාත්‍යාංශයට භාර නොදුන් ණය වාරික 2017 දෙසැම්බර් 31 දිනටරු.මිලියන 33.25ක්වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට නොලැබූ ණය වාරිකවල වටිනාකම රු.මිලියන 31ක් විය. මීට අදාළ හිඟ ආදායම් වාර්තා පිළියෙල කර නොතිබීම හා අදාළ මුදල් භාණ්ඩාගරය වෙත නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම යන ගැටළු නිරීක්ෂණය විය.

ඉන්දියානු රජයේ සහය ඇතිව නිවාස ඒකක 4000ක් ඉදිකර තිබූ අතර ඊට අදාළ ආපසු ගෙවන ණය වාරික වලට අදාළ වැව්ලි මානව සංවර්ධනභාරය වෙත රු.මිලියන 2.7ක අධි ගෙවීමක් නිරීක්ෂනය විය.

නිවාස ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයේදී ප්‍රසම්පාදනය පටිපාටි උල්ලංඝනයවීම් නිරීක්ෂණය වූ අතර ප්‍රතිපාදන ඉක්මවා කොටියාගල නිවාස ව්‍යාපෘතියට අදාළව රු.මිලියන 14.8ක් වැඩිපුර ගෙවා තිබුණි.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත නිවාස සංඛ්‍යා ඉදිකිරීමට අපොහොසත්වීම, ඇතැම් ඉදිකිරීම් අත්හැර තිබීමේ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඉදිකරන ලද නිවාසවල හැටන්, නුවරඑළිය ප්‍රදේශවල පදිංචිවීම අවම මට්ටමක පැවතුණි.

නිවාස ඉදිකිරීම් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ඉඩම් තෝරා ගැනීම හා ඉදිකිරීම් වලදී ඇස්තමේන්තු පිළියල කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය හා ඉදිකිරීම් අධීක්ෂණය කිරීම මෙන්ම නිවාස ණය අයකර ගැනීම යන කටයුතු වලදී අමාත්‍යාංශයේ අධීක්ෂණ මට්ටම තවදුරටත් වැඩිකල යුතු බවට නිර්දේශ කර තිබුණි.

පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)

1978 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1987 වර්ෂයේදී හඳුන්වා දුන් 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් පාලනය පළාත් සභා විෂයයක්ව පවතී. මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතන වර්ග 03 අතරින් කුඩාම පළාත් පාලන ආයතනය වන ප්‍රාදේශීය සභා, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් හඳුන්වාදී ඇත.

රටේ ප්‍රධාන නගරවලින් දුරබැහැරව පවතින ප්‍රාදේශීය සභාවලින් ජනතාවට ලබා දිය යුතු සේවාවන් ලබා දීම, අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම එම ප්‍රාදේශීය සභාවන්ට ස්වශක්තියෙන් සිදු කර ගැනීම දුෂ්කර වීම හේතුවෙන් මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන විදේශීය ණය ව්‍යාපෘති මගින් මෙම පළාත් පාලන ආයතන නගා සිටුවීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රාදේශීය සභා මට්ටමේදී ප්‍රාදේශීය පාලන නායකත්වයේ මහ පෙන්වීම හා නිලධාරීන්ගේ අවංක කැපවීම මත ආර්ථික දුෂ්කරතා මඟහරවා ගනිමින් ජනතාවට උපරිම සේවයක් ලබාදීම සඳහා කටයුතු කරනු ලබන ප්‍රාදේශීය සභාවන් පැවතියද ජනතාවට අවශ්‍ය ව්‍යාපෘති හඳුනා ගෙන අවශ්‍යතා අනුපිළිවෙළකට පෙළ ගස්වා නොගෙන කටයුතු කරන ආයතන පවතී.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියට පවරා ඇති විෂය පථය තුළ වූ කාර්යභාරය දෙයාකාර වේ.

- අනිවාර්යයෙන් ඉටුකිරීමට බැඳී ඇති කාර්යයන්
- ඉටුකිරීමට බලය ඇතත් අනිවාර්ය නොවූ කාර්යයන්

පළාත් පාලන ආයතනයක් මඟින් අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු කාර්යයන් ලෙස බල ප්‍රදේශය තුළ ඇති මංමාවත් සහ මහජන සෞඛ්‍යයට අදාළ වන කර්තව්‍යයන්

(Duties) නීතියෙන් නියම කොට ඇත. එම කටයුතු ඉටු නොකිරීම හෝ හිතාමතා පැහැර හැරීම යුතුකම හා වගකීම පැහැර හැරීමක් ද වන්නේ ය.

ඉටුකිරීමට බලය පැවරී ඇති මුත් අනිවාර්යයෙන් ම ඉටුකිරීමට නීතියෙන් නියම වී නැති කාර්යයන් ද තිබෙන අතර පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති පොදු උපයෝගිතා සේවා, සුබසාධන සේවා, අධ්‍යාපන, ආගමික හා සංස්කෘතික සේවා මීට අයත් වේ. මෙම සේවාවන් සැලසීමට බලය ලැබී ඇතත් ඒවා ඉටු කළ හැක්කේ ආයතනයේ සම්පත් ප්‍රමාණය හා ජනතාව ඒ කෙරෙහි ඇති ඉල්លුම හෙවත් අවශ්‍යතාව සැලකිල්ලට ගැනීමෙනි. ආයතනයේ ප්‍රමුඛතාව ලැබිය යුත්තේ ආයතනයේ යුතුකම් හා වගකීම් ඉටුකිරීම පිණිස ය.

ඒ අනුව මාතෘ සායනයේ පටන් ආදාහනාගාරය දක්වා වූ මිනිස් ජීවිතයට අවශ්‍ය සියලුම පහසුකම් සැපයීමේ වගකීම පළාත් පාලන ආයතන වෙත ම පැවරී තිබේ. ඒ අනුව මාතෘ සායන, සෞඛ්‍ය සායන, බෙහෙත් ශාලා, ආයුර්වේද වෛද්‍ය සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, කැළි කසළ කළමනාකරණය, බෝවන රෝග හා වසංගත රෝග පාලනය කර ගැනීම, නගර නිර්මාණය, නාගරික සැලසුම් අනුමත කිරීම, වීථි ආලෝකකරණය, කර්මාන්තශාලාවලින් සිදුවන පරිසර හානි වළක්වා ගැනීමට කටයුතු කිරීම, දරුවන් හා වැඩිහිටියන් සඳහා පුස්තකාල සේවා පවත්වාගෙන යාම, ළදරු පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පමණක් නොව ආදාහනාගාර හා සුසාන භූමි පවත්වාගෙන යාම, නගරය සෞඛ්‍යාරක්ෂිතව හා අලංකාරව පවත්වාගෙන යාමේ වගකීමත් මෙම කුඩා ආයතනයට පැවරී ඇත.

පළාත් පාලන ආයතන සතු බලතල මෙන් ම නාගරික පදිංචිකරුවන්ගේ ඉල්ලීම් හේතුවෙන් ද යහපාලන මූලධර්මයන්ගෙන් බැහැරව ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මහජන ඉල්ලීම් ඉටුකිරීමට අසමත් ආයතන ලෙස බොහෝ දෙනෙකු විසින් හඳුනාගෙන ඇත.

කෙසේ වුව ද මහජනතාවට ප්‍රමාණවත් සේවයක් සපයන, ආදායම අතින් ශක්තිමත් පදනමක් සහිත පළාත් පාලන ආයතන පද්ධතියක් ගොඩ නගා ගැනීම මගින් රට වැසියාගේ දිවි පැවැත්ම වඩාත් පහසු කරවනු නොඅනුමාන ය. ඒ සඳහා මධ්‍යම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අත්‍යවශ්‍ය හා සාර්ථක ව්‍යාපෘති බවට පත් වීමත්, එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට හා පළාත් පාලන ආයතනවලට ලැබීමත් අත්‍යවශ්‍ය කරුණු බවට අවධාරණය කෙරේ.

එසේ වුවත් පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති කළමනාකරණ සංග්‍රහයේ සඳහන් නිර්නායකවලට අනුකූලව උප ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා අධ්‍යයනයන් සිදු නොකර උප ව්‍යාපෘති තෝරා ගැනීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය, ක්‍රියාකාරී සැලසුම් සහ ව්‍යාපෘති මූල්‍ය සැලසුම් කළමනාකරණ සංග්‍රහය අනුව සකස් නොකිරීම, ප්‍රසම්පාදන ප්‍රමාදයන්, ඉදිකිරීම්වල

අයෝග්‍යතාවයන්, ඉදිකිරීම් නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතීම මෙන්ම අපේක්ෂිත අරමුණු ඉටුනොවන අවස්ථාවන් බහුල ව පවතින බව මෙන්ම නියමිත කාල වකවානුව තුළ ඉදිකිරීම් අවසන් කර ව්‍යාපෘතිය අවසන් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති කාර්යාල පවත්වා ගෙන යාමට සහ උපදේශක සමාගම්වලට අතිරේක ගෙවීම් කිරීමට සිදුවීම ඇතුළු කරුණු විගණනයේදී නිරීක්ෂණය විය.

ඒ අතරින් ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව 2011 ඔක්තෝබර් 21 දින එළඹී අංක 2790 SRC (SF) දරන ණය ගිවිසුම මගින් පළාත් සභා 7කට අයත් ප්‍රාදේශීය සභා 100 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 68.8ක් එනම් රුපියල් මිලියන 8,940ක් යෙදවීමටත්, එයින් රු.මිලියන 7,892 කට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 59ක් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යයනය කිරීමටත් එකඟ වී තිබුණි. කෙසේ වුව ද විදේශ ගැනුම් හිමිකම්වලට එරෙහිව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් ප්‍රතිප්‍රමාණය වීම හේතුවෙන් ණය නියෝජිතායතනය එකඟ වන ලද මුදල රුපියල් මිලියන 7,892 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 52.04 ක් ලෙස පසුව තීරණය කර තිබුණි. ඊට අමතරව ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් වැඩි වූ රුපියලේ වටිනාකමත් සමඟ පළාත් පාලන ආයතන ගණන 108 ක් දක්වා ඉහළ දමා තිබුණු අතර 2015 ජුනි 30 වන විට නිම කළ යුතුව පැවති ව්‍යාපෘතිය 2017 ජුනි 30 දක්වා වසර 2කින් දීර්ඝ කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 332.19 ක වියදමෙන් ඉදිකරන ලද බස් නැවතුම් පොළවල් 04 ක්, ජල සම්පාදන ව්‍යාපෘති 04ක්, බහුකාර්ය ගොඩනැගිලි 02 ක් සහ සනීපාරක්ෂක මධ්‍යස්ථාන 03 ක් අදාළ පළාත් පාලන ආයතන වෙත භාර දී තිබූ අතර සම්පූර්ණයෙන්ම නිශ්ක්‍රීයව පැවතුණි.

රු.මිලියන 513.73 ක වියදමෙන් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි 12 ක් ද, රු.මිලියන18.90 ක වියදමෙන් ඉදිකරන ලද පුස්තකාලයක් ද, රු.මිලියන 105.06 ක වියදමෙන් ඉදිකරන ලද සතිපොළවල් 03ක් ද විවිධ හේතු මත ඌන උපයෝජිතව පැවතුණි.

ඡායාරූපය - ඌන උපයෝජිතව පැවති කල්පිටිය පුස්තකාල ගොඩනැගිල්ල

ඡායාරූපය - ඌන උපයෝජිතව පැවති කල්පිටිය පුස්තකාල ගොඩනැගිල්ල

ඡායාරූපය - ඌන උපයෝජිතව පැවති සූරිය වැව සති පොළ

ඡායාරූපය - ඌන උපයෝජිතව පැවති සූරිය වැව සති පොළ

මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර පළාත් පාලන ආයතනවලට භාර දෙන ලද ව්‍යාපෘති අතරින් රු.මිලියන 666.15 වැය කර ඉදිකරන ලද උප ව්‍යාපෘති 19කින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබූ බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ඡායාරූපය - අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර නොගත් පොල්පිතිගම බහුකාර්ය ගොඩනැගිල්ල

ඡායාරූපය - අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර නොගත් මාවතගම බස් නැවතුම්පල

මාතෘ සායන, වෛද්‍ය සායන, පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පුස්තකාල, ශ්‍රවණාගාර ආදී අංගවලින් සමන්විතව ඉදිකරන ලද වටිනාකම රු.මිලියන 90.35ක්වූ බහුකාර්යය ගොඩනැගිලි 02 ක් අපේක්ෂිත කාර්යයන්වලට භාවිත නොකර ප්‍රාදේශීය සභා කාර්යාල ලෙස භාවිත කරනු ලබන බව නියැදි විගණන පරීක්ෂාවේදී තහවුරු විය.

ඒ අනුව පළාත් පාලන ආයතන මඟින් ඉටුකරනු ලබන අනිවාර්ය අවශ්‍යතාවයට පමණක් ව්‍යාපෘති හඳුනාගැනීම, අදාළ ව්‍යාපෘති

ආරම්භ කිරීමට පෙර ඒවා හොඳින් අධ්‍යනය කිරීම හා දැනට ඵලදායී ලෙස උපයෝජනය නොවන ව්‍යාපෘති ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ මෙම වාර්තාවේ නිර්දේශ ලෙස දක්වා ඇත.

දේශීය වෙළඳපොළ තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් SLS ලාංඡනය ලබා දීම, ආනයන භාණ්ඩ වල තත්ත්වය පරීක්ෂාව, රසායනාගාර සේවා සැපයීම, ශ්‍රී ලංකා ප්‍රමිති පිලියෙල කිරීම, ප්‍රමිතිකරණය හා කර්මාන්ත වල තත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම, පුස්තකාල සේවාව පවත්වා ගැනීම තත්ත්ව පාලනය පිළිබඳ සහතික ලබා දීම යනාදී සේවාවන් සපයනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනත යටතේ ලංකා ප්‍රමිති කාර්යාංශය නමින් පිහිටුවා තිබුණි. 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මඟින් ලංකා ප්‍රමිති කාර්යාංශ පනත අවලංගු කොට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවා තිබූ අතර එහිදි ප්‍රමිති ප්‍රචලිත කිරීමේ සහ ශ්‍රී ලංකාවේ තත්ත්ව කලමනාකරණ පරිචයන් සඳහා සවිබල ගැන්වීම් ලබා දී තිබුණි. මෙම සේවාවන් සැපයීම සඳහා හා පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනීම සඳහා ආයතනය විසින් අනු ශාඛා 12කට බෙදා පවත්වාගෙන යනු ලබයි. එම අංශ භාණ්ඩ සහතිකකරණ අංශය, පද්ධති සහතිකකරණ අංශය, අලෙවි හා ප්‍රවර්ධන අංශය, විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය, ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය, තත්ත්ව සහතිකකරණ අංශය, පුහුණු අංශය, මූල්‍යය අංශය, ලේඛන හා තොරතුරු අංශය, පරිපාලන අංශය, රසායනාගාර අංශය, තොරතුරු තාක්ෂණ අංශය හා අභ්‍යන්තර විගණන ඒකකය ලෙස නම් කර පවතී.

පාරිභෝගිකයාට ගුණත්වයෙන් ඉහළ භාණ්ඩයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සතු කාර්යභාරයට අනුව යම් විශ්වාසයක් ගොඩනගාගෙන ඇත. ආයතනයට ඉහළ පිළිගැනීමක් පවතී. ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන නිෂ්පාදකයින් සඳහා ක්‍රමවේදයකට අනුව ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා දීමත්, ආනයන භාණ්ඩ වල තත්ත්ව පරික්ෂා කර ඒ පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබාදීමත් ආයතනය විසින් සිදුකරන ප්‍රධාන කාර්යයන් අතර වේ.

ආරක්ෂිත හා සෞඛ්‍ය ගැටළු රහිත භාණ්ඩ පාරිභෝජන ජනතාවක් සිටින රටක සංවර්ධනය ඉතා ඉහල මට්ටමක පවතියි. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව තුළ ද සෞඛ්‍යාරක්ෂිත ආහාර පරිභෝජනයට හුරු වීම තුළින් රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට හැකියාව පවතියි. ඒ සඳහා දේශිය නිෂ්පාදකයින් දිරිගැන්වීම නිරන්තරයෙන් සිදු කළ යුතුය. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට කළ හැකි කාර්යභාරය ඉතා වැදගත් වේ. ඒ සඳහා 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මඟින් විධිවිධාන සපයා ඇත. එසේ වුවද පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරිම හා පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනිම සම්බන්ධයෙන් ප්‍රමිති ආයතනය කටයුතු කර තිබේදැයි පරික්ෂා කිරීම සඳහා මෙම කාර්යසාධන විගණනය සිදුකර ඇත.

ඉහත අරමුණු ඉටු කිරීම වෙනුවෙන් පසුගිය වර්ෂ තුනනෙහි ආයතනික මෙහෙයුම් වියදම් **2019, 2020** සහ **2021** වර්ෂ වල පිළිවෙලින් රු.මිලියන **775** ක, රු.මිලියන **889** ක සහ රු.මිලියන **808** ක වියදම් වැය කර තිබුණි.

තවද **2021** වර්ෂය අවසානයට මෙම ආයතනයේ කාර්යන් ඉටුකිරීම පිණිස සේවයේ නියුතු කාර්ය මණ්ඩලය අතර, මාණ්ඩලික ශ්‍රේණියේ **132** ක් ද, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ **102** ක් ද, කණිෂ්ඨ සේවයේ **44** ක් ද වශයෙන් සේවයේ යොදවා තිබුණි.

මෙම වාර්තාවේ හඳුනාගත් නිරීක්ෂණයන් අතර, ආනයනික භාණ්ඩ පරික්ෂාවේදී පරික්ෂණ වාර්තා නිකුත්වීමට ප්‍රථම භාණ්ඩ වෙළඳපොලට නිකුත් වූ අවස්ථා, ප්‍රමිති සහතිකය නිකුත් කිරීමේදී සිදුව ඇති දුර්වලතා, කළමනාකරණ දුර්වලතා, රසායනාගාර පරීක්ෂණ සිදුකිරිමට ප්‍රමාද වීම, වෙළඳපොල පරික්ෂාවන් සිදුකිරිම අවම මට්ටමක පැවතීම, ප්‍රමිති භාවිතය පිළිබඳ දැනුවත් කිරීම අවම වීම, පරික්ෂණ වාර්තා අසමත් වූ භාණ්ඩ සම්බන්ධව විධිමත්ව කටයුතු කිරීමට අපොහොසත් වීම යනාදී කරුණු විය.

මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිදි ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා අනුකූලතා සහතික නිකුත් කරන දේශීය හෝ විදේශීය පර්යේෂණ ආයතන ප්‍රමිත ආයතනය තුළ ලියාපදිංචි වීම ඉතා අවම වීම, මාර්ගෝපදේශ සංග්‍රහයේ තෙවන වර්ගීකරනය අනුව භාණ්ඩ ගෙන්වන ආයතන ප්‍රමිති ආයතන ලියාපදිංචි වී අනුකූලතා සහතික ලබා ඇත් නම් නියැදි පරීක්ෂාවකින් තොරව ඒවා විකිණීමට නොහැකිවීමේ අවශ්‍යතාවය සපුරා තිබීම අවම මට්ටමක විය. තවද ප්‍රමිත ආයතනයේ පර්යේෂණ වාර්තා ලැබෙන තෙක් අදාළ භාණ්ඩ වෙළඳපලට නිකුත් කල නොහැකි බැවින් ඒවා පරීක්ෂා කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ නිකුත් කර නොතිබුණි.

තත්ත්වයෙන් උසස් සෞඛ්‍ය ආරක්ෂිත ආහාර ද්‍රව්‍යය මෙරටට ගෙන්වා ගැනීමට නම් ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍යය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිෂ්පාදන සහතිකය **(SLS)** ලබාගැනීම අනිවාර්ය කල යුතු වුවත් ආනයනය කරනු ලබන කිසිඳු ආහාර ද්‍රව්‍යයක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිෂ්පාදන සහතිකය **(SLS)** ලබාගැනීම අනිවාර්ය කර නොමැති බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් **2019** ජනවාරි **01** දින නිකුත් කර තිබුණු **LT - PC - 01** නිෂ්පාදන සහතිකය අනිවාර්ය කර ඇති භාණ්ඩ ලැයිස්තුව අනුව නිරීක්ෂණය විය.

රසායනාගාර පහසුකම් ප්‍රමිත ආයතනය වෙනුවෙන්ම ඇතිකිරීම අනිවාර්යය නමුත් එවැනි පහසුකම් ඇති කිරීමට **2018** වර්ෂය වන විට ඒ සඳහා රු.මිලියන **169**ක් වියදම්කර ඇතත් අදාළ ඉඩමේ අයිතිය නිරවුල් නොවීම මත එම පහසුකම් ඇති කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව රසායනාගාර පහසුකම් නොමැතිවීමෙන් රසායනාගාර වාර්තා අසාමාන්‍ය ලෙස ප්‍රමාදවීමත් ඒහේතුවෙන් එම වාර්තා නොමැතිව භාණ්ඩ වෙළඳපලට නිකුත් වීමට ඉඩ ප්‍රස්තා ඇතිවී තිබුණි.

මහජන ආරක්ෂාව හා තත්ත්වයෙන් උසස් භාණ්ඩ වෙළඳ පොළට නිකුත් කිරිමට අවශ්‍ය

පහසුකම් සැලසීමේ දී , නිෂ්පාදන සහතික ලාංඡනය (SLS සහතිකය) ඉවත් කරන ලද සහ තහනම් කරන ලද භාණ්ඩ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පනතේ ඇතුළත් කාර්යයන් වුවත් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් (පුවත් පත්, දැන්වීම්, අන්තර් ජාල, ගුවන් විදුලි, රූපවාහිනි දැනුවත් කිරීම්) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

තවද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති CS (Ceylon Standard) හා SLS ප්‍රමිති ගණන 4100 ක් වන අතර 2017, 2018 හා2019 යන ආසන්න වසර 03 ක ප්‍රමිත විකුණුම් පිළිබඳ ඇගයීමේදී විගණනය විසින් නිරීක්ෂණය කළ පරිදි නිකුත් කර ඇති ප්‍රමිත අතරින් ප්‍රමිත 500 – 600 අතර ප්‍රමාණයක් භාවිතයට නොගන්නා බව අනාවරණය විය. යම් කාලයක්, ශ්‍රමයක් හා පිරිවැයක් දරා ප්‍රමිති ආයතනය විසින් සකස් කරනු ලබන ප්‍රමිත ප්‍රයෝජනයට නොගැනීමෙන් ගම්‍ය වන්නේ මෙලෙස භාණ්ඩ ප්‍රමිත සම්බන්ධයෙන් නියාමනයන් සිදු නොවීම හේතුවෙන් බාධාවකින් තොරව ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපොලට නිකුත් වීමේ ඉඩ ප්‍රස්ථා ලැබී ඇති බවයි. එවැනි භාණ්ඩ වලට උදාහරණ ලෙස ගෑස්,පොල්තෙල්,විවිධ විදුලි උපකරණ,කිරිපිටි ආදිය දැක්විය හැක.

2019 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලයට අදාළව ආනයනය කරන ලද ,ශ්‍රී ලංකා ප්‍රමිති වලට අනුකූල නොවීම හේතුවෙන් භාවිතය හෝ විකිණීම තහනම් කරන ලද භාණ්ඩ 73 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පරීක්ෂාවේදී සිද්ධීන් 73 අතුරින් සිද්ධීන් 49 ක් සඳහා පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණු අතර ඉන් සිද්ධී 7 ක් පිළිබඳව පමණක් පරීක්ෂණ කටයුතු නිමා කර තිබුණි. ඒ තුළ ප්‍රති අපනයනය කළ බවට වාර්ථා ඉදිරිපත් කර තිබුණේ අවස්ථා 02 කදී පමණි.

ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු අවම කරගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිෂ්පාදන සහතික ලාංඡනය ලබා ගැනීමේ වැදගත් කම සම්බන්ධයෙන් අදාළ පාර්ශව දැනුවත් කිරීම, එම ලාංඡනය ලබා දීමේ ක්‍රමවේදය තව දුරටත් ශක්තිමත් කිරීම, අනෙකුත් අදාළ සම්බන්ධිත ආයතන සමඟ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, නිෂ්පාදන සහතික ලාංඡන නිකුත් කිරීම හා රසායනාගාර පරීක්ෂණ වලට අදාළව ආයතනික වශයෙන් අවශ්‍ය සම්පත් ලබාදීම හා එමඟින් එම ක්‍රියාවලීන් ඉක්මන් කිරීම යන කරුණු සම්බන්ධයෙන් මෙම වාර්තාවේ නිර්දේශ ලබා දී ඇත.

රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය

1931 දී සර්වජන ඡන්ද බලය ලබා දීමෙන් පසු ආචාර්යය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතාගේ මූලිකත්වයෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත විය. මේ යටතේ සැමට අධ්‍යාපනය ලබා දීම සඳහා රජය විසින් දිවයින පුරා මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කරන ලදි.

මෙම නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වෙමින් යන අතරතුර මිෂනාරි පාසල් හා ඇතැම් බෞද්ධ පෞද්ගලික පාසල් වශයෙන් ගාස්තු අයකරන පාසල් බොහොමයක් 1960

අංක 05 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතින් රජයට පවරා ගැනීමට කටයුතු කර ඇත.

1961 අංක 08 දරන උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය මගින් අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාවක (අවුරුදු 5-14 දක්වා) වයසේ පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පාසල් ආරම්භ කිරීමට පෞද්ගලික අංශයට නොහැකි බවට විධිවිධානයක් පනවා ඇත. එවැනි නීතිමය තත්ත්වයක් පැවතිය ද 1980 දශකය වනවිට ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටින විදේශීය ප්‍රජාවගේ දරුවන් ඉලක්ක කොට ගත් ජාත්‍යන්තර පාසල් නමින් අධ්‍යාපන ආයතන ආරම්භ වී ඇති අතර වර්තමානයේ ශ්‍රී ලාංකීය සිසුන් සැලකිය යුතු ප්‍රමාණයක් එම පාසල්වල දේශීය හා විදේශීය විෂය නිර්දේශ යටතේ ඉගෙනුම ලබති.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ අංක 29 හි 2 වන ඡේදය අනුව වයස අවු.18 ට අඩු ළමයෙකු සඳහා අධ්‍යාපනය ලබාදීමේ දී අනුකූල විය යුතු නිර්ණායක හඳුන්වා දී තිබිය යුතුය. එසේම ළමුන් වෙත අධ්‍යාපනය ලබාදෙන ආයතන විසින් රජය මගින් හඳුන්වා දී ඇති නිර්ණායක අනුව තම ආයතන පවත්වාගෙන යන බවට තහවුරුවක්ද ලබාදිය යුතුය.

එසේම 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු අංක 4 අනුව පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා එහි ඉලක්ක 4.1 අනුව, ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරුකල යුතුය.

ශ්‍රී ලංකාවේ පාසල් යන වයසේ දරුවන් අධ්‍යාපන ලබන පාසල් ව්‍යුහය පිළිබඳ තොරතුරු වගුව 04 පරිදි වේ.

ආයතනය			ආයතන සංඛ්‍යාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව
(අ)	රජයේ පාසල් (ජාතික හා පළාත්)		10,165	4,061,653
(ආ)	රජයේ අනුමත පෞද්ගලික පාසල්		89	135,600
(ඇ)	ජාත්‍යන්තර පාසල්		391 (දළ වශයෙන්)	139,727
(ඈ)	ආගමික පාසල්			
	(i)	පිරිවෙන්	801	68,319
	(ii)	සීලමාතා ආයතන	03	45
	(iii)	කතෝලික- දෙව්සත්හල්	04	16
	(iv)	හින්දු- පූජකවරුන් සඳහා අධ්‍යාපනය ලබා දෙන	03	40

	(v)	මද්‍රසා පාසල්/ අරාබි පාසල්	317 (මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සංඛ්‍යාව පමණි. මින් 32ක් ක්‍රියාත්මක නොවන බව දක්වා ඇත.)	28,424

වගුව 04 - ශ්‍රී ලංකාවේ පාසල් යන වයසේ දරුවන් අධ්‍යාපන ලබන පාසල් ව්‍යුහය

මේ අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් හා මද්‍රසා පාසල් යන පාසල් නියාමනය වන ආකාරය ඇගයීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදු කරන ලදී. රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් මෙහිදී හඳුනාගත් ප්‍රධාන නිරීක්ෂණ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මගින් රජයේ සියලු පාසල්වල ඉගෙනුම් ක්‍රියාවලිය අධීක්ෂණය කෙරුණ ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයපථයට අයත් නොවන බව පවසමින් රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් එවැනි පුළුල් අධීක්ෂණයක් සිදුනොවන බවත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා චක්‍රලේඛ නිකුත් කර තිබුණු නමුත් එම චක්‍රලේඛවල සඳහන් කරුණුවලට අනුගත නොවන පාසල් පවතින බවත්, එවැනි රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණයට යාමේදී ඒ සඳහා අවශ්‍ය සහයෝගය එම පාසල්වලින් නොලැබෙන බවත් නිරීක්ෂණය විය.

එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික අනුමැතියකින් තොරව ඇතැම් මව් පාසල් විසින් ශාඛා පාසල් ආරම්භ කර තිබීම, ගුරුවරුන් බඳවා ගැනීමේදී උපාධිධාරීන් නොවන ගුරුවරුන් බඳවා ගැනීම, විනය කාරණාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජනයකින් තොරව පාසලෙන් ආගමික නිකායන්ගෙන් පමණක් මූලික පරීක්ෂණ සිදු කිරීම යනාදී කරුණු නිරීක්ෂණය විය.

මෙම පාසල්වල පවතින භෞතික හා මානව සම්පත් මෙන්ම ලබාදෙන සේවාවන් අනුව පාසල් ශ්‍රේණිගත කිරීමක් කොට ඒ අනුව අයකල යුතු උපරිම හා අවම ගාස්තු පරාසයන් පිළිබඳ සීමා පැනවීමක් අධ්‍යාපන අමාත්‍යංශය විසින් සිදු කර නොතිබුණි. ඇතැම් රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා රජය විසින් නිලඇඳුම්, පොත්පත් හා ගුරු වැටුප් සඳහා වැය බරක් දැරුවද, එම පාසල්වල කළමනාකාරීත්වයේ අභිමතය පරිදි පාසල් ගාස්තු ඇතුළු වෙනත් අයකිරීම් කරනු ලබයි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වීමක් හෝ කිසිදු ආකාරයක නියාමන කාර්යයක්

ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් සිදු නොවීම දැක්විය හැක. එහෙත් සමාගම් ලියාපදිංචි කිරීමේ පනත/ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ව්‍යාපාරික ආයතන ලෙස ලියාපදිංචි වන මෙම පාසල්වල පවතින භෞතික පහසුකම් වල අඩුපාඩු, ගුරුවරුන්ගේ සුදුසුකම් හා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගැටළු, ගාස්තු අයකිරීම් විෂමතා ඇතුළු අනෙකුත් ගැටළු පිළිබඳ වරින් වර විවිධ මහජන නියෝජනයන් අධ්‍යාපන අමාත්‍යාංශයට වාර්තා වී තිබුණි. මේ අතර දිවයිනේ ඇතැම් ප්‍රසිද්ධ යැයි සම්මත, වැඩි දෙමාපිය ආකර්ශනයක් හිමි කරගත් ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන් නිසි පරිදි ඉගැන්වීම් නොකිරීම, වරින් වර ගුරුවරුන් මාරුවීම, සුදුසුකම් නොලත් ගුරුවරුන් ඉගැන්වීම, විෂය නිර්දේශ ආවරණය නොකිරීම, ළමා මානසික තත්ත්වය තේරුම්නොගත් ඉගැන්වීම් ක්‍රම භාවිතා කිරීම, අසාධාරණ ලෙස ගාස්තු අයකිරීම, දරුවන්ට ලිංගික අපයෝජනයන් සිදුවීම වැනි සිදුවීම්වලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත් වීම අවම විය.

ජාත්‍යන්තර පාසල් සම්බන්ධව පැන නැගුනු විවිධ ගැටළුකාරී අවස්ථාවලදී දේශීය හා විදේශීය පාර්ශවයන් විසින් විවිධ කරුණු අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විමසීම් කරනු ලබයි. එයින් අදහස් වන්නේ ජාත්‍යන්තර පාසල් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම සම්බන්ධ නියමිත අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය බවට සමස්ත ප්‍රජාව විශ්වාස කිරීමයි. නමුත් මෙම සියළු විමසීම්වලදී අධ්‍යාපන අමාත්‍යාංශය තමන්ගේ මැදිහත්වීමක් නොමැති බවට ඒ ඒ ආයතනවලට පිළිතුරු ලෙස ලබා දුන්නද මෙම නියාමන කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශය සතු විය යුතු බව හඳුනාගෙන නොතිබුණි.

මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති මද්‍රසා පාසල් සංඛ්‍යාව 317 ක් පමණක් වුවත් 2021 සැප්තැම්බර් 06 දින වන විට පාසල් 32ක් ක්‍රියාත්මක නොවන බව එම දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා ඇත. දිවයින පුරා මද්‍රාසා පාසල් 1700 කට ආසන්න ප්‍රමාණයක් ක්‍රියාත්මක වන බවත් මේ සම්බන්ධ දත්ත නොමැතිවීම හා කිසිඳු රාජ්‍ය ආයතනයකින් මෙම පාසල් අධීක්ෂණය හෝ නියාමනයක් සිදුනොවීම දැක්විය හැක. මෙම දරුවන්ට සාමාන්‍ය අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් අදාළ දිස්ත්‍රික්කවල පිහිටා තිබියදී මෙවැනි පාසල් සඳහා අනිවාර්යය අධ්‍යාපනය හැදෑරිය යුතු වයසේ දරුවන් යොමුවීම පිළිබඳ නියාමනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වී නොතිබුණි.

මෙම පාසල් සම්බන්ධ ජාතික වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය නිර්දේශයක් මත ඉගැන්වීම් සිදු නොකිරීම, පිළිගත් ආයතනයක් මගින් මෙම පාසල්වල ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු නොකිරීම, මෙම පාසල්වල ළමුන් සංඛ්‍යාව, උගන්වන ගුරුවරු සංඛ්‍යාව හා ඔවුන්ගේ සුදුසුකම් හා මෙම පාසල්වල ළමුන් ට මූලික පහසුකම් පවතීද යන්න පිළිබඳවත්, මෙම පාසල්වල මූල්‍ය තත්ත්වය කුමක්ද යන්න හා අරමුදල් සපයා ගන්නා ප්‍රභවය කුමක් ද යන්න

පිළිබඳවත්, මෙම පාසැල් පිළිබඳව කිසිඳු රාජ්‍ය ආයතනයකින් නියාමනයක් සිදු නොවන බවත් 2020 පෙබරවාරි 19 දිනැති ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික කමිටු වාර්තාවේද දක්වා තිබුණි.

අනිවාර්යය අධ්‍යාපනය ලබාදිය යුතු වයසේ සියලු දරුවන්ට ජාතික වශයෙන් පිළිගත් ප්‍රමිති සහගත අධ්‍යාපනයක් ලබාදීමට පවතින රජයන් කටයුතු කළ යුතු බවත්, ගෝලීය අවශ්‍යතාවයන්ට සරිලන එවැනි අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවය මේ වන විට මතුව ඇති හෙයින් එවැනි අවශ්‍යතාවයකට සරිලන අධ්‍යාපනය ලබාදෙන මුවාවෙන් ව්‍යාපාරික මධ්‍යස්ථාන බිහිවීම වැළැක්වීමට සියලු අධ්‍යාපන ආයතන නියාමනය කිරීමේ මධ්‍යම කේන්ද්‍රස්ථානය බවට අධ්‍යාපන අමාත්‍යාංශය පත්විය යුතු බවත් මෙම විගණනය මගින් නිර්දේශ කෙරේ.

ශ්‍රී ලංකාවේ බෝ නොවන නිදන්ගත රෝග වැලැක්වීම හා පාලන ක්‍රියාවලිය නියාමනය

ශ්‍රී ලංකාව තුළ බෝ නොවන රෝග හේතුවෙන් පුද්ගලයින්, රෝගීභාවයට පත්වීම, මරණයට පත්වීම හා එමඟින් සාමාජීය හා ආර්ථික වශයෙන් කෙරෙන බලපෑම වර්තමානය වන විට බරපතල ගැටළුවක් බවට පත්ව තිබේ.

බෝ නොවන රෝග ජාතික ප්‍රතිපත්තිය යටතේ දක්වා ඇති හෘද රෝග, ශ්වසන රෝග සහ දියවැඩියාව සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග ඒකකය විසින් ක්‍රියාත්මක කරනු ලබන බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය සම්බන්ධයෙන් වන ජාතික බහු ආංශික ක්‍රියාකාරී සැලැස්මෙහි (2016-2020) ක්‍රියාත්මකභාවය පිළිබඳව අපගේ විෂය පථය යටතේ සලකා බලන ලදී. බෝ නොවන රෝග වැළැක්වීම හා පාලනය සම්බන්ධයෙන් වන අරමුණු පාර්ශවයන් රැසකගේ සහභාගිත්වයෙන් යුතුව ජයගත යුතු වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සහ එය යටතේ වන විවිධ ඒකකයන්, පළාත් සහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අධ්‍යාපන, පරිසර, කෘෂිකර්ම, ක්‍රීඩා, පළාත් සභා ඇතුළු අමාත්‍යාංශ ගණනාවක් සහ සුරාබදු දෙපාර්තමේන්තුව, දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය වැනි ආයතන ගණනාවක්ද මෙම බහු ආංශික ක්‍රියාකාරී සැලසුම තුළ වන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම පැවරුණු පාර්ශවයන් වේ. අපගේ විගණනයේ අරමුණ වූයේ බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා කටයුතු කරනු ලබන ආයතන හා ඊට අදාළ විශේෂිත ඒකක මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මගින් බෝ නොවන රෝග වැළැක්වීම හා පාලනයට අදාළ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර ඇත්ද යන්න ඇගයීම සහ ඒ සඳහා ඇති බාධාවන් මොනවාද යන්න හඳුනාගැනීම වේ.

මෙම විගණනයෙහි ප්‍රධාන නිරීක්ෂණයන් අතර,දුම්පානයට අදාළවන දුම්කොළ භාවිතය සම්බන්ධයෙන් දුම්කොළ පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කර නොතිබීම, වැඩිම අලෙවියක් සහිත තනි සිගරට්ටුව අලෙවිය අඩුකිරීම සම්බන්ධයෙන් නීති සකසා නොතිබීම, දුම්කොළ භාවිතය ව්‍යාප්තිය අවම

කිරීම සඳහා දුම්පානය සඳහා නිදහස් කලාප ඇති කර තිබුණත් ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සන්නිවේදන ගැටලු පැවතීම, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ කාර්යබහුලත්වය නිසා අධීක්ෂණය දුර්වලවීම, දුම්කොළ සමාගම් මැදිහත් වීම් වැනි ගැටළු නිරීක්ෂණය විය. එසේම දුම්කොළ භාවිතය අවම කිරීම සඳහා ඉලක්ක ගත කණ්ඩායම් වෙනුවෙන් පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් පරිදි පවත්වා නොතිබීම, අධ්‍යාපන ආයතනයන් ආසන්නයේ දුම්වැටි අලෙවි කරන අලෙවිසැල් පැවතීම, දුම්කොළ ආනයනය වැඩිවීමද කැපී පෙනුණි. දුම්කොළ නිෂ්පාදන ඇසුරුම්වල රූපමය අවවාද ඇතුළත් කිරීම පිළිබඳ ගැටළු හා දුම්කොළ සඳහා බදු අය කිරීම පිළිබඳ ගැටළු නිරීක්ෂණය කරන ලදී. තවද මධ්‍යසාර පාලනය අවම වීම වෙනුවට ඒවා භාවිතය ඉහළ ගොස් තිබුණි.

සෞඛ්‍ය සම්පන්න ආහාර ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් එළවළු හා පළතුරු නිෂ්පාදනයේදී අවිධිමත් අයුරින් පලිබෝධ නාශක හා පොහොර භාවිතය සම්බන්ධව විධිමත් සුපරීක්ෂණයක් නොමැතිවීම, ප්‍රවාහන හා ඇසුරුම් ක්‍රමවේදවල දුර්වලතාවයන් හේතුවෙන් පසු අස්වනු හානි සිදුවීම, කෘෂිභෝග වලට සිදුවන රෝග පිළිබඳව නියැදි පරීක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් පරීක්ෂණාගාර පහසුකම් නොමැතිවීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) යටතේ ලබාගන්නා එළදාව අලෙවිය සඳහා ප්‍රමාණවත් වෙළඳපළක් නිර්මාණය වී නොතිබීම වැනි තත්ත්වයන් නිරීක්ෂණය කරන ලදී. ආහාර හා පාන වර්ග සම්බන්ධයෙන් වන වෙළඳ දැන්වීම් හා පැමිණිලි නියාමනය සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීම, ආහාර ලේබල් කිරීමේ හා ප්‍රචාරණය කිරීමේ නියෝග කාලීනව සංශෝධනය වී නොතිබීම, ආහාර හා පාන වර්ග සම්බන්ධයෙන් වන ප්‍රචාරණ කටයුතු සඳහා පාසල් යන වයසේ ළමුන් යොදා ගැනීම, ආහාර වල සීනි, ලුණු සහ මේදය සඳහා වර්ණ සංකේතවත් කිරීමේ නියෝග හඳුන්වා දී තිබුණද එම නියෝග ක්‍රියාත්මක කිරීමේ දිනය වරින් වර දිගු කර තිබීම, පාසල් සිසුන්ගේ ආහාර සම්බන්ධයෙන් පාසල තුළ මෙන්ම බාහිර සාධක පාලනය පිළිබඳ ගැටළු මෙන්ම පාසල් සඳහා ව්‍යායාම් පිළිබඳ මාර්ගෝපදේශයන් සකස් කර යාවත්කාලීන කිරීම හා පාසල් දරුවන් ශාරීරික ක්‍රියාකාරකම් හි නිරතවන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබීම නිරීක්ෂණය විය.

වායු දූෂණය සම්බන්ධයෙන් වායු ගුණත්ව තත්ත්වයන් නිශ්චය කිරීම සඳහා පවතින දත්තයන් සීමාසහිත වීම, ගෘහස්ථ වායු ගුණත්වය වැඩි දියුණු කිරීම සඳහා වායු ගුණත්ව මාර්ගෝපදේශ පිළියෙල කිරීම සම්පූර්ණ වී නොතිබීම හා ඒ අනුව පාසල්, කර්මාන්තශාලා, කාර්යාල වැනි පරිශ්‍රයන් තුළ පැවතිය යුතු වායු ගුණත්වය පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් වී නොතිබීම වැනි තත්ත්වයන් නිරීක්ෂණය කරන ලදී. දුම්කොළ හා මත්පැන් භාවිතය, සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පරිභෝජනය , ප්‍රමාණවත් ශාරීරික ව්‍යායාම නොමැතිවීම යන අවධානම් සාධක සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වන වගකීම ජන මාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණද එම අමාත්‍යාංශය ඒ

පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් දැනුවත් කිරීමේ කාර්යයන් ප්‍රමාණවත් පරිදි සිදු වී නොමැති බවද නිරීක්ෂණය වුණි.

රෝග පූර්ව හඳුනාගැනීම් සහ කළමණාකරණය සම්බන්ධයෙන් ඒ සඳහා ප්‍රාථමික මට්ටමේදී දායකත්වය සපයන සුවදිවි මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයන්හි ඌනතාවයන් පැවතීම, චක්‍රලේඛ අවශ්‍යතාවයන් ප්‍රකාරව ඇතැම් සුවදිවි මධ්‍යස්ථාන පැවැත්විය යුතු දින ගණන සම්බන්ධයෙන් ප්‍රගතියක් අත්පත් කරගෙන නොතිබීම, ඇතැම් සුවදිවි මධ්‍යස්ථාන සඳහා රුධිරයේ කොලෙස්ටරෝල් පරික්ෂාව සඳහා අවශ්‍ය පහසුකම් නොමැතිවීම, රුධිරයේ සීනි පරික්ෂාව සඳහා අවශ්‍ය ග්ලෝකෝමීටර් පටි (Glucometer Strips) නොමැති වීම නිසා රුධිර සීනි මට්ටම් බැලීම නවතා දමා තිබීම, අනෙකුත් භෞතික පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති වීම සහ සුවදිවි මධ්‍යස්ථාන පිළිබඳව ජනතාවගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවීම යන කරුණු නිරීක්ෂණය කරන ලදී.

සෞඛ්‍ය සංඛ්‍යාලේඛන දත්ත (2018) ප්‍රකාරව කිරීටක හෘද රෝග ශ්‍රී ලංකාවේ මරණ සඳහා ප්‍රධාන හේතු සාධකය වී තිබුණි. ඒ අනුව විගණනයේදී අවධානයට යොමු කළ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි මුළු ජනගහනයට සාපේක්ෂව රෝහල් පහසුකම් පිළිබඳ ගැටළු, හෘද රෝග විශේෂඥ වෛද්‍යවරුන්ට අවශ්‍ය පහසුකම් රෝහල්වල නොමැතිවීම නිසා විශේෂයෙන් කොළඹ ජාතික රෝහලේ පවතින අධික තදබදය, දැඩි සත්කාර ඒකකය හා සායන හා ශල්‍යාගාරවල පවතින අඩුපාඩු හා පොරොත්තු ලේඛනවල විශාල රෝගීන් සංඛ්‍යාවක් සිටීම මෙහිදී කැපී පෙනුනි. කොළඹ ජාතික රෝහලේ සෞඛ්‍ය දත්ත අනුව 2018 හා 2019 වර්ෂවලදී හෘදයාබාධ හේතුවෙන් රෝහලට ඇතුළත්වන හෘද රෝගීන්ගෙන් 10% ක් මියයාමේ තත්ත්වයක් නිරීක්ෂණය විය. ඊට මූලිකවම බලපාන කරුණක් ලෙස කැතීටකරණ පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති වීම හඳුනාගත හැකිවිය.

ඡායාරූපය - ශල්‍ය ද්‍රව්‍ය අනාරක්ෂිතව ගබඩා කර තිබීම

ඡායාරූපය - ශල්‍ය ද්‍රව්‍ය අනාරක්ෂිතව ගබඩා කර තිබීම

ඡායාරූපය - ශල්‍ය ද්‍රව්‍ය අනාරක්ෂිතව ගබඩා කර තිබීම

කොළඹ මහ රෝහල හැරුණු විට බස්නාහිර පළාතේ අනෙකුත් ශික්ෂණ රෝහල්වලද කැතීටකරණ පහසුකම් ප්‍රමාණවත් පරිදි නොතිබීමෙන් නිරන්තරයෙන් හෘද රෝගීන් කොළඹ ජාතික රෝහලට ප්‍රවාහණය කිරීමට සිදුවී තිබුණු අතර එය රෝගීන්ගේ පාර්ශවයෙන් අවදානම් තත්ත්වයක් විය.

ඡායාරූපය - වසර 10 කට වැඩි කාලයක සිට දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ඉදිවෙමින් පවතින හෘද කැතීටකරණ ශල්‍යාගාරය

ඡායාරූපය - වසර 10 කට වැඩි කාලයක සිට දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ඉදිවෙමින් පවතින හෘද කැතීටකරණ ශල්‍යාගාරය

ඡායාරූපය - වසර 10 කට වැඩි කාලයක සිට දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ඉදිවෙමින් පවතින හෘද කැතීටකරණ ශල්‍යාගාරය

දියවැඩියා රෝගය සම්බන්ධයෙන් එම රෝගයට ප්‍රතිකාර ගැනීම සඳහා සායනවලට සහභාගි වන රෝගීන් සඳහා සායනවල ප්‍රමාණවත් ඉඩ කඩ නොමැතිවීම, පරීක්ෂණ පහසුකම්වල පවතින අඩුපාඩු, කාර්යමණ්ඩලයෙහි ඌනතාවයන් මෙන්ම

ඇතැම් ඖෂධවල හිඟතාවයන්ද නිරීක්ෂණය කරන ලදී.

ශ්වසන රෝග සම්බන්ධයෙන් නිදන්ගත ශ්වසන රෝගීන් සඳහා ස්වයං කළමණාකරණ සැලසුම් හඳුන්වාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබීම, ශ්වසන රෝග විනිශ්චය සහ ඇගයීම සඳහා පවතින උපකරණ ප්‍රමාණවත් පරිදි නොමැතිවීම, ශ්වසන රෝග කළමණාකරණය සඳහා අවශ්‍ය ඇතැම් ඖෂධයන්හි හිඟතාවයන් පැවතීම මෙන්ම ඇතැම් ඖෂධයන්හි අතිරික්තතාවයන් පැවතීම, නිදන්ගත පුප්පුශීය අවහිරතා රෝගය සඳහා ප්‍රජාපාදක වෛද්‍ය සහන සත්කාර ස්ථාපිත කර නොතිබීම, සායනයන් සඳහා ප්‍රමාණවත් භෞතික පහසුකම් නොතිබීම යන කරුණු නිරීක්ෂණය කරන ලදී.

බෝ නොවන රෝග පිළිබඳ ජාතික බහු ආංශික සැලැස්ම (2016-2020) ක්‍රියාවේ යෙදවීම පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම, ප්‍රගති සමාලෝචනය, අවශ්‍ය සම්බන්ධීකරණ සහ අධීක්ෂණ කටයුතු යන කාර්යයන් බෝ නොවන රෝග පිළිබඳ ජාතික කවුන්සිලය වෙත පැවරී තිබුණු අතර එහි ක්‍රියාත්මකභාවය හා අදාළ පාර්ශව සම්බන්ධ කරගැනීමට අදාළ ගැටළු නිරීක්ෂණය කරන ලදි. එහිදී 2016 පාදක දත්ත අනුව අකල් මරණ 2020 වනවිට සියයට 10 කින් අඩු කිරීමට හා වසර 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීමට ඉලක්ක කර ඇතත් මරණ වයස් විශ්ලේෂණය සඳහා තොරතුරු පද්ධතිය සකස් නොවීමෙන් එය මැනිය නොහැකි වී තිබීම, අභ්‍යන්තර රෝගී හා මරණ වාර්තාව (IMMR) තුළ රෝහල්ගත නොවී සිදුවන මරණ බවට අදාළ දත්ත ඇතුළත් නොවීම වැනි කරුණු ද ඒ අතර විය.

ඉහත තත්ත්වයන් සඳහා පිළියම් ලෙස සෞඛ්‍ය සම්පන්න ආහාර පරිභෝජනය දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, දුම්කොළ හා මත්පැන් භාවිතයේ ඇති අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ පාසල් සිසුන්, තරුණ කණ්ඩායම් ඇතුළු ප්‍රජාව දැනුවත් කිරීම, සෞඛ්‍ය සම්පන්න ආහාර දිරිගැන්වීම සඳහා සහන ලබාදීම, දුම්කොළ සහ මත්පැන් භාවිතය අධෛර්යමත් කිරීම සඳහා බදු ඉහළ නැංවීම, පාසල් ළමුන් ඇතුළු ප්‍රජාව ශාරීරික ව්‍යායාම් සම්බන්ධයෙන් දිරිගැන්වීම, ගෘහස්ථ වායු දූෂණයේ අහිතකර ප්‍රතිඵලයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ගෘහස්ථ සහ බාහිර වායු දූෂණයන් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යනාදී නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ. මෙයට අමතරව සුවදිවි මධ්‍යස්ථාන පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, සුවදිවි මධ්‍යස්ථානවල සේවාවන් වඩාත් ඵලදායක ලෙස පවත්වා ගෙන යාම සඳහා ඒවාට අවශ්‍ය පරීක්ෂණ පහසුකම් සහ පරීක්ෂණ ද්‍රව්‍ය හිඟයකින් තොරව ලබා දීමට නිර්දේශයන් කරනු ලැබේ. හෘද රෝග ඒකකයන් සම්බන්ධයෙන් වූ කළ කොළඹ ජාතික රෝහලෙහි සහ කරාපිටිය ශික්ෂණ රෝහලෙහි හෘද ප්‍රතිකාර සඳහා පවත්නා දිගු පොරොත්තු ලේඛන අවම කරලීම සඳහා කඩිනමින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා ශ්වසන රෝග සහ දියවැඩියා රෝගයන් සඳහා ප්‍රතිකාර සැලසීමේ

සේවාවන් හා පහසුකම් වැඩිදියුණු කිරීම නිර්දේශ කරනු ලැබේ.

නියාමන කාර්යයන් සම්බන්ධයෙන්වූ කළ අදාළ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සියලු පාර්ශවයන්ගේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම, නියමිත කාලයට රැස්වීම් වාර පැවැත්වීම, ඉලක්කයන්ගෙන් බැහැරවීම් පවතී නම් ඒවා අපේක්ෂිත ඉලක්කයන් කරා යොමු කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ගයන් ගැනීම, සෞඛ්‍ය දත්ත පද්ධතිය සඳහා සෑම රෝහලකින්ම දත්ත ලබා ගත හැකි වන සේ අදාළ පහසුකම් නොමැති රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම, සායනික විගණනයන් ආරම්භ කිරීම යනාදී නිර්දේශයන් සිදු කරනු ලැබේ.

හම්බන්තොට, අනුරාධපුර, වවුනියාව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ඛණිජ ද්‍රව්‍ය (කළුගල්) කැණීම සඳහා රජයේ ඉඩම් බදුදීම, පාලනය සහ රාජ්‍ය භාගය අයකිරීම පිළිබඳ කාර්ය සාධනය

ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා වෙළඳපොල තුළ විශාල ඉල්ලුමක් පවතී. ඛණිජ ද්‍රව්‍යයක්වන කළුගල් සීමිත සම්පතක් වශයෙන් හඳුනාගෙන ඇති අතර, මෙම ඛණිජ ද්‍රව්‍ය අයිතිය, පාලනය සහ බලතල සම්බන්ධයෙන් 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත සහ 2009 අංක 66 දරන සංශෝධිත පනත මඟින් විධිවිධාන සලසා තිබේ.

රජයේ ඉඩම්වල ඛණිජ කැණීම් සම්බන්ධයෙන් අදාළ වන නීතිරීති, අණ පනත් වශයෙන් 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනතේ (451 වන අධිකාරය) 6,7,8,20 හා 78 වගන්තිද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 දෙසැම්බර් 26 දිනැති අංක 68/14 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රය, 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රය, 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 2001 අගෝස්තු 10 දිනැති අංක 5/2001 දරන වන සම්පත් හා පරිසර අමාත්‍යාංශ චක්‍රලේඛ හඳුනා ගන්නා ලදී.

ඉහත සඳහන් කළ නීති රීති, යටතේ ඛණිජ ද්‍රව්‍ය කැණීම සම්බන්ධයෙන් බලපත්‍ර ලබාදීමේ අධිකාරිය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිදුකරන අතර, ඒ සඳහා අවශ්‍ය නිර්දේශ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය ආදී ආයතන මඟින් සිදුකරනු ලබයි. ප්‍රාදේශීය ලේකම් පාලනය සතු රජයේ ඉඩම් බදුදීමේ කාර්යයේදී ඉඩම් කොමසාරිස් ජනරාල් සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයා මෙන්ම, ප්‍රාදේශීය ලේකම්වරුන්ද සම්බන්ධ වේ. ඛණිජ ද්‍රව්‍ය කැණීම වෙනුවෙන් පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම, ආරක්ෂක අමාත්‍යාංශ පාලනය යටතේ දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය මඟින් පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් වගකීම් දරනු ලබයි.

ඉහත රෙගුලාසි වලට යටත්ව කටයුතු කිරීම හා ඊට සමගාමීව රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සංවර්ධනය අපේක්ෂා කලයුතු වුවද, මෙමඟින් රජයට අයවිය යුතු ආදායම විශාල වශයෙන් අහිමිවීමේ තත්ත්වයක් හා අදාළ රෙගුලාසිවලට පටහැනිව කටයුතු කිරීමේ

අවස්ථා බහුලව පැවතීම මෙන්ම ඒ මත සිදුවන විවිධ වූ පාරිසරික ගැටළු හේතුවෙන් ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් කළුගල් කැණීමේ කර්මාන්තය සිදුකරනු ලබන දිස්ත්‍රික්ක ලෙස හඳුනාගත් හම්බන්තොට, අනුරාධපුර, කුරුණෑගල සහ වවුනියාව යන දිස්ත්‍රික්ක පදනම් කරගනිමින් මෙම කාර්යසාධන විගණනය සිදු කරන ලදී.

ඉඩම් හා ඛණිජ නිධි මායිම් හඳුනාගැනීම යටතේ කාර්මික කැණීම් බලපත්‍රයක් දීමේදී ඉඩමේ කැණීම් සඳහා අනුමැතිය ලද අනුරේඛනය පරිදි සීමා කණු යෙදීම සිදුකල යුතු වුවත් නියැදි පරීක්ෂණයට ලක්වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවස්ථා දෙකකදී මායිම් කණු නොයෙදීමේ ප්‍රතිශතය 78 ක් හා 43ක්ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6ක එම ප්‍රතිශතය සියයට 20ක් හා සියයට 0 දක්වා වූ පරාසයක වූ අතර වවුනියාව දිස්ත්‍රික්කයේ අවස්ථා 7කට අදාළව එම ප්‍රතිශතය සියයට 80 සිට සියයට 45 දක්වා පරාසයක් තුළ විය.

කැණීම් කටයුතු සඳහා අවශ්‍ය බලපත්‍රවල/ නිර්දේශවල වලංගු කාලසීමාව ඉකුත් වීමට ප්‍රථම බලපත්‍රය අලුත් කිරීමට අයදුම් කර නව බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කල යුතු වුවත්, කාර්මික කැණීම් බලපත්‍රය, පුරාවිද්‍යා නිර්දේශය, පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍රය හා පරිසර බලපත්‍රය යන බලපත්‍රවල වලංගු කාලසීමාව ඉක්මවා තිබියදී කැණීම් සිදු කර තිබූ අවස්ථාවන් 03 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක නිරීක්ෂණය වූ අතර, එලෙස බලපත්‍ර අලුත් නොකල කළුගල් වැඩ බිම් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විශේෂ අවධානයක් යොමුකර නොමැති බවද තව දුරටත් නිරීක්ෂණය විය.

ඡායාරූපය - නාච්චාදුව ප්‍රා.ලේ කාර්යාලයේ බලපත්‍ර ඉකුත් වුවද තවදුරටත් කැණීම් සිදුවීම

ඡායාරූපය - නොච්චියාගම ප්‍රා.ලේ කාර්යාලයේ බලපත්‍ර ඉකුත් වුවද තවදුරටත් කැණීම් සිදුවීම

කැණීම්වලින් රාජ්‍ය භාගය අයකර ගැනීමේදී කැණීම් කළ කළුගල් ප්‍රමාණය හඳුනාගැනීමට පිළිගත් විද්‍යාත්මක ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. එමෙන්ම ඉඩම් ආඥාපනතේ 196.1(vi) වගන්තිය ප්‍රකාරව ව්‍යාපාර කටයුතු සඳහා ඉඩම් බදුදීමේදී ඉඩම්වල වෙළඳපොළ වටිනාකමින් සියයට 4ක් ලෙස විය යුතු වුවද විවිධ වූ පදනම් යටතේ වෙළඳ වටිනාකමට අඩු වටිනාකමින් ඉඩම් අගය කිරීම් මත රාජ්‍ය ආදායම අඩුවෙන් අයකරගෙන ඇත. ඒ අනුව නියැදි පරීක්ෂණයට ලක්වූ අගුණකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශය තුළ අඩුවෙන් ගණනය කල බදු ආදායම රු.මිලියන 2.2ක මුදල අධිකරණය වෙත ගෙවීමට නියෝග කර ඇති නමුත් නැවත එම බදුකරුවන්ටම කැණීම් කිරීමේ අවස්ථාව සලසා දී තිබුණි.

ඊට අමතරව කැණීම් අවසන්කල හෝ කැණීම් අත්හිටවා ඇති වැඩබිම් නැවත පුනරුත්ථාපනය කළ යුතු වුවත් එසේ නොවන අවස්ථා නිරීක්ෂණය විය.

ඡායාරූපය - කැණීම් බලපත්‍ර අංක : IML/B/HO/3711/LR/7 (හම්බන්තොට දිස්ත්‍රික්කය)

අනවසර කැණීසම් සම්බන්ධයෙන් මෙම දිස්ත්‍රික්කවල කරුණු නිරීක්ෂණය වන අතර එහිදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනවසරව සිදුකල කැණීම්වල වටිනාකම රු.මිලියන 16.3ක් ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයෙන් වාර්තා වී තිබුණි. තවද එවැනි අනවසර කැණීම් නිසා රු.මිලියන 31.4 ක රාජ්‍ය ආදායමක් අහිමි වූ අවස්ථාවන් අගුණකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයෙන් වාර්තා වී ඇත.

ඒ අනුව සමස්ථයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක කළුගල් වැඩබිම් 12 කට අදාළව රු. 198,898,250 ක්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක කළුගල් වැඩබිම් 46 කට අදාළව රු. 254,408,741 ක්ද, වවුනියාව දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක කළුගල් වැඩබිම් 27 කට අදාළව රු. 81,278,190 ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක කළුගල් වැඩබිම් 12 කට අදාළව රු. 16,973,250 ක්ද වශයෙන් ඉහත නීති විධිවිධාන අනුව අයකළ යුතු රජයේ ගාස්තු අඩුවෙන් අයකිරීම හා කැණීම් කරන ලද ගල් කියුබ් ප්‍රමාණය අඩුවෙන් ගණනය කිරීම නිසා 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු. 551,305,626 ක් වූ මුළු ආදායම රාජ්‍ය ආදායමට අහිමිකර තිබුණි.

තවද භාවිතයට ගනු ලබන පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණය මත ඉවත් කරණ ඛණිජ ප්‍රමාණය සමපාත නොවන අවස්ථා පවතින අතර නියැදි පරීක්ෂණයට ලක්වූ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගල් කියුබ් 12,656 ක් කැණීම් කර තිබුණු අතර ඒ සඳහා යොදාගත යුතු අවම පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 6,328 කි. නමුත් එම බලපත්‍රධාරියාට නිකුත් කළ පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 26,244 ක් වී තිබුණි. ඒ අනුව පුපුරණ ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 19,916 ක් හෙවත් නිකුත් කළ ප්‍රමාණයෙන් සියයට 76 ක අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය කුමන කාර්යයන් සඳහා යොදාගත්තේද යන්න අනාවරණය නොවීය.

ඒ අනුව මෙම ස්වාභාවික ඛණිජ සම්පත නිසි පාලනයකින් සහ ඵලදායීතාවයකින් යුතුව කර්මාන්තකරුවන් ආරක්ෂාවන පරිදි සහ

පරිසරය රැක ගනිමින්, කර්මාන්තය දියුණු කිරීම, ඛණිජ පරිමාව නිවැරදිව ගණනය නොකිරීම සහ ඛණිජ භාවිතා කිරීම වෙනුවෙන් රජයට ලැබිය යුතු ගාස්තු අඩුවෙන් අයකිරීම, නියමිත නීතිරීති විධිවිධාන පිළි නොපැදීම පිළිබඳව මෙම කර්මාන්තය හා සම්බන්ධ රාජ්‍ය ආයතන සහ කර්මාන්තකරුවන්ගේ අවධානය යොමු විය යුතු බව පෙන්වා දෙමි.

ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම

රජයේ රෝහල් ඇතුළු වෛද්‍ය ආයතන වලින් බැහැර කරන සායනික අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය කිරීම රෝහල්වල සනීපාරක්ෂාව හා බෝවන රෝග පාලනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වේ. තවද මධ්‍යම පරිසර අධිකාරිය විසින් පනවන ලද රෙගුලාසි ප්‍රකාරව, සියළු සායනික අපද්‍රව්‍ය උපද්‍රවකාරී අපද්‍රව්‍ය වන අතර එවැනි අපද්‍රව්‍ය උත්පාදනය වී පැය 48 ක් ඇතුළත ජීවානුහරණය කර බැහැර කිරීම කළ යුතුය.

රෝහල් හා විවිධ සෞඛ්‍ය ආයතන තුළ උත්පාදනය වන සායනික අපද්‍රව්‍ය නිසි කළමනාකරණය සඳහා අවශ්‍ය පහසුකම්වලින් සමන්විත විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම පසුගිය වර්ෂ ගණනාවක සිට සෞඛ්‍ය අමාත්‍යාංශය මෙන්ම පළාත් 09 හි සෞඛ්‍ය අංශ විසින් මුහුණදී තිබුණු ඉතා බරපතල ප්‍රශ්නයක් ලෙස හඳුන්වා දිය හැකිය.

ඡායාරූපය - කුරුණෑගල රෝහලේ Meta Mizer යන්ත්‍රය ක්‍රියාත්මක නොකිරීමත් රෝහලේ පැවති ඉන්සිනරේටරය අක්‍රියවීම නිසාත් රෝහල අසළ සායනික අපද්‍රව්‍ය ගොඩගසා තිබුණු අයුරු

ඡායාරූපය - කුරුණෑගල රෝහලේ Meta Mizer යන්ත්‍රය ක්‍රියාත්මක නොකිරීමත් රෝහලේ පැවති ඉන්සිනරේටරය අක්‍රියවීම නිසාත් රෝහල අසළ සායනික අපද්‍රව්‍ය ගොඩගසා තිබුණු අයුරු

ඡායාරූපය - කරවනැල්ල රෝහල විසින් හිස් ඖෂධ කුප්පි පරිසරයට මුදා හැර තිබීම

ඡායාරූපය - මාරවිල මූලික රෝහලෙන් බැහැර කරනු ලබන සායනික අපද්‍රව්‍ය රෝහල් භූමිය තුළ ගිනිතැබීම

සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඕස්ට්‍රේලියානු සමාගමක් විසින් සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අනායාචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබුණු අතර එම ව්‍යාපෘති යෝජනාව සලකා බලා එම යෝජනාව පිළිගෙන ක්‍රියාත්මක කිරීම සඳහා 2013 මැයි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව අපද්‍රව්‍ය බැහැර කිරීමේ උපකරණ වූ වර්ෂයක වගකීම් කාලයක් සහිත Meta Mizer යන්ත්‍ර 20 ක් හා Incinerator යන්ත්‍ර 15 ක් සපයා සවිකර ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට හා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමට, Meta Mizer යන්ත්‍ර සේවා කිරීම හා නඩත්තු කිරීමට සහ Incinerator යන්ත්‍ර සේවා කිරීම හා නඩත්තු කිරීමට 2013 දෙසැම්බර් 12 දින ඕස්ට්‍රේලියාවේ R.R.Taylor Pty.Ltd හා එම සමාගමේ දේශීය නියෝජිතයා වූ Biomed International Pty.Ltd සමඟ, ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු සඳහා Biomed International Pty.Ltd සමඟ වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගිවිසුම් 04 කට එළඹ තිබුණි.

මෙම සමස්ථ ව්‍යාපෘතියේ මුළු වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 21.11 ක් හා රු.මිලියන 452.24 ක් වූ අතර ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම මෙම විගණනයේ අරමුණ විය.

දිවයිනේ පළාත් 09 ආවරණය කරමින් පොකුරු 06 කට වෙන් කරන ලද රජයේ රෝහල් 134 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් ගිවිසුම් 04 න් ගිවිසුම් 02 ක්, 2015 දෙසැම්බර් 01 දින සංශෝධනය කර තිබුණි. ඒ අනුව යන්ත්‍ර සපයා සවිකිරීමේ හා අදාළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ ගිවිසුම යටතේ සැපයීමට යෝජිත Incinerator යන්ත්‍ර 15 යන්ත්‍ර 05 දක්වා අඩුකර ගිවිසුම්ගත වටිනාකම වූ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 18.445 ක් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 16.19 ක් දක්වා අඩුකර තිබුණි. එසේම Incinerator යන්ත්‍ර සේවා කිරීම සඳහා වූ ගිවිසුම යටතේ ගෙවීමට එකඟවී තිබුණු වර්ෂ 05 ක සේවා හා නඩත්තු ගාස්තුව වූ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 0.190 ක් හා රු.මිලියන 36.382 ක්, ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 63,175 ක් හා රු.මිලියන 12.127 ක් දක්වා අඩුකර තිබුණි. නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් ගාස්තුව (Operating fee) වෙනස් කර නොතිබුණි.

ණය ආධාර ව්‍යාපෘතියේ ගිවිසුම 2013 වර්ෂයේදී අත්සන් කර තිබියදී හා එම ව්‍යාපෘතිය මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි රෝහල් 134 ක් පොකුරු 06 කට බෙදා වෙන්කර එම එක් එක් පොකුරෙහි සායනික

අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකිව තිබියදී, 2014 වර්ෂයේදී අමාත්‍යාංශ නිලධාරීන් විසින් බස්නාහිර, දකුණ හා මධ්‍යම පළාත්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට සිසිලි හනාරෝ එන්කෙයා පෞද්ගලික සමාගම විසින් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘතියට වාසිදායක වන අයුරින් එම පළාත් 03 හි ස්ථාපිත කිරීමට ගිවිසගෙන තිබුණු Meta Mizer යන්ත්‍ර 10 ක් හා Incinerator යන්ත්‍ර 08 ක් එම ව්‍යාපෘතියෙන් ඉවත් කර තිබුණි. මෙම Meta Mizer යන්ත්‍ර 10 උතුර, නැගෙනහිර, උතුරු මැද, වයඹ, සබරගමුව හා ඌව ආදී පළාත්වල ස්ථාපිත කර තිබුණි.

තවද වර්තමානය වන විට Meta Mizer යන්ත්‍ර 20 න් 10 ක්ම පොකුරු ක්‍රියාත්මක නොවන කරවනැල්ල, මාරවිල, අක්කරෙයිපත්තු, කල්මුණේ හා කල්මුණේ අෂ්රෆ් රෝහල යන මූලික රෝහල්වලද, කුලියාපිටිය ශික්ෂණ රෝහල තුළද, ඇඹිලිපිටිය, මොණරාගල, හලාවත හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෝහල්වලද ස්ථාපිත කර තිබුණි.

මෙම ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව, සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය හා උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ලබාගත යුතු බලපත්‍රය ලබා ගැනීම සැපයුම්කරුගේ හා ඔහුගේ දේශීය නියෝජිතයාගේ වගකීම විය. නමුත් Meta Mizer යන්ත්‍ර සවිකරන ලද රෝහල් 20 ක් අතරින් පරීක්ෂාවට භාජනය කළ රෝහල් 09 කින් රෝහල් 06 ක් සඳහාම පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණු අතර රෝහල් 08 ක් උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ලබාගත යුතු බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

ඡායාරූපය - මාරවිල රෝහල විසින් Meta Mizer යන්ත්‍රයෙන් බැහැර කරන ලද අපද්‍රව්‍ය නැවතත් රෝහල් භූමිය තුළම පිළිස්සීම

ඡායාරූපය - කෑගල්ල රෝහලේ Meta Mizer යන්ත්‍රයෙන් ඉවත් කළ ඉවත් කළ අපද්‍රව්‍ය ඇළ මාර්ගය දෙපස ගොඩගසා තිබීම

ඡායාරූපය - පොළොන්නරුව රෝහලේ Incinerator යන්ත්‍රයේ චිමිනිය පහළ මට්ටමක පැවතීම

ඡායාරූපය - රත්නපුර රෝහලේ Meta Mizer යන්ත්‍රයෙන් පිටතට හුමාලය පිටවන බව

ඡායාරූපය - කෑගල්ල රෝහලේ Meta Mizer යන්ත්‍රයෙන් පිටතට හුමාලය පිටවන බව

ඡායාරූපය - කෑගල්ල රෝහලේ Meta Mizer යන්ත්‍රයෙන් පිටතට හුමාලය පිටවන බව

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එක් එක් රෝහල් විසින් යන්ත්‍රයට ඇතුළත් කරන අපද්‍රව්‍ය එකිනෙකට වෙනස්වීම, ගතවන කාලය හා යන්ත්‍රවාර ගණන රෝහල් අතර වෙනස්වීම, ජීවානුහරණ උෂ්ණත්වයට පැමිණීමට විවිධ කාල පරාසයන් ගැනීම, යන්ත්‍රවලට අවශ්‍ය ජල පීඩනය රෝහල් අතර වෙනස්වීම, යන්ත්‍රවල හයිඩ්‍රොලික් තෙල් සැපයීමට අදාළ තාක්ෂණික ගැටළු නිසා යන්ත්‍ර ක්‍රියාවිරහිතවීමේ අවස්ථා පැවතීම, ඇතැම් රෝහල්වල යන්ත්‍රවල දුර්ගන්ධ කළමනාකරණ ඒකකය අක්‍රියවීම, උෂ්ණත්වමාන අක්‍රියවීම නිසා අර්ධ දහනයන් සිදුවීමේ අවස්ථා පැවතීම යන තාක්ෂණික හා අනෙකුත් පොදු ගැටළු නිරීක්ෂණය විය.

අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් සෘජුව හෝ වක්‍රාකාරයෙන් සම්බන්ධ වී බස්නාහිර, මධ්‍යම හා දකුණු පළාත්වල සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ කොන්ත්‍රාත්තුව සිසිලි හනාරෝ එන්කෙයා පෞද්ගලික සමාගමට ලබාදීමේ අරමුණින් කටයුතු කරමින් හා එම සමාගමට වාසිදායක වන ලෙස වාණිජ ගිවිසුමකට එළඹීමටත්, ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතියේ විෂය පථයෙන් සියයට 50 කට වඩා ආවරණය වූ පළාත් 03 වෙනස් කිරීමෙන් පොකුරු සැලැස්ම අඩාල කිරීමටත්, උතුරු, නැගෙනහිර, උතුරු මැද, වයඹ, සබරගමුව හා ඌව පළාත්වල පමණක් සායනික අපද්‍රව්‍ය සම්බන්ධ කටයුතු කිරීමට ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘති ගිවිසුම සංශෝධනය කරවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කර තිබුණි.

එපරිදි කටයුතු කිරීම නිසා රෝහල් 21 ක සායනික අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක කාලපරිච්ඡේදය තුළදී සිසිලි හනාරෝ

එන්කෙයා පෞද්ගලික සමාගමට සහ වෙනත් ආයතන වෙත ගෙවීමට සිදුවී තිබුණු මුළු මුදල රු.මිලියන 384.122 ක් වූ අතර එය රජයට අමතර වැය බරක් විය.

ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය යටතේ සපයා තිබුණු Meta Mizer යන්ත්‍ර හා Incinerator යන්ත්‍ර පිරිවිතරවල සඳහන් ධාරිතාවයෙන් ක්‍රියත්මකවී නොතිබුණු අතර යන්ත්‍රවලින් බැහැරවන ද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීමට සුදුසු තත්ත්වයට පත්ව ඇති බවට ස්වාධීන පරීක්ෂණයක් මගින් තහවුරු කරද නොතිබුණි. ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වූ රෝහල් කිහිපයක සායනික අපද්‍රව්‍ය එක් ස්ථානයකදී අපහරණය කිරීමේ ක්‍රියාවලිය (Cluster System) මුළුමනින්ම අසාර්ථක වී තිබුණි. තවද මෙම යන්ත්‍ර මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය විධිමත් පරිදි පළාත් පාලන අධිකාරීන් හරහා බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් දිවයින පුරා ක්‍රියාත්මක කර නොතිබුණි.

රෝහල් සඳහා සායනික අපද්‍රව්‍ය කලමනාකරණ ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම පාරිසරික හා උපලේඛනගත ද්‍රව්‍ය සඳහා වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම කැබිනට් අනුකාරක සභාවේ නිර්දේශ හා අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක වීම සම්බන්ධ පරීක්ෂාව, වාර්ෂික මෙහෙයුම් ගාස්තු සංශෝධනය හා ව්‍යාපෘති මුල් ගිවිසුමට අවශ්‍ය සංශෝධන ගෙන ඒම යන්ත්‍ර ක්‍රියාකාරීත්වයේදී ඇතිවන අවහිරතා සමනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම ඉතිරිවන අවශේෂ ද්‍රව්‍ය අහිතකර නොවන බවට තහවුරු කර ගැනීම හා ඒ පිළිබඳ පළාත්පාලන ආයතන දැනුවත් කිරීම, Incinerator යන්ත්‍රවලට අමාත්‍යාංශයෙන් වැය කළ මුදල් අදාළ නියෝජිත ආයතනයෙන් අයකර ගැනීම, මෙම යන්ත්‍ර භාවිතයෙන් පසුවද තවදුරටත් අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැරකරන රෝහල අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යන මූලික නිර්දේශයන් මෙම වාර්තාවේ දක්වා ඇත.

නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම

දිවයිනෙහි මුළු බලශක්ති අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් විදුලිබලය මත යැපෙන අතර මුළු විදුලිබල ජනනයෙන් සියයට 63 ක් ඉන්ධන සහ ගල් අඟුරු තාප බලාගාර මඟින් සැපයේ.මේ සඳහා වාර්ෂිකව ඇමෙරිකන් ඩොලර් විශාල ප්‍රමාණයක් වැය වීම හේතු කොට අනාගතයේදී ඇති විය හැකි විදේශ විනිමය අර්බුදයන් වලට සහ හදිසි විදුලි කප්පාදු කිරීම් වලට සාර්ථකව මුහුණ දීමට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ට යොමු වීමේ වැදගත්කම වර්තමානයේදී ඉතා පැහැදිලිය. 2020 වර්ෂයෙහි පුනර්ජනනීය බලශක්ති (Renewable Energy) උත්පාදනය මුළු බලශක්ති සැපයුමෙන් සියයට 37 ක් වන අතර නව පුනර්ජනනීය බලශක්ති (New Renewable Energy- NRE) උත්පාදනය මුළු බලශක්ති සැපයුමෙන් සියයට 12 ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව ඉහළ සුළං හා සූර්ය බල ධාරිතාවයක් පවතින අතර වර්තමාන උපයෝජනය සාපේක්ෂව ඉතා අඩුය. පුනර්ජනනීය බලශක්ති භාවිතය තුළින් හරිතාගාර වායු විමෝචනය අඩුවීම, ගෝලීය

උෂ්ණත්වය ඉහළයාම පාලනය මෙන්ම ෆොසිල ඉන්ධන ආනයනය මඟින් දේශීය ආර්ථිකය මත වන පීඩනය මඟහරවා ගැනීමටද හැකියාව ලැබේ. වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව 2030 වන විට මුළු පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සියයට 70 ක් දක්වා වර්ධනය කර ගැනීමටද අනාගතයේදී නව ගල් අඟුරු බලාගාර පිහිටුවීමට කටයුතු නොකිරීමටද අපේක්ෂිතය.

මෙහි ප්‍රධාන නිරීක්ෂණයන් අතර බලශක්ති ප්‍රතිපත්තිය අනුව 2050 දී සියලු බලශක්ති සැපයුම් ජාලයන්ගේ පූර්ණ සංක්‍රාන්තිය ලඟා කර ගැනීමට (අංගාර තුළනය) සැළසුම් කර තිබුණද ලංවීම විසින් ඉදිරිපත් කළ 2022-2041 අවම පිරිවැය දිගු කාලීන ජනන සැලැස්මට අනුව 2041 වසර දක්වාම පුනර්ජනනිය ප්‍රභවයන්ගෙන් විදුලිබල උත්පාදනය සියයට 50 ක් පමණක් වන අතර ගල් අඟුරු බලාගාර 02 ක්ද ඇතුළත් කර තිබුණි. දීර්ඝ කාලයක් පවතින ගල්අඟුරු බලාගාර අඛණ්ඩව ඉදිකිරීම තුලින් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය මඟින් සැළසුම් කළ පරිදි 2050 දී පූර්ණ සංක්‍රාන්තිය ලඟාකර ගැනීම කළ නොහැකි බව නිරීක්ෂණය කළ හැකි වේ. තවද සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ සහ ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙහි ප්‍රතිපාදන අනුව කේන්ද්‍රීය සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීමේ සංකීර්ණ ක්‍රියාවලිය සඳහා වැය වන වසර 02 ටද වැඩි දීර්ඝකාලය අවම කිරීමට පියවර ගෙන නොතිබීමද නිරීක්ෂණය විය.

2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 43(4) වගන්තිය අනුව නව උත්පාදන පිරියතයන් සැපයීම, දීර්ඝ කිරීම සඳහා තරඟකාරී මිලගණන් යටතේ අවම පිරිවැය මත මිල කැඳවුම් මගින් බලශක්ති මිලදී ගැනීම සඳහා වූ නියමය පදනම් කරගෙන ලං. වි. ම. විසින් සම්මත අයක්‍රමය යටතේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අනුමත කර තිබූ මෙගා වෝට් 4014.84 ට අදාළ ව්‍යාපෘති 1,374 ක් සඳහා ගිවිසුම්වලට එළඹීම 2017 ජනවාරි 01 දින සිට එකවරම අත්හිටුවා තිබුණි. එසේ වූවද 2017 වර්ෂයේ සිට මේ දක්වා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලාගාර ඉදිකිරිම සඳහා සංවර්ධකයන්ගෙන් අයදුම්පත් සහ ගාස්තු ලබාගැනීම සිදු කර තිබුණ නමුත් එම ව්‍යාපෘති සම්බන්ධව මෙතෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්යභාරය යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවේ (PAC) අනුමත වූ 2017 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලපත්‍ර සහ තාවකාලික අනුමැතිය ලබාදී ඇති සහ ජාල එකඟතාවයට ඉදිරිපත් කර ඇති මෙගා වොට් 4,014.84 ක ව්‍යාපෘති 1,374 ක ක්‍රියාකාරීත්වය තරගකාරි මිල කැඳවුම් ක්‍රමයට අවතීර්ණ වීම නිසා ලං.වී.ම විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම්* අත්සන් නොකිරීම හේතුවෙන් නතරවී තිබුණි.

** "විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුමක්" යනු බෙදා හැරීමේ බලපත්‍රලාභින්ට විදුලි බල ශක්තිය විකිණීමේ කාර්යය සඳහා පමණක්ම විදුලිබල ශක්තිය තොග වශයෙන් හෝ විදුලි උත්පාදන*

ධාරිතාව තොග වශයෙන් මිලදීගැනීම සඳහා විදුලි උත්පාදන බලපත්‍රලාභියකු සමඟ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් එළඹුන ගිවිසුමක් වේ."

මෙහිදී අවසාන පියවර වන ගිවිසුම් අත්සන් කිරීමේ අවස්ථාව තෙක් පැමිණ එම කාර්යය අත්හිටවූ ව්‍යාපෘති 30 ක්ද තාවකාලික අනුමැතිය ලද ව්‍යාපෘති 130 ක්ද විය. මෙම තත්ත්වයට මූලික හේතුව 2017 වර්ෂය ආරම්භයේ සිට පැවති ක්‍රමවේදය එක්වරම අත්හිටවුවීම විය.

අත්හිටවූ ව්‍යාපෘති වලට අදාළ සවිස්තර තොරතුරු වගුව 05 පරිදි විය.

විස්තරය	ව්‍යාපෘති සංඛ්‍යාව	ධාරිතාවය (මෙගා වොට්)
ගිවිසුම් අත්සන් නොකළ	30	49.33
තාවකාලික අනුමැතිය ලද (අභිප්‍රාය ලිපිය නිකුත්කර නොමැති)	53	127.61
තාවකාලික අනුමැතිය ලද (අභිප්‍රාය ලිපිය දීර්ඝකර නොමැති)	77	110.67
ජාල එකඟතාවයට යොමුකළ	1214	3727.23
එකතුව	----- 1374 ===	---------- 4014.84 =====

වගුව 05 - අත්හිටවූ ව්‍යාපෘති වලට අදාළ තොරතුරු

තරඟකාරී මිල ක්‍රමය යටතේ ජාතික විදුලිබල පද්ධතියට එකතු කර ඇත්තේ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා මෙගා වෝට් 1 බැගින් වූ සූර්ය බල ව්‍යාපෘති 13 ක් පමණි. සුළං බල විදුලි බලාගාර සංවර්ධනය සම්බන්ධයෙන් දැනට අයදුම්පත් කැඳවා ඇත්තේ මෙගා වෝට් 60 ක ධාරිතාවයක් සඳහා පමණි. සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ මෙගා වෝට් 269 ක ධාරිතාවයක් පමණක් මධ්‍යම ජාලයට සම්බන්ධ කර තිබුණු බව නිරීක්ෂණය විය. පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරුවන්ගෙන් මිලදී ගනු ලබන විදුලිය සඳහා ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් පොලී මුදලක් ගෙවීමට සිදුවීමේ අවධානමක්ද ඇත. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය යටතේ ගෝලීය උෂ්ණත්වය ඉහළයාම $2C^0$ට අඩුවෙන් තබා ගැනීමේ ගෝලීය ප්‍රඥප්තිය අනුව ඉන්ධන බලාගාර වෙනුවට ද්‍රවීකෘත ස්වාභාවික වායු බලාගාර (LNG) හඳුන්වා දීමටද තීරණය කර තිබුණද එකදු බලාගාරයක්වත් මේ වන විට ඉදි කර නොතිබුණි. මේ තත්ත්වයන් ඩීසල් බලාගාර වෙතින් හදිසි මිලදි ගැනීම් වර්ධනය වීමටද බෙහෙවින් හේතු වී තිබුණි.

ඉහත සඳහන් කැපීපෙනෙන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් වූ කල, බලශක්ති ව්‍යාපෘතීන්ට අදාළව අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන් වළක්වා ගැනීමට සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් සකස්කළ යුතු අතර දිගුකාලීන ජනන සැලැස්ම පිළියෙල කිරීමේදී ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා අන්තර්ජාතික සම්මුතීන්ට අනුකූල විය යුතු වේ. 2017 ජනවාරි 01 දින සිට ලං.වි.ම සමඟ සම්මත අයක්‍රමය යටතේ විදුලිය මිලදීගැනීමේ ගිවිසුම් අත්සන් නොකළ දැනට උත්පාදන බලපත්‍රහිමි හා අභිප්‍රාය ලිපි නිකුත් කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් තීරණයන්ට එළඹීමද වැදගත් වේ. කුඩා පරිමාණ ව්‍යාපෘති සඳහා දේශීය ආයෝජකයින් පමණක් සම්බන්ධ කර ගැනීම තුලින් විදේශ විනිමය රඳවා ගැනීමට හා

දේශීය ආර්ථිකය නැංවීමට කටයුතු කිරීම වැදගත් වේ. වර්තමානයේ මුහුණ දීමට සිදුව ඇති ලෝක වසංගත (Covid-19) තත්ත්වය යටතේ සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම සහ විදේශ විනිමය සංචිත ගැටළුවද සමග ආර්ථිකය යළි පන ගැන්වීමේ කාර්යයේදී පුනර්ජනනීය බලශක්ති කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් විය හැක. තවද සූර්ය කෝෂ තාක්ෂණය හඳුන්වාදීම තුළින් සූර්යය බලය ගබඩා කර තබා අතිශය කාර්යබහුල වේලාවලදී (පීක් ටයිම්) භාවිතයට ගැනීමට කටයුතු කිරීමද යෝග්‍ය වේ. ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (CSR) ක්‍රියාවට නැංවීම තුළින්, පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් ව්‍යාපෘති ඉදිකිරීමේදී මතුවන සමාජ විරෝධතා හා පරිසර බලපෑම් අවම කිරීමටද කටයුතු කළ යුතු වේ.

මෙම වාර්තාව නිකුත් කිරීමෙන් අනතුරුව අදාළ ආයතන විසින් මෙම තත්ත්වයන් නිවැරදි කිරීමට ගනු ලැබූ තීරණ අතර, පුනර්ජනනීය බලශක්ති විදුලිබලය මිලදී ගැනීමේ ගාස්තු (Purchase Tariff Revision-2022) සංශෝධනය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීම හා ඒ සඳහා 08 දෙනෙක්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සුදුසු පරිදි සංශෝධනය කිරීම මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පැවති නීතිමය බාධා ඉවත් කිරීම, ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාවට අදාළව 2022.04.21 දින ඉඩම් අමාත්‍යාංශයේදී කුඩා ජල විදුලි බලාගාර සඳහා ඉඩම් අත්පත් කර ගැනීම/පැවරීම ප්‍රමාදවීම සම්බන්ධ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වා ඒ අනුව අදාළ ව්‍යාපෘති ප්‍රමාදයට හේතු සොයා බැලීම, ප්‍රමාද වූ ව්‍යාපෘති කඩිනම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් වහාම අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර කාර්සාධන වාර්තාවේ තොරතුරු සහ නිරීක්ෂණ පදනම් කරගෙන බලශක්ති උපදේශකවරු තවදුරටත් සිදුකළ යුතු යෝජනා ඉදිරිපත් කර ඇති අතර, ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු වීමේ කාර්යසාධනය

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ, ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 906 කට සමාන රු. මිලියන 117,780 ක් වන අතර ඉන් එ.ජ.ඩො. මිලියන 800 කට සමාන රු.මිලියන 104,000 ක් මූල්‍යායන පහසුකම් 6 ක් යටතේ සැපයීමට ආසියානු

සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉන් පළමු කොටස් 4 යටතේ රු.මිලියන 75,195 ක මුදලක් 2019 දෙසැම්බර් 31 දින වන විට මූලායනය කිරීමට වෙනම ණය ගිවිසුම් 4 ක් අත්සන් කර තිබුණු අතර එලෙස ලද මුදල් වලින් රු.මිලියන 61,533 ක මුදලක් 2019 දෙසැම්බර් 31 දින වන විට ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. මෙම කාර්යයන්වල කාර්යසාධන ඇගයීම මෙම විගණනයේ අරමුණ විය.

2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති උපදේශක විසින් නිකුත් කරන ලද භෞතික ප්‍රගති වාර්තා සහ විගණනය විසින් සිදුකරන ලද පසුගිය ක්ෂේත්‍ර පරීක්ෂාවලදී ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කයන් නියමිත දිනට ළඟාකරගෙන නොතිබුණු බවට නිරීක්ෂණය වීම හේතුවෙන් මෙම වැඩසටහන යටතේ කාර්යසාධන විගණනය සිදුකිරීමට තෝරා ගන්නාලදී. මෙහිදී, වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ මුළු කොන්ත්‍රාත් පැකේජ 42 ක් අතරින් 2018 දෙසැම්බර් 31 දින වන විට අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා නොවූ කොන්ත්‍රාත් පැකේජ 08 ක් පමණක් සහ වයඹ පළාතේ කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක තුළ ව්‍යාප්තවී ඇති මාර්ග පමණක් භෞතිකව පරීක්ෂාකිරිමට තෝරාගන්නා ලදී.

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ දකුණු, මධ්‍යම, සබරගමුව, උතුරුමැද පළාත සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්ක වල කි.මී.3,143 ක දිගින් යුත් ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත් පැකේජ 42 ක් අතුරින් කොන්ත්‍රාත් පැකේජ 25 ක එනම්, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ KU01, KU02 පැකේජය, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ සියළු පැකේජයන්ද මාතලේ දිස්ත්‍රික්කයේ MA02, MA03 පැකේජ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ NE02 පැකේජයේ පමණක් පුනරුත්ථාපන වැඩ නිමකර තිබුණි. එමෙන්ම, දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ M01, M02 සහ M03 පැකේජයන්ද, ගාල්ල දිස්ත්‍රික්කයේ G2, G3 පැකේජයන්ද, හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළ H1, H2, H3 පැකේජයන්ද 2019 ඔක්තෝම්බර් 30 දිනට වැඩ අවසන් කර තිබුණි. තවද, උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ AP01, AP02, AP03, AP04 සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ PO1, PO2, PO3 සහ කළුතර දිස්ත්‍රික්කයේ KL01 පැකේජයද 2019 නොවැම්බර් 04 දිනට වැඩ අවසන් කර තිබුණි. සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ R3 පැකේජයේ පමණක් වැඩ නිම කර තිබුණි.

තවද, ඉහත ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත් පැකේජ 42 න් 12 ක එනම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැකේජ 3 ක් ද (KU03, KU04, KU05) සහ පුත්තලම දිස්ත්‍රික්කයේ පැකේජ 2 ක් (PU2, PU3) සහ මාතලේ දිස්ත්‍රික්කයේ MA1 පැකේජයේද ගාල්ල දිස්ත්‍රික්කයේ G1 පැකේජයේද කෑගල්ල දිස්ත්‍රික්කයේ KE1 පැකේජයේද රත්නපුර දිස්ත්‍රික්කයේ පැකේජ දෙකෙහි (R1, R2) සහ කළුතර දිස්ත්‍රික්කයේ පැකේජ දෙක (KL2, KL3) මාර්ග පුනරුත්ථාපන කටයුතු කොන්ත්‍රාත්කරුවන් විසින් අත්හැර දමා තිබුණි.

ඉදිකිරීම් කොන්ත්‍රාත්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වටිනාකම රු.මිලියන 2,092.2 ක් වූ කොන්ත්‍රාත් පැකේජ අංක 04 (KU04) යටතේ මාර්ග අංක 96 කාසිකොටේ හන්දිය සිට මී ඔය පාලම හරහා පිල්ල දක්වා වූ කි.මී 4.30 දිගින් යුත් මාර්ගයේ කි.මී.4.11 ක් පෙරනිම් තාර යොදා මාර්ග තලය සකස් කර තිබුණි. එම මාර්ගය ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම නිසා මාර්ගය සෝදායාමකට ලක් වී තිබූ බැවින් එහි පැවැත්ම අවිනිශ්චිත විය.

ඡායාරූපය - 2019 නොවැම්බර් 27 දිනට තත්වය

ඡායාරූපය - 2019 නොවැම්බර් 27 දිනට තත්වය

ඡායාරූපය - මාර්ග අංක 96 කාසිකොටේ හන්දිය සිට මීඔය පාලම හරහා පිල්ල දක්වා වූ මාර්ගය - 2020 මැයි 13 දිනට තත්වය

ඡායාරූපය - මාර්ග අංක 96 කාසිකොටේ හන්දිය සිට මී ඔය පාලම හරහා පිල්ල දක්වා වූ මාර්ගය 2020 මැයි 13 දිනට තත්වය

තවද, මෙම දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ අංක KU04 යටතේ සංවර්ධනය කර තිබූ මාර්ගයේ ඉදිකිරීම් දුර්වලතා අතර, සම්පීඩන අඩුපාඩු, පෙරනිම් තාර යොදා සකසන ලද මාර්ගය ඉරි තැලීම් සහිත විය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැකේජ අංක KU01 යටතේ ඉදිකල මාර්ගයට අදාළව ප්‍රමාණ පත්‍ර සැකසීමේදී පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකිරීම හේතුවෙන් එම පාලම් කොටස අතහැර මාර්ගයේ ඉතිරි කොටස පමණක් සම්පූර්ණ

කිරීම හේතුවෙන් මාර්ගයේ ගුණාත්මකභාවයට හානි වී තිබුණි.

ඡායාරූපය - මාර්ග අංක 81: දම්වැල් මාපාංක 7+105

ඡායාරූපය - මාර්ග අංක 81: දම්වැල් මාපාංක 7+105

එමෙන්ම, කොන්ත්‍රාත් පැකේජ 05 ක එනම් පුත්තලම දිස්ත්‍රික්කයේ PU1 පැකේජයද නුවරඑළිය දිස්ත්‍රික්කයේ NE01, NE03 පැකේජද කෑගල්ල දිස්ත්‍රික්කයේ KE2, KE3 පැකේජ ද මාර්ග පුනරුත්ථාපන වැඩ කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විට මන්දගාමීව ක්‍රියාත්මක වෙමින් පැවතුණි. තවද, ඉහත කොන්ත්‍රාත් පැකේජ 12 ට අදාළව කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාදී තිබූ රු.මිලියන 2,577 ක කාර්යසාධන බැඳුම්කර 2019 නොවැම්බර් 30 දින වන විටත් ආපසු අයකර ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත්වී තිබුණි.

ඉහත සඳහන් කරන ලද පරිදි මාර්ග පුනරුත්ථාපන වැඩ වල නිරතවී වැඩ අත්හැර දැමූ කොන්ත්‍රාත්කරුවන් 12 දෙනෙකු හට වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් වශයෙන් ලබාදෙන ලද රු.මිලියන 3,434 ක මුදලින් 2019 නොවැම්බර් 30 දින වන විට රු.මිලියන 2,994 ක මුදලක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

සමස්ථයක් වශයෙන් ගත්කල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සඳහා පිරිනමන ලද රු. මිලියන 71,978.15 ක් වටිනාකම වූ කොන්ත්‍රාත් පැකේජ 42 න් 12 ක පුනරුත්ථාපන කටයුතු කොන්ත්‍රාත්කරුවන් විසින් අත්හැර දමා තිබුණි. ඒ අනුව කුරුණෑගල, පුත්තලම, මාතලේ, කෑගල්ල, ගාල්ල, රත්නපුර හා කළුතර යන දිස්ත්‍රික්කවල 2015 හා 2016 වර්ෂවල ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ රු. මිලියන 21,459 ක් සහ මාර්ග දිග කි.මී. 1003.79 ක් වූ එම කොන්ත්‍රාත්තු 12, 2019 වර්ෂය තුළ දී නවතා දමා තිබූ අතර එසේ නවතා දමන විට ඒ කොන්ත්‍රාත් වෙනුවෙන් දරා තිබූ වියදම් රු.මිලියන 10,583.6 ක් විය.

මෙම අතරමඟ වැඩ නවතා දමා තිබූ කොන්ත්‍රාත් පැකේජවල වැඩ නතරවීමෙන් අනතුරුව එම පැකේජවලට අනුයුක්තව සේවය කළ සේවායෝජක සහ ඉංජිනේරුවරයා (Consultant) ගේ කාර්යයමණ්ඩලය නඩත්තුව වෙනුවෙන් වැටුප් හා දීමනා, නිවාස පහසුකම්, කාර්යාල

පහසුකම් සහ වාහන පහසුකම් වෙනුවෙන් අතුරුගෙවීම් අංක 39 මඟින් 2019 අගෝස්තු මස දක්වා පමණක් එකතුව රු.මිලියන 23 ක් ගෙවා තිබූ අතර, එම ගෙවීම් කිරීම සඳහා විචලතා නියෝග ලෙස (Variation orders) කොන්ත්‍රාත් පැකේජ අංක KU 01, KU 02 සහ PU 01 භාවිතා කර තිබුණි.

මෙම වාර්තාවේ නිරීක්ෂණය වූ කරුණු පදනම්ව, ඉදිකිරීම් කොන්ත්‍රාත් සහ උපදේශන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී සහ ක්‍රියාත්මක කරවීමේදී, වැඩසටහන මූලික වශයෙන් සැලසුම් කරන ලද ග්‍රාමීය සහ ජාතික මාර්ග දුර අනුමාන ලෙස පවත්වාගෙන යාම තුලින් ග්‍රාමීය මාර්ග මෙන්ම ජාතික මාර්ග උපරිම ප්‍රමාණයක් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම, වැඩසටහන සඳහා ලැබෙන අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය වන බවට තහවුරු කර ගැනීම, ඉදිකිරීමේ කොන්ත්‍රාත් පිරිනැමීමෙන් අනතුරුවද, වෙනත් ව්‍යාපෘති මඟින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග කොටස් හඳුනාගැනීමට කටයුතු කල යුතු අතර, එසේ වෙනත් ව්‍යාපෘතියක් තුලින් නිමකිරීම හේතුවෙන් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතියේ පිරිවැය සංශෝධනය කිරීම් සහ එම මුදල් ප්‍රතිපාදන තුලින් වෙනත් මාර්ග පුනරුත්ථාපනය කරගැනීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම, මාර්ග පුනරුත්ථාපන කටයුතු වැඩසටහනේ මූලික සැලසුම් අනුව, නියමිත කාල රාමුව තුළ සම්පූර්ණයෙන් නිමකරවා ගැනීමට අවශ්‍ය නිසි සැලසුම්කරණයක් සිදු කළ යුතුය යන මූලික නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

නැව් මඟින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

මිනිසාගේ පැවැත්ම උදෙසා ඉවහල් වන්නා වූද ජෛව සම්පත් අතින් අනූන වන්නා වූද සම්පතක් ලෙස සාගරය වැදගත්කමක් උසුලයි. ලොව පුරා දේශගුණික ක්‍රියාකාරකම් පාලනය සඳහා ද ජල චක්‍රයේ ප්‍රමුඛතම අංශය වන්නා වූ සාගරය දූෂණයෙන් තොර කලාපයක් ලෙස පවත්වා ගැනීමට දායක වීම සෑම පුරවැසියකුගේම යුතුකමයි. එක්සත් ජාතීන්ගේ සාගර නීති ප්‍රඥප්තියට අනුව රටක සාගර කලාපය තීරණය වන අතර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් 1976 අංක 22 දරන සමුද්‍රීය කලාපය පිළිබඳ පනත මඟින් සාගර කලාපය නිර්වචනය කර ඇත. තවද මෙම පනතට අනුව වෙරළ කලාපයේ පාදක රේඛාවේ සිට නාවික සැතපුම් 200 දක්වා වූ අනන්‍ය ආර්ථික කලාපය නැතහොත් දූෂණය වැළැක්වීමේ කලාපය ආරක්ෂා කිරීමේ වගකීම ශ්‍රී ලංකාව සතු වේ. සාගර දූෂණය ඇතිවිය හැකි එක් ප්‍රධාන හේතුවක් ලෙස නැව් මඟින් සිදු වන්නා වූ දූෂණය හැඳින්විය හැක. මෙම පාරිසරික ගැටළුව කළමනාකරණය කිරීමේ පියවරක් ලෙස ජාත්‍යන්තර වශයෙන් සිදු කර තිබූ එක් පියවරක් වශයෙන් නෞකා මඟින් සිදු වන සාගර දූෂණය පාලනය කිරීම සඳහා වන අන්තර්ජාතික සම්මුතිය හැඳින්විය හැක. මෙම සම්මුතිය 1973 වර්ෂයේදී ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ පිළිගැනීමට පාත්‍ර වී ඇති අතර 1978 වර්ෂයේදී නවීකරණය කර තිබේ. MARPOL 1973/1978 නමින් හැඳින්වෙන මෙම සම්මුතිය මඟින් නෞකා හදිසි

අනතුරකදී ඇති වන දූෂණයන් හා සාමාන්‍ය මෙහෙයුම් කටයුතු වලදී සිදු වන දූෂණයන් වැළැක්වීම හා අවම කිරීම අරමුණු කරගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය රෙගුලාසීන් ඇතුළත් තාක්ෂණික ඇමුණුම් 06 ක් ඉදිරිපත් කර ඇත. අතීතයේ පටන් නාවික ගමනාගමනය සම්බන්ධයෙන් සේද මාවත ලෙස ශ්‍රී ලංකා මුහුදු තීරයේ විශාල වශයෙන් නාවික ගමනාගමනය වර්ධනය වීමත් සමඟ නෞකා මඟින් සිදුවන සමුද්‍ර දූෂණය තීව්‍ර වීමේ අවධානමක් පැවති බැවින් හා එම අවධානම අනාගතයේදී තවදුරටත් වර්ධනය විය හැකි බැවින් ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාප තුළ නැව් මඟින් සිදුවන දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය සහ එම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ආයතන වල නෛතිකමය රාමුව, ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාවය ඇගයීම මෙම විගණනයේ අරමුණ විය.

මෙහිදී ශ්‍රී ලංකාවේ නැව් මඟින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කල යුතු ආකාරය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් පිළියෙළ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද නැව් මඟින් සිදුවන සමුද්‍රීය දූෂණය වැළැක්වීම සඳහා වූ මාර්පෝල් සම්මුතියේ සියළු තාක්ෂණික අරමුණු ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ථයක් වශයෙන් වගකිව යුතු එක් නිශ්චිත ආයතනයක් දේශීය යාන්ත්‍රණය තුළ නොතිබුණි.

මුහුදු ජලය මතුපිට දෘෂ්‍යමාන තෙල් සලකුණක් නිරීක්ෂණය වූ විට සම්මුතිය යටතේ පාර්ශවකාර රාජ්‍යයන් විසින් නිරීක්ෂණයන් කල යුතු අතර මේ සඳහා පැය 24/7 සේවාවක් ක්‍රියාත්මක යුතු වුවත් එවැනි යාන්ත්‍රණයක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත වී නොතිබුණි. තෙල් විසිරුමක් මඟින් සමුද්‍රීය කලාපයේ ඇති වන දූෂණයන් කළමණාකරණය කිරීම සඳහා වූ සැලැස්මේ Tier 02 සංකල්පය (ටොන් 50-100 අතර තෙල් විසිරුම) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් එක් ආයතනයක් හෝ ස්ථානයක් සතුව නොතිබුණි.

මාර්පෝල් සම්මුතියේ තාක්ෂණික ඇමුණුම් II – (අධික ප්‍රමාණයෙන් හානිකර ද්‍රව්‍ය තොග කොට ගෙන ඇතිවන දූෂණය පාලනය කිරීම) සම්බන්ධයෙන් දේශීය වශයෙන් රෙගුලාසි නිකුත් කිරීම සිදුකර නොතිබුණි. තවද ඇසුරුම් කොට මුහුදු මඟින් ගෙන යන හානිකර ද්‍රව්‍ය නිසා සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වූ තාක්ෂණික ඇමුණුම් III හි අවශ්‍යතා වලට අනුකූල වන තෙක් නැව දියත් නොකරන බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස දේශීය නීතියට එක් කොට නොතිබුණි.

නැව් මඟින් සිදුවන වායු දූෂණය වැළැක්වීම සඳහා වූ තාක්ෂණික ඇමුණුම් 06 සඳහා ප්‍රවේශ වීමට 2016 වර්ෂයේ අනුමැතිය හිමිව තිබුණද ශ්‍රී ලංකාව මෙම ඇමුණුමේ පාර්ශවකරුවකු වී නොතිබුණි. නැව් සඳහා භාවිතා කරන බන්කර් ඉන්ධන වල (Banker Fuel) ගුණත්වය පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය අංශය මැදිහත් වී නොතිබුණි. තවද නැවක් සම්බන්ධයෙන් හදිසි අනතුරකදී නැව බේරා ගැනීමේ කටයුතු වලදී ගිවිසුම්ගත බේරාගන්නකු ලෙස ශ්‍රී ලංකාවට කටයුතු කිරීමට හැකිවන පරිදි බේරා ගැනීමේ

සම්මුතියේ (Salvage Convention) පාර්ශවකරුවකු වී නොතිබුණි.

තෙල් නෞකාව (Oil Tankers) හැර අනෙකුත් නෞකා මඟින් සිදුවන සමුද්‍රීය දූෂණයට අදාළ බංකර් සම්මුතිය හා විෂ රසායනික ද්‍රව්‍ය ඇතුළත් බහාලුම් ප්‍රවාහනයේදී ඇතිවිය හැකි සමුද්‍රීය විපත් සම්බන්ධයෙන් වූ HNS සම්මුතිය (International Convention on Liability and Compensation or damage in connection with the carriage or hazardous and noxious substances by sea) සහ සමුද්‍රීය වන්දි ලබා ගැනීමට අදාළ LLMC සම්මුතිය (Convention on Limitation of liability for maritime claim) යන සම්මුති සඳහා ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වී නොතිබුණි.

බැලස්ට් ජලය හරහා ආක්‍රමණශීලී ආගන්තුක ජීවීන් සමුද්‍ර පරිසරයට එකතු වීම හරහා වන පාරිසරික දූෂණය අවම කිරීම සඳහා සැලැස්වීම ජල කළමණාකරණ සම්මුතීන් පාර්ශවකරුවකු ලෙස කටයුතු කිරීම වැදගත් වුවත් එම සම්මුතියේ ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වී නොතිබුණි.

2020 වර්ෂයේ සැප්තැම්බර් මස 03 වන දින ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ අනතුරට පත් නිව් ඩයමන්ඩ් නෞකාව මඟින් සිදු වූ සමුද්‍රීය විපත හේතුවෙන් සමුද්‍රීය පරිසරයට සිදු වූ හානිය සම්බන්ධයෙන් පනතේ 34 වගන්තිය යටතේ හානි අය කර ගැනීම සිදු කර නොතිබුණි. තවද නැව් මඟින් සිදුවිය හැකි රසායනික ද්‍රව්‍ය හදිසි විසිරුම් කළමණාකරණයට අදාළව සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

භෞතික හා මානව සම්පත් ශක්තිමත් කිරීම මඟින් ආයතනික සංවර්ධන කටයුතු පුළුල් කිරීම හා සමුද්‍රීය පරිසරයේ නාවික මෙහෙයුම් කටයුතු හා ඇතිවිය හැකි අවිනිශ්චිත තත්ත්වයන් සම්බන්ධයෙන් විමසිලිමත් වෙමින් හදිසි අවස්ථා වලදී පැය 24/7 සේවා සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. ඒ අනුව ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව දේශීය පනත යාවත්කාලීන කිරීම හා නෞකා මෙහෙයුම් කටයුතු සංවර්ධනය, පාරිසරික තත්ත්වයන් ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ආයතනික ප්‍රති ව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය කඩිනම් කිරීම මඟින් සේදමාවතේ නාවික කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීමට පවතින අභියෝග ජයගත හැකි බවට නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ඡායාරූපය - නැව් මඟින් සිදුවන සමුද්‍ර දූෂණය

ශ්‍රී ලංකාවේ වෙරළ හා සමුද්‍රීය ජාතික උද්‍යාන සංරක්ෂණය

වෙරළබඩ පරිසර පද්ධතීන් රාශියකගෙන් අනූන වූද දිගින් කිලෝමීටර් 1,620 ක් පමණ වූ ශ්‍රී ලංකාවේ වෙරළ තීරය හා සමුද්‍රීය ජාතික උද්‍යාන වර්තමානයේදී විවිධ වූ මානව ක්‍රියාකාරකම් ස්වාභාවික සංසිද්ධීන් හේතුවෙන් හානියට පත් වෙමින් පවතී.

එපමණක් නොව හිරිගල් පර කලපු හා මෝය වැනි භෞතික පිහිටීම් මෙන්ම කඩොලාන වැනි පරිසර පද්ධතීන්ද මේ තත්ත්වයන් නිසා බලපෑමට ලක් වී ඇත. විවිධ වූ මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික සංසිද්ධීන් වෙරළ කලාපයේ පැවැත්ම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කර ඇති අතර වර්ෂ 2030 තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමේදී මෙම තත්ත්වයන් ගැඹුරින් සැලකිල්ලට ගත යුතු බව අපට හැඟෙමින් පවතී. මෙම විගණනයේ අරමුණ වූයේ දේශීය, කලාපීය සහ ජාතික ක්‍රියා පිළිවෙලවල් මඟින් වෙරළ හා වෙරළ සම්පත් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එමඟින් ගෝලීය තිරසර සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම පරීක්ෂා කිරීම වේ. සම්බන්ධිත ආයතනවල කාර්යභාරය හා වර්තමානයේ ශ්‍රී ලංකාවේ බලපාන රෙගුලාසි සමාලෝචනය, එම කාර්යභාරය සඳහා ක්‍රියාත්මක විවිධ ව්‍යාපෘතිවල කාර්යසාධනය ඇගයීම හා වෙරළ කලාප සම්බන්ධ වර්තමානයේ පවතින පාරිසරික හානිය හා ඒ තුලින් දිගුකාලීන වශයෙන් පැන නැඟිය හැකි පාරිසරික ගැටළු හඳුනාගැනීම මෙම විගණනයේ උප අරමුණ විය.

මෙම විගණනයේදී සලකා බලන ලද විෂය පථය ලෙස වෙරළ හා සමුද්‍රීය ජාතික උද්‍යාන සංරක්ෂණය සඳහා ගෙන ඇති නෛතිකමය ප්‍රතිපාදන, ක්‍රියාමාර්ග ඇගයීමට ලක් කිරීම හා වෙරළ ඛාදනය වේගවත් කරන මානව ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාකාරකම් තුලින් වැඩි බලපෑමක් එල්ල වී ඇති ප්‍රදේශ නියැදි පදනමින් පරීක්ෂාවට ලක් කරමින් මෙම පාරිසරික ගැටළුව හා සම්බන්ධ විද්‍යාත්මක තහවුරු කිරීම සඳහා විශේෂඥ වාර්තා මත පදනම් ව සිදු කර ඇත.

මෙහිදී වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ පනත යටතේ හඳුනාගෙන තිබූ දිස්ත්‍රික්ක 12 ක ස්ථාන 45 ක් විශේෂ කළමණාකරන ප්‍රදේශ ලෙසට ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණ අතර ශ්‍රී ලංකාවේ පුරාවස්තු සහ ශ්‍රී ලංකාව තුළ ඇති ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන සහ ගොඩනැගිලි වඩා හොඳින් සංරක්ෂණය කිරීම සඳහා පුරා වස්තු ආඥා පනත යටතේ කටයුතු කල යුතු වුවත් වෙරළ කලාපය තුළ පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

කොරල් පර නැවත ප්‍රතිස්ථාපනය, මුහුදු තෘණ වගාව, වැලි කඳු පුනරුත්තාපනය හා පාවෙන සමුද්‍ර ජීවී වගාව (Floating Marine Culture for sea weeds) සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් යොදා තිබූ තාක්ෂණික ක්‍රම ප්‍රමාණවත් නොවිණි. තවද නිවර්තන හා උප නිවර්තන කලාපයන්හි කලපු මෝය සහ ආවරණය වූ බොක්කු වල අන්තර් උදම් කලාපයේ වර්ධනය වන කඩොලාන ශාක, ඉස්සන් වගාව, කෘෂිකාර්මික, නිවාස ඉදිකිරීම්, ජනාවාස පුළුල් කිරීම්, ගෘහස්ථ භාවිතය හා රොන්මඩ තැන්පත් වීම යන කරුණු හේතුවෙන් හායනයට පත් වීම හා

විනාශ වීම විශාල වශයෙන් සිදු වීම නිරීක්ෂණය විය.

ගාල්ල සහ මොරටුව වෙරළ කලාපවල පවතින මෝය සහ කලපු ආශ්‍රිත පරිසර පද්ධතීන් සම්බන්ධව අනවසර ගොඩ කිරීම්, අනවසර ඉදිකිරීම්, ලවණතාවයන් වෙනස් වීම්, කැලි කසල බැහැර කිරීම, මෝය කට අවහිර වීම් කලපු හා මෝය මායිම් මිනුම් කටයුතු සිදුකර සීමා නිවැරදි කිරීම් හා මෝය ගොඩවීම් ආදී තර්ජන වලට භාජනය වී තිබුණි.

ඡායාරූපය - මොරටුව වෙරළ කලාපය

ඡායාරූපය - මොරටුව වෙරළ කලාපය

ශ්‍රී ලංකාවට අනන්‍ය මුහුදු කලාපයේ දැඩි ලෙස අවධානමකට ලක්ව ඇති මුහුදු තෘණ තලා ප්‍රදේශ සිතියම් ගත කිරීම හා සංරක්ෂණ අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කර නොතිබුණ අතර වෙරළ තීරය සුරකින හරිත කලාප ඇතිකිරීමට හා පවතින කලාප සංරක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. තවද මුහුදු කැස්බෑ සංරක්ෂණය සම්බන්ධයෙන් හා කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන නියාමන සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි.

වරායන් තුළ එක්රැස් වන විශාල ප්‍රමාණයෙන් යුත් ෆයිබර් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම, පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම හා ප්‍රතිචක්‍රීකරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි. ශ්‍රී ලංකාවේ වාර්තා වී තිබූ මෘදු කොරල්පර වර්ග 35 කට හා දෘඩ කොරල් වර්ග 208 කට ආසන්න ප්‍රමාණයක් විවිධ වූ මිනිස් ක්‍රියාකාරකම් හා වෙනත් හේතූන් මත විනාශවීමේ බලපෑම් වලට හසුවෙමින් පවතී. මෙම කොරල්පර හා මසුන් නිරීක්ෂණය සඳහා භාවිතා වන ස්නොක්ලින් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් මඟින් මාර්ගෝපදේශ පිළියෙළ වී නොතිබුණි. තවද කොරල්පර සහිත ප්‍රදේශවල යාන්ත්‍රික බෝට්ටු නැංගුරම් ලෑමේදී අනුගමනය කල යුතු නීති රීති පිළියෙල වී නොතිබුණි.

හිරිගල් පර සංරක්ෂණය සඳහා 2018 වර්ෂයේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ සැලසුම් මඟින් යෝජිත ක්‍රියාකාරකම් 22 ක් 2020 වර්ෂය දක්වාම ක්‍රියාත්මක වී නොතිබුණ අතර ධීවර

කටයුතු සඳහා භාවිතා වන මා දැල්, ලයිල සහ සුරුක්කු පන්න ක්‍රමය, හැඹිලි දැල් භාවිතය, ඩයිනමයිට් භාවිතය හා රිටිපන්න ක්‍රම මඟින් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් පිළිබඳව හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් නියාමන ක්‍රමවේදයන් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

2016 වර්ෂයේ සිට 2020 වර්ෂයේ මැයි මස දක්වා පානදුර ධීවර වරාය බේසමේ වැලි කැණීම් මඟින් වැලි කියුබ් 11,600 කට ආසන්න ප්‍රමාණයක් ඉවත් කර තිබුණද එම වැලි නැවත වෙරළට නොදමා වරායෙන් පිටතට ගෙන ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. මෙවැනි තත්ත්වයන් වෙරළ ඛාදන තත්ත්වයන් සඳහා බලපෑ හැකි බව නිරීක්ෂණය විය. තවද වෙරළ කලාපය තුළ හඳුනාගෙන තිබූ සංවේදී කලාප (අභය භූමි හා රක්ෂිත ඇතුළත්ව) සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

වෙරළ පස සිටු සීමාව නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බවට නිරීක්ෂණය වූ අතර වෙරළ කලාපය තුළ වනජීවී නීති ක්‍රියාත්මක වීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. තවද වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 469 වන අධිකාරිය (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් වන විට ප්‍රකාශයට පත්කර තිබූ සමුද්‍රීය ජාතික උද්‍යාන 29 සම්බන්ධයෙන් නිසි කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. තිරසර සංවර්ධන ඉලක්ක 14.5 ට අනුව වර්ෂ 2020 වන විට විද්‍යාත්මක තොරතුරු සහ ජාතික සහ අන්තර්ජාතික නීති වලට අනුකූලව වෙරළබඩ සහ සමුද්‍රීය ප්‍රදේශ වලින් සියයට 10 ක් සංරක්ෂණය කිරීම අපේක්ෂා කලද එම ප්‍රමාණයෙන් සියයට 2 ක ප්‍රමාණයක් පමණක් ආවරණය වී තිබුණි.

ඉහත අහිතකර තත්ත්වයන් වල වර්ධනයත් සමඟ 2025 වර්ෂය වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම් පදනම් කරගත් ක්‍රියාකාරකම් මඟින් සිදුවන සියළුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම හා සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම තිරසර සංවර්ධන අරමුණු මඟින් අපේක්ෂිත බැවින් වෙරළ සංරක්ෂණය සඳහා සම්බන්ධිත පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීම අවශ්‍ය බව නිරීක්ෂණය විය.

වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන අනුව විශේෂ වෙරළ කළමනාකරණ ප්‍රදේශ ලෙස යෝජිත ස්ථාන ප්‍රකාශයට පත්කිරීම, කඩොලාන නැවත වගා කිරීමේ මාර්ගෝපදේශ පිළියෙල කර ප්‍රකාශයට පත් කිරීම හා කඩොලාන සංරක්ෂණය සඳහා ප්‍රමුඛතා හඳුනාගැනීම, මෝය කට ගොඩවීම් අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා කලපු මෝය මායිම් සීමා වෙන් කිරීම, කොරල් පර හා මුහුදු තෘණ තලා සංරක්ෂණ කටයුතු සිදු කිරීම, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවේ රැස්වීම් පැවැත්වීම හා උපදේශක සභාවේ කාර්යයන් පනතේ විධිවිධාන ප්‍රකාරව පවත්වාගෙන යෑම, වෙරළ කලාපයේ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු කිරීම,

සමුද්‍රීය ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීමේ ප්‍රමිතීන් නිකුත් කිරීම හා ඒ අනුව කටයුතු කිරීම, කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම හා නිසි පරිදි නියාමන කටයුතු සිදු කිරීම, ධීවර වරායන් වල ඉවත් කරනු ලබන බෝට්ටු, ෆයිබර් හා වෙනත් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රමවේදයන් පිළියෙල කිරීම හා ඒ අනුව කටයුතු කිරීම , ධීවර වරායන් මඟින් වැලි ඉවත් කිරීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ පිළියෙල කිරීම, ඒ අනුව කටයුතු කිරීම හා නියාමනය කිරීම, වෙරළ ආශ්‍රිත අපජල පිරිපහදු ක්‍රමවේදය හා බැහැර කිරීම විධිමත් කිරීම හා නියාමනය කිරීම, සමුද්‍රීය අභය භූමි ප්‍රකාශයට පත් කිරීම හා සංරක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, වෙරළ පසසිටු පවත්වා ගැනීම හා වෙරළ ප්‍රවේශ ප්‍රකාශයට පත් කිරීම හා වාර්තාවේ හඳුනාගෙන ඇති මෙම ගැටළු වලට අදාළ ආයතනික කාර්යභාරයන් මනා සම්බන්ධීකරණයකින් යුතුව පවත්වාගෙන යෑම යන නිර්දේශ මෙම වාර්තාව මඟින් ලබාදෙන ලදී.

ශ්‍රී ලංකාවේ භූගත ජල කළමණාකරණයේ නීතිමය යාන්ත්‍රණය හා එහි ක්‍රියාකාරීත්වය ඇගයීම

වසර මිලියන ගණනක් මුළුල්ලේ පෘථිවි පෘෂ්ඨයෙන් පහළ ජලධර මත එකතු වූ මිරිදිය ජලයෙන් දල වශයෙන් සියයට 30 ක ප්‍රමාණයක් ගබඩා වී ඇත්තා වූ ද වාර්ෂික ප්‍රති ආරෝපණ අනුපාතය ඉතා පහල අගයක් ගන්නා වූ ජලය භූගත ජලය ලෙස හැඳින්වේ. මධ්‍යම කඳුකරයේ තිරසර ජල සම්පත් ප්‍රභවයන් අධික වීමත් හා ලෝකයේ අනෙක් රටවලට වඩා ශ්‍රී ලංකාවේ වාර්ෂික මධ්‍යම වර්ෂාපතනය ඉහල යාමත් භූගත ජලය සහ භූගත ජලයේ තිරසර භාවය රඳා පවත්වා ගැනීමටත් එක් හේතුවක් වේ. ශ්‍රී ලංකාවේ භූගත ජල කළමණාකරණය සම්බන්ධයෙන් වූ ආයතනික නෛතික පසුබිම අධීක්ෂණය භූගත ජලයේ ගුණාත්මකභාවය ඇගයීම හා භූගත ජල සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම විගණනයේ අරමුණ විය. මෙම විගණනයේ විෂය පථය ලෙස භූගත ජල කළමණාකරණයට අදාළ නෛතික ප්‍රතිපාදන සහ ඒවායේ කාලීන බව ඇගයීම, තිරසර භූගත ජල කළමණාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය ආයතනවල කාර්යභාරය ඇගයීම සහ දේශගුණික විපර්යාස අවම කිරීමේ උපායක්‍රම හා දේශගුණික විපර්යාස හේතුවෙන් භූගත ජලයේ නයිට්‍රේට් හා ක්ලෝරයිඩ් ප්‍රමාණය ඉහල යා හැකි වීම සම්බන්ධයෙන් ඇති අවධානම හඳුනාගැනීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මෙහිදී 2014 දෙසැම්බර් 22 දිනැති අංක 1894/3 දරණ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව භූගත ජල කළමණාකරණය සඳහා හඳුනාගෙන තිබූ ආයතනය ජල සම්පත් මණ්ඩලය වුවත් විගණිත දින දක්වාම භූගත ජල කළමණාකරණයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කොට ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, අනාගතයේදී ඇතිවන භූගත ජල ඉල්ලුමට සාපේක්ෂව එම අවශ්‍යතාවයන්

සපුරාලීමේ විකල්ප ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ ඒ සඳහා සූදානම් වීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 16 (1) හා 16 (2) වගන්ති වලට අනුව මණ්ඩලයේ කාර්යභාර්ය සම්බන්ධයෙන් එක් එක් අවස්ථා වලදී ව්‍යවස්ථාවන් සම්පාදනය කොට ක්‍රියාවේ යෙදවිය යුතු වුවත් 1964 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එක් ව්‍යවස්ථා සම්පාදනයක් පමණක් සිදු වී තිබුණි. තවද ජල සම්පත් මණ්ඩල පනත යටතේ වරදකරුවකු සඳහා දඩ මුදලක් නියම කිරීම සිදුවන අතර 2020 වර්ෂය වන විට වර්ෂ 21 ක කාලයක් තුළ මෙම මුදල සංශෝධනය වී නොතිබුණ අතර පැවති දඩ මුදල යටතේද 2020 ඔක්තෝබර් 12 දින වන විටත් කිසිදු දඩ මුදලක් අයකර ගෙන නොතිබුණි.

විවිධ අවශ්‍යතාවයන් සඳහා භූගත ජලය උකහාගත හැකි ආකාරය හා ප්‍රමාණයන් තීරණය කිරීම හා ඒ සමඟම පාංශු ස්තර ජල පෝෂක ආරක්ෂා කර ගනිමින් භූගත ජල උකහා ගැනීමට ප්‍රතිපාදන සැලසීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය වූ අතර නළ ළිං ඉදිකිරීම සඳහා වූ මාර්ගෝපදේශ නිකුත් කිරීම ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාර්ය වුවත් 2020 වර්ෂය දක්වාම මාර්ගෝපදේශ නිකුත් වී නොතිබුණ බව නිරීක්ෂණය විය. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යටතේ පිහිටුවා ඇති භූගත ජල අංශය ද ශ්‍රී ලංකාව තුළ නළ ළිං ඉදි කිරීමේ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වුවද 2020 අගෝස්තු 16 දක්වා ජල සම්පත් මණ්ඩලය යටතේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි.

ජල සම්පත් මණ්ඩලය මගින් ජලයේ ලවණතාවය පාලනය කිරීම සම්බන්ධයෙන් වන නිර්දේශ ක්‍රියාත්මක වන්නේද යන්න පසු විපරම් කිරීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. තවද නල ළිං වලට ජලය ලැබෙන ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ වල සිදුවන අනවසර ඉදිකිරීම් සහ අනීතික ලෙස ඉඩම් අත්පත් කර ගැනීම වැනි කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලතල ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙමඟින් ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ තර්ජනයට ලක්වීමේ ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය.

ජල බෝතල් කිරීමේ කර්මාන්තයේ හෝ බීම නිෂ්පාදනයෙහි නියැලෙන කර්මාන්ත වලින් සියයට 77 ක කර්මාන්ත ඔවුන්ගේ භූගත ජල නියැදි ජල සම්පත් මණ්ඩලය වෙත ලබා නොදීම මගින් එම කර්මාන්ත සම්බන්ධ නියාමනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. තවද ස්වාභාවික ජල උල්පත් හෝ භූගත ජලය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන හෝ සේවා කටයුතු සිදු කරනු ලබන ආයතනයක හෝ ස්ථානයක පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයකදී මෙම ස්ථාන වලට ඇතුළු වී පරීක්ෂා කිරීමේ අයිතිය ජල සම්පත් මණ්ඩලය සතු වුවද ඉහත පරීක්ෂා කිරීම් කුරුණෑගල, පුත්තලම, රත්නපුර හා මාතලේ යන දිස්ත්‍රික්ක වලට පමණක් සීමා වී තිබූ අතර දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂා කිරීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

ජල සම්පත් මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ භූගත ජලය ආරක්ෂා කල යුතු සංවේදී කලාප ලෙස කල්පිටිය, යාපනය අර්ධද්වීපය හා කොළඹ - මීගමුව වෙරළ තීරය හඳුනාගෙන තිබුණි. මෙම කලාප වල භූ ජල විද්‍යාත්මක පිහිටීම මත අධ්‍යයනයක් මගින් සංවේදී කලාප ලෙස හඳුනාගෙන තිබුණු අතර එය ගැසට් පත්‍රයක් මගින් සංවේදී කලාප ලෙස ප්‍රකාශයට පත් කල යුතුව තිබුණි. හඳුනාගත් සංවේදී කලාප මනා ලෙස කළමනාකරණය කිරීමේ අවස්ථාව හා ආරක්ෂා කිරීමට පියවර ගැනීමේ හැකියාව ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීම මගින් ලබා ගත හැකි වුවද එසේ සිදු කර නොතිබුණි.

වර්තමානයේදී පෘථිවියේ පවතින ජලධර වලින් ජලය අධි පරිභෝජනයක් සිදු වන බවට අනාවරණය වී ඇති අතර එය භූ ජලය පුනරාරෝපණය වන සීඝ්‍රතාවයට වඩා බෙහෙවින් වැඩිය. යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ඉදිරි වර්ෂ **05** ක කාලය තුළ වර්තමානයේ පවතින ධාරිතාවය මෙන් සියයට **649** ක පුරෝකතන ඉල්ලුමක් මසකට ඇති වේ යැයි අපේක්ෂා කරන අතර ගම්පහ හා වවුනියාව/ මන්නාරම දිස්ත්‍රික්ක වල එය පිළිවෙලින් සියයට **251** ක් හා **230** ක් බව නිරීක්ෂණය විය.

2015 වර්ෂයේ සිට **2019** වර්ෂය වන විට නළ ළිං **1,229** ක් අළුතින් ඉදි කර ඇති අතර නළ ළිං අළුතින් ඉදිකිරීමේ ප්‍රවණතාවය අනුව කෑගල්ල, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක වල නළ ළිං ඉදිකිරීමේ වර්ධනය සියයට **50** කට වඩා වැඩි වී තිබුණි. මෙම දිස්ත්‍රික්ක වල නල ළිං ඉදි කිරීම හේතුවෙන් දීර්ඝ කාලීනව භූගත ජලයේ හීනතාවයක් ඇතිවිය හැකි බවට නිරීක්ෂණය විය. තව ද ජල විද්‍යා විශේෂඥයන් විසින් මෙතෙක් සිදු කර ඇති පර්යේෂණ පත්‍රිකා පරීක්ෂාවන් මගින් ශ්‍රී ලංකාවේ භූගත ජල දූෂණයට අදාළව හඳුනාගෙන ඇති ලක්ෂ හා ලක්ෂ නොවන ප්‍රභව සම්බන්ධයෙන් දිගු කාලීන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

නාගරීකරණය වූ ප්‍රදේශ වල සිදු කළ අධ්‍යයනයන්ට අනුව එම ප්‍රදේශ වල භූගත ජලයේ වැඩි නයිට්‍රේට් ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර එම ප්‍රදේශ වල සනීපාරක්ෂක තත්ත්වයන්ගේ පවතින ගැටළු හා පස තුළ ඇති ජල වහනය වීමේ ගුණාංග මීට හේතු වී ඇති බව අනාවරණය වී තිබුණි. එසේ වුවද එපරිදි නයිට්‍රේට් සංයුතියේ වැඩිවීමේ හේතු කාරක හා ඒවා පාලනය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

ඡායාරූපය - භූගත ජල පරිහරණය

ඡායාරූපය - භූගත ජල පරිහරණය

මේ අනුව භූගත ජල සංවර්ධන අවශ්‍යතාවය මෙන්ම ජල සංරක්ෂණ අවශ්‍යතාවයද ප්‍රමුඛ වූ නෛතික පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම මඟින් වර්ෂ 2030 වන විට තිරසර භූගත ජල කළමනාකරණයක් අත්පත් කර ගැනීම සඳහා දායක විය හැකි බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකාවේ පළාත් අනුව භූගත ජල ප්‍රමාණය ස්වභාවය හා ගුණාත්මකභාවය මත පදනම් වූ භූගත ජල ප්‍රතිපත්තියක් ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම, භූගත ජල කළමනාකරණය පිළිබඳ වගකීම නිශ්චිත වශයෙන් තහවුරු කර ගැනීම, භූගත ජලයේ සංවර්ධනය හා සංරක්ෂණය මත පදනම් වූ අරමුණ ඇති කරගනිමින් ක්‍රියාත්මක කිරීම, භූගත ජල කළමනාකරණය මඟින් ජල සම්පත් මණ්ඩලයේ දායකත්වය වැදගත් බැවින් භූගත ජල සංරක්ෂණය සඳහා දක්වා ඇති අවධානය වැඩි කිරීම, භූගත ජල සංරක්ෂණ ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේදී උතුර, වයඹ, ඌව හා උතුරු මැද යන පළාත් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දීම, භූගත ජලයේ රසායනික සංයුතිය වෙනස් කරන විවිධ මානව ක්‍රියාකාරකම් වර්ධනය වීමක් දක්නට ඇති බැවින් භූගත ජලයේ රසායනික විශ්ලේෂණයන් ලබාගෙන ඊට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථාවල සම්බන්ධීකරණයක් ඇති කොට ජල භූ විද්‍යාව සම්බන්ධ මූලික දත්ත සමීක්ෂණය කිරීම, ඒ සම්බන්ධ පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ සැලැසුම් යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම, රටේ භූගත ජල සම්පත් සංරක්ෂණය, උපයෝගීකරණය සහ සංවර්ධනයට අදාළව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ එම ව්‍යාපෘති පවත්වාගැනීමේ හැකියාව ප්‍රයෝජන සහ ආර්ථික ශක්‍යතාව තක්සේරු කිරීම යන නිර්දේශ මෙම විගණන වාර්තාව හරහා ලබා දෙන ලදී.

විමර්ෂණ විගණනය

විමර්ෂණයට ලක් කළ ගණුදෙනු/ සිද්ධීන්/ ආයතන

- ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ නිශ්චිත කොටසක්
- කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය.
- කොටවිල කසළ එක්රැස්කරන මධ්‍යස්ථානය.
- උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනයේ අනවසර දැන්වීම් පුවරු සවිකිරීම.
- මාතර මහ නගර සභාවේ බඳවා ගැනීම්.
- උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියට අයත් කම්කරු සේවාවන් සපයන ආයතන සඳහා සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දායක මුදල් ගෙවීම.
- අකුරණ ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ත්ව ආහාර නිෂ්පාදන කර්මාන්ත ශාලාව.
- අනුරාධපුර සිවලාකුලම ගොවිජන සේවා මධ්‍යස්ථානය.
- සමූපාකාර තොග වෙළඳ සංස්ථාව විසින් සහල් ආනයනය කිරීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් පෞද්ගලික පාර්ශවයක් විසින් විකිණීම.
- සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරීත්වය.
- මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරීත්වය.
- වී අලෙවි මණ්ඩලයේ ණයගැති ශේෂ.
- ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ පරිපාලනය.

විමර්ශන විගණනය

රාජ්‍ය විගණනයට අදාළව මා සතු ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කිරීම පහසු සහ ක්‍රමානුකූල කරවීම සඳහා විගණන කාර්යමණ්ඩලය විවිධ විෂයානුබද්ධ විගණන අංශ යටතේ අනුයුක්ත කර ඇත. එහිදී යම් විගණන ආයතනයකට අදාළව ඇතැම් ගණුදෙනුවක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනාත්මක විගණනයක් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැනනඟින විට එවැනි විමර්ශන විගණන කාර්යයන් සිදුකිරීම සඳහා සහ එවැනි විගණනයන්ට සහය දැක්වීම සඳහා ජාතික විගණන කාර්යාලයේ විශේෂ විමර්ෂණ හා ව්‍යවහාරික විගණනය පිළිබඳ පුහුණුවීම් සහ අත්දැකීම් සහිත නිලධාරීන්ගෙන්ද සමන්විතව විශේෂ විමර්ශන අංශයක් ස්ථාපිත කර ඇත.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 04 වගන්තිය පරිදි මා වෙත ලැබෙන මහජන නියෝජනද, රාජ්‍ය ගිණුම් පිළිබඳ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවන්හි දැනුම් දීම් මෙන්ම ආයතන ප්‍රධානීන්, ජනමාධ්‍ය වෙතින් ප්‍රකාශිත කරුණුද, මා විසින් සැලකිල්ලට ගනුලබන වෙනත් අවශ්‍යතාවයන්ද සැලකිල්ලට ගනිමින් විශේෂ විගණන විමර්ශනයකට ලක් වීම උචිත යයි මා විසින් තීරණය කරනු ලබන ගණුදෙනු හා සිද්ධීන් මෙම විමර්ශන අංශයේ විගණනයට ලක් කරවනු ලැබේ. ඇතැම් අවස්ථාවන්හිදී මෙම අංශයේ නිලධාරීන් වෙනත් විගණන අංශ/ශාඛා වෙත තාවකාලිකව අනුයුක්ත කර විශේෂ විමර්ශනයන් සිදු කරවනු ලැබේ.

2021 වර්ෂයේදී එලෙස විශේෂ විමර්ශනයට ලක්කළ ගණුදෙනු හා සිද්ධීන් සමූහය අතරින් ප්‍රමාණාත්මකව වැදගත් පරීක්ෂාවන් පහත දැක්වේ.

විමර්ෂණයට ලක් කළ ගණුදෙනු/ සිද්ධීන්/ ආයතන

1. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ නිශ්චිත කොටසක්
2. කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය.
3. කොටවිල කසළ එක්රැස්කරන මධ්‍යස්ථානය.
4. උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනයේ අනවසර දැන්වීම් පුවරු සවිකිරීම.
5. මාතර මහ නගර සභාවේ බඳවා ගැනීම්.
6. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියට අයත් කම්කරු සේවාවන් සපයන ආයතන සඳහා සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දායක මුදල් ගෙවීම.
7. අකුරණ ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සත්ත්ව ආහාර නිෂ්පාදන කර්මාන්ත ශාලාව.
8. අනුරාධපුර සිවලාකුලම ගොවිජන සේවා මධ්‍යස්ථානය.
9. සමූපාකාර තොග වෙළඳ සංස්ථාව විසින් සහල් ආනයනය කිරීම.

10. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් පෞද්ගලික පාර්ශවයක් විසින් විකිණීම.
11. සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරීත්වය.
12. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරීත්වය.
13. වී අලෙවි මණ්ඩලයේ ණයගැති ශේෂ.
14. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ පරිපාලනය.

කෙසේ වෙතත්, 2021 වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය තුළ විගණන කටයුතු සඳහා බැහැර යාමට පැවති සීමාකාරී තත්ත්වයන් මෙන්ම විගණන සහ විගණිත ආයතනයන්හි කාර්යමණ්ඩල කාර්යාලගතව රාජකාරි ඉටු කිරීමද සාපේක්ෂව අඩුවීම මෙම විමර්ශන අංශයේ කාර්භාරයන් වෙත සීමාකාරී බලපෑමක් ඇතිකරවනු ලැබීය.

මෙම විමර්ශන අංශය විසින් අනාවරණය කර ගත් ඇතැම් නිරීක්ෂණ ජාතික විගණන පනතේ 11 සහ 12 වගන්තිය පරිදි නිකුත් කලයුතු වාර්තාවලටද, පනතේ 13 වගන්තිය පරිදි නිකුත් කරනු ලබන විශේෂ වාර්තාවන්ටද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව පරිදි සභාගත කරනු ලබන වාර්තාවලද සුදුසු පරිදි ඇතුළත් කරනු ලබන අතර ඇතැම් නිරීක්ෂණ කලමනාකරණය වෙත නිකුත් කරනු ලබන වාර්තාවලට ඇතුළත් කරනු ලැබේ.

කෙසේ වෙතත් විමර්ශන විගණනයන් සඳහා සාපේක්ෂව වැඩි කාලයක් ගතවීම සහ විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබාදීමට විශාල කාලයක් ලබාගැනීම මෙන්ම එම පිළිතුරු නැවත නැවත සමාලෝචනය කිරීමට සිදුවීම හේතුවෙන් එකිනෙක වර්ෂ තුළදී සිදුකරනු ලබන විමර්ශන විගණනයන්හි නිරීක්ෂණ ඉහත සඳහන් වාර්තා වලට ඇතුළත් කිරීම බොහෝවිට ඉදිරි වර්ෂවලදී සිදු කෙරේ.

ජාතික විගණන කාර්යාලයේ 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන

විෂයයන්
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රුපියල්	**2020** රුපියල්
මූල්‍ය නොවන වත්කම්		
දේපළ, පිරියත හා උපකරණ	1,452,785,677	525,720,485
මූල්‍ය වත්කම්		
අත්තිකාරම් ගිණුම්	224,242,476	228,179,389
මුදල් හා මුදල් සමාන දෑ	-	64,784
මුළු වත්කම්	**1,677,028,153**	**753,964,658**
ශුද්ධ වත්කම් / ස්කන්ධය		
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්	49,419,013	115,790,810
දේපළ පිරියත හා උපකරණ සංචිතය	1,452,785,677	525,720,485
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		
ජංගම වගකීම්		
තැන්පතු ගිණුම්	174,823,463	112,388,579
අග්‍රිම ශේෂය	-	64,784
මුළු වගකීම්	**1,677,028,153**	**753,964,658**

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇති අතර ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
විගණකාධිපති
2022 පෙබරවාරි 28 දින

ජී.එස්. කරුණාරත්න
ප්‍රධාන ගණකාධිකාරී
2022 පෙබරවාරි 28 දින

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතිය

සකස් කිරීමේ පදනම

ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ 6 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර ඇත. එම මාර්ගෝපදේශයේ පහත සඳහන් පදනම් යොදා ගෙන 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රුපියල්		තත්‍ය 2021 රුපියල්	නැවත ගලපන ලද 2020 රුපියල්
-	ආදායම් ලැබීම්	348,678,099	302,494,749
-	ආදායම් බදු	-	-
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	-	-
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	-	-
220,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	348,678,099	302,494,749
220,000,000	මුළු ආදායම් ලැබීම් (අ)	348,678,099	302,494,749
-	ආදායම් නොවන ලැබීම්		
-	භාණ්ඩාගාර අග්‍රිම	1,426,015,000	1,420,640,000
-	තැන්පතු	138,531,867	316,938,095
55,000,000	අත්තිකාරම් ගිණුම්	83,398,507	63,638,620
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්	4,570,132	17,382,954
55,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)	1,652,515,506	1,818,599,669
275,000,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ=(අ)+(ආ)	2,001,193,605	2,121,094,418
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)	68,514,459	53,256,963
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ)-(ඈ)	1,932,679,146	2,067,837,455
	අඩු කළා : වියදම්		
-	පුනරාවර්තන වියදම්	-	-
1,942,750,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	1,579,046,154	1,451,777,938
310,900,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	242,889,315	273,604,910
16,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	13,168,281	14,628,903
-	පොළී ගෙවීම්	-	-
-	වෙනත් පුනරාවර්තන වියදම්	34,698	141,401
2,270,150,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)	1,835,138,448	1,740,153,152
	මූලධන වියදම්		
35,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	7,415,964	21,285,201
12,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	4,670,023	19,016,378
-	ප්‍රාග්ධන මාරුකිරීම්	-	-
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	-	-
20,000,000	හැකියා වර්ධනය	1,445,665	323,300
-	වෙනත් මූලධන වියදම්	-	-
68,000,000	මුළු මූලධන වියදම් (උ)	13,531,652	40,624,879
	තැන්පතු ගෙවීම්	76,096,982	266,873,212
	අත්තිකාරම් ගෙවීම්	79,461,594	65,483,738
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	4,570,132	17,382,954
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	160,128,708	349,739,904
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	2,008,798,808	2,130,517,935
		-	-
2,338,150,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)	(76,119,662)	239,814,269
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	(76,119,662)	(62,680,480)
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		
		(76,119,662)	(62,680,480)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සත්‍ය	
		නැවත ගලපන ලද
	2021 රුපියල්	2020 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	348,678,099	302,494,749
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	77,718,554	72,347,403
අග්‍රිම ලැබීම්	1,426,015,000	1,420,650,000
අත්තිකාරම් අයකර ගැනීම්	85,093,512	65,260,012
තැන්පතු ලැබීම්	138,531,867	316,938,095
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්	4,570,132	17,382,954
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	2,080,607,164	2,195,073,213
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,830,269,066	1,745,623,520
සහනාධාර සහ මාරුකිරීම්	13,168,281	14,628,903
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,567,631	12,026,740
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	68,514,459	53,256,963
අත්තිකාරම් ගෙවීම්	79,750,590	66,264,543
තැන්පතු ගෙවීම්	76,096,982	266,873,212
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	4,570,132	17,382,954
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,075,937,141	2,176,056,835
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	4,670,023	19,016,378
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	4,670,023	19,016,378
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	4,670,023	19,016,378
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(4,670,023)	(19,016,378)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)		
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

2021 වර්ෂය තුළ නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා

විෂයයන්

- මනම්පිටිය වැලි කැණීමේ ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව
- අග්‍රහාර රක්ෂණ භාර අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික)සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

2021 වර්ෂය තුළ නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 13 වන වගන්තිය ප්‍රකාරව විශේෂ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. තවද, ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතනවලට අදාළව මෙම වාර්තා නිකුත් කරනු ලබයි. මෙම විශේෂ විගණන වාර්තා නිකුත් කිරීමේ දී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් කරනු ලබන දැනුම්දීම් ද සහ විගණිත ආයතන විසින් සිදු කරන ලද ඉල්ලීම් ද, ජාතික හා කාලීන වැදගත්කම පිළිබඳ අවධානය යොමු කර මාධ්‍ය හෙළිදරව් කිරීම් හෝ මහජන නියෝජනයන් ආදී කරුණු ද සැලකිල්ලට ගෙන මා වෙත පැවරී ඇති අභිමතානුසාරී බලතල මත විශේෂ විගණන වාර්තා සඳහා විෂයයන් තීරණය කරනු ලැබේ.

වගුව 06 හි විස්තර දැක්වෙන පරිදි විශේෂ වාර්තා 03 ක් 2021 වර්ෂය තුළදී නිකුත් කරන ලදී. 2020 වර්ෂය තුළදී විශේෂ වාර්තා 18 ක් නිකුත් කල ද 2020 සහ 2021 වර්ෂ වල රටතුළ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේ දී නිකුත් කරන ලද මෙම වාර්තා සංඛ්‍යාව ප්‍රමාණාත්මකව අඩු වීමට හේතු විය. 2021 වර්ෂයෙහි නිකුත් කරන ලද එම සියලුම විශේෂ වාර්තා පාර්ලිමේන්තුවෙහි සභාගත කර ඇති අතර මෙම වාර්තා පිළිබඳ උනන්දුවන පාර්ශවයන්ගේ පරිශීලනය සඳහා ජාතික විගණන කාර්යාල වෙබ් අඩවියෙහි එම වාර්තාවන් ත්‍රෛයිභාෂාවෙන් පළ කිරීමට ද කටයුතු කර ඇත.

අනු අංකය	වාර්තාවේ අංකය	වාර්තාවේ නම	වාර්තාවේ දිනය	වාර්තාව නිකුත් කිරීමට පසුබිම් වූ කරුණු
01	SPR/2021/01	මනම්පිටිය වැලි කැණීමේ ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව	2021 ජනවාරි 29	ගංවතුර පාලනය කිරීමත්,කොළඹ සහ අනිකුත් ප්‍රදේශ වල පවත්නා වැලි හිඟය අවම කිරීමත් අරමුණු කර ගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමට වැලි කැණීමේ හා විකිණීමේ කටයුතු පවරා තිබුණි. එම ව්‍යාපෘතියේ කටයුතු සමාගමට පැවරූ පසුවද ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යාමේ දී විවිධ අක්‍රමිකතා සිදුවන

				බවට මහජන නියෝජන ලැබීමත්, මාධ්‍ය මඟින් ඒ සම්බන්ධයෙන් විවිධ වාර්තා පළවීමත් විගණනය විසින් වරින් වර සිදුකරන ලද පරීක්ෂාවන් වලදී ද මෙම විෂයට අදාළව ගැටළු කිහිපයක් හඳුනාගැනීමට හැකිවීමත් හේතුවෙන් **2018** අංක **19** දරන විගණන පනතේ **13** වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදී.
02	SPR/2021/02	අග්‍රහාර රක්ෂණ භාර අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	**2021** මාර්තු **10**	රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන් සහ එම පවුල්වල සාමාජිකයන් ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මූලික අරමුණු කර ගනිමින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් අග්‍රහාර රක්ෂණ ක්‍රමය **1997** වර්ෂයේදී හඳුන්වා දී තිබුණි. ඒ අනුව දශක දෙකකට පමණ පෙර ආරම්භ කරන ලද මෙම රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට නිසි පරිදි නොලැබෙන බවට විවිධ අවස්ථාවන් වලදී විගණනයට තොරතුරු ලැබී තිබුණි. එම තොරතුරු පරීක්ෂාවේ දී ලද නිරීක්ෂණයන්ද මත පදනම්ව **2018** අංක **19** දරන විගණන පනතේ **13** වන වගන්තිය ප්‍රකාරව මාහට ලැබී ඇති බලතල මත අග්‍රහාර රක්ෂණයේ කාර්යභාරය පිළිබඳව වැඩිදුර සිදුකරන ලද පරීක්ෂාවන්ට අනුව හඳුනා ගන්නා ලද තොරතුරු

				ඇතුළත්ව මෙම විශේෂ විගණන වාර්තාව නිකුත් කරන ලදී.
03	SPR/2021/03	හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික)සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2021 නොවැම්බර් 23	GOPL සමාගමෙහි ක්‍රියාකාරිත්වයෙහි පවතින ගැටළුකාරී යැයි හඳුනාගන්නා ලද ක්ෂේත්‍රයන් කිහිපයක් පිළබඳව කරුණු දක්වමින් උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් මා වෙත යොමු කර තිබූ ඉල්ලීම ද සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව අනුව මා වෙත රාජ්‍ය සමාගමක් විගණනය කිරීම සඳහා ලැබී ඇති බලතල මත හා 2018 අංක 19 දරන විගණන පනතෙන් මා වෙත ලැබී ඇති බලතල මත 2017 වර්ෂයෙහි සිට මෙම සමාගම් වල වාර්ෂික මූල්‍ය විගණනයෙන් හඳුනාගත් කරුණුද පදනම් කරගනිමින් මෙම විගණනය සිදු කරන ලදී.

වගුව 06 - 2021 වර්ෂයෙහි නිකුත් කළ විශේෂ විගණන වාර්තා

2021 වර්ෂයේ නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තාවන්හි ඇතුළත් කරුණුවල සාරාංශයන් පහතින් දැක්වේ.

මනම්පිටිය වැලි කැණීමේ ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව

මහවැලි නදිය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය ඇතුළු සෝමාවතිය ප්‍රදේශයේදී තැනිතලා භූමියක ගලා බැසීම හේතුවෙන් ගඟ ඉහල ප්‍රදේශවලින් ගසා ගෙන එන වැලි එම ප්‍රදේශයේ නිරන්තරව තැන්පත් වේ. මේ තත්ත්වය හේතුවෙන් ගඟේ ජලය ගලා යාමට බාධා ඇති වන අතර වර්ෂා කාලයන්හිදී මහවැලි නදිය පිටාර ගැලීම හේතුවෙන් මනම්පිටිය හා ගල්ලැල්ල ප්‍රදේශය ජල ගැලීමට ලක්වීමත් ඒ තුලින් ප්‍රදේශවාසීන්ගේ නිවාස, වගාබිම්, ඉඩම් හා පොළොන්නරුව-මඩකලපුව ප්‍රධාන මාර්ගය ගංවතුරට යටවීමත් බොහෝ අවස්ථාවල සිදුවේ. මෙම වැලි තැන්පත්වීම මනම්පිටිය ඇතුළු සෝමාවතිය ප්‍රදේශයේ වන ජීවී කලාපය තුළ පැතිරී ඇත. මෙම ප්‍රදේශයේ ඇතිවන ජල ගැලීම් පාලනය කිරීමටත් කොළඹ සහ අනිකුත් ප්‍රදේශවල පවතින වැලි හිඟය නැති කිරීම සඳහාත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2008 මාර්තු 31 දින ලබාදුන් අංක SC(F/R) No 81/04 දරන නඩු තීන්දුව මගින් මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැණීම හා අලවි කිරීම ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමට පවරා තිබුණි. ඒ අනුව එම සමාගම විසින් 2008 වර්ෂයේ සිට මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි.

ජල ගැලීම් පාලනය කිරිම වැලි කැණීම් ව්‍යාපෘතියේ එක් අරමුණක් වුවද ඒ සඳහා වූ ක්‍රමවත් සැලසුමක් මත වැලි කැණීම් සිදු නොකිරීමත්, මනම්පිටිය පාලමෙන් ඉහල ප්‍රදේශයේ කි.මී.2.7 ක ප්‍රමාණය දක්වා පමණක් වැලි ඉවත් කිරීමත්, ගඟ පහළ ප්‍රදේශයේ වැලි ඉවත් කිරීමේදී වන ජීවී කලාපය භාවිතා කිරීම සීමා වීමත් යනාදී හේතු මත වැලි කැණීම ගංවතුර පාලනය වන ආකාරයට සිදු නොකිරීම නිසා වර්ෂා කාලයේදී ජල ගැලීම් සිදුවීම දිගින් දිගටම සිදුව තිබුණි.

වැලි කැණීම් සඳහා 2020 ජූලි 31 දිනට සමාගම හූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ශිල්පීය කැණීම් බලපත්‍ර 102 ක් ලබාගෙන තිබූ අතර කලාපය තුළ මංකඩ 221 ක් ලියාපදිංචි කර එයින් වැලි මංකඩ 190 ක් ක්‍රියාත්මක කරමින් පැවතුණි. 2018 හා 2019 වර්ෂ තුළ පොළොන්නරුව නිදහස් ටිපර් රථ සංගමය නම් වූ සංගමයක සාමාජිකයන් වැලි මංකඩ නියෝජිතයන් ලෙස අවිධිමත් ආකාරයට පත්කර ගඟ ඉහල ප්‍රදේශය සඳහා ලියාපදිංචි මංකඩ 261 න් 217 ක කම්කරුවන් යොදවා වැලි කැණීම් කිරීමට අවස්ථාව ලබාදී තිබුණි. එහිදී එම සංගමය කම්කරුවන් යොදවා වැලි කැණීම් කර තිබූ අතර එම කැණීම් කරන වැලි වලින් සියයට 50ක ප්‍රමාණයක් සඳහා අදාළ මුදල් ගෙවා සංගමයේ නියෝජිතයන්ට මිලදී ගැනීමට ඉඩ ප්‍රස්ථාද ලබාදී තිබුණි. මෙම ගංගා වැලි සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම පාහේ ඇඩි ඉල්ලුමක් පවතින බැවින් වැලි මිලදී ගැනීමට ගැනුම්කරුවන් (ප්‍රවාහනකරුවන්ද ඇතුළුව) අතර විශාල තරඟයක් පවතින පසුබිමක් තුළ අදාළ සංගමය කැණීම් කරන වැලි වලින්

සියයට 50 ක් කිසිදු විධිමත් බෙදාහැරීමේ ක්‍රමවේදයකට අනුකූල නොවන ලෙස සංගමයේ නියෝජිතයන් වෙත ලබාදීම තුලින් අයථා ලෙස ඉහල මිලකට වෙළඳපලේ වැලි අලෙවි කර ගැනීමට ඉඩකඩ සලසා තිබුණි.

සමාගම විසින් අලෙවි කරන ඉතිරි සියයට 50 ක වැලි වලින්, පළමුව ප්‍රමුඛතාව මත නිකුත් කල යුතු වැලි නිකුත් කර ඉතිරි වැලි ප්‍රමාණයෙන්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ලොරි රථ සඳහා සියයට 50 ක්ද නිකුත් කර අනතුරුව ඉතිරි ප්‍රමාණය පැමිණීමේ අනුපිළිවෙල අනුව අනෙකුත් ප්‍රදේශවල ගැනුම්කරුවන් වෙත ලබා දෙමින් පැවතුණි.

2019 නොවැම්බර් 19 දින මනම්පිටිය ව්‍යාපෘති කාර්යාලයේ ගිනි තැබීමක් සිදුව තිබූ අතර මෙම ගිනි තැබීම අහඹු සිදුවීමක් නොවන බව පොලිසිය වාර්තා කර තිබුණි.තවද එම අවස්ථාවේ දී ව්‍යාපෘතියෙහි සවි කර තිබුණු CCTV කැමරා පද්ධතිය අක්‍රිය වී පැවතීමද ප්‍රශ්ණගත කාරණයක් වී තිබුණි. අනතුරුව 2020 ජනවාරි 6 දින ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කර තිබූ අතර නැවතත් අවිධිමත් ආකාරයට පොළොන්නරුව මහවැලි එක්සත් ටිපර් රථ සංගමය නම් සංගමයක ලියාපදිංචි ලොරි රථ වැඩි සියයට 75 ක පමණ ඉහළ ප්‍රතිශතයකින් වැලි නිකුත් කරමින් පැවතුණි.
සමාගම වැලි කියුබ් 1 ක විකුණුම් මිල තීරණය කිරීමේදී පිරිවැය ලෙස විවිධ රාජ්‍ය ආයතනයන්ට ගෙවන ලද ගාස්තු හා සමාගම විසින් විවිධ රාජ්‍ය අරමුදල් සඳහා වෙන්කරන ලද මුදල් ද ඇතුළත් කිරීම හේතුවෙන් එය වෙළඳපලේ වැලි විකුණුම් මිලට ද බලපා තිබුණි.

කෙසේ වුවද අධිකරණය ලබා දුන් තීන්දුව ප්‍රකාරව මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි වැලි නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමත් ඇතුළුව අතරමග නවතා ඇති ව්‍යාපෘතිය 11 (ගග පහල කොටස) නැවත ආරම්භ කර ව්‍යාපෘතියේ ඵලදායීතාවය ඉහල නැංවීමට පියවර ගත යුතු බව මෙම වාර්තාවෙන් ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය කරමි.

අග්‍රහාර රක්ෂණ භාර අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 05/97 මඟින් අග්‍රහාර රක්ෂණ ක්‍රමය 1997 වර්ෂයේදී හඳුන්වා දී තිබුණු අතර එම රක්ෂණ ක්‍රමය තුලින් රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් සහ එම පවුල්වල සාමාජිකයින්ගේ ජීවන තත්වය නඟා සිටුවීම මූලික අරමුණ කර ගෙන තිබුණි.එලෙස හඳුන්වා දුන් මෙම රක්ෂණ ක්‍රමය සඳහා සංශෝධනයන් විවිධ අවස්ථාවන් වලදී සිදුකරමින් පැවතිය ද අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට නිසි පරිදි නොලැබෙන බවට විගණනයට ලද පැමිණිලි හේතුවෙන් මෙම වාර්තාව නිකුත් කරන ලදී.

ඒ අනුව 1997 ජනවාරි 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 5/97 (vi) පරිදි , රු. 11 ක දායකත්ව මුදලක් යටතේ ආරම්භ කරන ලද අග්‍රහාර රක්ෂණ ක්‍රමය පසුව රු 125 ක දායකත්ව මුදලක් දක්වා වැඩිකර තිබුණු අතර ඉන්අනතුරුව ස්ව කැමැත්ත මත රු. 300 ක හා රු. 600 ක මාසික දායකත්වයක් දරමින් පිළිවෙලින් අග්‍රහාර රිදී හා රන් වශයෙන් තවදුරටත් පුළුල් කර තිබුණි.තවද රාජ්‍ය විශ්‍රාමික නිලධාරීන් සඳහා ද මෙම රක්ෂණ ක්‍රමය 2016 වර්ෂයේ හඳුන්වා දී තිබුණු අතර හඳුන්වාදීමේ දී පැවති රු. 200 ක දායකත්වය 2017 වර්ෂයේ රු. 600 ක් දක්වා ඉහළ නංවා ප්‍රතිලාභ හිමි වීම ජීවිතාන්තය දක්වා වැඩි කර තිබුණි.

සියළුම රාජ්‍ය සේවකයින් අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක කර ගැනීම අරමුදලෙහි අරමුණ වුවද එලෙස සියළුම රාජ්‍ය සේවකයින් අරමුදලට දායක කර ගැනීමට අපොහොසත් වී ඇති බවත්,ප්‍රතිලාභ ලබා දීම පහසු කරවීම සඳහා විවිධ වර්ගයේ චුම්බක කාඩ්පත් වරින් වර හඳුන්වා දී තිබුණ ද ඒ තුලින්ද අපේක්ෂා කල පරිදි ප්‍රතිඵල ලබා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. තවද අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභයක් වැඩ කරන දින 10 ක් ඇතුළත ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු වුවද අදාළ අයදුම්පත් ප්‍රතික්ෂේප වූ ප්‍රතිලාභීන්ට ඒ සම්බන්ධයෙන් දැනුම් දීමටද මාස 05 ඉක්ම වූ කාලයක් ගත වූ අවස්ථා පවතින බවද ප්‍රතිලාභ ගෙවීම සඳහාද අයදුම්පත් ලද දිනයේ සිට මාස 02 සිට මාස 12 දක්වා දීර්ඝ කාලයක් ගෙන ඇති බවද, 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා දෝෂ සහිත ලෙස හඳුනාගන්නා ලද අයදුම්පත් 30,742 ක් සඳහා ද 2013 ට පසු කාලපරිච්ඡේදයේදී අයදුම්පත් 87,161 ක් සඳහාද දායක මුදල් ගෙවීමට අරමුදල විසින් කටයුතු කර නොතිබීම ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනා ගැනීමට හැකිවිය.

මේ වනවිට ක්‍රමයෙන් අලාභ ලබන තත්ත්වයට පත්වෙමින් පවතින මෙම අරමුදල නැවත ලාභදායි බවට පත්කරමින් ද , ප්‍රතිලාභීන් මෙන්ම අරමුදලද අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ නිසි පරිදි ලබා දීමට සලස්වමින් මෙම අරමුදල ඵලදායි ලෙස යොදා ගැනීම මෙම වාර්තාවෙන් නිර්දේශ කරමි.

හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

දේශිය සීනි කර්මාන්තය නඟා සිටුවීමේ අරමුණින් 1960 දශකයේ දී ස්ථාපිත කරන ලද හිඟුරාන සීනි කර්මාන්තායතනය 1993 වර්ෂයේ දී පෞද්ගලිකරණය කරන ලදී. පෞද්ගලිකරණය කලද එය සාර්ථක නොවීම හේතුවෙන් නැවතත් 1997 වර්ෂයේ දී රජයට පවරාගෙන නිෂ්පාදන කටයුතු ආරම්භ කලද 1997 සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන කටයුතු නතර කිරීමට සිදු වී තිබුණි.

මෙලෙස නිෂ්පාදන කටයුතු නතර කර තිබුණු කර්මාන්තායතනයෙහි සේවය කරමින් සිටි සේවක පිරිසද විශ්‍රාම ගැන්වීමට කටයුතු කරන ලද අතර නැවතත් කර්මාන්තායතනය

ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු 2006 වර්ෂයේ දී ආරම්භකර තිබුණි.

මෙම ප්‍රතිව්‍යුහගතකරණය යටතේ 2006 වර්ෂයේ දී රජය, පෞද්ගලික සමාගම් වන බ්‍රවුන්ස් සහ සමාගම (Browns) සහ ලංකා ඔරික්ස් ලීසින් සමාගම (LOLC) යන සමාගම් එක් වී පිහිටුවා ගන්නා ලද සමාගමක් මගින් හිඟුරාන සීනි කර්මාන්තායතනයෙහි කටයුතු ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2009 වර්ෂයේදී රජය සමග කොටස්හිමි ගිවිසුමකට එළඹ තිබූ අතර එතෙක් වූ 2006 – 2009 කාලය තුළ රජයේ දායකත්වයක් නොමැතිව ස්ථාපිත කර තිබූ ගල්ඔය වැවිලි (පුද්) සමාගම (GOPL) නමින් වූ සමාගමක් මගින් කර්මාන්තායතනයෙහි කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

එලෙස රජයේ දායකත්වයක් නොමැතිව සමාගමෙහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන ගොස් තිබූ කාලය තුළ ඇති වූ තත්ත්වයත් මෙන්ම 2009 වර්ෂයේදී රාජ්‍ය සමාගම පිහිටුවීමට ගිවිසුම්ගත වීමෙන් අනතුරුව ඇති වූ තත්ත්වයන්ද සැලකිල්ලට ගනිමින් මෙම වාර්තාව නිකුත් කරන ලදී.

2009 වර්ෂයේ රජය සමඟ කොටස් ගිවිසුමට එළඹීමෙන් අනතුරුව 2010 වර්ෂයේ දී සමාගමෙහි කොටස් නිකුතුව සිදු කර තිබුණි.මෙම කොටස් නිකුතුවේ දී රජයට සමාගමේ අයිතියෙන් සියයට 51 ක් හා Browns සමාගම සහ LOLC සමාගම ප්‍රමුඛ පෞද්ගලික අංශයට සියයට 49 ක්ද හිමි වී තිබුණි.

ඉහත සඳහන් සියයට 49 ක කොටස් හිමි පෞද්ගලික අංශය ඊට අදාළ ප්‍රතිෂ්ඨාව මුදලින් ගෙන ආ යුතු වුවද එම ප්‍රතිෂ්ඨාව මුදලින් ගෙනැවිත් නොතිබුණු අතර රජයට හිමිකමක් නොතිබූ 2006-2009 කාලය තුළ ඉහතින් සඳහන් කරන ලද පෞද්ගලික අංශය විසින් GOPL සමාගමට යෙදවූ වායැයි සඳහන් කරන ලද මුදලක් එම ප්‍රතිෂ්ඨාව ලෙස හිලව් කර තිබුණි. තවද එම යොදන ලද යැයි සඳහන් කරන ලද මුදලට සියයට 28 ක පමණ පොළී ප්‍රතිශතයක් අයකිරීමටද කටයුතු කර තිබුණු අතර සමාගමෙහි කටයුතු සඳහා දිගින් දිගටම අසාමාන්‍ය කොන්දේසි හා සාපේක්ෂව ඉහල පොළී අනුපාතයන් යටතේ ඉහතින් සඳහන් කරන ලද LOLC සමාගමෙහි ආශ්‍රිත සමාගම් වලින් ණය ලබා ගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

එලෙස ඉහළ පොළී අනුපාතිකයන් හා ඇතැම් අවස්ථාවන් වලදී වැල්පොළී අනුපාතයන් යටතේ ණය ලබා ගැනීම හේතුවෙන් අධික මූල්‍ය පිරිවැයක් දැරීමට ද GOPL සමාගමට සිදු වී තිබුණි. තවද 2009 වර්ෂයේ සිට විවිධ උච්චාවචනයන් යටතේ දළ ලාභයක් ඉපයීමට එම සමාගම සමත් වුවද 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දිගින් දිගටම ශුද්ධ අලාභයන් වාර්තා කිරීමට මෙම ඉහළ මූල්‍ය පිරිවැය ප්‍රධාන වශයෙන් බලපා ඇති බව නිරීක්ෂණය විය.

තවද රාජ්‍ය සමාගමක් වන මෙම සමාගමට අදාළව ප්‍රමාණාත්මක සෘජු අධීක්ෂණයක් මහා භාණ්ඩාගාරයෙන් සිදු නොවීම මෙන්ම කොටස්හිමි ගිවිසුමට අනුව රජයට කිසිඳු ලාභාංශයක් ලැබී නොමැති බව නිරීක්ෂණය වූ

අතර මෙම වාතාවරණය තුළ 2020 මාර්තු 31 දින වන විට සමාගමේ වත්කම් ඉක්ම වූ වගකීම් වටිනාකම රු.මිලියන 7,521 ක් වී තිබුණි. තවද කොටස්කරුවන්ගේ ගිවිසුමට එළඹෙන විට එම ගිවිසුමට ඇතුළත් කරන ලද යම් යම් කොන්දේසි ඉටුකිරීමට දෙපාර්ශයම අසමත් වී තිබුණු අතර GOPL සමාගමෙහි කළමණාකරන කටයුතු ඉටුකිරීම සමාගම ගල්ඔය හෝල්ඩින්ග්ස් සමාගම (GOHL) වෙත පවරා දී තිබුණද ඒ තුලින් අපේක්ෂා කරන ලද අරමුණු ඉටු වී නොමැති බව GOPL සමාගමෙහි දිගින් දිගටම පවතින මෙහෙයුම් අකාර්යක්ෂමතාවය තුලින් නිරීක්ෂණය විය.

ඒ අනුව රජයට සියයට 51 ක අයිතියක් ඇතිව හා රජයේ දේපල භාවිතා කරමින් පවත්වාගෙන යනු ලබන GOPL සමාගමෙහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාරයේ අධීක්ෂණය පුළුල් කිරීම තුලින් රජයේ හිමිකම සහතික කිරීම හා සමාගම ලාභදායි තත්ත්වයට පත්කිරීමට උපරිම ප්‍රයත්න දැරීම තුලින් රජයට හිමිවිය යුතු ආදායම් නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කිරීමත්, උක් ගොවීන්ට සාධාරණ වාසි අත්කර දීමත් වර්තමානය වන විට දේශිය සීනි අව්‍යශතාවයෙන් රටතුළ සීනි නිෂ්පාදනය සියයට 9 ක් පමණ වන ප්‍රමාණය ඉහළ නංවා ගැනීම තුලින් සීනි ආනයනය සීමා කිරීම සඳහා උපරිම ප්‍රයත්න දැරීමට සමාගමේ කටයුතු මෙහෙයවීම සිදු කල යුතු බව මෙම වාර්තාවෙන් නිර්දේශ කෙරේ.

ඒකාබද්ධ අරමුදල

විෂයයන්

- රජයේ ආදායම
- රජයේ ආදායම් වර්ගීකරණය
- රජයේ ආදායම ඇස්තමේන්තු කිරීම
- රජයේ වියදම
- පොලී වියදම වර්ධනය වීම
- ආදායම් ඌනතාවය
- රාජ්‍ය ආයෝජන
- අයවැය හිගය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය
- අයවැය හිඟය මූල්‍යනය
- ණය ශේෂය වර්ධනය වීම
- රාජ්‍ය ණය
- උපරිම බැරකම් සීමාව ඉක්මවීම
- ඒක පුද්ගල ණය ප්‍රමාණය
- රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොලී ගෙවීම වැඩිවීම

ඒකාබද්ධ අරමුදල

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත.

රජයේ ආදායම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව, බදු ආදායම් සහ බදු නොවන ආදායම් (විදේශ ප්‍රදාන හා පළාත් සභා ආදායම් හැර) ඇස්තමේන්තු කළ මුළු රාජ්‍ය ආදායම රු.මිලියන 1,984,400 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම වූ රු.මිලියන 1,547,200 සමඟ සැසඳීමේ දී රු.මිලියන 437,200 ක් හෙවත් සියයට 28 කින් වැඩි වී තිබුණි. ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 1,466,902 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව අනුමත කළ ඇස්තමේන්තුගත ආදායමෙන් රු.මිලියන 517,498 ක් හෙවත් සියයට 26 ක ඇස්තමේන්තුගත ආදායමක් රැස්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඉකුත් වර්ෂයේ රැස්කළ රු.මිලියන 1,378,887 ක ආදායම සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ රැස් කළ ආදායම රු.මිලියන 88,015 ක් හෙවත් සියයට 6 කින් වැඩි වී තිබුණි. රජයේ ආදායම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේ දී ඉකුත් වර්ෂයේ සියයට 9.2 ක් වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 8.7 ක් දක්වා අඩුවී තිබුණි. 2016 වර්ෂයේදී සියයට 14.16 ක්ව පැවැති එම අනුපාතය 2021 වර්ෂය වන විට සියයට 8.73 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර රූප සටහන ...... හි දැක්වේ.



රූපසටහන 01 - රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාව

රජයේ ආදායම් වර්ගීකරණය

රජයේ ආදායම "බදු ආදායම හා බදු නොවන ආදායම" ලෙස ප්‍රධාන ප්‍රභේද දෙකක් යටතේ

වාර්තා වී තිබුණු අතර, බදු ආදායම නැවත “ආදායම් බදු, දේශීය භාණ්ඩ හා සේවා මත බදු, ජාත්‍යන්තර වෙළඳාම මත බදු” වශයෙන් වර්ග කර, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ “රජයේ මූල්‍ය ප්‍රකාශනවල” දක්වා ඇත. සමාලෝචිත වර්ෂය සඳහා බදු ආදායම ලෙස රු.මිලියන 1,724,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර, එම ඇස්තමේන්තුව සියයට 23 ක් හෙවත් රු.මිලියන 399,000 කින් අඩු කර රු.මිලියන 1,325,000 ක් ලෙස ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට තථ්‍ය වශයෙන් රු.මිලියන 1,298,019 ක බදු ආදායමක් රැස්කර තිබුණි. එය මුල් ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 75.29 ක් වී තිබුණි. සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 97.96 ක් වී තිබුණි. සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට අනුව සමාලෝචිත වර්ෂයේ බදු ආදායමේ ඇතුළත් ආදායම් බදු, දේශීය භාණ්ඩ හා සේවා මත බදු හා ජාත්‍යන්තර වෙළඳාම මත බදු වශයෙන් පිළිවෙලින් රු.මිලියන 295,000 ක් රු.මිලියන 647,136 ක් හා රු.මිලියන 382,864 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් පිළිවෙලින් රු.මිලියන 302,116 ක්, රු.මිලියන 643,086 ක් හා රු.මිලියන 352,818 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් බදු ආදායම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 7,116 කින් හෙවත් සියයට 2.41 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට අනුව සමාලෝචිත වර්ෂය සඳහා බදු නොවන ආදායම් ලෙස රු.මිලියන 181,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ඉන් රු.මිලියන 168,883 ක් හෙවත් සියයට 93 ක ආදායමක් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම පිළිබඳ විස්තර රූපසටහන 02 හි දැක්වේ.



රූපසසටහන 02 - ඇස්තමේන්තුගත හා තථ්‍ය බදු ආදායම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන - 2021

රජයේ ආදායම ඇස්තමේන්තු කිරීම

2021 වර්ෂයේ දළ දේශිය නිෂ්පාදනය රු.මිලියන 16,809,000 ක් වී තිබුණු අතර 2020 වර්ෂයේ දළ දේශිය නිෂ්පාදනය රු.මිලියන 15,027,000 ක් වි තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ දේශිය නිෂ්පාදනය රු.මිලියන 1,782,000 කින් හෙවත් සියයට 11.86 කින් වැඩි වි තිබුණි. 2021 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම රු.මිලියන 1,984,400 ක් වි තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.මිලියන 1,547,200 ක් වි තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට වඩා රජයේ ආදායම රු.මිලියන 437,200 කින් හෙවත් සියයට 28.26 කින් වැඩි කර ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායම් ඇස්තමේන්තුව පදනම් කර ගෙන අයවැය හිඟය ඇස්තමේන්තු කර තිබුණි. නමුත් මුල් ආදායම් ඇස්තමේන්තුව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රු.මිලියන 1,506,000 ක් දක්වා රු.මිලියන 478,400 කින් අඩු කර සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ තථ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 8.73 ක් වි තිබුණි. ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී දළ දේශීය නිෂ්පාදනයේ වැඩිවිම කෙරෙහි සැලැකිලිමත් විය යුතුව තිබුණත්, ඒ කෙරෙහි අවධානය යොමු නොකර ආදායම අධි ඇස්තමේන්තුකරණයක් සිදු කර තිබුණි. 2021 වර්ෂයේ රැස්කළ රජයේ ආදායම රු.මිලියන 1,466,902 ක් වි තිබුණු අතර එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 39,098 කින් අඩු වී තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු ආදායම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී එම අඩුවිම රු.මිලියන 517,498 ක් වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසයක තුළ සෑම වර්ෂයකදීම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් ආදායමට වඩා රැස්කළ ආදායමේ අඩුවීම සියයට 9.51 ක සිට සියයට 25.50 ක පරාසයක් වී තිබුණි. එම කාල පරාසය තුළ වැඩිම ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේදී වාර්තා වී තිබුණි. විස්තර රූපසටහන 03 හි දැක්වේ.



රූපසටහන 03 - ඇස්තමේන්තුගත ආදායමෙන් රැස් නොකළ ආදායම ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර - වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා රජයේ මූල්‍ය ප්‍රකාශන 2012 - 2021

මුදල් රෙගුලාසි 85(2)(ආ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම පමණක් සඳහන් වන හෙයින්, පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ආදායම් ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමට අවස්ථාව ලබා දීම නිසා ආදායම් තාත්ත්වික ලෙස ඇස්තමේන්තු කිරීමේ වගවීම දුර්වල වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1,298,019 ක් වූ රජයේ මුළු බදු ආදායමෙන් සියයට 23 ක් හෙවත් රු.මිලියන 302,115 ක් සෘජු බදුවලින් රැස්කර තිබුණි. ඉන් රු.මිලියන 995,904 ක් හෙවත් සියයට 77 ක් වක්‍රබදුවලින් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය හා සසැදීමේදී එම ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 22 ක් හා සියයට 78 ක් වී තිබුණි. භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාමට වක්‍ර බදුවල බලපෑම ඉකුත් වර්ෂයේදී මෙන් සමාලෝචිත වර්ෂයේදී සියයට 1 ක වෙනසක් සහිතව වාර්තා ගත වී තිබුණි. 2012 වර්ෂයේදී මුළු බදු ආදායමෙන් සියයට 20 ක් සෘජු බදුවලින්ද, සියයට 80 ක් වක්‍ර බදුවලින්ද, ආදායම් රැස්කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ 2019 වර්ෂයේදී සෘජු බදු ආදායම මුළු බදු ආදායමෙන් සියයට 25 ක් හා වක්‍ර බදු ආදායම සියයට 75 ක් වි තිබුණි. එම කාලපරිච්ඡේදය තුළ සෘජු බදු ආදායම මුළු බදු ආදායමෙන් සියයට 25 ක ප්‍රමාණයක් වී තිබුණු අවස්ථාව එය වී තිබුණි. කෙසේ වුවද, මහජනතාවගේ ජීවන වියදම කෙරෙහි සෘජු ලෙස වක්‍ර බදු ආදායම බලපාන බැවින් මුළු බදු ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් සෘජු බදුවලින් රැස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේය තුළ රැස්කළ සෘජු හා වක්‍ර බදු පිළිබඳ විස්තරයක් රූපසටහන 04 හි දැක්වේ.

රූපසටහන 04 - සෘජු හා වක්‍ර බදු රැස්කිරීම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2012 - 2021

2021 වර්ෂයේ රාජ්‍ය බදු ආදායම අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ 2020 දී රජයේ බදු ප්‍රතිපත්තියේ සිදු කරන ලද සංශෝධනයන් වන අතර ඒ අනුව, අදායම් බදු සීමාව ඉහළ දැමීම, වැට් බදු ප්‍රතිශතය 15% සිට 12% දක්වා අඩු කිරීම සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පාර්ලිමේන්තුට ඉදිරිපත් කරන ලදි. වාර්තාවේ දක්වා ඇති ආකාරයට බදු සංශෝධන කොතරම් විචක්ෂණශීලී තීරණයක්ද යන්න විද්වත් කමිටුවක් හරහා නැවත සමාලෝචනයට ලක් කිරීම සුදුසු බවට නිර්දේශ කෙරේ.

රජයේ වියදම

2021 මුදල් වර්ෂය සඳහා රජයේ වියදමට අවශ්‍ය නීතිමය විධිවිධාන 2020 අංක 7 දරන විසර්ජන පනතින් සලසා තිබුණි. ඒ අනුව, විසර්ජන පනතේ ප්‍රතිපාදන හා පවත්නා නීති මගින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන ඇතුළුව රජයේ සැපයුම් හා සේවා සඳහා රු.මිලියන 5,046,538 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඊට අතිරේකව සමාලෝචිත වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර රු.මිලියන 211,844 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ නිති සේවා වොරන්ට් බලපත්‍රයක් මගින් රු.මිලියන 162,530 ක ප්‍රතිපාදන විශේෂ නීති සේවා වියදම් සඳහා ලබා ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 5,420,912 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණි. විස්තර වගුව 07 හි දැක්වේ.

මූලය	මූලධන ප්‍රතිපාදනය රු.මිලියන	පුනරාවර්තන ප්‍රතිපාදනය රු.මිලියන	එකතුව රු.මිලියන
සැපයුම් හා සේවා සඳහා විසර්ජන පනතින් සලසා තිබුණු ප්‍රතිපාදනය	1,100,089	1,718,301	2,818,390
පවත්නා නීති මගින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වූ විශේෂ නිති සේවා සඳහා ප්‍රතිපාදන	1,252,297	975,851	2,228,148
සැපයුම් හා සේවා වියදම් සඳහා අතිරේකව ලබා දුන ලද ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු මගින්)	69,273	142,571	211,844
විශේෂ නීති සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන	83,000	79,530	162,530
එකතුව	2,504,659	2,916,253	5,420,912

වගුව 07 - රජයේ සැපයුම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය

මූලාශ්‍රය - 2020 අංක 7 දරන විසර්ජන පනත හා පරිපූරක ඇස්තමේන්තු

2020 අංක 7 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ශිර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහය සේවා සහ හදිසි

අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1 ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා පමණක් උපයෝජනය කිරීම සඳහා රු.මිලියන 365,030 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 363,516 ක ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,514 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර වගුව 08 හි දැක්වේ.

වියදමේ ස්වභාවය	විසර්ජන පනතෙන්	පරිපූරක ඇස්තමේන්තු මගින්	මු.රෙ.66/99 මාරු කිරීම්	ශුද්ධ ප්‍රතිපාදනය	වැය ශීර්ෂවලට ප්‍රතිපාදන මාරු කිරීම	ප්‍රතිපාදන ඉතිරිය
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
පුනරාවර්තන	33,893	131,000	(36,813)	128,080	127,600	480
මූලධන	131,137	69,000	36,813	236,950	235,916	1,034
එකතුව	165,030	200,000	0	365,030	363,516	1,514

වගුව 08 - පරිපූරක සහය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වූ ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂවලට මාරු කිරීම.

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන 2021

සමාලෝචිත වර්ෂයේ රජයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 5,420,912 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 4,718,158 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 702,754 ක් හෙවත් සියයට 14.89 කින් වැඩි වී තිබුණි. 2021 වර්ෂයේ සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,879,195 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් රු.මිලියන 541,717 ක්, එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් ඉතිරි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව රජයේ සැපයුම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සිදුවී තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,874,192 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 2,757,343 ක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 116,849 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 4 ක් වී තිබුණි.

- රාජ්‍ය ආයෝජනය සඳහා රු.මිලියන 1,201,353 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 789,636 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 411,716 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් වී තිබුණි.

- දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 1,345,367 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ණය

ආපසු ගෙවීම සඳහා රු.මිලියන 1,332,216 ක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13,151 ක් හෙවත් සියයට 1 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

ශීර්ෂය 422 - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4,931 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ප්‍රතිපාදන සීමාව රු.මිලියන 18 කින් ඉක්මවා රු.මිලියන 4,949 ක් උපයෝජනය කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 2,874,192 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු. මිලියන 2,757,343 ක් හෙවත් සියයට 96 ක් උපයෝජනය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 2,804,651 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 2,682,713 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 4 ක් හෙවත් රු.මිලියන 121,938 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය ආයෝජන ලෙස රු.මිලියන 1,201,353 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 789,636 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 411,717 ක් හෙවත් සියයට 34 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 12.17 ක් වී තිබුණි. 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 06 ක කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය ආයෝජන සඳහා එකතුව රු.මිලියන 6,137,593 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 4,115,481 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම කාල පරිච්ඡේදය තුළ සලසා තිබුණු රාජ්‍ය ආයෝජන ප්‍රතිපාදනයෙන් සියයට 33 ක් හෙවත් රු.මිලියන 2,022,112 ක රාජ්‍ය ආයෝජන ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි. විස්තර රූපසටහන 05 හි දැක්වේ.



රූපසටහන 05 – 2016 – 2021 වර්ෂය දක්වා රාජ්‍ය ආයෝජන සඳහා ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2016 - 2021

සමාලෝචිත වර්ෂයේ මුළු අයවැයගත වියදම රු.මිලියන 5,420,912 ක් වී තිබුණු අතර, තථ්‍ය වියදම රු.මිලියන 4,879,195 ක් වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ වියදමෙන් රු.මිලියන 541,717 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 2.3 ඡේදයේ සඳහන් පරිදි රජයේ වියදම්, කැබිනට් අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ යටතට ගොනුකර ඉදිරිපත් කර තිබුණි. එම පදනම

මත හඳුනාගත් ක්ෂේත්‍ර 27 ක් සඳහා රාජ්‍ය ණය ආපසු ගෙවීම් හා ණය සඳහා පොලී ගෙවීම් හැර රු.මිලියන 2,498,597 ක වියදම එම ක්ෂේත්‍ර 27 යටතේ සිදු කර තිබුණි. රාජ්‍ය සේවා හා පළාත් සභා ක්ෂේත්‍රය වෙනුවෙන් රු.මිලියන 658,386 ක් වැය කර තිබුණු අතර, එය රාජ්‍ය ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් හැර මුළු වියදමෙන් සියයට 26 ක වැඩිම නියෝජනයක් වී තිබුණි. ආරක්ෂාව, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණය යන ක්ෂේත්‍රයට රු.මිලියන 483,220 ක් හෙවත් සියයට 19 ක්ද, සෞඛ්‍ය, ඖෂධ නිෂ්පාදනය හා සැපයීම සඳහා රු.මිලියන 314,472 ක් හෙවත් සියයට 13 ක්ද, භාණ්ඩාගාර කටයුතු වෙනුවෙන් රු.මිලියන 243,219 ක් හෙවත් සියයට 10 ක්ද, මහාමාර්ග සඳහා රු.මිලියන 213,463 ක් හෙවත් සියයට 9 ක්ද, අධ්‍යාපන, නිපුණතා හා වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් රු.මිලියන 169,953 ක් හෙවත් සියයට 7 ක් වශයෙන් වී තිබුණි. රූපසටහන 06 හි දැක්වේ.



රූපසටහන 06 - ණය වාරික හා පොලී වියදම හැර ක්ෂේත්‍ර 27 යටතේ වූ වියදම

මූලාශ්‍රය - රජයේ මුල්‍ය ප්‍රකාශන 2021

පොලී වියදම වර්ධනය වීම

සමාලෝචිත වර්ෂයේදී පොලී වෙනුවෙන් රු.මිලියන 1,048,382 ක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී එය රු.මිලියන 975,434 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 72,948 කින් හෙවත් සියයට 7.48 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේදී රු.මිලියන 150,778 ක් පැවැති පොලී වියදම 2021 වර්ෂය අවසන් වන විට එය රු.මිලියන 1,048,382 ක් දක්වා වැඩි වී තිබුණි. 2006

වර්ෂයට සාපේක්ෂව සියයට 595 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ මුළු පොලී වියදම පුනරාවර්තන වියදමෙන් සියයට 26.03 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එය සියයට 38.02 ක් දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම 2006 වර්ෂයේදී රජයේ ආදායමෙන් සියයට 31.58 ක් හෙවත් රු.මිලියන 150,578 ක් පොලී වශයෙන් ගෙවා තිබුණු අතර, 2021 වර්ෂයේදී එය සියයට 71.47 ක් දක්වා වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 07 හි දැක්වේ.



රූපසටහන 07 - මුළු පුනරාවර්තන වියදම හා පොලී වියදම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

ආදායම් ඌනතාවය

සමාලෝචිත වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වල ආදායමේ ඌනතාවය රු.මිලියන 1,290,441 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එය රු.මිලියන 1,303,826 ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසය තුළ ඉහළම ආදායමේ ඌනතාවය 2020 වර්ෂයේදී වාර්තා වී තිබුණි. එම කාල පරාසය තුළ සෑම වර්ෂයකම රැස්කළ ආදායම රජයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමට අපොහොසත් වී තිබුණි. ආදායමේ ඌනතාවයේ අවම අගය 2007 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර එය රු.බිලියන 43 ක් වී තිබුණු අතර රැස්කළ රජයේ ආදායමෙන් සියයට 7.56 ක් නියෝජනය වී තිබුණි. එම කාල පරාසය තුළ සමස්ථ ආදායමේ ඌනතාවය රු.බිලියන 4,780 ක් වී තිබුණි. එම ඌනතාවය පියවා ගැනීමට දේශීය හා විදේශීය ණය සහ විදේශ ප්‍රදාන ලබා ගෙන තිබුණි. මේ අනුව එම කාල පරාසය තුළ දේශීය ණය රු.බිලියන 16,265 ක්ද, විදේශීය ණය රු.බිලියන 6,704 ක් හා විදේශ ප්‍රදාන රු.බිලියන 213 ක් වශයෙන් එකතුව රු.බිලියන 23,183 ක් ලබා ගෙන තිබුණි. එක් එක් වර්ෂයේදී එසේ ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් සියයට 6.86 ක සිට සියයට 45.59 ක පරාසයක ප්‍රමාණයන් මගින් ආදායමේ ඌනතාවය මූල්‍යණය කර තිබුණි. ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් ආයෝජනයන් සිදු නොකර පුනරාවර්තන

වියදම් පියවා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සියයට 20.23 ක්ද, 2020 වර්ෂයේදී සියයට 45.59 ක් හා 2021 වර්ෂයේදී සියයට 42.39 ක්ද වශයෙන් උපයෝජනය කර තිබුණි. විස්තර වගුව 09 හි දැක්වේ.

වර්ෂය	තථ්‍ය ආදායම රු.බිලියන	තථ්‍ය පුනරාවර්තන වියදම රු.බිලියන	ආදායමේ ඌනතාවය රු.බිලියන	ආදායමේ ඌනතාවය රැස්කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට	විදේශ ණය, ප්‍රදාන හා දේශීය ණය රු.බිලියන	ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවල ප්‍රතිශතයක් ලෙස සියයට
2006	477	579	102	21.38	514	19.84
2007	572	615	43	7.52	587	7.33
2008	664	736	73	10.99	678	10.77
2009	708	882	174	24.58	1,019	17.08
2010	826	951	126	15.25	918	13.73
2011	943	1,020	77	8.17	998	7.72
2012	997	1,118	122	12.24	1,108	11.01
2013	1,066	1,254	187	17.54	1,289	14.51
2014	1,128	1,370	242	21.45	1,397	17.32
2015	1,394	1,673	279	20.01	1,750	15.94
2016	1,699	1,771	72	4.24	1,623	4.44
2017	1,845	1,946	101	5.47	1,466	6.89
2018	1,935	2,109	174	8.99	1,883	9.24
2019	1,907	2,322	414	21.71	2,049	20.20
2020	1,379	2,683	1,304	94.56	2,860	45.59
2021	1,467	2,757	1,290	87.97	3,043	42.39
එකතුව	19,006	23,786	4,780		23,183	

වගුව 09 - පුනරාවර්තන වියදම පියවා ගැනීමට නොහැකි වූ ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවලින් උපයෝජනය කිරීම

මූලාශ්‍ර - 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 1,048 ක පොලී ගෙවා තිබුණු අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 38.02 ක නියෝජනයක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ පොලී ගෙවීම් රු.බිලියන 975 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 36.36 ක් වී තිබුණි. පොලී ගෙවීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.බිලියන 73 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේදී රු.බිලියන 151 ක් වූ පොලී ගෙවීම් 2021 වර්ෂය වන විට එය රු.බිලියන 1,048 ක් දක්වා සියයට 594 කින් වැඩි වී තිබුණි. අයවැය හිඟය මූල්‍යාණය කිරීම් සඳහා ණය ලබා ගැනීමත් ඒ සඳහා වන පොලී ගෙවීම වාර්ෂිකව වැඩි වී තිබුණි. 2021 වර්ෂයේදී රැස්කරන ලද රු.බිලියන 1,467 ක රජයේ ආදායමෙන් රු.බිලියන 1,048 ක් හෙවත් සියයට 71.74 ක් පොලී ගෙවීමට සිදු වී තිබුණි. මෙම තත්ත්වය අදාළ කාලපරිච්ඡේදයේදී වාර්ෂිකව වර්ධනය වෙමින් පැවැති අතර 2019 වර්ෂයේ සිට එය සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි. විස්තර වගුව 10 හි දැක්වේ.

වර්ෂය	තථ්‍ය පුනරාවර්තන වියදම	පොලී වියදම	පොලී වියදම මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස	තථ්‍ය ආදායම	පොලී ගෙවීම තථ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස
	රු.බිලියන	රු.බිලියන	සියයට	රු.බිලියන	සියයට
2006	579	151	26.08	477	31.66
2007	615	181	29.43	572	31.64
2008	736	212	28.80	664	31.93
2009	882	303	34.35	708	42.80
2010	951	348	36.59	826	42.13
2011	1,020	353	34.61	943	37.43
2012	1,118	409	36.58	997	41.02
2013	1,254	465	37.08	1,066	43.62
2014	1,370	446	32.55	1,128	39.54
2015	1,673	527	31.50	1,394	37.80
2016	1,771	611	34.50	1,699	35.96
2017	1,946	736	37.82	1,845	39.89
2018	2,109	852	40.40	1,935	44.03
2019	2,322	889	38.29	1,907	46.62
2020	2,683	975	36.34	1,379	70.70
2021	2,757	1,048	38.01	1,467	71.44
එකතුව	23,786	8,507		19,006	

වගුව 10 - ණය සඳහා පොලී ගෙවීම සඳහා රැස්කළ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වැය කිරීම

මූලාශ්‍රය - 2066 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදි එකතු කළ යුතුව තිබුණු රු.බිලියන 620 ක ආදායම්, එකතු නොකර හිඟහිටිව පැවැතුණි. එම ආදායම් 2021 වර්ෂයේදී රැස්කර ගැනිමට සමත් වුයේනම් එම වර්ෂයේ ආදායම් ඌනතාවය රු.බිලියන 670 ක් හෙවත් සියයට 51.94 කින් අඩු කර ගත හැකිව තිබුණි. එම හිඟ හිටි ආදායම 2019 හා 2020 වර්ෂ වලදී පිළිවෙලින් රු.බිලියන 698 ක් හා රු.බිලියන 579 ක් වී තිබුණි. එම වර්ෂවලද එම හිඟහිටි ආදායම් රැස්කර ගත හැකිව තිබුණේනම් 2019 වර්ෂයේදී රු.බිලියන 165 ක ආදායමේ අතිරික්තයක් බවට පත් කර ගත හැකිව තිබුණි. 2020 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 606 ක් දක්වා සියයට 46.47 කින් අඩුකර ගැනීමට හැකියාව පැවැතුණි. විස්තර වගුව 11 හි දැක්වේ.

වර්ෂය	හිඟහිටි ආදායම රු.බිලියන	ආදායම් ඌනතාවය රු.බිලියන	හිඟහිටි ආදායම් රැස්කර ගත්තේනම් ආදායමේ අතිරික්තය/(ඌනතාවය) රු.බිලියන	ආදායම් ඌනතාවය අඩුකර ගැනීමේ ප්‍රතිශතය සියයට
2019	579	414	165	-
2020	698	1,304	(606)	46.47
2021	620	1,290	(670)	51.94

වගුව 11 - ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟහිටි ආදායම් හා එය ආදායම් ඌනතාවය කෙරෙහි ඇතිකළ බලපෑම

මූලාශ්‍රය - 2019 සිට 2021 වර්ෂය දක්වා දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන හා රජයේ මූල්‍ය ප්‍රකාශන

නිවැරදි ආකාරයට ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හෝ පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු අනුව ආදායම රැස් නොකිරිමත්, අරපිරිමැසුම් දායක ලෙස වියදම් කළමනාකරණය නොකිරිම නිසා රාජ්‍ය ණය ලබා ගැනීම සිදු වී තිබුණි. එම ණය ලබා ගැනීම වාර්ෂිකව වැඩි වි තිබීම නිසා ණය පොලී පිරිවැය වාර්ෂිකව වැඩිවී තිබුණු අතර පුනරාවර්තන වියදම වැඩි වී තිබුණි. ඇස්තමේන්තු කළ ආදායම අපේක්ෂිත පරිදි රැස් කර ගැනීමට නොහැකි විමත්, පුනරාවර්තන වියදම වැඩිවීම නිසා වාර්ෂිකව වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ආදායම් ඌනතාවය වාර්ෂිකව වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 08 හි දැක්වේ.



රූපසටහන 08 - ආදායම් ඌනතාවය කථ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2006-2021

රාජ්‍ය ආයෝජන

පුනරාවර්තන වියදම පියවා ගැනිමට ප්‍රමාණවත් ආදායම් රැස්කර ගැනිමට 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසය තුළදි අපොහොසත් වී තිබුණත්, එම කාල පරාසය තුළ රාජ්‍ය ආයෝජන වශයෙන් රු.මිලියන 8,199,316 ක් උපයෝජනය කර තිබුණි. එම උපයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සමස්ථයක් වශයෙන් රාජ්‍ය ණය මගින් සිදු කර ඇති බව මූල්‍ය ප්‍රකාශන

විශ්ලේෂණයේදී පැහැදිලි වේ. 2021 වර්ෂයේදී රාජ්‍ය ආයෝජන වශයෙන් රු.මිලියන 789,636 ක් උපයෝජනය කර තිබුණි. ඉකුත් වර්ෂයේ උපයෝජනය කළ රාජ්‍ය ආයෝජන ප්‍රමාණය වූ රු.මිලියන 811,773 ක් වී තිබුණු අතර, එය සමාලෝචිත වර්ෂයේ උපයෝජනය සමඟ සැසඳීමේදී රු.මිලියන 22,137 ක අඩුවීමක් නිරීක්ෂණය වේ. 2021 වර්ෂයේ රාජ්‍ය ආයෝජන රු.මිලියන 789,636 ක ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි. 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රාජ්‍ය ආයෝජන වශයෙන් එකතුව රු.මිලියන 8,199,316 ක ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශවල භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි. නමුත් 2021 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් වශයෙන් ඉන් රු.මිලියන 2,663,594 ක් පමණක් වත්කම් වශයෙන් හඳුනා ගෙන ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශවල සඳහන් කර තිබුණු භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්වල එකතුව රු.මිලියන 8,199,316 කින් රු.මිලියන 5,535,721 ක් හෙවත් සියයට 68 ක් වටිනා වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට අපොහොසත් වී තිබුණි. 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරාසය තුළ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර නොතිබුණු අතර, එය 2015 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීම ආරම්භ කර තිබුණි. විස්තර වගුව 12 හි දැක්වේ.

වර්ෂය	භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම	ගිණුම්ගත කර තිබුණු මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ප්‍රමාණය	වැය කර තිබුණත්, මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකළ ප්‍රමාණය	වියදමෙන් ගිණුම් ගත නොකළ ප්‍රමාණයේ ප්‍රතිශතය
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	සියයට
2006	197,850	17,697	180,153	91.06
2007	271,191	45,279	225,912	83.30
2008	297,173	45,439	251,734	84.71
2009	365,754	71,819	293,935	80.36
2010	347,007	63,669	283,337	81.65
2011	398,519	49,615	348,904	87.55
2012	471,089	51,591	419,497	89.05
2013	455,578	25,923	429,655	94.31
2014	595,711	64,211	531,500	89.22
2015	683,963	125,266	558,697	81.69
2016	594,013	361,771	232,242	39.10
2017	657,530	500,300	157,230	23.91
2018	625,310	294,160	331,150	52.96
2019	637,219	304,949	332,269	52.14

2020	811,773	489,705	322,068	39.67
2021	789,636	152,200	637,436	80.73
එකතුව	8,199,316	2,663,594	5,535,721	67.51

වගුව 12 - රාජ්‍ය ආයෝජන/ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් වලින් ජනිත මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත කිරීම

මූලාශ්‍ර - 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

අයවැය හිඟය

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 වර්ෂයේ අයවැය හිඟය රු.මිලියන 2,080,078 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 12.37 ක් වී තිබුණි. 2020 වර්ෂයේ අයවැය හිඟය රු.මිලියන 2,115,599 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14.08 ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සමස්ථ කාල පරාසය පුරාවට අයවැය හිඟයක් පැවැතුණු අතර, එය 2006 වර්ෂයේදී පැවැති රු.මිලියන 299,705 ක අයවැය හිඟය 2021 වර්ෂය වන විට රු.මිලියන 2,080,077 ක් දක්වා වර්ධනය වී තිබුණි. එම කාලපරාසය තුළ ඉහළම අයවැය හිඟය 2020 වර්ෂයේදී වාර්තා ගත වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශයක් ලෙස ගත් විට එය සියයට 5.55 ක සිට සියයට 14.08 ක් දක්වා පරාසයක ප්‍රමාණයක පැවතුණි. තථ්‍ය අයවැය හිඟය තථ්‍ය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතය 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව පැවැතිය යුතුව තිබුණු සියයට 5 ක සීමාව එම කාල පරිච්ඡේදය තුළ කිසිම වර්ෂයකදී පවත්වා ගෙන නොතිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් සියයට 5.55 ක්, සියයට 5.69ක් හා 5.59 ක ප්‍රමාණයයන් ගෙන් පවත්වා ගැනීමට සමත් වී තිබුණි. විස්තර රූපසටහන 09 හි දැක්වේ.

රූපසටහන 09 - අයවැය හිඟය ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර - මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා හා රජයේ මූල්‍ය ප්‍රකාශන 2006-2021

රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය රු.මිලියන 2,569,545 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය රු.මිලියන 2,196,859 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.මිලියන 372,686 කින් හෙවත් සියයට 17 කින් වැඩි වී තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය රු. මිලියන 2,080,078 ක් වී තිබුණු අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය රු.මිලියන 2,115,599 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය රු.මිලියන 35,521 කින් අඩු වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු.මිලියන 489,467 කින් හෙවත් සියයට 19 කින් තථ්‍ය අයවැය හිඟය අඩු වී තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය

රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන අයවැය හිඟය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් වන අයවැය හිඟය අතර වෙනස් අගයන් වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් රජයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ වර්ගීකරණය අනුව පිළියෙල කර ඇති බවත්, ආර්ථික වර්ගීකරණය අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය ගණනය කර ඇති බවත් දන්වා තිබුණි. 2021 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව අයවැය හිඟය රු.මිලියන 2,058,925 ක් වී තිබුණි. නමුත් රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම හිඟය රු.මිලියන 2,080,078 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 21,153 ක වෙනසක් පැවැතුණි.

අයවැය හිඟය මූල්‍යනය

රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී, අයවැය හිඟය රු.මිලියන 35,521 කින් එනම් සියයට 1.68 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අයවැය හිඟය පියවා ගැනීමට ශුද්ධ වශයෙන් විදේශ ණය රු.මිලියන 13,901 ක් ආපසු ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව, අයවැය හිඟය පියවා ගැනීමට ශුද්ධ වශයෙන් දේශීය ණය රු.මිලියන 1,717,712 ක් ලබා ගැනිමට සිදු වී තිබුණි.

ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය ණය ගැනීම් මඟින් ඉහළ දායකත්වයක් ලබාගෙන තිබුණු අතර එය සමස්ථ මූල්‍යනයෙන් සියයට 82 ක් වී තිබුණි.

ණය ශේෂය වර්ධනය වීම

වාර්ෂිකව අයවැය හිඟය වර්ධනයවීම හමුවේ ණය ලබා ගැනීම් ප්‍රමාණයද වැඩි වි තිබුණි. 2021 වර්ෂය අවසාන වන විට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු.මිලියන 16,826,831 ක් ලෙස රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ශේෂය දේශීය ණය වශයෙන් රු.මිලියන 9,985,947 ක්ද, විදේශ ණය වශයෙන් රු.මිලියන 6,840,884 ක් වශයෙනි පැවැතුණි. 2020 වර්ෂයේදී රජයේ

ණය ශේෂය රු.මිලියන 14,692,492 ක් වී තිබුණි. ඒ අනුව 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී ණය ශේෂය රු.මිලියන 2,134,339 කින් හෙවත් සියයට 14.53 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ පැවැති රු.මිලියන 2,430,871 ක ණය ශේෂය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 82.72 ක් වී තිබුණි. එය 2021 වර්ෂය අවසාන වන විට රු.මිලියන 16,826,831 ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 100.11 ක් වී තිබුණි. 2021 අංක 12 හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) සංශෝධන පනත්වලින් සංශෝධිත 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව රජයේ බැරකම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80 කට වඩා අඩු විය යුතුව තිබුණත්, අනෙකුත් බැරකම් හැර රජයේ ණය බැරකම පමණක් එම සීමාව ඉක්මවා සියයට 100.11 ක් වී තිබුණි. එම තත්ත්වය 2020 වර්ෂයේදීද පැවැතුණි. විස්තර රූපසටහන 10 හි දැක්වේ.



රූපසටහන 10 - රාජ්‍ය ණය ශේෂය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

රාජ්‍ය ණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ණය ඇතුළු සම්පූර්ණ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතු වන අතර ජනරජයේ සියළු ණය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතුවේ. 2021 අංක 26 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2020 අංක 7 දරන විසර්ජන පනතේ 2.1 (ආ) වගන්තිය ප්‍රකාරව “2021 මුදල් වර්ෂය තුළ ලබා ගනු ලබන ණය මුදල්වලින් පැන නගින ඉතිරි ශේෂය 2021 මුදල් වර්ෂය තුළ කවර හෝ අවස්ථාවකදී හෝ 2021 වර්ෂය අවසානයේ දී රුපියල් තුන්දහස් තුන්සිය අනුහත් බිලියනයක් නොඉක්මවන්නේ නම් සහ 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 13 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුව ඉදිරියේ

තැබීම සඳහා නියමිත අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ ඒ ණය මුදල්වල විස්තර ඇතුළත් කරන්නේ නම්, ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් අදාළ නීති ප්‍රකාර, ශ්‍රී ලංකාව තුළින් හෝ බැහැරින් හෝ මුදල් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන්නා වූ, 2021 මුදල් වර්ෂය තුළ දී ණය ගැනුම්වලින් පියවිය යුතුය. එසේ වුවද, මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි 2021 මුදල් වර්ෂය තුළදී ලබා ගන්නා ලද ණය මුදල් ගණනය කිරීමේ කාර්යය සඳහා කෙටිකාලීන ණය මුදල් ප්‍රමාණය තීරණය කිරීමේදී, 2021 මුදල් වර්ෂය තුළදී ලබා ගන්නා සම්පූර්ණ කෙටිකාලීන ණය ප්‍රමාණය සහ 2021 මුදල් වර්ෂය තුළදී කරනු ලබන සම්පූර්ණ කෙටිකාලීන ණය පියවීම් ප්‍රමාණය අතර වූ වෙනස පමණක් සලකා බලනු ලැබිය යුතුය. එම විධිවිධානවලට යටත්ව පාර්ලිමේන්තුව විසින් ණය ලබා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය රු. මිලියන 516,606 ක් ද, දේශීය බැංකු නොවන ණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) රු.මිලියන 2,519,420 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 3,036,026 ක ණය ලබා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු.මිලියන 2,854,791 ක ණය ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) සමඟ සැසඳීමේදී, රු.මිලියන 181,235 කින් හෙවත් සියයට 6.34 කින් වැඩිවීමකි. සමාලෝචිත වර්ෂයේදී රජය දේශීය ණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු දේශීය ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළුව) රු.මිලියන 2,253,903 ක දේශීය ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.මිලියන 265,517 කින් හෙවත් සියයට 11.78 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබා ගත් ණය ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සසඳා වගුව 13 හි දැක්වේ.

විස්තරය		2021	2020
		රු. මිලියන	රු. මිලියන
විදේශීය ණය ගැනීම්		516,606	600,888
දේශීය ණය ගැනීම්			
	භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ)	649,336	723,705
	භාණ්ඩාගාර බැඳුම්කර	1,761,979	1,332,069
	විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන)	(102,352)	50,635
	සංවර්ධන බැඳුම්කර	207,504	93,679
	විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන)	2,953	3,815
	දේශීය කාලීන ණය පහසුකම	-	50,000
මුළු දේශීය ණය ගැනීම්		2,519,420	2,253,373
වර්ෂය තුළ ලබාගත් මුළු ණය ප්‍රමාණය		3,036,026	2,854,791

වගුව 13 - රජය විසින් ලබා ගත් දේශීය හා විදේශීය ණය

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය ශේෂය (බැංකු අයිරාව හැර) රු. මිලියන 16,826,831 ක් වූ අතර, එය 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 14,692,492 ක් වූ මුළු රාජ්‍ය ණය ශේෂය (බැංකු අයිරාව හැර) සමඟ සැසඳීමේදී රු.මිලියන 2,134,339 කින් හෙවත් සියයට 14.53 කින් වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු රාජ්‍ය ණය පිළිබඳ විස්තරයක් පහත වගුව 14 හි දැක්වේ.

විස්තරය	දෙසැම්බර් 31 දිනට ශේෂය	
	2021	2020
	රු. මිලියන	රු. මිලියන
භාණ්ඩාගාර බිල්පත්	2,270,712	1,621,375
භාණ්ඩාගාර බැඳුම්කර	6,937,928	5,689,504
රුපියල් ණය	24,088	24,088
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	460,078	491,857
විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය	139,301	227,418
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකය (ව්‍යාපෘති)	20,247	19,348
සුහුරුපාය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගත් ණය	5,120	5,689
භාණ්ඩාගාර බැඳුම්කර (සක්‍රිය වගකීම් කළමනාකරණ පනත)	30,000	30,000
විශ්‍රාම පාරිතෝෂික ණය	52,995	57,065
කල්බදු ණය හිමියන්	478	732
දේශීය කාලීන ණය පහසුකම	45,000	50,000
මුළු දේශීය ණය	9,985,947	8,217,076
විදේශීය (ව්‍යාපෘති)	3,779,702	3,576,769
විදේශ මුදලින් කාලීන ණය පහසුකම්	445,521	279,612
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	2,615,661	2,619,035
මුළු විදේශීය ණය	6,840,884	6,475,416
මුළු රාජ්‍ය ණය ශේෂය	16,826,831	14,692,492
ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය	16,508,000	16,003,000
මුළු රාජ්‍ය ණය ශේෂය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස	101.93	91.81

වගුව 14 - වර්ගීකරණය කරන ලද වර්ෂය අවසානයට පැවැති ණය ශේෂය

මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව/ රජයේ මූල්‍ය ප්‍රකාශන

උපරිම බැරකම් සීමාව ඉක්මවීම

2021 අංක 12 හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80 නොඉක්මවිය යුතුව තිබුණත්, 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා තිබුණු විවිධ රාජ්‍ය ව්‍යවසායවලට අදාළ බැරකම්ද සැලකිල්ලට ගත්විට සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. විස්තර වගුව 15 හි දැක්වේ.

බැරකම	2021 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම රු. බිලියන
බැංකු අයිරාව	832
රාජ්‍ය ණය (රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව)	16,826
මහබැංකු අත්තිකාරම්	150
මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම්:	
- ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් තබන විදේශ ණය	311
- ගිණුම්ගත නොකළ විදේශ ණය	17
මුළු බැරකම	18,136
ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතය	16,508
මුළු බැරකම ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	109.9

වගුව 15 - උපරිම බැරකම් සීමාව ඉක්මවීම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන තිබුණු ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපිවල වටිනාකම වූ රු.බිලියන 1.58 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විදේශ වියදම් ඒකක වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශනවල ඇතුළත් රු. බිලියන 334 ක වටිනාකම්ද ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත.

ඒක පුද්ගල ණය ප්‍රමාණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 08 ක රාජ්‍ය ණය ශේෂය, මධ්‍ය වාර්ෂික ජනගහනය හා ඒකපුද්ගල ණය ප්‍රමාණය රූපසටහන 11 දැක්වේ.



රූපසටහන 11 - ඒකපුද්ගල ණය ප්‍රමාණය

මූලාශ්‍රය -රජයේ මූල්‍ය ප්‍රකාශන/ මහා බැංකුවේ වාර්ෂික වාර්තා

ඉහත තොරතුරු අනුව මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2012 දෙසැම්බර් 31 දිනට රු.264,811 ක් වූ ඒකපුද්ගල ණය වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට රු.759,471 ක් දක්වා වැඩිවී තිබුණි. එසේම එය, 2020 දෙසැම්බර් 31 දිනට රු.670,308 ක් වූ ඒකපුද්ගල ණය ප්‍රමාණය

සමඟ සැසඳීමේදී රු.89,163 කින් හෙවත් සියයට 13.30 කින් පමණ වැඩිවී තිබුණි.

රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොලී ගෙවීම වැඩිවීම

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ණය ගෙවීම් (දේශීය හා විදේශීය) රු.මිලියන 369,317 කින් වැඩි වී තිබුණු අතර ණය සඳහා පොලී ගෙවීම් ද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 72,948 කින් හෙවත් සියයට 7.48 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂවලදී මෙන් සමාලෝචිත වර්ෂයේදීද ණයවාරික හා පොලී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. විස්තර රූපසටහන 12 හි දැක්වේ.



රූපසටහන 12 - ණය වාරික හා පොලී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

රජය සතු සීමිත වගකීම් සමාගම්

විෂයයන්

- මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකන් ගුවන් සමාගම
- රාජ්‍ය සමාගම් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව විගණකාධිපතිවරයාගේ මතය

රජය සතු සීමිත වගකීම් සමාගම්

රජය සතු සීමිත වගකීම් සමාගම් යන්නට 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට 50 ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් වසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගම් ඇතුළත් වේ. 2021 වර්ෂය අවසානය වන විට විගණකාධිපතිවරයාගේ සෘජු විගණනයට ඇතුළත් රාජ්‍ය සමාගම් 125ක් පැවති අතර ඉන් සමාගම් 70ක් 2021 වර්ෂය සඳහා 2022 සැප්තැම්බර් 20 දින වන විටත් සිය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණු අතර සමාගම් 55ක් පමණක් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. එම රාජ්‍ය සමාගම් 125 හි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ආංශික වර්ගීකරණය රූපසටහන 13 දැක්වේ.



රූපසටහන 13 : රාජ්‍ය සමාගම් 125 හි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ආංශික වර්ගීකරණය

මෙම සමාගම් 125 අතරින් විදුලිබල ක්ෂේත්‍රයට සම්බන්ධ එක් සමාගමක් විසින් තම ආයතනය විගණකාධිපති විසින් විගණනය කිරීම වළක්වාලමින් අධිකරණයෙන් අතුරු තහනම් නියෝගයක් ලබාගෙන ඇති බැවින් එම සමාගම විගණනය කිරීමට නොහැකි වී ඇත.

මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

විගණකාධිපතිවරයාගේ විෂය පථය තුළට ගැනෙන රාජ්‍ය සමාගම් 125ක් විසින් විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ සාරාංශය පහත දැක්වේ.



2021 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, රාජ්‍ය සමාගම් 55 සම්බන්ධයෙන් වාර්තා කරන ලද සමුච්චිත බදු පෙර ලාභය රු. මිලියන 41,283 ක් වන අතර සමාගම් 20ක් සමාලෝචිත වර්ෂය තුළ බදු පෙර අලාභ තත්ත්වයන් වාර්තා කර තිබුණි. එම මුළු අලාභය රු. මිලියන 2,865 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ සමාගම් 34ක් ලාභයක් වාර්තා කර තිබුණි. රු. මිලියන 100 ට වැඩි බදු පෙර අලාභයන් ලැබූ රාජ්‍ය සමාගම් ලෙස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, මාගම්පුර වරාය කළමණාකරණ සමාගම, හොටෙල් ඩිවලොපර්ස් ලංකා යන සමාගම් ඇතුළත් විය. 2021 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව විගණනයට ලක් වූ රාජ්‍ය සමාගම් 55 ක මුළු වත්කම් රු. මිලියන 665,090 ක් විය.



රූපසටහන 14 : 2021 වර්ෂයේ බදු පෙර ලාභ/අලාභ

ශ්‍රී ලංකන් ගුවන් සමාගම

එයාර් ලංකා සමාගම 1998 වර්ෂයේ සිට ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම බවට පත් කළ අතර 1998 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා එමිරේට්ස් සමඟ දස අවුරුදු උපාය මාර්ගික හවුල් ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම පවත්වාගෙන ගොස් ඇත. 2008 දී කළමනාකරණය දේශීය කළමනාකාරිත්වයට පවරන ලදි. 2021 වසරේ පැවති මහ සභා රැස්වීමට අනුව, සමාලෝචිත වර්ෂය හා 2020/21 වර්ෂය තුළදී රජය විසින් ලබා දුන් රු.මිලියන 44,743.23 ක දීමනා එකතු කිරීමෙන් සමාගමේ කොටස් ප්‍රාග්ධනය ඉහළ ගොස් ඇති අතර එම නිසා, සමාගමේ ප්‍රාග්ධනය සඳහා රජයේ දායකත්වය රු.මිලියන 51,157 හෝ සියයට 99.11 සිට රු.මිලියන 95,900 හෝ සියයට 99.56 දක්වා ඉහළ ගොස් ඇත.

2021 මාර්තු 31 දින වන විට කුලියට ගත් පටු බඳ ගුවන් යානා 12ක් සහ පළල බඳ ගුවන් යානා 12ක් සේවයේ යොදවා තිබූ නමුත් ඒ අතරින් ගුවන් යානා 4ක් මෙහෙයුම් කටයුතු සිදු නොකර හෝ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. 2022 මාර්තු 31 දිනට සමාගමේ සේවකයන් 5,965ක් විය.

2021 මාර්තු 31 න් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ ශුද්ධ අලාභය රු. මිලියන 45,674 ක් වූ අතර එදිනට සමුච්චිත අලාභය රු. මිලියන 372,015 ක් වූ අතර එම දිනය වන විට සමාගමේ ශුද්ධ වත්කම රු.මිලියන 289,574 ක සෘණ වටිනාකමකි. එබැවින් සමාගමට අඛණ්ඩ පැවැත්මේ බරපතල ගැටළුවක් පවතියි. කෙසේ වෙතත්, කැබිනට් අනුමැතිය මත මහා භාණ්ඩාගාරය අඛණ්ඩ පැවැත්ම සඳහා සහතික වී ඇති අතර, රජය විසින් සහය ලබා දෙනු ඇත.

2021 මාර්තු 31 දින වන විට රාජ්‍ය බැංකු 2 කින් ලබාගෙන ඇති මුළු ණය මුදල රු.මිලියන 71,621ක් වූ අතර, එදිනට වූ ජාත්‍යන්තර බැඳුම්කරයේ ශේෂය රු. මිලියන 34,909ක් විය.

2010 සිට 2021 දක්වා කාලය සඳහා සමාගම සඳහා සංයුක්ත සැලසුම් 11ක් සකස් කර තිබුණු අතර මෙම සැලසුම්වල ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. A330-300 ගුවන් යානා හයක් (06) සහ A350-900 ගුවන් යානා හතරක් (04) මිලදී ගැනීමට, තවත් A350-900 ගුවන් යානා හතරක් (04) බදු ගැනීමට සහ ඉහත A330-300 ගුවන් යානා හය (06) විකිණීමට සහ නැවත බදු ගැනීමට තීරණය කිරීම, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සහ නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු නොකර 2013 වර්ෂයේ දී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

මේ අතර, 2020 සහ 2021 දී ලැබීමට නියමිතව තිබූ A350-900 ගුවන් යානා හතර (04) වෙනුවට A321 NEOs සහ/හෝ A330 NEOs ලබා ගැනීමට ගිවිසුම සංශෝධනය කිරීම සඳහා සමාගම, එයාර්බස් එස්ඒඑස් (Airbus SAS) සමාගම සමඟ සාකච්ඡා කරමින් සිටින අතර වාර්තා කරන දිනය වන විට රු.මිලියන 2,528.12 (ඇ.එ.ජ. ඩොලර් මිලියන 19.21) ක් එයාර්බස් වෙත ලැබීමට පෙර ගෙවීම් ලෙස

ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2022 මාර්තු 31 වන තෙක් අවසන් තීරණයක් ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, A330-300 ගුවන් යානා 6 ක් 2013 සහ 2014 දී මිලදී ගෙන, විකුණා සහ නැවත බදුගෙන ඇත.

2016/2017 වර්ෂයේදී බදු පදනම මත ලැබීමට නියමිතව තිබූ A350-900 ගුවන් යානා හතරක් (04) සඳහා වූ බදු ගිවිසුම් අවලංගු කිරීමේ ක්‍රියාවලියේදී වන්දි වශයෙන් රු.මිලියන 16,924.36 ක මුදලක් ගෙවා තිබුණි. තවද, එවකට ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ බිරිඳට අයත් සමාගමකට මෙම ගනුදෙනුවට අදාළව ගෙවීම් කිරීමට එයාර්බස් සමාගමේ සේවකයින් එකඟ වී ඇති බව එක්සත් රාජධානියේ ක්‍රවුන් කෝට් (Crown Court) හි තීන්දුවෙන් අනාවරණය විය. හිටපු ප්‍රධාන විධායක නිලධාරියාට එරෙහිව සහ අලාභ අයකර ගැනීමට සමාගම විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

රාජ්‍ය සමාගම් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය සමාගම් විසින් 2021 වර්ෂය අවසානයට විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් එහි දැක්වෙන මූල්‍ය තොරතුරු වලින් සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන්නේද යන්න පිළිබඳව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට මූල්‍ය ප්‍රකාශයන්හි අනුකූලතාවය පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල රාජ්‍ය සමාගම් 55ක් සම්බන්ධව විගණකාධිපතිවරයාගේ මතයේ ආකාරය පහත දැක්වේ.



විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්

විෂයයන්

- විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හී කාර්යසාධනය
- මූල්‍ය කාර්යසාධනය
- විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසීන්ට අනුව ඇතැම් ආයතන විශේෂිත ව්‍යාපාරික ව්‍යවසායන් ලෙස හඳුන්වා දී ඇත. මෙම පනත 1999 ජනවාරි 01 දා සිට, හඳුනාගත් විශේෂිත ව්‍යාපාරික ව්‍යවසායයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ විගණන කිරීම සඳහා අදාළ වේ.

ඒ අනුව බැංකු, රක්ෂණ, කල්බදු, ණයසාධ්‍යකරණය, මූල්‍යසේවා, අරමුදල් කළමනාකරණය, කොටස් තැරැව්කාර යන ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටින සමාගම්, කොළඹ කොටස් හුවමාරුව යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම සමාගම් සහ රු.මිලියන 500 ට වැඩි ආදායමක් ඇති සමාගම්, රු. මිලියන 100 ට වඩා අධික හිමිකම් ප්‍රාග්ධනයක් හිමි සමාගම, රු. මිලියන 300ට වැඩි දළ වත්කම් හිමි සමාගම්, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන වෙත රු. මිලියන 100ට වඩා වැඩි වගකීම් සහිත සමාගම්, 1,000ට වඩා වැඩි කාර්ය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටින සමාගම්, භාණ්ඩ විකිණීමේ හෝ සේවා සැපයීමේ යෙදී සිටින රාජ්‍ය සංස්ථා විශේෂිත ව්‍යාපාර ව්‍යවසායවලට (SBE) ඇතුළත් වේ. මෙම සෑම විශේෂිත ව්‍යාපාර ව්‍යවසායක් (SBE) මගින්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඒවායේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අවශ්‍ය වන අතර වෘත්තියේ කටයුතු කිරීම සඳහා ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන ආයතනයේ සාමාජිකයන් වන, වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් විගණකවරුන් විසින් සෑම විශේෂිත ව්‍යාපාර ව්‍යවසායකම (SBE) ගිණුම් විගණනය කරනු ලබන්නේය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය යටතට රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද, ඒවායේ ගිණුම් ද ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය ලෙස සඳහන් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අධීක්ෂණ මණ්ඩලයේ තොරතුරුවලට අනුව, අස්තිත්ව 1681ක් විශේෂිත ව්‍යාපාර ව්‍යවසාය (SBE) වශයෙන් ලැයිස්තුගත කර ඇති අතර ජාතික විගණන පනතට අනුව, 2021 වසර අවසානයේදී රාජ්‍ය සමාගම් හැර විශේෂිත ව්‍යාපාර ව්‍යවසාය (SBE) ලෙස ගැනෙන රාජ්‍ය සංස්ථා 45ක් විගණකාධිපතිවරයාගේ විෂයපථය යටතට ඇතුළත් වේ. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ඉදිරිපත් කර ඇති ආයතන වර්ගීකරණය අනුව එම විශේෂිත ව්‍යාපාර ව්‍යයසායන් රූපසටහන 15 හි පරිදි වර්ගීකරණය කළ හැකිය.



රූපසටහන 15 : විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් වර්ගීකරණය

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හී කාර්යසාධනය

බොහොමයක් විශේෂිත ව්‍යාපාර ව්‍යාවසායන් යම් නිශ්චිත අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරන ලද රාජ්‍ය සංස්ථා වේ. සමහර විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් අලාභ ලබන තත්ත්වයක් දී වුවද එහි සමාජ ප්‍රතිලාභය සලකා බලා තවදුරටත් පවත්වාගෙන යාමට සිදුව ඇත. ලාභය එහි දී කාර්යසාධන මිණුම්දණ්ඩක් ලෙස සැලකීම ප්‍රශස්ථ නොවන අතර එම ව්‍යවසායන් කොතෙක් දුරට එකී ප්‍රමුඛ සමාජ අවශ්‍යතා සඳහා දක්වා ඇති දායකත්වය සැලකිල්ලට භාජනය කළ යුතුය.

එහි දී කාර්යසාධන විගණනයේ අවශ්‍යතාව දැඩිව ඉස්මතුවන අතර එක් එක් ව්‍යවසාය පිහිටවීමේ විශේෂ අරමුණු පවතින අතර කාර්යසාධන විගණනයේ දි එකී අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා එම විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් සම්පත් කාර්යක්ෂමව, ආර්ථිකව හා ඵලදායිව අරමුණු සපුරාලීම සඳහා උපයෝජනය කර තිබේ ද යන්න පරික්ෂාවට බඳුන් කරනු ලබයි.

මූල්‍ය කාර්යසාධනය

විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් වූ මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු හා මූල්‍ය ආයතන 07 හැර අනෙකුත් ව්‍යාවසායන් 26 ක් 2021 වර්ෂය තුළ රු. මිලියන 72,281 ක සමුච්චිත බදු පෙර අලාභයක් උපයා ඇති අතර එහි ආංශික වර්ගීකරණය රූපසටහන 16 හි දැක්වේ.



රූපසටහන 16 : 2021 වර්ෂයේ බදු පෙර ලාභ/අලාභ

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද ආයතන 26 කින් (බැංකු හැර) ආයතන 06 ක මූල්‍ය ප්‍රතිඵලය ඌන තත්ත්වයක් වූ අතර එහි සමුච්චිත බදු පෙර අලාභ අගය රු. මිලියන 110,177 ක් විය. ආයතන 20ක සමස්ථ බදු පෙර ලාභය රු. මිලියන 37,896 ක් විය. 2021 වර්ෂය අවසානයේ දි රු. මිලියන 100ට වඩා අලාභයක් වාර්තා කල ප්‍රධාන ආයතන අතරට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළත් වන අතර ලංකා විදුලිබල මණ්ඩලය සහ ඛණිජතෙල් නීතිගත සංස්ථාව යන ආයතන දෙකෙහි බදු පෙර අලාභය පමණක් රු.මිලියන 103,745 ක් විය.

විගණනය සඳහා ඉදිරිපත් වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 වර්ෂය තුළ (බැංකු හැර) විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හි මුළු ශුද්ධ වත්කම් රු.මිලියන 930,258ක් විය. එහි ආංශික වර්ගීකරණය මත ශුද්ධ වත්කම්වල විසිර පැවතීම පහත පරිදි දැක්විය හැකිය. ඒ අනුව 2021 වර්ෂයට අදාළව වරාය අධිකාරිය හා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මුළු ශුද්ධ වත්කම්වලින් සියයට 93 ක් නියෝජනය කරයි. වත්කම් අභිබවාගිය වගකීම් වල සමුච්චිත වටිනාකම රු. මිලියන 367,678 ක් වන අතර ඊට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා පිඟන් සංස්ථාව, දේශිය ණය සහ සංවර්ධන අරමුදල ඇතුළත් වේ.



රූපසටහන 17 : විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්වල ශුද්ධ වත්කම්වල විසිර පැවතීම

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් 2021 වර්ෂය අවසානයට විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් එහි ප්‍රකාශිත මූල්‍ය තොරතුරු වලින් සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන්නේද යන්න පිලිබඳව හා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලතාවය පිලිබඳව විගණකාධිපතිවරයාගේ නිගමනය විගණක මතයෙන් ප්‍රකාශ කෙරේ.

බැංකු හැර විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් 38ක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ විගණන මතයේ ආකාරය පහත දැක්වේ.



විගණනයට යටත් වන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්

විගණනයට යටත් වන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්

නිශ්චිත පරමාර්ථයක් ඉටු කර ගැනීම අරමුණු කර ගෙන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 64 ක් ස්ථාපිත කර ඇති අතර එම සියළුම අරමුදල් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් යටතේ ක්‍රියාත්මක වනු ලබයි. මෙම අරමුදල්වලින් 42ක් පමණක් පනතක් මඟින් ස්ථාපිත කර ඇති අතර, අනෙක් අරමුදල් 22 අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන්, නියමාවලින්, වෙනත් පනත්වල ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගෙන හා භාර ඔප්පු මඟින් පිහිටුවා තිබූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ලෙස ස්ථාපිත කර තිබුණි.

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876 (3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව දන්වා ඇතත්, ඒ අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල 22 සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද එම ඡේදය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීති ගත කිරීමට කටයුතු කළ යුතු වුවත් 2021 වර්ෂය තුළදී කිසිදු අරමුදලක් ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

2022 සැප්තැම්බර් 10 දිනට 2021 මූල්‍ය වර්ෂය වෙනුවෙන් අරමුදල් 51 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ අතර, ඉතිරි අරමුදල් 13 හි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඉදිරිපත් කර තිබූ ගිණුම් 51 කින් විගණනය අවසන් කළ ගිණුම් 46 ක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද මතයන් සංඛ්‍යාව වගුව 16 හි දැක්වේ.

නිකුත් කර ඇති විගණන මතය	සංඛ්‍යාව
තත්ත්වාගණනය නොකළ මතය	10
තත්වාගණනය කළ මතය	34
මතය වියාචනය	01
අහිතකර මතය	01

වගුව 16 : අරමුදල් 46 ක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද මතයන් සංඛ්‍යාව

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද අරමුදල් 51 කින් අරමුදල් 35 ක මුදල් ශේෂයක් හා අරමුදල් 15 ක භාණ්ඩාගාර පොදු තැන්පත් ශේෂයක් පැවතිණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා බැංකු ශේෂය රු.මිලියන 7,786.26 ක් හා විදුලිබල මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ බැංකු අයිරාව රු. මිලියන 72.85 ක් වූ අතර පළාත් පාළන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ මුදල් ශේෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පොදු ගිණුමට තැන්පත් කරයි. සමාලෝචිත

වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන පොදු තැන්පත් ගිණුම් 15 ක රු. මිලියන 24,674.71 ක ශේෂයක් පැවතිණි.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබූ අරමුදල් 51 කට අදාළව මුළු ආදායම රු.මිලියන 405,092.90 ක් වූ අතර මුළු වියදම රු.මිලියන 62,127.05 ක් විය. එම අරමුදල් වලින් අරමුදල් 42 ක සමාලෝචිත වර්ෂයේ ඉපයූ අතිරික්තය රු. මිලියන 344,573.87 ක් වූ අතර, අලාභ ලබා තිබූ අරමුදල් 09 ක ඌණතාවය රු.මිලියන 1,608.02 ක් විය. තවද, අරමුදල් 51 කට අදාළ මුළු වත්කම් ශේෂය රු.බිලියන 3,687.61 ක් විය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ ප්‍රදේශීය ලේකම් කාර්යාල 329 ක් ක්‍රියාත්මක වන අතර වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට ප්‍රතිපාදන වෙන්කරනු ලබයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවලට අයත් කාර්යාල පවත්වාගෙන යනු ලබයි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමාජසේවා දෙපාර්තමේන්තුව ආදි විවිධ රජයේ ආයතනවලට අදාළ මෙහෙයුම් කටයුතු සඳහා කාර්යාල පවත්වාගෙන යනු ලබයි.

2021 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ පාර්ලිමේන්තු විසර්ජන පනතින් රු.මිලියන 43,656.65 ක් ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඉන් රු.මිලියන 38,056.88 ක් වැයකර තිබුණි. ඒ අනුව සලසා ඇති ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4005.77 ක් ඉතිරි වී තිබුණි. රේඛීය අමාත්‍යාංශය මඟින් රු.මිලියන 17,179.69 ක් ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඉන් රු.මිලියන 11,727.72 ක් වැයකර තිබුණි. ඒ අනුව සලසා ඇති ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5451.97 ක් ඉතිරි වී තිබුණි. තවද වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් විවිධ කාර්යයන් ඉටු කර ගැනීමට ලබා දී තිබූ රු.මිලියන 85,261.54 ක මුදලින් රු.මිලියන 69,023.63 ක් වැය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 16,237.91 ක ඉතිරියක් විය.

2021 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලින් අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

- කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාළව රු.මිලියන 2.99 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු ව්‍යාපෘති 16 ක වැඩ නිම කර නොතිබුණි. කොළඹ, දෙහිවල, කොලොන්නාව, කැස්බෑව සහ හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ක්‍රියාත්මක වේ. මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 ජූලි 15 දින සිදු වූ රු.මිලියන 1.08 ක මුදල් වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර තිබුණු අතර එය ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරි, මුදල් සහකාර සහ සරප් යන අයගෙන් අයකර ගත යුතු බවට නිර්දේශ ලබාදී තිබුණද 2022 අගෝස්තු වනවිටත් අයකරගෙන

නොතිබුණි. මිනුවන්ගොඩ, අත්තනගල්ල සහ මීගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජා මූල බැංකු 16 කින් ලබා දී තිබූ රු.මිලියන 254.16 ක ණය ශේෂවල ගෙවීම් පැහැර හැර තිබුණි. අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පවුල් 50,718 ක් වූ අතර ඉන් පවුල් 399 ක් අනවසර නිවාසවලද 318 ක් තාවකාලික නිවාසවලද, 345 ක් වැසිකිළි පහසුකම් නොමැතිවද, 269 ක් මාර්ග පහසුකම් නොමැති පවුල්ද, 662 ක් පිරිසිදු ජලය නොමැති පවුල් ද, 564 ක් විදුලිය නැති නිවාස ද, 27,118 ක් සේවා වියුක්තවද සිටින බව නිරීක්ෂණය විය.

- කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 8 ක රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට අයත් ගොඩනැගිලි 45 ක් වර්ෂ ගණනාවක සිට භාවිතයට ගෙන නොතිබුණි. ඉන් 11 ක් භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. ස්වභාවික ආපදාවලින් පූර්ණ හානියට පත්වූ පවුල් සඳහා ‘නිවසට නිවසක්’ සංකල්පය මත නිවාස 918 ක් සඳහා 2017 සිට 2021 දක්වා රු.මිලියන 1,466.81 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු.මිලියන 1,002.29 ප්‍රතිලාභීන් හට ලබාදී තිබුණි. ප්‍රතිලාභීන් 397 කගේ නිවාස නිමකර නොතිබුණි.

- ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් ක්‍රියාත්මක වේ. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ආසන 2000 ක ශ්‍රවණාගාරය ඉදි කිරීමට මුල් ඇස්තමේන්තුව රු.මිලියන 1,700 ක් වුවද, අවස්ථා දෙකකදී පිළිවෙලින් රු.මිලියන 2,657 ක් හා රු.මිලියන 3,155 ක් දක්වා ඇස්තමේන්තුව වැඩි කර තිබුණු අතර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. භෞතික ප්‍රගතිය සියයට 15 ක තරම් අඩු මට්ටමක විය. 2022 පෙබරවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ව්‍යාපෘතියේ නොනිමි වැඩ වෙනත් කාර්යයකට යොදා ගැනීමේ හැකියාව පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද එසේ සිදු කර නොතිබුණි. ශ්‍රවණාගාරය අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව සිදු කිරීම හේතුවෙන් වැය කල රු.මිලියන 874.79 නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. තවද ඉදිකිරීමට අදාළව ගෙනවිත් තිබූ ද්‍රව්‍ය ව්‍යාපෘති භූමියේ අනාරක්ෂිතව ගොඩගසා තිබුණි. ව්‍යාපෘතිය සඳහා පවරා ගන්නා ලද හෙක්ටයාර 2.709 ඉඩමද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

- මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් ක්‍රියාත්මක වේ. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පොදු යටිතල

පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කෝට්ටගොඩ උම්බලකඩ හා කරවල නිෂ්පාදන කර්මාන්ත ගොඩනැඟිල්ල රු.මිලියන 6 ක ඇස්තමේන්තුව මත ඉදිකිරීම සැලසුම් කර තිබුණද 2022 පෙබරවාරි වන විටත් ගොඩනැඟිල්ලේ අත්තිවාරම දක්වා කොන්ක්‍රීට් කනු ඉදිකිරීම පමණක් සිදුකර තිබුණි.

- හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් ක්‍රියාත්මක වේ. සූරියවැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අඩු ආදායම්ලාභී පවුල් තහවුරු කරගැනීමකින් තොරව රු.මිලියන 3.2 ක බඩුමලු 320 ක් බෙදාදී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 විසින් කුට්ටිගල් ඇතිරූ මාර්ග 163 ක දාර කැපීම සිදු නොකර තිබියදී ඒ සඳහා රු.මිලියන 5.16 ක් ගෙවා තිබුණි. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 ක නියමිත ප්‍රමිතියට ABC ගල් අතුරා නොතිබියදී රු.මිලියන 4.11 ක් වැඩියෙන් ගෙවා තිබුණි. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක රු.මිලියන 3.46 ක් වැයකර ගල් ඇතිරූ මාර්ග 05 ක් කිලෝමීටර ලක්ෂය යටතේද සංවර්ධනය කිරීමට අනුමැතිය ලබාදීම හේතුවෙන් ඒ සඳහා වැයකල මුදල් නිෂ්ක්‍රීය වියදමක් වී තිබුණි.

- මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් ක්‍රියාත්මක වේ. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක විශ්‍රාමික නිලධාරීන් 61 කට රු.මිලියන 13.22 ක් වැඩියෙන් ගෙවා තිබුණු අතර ඉන් රු.මිලියන 5.19 ක් අයකරගත යුතුව පැවතුණි. හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක ග්‍රාම ශක්ති ව්‍යාපාරය යටතේ ලබාදුන් ණයවලින් රු.මිලියන 3.03 ක් අයවීමට තිබූ අතර ඉන් රු.මිලියන 2.44 ක් මාස 06 කට වඩා ගෙවීම ප්‍රමාද වී තිබුණි. දිවිනැඟුම ප්‍රජාමූල බැංකුවල සමාලෝචිත වර්ෂය අවසානයේ චක්‍රීය අරමුදල් ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 173.69 ක් වූ අතර, ඉන් රු.මිලියන 94.94 ක් හෙවත් සියයට 55 ක් ණය ලබාදීමෙන් තොරව පැවතුණි.

- නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හඟුරන්කෙත හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.මිලියන 5.47 ක පාරිභෝජන ද්‍රව්‍ය තොගය ගිණුම්වල දක්වා නොතිබුණි. එමෙන්ම නුවරඑළිය, අඹගමුව සහ වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවසන් පාරිභෝජන ද්‍රව්‍ය තොග ගණනය කර හෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

- මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11

ක් ක්‍රියාත්මක වේ. වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරාගැනීමේදී දීගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දඬුයාය ග්‍රාම නිලධාරි වසමේ ඉඩම් කැබැල්ලක වටිනාකම රු.91,000 ක් ලෙස පළමුව තක්සේරු කර තිබුණි. අවස්ථා කිහිපයකදී තක්සේරු වටිනාකම වෙනස් කර රු.මිලියන 2.91 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණද ඊට වූ පදනම විගණනයේ දී තහවුරු නොවුණි. තවද ඉඩම් කැබලි 07 ක් පෞද්ගලික ඉඩම් ලෙස සලකා රු.මිලියන 2.79 ක වන්දි මුදල් ගෙවා තිබුණි. ගොඩනැගිලි ව්‍යාපෘති 06 ක් හා ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා රු.මිලියන 5.98 ක් වැය කර තිබුණ ද සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව නිෂ්ක්‍රීය ව තිබුණි. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.මිලියන 1 ක් ප්‍රතිලාභීන් 10 දෙනෙකුට ලබාදී තිබුණද එම කාර්යය ආරම්භ කර නොතිබුණි.

- බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් විය. මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට රු.මිලියන 140.96 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර රු.මිලියන 109.02 ක් 2022 මාර්තු වනවිට වැයකර තිබුණි. ගිවිසුම ප්‍රකාරව දින 546 කින් වැඩ නිමකල යුතු වුවත් 2022 මාර්තු වන විට දින 1547 ක් ගත වී තිබුණද වැඩ අවසන් කර නොතිබුණි.

- මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විය. 2020 වර්ෂයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 'සපිරිගමක්' වැඩසටහන යටතේ රු.මිලියන 8.29 ක වියදමක් දරා සංවර්ධනය කරන ලද ග්‍රාමීය මාර්ග 11 ක් 2021 වර්ෂයේ කාපට් අතුරා සංවර්ධනය කර තිබුණි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විදුලි වැට නඩත්තුව සහ පසු විපරම සඳහා මුරකුටි ඉදිකිරීමට 2020 වර්ෂයේ රු.මිලියන 36.45 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණු අතර පැකේජ 5 ක් යටතේ සංවර්ධනය කිරීමට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු සමඟ ගිවිසුම්ගතවී තිබුණි. ඉන් පැකේජ 4 ක් සඳහා රු.මිලියන 25.01 කට ගිවිසුම්ගත වී තිබුණද 2022 මාර්තු වනවිටත් නිමකර හෝ කාලය දීර්ඝකර හෝ නොතිබුණි.

- කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විය. ආබාධ සහිත වූවන්ගේ ස්වශක්ති සංවිධානය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව අඩු ආදායම්ලාභී ආබාධිත

පුද්ගලයන් 300 ක් සඳහා වූ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස ප්‍රතිලාභීන් 381 ක් වෙත 2020 වර්ෂය දක්වා රු.මිලියන 23.71 ක් ගෙවා තිබුණි. තවදුරටත් ගෙවීමට ඇති ආධාර මුදල රු.මිලියන 95.69 ක් විය. තවද 2018 වර්ෂයේ කොඩි අලෙවිය මඟින් රැස්කළ රු.මිලියන 7.36 ක් ස්වශක්ති බල මණ්ඩලයේ තැන්පත් කර තිබුණි. මෙම මුදල් අදාළ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණු අතර ප්‍රතිලාභීන් 381 කින් නිවාස 03 ක් පමණක් නිමකර තිබුණි. ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ සමිති ස්ථාපිත කිරීම සඳහා පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක සමිති 43 ක් සඳහා රු.මිලියන 69.58 ක් ද, දෙවන අදියර යටතේ සමිති 96 ක් සඳහා රු.මිලියන 4.56 ක් ලබාදී තිබුණද පළමු අදියරේදී ලබාදුන් මුදලින් සියයට 71 ක් හෙවත් රු.මිලියන 49.81 ක් ද, දෙවන අදියරේදී ලබාදුන් මුදලින් සියයට 96 ක් හෙවත් රු. මිලියන 4.36 ක් අදාළ කාර්යය සඳහා නොයොදවා සමිතිවල බැංකු ගිණුම්වල රඳවාගෙන තිබුණි. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුව තිබූ විශ්‍රාම වැටුප් වංචාවෙන් තවදුරටත් රු.මිලියන 16.77 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි. වරකාපොල බස් නැවතුම්පොළ හා සාප්පු සංකීර්ණය ඉදිකිරීම භූමියේ හිමිකාරීත්වය පිළිබඳ ගැටළු හේතුවෙන් රු. මිලියන 15.19 ක් වැයකර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර කර තිබුණි.

- රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් විය. රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 11.22 ක් වූ ව්‍යාපෘති 31 ක් නිම නොකර අත්හැර දමා තිබුණි. ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2020 වර්ෂයේ රු.මිලියන 4.46 ක් වැයකර ඉදිකර තිබුණු මාර්ග 3 ක් අබලන් වී නොතිබියදී නැවත කාපට් කර තිබුණි. ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබුණු අතර වර්ෂ 8 කට පසුව 2021 වර්ෂයේ ලබාදුන් රු.මිලියන 26.42 ප්‍රතිපාදන සැලසුමක් නොමැතිවීම හේතුවෙන් නැවත ආපසු පවරාගෙන තිබුණි. ඉදිකිරීම් පරිශ්‍රය වල්බිහිවෙමින් විනාශවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

- කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක් විය. සපිරිගමක් සංවර්ධන වැඩසටහන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 1,159 ක් සඳහා රු. මිලියන 905.98 ක් වැයකර

තිබුණු අතර ඉන් රු. මිලියන 802.59 ක් හෙවත් සියයට 89 ක් මාර්ග සංවර්ධනයට වැයකර තිබුණි. කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහනට ලබා දී තිබූ රු.මිලියන 100 කින් රු.මිලියන 5.4 ක් වැයකර කැබලි කිරීමේ යන්ත්‍ර 20 ක් මිලදීගෙන තිබුණද, 2022 අප්‍රේල් වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. ඉතිරි රු.මිලියන 94.6 ක ප්‍රතිපාදන නැවත හරවා යවා තිබුණි. කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ට 2020/2021 වර්ෂවල මහ කන්නයේ වී මිලදී ගැනීමට රු.මිලියන 50 ක් ලබාදී තිබුණි. ඉන් රු.මිලියන 1.41 ක වී මිලදීගෙන තිබූ අතර ඉතිරි රු.මිලියන 48.59 හරවා යවා තිබුණි. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට ලබාදී තිබුණ රු.මිලියන 122.26 ක ඇගළුම් උපකරණ 2022 අප්‍රේල් මස වනවිටත් නිෂ්කාර්යව පැවතුණි.

- පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විය. සුළු හා මධ්‍ය පරිමාණ හාල්මොල් හිමියන් හරහා වී මිලදී ගෙන තිබුණද පිළිවෙලින් 2020/2021 මහ කන්නයේ සහ 2021 යල කන්නයේ රජයට ලබා දියයුතු හාල් කිලෝග්‍රෑම් 402,927.7 ක් හා 1,006,687.5 ක් ලබා දී නොතිබුණි. එහි ප්‍රතිශතය සියයට 61.12 ක් හා සියයට 100 විය. 2014 වර්ෂයේ වෙන්නප්පුව ජෝෂප්වාස් විද්‍යාලයේ ක්‍රීඩාගාරය රු.මිලියන 48.64 ක් වැයකර අලුත්වැඩියා කළද එය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 23 ක් විය. ප්‍රාදේශීය ලේකම්වරු යටතේ පාලනය වන රජයේ ඉඩම් වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීම් හා ලබාගැනීම් වෙනුවෙන් ගාස්තු අය කිරීමේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක පවත්වාගෙන යන කළුගල් වැඩබිම්වලින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කළ කැණීම් බලපත්‍රයේ සඳහන් කියුබ් ප්‍රමාණයට වඩා කැනීම් කරනලද කළුගල් සඳහා රු.මිලියන 93.35 ක ගාස්තු අයකර නොතිබුණි. එසේම ඉකුත් වර්ෂවලට අදාළ හිඟ ගාස්තු රු.මිලියන 395 ක්ද විය.

- පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විය. හිඟුරක්ගොඩ හා ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදුලි වැට ආශ්‍රිතව මුර කුටි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 22.95 කට ලබා දී තිබුණු අතර 2021 පෙබරවාරි 20 දින වැඩ නිම කළ යුතු වුවත් 2022 පෙබරවාරි 25 දින වන විටත් ප්‍රමාණ පත්‍රයේ සඳහන් රු.මිලියන 13.55 ක් වූ අයිතම 29 ක් ඉටු නොකර අත්හැර දමා

තිබුණි. ඒ හේතුවෙන් වැය කර තිබූ රු.මිලියන 6.56 ක් නිෂ්කාර්ය වී තිබුණි. තවද, රු.මිලියන 2.07 ක අධි ගෙවීමක් සිදු කර තිබුණු අතර කාර්යසාධන සුරක්ෂණ කාලය 2021 නොවැම්බර් 07 දින අවසන්වී තිබීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා 2019/20 මහ, 2020 යල, 2020/21 මහ කන්න සඳහා වී ලබාගත් මෝල් හිමියන් 44 දෙනෙකු විසින් මිලදී ගන්නා ලද වී කිලෝ ග්‍රෑම් 1,521,337 ක් සහල් බවට පත්කර රජයට ලබානොදීම හේතුවෙන් තවදුරටත් රජයට අයවිය යුතු මුදල රු.මිලියන 85.18 ක් වී තිබුණි. රජයේ ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීමේ ගාස්තු වශයෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පවත්වාගෙන ගිය බලපත්‍රලාභී කළුගල් වැඩපොළවල් 43 කින් අයවිය යුතු රු.මිලියන 142.19 ක් විය.

- ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විය. ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 මැයි 17 දිනැති අංක.SMRHC/RD/04/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව නිවාසලාභීන් තෝරාගැනීමේදී යුද්ධය හෝ ඒ ආශ්‍රිත හේතු නිසා ආබාධිත වූවන් තෝරාගත යුතු වුවත් කින්නියා, කුච්චවේලී, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වෙනත් හේතු නිසා ආබාධිත වූවන් 313 ක් නිවාසලාභීන් ලෙස තෝරාගෙන තිබුණි. “ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය” යටතේ ග්‍රාම ශක්ති ජනතා සමිති 33 ක් වෙත ලබාදී තිබූ රු. මිලියන 52.19 වැඩසටහන ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉටු කල යුතු ව්‍යාපෘති 222 ක් නිම නොකර අත්හැර දමා තිබුණි.

- මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් විය. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනතේ 29 (අ) වගන්තියට අනුව රාජ්‍ය නිලධාරීන්ට, මානසික ආබාධ ඇති අයෙකුට සහ බංකොලොත් අයෙකුට බලපත්‍ර ලබාදිය නොහැකි වුවද ඊට පටහැනිව ඒරාවූර් ප්‍රාදේශීය ලේකම් වැලි බලපත්‍ර දෙකක් ලබාදී තිබුණි. කිරන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දුන් මිරිදිය වැලි කැණීම් බලපත්‍ර 26 කින් අවසර ලබාදී තිබූ කියුබ් ප්‍රමාණයට වඩා වැලි කියුබ් 60,118 ක් කැණීම් කර තිබුණි.

- අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් විය. සමෘද්ධි ගෘහ

ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගොල්ල ගම්මානයේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මසුන් අභිජනන ජල තටාක 30ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 2.67 ක් ලබාදී තිබුණද තටාක 17 ක් ඉදිකර නොතිබුණි.

- යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විය. නිර්වේලි අළුකෙසෙල් කැබලි (Chips) නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය රු.මිලියන 10.33 ක් වූ ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ ස්ථාපිත කර 2020 ජූනි මාසයේදී නිර්වේලි අළුකෙසෙල් නිෂ්පාදන යන්ත්‍රය, විකුණුම් සමූපකාර සමිතිය වෙත පවරා තිබුණද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් නිෂ්ක්‍රීය වියදමක් වී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.6 වගන්තියට පටහැනිව මුල් ගිවිසුම් වටිනාකමෙන් සියයට 50 ක් දක්වා නැවත මිල දී ගැනීමට පවතින සීමාව ඉක්මවා සියයට 60 ත් සියයට 24700 ත් අතර පරාසයක් තුළ රු.මිලියන 30.20 ක භාණ්ඩ ප්‍රති ඇණවුම් මගින් මිල දී ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක් විසින් කටයුතු කර තිබුණි. 2019 වර්ෂයේදී නිම විය යුතු පිරිවැය රු.මිලියන 56.64 ක් වූ කිරි කල්තබා ගැනීමේ ව්‍යාපෘතිය 2022 ජූලි දක්වාම නිමකර නොතිබුණි.

එහෙත්, රු.මිලියන 4.82ක් වූ කාර්යසාධන සුරක්ෂණයේ මුල් පිටපත ලබා නොගැනීම හේතුවෙන් එය මුදල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

- වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු යතුරු පැදි ඇතුළු වාහන 25 ක් වර්ෂ 02 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට අළුත්වැඩියා නොකර අත්හැර දමා තිබුණි. 2018 වර්ෂයේදී රු.මිලියන 16.09 ක වියදමින් ඉදිකළ ඕමන්ත සංස්කෘතික මධ්‍යස්ථානය වර්ෂ 03කට වැඩි කාලයක සිට අභාවිතව පවතී. එමෙන්ම, 2020 වර්ෂයේදී මෙම මධ්‍යස්ථානය සඳහා මිල දී ගත් රු.991,670 ක් වටිනා භාණ්ඩ ඒකක 349 ක් ද වර්ෂකට වැඩි කාලයක සිට අභාවිතව හා අනාරක්ෂිතව පැවැතිණි. වවුනියාව ආර්ථික මධ්‍යස්ථානය මේ දක්වාම භාවිතයට නොගැනීම නිසා 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එහි ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු, ජල ගාස්තු හා උපකරණ මිල දී ගැනීම් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරන ලද රු.මිලියන 4.85ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014/15 වර්ෂවල වී

මිලදී ගැනීමේ අරමුණින් අත්තිකාරම් ලෙස විශ්වමඩු ගොවින්ගේ විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදුන් රු.මිලියන 16 ක් සහ පනංගාමම් පත්තු ගොවින්ගේ විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදුන් රු.මිලියන 2.33 ක් පසුගිය වර්ෂ 06කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි. 2020 වර්ෂයේදි ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරිගම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 1.48 ක වියදමින් තෙල් නිෂ්පාදන යන්ත්‍ර මිලදී ගෙන තිරුමුරුගන්ඩි ග්‍රාමීය සංවර්ධන සමිතියට ලබාදුන් නමුත් අදාළ යන්ත්‍ර අදාළ අරමුණු සඳහා මේ දක්වා භාවිතා කර නොතිබුණි.

- කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විය. කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිෂ්පාදන සමූපකාර ව්‍යාපෘතිය යටතේ ලබා දුන් රු.මිලියන 13.48 ක ගොඩනැගිලි හා උපකරණ වර්ෂ 03කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පවතී. වටිනාකම රු.මිලියන 21.55 ක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බංගලා 02 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

- මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විය. 2018 වර්ෂයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකළ තාක්ෂණ උද්‍යානය, වාහන නැවැතුම්පළ සහ ශ්‍රවණාගාරය සඳහා රු.මිලියන 72.57 ක් ගෙවා තිබූ නමුත් අදාළ කාර්යය සඳහා වූ මුළු ඇස්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුකූලව අනුමැතිය Architectural Drawings and Structural Drawings සඳහා නොමැති බව නිරීක්ෂණය විය.

පළාත් පාලනය

විෂයයන්

- හැඳින්වීම
- විගණන නිරීක්ෂණ
    - තක්සේරුවලට අනුකූල නොවීම
    - වැඩිපුර ගෙවීම්
    - නීතිමය කටයුතු
    - වත්කම් කළමනාකරණය
    - ආදායම් අහිමි වීම
    - අයකරගත යුතු ගාස්තු

පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති මහා නගර සභා 24 ක් මහා නගර සභා ආඥා පනතේ (පරි.252) විධිවිධාන මගින්ද, නගර සභා 41 ක් නගර සභා ආඥා පනතේ (පරි.255) විධිවිධාන මගින්ද, ප්‍රාදේශීය සභා 276 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මගින්ද පළාත් පාලන ආයතන 341 ක් පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම පළාත් පාලන ආයතනයන්ගේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිකුත් කළ විගණන මතයන් පිළිබඳ සාරාංශයක් වගුව 17 හි දැක්වේ.



රූප සටහන 18 : පළාත් පාලන ආයතන ගණන

පළාත් පාලන ආයතන වර්ගය	ගිණුම් ඉදිරිපත් කළ යුතු සභා ගණන	2022.08.15 දිනට විගණනයට ඉදිරිපත් කළ ගිණුම් ගණන	විගණන වාර්තා නිකුත් කළ සභා ගණන	2022.08.15 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය			
				තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	මතය වාරණය	අහිතකර මතය
මහා නගර සභා	24	24	19	13	-	02	04
නගර සභා	41	41	35	35	-	-	-
ප්‍රාදේශීය සභා	276	276	259	250	03	-	06
එකතුව	341	341	313	298	03	02	10

වගුව 17 - 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිකුත් කළ විගණන මතයන්

පළාත් පාලන බලමණ්ඩල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාවලින් අනාවරණය කර ඇති වැදගත් නිරීක්ෂණ කිහිපයක් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

තක්සේරුවලට අනුකූල නොවීම

- බුත්තල ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 67 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව

පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ 2018 ජූලි 24 දිනැති අංක එම්ඕ/ආර්ඩී/498 දරන තක්සේරුව අනුව කටයුතු කර නොතිබීම නිසා 2021 දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු.මිලියන 18.17 ක ආදායමක් අහිමි වී තිබුණි.

- හම්බන්තොට මහා නගර සභාව විසින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 28 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 02 හා 03 ඡේදය ප්‍රකාරව කඩ කාමර තක්සේරු කර සභා සම්මත කරගෙන තිබුණත් කඩකාමර හා ඉඩම් 56 කට අදාළව පැරණි කුළිය අයකිරීම නිසා 2016 වර්ෂයේ ජනවාරි මස සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සභා අරමුදලට රු.මිලියන 13.32 ක පාඩුවක් සිදු වී තිබුණි.

- කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් බලගොල්ල මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 48 ක් සඳහා 2014 වර්ෂයේ තක්සේරුව අනුව නියමිත තක්සේරු මුදල අය නොකර 2015 පෙබරවාරි 25 දින පැවති මහා සභා තීරණය අනුව ඉහළ මහලේ කඩ කාමර සඳහා රු.500 බැගින්ද පහළ මහලේ කඩ කාමර සඳහා රු.1,000 බැගින්ද අය කිරීමට යෝජනා කර එම කුලිය අය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 21.77 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

- අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ නිට්ටඹුව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 83 ක් සඳහා 2018 අගෝස්තු 16 දින කරන ලද තක්සේරුවට ඉදිරිපත් වූ අභියාචනා හේතුවෙන්, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අවම වශයෙන් වසර 03 ක් බල පැවැත්වෙන පරිදි, නැවත සංශෝධනය කරන ලද කඩ කාමර තක්සේරුව, 2019 මාර්තු 22 දින ඉදිරිපත් කර තිබුණි. විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 10 වන විටත් මෙම සංශෝධිත තක්සේරු කුලිය මත පදනම්ව ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තක්සේරු දිනය වූ 2019 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා වර්ෂ 03 ක කාලපරිච්ඡේදයක් සඳහා සංශෝධිත තක්සේරුව හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන්, සභාවට සිදුව ඇති පාඩුවේ වටිනාකම රු.මිලියන 27.58 ක් වී තිබුණි. තවද 2021 දෙසැම්බර් 14 දිනැති මහා සභාවේදී කරන ලද යෝජනා සම්මත වීමක් මත 2022 ජනවාරි 01 දින සිට තක්සේරු වටිනාකමින් සියයට 50 ක් කඩ කුලී ලෙස අය කරමින් පැවතුණි.

වැඩිපුර ගෙවීම්

- මාතර මහා නගර සභාව විසින් 2020 වර්ෂය තුළ විවිධ අරමුදල් යටතේ කොන්ක්‍රීට් කාණු ඉදිකිරීමේදී කාණුවල හැඩයම් සකස් කිරීම සඳහා පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර තිබුණි. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

විසින් පදම් කළ ලෑලි පුවරු භාවිතා කර හැඩයම් සකස් කිරීම සඳහා රේටයක් හඳුන්වා දී නොතිබුණු අතර, ඒ අනුව පදම් කළ ලෑලි පුවරු භාවිතා කර හැඩයම් සැකසීම සඳහා දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් CT-036 යටතේ හඳුන්වා දී තිබූ රු.841 ක රේටය භාවිතා නොකර ඊට අදාළ නොවූ රේටයන් වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ST – 057 යටතේ හා ST – 112 යටතේ හඳුන්වා දී තිබූ රේට දෙක යොදා ගෙන හැඩයම් වර්ග මීටරයක් සඳහා පිළිවෙලින් රු.1,108 හා රු.1,377.85 බැගින් ගෙවීම් කිරීම නිසා කොන්ක්‍රීට් කාණු 42 ක හැඩයම් සකස් කිරීම සඳහා එකතුව රු.මිලියන 3.11 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- කුරුණෑගල මහා නගර සභාව විසින් සායන මධ්‍යස්ථානය හා පෙර පාසැල ඉදිකිරීම සඳහා රු.මිලියන 232.12 ක වටිනාකමකට ගිවිසුම්ගතව ව්‍යාපෘතිය ඉටු කරමින් පැවතුණි. මෙම ව්‍යාපෘතියේ මූලික වියදම් සඳහා (Preliminaries) ඇස්තමේන්තුවේ සඳහන් පහසුකම් සපයා නොතිබියදී ඒ සඳහා රු.මිලියන 9.33 ක මුදලක් හා පරිශ්‍රයේ පැවති ගල ඉවත්කිරීම සඳහා අනුමත මිල රේටය භාවිතා නොකර සාවද්‍ය විශේෂ මිල විශ්ලේෂණයක් සකස් කර තාක්ෂණික නිලධාරී හා සහකාර ප්‍රමාණ සමීක්ෂක විසින් සහතික කිරීමෙන් පසුව නාගරික ඉංජිනේරු හා නාගරික කොමසාරිස් අනුමත කර රු.මිලියන 50.55 ක මුදලක් ලෙස රු.මිලියන 59.88 ක මුදලක් කොන්ත්‍රාත්කරුවෙකුට වැඩිපුර ගෙවා තිබුණි.

නීතිමය කටයුතු

මාතලේ මහා නගර සභාව දෛනිකව කසළ ටොන් 16.5 ක් එකතු කරන අතර ඉන් දිරන හා නොදිරන වශයෙන් වෙන් නොකරන ලද කසළ ටොන් 1 1/2 ක් පමණ දෛනිකව වාරියපොලවත්ත කසළ අංගනයට අවිධිමත්ව බැහැර කර තිබුණි. එමෙන්ම වාරියපොලවත්ත කසළ භූමියේ එක්රැස්වන අප ජලය වර්ෂා දිනවලදී ස්වභාවික ජල මූලාශ්‍රවලට එකතුවන බව නිරීක්ෂණය විය. වාරියපොලවත්ත කසළ බැහැර කිරීමේ ඉඩම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩුවකට අනුව 2020 පෙබරවාරි 20 දින හා ඊට පෙර පැවති නඩුවාරවලදී කසල කළමනාකරණය සම්බන්ධයෙන් ලබාදී තිබුණු නිර්දේශයන් 2021 වර්ෂයේ අවසාන දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාදී නොතිබුණු අතර, අධිකරණයේ පවතින නඩු කටයුත්තද අවසන් වී නොතිබුණි. ඒ සඳහා 2018 සැප්තැම්බර් 15 දින සිට 2021 වර්ෂයේ අප්‍රේල් 06 දක්වා කාල පරාසය තුළ එකතුව රු.මිලියන 5.67 ක නඩු ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණි.

වත්කම් කළමනාකරණය

මහනුවර මහා නගර සභාව විසින් කුඩා රත්වත්ත මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීමේදී තෝරාගත් කොන්ත්‍රාත්කරු අදාළ ඉදිකිරීම් සිදු

කරන අතරතුර විධිමත් අනුමැතියකින් තොරව සභාවට අයත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් ඉදිකිරීම් කටයුතුවලට යෙදවීමේදී අනතුරට පත් වී තිබුණි. පසුව යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට රු.මිලියන 9.97 ක් මහා නගර සභා අරමුදලින් ගෙවා තිබුණද, රක්ෂණ වන්දි 2022 ජූලි 30 දින වනවිටත් ලබාගෙන නොතිබුණි. එමෙන්ම, ගොහාගොඩ කසළ අංගනය තුළ කසළ හැසිරවීම් කටයුතු කරගෙන යාම සඳහා ඉහත අනතුරට පත් යන්ත්‍රය වෙනුවට 2020 නොවැම්බර් සිට 2021 ඔක්තෝබර් දක්වා කාලය තුළ කුළියට ගෙන තිබුණු එක්ස්කැවේටර් යන්ත්‍රය සඳහා යන්ත්‍ර පැයකට රු.3500 බැගින් රු.මිලියන 12.08 ක් ගෙවා තිබුණි. මේ අනුව, එක්ස්කැවේටර් යන්ත්‍රයට සිදු වූ අලාභය හා එම යන්ත්‍රය වෙනුවට කුළියට ගෙන තිබුණු එක්ස්කැවේටර් යන්ත්‍රයට කුළී ගෙවීම සඳහා සභා අරමුදලින් රු.මිලියන 22.05 ක් ගෙවා තිබුණද, එම මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

ආදායම් අහිමි වීම

කොළඹ මහා නගර සභාව විසින් තෝරාගත් බල ප්‍රදේශයක පාර්කින් මීටර් සවිකිරීම මඟින් රථවාහන ගාල් කිරීම සඳහා වන ගිවිසුමට පුද්ගලික ආයතනයක් සමඟ 2016 මාර්තු 28 දින ගිවිසුම්ගත වී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට අදාළ ආයතනයෙන් අයකර ගතයුතු හිඟ කුලී ආදායම රු.මිලියන 101.77 ක් විය. 2016 වර්ෂයේ සිටම නිසි පරිදි කුලී මුදල් නොගෙවීම නිසා 2021 අප්‍රේල් 07 දින අදාළ ආයතනය සමඟ පැවති ගිවිසුම අත්හිටුවීමට නගර සභාව කටයුතු කර තිබූ නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් එම ප්‍රදේශවල රථගාල් ගාස්තු අයකර ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් සකසා නොතිබුණි. ඒ අනුව වසරකට ආසන්න කාලයක් සඳහා සභාවට රු.මිලියන 66.73 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

අයකරගත යුතු ගාස්තු

කොළඹ මහා නගර සභාවේ රථගාල් ගාස්තු අය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පෞද්ගලික ආයතන විසින් නගර සභාවට ගෙවිය යුතු මාසික කුලී මුදල් ගෙවීම දිගින් දිගටම පැහැරහැර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ආයතන 38 කින් අයකර ගතයුතු ගාස්තු ආදායම රු.මිලියන 265.5 ක් විය.

විදේශාධාර ව්‍යාපෘති

විගණන නිරීක්ෂණ

- මාර්ග ඉදිකිරීම් හා ප්‍රවාහන අංශය
- සමාජ සුබසාධන ව්‍යාපෘති
- විදේශ ආයෝජන ව්‍යාපෘතිවල පොදු අඩුපාඩු

විදේශාධාර ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ වාර්ෂික රාජ්‍ය වියදම ආවරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් වාර්ෂික රාජ්‍ය ආදායමක් නොලැබීම නිසා වර්ෂයෙන් වර්ෂය රාජ්‍ය අයවැය හිඟය ඉහළ යමින් පැවතුණි. 2021 මූල්‍ය වර්ෂය සඳහා වූ රාජ්‍ය අයවැය හිඟය රු.බිලියන 2,080ක් වූ අතර එම අයවැය හිඟය පියවීම සඳහා දේශීය ණය රු.බිලියන 2,519ක් හා විදේශීය ණය රු.බිලියන 517ක් ලබාගෙන තිබුණි. එම විදේශ ණය ගැනීම්වලින් 2021 වර්ෂය තුළ විදේශ ණය ආපසු ගෙවීම් සඳහා රු.බිලියන 530ක් යොදවා තිබූ බැවින් ශුද්ධ විදේශීය ණය ගැනීම් සෘණ රු.බිලියන 13 ක් බවට පත් වී තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ විදේශීය ණය ගැනීම් සියල්ල ණය ආපසු ගෙවීම් සඳහා යොදවා තිබුණි. වාර්ෂිකව අයවැය පරතරය පියවීම සඳහා විදේශීව ලබා ගන්නා ණය ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති ණය හා ව්‍යාපෘති නොවන ණය ලෙස කොටස් දෙකකට බෙදෙන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව පසුගිය වර්ෂ ගණනාවක් තුළ ලබා ගන්නා ලද විදේශීය ණය රු. බිලියන 16,827ක් වූ අතර එයින් ව්‍යාපෘති සඳහා ගිවිසුම් 775ක් මඟින් රු. බිලියන 3,780ක් ණය ලෙස ලබාගෙන තිබුණි. මීට අමතරව විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැනි ආයතන සෘජුවම ණය නියෝජිත ආයතනවලින් ණය ලබාගෙන තිබුණි. එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 45ක් ප්‍රාග්ධන නොවන ස්වරූපයේ ව්‍යාපෘති වූ අතර ඉතිරි ව්‍යාපෘති ජල සම්පාදන, මහා මාර්ග, සමාජ සුබසාධන, අධ්‍යාපන හා වෘත්තීය වැනි ව්‍යාපෘති විය. ඉන් ව්‍යාපෘති 130 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි.

මෙම ව්‍යාපෘති ණය මඟින් දේශීය ව්‍යාපෘති සඳහා වූ අරමුදල් යෙදවීම 1978 වර්ෂයේ සිට පමණ ආරම්භ කර තිබූ අතර ආරම්භයේදී විදේශීය ණය ප්‍රාග්ධන ස්වරූපයේ ව්‍යාපෘති සඳහා මූල්‍යනය කර තිබූ නමුත් එය සමාජ සුභසාධක හා පාරිභෝගික අවශ්‍යතා සඳහා ණය ලබාගැනීම දක්වා ක්‍රමයෙන් වෙනස් වී තිබුණි. එමෙන්ම පසුගිය කාලය තුළ ලබාගෙන තිබූ බොහෝ ව්‍යාපෘති ණය ඒ සඳහා ලැබෙන ප්‍රතිලාභ සලකා බැලීමකින් තොරව ආයෝජනය කර තිබීම නිසා ඒවා රටේ ආර්ථික වර්ධනයට වඩා රටේ ණයගැතිභාව වැඩිවීම සඳහා හේතු වී තිබුණි.

මෙම ව්‍යාපෘතිවලින් බොහොමයක් ණය ගිවිසුම්වලට එළඹීමේදී ඒ සඳහා විගණන ප්‍රතිපාදන ඇතුළත් කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම නිසා ඒවායේ විගණන කටයුතු විගණකාධිපති විසින් සිදුකර වෙනම වාර්තාවක් නිකුත්කර නොතිබුණි. නමුත් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 123 ක විගණන කටයුතු විගණකාධිපති විසින් සිදුකර වෙනම විගණන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.

එමෙන්ම මෙම විදේශ ව්‍යාපෘතිවලින් බොහොමයක් සැදැහුම් නොකළ පිරිවැය

පදනම මත ආරම්භ කර තිබුණු අතර එම හේතුව නිසා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිවල වාසි රටට නොලැබී තිබුණු අතර මෙම සැදැහුම් නොකල පිරිවැය පදනම මත රටට ලැබී තිබුණු ව්‍යාපෘති බොහොමයක් රටේ ආයෝජන අවශ්‍යතා ඉටුවීම සඳහා හේතු වී නොතිබුණි.

එම ව්‍යාපෘති ජල සම්පාදන හා සනීපාරක්ෂක, මාර්ග ඉදිකිරීම් හා ප්‍රවාහන අංශය, විදුලිබල හා බලශක්ති අංශය, සමාජ සුබසාධන ව්‍යාපෘති, අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන අංශය, කෘෂිකාර්මික අංශය, සෞඛ්‍ය අංශය, නාගරික සංවර්ධන අංශය, වෙනත් අංශය වැනි ප්‍රධාන අංශ 09ක් යටතේ ක්‍රියාත්මක වෙමින් පැවති අතර මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළ සිදු කරන ලද නිරීක්ෂණවලින් සමහරක් පහත දක්වා ඇත.

මාර්ග ඉදිකිරීම් හා ප්‍රවාහන අංශය

- 2021 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 9ක් වෙනුවෙන් විදේශ ණය මත මුළු ප්‍රතිපාදන වූ රු.මිලියන 17,129 ක් අතුරින් රු.මිලියන 3,754ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු. මිලියන 13,371 ක් හෙවත් සියයට 78ක් උපයෝජනය කර නොතිබුණි.

- මන්දගාමී ප්‍රගතිය හා රුපියලේ අගය අවප්‍රමාණය වීම මත 2021 දෙසැම්බර් 31 දිනට වරාය පිවිසුම් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියේ පමණක් රු. මිලියන 369ක විදේශ විනිමය අලාභයක් වාර්තා කර තිබුණි.

- 1950 අංක 09 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව ඉඩම් අත්පත්කර ගැනීමේදී අදාළ ඉඩම් හිමිකරුවන් වෙත පනතේ 35 වගන්තිය ප්‍රකාරව වන්දි ගෙවිය යුතුය. කෙසේ වුවද මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති 07ක ඉඩම් කැබලි 19,811ක් සඳහා පනතේ ප්‍රකාරව අත්පත්කර ගැනීම් නියෝග නිකුත්කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ඉන් ඉඩම් කැබලි 12,047ක් සඳහා වන්දි ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 20,650 ක් වන්දි ගෙවා තිබුණි. එලෙස වන්දි ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම මත වන්දි ගෙවීම ප්‍රමාද වී තිබූ අතර අත්පත්කර ගන්නා ලද ඉඩම් කැබලි සඳහා පනතේ 35 වගන්තිය යටතේ පොළී ගෙවිය යුතුය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට මෙම වන්දි ගෙවීම ප්‍රමාද වීම මත ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් පමණක් රු.මිලියන 2,870 ක පොළී මුදලක් ගෙවීමට සිදුව තිබුණි. එසේම ඉහත වන්දි ගෙවූ ඉඩම් කැබැලිවලින් ඉඩම් කැබැලි 5 ක පමණක් පනතේ 44 වගන්තිය ප්‍රකාරව අත්පත් කර ගැනීම් කටයුතු අවසන් කර තිබුණි.

- මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ බේස්ලයින් ව්‍යාපෘතිය, අරමුදල් සැපයීමේ නියෝජිතායතයක් නොමැතිව සහ සිවිල් වැඩ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමකින් තොරව මේ දක්වා ක්‍රියාත්මක කර තිබූ අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 30 ක් වැය කර තිබුණි.

- නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියේ කටයුතු 2016 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් 2022 අගෝස්තු දක්වාම සිවිල් වැඩ ආරම්භ කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2022 ජුනි 31 දක්වා ආයෝජකයෙකු තෝරා ගෙන නොතිබූ අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙනුවෙන් රු.මිලියන 227 ක් දරා තිබුණි.

- රක්වාන - සූරියකන්ද මාර්ගය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා ඔපෙක් සංවිධානයෙන් ඩොලර් මිලියන 40ක ණය මුදලක් 2019 වර්ෂයේදී ලබා ගෙන තිබූ අතර ණය ගිවිසුම්ගත දින සිට 2021 දෙසැම්බර් 31 දිනට වසර 2ක් ඉක්මවා ගොස් තිබුණද, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 අගෝස්තු 08 වන විටත් ආරම්භකර නොතිබුණි. තවද, මෙම ණය ගිවිසුම 2023 සැප්තැම්බර් 30 දින වන විට කල්පිරීමට නියමිතය.

- කොන්ත්‍රාත් පොදු කොන්දේසිවල 4.2 උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා තමාගේ වියදමෙන් කාර්ය සාධන බැඳුම්කර ලබා ගත යුතු වුවද එයට පටහැනිව ව්‍යාපෘති 7කට අදාළව වැඩ ප්‍රමාණ පත්‍රවල ඒ සඳහා වෙනම ගෙවීම් අයිතමයක් ඇතුළත් කරමින් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 2,526 ක් ගෙවා තිබූ බැවින් කොන්ත්‍රාත්කරුවන්ට අතිරේකව වාසි සලසා තිබුණි.

- රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් සඳහා අවශ්‍ය අරමුදල් දේශිය බැංකු පද්ධතිය හරහා සපුරා ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබාදී තිබුණු අතර මුළු කොන්ත්‍රාත් පිරිවැයෙන් රු.මිලියන 54,695ක මුදලින් 2021 දෙසැම්බර් 31 දින වන විට දේශීය බැංකු පද්ධතිය හරහා රු.මිලියන 16,200 ක අරමුදල් පහසුකමක් පමණක් අනුමත කර තිබූ අතර ඉතිරි කොන්ත්‍රාත් පිරිවැය වූ රු.මිලියන 38,795ක් සඳහා 2022 ජුලි 30 දින වන විටත් අරමුදල් සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගම වෙත 2022 ජුනි 30 වන විට රු.මිලියන 5,099 ක නිරවුල් නොකල බැරකමක් පැවතුනි.

- 2021 දෙසැම්බර් 31 දින වන විට දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ 01 කොටස සහ 4 කොටස සඳහා බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 1,097.18 ක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ ණය සපයන ආයතන වෙත ගෙවා තිබුණි.

- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සහ දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ණය ගිවිසුම් ප්‍රකාරව,

උපයෝජනය නොකළ ණය මත ණය ප්‍රදාන නියෝජිතායතනයට 2021 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් සමුච්චිත පොළී සහ බැඳීම් ගාස්තු ලෙස රු. මිලියන 1,516.79 ක් සහ රු.මිලියන 576.30 ක් අනාර්ථික ලෙස ගෙවා තිබුණි.

- දක්ෂිණ අධිවේගී මාර්ගයේ කිලෝමීටර 46 ස්ථානයෙන් පසු අධිවේගී මාර්ග භාවිතා කරන්නන් සඳහා කිසිඳු සේවා සැපයුම් ප්‍රදේශයක් නොමැති බැවින් වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 176ක් ගමන් කරන මගී ජනතාවට සේවා සැපයුම් සැලසීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන අත්හැර දැමූ කොන්ත්‍රාත් පැකේජ 12 ක් අතරින් 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජ 6 ක ඉතිරි වැඩ මෙම වැඩසටහන හරහා ඉටු කිරීමට නැවත ප්‍රදානය කර තිබූ අතර මූලික කොන්ත්‍රාත් මිල සමඟ සන්සන්දනය කිරීමේදී නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල වටිනාකම රු. මිලියන 4,808.8 කින් වැඩි වී තිබුණි. එබැවින් දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් රජයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවලංගු කරන ලද කොන්ත්‍රාත් පැකේජ 03 කට අදාළ රු.මිලියන 690.74 ක් වූ කාර්යසාධන ඇපකර මුදල් කරගැනීමට ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන විසින් කටයුතු කර නොතිබුණි.

- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ඌව පළාතේ අවලංගු කළ කොන්ත්‍රාත් පැකේජ 03 ට අදාළව ඉතිරිව තිබූ රු.මිලියන 560.14 ක හිඟ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අය කර ගැනීමට වැඩසටහන අපොහොසත් වී තිබුණි. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහන විසින් පිරිනමන ලද කොන්ත්‍රාත්වල අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වල මුළු වටිනාකම රු. මිලියන 13,922.63 ක් විය.

- දුම්රිය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න ප්‍රදේශයේ දුම්රිය ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් දුම්රිය මාර්ග 4ක් සඳහා ශක්‍යතා අධ්‍යන සහ විස්තරාත්මක සැලසුම්කරණය කිරීම 2021 මාර්තු නිමකර වාර්තා රේඛීය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි. මේ සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව රු.මිලියන 1,506කට සමාන එ.ජ.ඩො මිලියන 8.397ක් යොදවා තිබුණ අතර ඉන් සියයට 96ක් වන රු.මිලියන 1,447ක මුදලක් ගෙවා තිබුණි. නමුත් අදාළ වාර්තා ක්‍රියාත්මක කිරීමකින් තොරව දුම්රිය දෙපාර්තමේන්තුවේ පැවතුණි.

- මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගෙන තිබූ ණය මුදල සඳහා 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ගාස්තු හා ණය පොළී සඳහා රු.මිලියන 69.3 කට සමාන එ.ජ.ඩො 380,000ක් ගෙවා තිබුණි. මෙම ශක්‍යතා අධ්‍යන සහ විස්තරාත්මක සැලසුම් වාර්තා ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මේ සඳහා දරන ලද පිරිවැයට ප්‍රතිලාභයක් රටට ලැබී නොතිබුණි.

සමාජ සුබසාධන ව්‍යාපෘති

- 2017 වර්ෂයේ ආරම්භ කර 2022 වර්ෂයේ නිම කිරීමට නියමිත සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදන මුදල වූ එ.ජ.ඩො. මිලියන 75න් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 07ක් පමණ උපයෝජනය කර තිබුණි.

- ශ්‍රී ලංකා රජය මගින් කරන ලද ඉල්ලීමකට අනුව කොවිඩ් වසංගතයට මුහුණ දීම සඳහා සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කර එමගින් එකතුව එ.ජ.ඩො. මිලියන 45ක් 2020 වර්ෂය තුළදී නිදහස් කර තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය රු. මිලියන 436.02ක් පොළී ගාස්තු සහ රු. මිලියන 107.54ක් බැදීම් ගාස්තු ලෙස ගෙවීමට සිදු වී තිබුණි.

- 2021 දෙසැම්බර් 31 දින වන විට සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය ආරම්භ වී වසර පහක් ගත වී තිබුණද ව්‍යාපෘතිය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් අතුරින් සමාජ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම පමණක් ඉටු කර ගැනීමට හැකිව තිබුණි. නමුත් සමාජ සුභසාධන ප්‍රතිලාභ පනත සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණි.

- එසේම විවිධ සුභසාධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය වැඩිදියුණු කිරීම සඳහා සුභසාධන වැඩසටහන් හා සම්බන්ධ තොරතුරු ගබඩා කරන සමාජ ආරක්ෂණ තොරතුරු ජාලය විද්‍යුත් දත්ත ගබඩාවක් ලෙස ස්ථාපනය සහ එය ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් දක්වා ව්‍යාප්ත කිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් ආරම්භ කර තිබුණද අපේක්ෂිත පරිදි අවසන් කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි.

විදේශ ආයෝජන ව්‍යාපෘතිවල පොදු අඩුපාඩු

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන්ගේ වියදම් ආවරණය කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ලේඛණවලට වගන්ති එක් කිරීම තුළින් ව්‍යාපෘතියට අදාළ නොවන කටයුතු වෙනුවෙන් ණය අරමුදල් යොදාගැනීම හා කොන්ත්‍රාත්කරුවන්ට එකඟ වූ මුදලට අමතරව ලාභාන්තිකය සහ පොදුකාර්ය වියදම් ආවරණය සඳහා වන ප්‍රතිශතාත්මක අගයක් දැරීමටත් ව්‍යාපෘතිවලට සිදු වී තිබීම.

- ව්‍යාපෘති විසින් වාහන මිලදී නොගෙන එම අවශ්‍යතාව කොන්ත්‍රාත් ගිවිසුමේ වැඩ

ප්‍රමාණ බිල්පත්වල විෂයක් ලෙස ඇතුළත් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සෘජුව මෝටර් වාහන මිලදී ගැනීමට වඩා වැඩි මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුවීම හා අදාළ වාහනවල හිමිකාරත්වය කොන්ත්‍රාත් සමාගමේ නමින් පැවැතීමත් නිසා ව්‍යාපෘති කාලය අවසානයේදී අදාළ මෝටර් වාහනවල හිමිකාරත්වය රේඛීය අමාත්‍යාංශයට හෝ රාජ්‍ය ආයතනයන්ට නොලැබීමේ අවදානමක් පැවතීම.

- 2021 වර්ෂය තුළ රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතිවල භෞතික කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කවලට පසුපසින් පැවතීම,ණය මුදල් උපයෝජනය පහළ මට්ටමක පැවතීම හා ව්‍යාපෘතිවල ඉලක්ක සපුරා ගැනීම සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදීම් සිදු කර තිබුණි. මේ හේතුවෙන් වියපැහැදම් නොවූ ණය මුදල් මත බැඳීම් ගාස්තු වශයෙන් විශාල පිරිවැයක් දැරීමට ශ්‍රී ලංකා රජයට සිදු වී තිබුණි.

- මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති අවසන් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ආකාරය පිළිබඳව විධිමත් උපදෙස් ලබා නොතිබීම හේතුවෙන් විදේශාධාර ව්‍යාපෘතිවල ක්‍රියාකාරී කාල සීමාව අවසාන වීමෙන් පසුවද ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

බැංකු අංශය

විෂයයන්

- හැඳින්වීම
- බැංකු අංශයේ වත්කම්
- බැංකු අංශයේ වගකීම්
- බැංකු අංශයේ අක්‍රීය ණය (Non Performing Loans - NPL)
- බැංකු අංශයේ කාර්යසාධනය
- ශ්‍රී ලංකා මහ බැංකුව
- ලංකා බැංකුව
- මහජන බැංකුව
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව - සමූහය
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (MBSL)
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB)
- ප්‍රධාන විගණන නිරීක්ෂණ
    - ශ්‍රී ලංකා මහ බැංකුව
    - ලංකා බැංකුව
    - මහජන බැංකුව
    - ජාතික ඉතිරි කිරීමේ බැංකුව
    - නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
    - මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
    - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

බැංකු අංශය

ශ්‍රී ලංකාවේ බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු (Licensed Commercial Banks - LCBs) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (Licensed Specialized Banks -LSBs) වලින් සමන්විත වන අතර 2021 වර්ෂය අවසාන වන විට විදේශීය බැංකු 11 ක් ඇතුළත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු 24 කින් ද බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 කින් ද වශයෙන් බැංකු 30 කින් මෙරට බැංකු ක්ෂේත්‍රය සමන්විත වී තිබුණි.

බැංකු අංශයට අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය තැන්පතු වන අතර 2021 වර්ෂය තුළ රුපියල් ණය ගැනීම්වල කැපී පෙනෙන වැඩි වීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, විදේශ මූලාශ්‍ර වලින් විදේශ ණය ලබා ගැනීම සඳහා ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීම අහිතකර ලෙස බලපාන ලදී. ශුද්ධ පොලී ආදායමේ හා පොලී නොවන ආදායමේ ඇතිවූ කැපී පෙනෙන වැඩිවීම හේතුවෙන් 2021 වසර තුළ බැංකු අංශයේ ලාභදායිත්වය පසුගිය වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය.

බැංකු අංශය, එහි අතරමැදිකරන භූමිකාව 2021 වර්ෂයේදී අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් මූල්‍ය අන්තර්ගතභාවය පහසු කිරීම සඳහා බැංකු ජාලය පුළුල් කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු දත්ත අනුව, 2021 වර්ෂය අවසානයට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අයත් ශාඛා 2,919 ක් ද, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අයත් ශාඛා 705 ක් හා ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,695 ක් පැවතුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන විට මුළු බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකක සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) සංඛ්‍යාව පිළිවෙලින් 7,319 ක් හා 6,342 ක් දක්වා වැඩි වී තිබුණි.

බැංකු අංශයේ වත්කම්

බැංකු අංශයේ වත්කම් පදනම 2021 වසර තුළ රු. ට්‍රිලියන 2.3 කින් ඉහළ ගොස්, 2021 වසර අවසාන වන විට රු. ට්‍රිලියන 16.9 ඉක්ම වූ අතර, එය 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 17.1 ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව සියයට 15.4 ක වර්ධනයකි. එම වත්කම් වර්ධනය ප්‍රධාන වශයෙන් ණය හා අත්තිකාරම් සහ ආයෝජන මඟින් මෙහෙයවනු ලැබීය. ණය සහ අත්තිකාරම්වල වර්ධනය 2020 වසරේ දී සියයට 11.9 සිට 2021 වසරේ දී සියයට 15.3 දක්වා ඉහළ යන ලදි. 2021 වසර තුළ සිදු වූ ණය කළඹෙහි වර්ධනයෙන් දළ වශයෙන් සියයට 92.2 කට හේතු වී ඇත්තේ රුපියල් ණය ඉහළ යාමයි. ආයෝජනවල වාර්ෂික වර්ධනය 2020 වසර අවසන් වනවිට පැවති සියයට 40 සිට 2021 වසර අවසන් වන විට සියයට 16.4 දක්වා අඩු විය. භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය රු.බිලියන 903.7 කින් වැඩි වීම සහ භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන පිළිවෙලින් රු. බිලියන 99.8 කින් සහ රු. බිලියන 55 කින් අඩු වීම හේතුවෙන් කල්පිරීම තෙක් රඳවා ගන්නා ආයෝජන කළඹ 2021 වසරේදී සියයට 24.8

කින් වර්ධනය විය. බැංකු අංශයේ මුළු වත්කම්වල වෙනස්වීම 2016 සිට 2021 දක්වා එක් එක් වර්ෂය අවසානයට පැවති ශේෂ රූපසටහන 19 හි දැක්වේ.



රූපසටහන 19 - බැංකු අංශය සතු මුළු වත්කම්

බැංකු අංශයේ වගකීම්

බැංකු අංශයට අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස තැන්පතු අඛණ්ඩව පැවතුණු අතර, ණය ගැනීම් දෙවන විශාලතම ප්‍රභවය විය. සමස්ත තැන්පතුවලට කාලීන තැන්පතු දැක්වූ දායකත්වය 2020 වසරේ සියයට 63 සිට 2021 වසර අවසන් වන විට සියයට 60.6 ක් දක්වා අඩුවිය. 2021 වසර තුළදී සිදුවූ තැන්පතු වැඩිවීමෙන් සියයට 42.7 කට කාලීන තැන්පතු දායක විය. වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින් ඉතුරුම් තැන්පතු සහ ජංගම තැන්පතු පිළිවෙලින් සියයට 29.5 ක් සහ සියයට 7 ක් විය. ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් සියයට 34.5 ක් හා සියයට 36.6 ක් විය. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2020 වර්ෂයේ දී වාර්තා වූ රු. බිලියන 12.8 ක ඉහළ යාමට සාපේක්ෂව 2021 වසරේදී රු.බිලියන 489 ක (එනම් සියයට 28.9) වර්ධනයක් පෙන්නුම් කරන ලදි. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2021 වසරේදී සියයට 86.6 ක (රු.බිලියන 688) වර්ධනයක් වාර්තා වූ රුපියල් ණය ගැනීම් වේ. බැංකු අංශයේ තැන්පතුවල වෙනස්වීම 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ අවසානයට පැවති ශේෂ රූපසටහන 20 හි දැක්වේ.



රූපසටහන 20 - බැංකු අංශය සතු මුළු තැන්පතු

බැංකු අංශයේ අක්‍රීය ණය (Non Performing Loans - NPL)

2021 වර්ෂය තුළ COVID වසංගතය විවිධ පරිමාණයෙන් පැවතීම නිසා ඉන් පීඩාවට පත්වූ පුද්ගලයන් සහ ඇතැම් අංශවල ව්‍යාපාර වෙනුවෙන් ලබා දුන් ණය සහන අවස්ථා කිහිපයක් 2022 වසර දක්වා දීර්ඝ කරන ලදි. ණය සහන කාලය තුළ දී, ණය හා අත්තිකාරම් අක්‍රීය කාණ්ඩයට වර්ගීකරණය අත්හිටුවා තිබුණ ද, රු.බිලියන 66.4 ක් වූ 2020 වසරේ අක්‍රීය ණය (NPLs) වැඩි විමට සාපේක්ෂව, 2021 වසරේ දී එය රු.බිලියන 20.1 කින් ඉහළ යන ලදි. එසේ වුවද, 2021 වසර තුළ සාපේක්ෂ වශයෙන් ණය සහ අත්තිකාරම් ඉහළ වර්ධනයක් පෙන්වීම හේතුවෙන්, දළ අක්‍රීය ණය අනුපාතය 2020 වසර අවසානයේ පැවති සියයට 4.9 ක සිට 2021 අවසානයේදී සියයට 4.5 දක්වා අඩු විය. ඉහළ වෙන් කිරීම් අවශ්‍ය වන කාණ්ඩවලට අක්‍රීය ණය සංක්‍රමණය වීමත් සමඟ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය ද, 2021 වසර තුළ අඩුවී ඇත. මුළු අක්‍රිය ණය සඳහා වෙන් කිරීම් රු.බිලියන 80.2 කින් වැඩි වූ අතර එයින් නිශ්චිත වෙන් කිරීම් සියයට 84.7 ක් විය.

තවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත 9 ට අනුව, අපේක්ෂිත අලාභ ආකෘතිය (Expected Loss Model) ක්‍රියාත්මක කිරීමෙන් පසු, 2021 වසර අවසානයේදී බැංකු අංශයේ මුළු ණයවලින් සියයට 7.64 ක් තුන්වන කාණ්ඩයේ ණය ලෙස පෙන්නුම් කළ අතර, තුන්වන කාණ්ඩයේ ණය හානිකරණය ගලපන ලද මුළු ණය වලින් සියයට 4.26 ක් තුන්වන කාණ්ඩයේ (තුන්වන කාණ්ඩයේ ණය හානිකරණය ගලපන ලද) ණය ලෙස පෙන්නුම් කළේය.

බැංකු අංශයේ කාර්යසාධනය

2021 වසර තුළ වාර්තා වූ පොලී වියදම සියයට 11.5 කින් අඩුවීමට සාපේක්ෂව සහ පොලී ආදායම සියයට 3.2 කින් වැඩිවීම හේතුවෙන් බැංකු අංශයේ ශුද්ධ පොලී ආදායම සියයට 28.5 කින් වර්ධනය වී ඇත. ඒ අනුව, 2020 වසර අවසානයේ සියයට 3.1 ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2021 වසරේදී සියයට 3.4 ක් දක්වා වර්ධනය විය. පසුගිය වසරට සාපේක්ෂව, ශුද්ධ පොලී ආදායම රු.බිලියන 121.8 කින් වර්ධනය වූ අතර 2021 වසරේ ඉහළ විදේශ මුදල් ප්‍රත්‍යාගණන ලාභය හේතුවෙන් පොලී නොවන ආදායම රු.බිලියන 24.6 කින් ඉහළ ගොස් ඇත. එසේම, 2021 වසර අවසානයේදී බැංකු අංශයේ බදු පසු ලාභය රු.බිලියන 198.4 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 46 ක වැඩිවීමකි.

ශ්‍රී ලංකා මහ බැංකුව

1949 අංක 58 දරන මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය හා ගෙවීම් ක්‍රමයේ පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු ඉහළම අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය දිරිමත් කිරීම හා ප්‍රචලිත කිරීම උදෙසා ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමේ අරමුණු පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි.

දේශීය මුදල් ස්ථායිකරණය සඳහා දේශීය මුදල් ප්‍රතිපත්තිය නිර්ණය කිරීමට මුදල් නීති පනත මඟින් බලය ලබා දී ඇති ක්‍රියාවන් මඟින් හැකිතාක් දුරට සුරක්ෂිත කිරීම සඳහා සැපයුම, තිබෙන බව සහ මුදල් පිරිවැය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය උත්සාහ කළ යුතුය. ප්‍රධාන වශයෙන් ආර්ථිකයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික තීරණය කිරීම සහ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම මහ බැංකුව විසින් සිදු කරනු ලබයි. ආර්ථිකයේ පවත්නා පොලී අනුපාතික මත මහ බැංකුවේ මුදල් මෙහෙයුම් කටයුතු බලපෑම් කරනු ලබන අතරම, එය ණය ගැතියන් හා ණය හිමියන්ගේ හැසිරීම, ආර්ථික ක්‍රියාකාරකම් සහ අවසාන වශයෙන් උද්ධමන අනුපාතිකය මත බලපෑම් ඇති කරනු ලබයි. ඒ අනුව, උද්ධමනය පාලනය කිරීම සහ උද්ධමනය අපේක්ෂිත මට්ටමක පවත්වා ගැනීම සඳහා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය භාවිතා කරනු ලබයි.

මැදි කාලීන මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති දක්වමින් “ 2021 පෙර දැක්ම : 2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති” ප්‍රකාශය ඉදිරිපත් කිරීම 2021 වසර ආරම්භයේදී සිදු කෙරිණි. අභියෝග සහ අවිනිශ්චිතතා වැඩි වීමත් සමඟ, තෙවැදෑරුම් රාමුවක් මත පදනම්ව ආර්ථිකය ශක්තිමත් කිරීම සහ සර්ව ආර්ථික ස්ථායිතාවය පිළිබඳ සහතිකයක් වෙළඳපොළ වෙත ලබා දීම අරමුණු කොටගෙන, බැංකුව 2021 ඔක්තෝබර් මාසයේදී " සර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම” ඉදිරිපත් කරන ලදී.

උද්ධමන පීඩනය ඇති වීම මැඩපැවැත්වීමේ සහ විදේශීය අංශයේ අසමතුලිතතා සඳහා

පිළියම් යෙදීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා මහා බැංකුව 2021 වර්ෂයේදී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරත්වයෙන් බැහැර විය. මැදි කාලීනව ඇතිවිය හැකි අධික උද්ධමන පීඩනය වැලක්වීමට සහ විදේශ අංශයේ හා දේශීය මූල්‍ය වෙළඳපොල අසමතුලිතතා සඳහා පිළියම් යෙදීමේ අරමුණින් 2021 අගෝස්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ බලපත්‍රලභී වාණිජ බැංකු වෙතැති සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය බැංකුව විසින් ඉහළ නංවන ලදි. ඒ අනුව, බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය 2021 අගෝස්තු මස මැදදී පදනම් අංක 50 බැගින් පිළිවෙළින් සියයට 5 ක් සහ සියයට 6 ක් දක්වා ඉහල නංවන ලදී. එමෙන්ම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද 2021 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිශතාංක 2 කින් සියයට 4 ක් දක්වා ඉහළ නංවන ලද අතර එමගින් බැංකු පද්ධතිය තුළින් රු.බිලියන 170 ක ද්‍රවශීලතාව අවශෝෂණය කරන ලදී. 2022 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික සමස්තයක් ලෙස පදනම් අංක 150 කින් ඉහල නන්වන ලදී. 2022 අප්‍රේල් මාසයේදී බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කරමින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700 කින් ඉහල නැංවීම සිදු කළ අතර ණය උපකරණ සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා සියල්ලම පාහේ ඉවත්කරන ලදී.

2021 වසර තුළදී බැංකුව, බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතාවය සහ ශක්තිමත් බව තහවුරු කිරීමට බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය සහ මෙහෙයුම් ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නියාමනයන් අඛණ්ඩව හඳුන්වාදීමට කටයුතු කරන ලදි. එමෙන්ම, COVID 19 වසංගතයේ ව්‍යාප්තිය නිසා පීඩාවට පත්වූ ආර්ථික අංශ සඳහා සහන සැපයීම අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සහ බැංකු ක්ෂේත්‍රය නව සාමාන්‍ය තත්වයට හැඩගැසීම පහසු කිරීම සඳහා ඇතැම් නියාමනයන් සුපරීක්ෂාකාරීව ලිහිල් කිරීමට ද බැංකුව කටයුතු කරන ලදි.

ලංකා බැංකුව

ලංකා බැංකුව 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත යටතේ 1938 අගෝස්තු 01 දින නියමිත පරිදි සංස්ථාපනය කරන ලද, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වෙමින් ගණුදෙනුකාර කේන්ද්‍රීයගත නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම ලංකා බැංකුවේ දැක්ම වන අතර ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් ගනුදෙනුකාර ප්‍රජාව වෙත ළඟාකරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත් නවීන තාක්ෂණවේදයන් මුසු වූත් මූල්‍ය සේවාවන් හරහා සියලු පාර්ශවකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කිරීම එහි මෙහෙවර වේ.

2021 දී ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් වලින් සියයට 25 ක් සහ තැන්පතු වලින් සියයට 23 ක හිමිකාරීත්වයක් දැරීමට ලංකා බැංකුව සමත් වී ඇති අතර ශ්‍රී ලංකාව පුරා සිය පුළුල් ප්‍රවේශයට අමතරව ලංකා බැංකුව විසින් ඉන්දියාව, මාලදිවයින සහ සීෂෙල්ස් යන රටවල ශාඛා තුනක් ද, හුල්හුමාලේ හි සීමිත සේවා ශාඛාවක් ද, එක්සත් රාජධානියේ ලන්ඩන් හි පූර්ණ හිමිකාරිත්වය දරන අනුබද්ධ ආයතනයක් ද ක්‍රියාත්මක කරයි.

ණය කළඹේ වර්ධනය, පොළී ආන්තිකයන්හි ණය කළඹේ ගුණාත්මකභාවය සහ වියදම්හි ඵලදායි කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළදී සියයට 83 වර්ධනයක් සහිතව බදු පෙර ලාභය රු.බිලියන 43.2 දක්වා ඉහළ නැංවීමට බැංකුවට හැකි වී ඇති අතර එය පැවති දැඩි වෙළඳපොළ අභියෝග වලින් සමන්විත වර්ෂයක් තුළ දී ලැබූ ප්‍රශංසනීය ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකිය.

වර්ෂය තුළදී සියයට 28 ක ශක්තිමත් වත්කම් ප්‍රසාරණයක් පෙන්නුම් කරමින්, බැංකුවේ ශේෂ පත්‍රය 2021 දෙසැම්බර් අවසානය වන විට රු.ට්‍රිලියන 3.8 දක්වා ළඟා වී තිබුණි. වත්කම්හි සියයට 22 ක වර්ධනය මූලික වශයෙන් ණය සහ අත්තිකාරම් මගින් මෙහෙයවනු ලැබූ අතර වසංගතයෙන් බලපෑමට ලක් වූ කර්මාන්ත සහ ව්‍යාපාර යළි නගා සිටුවීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

බැංකුවේ ණය සහ අත්තිකාරම් වර්ෂය තුළදී රු.ට්‍රිලියන 2 සීමාව ඉක්මවා යන ලදී. වර්ෂය පුරාවටම පැවැති අඩු පොළී තත්වයත්, නව සාමාන්‍යකරණය යටතේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා ණය ඉල්ලුම් කිරීම වැඩිවීමත් මෙයට හේතු වී තිබුණි. පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම, අයිරා පහසුකම් සියයට 73 කින් සහ කාලීන ණය සියයට 12 කින් වැඩිවීම තුළින් පිළිබිඹු වන අතර සංචාරක සීමා ලිහිල් කිරීම සහ එන්නත් කිරීමේ වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම නිසා ජීවන රටාව නව ආකාරයකින් සාමාන්‍ය තත්වයට ගෙන ඒම තුළින් පුද්ගලික ණය පහසුකම් වර්ෂය තුළ සියයට 19 කින් වර්ධනය වී තිබුණි.

තැන්පතු වල සියයට 16 ක වර්ධනයක් සහ අනෙකුත් ණය ගැනීම් දෙගුණයකින් වැඩි වීමෙන් මුළු වගකීම් රු.ට්‍රිලියන 3.6 දක්වා සියයට 28 කින් වැඩි වී තිබුණි.

බැංකුවේ වක්‍ර පරිපාලිත ආයතනයක් වූ කොළදෙනිය හයිඩ්‍රොපවර් පෞද්ගලික සමාගම බාහිර පාර්ශවයකට විකිණීම ද, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ආයතනය වර්ෂය තුළ ලාභදායී ආයතනයක් බවට පත් කිරීම උදෙසා රු.බිලියන 1.7 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබාදීම ද 2021 වර්ෂයේ දී සිදු විය.

මහජන බැංකුව

මහජන බැංකුව රජය සතු බැංකුවක් ලෙස 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස ස්ථාපිත කරන ලදී. පනතේ 4 වන වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාරව බැංකුවේ අරමුණ වනුයේ

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකුකරණය, කෘෂිකර්මාන්තය සහ කර්මාන්ත සංවර්ධනය කිරීම සහ සහාය වීම සහ වාණිජ බැංකුවක, උකස් තැරැව්කරුවකුගේ ව්‍යාපාර කරගෙන යාම සහ වෙළඳ බැංකුව වශයෙන් කටයුතු කිරීමයි.

මහජන බැංකුව 2021 වසර අවසන් වන විට දිවයින පුරා ශාඛා 742 කින් ක්‍රියාත්මක වේ. ඊට අමතරව ATM යන්ත්‍ර 797ක්, CDM යන්ත්‍ර 298ක්, Kiosks 221 ක් සහ ස්වයං බැංකු ඒකක 268 ක් විය. 2021 වසර අවසන් වන විට බැංකුවේ මුළු තැන්පතු පදනම රු. බිලියන 236.43 කින් පුළුල් වී 2021 වසර අවසන් වන විට රු. බිලියන 2,071.5 ක් දක්වා ළඟා විය. 2021 දෙසැම්බර් අවසන් වන විට බැංකුවේ මුළු වත්කම් පදනම රු. බිලියන 2,647.64 ක් ලෙස වාර්තා කරයි. 2021 වර්ෂයේ බැංකුවේ බදු ගෙවීමට පෙර ලාභය රු. බිලියන 30.4 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 43.2 ක වර්ධනයකි. බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2021 වර්ෂයේ රු. බිලියන 82.64 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 35.3 ක වර්ධනයකි.

2021 පාරිභෝගික මූල්‍ය සේවා ජාත්‍යන්තර සම්මාන උළෙලේදී බැංකුව, ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම පාරිභෝගික බැංකුව සහ ඩිජිටල් බැංකුව ලෙස සම්මානයට පාත්‍ර විය. තවද, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය මගින් 2021 වසරේ දී අඛණ්ඩව 15 වන වරටත් වසරේ බැංකුව ලෙස මහජන බැංකුව ඇගයීමට ලක් විය. ජාත්‍යන්තර ව්‍යාපාර සඟරාව විසින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ඩිජිටල් බැංකුව ලෙස සම්මානයට පාත්‍ර විය. 2021 වසරේදී නව්‍යකරණ වලින් එකක් ලෙස People's Pay Wallet යෙදුම හඳුන්වාදෙන ලදී. තවද, 2021 වසරේ ලෝකයේ හොඳම බැංකු 1000 අතරට අඛණ්ඩව සිව්වන වරටත් තේරී පත්වන ලදී. බැංකුවට Fitch Rating Lanka Ltd විසින් "AA-(lka)" ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීමක් හිමි වී ඇත.

2020 සහ 2021 වර්ෂ දෙක තුළ මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය වෙත අරමුදල්කරණය ලෙස රු.බිලියන 700 ක් පිරිනමා ඇත. 2021 වර්ෂය තුළ මහජන බැංකුවේ ණය කළඹේ වර්ධනය ක්ෂේත්‍රයේ ණය කළඹ වර්ධනයෙන් සියයට 22 කට ආසන්නව දායක වී ඇත. 2021 වසර අවසානයේ දී බැංකුවේ ණය කළඹින් ආසන්න වශයෙන් සියයට 50 ක් රාජ්‍ය සහ වෙනත් රජයට අයත් ව්‍යවසාය වෙත ලබා දී ඇත. බැංකුවේ වත්කම්, තැන්පතු හා වැදගත් දර්ශක කිහිපයක් වගුව 18 හි දැක්වේ.

විස්තරය	2020 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට
මුළු වත්කම් (රු.000)	2,230,118,665	2,647,640,536
මුළු තැන්පතු (රු.000)	1,835,099,456	2,071,532,612
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (බදු වලට පෙර) (%)	1.0	1.3
කොටස් මත ප්‍රතිලාභය (%)	14.4	19.9
අක්‍රිය ණය (%)	3.2	3.2

වගුව18 : මහජන බැංකුවේ වත්කම්, තැන්පතු හා වැදගත් දර්ශක

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1971 අංක 30 දරන පාර්ලිමේන්තු පනතක් මගින් 1972 දී පිහිටුවන ලද්දේ එවකට ජනතාවට මූල්‍ය සේවා සැපයීමේ නියැලී සිටි සුවිශේෂී ආයතන හතරක් ඒකාබද්ධ කිරීම මගිනි. 1988 අංක 30 දරන බැංකු පනතට අනුව බැංකුවට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය ලබා දෙන ලදී. බැංකුවේ මෙහෙවර වනුයේ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ සහ සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලමින් ඔවුන්ගේ ඉතුරුම් සහ ආයෝජන අවශ්‍යතා ඉහළ නැංවීම සඳහා පූර්ණ පරාසයක මූල්‍ය විසඳුම් ලබා දීමයි.

ඉහත මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව ශාඛා 261 ක්, තැපැල් සහ උප තැපැල් කාර්යාල 4,064 ක් සහ CDM / ATM / CRM යන්ත්‍ර 384 ක් හරහා ඔවුන්ගේ සේවාවන් බෙදා හැර ඇත. ඊට අමතරව දිවයින පුරා කාර්ය මණ්ඩල සංඛ්‍යාව 4,616 ක් සේවයේ යොදවා තිබුණි.

ICRA Lanka Limited විසින් බැංකුවට SLAAA (ස්ථාවර) දිගුකාලීන ණය ශ්‍රේණිගත කිරීමක් ලබා දී ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව - සමූහය

සමූහයට, සීමාසහිත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSB) යන පරිපාලිත සමාගම් දෙකක් ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1999 නොවැම්බර් 16 වන දින සීමාසහිත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම නමින් වෙනම සමාගමක් සංස්ථාගත කරන ලදී. සීමාසහිත ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම 2000 මාර්තු 1 වන දින මහ බැංකුව විසින් කැපවූ ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස පත් කරන ලදී.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාපිත වූ සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද පොදු සීමිත වගකීම් සහිත සමාගමකි. තවද, එය 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ස්ථාපිත කර තිබුණි. 2016 රජයේ අයවැයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුකූලව ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2019 ඔක්තෝබර් 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සම්පූර්ණයෙන්ම අත්පත් කර ගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ 2021 ජනවාරි 05 දිනැති ලිපියට අනුව, බැංකුව 2021 සැප්තැම්බර් 30 වන විට ඈවර කිරීමට හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට නියමිතය. කෙසේ වෙතත්, මෙම වාර්තාකරණ දිනය දක්වා, ඉහත ක්‍රියාවලිය අවසන් කර නොතිබූ අතර ව්‍යාපාරික මෙහෙයුම් ද සිදු කර නොතිබුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 1997 අංක 07 දරන (සංශෝධිත 2003 අංක 15 දරන

පනත හා 2011 අංක 45 දරන පනත) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත යටතේ සංස්ථාපනය කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත මඟින් බලපත්‍රලාභී විශේෂ බැංකුවක් බවට පත් විය. පනතේ අංක 12(අ) හා සංශෝධිත වලට අනුව බැංකුවේ අරමුණු වනුයේ, සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස සිහිනය සැබෑ කර ගැනීමට නිවාස ආශ්‍රිත මූල්‍ය සම්පාදනයේ අවිවාදාත්මක වෙළඳපොල නායකයා බවට පත් වීමය.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ බැංකුව 2021 වර්ෂයේදී නව ශාඛා ස්ථාපිත කර නොතිබූ අතර ඒ අනුව 2021 වසර අවසානයේ දී මුළු ශාඛා 39 ක් වූ අතර BB + (lka) ණය ශ්‍රේණිගත කිරීමකින් යුක්ත විය. ඊට අමතරව ලබා දී ඇති ණය 2021 දී රු.බිලියන 41.84 ක් වූ අතර 2020 දී රු.බිලියන 41.21 ට සාපේක්ෂව එය සියයට 1.5 කින් වැඩි විය. සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම, පෙර වර්ෂයේ ආදායම වූ රු. බිලියන 7.46 සිට රු. බිලියන 6.61 දක්වා සියයට 11.32 කින් අඩු වී තිබුණි. තවද, බැංකුව වසර තුළ සිය තැන්පතු පදනම රු.බිලියන 47.95 සිට රු.බිලියන 49.81 දක්වා පුළුල් කර ඇති අතර එය සියයට 3.89 ක වර්ධනය වීමකි.

2020 වර්ෂය අවසන් වන විට රු. බිලියන 61.03 ක් වූ මුළු වත්කම් 2021 වර්ෂය අවසන් වන විට රු. බිලියන 62.96 දක්වා රු. බිලියන 1.93 කින් වැඩි වී තිබුණි. බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2020 වසරේ සියයට 20.2 සිට 2021 වසරේ සියයට 18.8 දක්වා අඩු වී තිබුණි.

2021 වසරේදී බැංකුව රු.මිලියන 878 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 17.79 ක අඩුවීමක් විය. තවද, 2020 වසරට සාපේක්ෂව බැංකුවේ ශුද්ධ පොලී ආදායම මිලියන 75 කින් හෙවත් සියයට 2.52 කින් වැඩි වී තිබුණි.

ප්‍රාග්ධන ප්‍රමාණවත් වීම සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය, කොටස් හිමියන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම ප්‍රමුඛතාවය වූ අතර කොටස් හිමියන්ගේ අරමුදල් 2021 දී සියයට 9.88 කින් වැඩි විය, කොටසකට ශුද්ධ වත්කම් රු. 89.35 සිට රු. 98.18 දක්වා 2021 දී එය සියයට 9.88 ක වර්ධනයක් සනිටුහන් කර තිබුණි. කෙසේ වෙතත්, ලාභදායිතාවය අඩුවීම හේතුවෙන් 2021 වර්ෂය තුළ කොටසකට ඉපැයීම රු.10.94 සිට රු.8.46 දක්වා අඩු විය. මූලික ප්‍රාග්ධන අනුපාතය (ස්ථර 1) සහ සම්පූර්ණ ප්‍රාග්ධන අනුපාතය (ස්ථර 2) නියාමන අවශ්‍යතා වන සියයට 8.5 සහ සියයට 12.5 ට සාපේක්ෂව අවම අවශ්‍යතාවයට වඩා සියයට 22.38 සහ සියයට 23.02 ලෙස පවතී. කෙසේ වෙතත්, 2017 ඔක්තෝබර් 26 දිනැති අංක 05 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියෝගයට අනුව 2020.12.31 දින සිට බැංකුවේ අවම ප්‍රාග්ධනය රු.මිලියන 7,500 ක් විය යුතුය. වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 වසර අවසානය දක්වා අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා කාල සීමාව සංශෝධනය කරන ලදී. බැංකුවේ වත්කම්, තැන්පතු, ණය ගැනීම් හා වැදගත් දර්ශක කිහිපයක් පහත දැක්වේ.

විස්තර	2020 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට
මුළු වත්කම් (රු.මිලියන)	61,030	62,964
මුළු තැන්පතු (රු.මිලියන)	47,947	49,813
ණය ගැනීම් (රු. මිලියන)	5,542	5,090
වත්කම් මත ප්‍රතිලාභ (%)	1.16	0.87
කොටස් මත ප්‍රතිලාභ (%)	12.25	8.61
අක්‍රීය ණය (%) - දළ	20.23	18.8

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (MBSL)

1982 වර්ෂයේ දී දිවයිනේ ප්‍රථම සහ එකම විශේෂිත වෙළඳ බැංකුව වශයෙන් මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සංස්ථාපනය කරන ලදී. 1991 වර්ෂයේදී මෙම සමාගම කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කරන ලද අතර 2000 දී කල්බදු මූල්‍යකරණ සමාගමක් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍රය ලබා ගන්නා ලදී. 2014 වර්ෂයේදී මෙම සමාගම මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ලෙස නැවත නම් කරන ලද අතර 2015 වර්ෂයේ දී මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා බලයලත් බලපත්‍රලාභී මුදල් සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ දැක්ම වන්නේ ජාතියට නව්‍යකරණ ව්‍යාපාර විසඳුම් සපයන්නා බවට පත්වීමයි. වර්තමානයේ දී සමාගම ශාඛා 48 ක ජාලයක් තුළින් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාව තුළ පමණක් ක්‍රියාත්මක වේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB)

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත මඟින් 2010 වසරේ පළාත් සංවර්ධන බැංකු හයක් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාවේ ස්ථාපිත රජය සතු බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවන ලදී. රජය සතු ජාතික මට්ටමේ බැංකුවක් ලෙස බැංකුවේ අරමුණු වන්නේ ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳ, වාණිජ, පශු සම්පත්, ධීවර වැනි සමස්ත කලාපීය ආර්ථික සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට මූල්‍ය ආධාර ලබා දීමෙන් කාන්තාවන් සවිබල ගැන්වීමත්ය.

මූල්‍ය ආයතනයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මූල්‍ය සංවර්ධනය ඉලක්ක කරගනිමින් රටේ සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් නඟා සිටුවීමේ දී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කිරීමට අපේක්ෂා කරයි. දිවයින පුරා සිටින 2,590 පමණ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දායකත්වයෙන් බැංකුව සිය දීප ව්‍යාප්ත ශාඛා 288 හරහා බැංකුවේ ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීමට සහ එමඟින් සමස්ත ජාතිය සංවර්ධනය සඳහා දායකත්වය සපයයි. බැංකුව ICRA ලංකා සමාගම වෙතින් BBB+ (ඍණ) ශ්‍රේණිගත කිරීමක් ලබා ඇත.

රජය සතු බැංකුවක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් COVID-19 කාලය තුළ පාරිභෝගිකයන් වෙත ණය සහ වෙනත් සහන ක්‍රියාත්මක කරන ලදී. 2021 වර්ෂය තුළදී

බැංකුව විසින් RDB QR කේත පදනම් කරගත් ගනුදෙනු පහසුකම දියත් කරන ලද අතර එමඟින් වෙළඳ ආයතනයකින් භාණ්ඩ හෝ සේවා මිලදී ගන්නා ගනුදෙනුකරුවන්ට වෙනත් බැංකුවක QR යෙදුම හරහා භාණ්ඩ සඳහා මුදල් ගෙවිය හැකි අතර අරමුදල් අදාළ වෙළඳ ආයතනයේ/හිමිකරුගේ RDB ගිණුමට බැර වේ. තවද, ණය පද්ධතිය (LOS) සහ ණය එකතු කිරීමේ කළමනාකරණ පද්ධතිය (CMS) යන පද්ධති සංවර්ධනය කිරීමේ අවසන් අදියරේ පවතින අතර එය ගනුදෙනුකරුවන්ට කඩිනමින් ණය පහසුකම් සැලසීමට ඉවහල් වේ.

2021 වර්ෂය සඳහා බැංකුව රු. මිලියන 775.5 ක බදු පෙර ලාභයක් සහ වසරේ ශුද්ධ පොලී ආදායම රු. බිලියන 13.65 ක් වාර්තා කරන ලදී. 2021 වසර අවසන් වන විට බැංකුවේ මුළු වත්කම් රු. බිලියන 245.9 ක් දක්වා වර්ධනය වූ අතර එය 2020 වසරේ මුළු වත්කම් වටිනාකම වූ රු.බිලියන 222.1 ට සාපේක්ෂව සියයට 11 ක වැඩිවීමකි. 2021 වර්ෂය අවසානයට ගනුදෙනුකරුවන්ගේ තැන්පතු රු. බිලියන 187.7 ක් වූ අතර එය 2020 වසර අවසානයට සාපේක්ෂව රු. බිලියන 14.8 ක හෝ සියයට 8.6 ක වැඩිවීමකි. 2021 මූල්‍ය වර්ෂය අවසානයට පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 8.72 ක් වූ අතර මුළු ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 14.27 කි.

ප්‍රධාන විගණන නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුව

- බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුව, බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ආයෝජනයේ වටිනාකම, 2019 අවසානයට පැවති රු.බිලියන 25 (පොත් අගය) සිට 2020 වර්ෂය අවසානවන විට රු.බිලියන 638 (පොත් අගය) දක්වාත්, 2021 වර්ෂය අවසාන වන විට රු.බිලියන 1,351 (පොත් අගය) දක්වාත් වැඩිවී තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය අවසාන වන විට රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 2.9 ක ප්‍රමාණයක් පමණක් බැංකුව සතුව පැවති අතර, එම ප්‍රමාණය 2020 වර්ෂය අවසානවන විට නිකුත් කර තිබූ ප්‍රමාණයෙන් සියයට 40.4 ක් දක්වා හා 2021 වර්ෂය අවසානවන විට නිකුත් කර තිබූ ප්‍රමාණයෙන් සියයට 59.5 ක් දක්වාත් වැඩිවී තිබුණි. මේ අනුව, ඒ ඒ වර්ෂ අවසානයට පැවති රජය නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් බැංකුව මිලදී ගෙන තිබුණි.

- බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 වර්ෂය අවසාන වන විට රු.බිලියන 1,511.6 ක්ව පැවති බැංකුවේ විදේශ වත්කම් 2020 වර්ෂය අවසානයට රු.බිලියන 1,387.5 දක්වා හා 2021 වර්ෂය අවසානවන විට රු.බිලියන 798.8 දක්වා 2020 වර්ෂයට සාපේක්ෂව 2021 අවසානයට සියයට 42 කින් පමණ අඩුවී තිබුණි. බැංකුව මඟින් ප්‍රකාශයට පත්කරන

සතිපතා ආර්ථික දර්ශක අනුව, බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් 2021 අගෝස්තු මාසයේ දී රු. බිලියන 83.9 ක සෘණ අගයක් ගෙන ඇති අතර එය වර්ධනය වෙමින් 2021 දෙසැම්බර් වන විට ශුද්ධ විදේශ වත්කම්වල සෘණ ශේෂය රු.බිලියන 386.2 දක්වාත් 2022 ජූලි අවසාන වන විට එම සෘණ ශේෂය රු.බිලියන 1,612. 7 දක්වාත් වැඩිවී තිබුණි.

- බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ දෛනික විනිමය අනුපාත අනුව, 2021 සැප්තැම්බර් 7 සිට 2022 මාර්තු 7 දක්වා බැංකුව විසින් ඇමෙරිකානු ඩොලරය සඳහා වන විනිමය අනුපාතය ස්ථාවර අගයක පවත්වා ගෙන ගිය අතර එම කාලය තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපලට බැංකුව විසින් කරන ලද විදේශ විනිමය විකිණීම් වැඩි වශයෙන් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා කාලපර්ච්ඡේදය තුළදී බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපලට එක්සත් ජනපද ඩොලර් මිලියන1,746 ක් සපයා ඇති අතර දේශීය විදේශ විනිමය වෙළඳපලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 738 ක් පමණක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව, දේශීය විදේශ විනිමය වෙළඳපලට සපයන ලද ශුද්ධ විදේශ විනිමය එක්සත් ජනපද ඩොලර් මිලියන 1,008 ක් පමණ වූ අතර බැංකුව සතු විදේශ සංචිත අඩුවීමට එය ද බලපා තිබුණි.

- 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා වන කාලපර්ච්ඡේදය තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි. ඒ අනුව, 2021 පෙබරවාරි සිට 2021 අගෝස්තු දක්වා වන මාස 7 සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 3,548.9 ක විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබී තිබුණු අතර, 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා එය, එක්සත් ජනපද ඩොලර් මිලියන 2,049.8 ක් දක්වා අඩුවිය. නිල විනිමය අනුපාතයට සාපේක්ෂව අවිධිමත් වෙළඳපලේ විනිමය අනුපාතයේ කැපී පෙනෙන වෙනසක් පැවතීම, විධිමත් මාර්ග හරහා ලැබෙන ප්‍රේෂණ අඩුවීමට මූලික වශයෙන් හේතුවූ බව නිරීක්ෂණය විය.

- මුදල් නීති පනතේ 66(1) වගන්තියට අනුව, ශ්‍රී ලංකා රුපියලේ ජාත්‍යන්තර ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා සහ එහි වත්මන් ජාත්‍යන්තර ගනුදෙනුවල උපරිම නිදහස සහතික කිරීම සඳහා, මුදල් මණ්ඩලය විසින් මහ බැංකුවේ වත්කම් මගින් ජාත්‍යන්තර ගෙවුම් ශේෂයේ අපේක්ෂා කළ හැකි හිඟයක් සපුරාලීමට ප්‍රමාණවත් ජාත්‍යන්තර සංචිතයක් පවත්වා ගැනීමට උත්සාහ කළ යුතුය. කෙසේ වෙතත්, 2018 ජනවාරි මාසය වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 7,670 කට ආසන්නව අගයක් ගෙන තිබූ දළ නිල සංචිත, 2022 මාර්තු මාසය වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 2,000 ටත් වඩා අඩු අගයක් දක්වා විශාල

වශයෙන් අඩුවී තිබුණි. රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර පියවීම සඳහා අවස්ථා දෙකකදී එකතුව එක්සත් ජනපද ඩොලර් මිලියන 1,500 ක බැංකුව සතු විදේශ සංචිත යොදා ගැනීම ද මෙලෙස දළ නිල සංචිත අඩුවීමට හේතුවක් විය.

- මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රාජ්‍ය ණය කළමනාකරණය හා සම්බන්ධ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ණය යන්නට ඇතුළත් වන්නා වූ ණය වර්ගයන් හෙවත් රාජ්‍ය ණය සඳහා නිර්වචනයක්, රාජ්‍ය ණය කළමනාකරණයේ අරමුණු සහ කාර්යයන් පිළිබඳව මුදල් නීති පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක සඳහන් වී නොමැත.

- ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජූලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 6 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව, මෙම පනත බලපැවැත්වෙන දින සිට 2021 ජූනි 30 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යාම සඳහා සමාගම් 4 ක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි. 2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ප්‍රතිචාර වශයෙන්, ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ණය නියාමන අධිකාරියක් වෙනම පනතක් හරහා ස්ථාපිත කරන බවත් එම යෝජිත පනතෙහි කෙටුම්පත 2019 නොවැම්බර් 26 දින මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, 2021 වර්ෂය අවසාන වන විටත් එය බලාත්මක කර නොතිබුණි.

ලංකා බැංකුව

- සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.බිලියන 37.6 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ ලාභය රු.බිලියන 17.8 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.බිලියන 19.8 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ණය සහ අත්තිකාරම් සියයට 22 කින් වර්ධනය වීම සහ ආයෝජන සියයට 44 කින් වර්ධනය වීම මත පොලී ආදායම සියයට 15 කින් වැඩි වීම හේතු වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව, සෘජුව රජයට සහ රාජ්‍ය ව්‍යවසාය සඳහා ණය ලබාදීම

බැංකු අංශය

සියයට 41 කින් ද, පෞද්ගලික අංශය සඳහා ණය ලබාදීම සියයට 9 කින් ද, වර්ධනය වී තිබුණි.

- ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරන ගාස්තු පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ රු.බිලියන 12.5 කින් හෙවත් සියයට 40 කින් ඉහළ ගොස් තිබුණි. බැංකුවේ සමස්ත ණය ප්‍රමාණය ඉහළ යාම, අදියර I සහ II යටතේ වර්ගා කරන ලද ණය ප්‍රමාණය ඉහළ යාම, රජය සහ රාජ්‍ය ව්‍යවසායයන් සඳහා විදේශ මුදලින් ප්‍රදානය කරන ලද ණය මුදල් සහ විදේශ මුදලින් සිදුකරන ලද ආයෝජන මත කරන ලද වෙන්කිරීම් වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව බැංකුවේ තැන්පතු පදනම සියයට 16 කින් ද, ණය ගැනීම් සියයට 126 කින්ද, වැඩිවී තිබූ අතර වර්ෂය පුරා පැවැති අඩු පොළී තත්වය හේතුවෙන්, පොලී වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 2.2 කින් හෙවත් සියයට 2 කින් අඩු වී තිබුණි.

- රජය සතු ව්‍යවසායන්ට (SOEs) අයත් ණය සහ අත්තිකාරම් වල මුළු හිඟ ශේෂය පසුගිය වසර පහක කාලය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි. 2021 වර්ෂය වන විට, 2017 වර්ෂයට සාපේක්ෂව රජය සතු ව්‍යවසායන්ගේ මුළු හිඟ ණය සහ අත්තිකාරම් සියයට 209 කින් හෙවත් රු.මිලියන 772,819 කින් වැඩි වී තිබුණි. 2017 වර්ෂයේදී රජය සතු ව්‍යවසායන්ගේ මුළු හිඟ ශේෂය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 30.24 ක් සහ බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 18.90 ක් විය. මෙම ප්‍රතිශත 2021 දෙසැම්බර් 31 දිනට මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 44.31 ක් දක්වා සහ මුළු වත්කම්වලින් සියයට 30.02 ක් දක්වා වේගයෙන් වර්ධනය වී තිබුණි.

- 2021 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඉහළම ණය ශේෂයක් දරන රජය සතු ව්‍යවසායයන් අතරට මහා භාණ්ඩාගාරය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකන් ගුවන් සේවය, ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ වී අලෙවි මණ්ඩලය අයත් විය. 2021 දෙසැම්බර් 31 දිනට මෙම ආයතන සඳහා ලබාදී ඇති මුළු ණය වටිනාකමෙහි එකතුව, ප්‍රාග්ධන කොටස රු.මිලියන 1,085,738 ක් සහ පොළී කොටස රු.මිලියන 15,349 ක් සමඟ රු. මිලියන 1,101,087 ලෙස වාර්තා වී තිබූ අතර එය රජය සතු ව්‍යවසායන්ට අයත් ණය සහ අත්තිකාරම්වලින් සියයට 96.44 ක් නියෝජනය කරයි.

- 2021 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව රු.මිලියන 21,455.50 වූ අතර එදිනට මුළු ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සියයට 0.83 ක ප්‍රතිශතයක් විය.

මහජන බැංකුව

- පසුගිය වසර 5 (2017-2021) තුළදී රජය සතු ව්‍යවසායන්වලට අයත් ණය හා අත්තිකාරම් මුළු හිඟ ශේෂය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2021 වන විට, 2017 වර්ෂයට සාපේක්ෂව රජය සතු ව්‍යවසායන්ට අයත් ණය හා අත්තිකාරම් මුළු හිඟ ශේෂය රු. මිලියන 584,107 කින් හෙවත් සියයට 165 කින් වැඩිවී ඇත. 2017 වර්ෂය තුළදී රජය සතු ව්‍යවසායන්ට අයත් මුළු හිඟ ශේෂය බැංකුවේ මුළු ණය හා අත්තිකාරම්වලින් සියයට 32.89 ක් හා මුළු වත්කම්වලින් සියයට 24.08 ක් විය. මෙම ශේෂයන් 2021 දෙසැම්බර් 31 වන විට මුළු ණය හා අත්තිකාරම්වලින් සියයට 48.39 ක් ලෙස හා මුළු වත්කම්වලින් සියයට 35.40 ක් දක්වා වේගයෙන් වර්ධනය වී තිබුණි. 2021 දෙසැම්බර් 31 වන විට බැංකුවේ මුළු වත්කම් පදනම රු.මිලියන 2,647,641 ක් වූ අතර, ඉන් සියයට 35.40 ක් රජය සතු ව්‍යවසායන්ට අයත් ණය හා අත්තිකාරම් නියෝජනය විය.

- 2021 දෙසැම්බර් 31 වන විට, රජය සතු ව්‍යවසායන්ට දුන් ඉහළම ණය 10 හි ප්‍රාග්ධනය රු. මිලියන 873,689 ක් හා පොලිය රු.මිලියන 9,152 ක් සමඟ රු. මිලියන 882,840 ක් ලෙස වාර්තා වූ අතර එය රජය සතු ව්‍යාපාරවලට අයත් ණය හා අත්තිකාරම් මුළු හිඟ ශේෂයෙන් සියයට 94.18 ක් නියෝජනය විය. රජය සතු ව්‍යාපාරවලට දුන් ඉහළම ණය 10 නියෝජනය වූයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකන් ගුවන් සමාගම, මාර්ග සංවර්ධන අධිකාරිය, සීමා සහිත ලංකා පොහොර සමාගම, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ, සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව යන ආයතනයි.

- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, සමෘද්ධි ණය සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා රජයේ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොලිය ආදියේ හිඟහිටි ශේෂයන් වන රු. මිලියන 480,526 ක මුදල, මුදලින් පියවීම වෙනුවට 2020 හා 2021 වර්ෂවලදී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත්කිරීම මඟින් පියවන ලදී.

- උකස් නිලධාරියකු විසින් උකස් පද්ධතිය තුළ ව්‍යාජ ගනුදෙනුකරුවන් නිර්මාණය කරමින් එකතුව රු. 50,233,000 ක උකස් අත්තිකාරම් ලබා දී තිබුණි. ඒ අනුව, උකස් ගනුදෙනුකරුවන්ගේ භෞතික පෙනීසිටීමකින් තොරව අත්තිකාරම් මුදල් උපලබ්ධි කර තිබුණි.

- ව්‍යාපෘති ප්‍රඥප්තියට (Charter) අනුව, දත්ත ගබඩා කිරීමේ (Data Ware House) ව්‍යාපෘතිය අනුමත කර ඇති අතර 2012 වර්ෂයේදී ලංසු කැඳවන ලදි. 2015 දී JIT ටෙක්නොලොජීස් විසින් ලංසු බාරගන්නා ලද අතර 2015 නොවැම්බර් 02 දින බැංකුව විසින් ගිවිසුම අත්සන් කරන ලදි.

ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ මුළු වියදම රු.250,539,917.95 ක් විය. ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ප්‍රඥප්තියට අනුව, පසුගිය වර්ෂ 5 සඳහා ව්‍යාපෘතියේ අපේක්ෂිත මුළු නඩත්තු පිරිවැය රු.168,850,063.17 ක් විය. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 800/2021 පරිදි, පසුගිය වර්ෂ 5 සඳහා දරන ලද මුළු පිරිවැය රු. 402,028,385 හා මුළු අපේක්ෂිත පිරිවැය රු.480,910,852 ක් වේ. ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 08 දින නිම කිරීමට නියමිතව තිබුණි. මුදල් හා සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද විස්තරවලට අනුව, 2015 සිට 2020 දක්වා අවස්ථා 17 ක දී කොටස් වශයෙන් රු.137,187,229 ක් ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුම්වල නොපියවූ ලෙස පැවතුණි. ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් ද සිදුකර තිබුණි.

- 2021 ජූලි 27 හා 2021 අගෝස්තු 19 දින පැවති දත්ත ගබඩා කිරීම් කමිටුවේ රැස්වීම් වාර්තාවට අනුව, ව්‍යාපෘතිය අපේක්ෂා කළ පරිදි භාවිතා කිරීමට නොහැකි බවත් බලපත්‍රය කල්ඉකුත්වීම හේතුවෙන් දැනට පද්ධතිය නොපවතින බවත් එක් එක් අංශයේ නියෝජිතයන් අවධාරණය කර ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 800/2021 හරහා මණ්ඩලයට සන්නිවේදනය කර ඇති අතර විධායක මෙහෙයුම් කමිටුව දැනට පවතින දත්ත ගබඩාව ද නතර කිරීමට තීරණය කළේය.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

- ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 වර්ෂය තුළදී බැංකුවේ මුළු පොලී ආදායම සියයට 7.3 කින් හෙවත් රු. මිලියන 122,512 සිට රු. මිලියන 131,438 දක්වා වැඩි වී තිබුණි. පසුගිය වර්ෂයේ අනුරූපී බදු පෙර ශුද්ධ ලාභය වූ රු. මිලියන 15,645 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම රු. මිලියන 28,381 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණ අතර, එමගින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 12,736 ක හෙවත් සියයට 81 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (ROAA) සහ සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභය (ROAE) පිළිවෙලින් සියයට 1.93 ක් සහ 33.92 ක් විය.

- පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය අවසානයට ණය සහ අත්තිකාරම් සියයට 4 කින් හෙවත් රු. මිලියන 516,795 සිට රු. මිලියන 538,941 දක්වා ඉහළ ගොස් තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට හිඟ මුළු ණයවලින් පුද්ගලික ණය සියයට 40.5 ක් වූ අතර නිවාස හා දේපළ ණය සියයට 11.7 ක් විය. තවද, බැංකුව 2021 ජනවාරි 1 වන දින රු. මිලියන 59,366 ක වටිනාකමින් යුත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි හිඟ ණය, ණයකර ලෙස පරිවර්තනය කර ඇත. එබැවින්, එය 2021 දෙසැම්බර් 31 දිනට ණය සහ අත්තිකාරම් වලින් ණය සහ අනෙකුත් උපකරණ ලෙස වර්ග කර තිබුණි.

* සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතය සියයට 2.79 සිට සියයට 2.97 දක්වා ඉහළ ගොස් තිබුණි. තවද, හානිකරණය සඳහා ප්‍රතිපාදනය ද රු. මිලියන 2,978 කින් හෙවත් සියයට 33.1 කින් වැඩි වී තිබුණි. එසේ වැඩිවීමට හේතුව වූයේ අක්‍රිය ණය සියයට 12 කින් වැඩි වීමයි.

* වර්ෂය අවසානයට බැංකුවේ මුළු තැන්පතු පදනම සියයට 15 කින් හෙවත් රු. මිලියන 1,237,124 සිට රු. මිලියන1,428,467 දක්වා වැඩිවී තිබුණි. 2021 වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු බැංකුවේ මුළු තැන්පතුවලින් සියයට 74.2 ක් විය.

* 2021 වර්ෂය තුළ ණය සහ අනෙකුත් උපකරණවල ආයෝජනය සියයට 24 කින් හෙවත් රු. බිලියන 754.2 සිට රු.බිලියන 935.4 දක්වා වැඩිවී තිබුණි. ඉහත වර්ධනයට හේතුව සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය සුරැකුම්පත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB), ණයකර (භාණ්ඩාගාර ඇපකරය) සහ ආයතනික ණය උපකරණවල ආයෝජනයයි.

* සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ පෙළ 1 ප්‍රාග්ධන අනුපාතය සියයට 13.65 සිට සියයට 18.6 දක්වා වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ මුළු ප්‍රාග්ධන අනුපාතය සියයට 16.45 සිට සියයට 20.83 දක්වා වැඩි වී තිබුණි.

* 2016 අප්‍රේල් 29 දිනැති අංක PED/03/2016 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයට පටහැනිව සාමූහික ගිවිසුමට අනුව බැංකුවේ අරමුදල්වලින් තම සේවකයන් සඳහා උපයන විට ගෙවීමේ බදු ගෙවා ඇත. ඒ අනුව බැංකුව විසින් 2021 වර්ෂය සඳහා උපයන විට ගෙවීමේ බදු ලෙස රු.මිලියන 11.81 ක් ගෙවා තිබුණි.

* සමූහය විසින් 2021 වර්ෂය සඳහා රු.මිලියන 28,425 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 69 ක වැඩිවීමක් නියෝජනය කරයි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමූහයේ මුළු වත්කම් පදනම සියයට 16 ක වර්ධනයක් නියෝජනය කරමින් වර්ෂය අවසානයේදී රු.මිලියන 1,605,805 දක්වා වැඩි වී තිබුණි. 2020 වර්ෂය හා සැසඳීමේදී දළ ණය සහ අත්තිකාරම් සහ මුළු තැන්පතු පිළිවෙලින් සියයට 4 කින් සහ සියයට 15 කින් වැඩි වී තිබුණි.

* 2020 වර්ෂය හා සැසඳීමේදී සමූහයේ මුළු ප්‍රාග්ධන අනුපාතය සියයට 18.3 සිට සියයට 36.6 දක්වා වැඩි වී තිබුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

* 2011 ඔක්තෝම්බර් 05 දිනැති බැංකු පනතේ 2011 මාර්ගෝපදේශ අංක 07 අනුව බලපත්‍රලාභී බැංකු සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වැඩ රාමුව (IRM Framework), 2014 ජුනි 25 දිනැති බැංකු පනතේ 2014 මාර්ගෝපදේශ අංක

04 ඩී (D) 2.9 (අ) 7 සංශෝධනයට අනුව, සියලුම බැංකු 2015 ජූලි 01 දින සිට තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා (Baseline Security Standard) මූලික ආරක්ෂක ප්‍රමිතිය ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, 2015 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා Baseline Security Standard (BSS) ක්‍රියාත්මක කිරීමට බැංකුව අසමත් වී තිබුණි. බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව BSS ප්‍රතිපත්ති සකස් කර තිබුණද, සමස්ත බැංකු ජාලය තුළම එය ක්‍රියාත්මක කිරීමට බැංකුවට මේ දක්වාම නොහැකි වී තිබුණි. එම මඟපෙන්වීම යටතේ Baseline Security Standard පාලන අරමුණු 95 ක් ලබා දී තිබූ අතර ඒ අතුරෙන් පාලන අරමුණු 45 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

- 2021 ජූලි 20 දිනැති, ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ අංක 02/2021 හි 25 වැනි වගන්තිය ප්‍රකාරව, සියලුම මූල්‍ය ආයතන (FI) විසින් ස්ථානගත කිරීම, ක්‍රියාකාරීත්වය, අධීක්ෂණය, වාර්තා තබා ගැනීම, පද්ධති නඩත්තුව සහ පරිපාලනය පිළිබඳ අභ්‍යන්තර මෙහෙයුම් මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එය AML/CFT (මුදල් විශුද්ධිකරණයට විරුද්ධ / ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම) ප්‍රතිපත්තියේ කොටසක් ලෙස මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ (BOD) අනුමැතිය ඇතිව සිදු කිරීම ද අවශ්‍ය වේ. කෙසේ වුවද, සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා මෙම අවශ්‍යතාවය සපුරාලීමට බැංකුව අපොහොසත්ව තිබුණි.

- Password Settings (මුරපදය සැකසීම) : පොලාරිස් කෝර් බැංකු පද්ධතිය (Polaris - Core Banking System) තුළ පරිශීලක ගිණුම් 38 ක් සහ ICMS හි පරිශීලක ගිණුම් 22 ක් දීර්ඝ කාලයක් තුළ භාවිත කර නොතිබූ අතර එය අක්‍රිය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී තිබුණි.

- උපස්ථ ප්‍රතිස්ථාපන පරීක්ෂණයක් (Backup Restoration & Testing) : තොරතුරු ආරක්ෂණ පාලන ලේඛනය ප්‍රකාරව (Information Security Control Documents), උපස්ථ ප්‍රතිස්ථාපනය (backup restoration) මාස 4 කට වරක් සිදු කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචනයට භාජනය වන මූල්‍ය වර්ෂය තුළ බැංකුව දත්ත සමුදාය (Database) සහ Polaris, AMS, DMS, HRPA, ICMS, Palmtop සහ IB සඳහා උපස්ථ ප්‍රතිස්ථාපන පරීක්ෂණයක් (backup restoration testing) සිදු කර නොතිබුණි.

- ආයෝජන දේපල : කොළඹ 13, ශ්‍රී සංඝරාජ මාවත, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා පරිශ්‍රයේ පිහිටි රු. මිලියන 801 ක් වටිනා ආයෝජන දේපළෙහි අයිතිය 2008 දෙසැම්බර් 31 දින බැංකුව වෙත පවරා ගෙන තිබුණි. කෙසේ වුවද, ඉඩමේ හිස් භුක්තිය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

(BMC) විසින් බැංකුව වෙත භාර දී නොතිබුණි. 2008 වසරේ සිට මෙම ඉඩම හිස් භුක්තිය ලබා ගැනීමට බැංකුව උත්සාහ කරමින් සිටියි. කෙසේ වුවද, 2022 ජූලි 31 දින දක්වාම ඉඩමේ හිස් අයිතිය ලබා ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි.

- ණය සහ අත්තිකාරම් - ක්‍රියාත්මක සහ අක්‍රිය ණය (සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ණය (EPF) සහ කල් බදු පහසුකම් හැර) : 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය සහ අත්තිකාරම් ශේෂය රු.මිලියන 29,765 ක් වූ අතර එම දිනය වන විට අක්‍රිය ණය සහ අත්තිකාරම් රු.මිලියන 7,549 ක් වූ අතර එය මුළු හිඟ ණය සහ අත්තිකාරම් වලින් සියයට 25 ක් නියෝජනය විය. තවද, රු. මිලියන 2,154 ක ණය (මුළු හිඟයෙන් සියයට 7.2) රැකවල් (Watch) තත්ත්වය යටතේ වර්ගීකරණය කර ඇති බව නිරීක්ෂණය වූ අතර එය පසුව ක්‍රියාකාරී නොවන තත්ත්වය බවට පත්වීමේ අවදානමක් ද විය. 2021 දෙසැම්බර් 31 දිනට ආයතනික ණය (Corporate Loans) 67 ක හිඟ ශේෂය රු.මිලියන 1,378 කි. ඉන් රු.මිලියන 618 (ණය 10) 2021 දෙසැම්බර් 31 වන විට අක්‍රිය ණය ගණයට පරිවර්තනය වී තිබුණි. තවද, රු.මිලියන 22 ක ණය රැකවල් (Watch) යටතේ වර්ගීකරණය කර ඇති අතර එය පසුව ක්‍රියාකාරී නොවන තත්ත්වයට පත්වීමේ අවදානමක් ඇති බව ද නිරීක්ෂණය විය.

- රාජ්‍ය ආයතන සඳහා ලබා දී ඇති ණය : බැංකුව විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) යටතේ ඇති ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) සහ රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව (SD&CC) යන රාජ්‍ය ආයතන සඳහා පිළිවෙලින් රු. මිලියන 71.40 ක් සහ රු මිලියන 84ක් වශයෙන් ණය පහසුකම් 2 ක් ලබා දී තිබුණි. මෙම ආයතන දෙක ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේ අපේක්ෂා කළ පරිදි, කොන්ත්‍රාත් දෙක සිදු නොකිරීම මත වර්තමානයේ දී මෙම ණය දෙකම අක්‍රිය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 118ක් වී තිබුණි.

- ඔලිම්පස් ඉදිකිරීම් සමාගම (Olympus construction Limited) : කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ඔලිම්පස් ඉදිකිරීම් සමාගම (110730000003) විසින් ඉල්ලුම් කළ රු. මිලියන 350 ක ණය පහසුකමක් 2019 ජූනි 07 දින පැවති විශේෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී. පිළිවෙලින් 2019 ජූලි 8 සහ 2019 ඔක්තෝබර් 28 යන දිනයන්හිදී එම සමාගමට රු. මිලියන 100 ක් සහ රු. මිලියන 150 ක ණය පහසුකම් ලබාදී තිබුණි. පසුව, එය ප්‍රදානය කිරීමේ මුල් අදියරේදී 2020 ජනවාරි 07 දින අක්‍රීය ණය යටතේ වර්ගීකරණය කර තිබූ අතර, 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ මුදල රු.මිලියන 298 ක් අයකර ගැනීමකින් තොරව දින (Day Past Due) 785 ක් ගත

වී තිබුණි. තවද, 2021 මාර්තු 24 දින බැංකුව විසින් ඉහත දේපළ පවරා ගෙන තිබුණ අතර මේ වන විටද එය විකුණා ගැනීමට බැංකුවට නොහැකි වී තිබුණි.

- ප්‍රධාන තැන්පතුකරුවන් 10 (Top Ten Depositors) : ප්‍රධාන තැන්පත්කරුවන් දස දෙනාගේ මුළු මුදල රු. මිලියන 3,481 ක් වන අතර ප්‍රධාන තැන්පත්කරුවන් 10 දෙනාගෙන් සියයට 28 ක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල නියෝජනය කරන අතර එය රු. මිලියන 973 කි. පෙර වර්ෂයේ ඉහළම තැන්පත්කරුවන් 10 දෙනාගේ වටිනාකම රු. මිලියන 6,344 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 3,481 දක්වා සියයට 45 කින් පහත වැටී තිබුණි.

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

- සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 529 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ අලාභය රු. මිලියන 1,108 ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,637 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වර්ෂය පුරා පැවැති අඩු පොළී තත්ත්වයට එරෙහිව පොලි ආදායම සියයට 11.6 කින් වැඩිවීමත්, පොළී වියදම සියයට 24.3 කින් අඩුවීමත් මත ශුද්ධ පොළී ආදායමෙහි සිදුවූ සියයට 101 ක වර්ධනය මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට හේතු වී තිබුණි. වර්ෂය තුළදී සමාගමේ වත්කම්හි සියයට 6 ක ප්‍රසාරණයක් පෙන්නුම් කරමින්, සමාගමේ ශේෂ පත්‍රය 2021 දෙසැම්බර් අවසානය වන විට රු. බිලියන 34.3 ක් දක්වා වර්ධනය වී තිබුණි. ණය සහ අත්තිකාරම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 5.2 කින් වර්ධනය වී තිබූ අතර එය වත්කම්හි වර්ධනයට ප්‍රධාන ලෙස දායක වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව බැංකුවේ තැන්පතු පදනම සියයට 2.5 ක් වූ ප්‍රමාණයකින් වැඩිවී තිබුණි.

- ප්‍රාග්ධන අනුකූලතා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සමාගම 2021 වර්ෂයේ දී හිමිකම් නිකුතුවක් සිදුකළ අතර එමඟින් රු. බිලියන 2.15 ක ප්‍රාග්ධන මුදලක් රැස් කර ගන්නා ලදී. ඒ අනුව, සමාගමේ සංචිත ප්‍රාග්ධනය පසුගිය වර්ෂයේ තිබූ රු.බිලියන 2.12 සිට රු. බිලියන 4.27 දක්වා වර්ධනය කර ගැනීමට සමාගමට හැකිවිය.

- 2020 වර්ෂයේ දී සමාගමේ ස්ථර I ප්‍රාග්ධන සහ සමස්ථ ප්‍රාග්ධන අනුපාත පිළිවෙලින් සියයට 4.4 ක් සහ සියයට 5.6 ක් වූ අතර ඒවා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා පහල අගයක් ගන්නා ලදී. ප්‍රවර්තන වර්ෂයේදී හිමිකම් නිකුතුවත් සමඟ සිදු වූ ප්‍රාග්ධන වැඩිවීම හේතුවෙන් ස්ථර I ප්‍රාග්ධන සහ සමස්ථ ප්‍රාග්ධන අනුපාත පිළිවෙලින් සියයට 10.75 සහ සියයට 11.33 දක්වා වැඩි වූ අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ අවම නියාමන අවශ්‍යතාවයන් වූ සියයට 7

සහ සියයට 11 ට වඩා වැඩි අගයක් ගන්නා ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- 2020 වර්ෂය අවසානයේදී සියයට 10.11 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය 2021 වසර අවසානයට සියයට 8.71 දක්වා අඩු වී තිබුණි. කෙසේවුවද, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ආංශික දළ අක්‍රීය ණය අනුපාතය 2021 වසර සඳහා සියයට 6.47 ක් විය. තවද, පෙර වසර අවසානයට සාපේක්ෂව දළ ණය රු. බිලියන 21.9 කින් වැඩි වී තිබුණද, ණය සහ අත්තිකාරම්වල ගුණාත්මක භාවය පිරිහීම හේතුවෙන් අදියර 2 යටතේ වර්ගීකරණය කරන ලද ණය රු. බිලියන 9.8 කින් ඉහළ ගොස් තිබුණි.

- 2021 වසර සඳහා බැංකුවේ වත්කම් මත ප්‍රතිලාභය (ROA) සියයට 0.13 ක් වූ අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය සඳහා සියයට 1.33 කි. බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය සඳහා සියයට 21.54 ක අනුපාතයට සාපේක්ෂව 2021 වර්ෂය සඳහා බැංකුවේ කොටස් මත ඉපයුම් ප්‍රතිලාභය (ROE) සියයට 1.99 ක් ලෙස වාර්තා වී ඇත.

- බැංකුව සහ සේවක සංගමය අතර සේවක වැටුප් සංශෝධන සඳහා සාමූහික ගිවිසුම් අත්සන් කර තිබූ අතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වැටුප් සංශෝධනය තීරණය කිරීමේදී අනෙකුත් රාජ්‍ය බැංකුවල වැටුප් සංශෝධන සලකා බලා ඇත. කෙසේ වෙතත්, වත්කම් පදනම, ලාභ මට්ටම්, සේවක සංඛ්‍යාව සහ ශාඛා සංඛ්‍යාව සමාන නොවන බැවින් එම බැංකුවල වැටුප් සංශෝධන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ සෘජුව සැසඳිය නොහැක. තවද, 2021 වසර සඳහා පුද්ගල වියදම් බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 66 ක් වූ අතර එය අනෙකුත් රාජ්‍ය බැංකු අතර ඉහළම අගය නියෝජනය කරන ලදී. එසේම, 2021 වර්ෂය සඳහා බැංකුව එක් සේවකයෙකුගෙන් උපයා ඇති ලාභය රු.මිලියන 0.12 ක් පමණක් වූ අතර එක් සේවකයෙකු සඳහා රු. මිලියන 2.82 ක පිරිවැයක් දරා ඇති බව නිරීක්ෂණය විය.

- රු.බිලියන 129.02 ශේෂයක් සහිත 423,760 ක ණය සංඛ්‍යාවක් හෝ 2021.12.31 දිනට මුළු ණය ශේෂයෙන් සියයට 77ක් සියයට 15ට වඩා අඩු පොලී අනුපාතයක් දරයි. කෙසේ වෙතත්, පොලී අනුපාත ඉහළ නැංවීමත් සමඟ ස්ථාවර තැන්පතු අනුපාත සියයට 20 ට වඩා වැඩි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොලී ආදායමට සෘණාත්මක බලපෑමක් ඉදිරියේදී වාර්තා විය හැකිය.

- ආදායම් බදු ගෙවීමට බැඳී සිටින එක් එක් සේවකයාගේ කැමැත්ත මත රැකියාවෙන් ලැබෙන ආදායම් සහ ලාභ වලින් සෑම සේවා යෝජකයෙකුම ආදායම් බද්ද අඩු කිරීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, 2016 අප්‍රේල් 29 වැනි දින අංක PED 03/2016 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයට පටහැනිව, බැංකුව විසින් 2021 වසර

සඳහා රු. මිලියන 15.33 ක උපයන විට ගෙවීම්/ APIT බද්දක් අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර තම සේවකයන් වෙනුවෙන් බැංකුව ගෙවා තිබුණි.

ජාතික ආරක්ෂාව

විගණන නිරීක්ෂණ

- ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය
- උපාය මාර්ගික ආරක්ෂක සංනිවේදන ජාල ව්‍යාපෘතිය
- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
- ජාතික ආරක්ෂක අරමුදල
- අපි වෙනුවෙන් අපි අරමුදල
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- රණවිරු සේවා අධිකාරිය
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
- සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම
- මෙට්‍රොපොලිටන් කැම්පස් ඇපයෙන් සීමිත සමාගම

ජාතික ආරක්ෂාව

ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තු 06 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් පිහිටුවා ඇති අතර සෘජුවම රටේ ආරක්ෂාවට සම්බන්ධවන දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- අභ්‍යන්තර කැරලි, ත්‍රස්තවාදී ක්‍රියා මැඩපැවැත්වීම හා බාහිර බලපෑම් වලින් ආරක්ෂා කිරීම
- මුහුදු සීමා උල්ලංඝනය කරමින් සිදුකරන නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වලක්වාලීම
- මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරිම සඳහා මත්ද්‍රව්‍ය මෙරටට ඇතුළුවීම වැලැක්වීම, මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම, මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවීම වැලැක්වීම හා මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවූවන් පුනරුත්ථාපනය සඳහා අදාළ ජනාධිපති කාර්යසාධන බලකාය සමඟ ඒකාබද්ධව කටයුතු කිරිම.
- ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුභසාධනය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.
- බහුකාර්යය සංවර්ධන කටයුතු සඳහා දිළිඳු පවුල් වල රැකියා හා ජීවනෝපාය දායකත්වය වැඩිවන අයුරින් දිළිඳු බව තුරන් කිරීමේ කාර්යයයන් සඳහා මෙන්ම අනෙකුත් සංවර්ධන ක්ෂේත්‍ර සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය වෙත යොමුකිරීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 06 ක් වෙත එකතුව රු.මිලියන 348,065 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 316,727 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 21 හි දැක්වේ.



	ආරක්ෂක අමාත්‍යාංශය	ශ්‍රී ලංකා යුධ හමුදාව	ශ්‍රී ලංකා නාවිකහමුදාව	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන	24,870	183,437	63,078	57,140	19,183	357	348,065
වියදම රු. මිලියන	20,693	178,986	57,264	41,737	17735	312	316,727
ඉතිරිය රු. මිලියන	4,177	4,451	5,814	15,403	1448	45	31,338

රූපසටහන 21 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම
මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය

- ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ 02 සිට 07 දක්වා වන ප්‍රමුඛතා අදියරයන්ට අදාළ කොන්ත්‍රාත් කාර්යන් 275 ක් රු.මිලියන 13,349 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගැනීමට සැලැසුම්කර තිබුණු නමුත් 2021දෙසැම්බර් 31 දිනට එම කාර්යයන්ගෙන් කාර්යන් 85 ක කිසිදු භෞතික ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණු අතර කාර්යයන් 58 ක ප්‍රගතිය සියයට 1 ත් 30 ත් අතර පහල අගයක පැවතුණි.

- සමාලෝචිත වර්ෂයේදී හා පූර්ව වර්ෂයකදී සිදුව තිබුණු ගිනි ගැනීම් හේතුවෙන් ත්‍රිවිධ හමුදා මූලස්ථාන ව්‍යාපෘතියට අයත් රු.මිලියන 14.27 ක් වටිනා වත්කම් අලාභහානියට පත්ව තිබුණු අතර ඒ සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීම හෝ පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවෙමින් පැවතුණි.

- ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදයන්, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදයන් ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුළ කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට සිදුව

තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් රු.මිලියන 1,126.14 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 1.61 ක් වූ කාලය දීර්ඝ කිරිමේ හිමිකම් පෑම් (Claims for EOT) 24 ක් ඉල්ලුම් කර තිබුණි.

උපාය මාර්ගික ආරක්ෂක සංනිවේදන ජාල ව්‍යාපෘතිය

මූලික සැලසුම් අනුව උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ඉදිකිරීම් අවසන් කිරීමට යෝජිතව පැවතියද ව්‍යාපෘති කාලසීමාව වර්ෂ 06 කින් දීර්ඝකර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පැවති සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 73 ක් සහ සියයට 53 ක් විය.

මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර ඇතත් 2021 දෙසැම්බර් 31 වනවිටත් ප්‍රසම්පාදන අභියාචනා කමිටු අදියරේ පැවතුණි. ඒ හේතුවෙන් 2016 සහ 2017 වර්ෂවලදී මිලදීගෙන තිබුණු රු.මිලියන 38.54 ක විදුලි ජනක යන්ත්‍ර 22 ක් හා 2020 වර්ෂයේදී වැඩ නිමකර තිබුණු පිරිවැය රු. මිලියන 562.16 ක සන්නිවේදන කුළුණු 11හා අනෙකුත් ඉදිකිරීම් සමගාමී කාර්යයන් ප්‍රමාදවීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. ඒ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත සන්නද්ධ සේවාවන් අතර ඒකාබද්ධ උපාය මාර්ගික සංනිවේදනය පවත්වාගැනීමේ මූලික අරමුණ කාලීනව ඉටුකර ගැනීම තවදුරටත් ප්‍රමාදවෙමින් පැවතුණි.

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ශිෂ්‍යභට නිලධාරීන්, නිලධාරීන්, රාජ්‍ය සේවකයන් සහ පළමු උපාධිය සඳහා සුදානම් වන වෙනත් ඕනෑම පුද්ගලයකු හට අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සහ උපදෙස් ලබාදීම , නිලධාරීන් හා ශිෂ්‍යභටයින් අතර සහෝදරත්වය සහ හොඳ හිත වර්ධනය කිරීම, පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ අනෙකුත් සුදුසුකම් ලබා ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලා ලබා දීම සහ විශ්ව විද්‍යාලය තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන ඇතුළු අනෙකුත් කාර්යයන් ඉටු කිරීම ආදී අරමුණු ඉටුකරගැනීම සඳහා 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත මගින් පිහිටුවා ඇත.

- විශ්ව විද්‍යාලය විසින් පාඨමාලා ගාස්තු කාලීනව අයකර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 කට වඩා කාලයක් හිඟහිට පැවති රු.මිලියන 45.97 ක පාඨමාලා ගාස්තුද, විදේශීය සිසුන් හට ආහාර සහ නේවාසිකාගාර පහසුකම් සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 10.82 ක් හා එක්සත් ජනපද ඩොලර් 118,107 ක්ද වර්ෂ 1- 04 අතර කාලයක් හිඟහිට පැවතුණි.

- ඇප බැඳුම්කර කොන්දේසිවලට එකඟව තිබුණු විශ්වවිද්‍යාල සිසුන්, කථිකාචාර්ය වරුන් සහ අනෙකුත් කාර්යමණ්ඩල සාමාජිකයන් 76 ක් විසින් එකී ඇප බැඳුම්කර කොන්දේසි කඩකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 75.03 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. මෙම ඇප බැඳුම්කර කොන්දේසි කඩකිරීම් පිලිබඳව නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණු නමුත් ඒ මත ඇතිකරගත් එකඟතාවයන් පරිදි අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකරගැනීම සඳහා සතුටුදායක ක්‍රමවේදයක් හෝ පසුවිපරම් ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණු අතර 2020 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඇප බැඳුම්කර කඩකිරීම් සංඛ්‍යාව සිව් ගුණයකින් වර්ධනයවී තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසන්වන විට විශ්ව විද්‍යාලයට අයත් දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කර වර්ෂ 07 ක කාලයක් ගතවී ඇතත් මණ්ඩපය විසින් පරිහරණය කරනු ලබන හෙක්ටයාර 7.6883 ක් වූ බිම් කොටස පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

- තවද රු.මිලියන 32,318 ක පිරිවැයක් දරා විශ්ව විද්‍යාලයීය ශික්ෂණ රෝහලේ ගොඩනැගිලි ඉදිකර තිබූ හෙක්ටයාර් 21.5815 ක ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විශ්ව විද්‍යාලය වෙත පැවරී නොතිබුණි. සමාලෝචිත වර්ෂය වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 05 කට අධික කාලයක් ගතවී ඇතත් අදාළ ඉඩම අත්පත් කර ගැනීමේ ඉදිරි කාර්යයන් අවසන් කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන වලින් මෙම ඉඩමේ වටිනාකම නිරූපණය කර නොතිබුණි.

- ශික්ෂණ රෝහලේ විකිරණ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ වෛද්‍ය නිලධාරී හා විකිරණ ශිල්පී තනතුරු ඇතුළු තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් පියයුරු පිළිකා හඳුනා ගැනීමේ ඒකකය (Breast Health Center) සහ න්‍යෂ්ඨික විකිරණ වෛද්‍ය ප්‍රතිකාර ඒකකය (Nuclear Medicine) යන අංශ ප්‍රතිකාර සේවා සඳහා ආරම්භ කර නොතිබීමෙන් ඒ සඳහා වෙන්කර ඇති පරිශ්‍රයන්ද, මිලදීගෙන තිබුණු ගෘහ භාණ්ඩ හා වෛද්‍ය උපකරණද ඵලදායී ලෙස උපයෝජනයට ගැනීමට නොහැකිව තිබුණි.

ජාතික ආරක්ෂක අරමුදල

- ජාතික ආරක්ෂක අරමුදල විසින් 2021 වර්ෂය තුළ රණවිරු පවුල් 150 ක් සඳහා නිවාස ඉදිකරගැනීම අධාර මුදල් ලෙස රු.මිලියන 105.98 ක් වාරික තුනක් යටතේ ගෙවා අවසන් කිරීමට සැළසුම් කළද 2021 වර්ෂය තුළ කිසිදු වාරික මුදලක් ගෙවීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

- මියගිය හා අබාධිත රණවිරුවන්ගේ 2019 වර්ෂයේ පහවසර ශිෂ්‍යත්ව විභාගය සමත්

දරුවන් 137 ක් සඳහා රු.25,000 බැගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මාස 15 ආසන්න කාලයක් ප්‍රමාදවී තිබුණි. තවද 2020 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් 130 කට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කටයුතු 2021 වර්ෂයේ ජුනි 30 දින වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද 2022 අප්‍රේල් 25 දින වන විටත් ශිෂ්‍යාධාර ලබාදීමට නොහැකිව තිබුණි.

- අරමුදලට අයත් ස්ථාවර තැන්පතු දෙකක් කල්පිරී දින 37 සිට දින 45 ක් දක්වා කාලයක් ප්‍රමාදවී ප්‍රති ආයෝජනය කිරීම හේතුවෙන් රු.මිලියන 3.49 ක ඇස්තමේන්තුගත අවම පොලී අදායමක් අහිමි වී තිබුණි.

අපි වෙනුවෙන් අපි අරමුදල

සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස තැනීම සඳහා හෝ නිවාස මිලදී ගැනීම සඳහා ණය ලබාදීම, මූල්‍ය ආයතන වලින් ගනු ලබන ණය ගෙවීම සඳහා ආධාර ලබාදීම සහ සාමාජිකයකු මියයන හෝ පූර්ණ ආබාධිත වන විට ණය ආපසු ගෙවීම සහතික කරලීම යන කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 2008 අංක 6 දරන පනත මගින් අපි වෙනුවෙන් අපි අරමුදල පිහිටුවා ඇත.

- අරමුදල විසින් අර්ධ නිවාස ආධාර ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී නිවාස 299 ක් සඳහා රු. මිලියන 209.74 ක ආධාර මුදලක් වාරික 03 ක් යටතේ ගෙවීමට සැලසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී නිවාස 02 ක් සඳහා පළමුවන වාරිකය ලෙස රු.448,833 ක් පමණක් ගෙවා තිබුණු අතර කිසිදු නිවසක් සඳහා දෙවන හා තුන්වන වාරිකය ගෙවා නොතිබුණි. එබැවින් වාර්ෂික සැළසුම් අනුව අපේක්ෂිත මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය ඉතා අවම මට්ටමක පැවතුණි.

- පූර්ණ නිවාස වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී නිවාස 27 ක් සඳහා වාරික 3කදී රු.මිලියන 43.07 ක ආධාර ලබා දීමට සැලසුම් කලද වර්ෂය තුළ එක් නිවසක් සඳහා වාරික 03 ක්ද , නිවාස 02 ක් සඳහා වාරික 02 ක්ද, එක් නිවසක් සඳහා එක් වාරිකයක්ද බැගින් රු.මිලියන 3.99 ක් පමණක් ගෙවා තිබුණි. එය වර්ෂය තුළ ගෙවීමට සැලසුම්කල මුදලේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 9 ක් වැනි ඉතාම අඩු මට්ටමක් විය.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

- 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 37 කදී විදේශීය අළුත්වැඩියාවන් සඳහා යොමුකර ඇති ගුවන් යානා අමතර කොටස් 72 ක් වර්ෂ 7ත් වර්ෂ 17 ත් අතර කාලයක සිට ගුවන් හමුදාවට නැවත ලැබී නොතිබුණි. මෙම ගුවන් යානා අමතර කොටස් වල වාණිජ වටිනාකම් සැලකීමේදී ගුවන් යානා අමතර කොටස් 55 ක අළුත්වැඩියා වටිනාකම ඇ.එ.ජ. ඩොලර් 130,525.28 ක් ද ගුවන් යානා අමතර කොටස් 05 ක අළුතින් මිලදී ගැනීම් වටිනාකම් ඇ.එ.ජ.ඩොලර් 536,000 ක් ද ගුවන් යානා අමතර කොටස්

05 ක සුන්බුන් වටිනාකම ඇ.එ.ජ. ඩොලර් 17,997 ක් ලෙස එකතුව රු.මිලියන 138.27 ක් ලෙස අධික වටිනාකමක්ව පැවතුණි.

- මුදල් රෙගුලාසි 128 (1) (ආ) ප්‍රකාරව රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා සම්පූර්ණයෙන් අයකර ගැනීමට ගණන්දීමේ නිලධාරිගේ වගකීමක් වේ. කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ සහ කොළඹ ගුවන් හමුදා කඳවුරේ පවත්නා රජයේ ගොඩනැගිලි 15 ක් බාහිර පාර්ශවයන්ට ලබාදීමේ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද මාසික කුලිය අය කිරීමේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලන අධ්‍යක්ෂකගේ උපදෙස් ප්‍රකාරව ඊට අදාළ ගිවිසුම් ගත වටිනාකමින් කොටසක් රජයේ ආදායම ලෙසත් ඉතිරි කොටස රාජ්‍ය නොවන අරමුදල් (Non Public Fund) ලෙස වෙනත් අරමුදලකට බැර කිරීම හේතුවෙන් 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ එකතුව රු.මිලියන 11.6 වූ ආදායමක් රජයට අහිමි වී තිබුණි.

- ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.2 ඡේදය පරිදි උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් නැති විවාහක නිලධාරීන්ගේ වැටුපෙන් සියයට12 ½ ක් අයකරගත යුතු වුවත් කොළඹ ගුවන් හමුදා කඳවුර සහ කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරට අදාළ නිලධාරි නිවාස කුලී අයවීමේදී එම නියමයන්ගෙන් බැහැරව උපලේඛනගත නිවාස හිමිකමක් නැති නිළධාරීන්ගෙන් ආර්ථික කුලිය සියයට 10 අයකිරීම හේතුවෙන් ගුවන් හමුදා කොළඹ කඳවුරේ නිලධාරි නිවාස 221 ක් වෙනුවෙන් 2021 වර්ෂය තුළ රු.මිලියන 3.63 ක් ද කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ නිවාස 302 ක් වෙනුවෙන් 2021 වර්ෂය තුළ රු.මිලියන 12.64 ක්ද නිවාස කුලිය ලෙස රජයට අහිමි වී තිබුණි.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2) ඉ පරිදි ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 කින් හා පෞද්ගලික ආයතන 02 කින් අයවියයුතු එකතුව රු.මිලියන 12.67 ක ගුවන් යානා කුලී ආදායම් වර්ෂ 3 සිට වර්ෂ 18 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව හිඟ හිටව පැවතුණි.

රණවිරු සේවා අධිකාරිය

සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන් ක්‍රියාන්විතයේදී මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ගේ ශුභසාධනය ප්‍රවර්ධනය කිරීම අධිකාරියේ මූලික අරමුණු විය.

- ආබාධිත රණවිරුවන්ට ශ්‍රවණාධාර උපකරණ මිලට ගැනීමේදී රු.මිලියන 2.51 ක් වටිනා Cochlear Implant replacement නැමැති උපකරණය සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව එක් ආයතනයක් වෙතින් ලබාගත් ලංසුවක් පමණක් සලකා බලා තිබුණි. මෙකී ශ්‍රවණාධාර උපකරණ මිලදී ගැනීම තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත්කර ඇගයීම් වාර්තා ලබාගෙන තිබුණු නමුත් එම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට ඇතුළත් කර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීම විනිවිදභාවයකින් සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

සන්නද්ධ හමුදාවල නිලධාරීන් අයත්වන අදාළ සේවාවල උචිත පත්වීම් සහ උසස්වීම් සඳහා ඔවුන් සූදානම් කිරීමට හා දැනුම ලබාදීමට මාණ්ඩලික විද්‍යාලයේ දී පුහුණු කිරීම සඳහා තෝරාගනු ලැබූ එම නිලධරයන්ගේ වෘත්තීය දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීම ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අරමුණ වේ.

- විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු සඳහා රු.මිලියන 133 ක් වැයකර ඉදිකරන ලද සිව් මහල් පුස්තකාල සහ විභාග ශාලා ගොඩනැගිල්ලේ ජල කාන්දු වීමේ ගැටළුව නිසා ඉහළ මහලේ විදුලි පද්ධතියට හා බිත්ති වලට විශාල හානියක් සිදු වී තිබුණු අතර ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීමට 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නොහැකි වී තිබුණි. මෙම තත්ත්වය විද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කටයුතු සඳහා 2021 වර්ෂයේ වැයකර තිබුණු සමස්ථ පුනරාවර්ථන වියදම රු.බිලියන 173 ක් වූ අතර එයින් රු.බිලියන 80 ක් වැටුප් ගෙවීම සඳහා වැයකර තිබුණි. මෙම පුනරාවර්තන වැය දැරීම් වලින් අනාවරණය වූ ප්‍රමාණාත්මක කරුණු කිහිපයක් පහත දැක්වේ.

- පසුගිය වර්ෂවල අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන මිලදීගත් රු.මිලියන 3.37 ක් වටිනා උපකරණ, ලිපිද්‍රව්‍ය, විදුලි උපකරණ, කවර් අවුටර්ස් හා බැටරි දීර්ඝ කාලයක් නිෂ්කාර්යව රඳවා තබාගැනීම නිසා කල් ඉකුත් වීම හෝ පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීම නිසා භාණ්ඩ වර්ග 27 කට අයත් භාණ්ඩ අයිතම 353 ක් අපහරණය කිරීමට යෝජනා කර තිබුණි.
- යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන ධාවන තත්ත්වයේ පවතින වාහන 2,464 කට අදාළව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර, ප්‍රවාහන අංශය විසින් තීරණය කරනු ලබන ඉන්ධන දහනය වීම් ප්‍රමාණයන් අනුව ධාවන සටහන්/ප්‍රවාහන ගමන් බලපත්‍රවල ඉන්ධන තුළනය කිරීම් සිදුකර තිබුණි.

- වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු. බිලියන 36.59 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි.

- සාම සාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට නියමිත 685 ක භට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුළදී මිලදී ගෙන තිබුණු අතර, මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් වටිනාකම් අනාවරණය කෙරුණු රු. බිලියන 1.38 ක ප්‍රවාහන හා උපකරණද, වටිනාකම් අනාවරණය නොකෙරුණු තවත් වාහන හා උපකරණ තොගද, නිශ්කාර්යව දිවයිනේ විවිධ ප්‍රදේශවල ගබඩාකර තිබුණි.

- ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ආයුධ ඇතුළු යුද්ධ හමුදාවේ විවිධ වත්කම්වලට සිදුවූ රු.බිලියන 13.78 ක අලාභ හානි 125 ක් හා රිය අනතුරු 497 කට අදාළව සිදුවූ රු. මිලියන 282.05 ක අලාභ ලෙස එකතුව රු. බිලියන 14.06 ක වර්ෂ අවසාන ශේෂයක් පැවති අතර, මෙම අලාභ හානිවලට වසර 10 කට වැඩි සිද්ධි 119 කට අදාළව රු.මිලියන 840.7 ක අලාභයන්ද, වසර 05 ට වැඩි සිද්ධි 263 කට අදාළව රු. බිලියන 12.99 ක අලාභයන්ද පැවතුණි. මෙම ශේෂ අයකර ගැනීම හෝ කපා හැරීම මන්දගාමී ස්වභාවයක පැවතුණි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

- රට තුළ උද්ගත වන අරක්ෂක තත්ත්වයන්ට අනුව අවශ්‍යතාවයට උචිත පරිදි සන්නද්ධ සේවා වලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම, ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම, රටතුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා සන්නද්ධ හමුදාවලට හා පොලීසියට සහයවීම, ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවලදී ඊට අදාළ ආරක්ෂාව සැපයීමේ කටයුතුවල යෙදීම හා රටතුළ ඇතිවන විවිධ ආපදා (ගංවතුර, නායයෑම්, සුනාමි) වැනි අවස්ථාවලදී ඒවා සමනය කිරීමේ කාර්යයන් වලට සහය වීම යන කාර්යයන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වුවද සිවිල් යුධ තත්ත්වයෙන් පසුව සිවිල් ආරක්ෂක භටයින් දිවයිනේ සෑම ප්‍රදේශයකම සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුයුක්ත කර කෘෂිකාර්මික, ආරක්ෂක, කාර්මික, සත්ව පාලනය, අත්කම් නිෂ්පාදන ව්‍යාපෘති, මධ්‍යම හා කුඩා පරිමාණ ඉදිකිරීම්, ඩෙංගු

මර්ධනය, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, ජාතික අධ්‍යාපන සංස්කෘතික වැඩසටහන් සංවර්ධනය යනාදී වැඩසටහන් වලටද යොදවා තිබුණි. එසේ වුවත් මේ සම්බන්ධයෙන් වූ විධිමත් මිනිස්බල සංවර්ධන සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් සකස්කර නොතිබුණි.

- රු.මිලියන 17.67 ක් වැයකර හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනයේදී ලංසු විවෘත කිරීම්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් ලබාදීම්, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම් හා භාණ්ඩ ඇණවුම් කිරීම් වැනි ප්‍රසම්පාදන කටයුතුවලට පෙර ගබඩාවට භාණ්ඩ ලැබී තිබුණු අතර, ඉතා ඉක්මණින් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීමට කටයුතු කිරීම නිසා රු. මිලියන 3. 23 ක මුදලක් වැඩිපුර වැයකර මිලදී ගත් භාණ්ඩ හා උපකරණ නිශ්කාර්යව වර්ෂයකට අධික කාලයක් ගබඩාකර තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය මෙතෙක් ක්‍රියාත්මක කරද නොතිබුණි.

- සිවිල් ආරක්ෂක භටයින් 3,300 ක් විදුලි වැට (අලිවැට) නඩත්තු කිරීම සඳහා ද, භටයින් 845 ක් වනඅලි පලවාහැරීම සඳහා ද, භටයින් 389 ක් වනජීවී කාර්යාල කටයුතු සඳහාද ලෙස භටයින් 4,534 ක් අනුයුක්ත කර තිබුණි. ශ්‍රී ලංකාවේ මේ වන විට ඉදිකර ඇති මුළු අලිවැට ප්‍රමාණය කි.මී.4,756 ක් වන අතර, මෙයින් කි.මී. 4,725 ක් හෙවත් සියයට 99 ක් ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නඩත්තු කටයුතු සඳහා භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු දෙක සම්බන්ධීකරණයවන ආකාරය හෝ අන්‍යෝන්‍ය සේවාවන් සපයන ආකාරය පිළිබඳවත් මුදල් වෙන්කරන ආකාරය පිළිබඳවත් පොදු එකඟතාවයක් ඇති කරගෙන නොතිබුණි. වනඅලින් පලවාහැරීම සඳහා වාර්ෂිකව රු. මිලියන 427 කට අධික වැටුප් හා දීමනා පිරිවැයක් දරා සිවිල් ආරක්ෂක භටයින් 845 දෙනෙකු යොදවා ගෙන තිබුණු අතර, මෙම භටයින්ට ඒ සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබාදී නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ අලි වැටවල් ඉදිකිරීම සඳහා දරා ඇති මුළු ප්‍රාග්ධන වියදම රු. බිලියන 1.64 ක් වන අතර, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අලිවැටවල් නඩත්තු කිරීම සඳහා නිලධාරීන්ගේ වැටුප් ඇතුළුව දරා ඇති මුළු වියදම රු. බිලියන 1.16 ක් වී තිබුණි. අදාළ කාලපරාසය තුළ අලිමිනිස් ගැටුම හේතුවෙන් මිනිසුන් 989 දෙනෙකුද, අලි ඇතුන් 3,646 දෙනෙකුද මියගොස් ඇති අතර, පෙර වර්ෂවලට සාපේක්ෂව ආසන්න වර්ෂවල සිදුවූ ජීවිතහානි වැඩි වී තිබුණත්, යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින්ට මෙම තත්ත්වය පාලනය කරගැනීමට නොහැකි වී තිබුණි.

ලංකා නාවික හමුදාව

ජාතික ආරක්ෂාව සහ ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සමුද්‍රික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නාවික

මෙහෙයුම් සිදුකිරීම මෙහෙවර කොටගත් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි නාවික විධාන 07 කට බෙදා වෙන්කර පරිපාලනය සිදුකරනු ලබන අතර 2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව හා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පිළිවෙලින් රු.මිලියන 63,078 ක් හා රු.මිලියන 357 වශයෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 57,264 ක් හා රු.මිලියන 312 ක් වශයෙන් පිළිවෙලින් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 5,814 ක් හා රු.මිලියන 45 ක් එනම් සියයට 9 ක් හා සියයට 12 වශයෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පරිහරණය කරනු ලබන වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු ඉඩම්වල ප්‍රමාණය හෙක්ටයාර් 435.4223 ක්වූ අතර එම ඉඩම් පරිහරණය කිරීම සඳහා විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි. සමහර ඉඩම් පරිහරණය කර තිබූ කාලය වසර 08, 14 හා 22 ද ඉක්මවා තිබුණි.

- 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නීතිවිරෝධි පුපුරණ ද්‍රව්‍ය ළඟතබා ගැනීම පිළිබඳ සොයාගැනීමේදී අත්අඩංගුවට ගන්නාලද වෝටර් ජෙල් කි. ග්‍රෑම් 41.012 ක් හා ප්ලේන් ඩෙටනේටර් ඒකක 542 ක් ශ්‍රී ලංකා පොලිසිය වෙත භාරදීම සම්බන්ධයෙන්වූ පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

- වසර 05 කට පෙර වෙඩි බෙහෙත් ගබඩාව තුළ සිදුවූ රු.මිලියන 8.3 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධයෙන් ආරම්භ කරනලද විමර්ශන කටයුතු මේ දක්වාම අවසන් වී නොතිබුණි.

- උතුරු නාවික විධානය විසින් රු.මිලියන 8.1 ක් දරා ඇති ඌරණි ධීවර වරායේ දියකඩනය ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි.

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

- දෙපාර්තමේන්තුවේ රෝහණ ආයතනය තුළ උසස් පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 30.09 ක මුදලක් වැයකළ පසුව 2017 ජූලි 22 වන දින සිට අතහැර දමා තිබුණු ව්‍යාපෘතියේ වැඩකටයුතු 2021 වර්ෂයේදී නැවත ආරම්භ කර තිබුණි. 2022 අප්‍රේල් වන විට මෙම ව්‍යාපෘතිය සඳහා දරා තිබූ මුළු වියදම රු. මිලියන 104.8 ක් වී තිබුණි. දෙපාර්තමේන්තුව සඳහා ඉතාමත්ම අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් වන මෙම පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ල කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගතයුතුව තිබුණි.

- ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති වටිනාකම රු.මිලියන 163.2 ක්වූ නෞකා/යාත්‍රා 10 ක් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කිරීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම

ගොඩබිම ආරක්ෂක සේවා, සමුද්‍ර ආරක්ෂක සේවා හා ආපනශාලා පවත්වාගෙන යාම මෙන්ම සමුද්‍ර ආරක්ෂක මෙහෙයුම් කටයුතු සිදු කිරීම රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රධාන කාර්යයන් වේ. මෙකී කාර්යන් ඉටුකිරීමට අදාළව නිරීක්ෂණ වු ඇතැතම් අඩුපාඩු පහත දැක්වේ.

- සමාගමේ අවසන් වරට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 මාර්තු 31 දිනට පැවති රු. මිලියන 2,299 ක්වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයෙන් රු. මිලියන 1,651ක් සමුද්‍රීය ආරක්ෂණ සේවා සැපයීමෙන් ලැබිය යුතු ණය ශේෂය විය. ඉන් රු. මිලියන 1,525 ක් එනම් මුළු ණය සියයට 92.4 ක් ඇවන්ගාඩ් ආයතනයෙන් ලැබිය යුතු ණය ශේෂය විය. රුංගල හා ගාල්ල පාවෙන අවි ගබඩා තුළින් ලැබිය යුතු පිළිවෙලින් රු.මිලියන 84 ක් හා රු.මිලියන 378 ක්වූ ශේෂ වර්ෂ 07 කට අධික කාලයක සිට අයනොවී තිබූ අතර එම ණය අයකරගැනීමටද කටයුතු කර නොතිබුණි.

- රක්නා ලංකා ආරක්ෂක සමාගමේ ප්‍රධානතම ආදායම් මාර්ගය දේශීය හා සමුද්‍රීය ආරක්ෂක සේවා සැපයීම මත තීරණය වුවද එම ආදායම් නිසි පරිදි ඉන්වොයිස් කර අදාල ආයතන වෙත යවා, එම ආයතන සමඟ ඇතිවන වෙනස්කම් හඳුනාගෙන එය විධිමත්ව කළමනාකරණයට හා පාලනයට සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපිත කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

- ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 739 ක් වැයකළ පසුව ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණු ගොඩනැගිල්ල පිහිටි පර්චස් 86.4 ක් පමණවූ ඉඩමෙහි වටිනාකම තක්සේරු කර අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

මෙට්‍රොපොලිටන් කැම්පස් ඇපයෙන් සීමිත සමාගම

ඇකඩමි ඔෆ් ෆයිනැන්ෂියල් ස්ටඩීස් (ගරන්ටි) ලිමිටඩ් (මිලෝදා ආයතනය) 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 හා 2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/ 25 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පීඨයක් ලෙස පවත්වන බවට නිවේදනය කර තිබුණු අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව GL2244 යටතේ ඇකඩමි ඔෆ් ෆයිනැන්ෂියල් ස්ටඩීස් (ගරන්ට්) ලිමිටඩ් නාමය මෙට්‍රොපොලිටන් කැම්පස් (ගරන්ටි) ලිමිටඩ් වශයෙන් සංස්ථාගත කර තිබුණි. මූල්‍ය කලමනාකරණය, තොරතුරු සන්නිවේදනය හා ඩිජිටල් කලමනාකරණය, නීතිය හා

නායකත්වය යන අංශයන් යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරින් පුහුණු කිරිම සඳහා පාඨමාලා පැවත්වීම සමාගමේ ප්‍රධාන කාර්යයන් වේ.

බන්ධනාගාර කළමනාකරණය හා සිරකරුවන් පුනරුත්ථාපනය

විගණන නිරීක්ෂණ

- ආදායම් කලමනාකරණය
- තැන්පතු හා ලැබිය යුතු ශේෂ
- පාඩු හා හානි
- වාහන පාලනය
- බැරකම් හා බැදීම්
- පනත් කෙටුම්පත්
- කාර්යයන් ඉටු නොකිරීම
- ප්‍රසම්පාදනයන්
- අභ්‍යන්තර විගණනය

බන්ධනාගාර කළමනාකරණය හා සිරකරුවන් පුනරුත්ථාපනය

පුනරුත්ථාපනය තුළින් නීතිගරුක සමාජයක් උදෙසා මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කරමින්, රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන ප්‍රතිසංස්කරණය කරමින් මනා අධීක්ෂණය හා සම්බන්ධීකරණය තුළින් රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීම සඳහා පහත කාර්යයන් ඉටුකල යුතුව තිබුණි.

- ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර තුළ සිදුවන සමාජ විරෝධී ක්‍රියා තුරන් කිරීම සඳහා පියවර ගැනීම.
- ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- බන්ධනාගාර තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.
- සිරකරුවන්ගේ තදබදය අවම කිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.
- සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා පුළුල් ක්‍රමවේදයක් සකස් කිරීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශයට, බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හා ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවට එකතුව රු.මිලියන 10,535 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 8,244ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 22 හි දැක්වේ.



	රාජ්‍ය අමාත්‍යාංශය	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදන රු.මිලියන	1,538	8,591	406	10,535
වියදම රු.මිලියන	821	7,051	372	8,244
ඉතිරිය රු.මිලියන	717	1,540	34	2,291

රූපසටහන 22 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීමේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආදායම් කළමනාකරණය

- බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලබන ආපනශාලාවල කුලී ආදායම් හඳුනාගෙන එම ආදායම් මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව බදු කුලී ආදායම් ලෙස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

- බෝගම්බර බන්ධනාගාර ආපනශාලාව 2021 වර්ෂයේ මුල් මාස 8 තුළ සිර හා සැකකරුවන් වෙත භාණ්ඩ අලෙවියෙන් පමණක් රු. මිලියන 10 කට වඩා වැඩි මුදලක් උපයාගෙන තිබුණි. නමුත් මෙම කාලපරිච්ඡේදය තුළ ආපනශාලා වෙත අනුයුක්ත කර තිබූ නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 1.42 ක් සහ ජලය, විදුලිය වෙනුවෙන් වියදම් දරා තිබුණද, මෙම කිසිදු වියදමක් අපනශාලාව ලබන ආදායමෙන් අඩුකර රජයට ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 2021 අගෝස්තු සිට දෙසැම්බර් මස දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආපනශාලා වෙත නිලධාරී 63 දෙනෙකු යොදවා තිබූ අතර එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 16.49 ක මුදලක් ඒකාබද්ධ අරමුදලින් වැය කර තිබුණි. මීට අමතරව ආපනශාලාවල සේවය සඳහා රැඳවියන් 103 දෙනෙකුද, අනුයුක්ත කර තිබුණි.

තැන්පතු හා ලැබිය යුතු ශේෂ

- සමාලෝචිත වර්ෂයේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති ණයගැති රු.මිලියන 49.56 ක ශේෂයෙන් රු.මිලියන 26.37ක ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණු අතර පොදු තැන්පත් ගිණුම් 05ක වර්ෂ 02ක් ඉක්ම වූ රු.මිලියන 84.69 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

- බන්ධනාගාරය විසින් රාජ්‍ය අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු. මිලියන 50ක ශේෂයෙන් වර්ෂ 20කට වඩා පැරණි රු.මිලියන 1. 64 හා වර්ෂ 5 ක සිට වර්ෂ 20 ක් අතර පරාසයක ලැබිය යුතු ශේෂය රු.මිලියන 24.7 ක් විය.

පාඩු හා හානි

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වර්ෂ 10කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 100ක් ඇතුළු සිද්ධීන් 103කට අදාළ අලාභය රු.මිලියන 9.33ක්ද, වර්ෂ 05ක සිට වර්ෂ 10 ක් අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 52ක් ඇතුළු සිද්ධීන් 54කට අදාළ අලාභය රු.මිලියන 38 ක් ද, 2021 වර්ෂයේ වූ වාහන අනතුරු 22ක් ඇතුළුව වර්ෂ 05කට වඩා අඩු කාලයක සිට පැවත එන වාහන අනතුරු 94ක් ඇතුළුව සිද්ධීන් 118කට සම්බන්ධ අලාභය රු.මිලියන 12.13 ක්ද, සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය

ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසානය දක්වා සිදුවූ අලාභ 26ක අලාභය තක්සේරු කර නොතිබුණි.

වාහන පාලනය

වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් අතර කාල පරාසය තුළ භාවිතයෙන් ඉවත් කළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාහන 72ක් හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ වාහන 3 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදු කර නොතිබුණි. තවද, බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත විවිධ ආයතන වෙතින් පවරාගෙන තිබුනු වාහන 56ක් ලියාපදිංචි කර නොතිබුණි.

බැරකම් හා බැඳීම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් වැය විෂයයන් 02 කට අදාළව රු.මිලියන 4.57 ක වටිනාකමින් යුත් බැරකම් අඩුවෙන් දක්වා තිබුණු අතර ගොඩනැඟිලි ඉදිකිරීම් වෙනුවෙන් බාහිර පාර්ශවයන් වෙත ඇති බැඳීම් වටිනාකම වූ රු.මිලියන 346.21ක් 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

පනත් කෙටුම්පත්

2017නොවැම්බර් 22 දිනැති අංක අමප/17/2509/745/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට පනත් කෙටුම්පත සකස්කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණු අතර, කාර්යාංශයට 2021 අප්‍රේල් 28 දිනැති අංක අමප/21/0564/330/029 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියද, 2021 වර්ෂය අවසානය තෙක් නැවත ඉදිරිපත් කිරීමේ කටයුතු නිමකර නොතිබුණි.

කාර්යයන් ඉටු නොකිරීම

කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සිරකරුවන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යක් වුවද, ඊට අනුගත නොවී සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගෙන පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. මෙම පුහුණු ව්‍යාපෘතිය යටතේ 2020 ජූනි 15 සිට 2022 මැයි 09 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අදාළ සමාගම විසින් සිරකරු මිනිස් දින 50103 ක් විවිධ වැඩබිම් වල සේවයේ යොදවා තිබුණි. මේ සඳහා දිනකට රු. 400ක් සිරකරුවෙකුට වේතන වශයෙන් ගෙවන අතර ඊට අමතරව සිරකරු සුභසාධන අරමුදලට හා රජයේ ආදායමට රු.50 බැගින් බැර කරනු ලබයි. මෙම සිරකරුවන් වැඩබිම් වල සේවයේ යෙදීමට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 3 ක මූලික පුහුණුවක් ලබාදිය යුතු වුවද, සිරකරුවන් 104ක් සඳහා මූලික පුහුණුවක් ලබාදී නොතිබුණි. තවද, පුහුණුව අවසන් කරන සිරකරුවන්ට ජාතික වෘත්තීය මට්ටමේ පුහුණු සහතිකයක් (NVQ) ලබාදීමට කටයුතු කලයුතු වුවත්, පුහුණුව නිම කළ සිරකරුවන්

236ක් සඳහා නිපුණතා සහතික ලබාදී නොතිබුණි.

සිරකරුවන් පිළිගැනීම හා බන්ධනාගාර නීති රීතිවලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය හා නඩත්තුව සැලසීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරින් එකක් වුවද, පහත හේතූන් නිසා ඊට අනුගත වී නොතිබුණි.

- බෝගම්බර (දුම්බර), මහර බන්ධනාගාරවල හා පල්ලෙකැලේ එලිමහන් සිර කඳවුරුවල වාට්ටුවල හා සිරමැදිරිවල ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිව රැඳවියන් 1667 ක් වැඩියෙන් රඳවා තිබීම.

- සිරකරුවන් හා සැකකරුවන් වර්ගීකරණය නොකර රැඳවියන් 3253ක් එකට රඳවා තිබීම.

- සිරකරුවන්ට ප්‍රමාණවත් සනීපාරක්ෂක පරිසරයක් නොමැති වීම.

- නැවත නැවත සිරගත වන පුද්ගලයන් හඳුනාගැනීමට නිසි ක්‍රමවේදයක් නොතිබුනු අතර, අවිධිමත් ආකාරයෙන් රැස්කරගත් තොරතුරු අනුව එම සංඛ්‍යාව 220ක් වීම.

- රස පරීක්ෂක වාර්තා ලබාදීමට ප්‍රමාද වීම නිසා බන්ධනාගාරවල මාස 6 ක සිට වර්ෂ 2ක කාලපරිච්ඡේදයක් තුළ සැකකරුවන් වශයෙන් 520ක් රදවාගෙන තිබීම.

ප්‍රසම්පාදනයන්

- 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 3ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කල යුතු වුවද, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදි එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද, රාජ්‍ය අමාත්‍යාංශය විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීමට රු.මිලියන 9.59ක් වැය කර තිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ප්‍රකාරව 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදුකර නොතිබුණි.

- පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පිහිටි ගොඩනැඟිල්ලේ තක්සේරු වාර්තාව ලබාගැනීමට හා ගොඩනැඟිලි හිමිකරු සමඟ ගිවිසුමට එළඹීමටත් පෙර අදාළ ආයතනය සමඟ රු.මිලියන 8.38ක මුදලකට ගොඩනැඟිල්ලේ කාර්යාල බෙදා වෙන්කිරීම් කාර්යය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තවද, මාසික කුලී වටිනාකම රු.මිලියන 2.40ක් ලෙස තක්සේරු කර තිබුණු එකී ගොඩනැඟිල්ල සඳහා එම තක්සේරු වටිනාකමට වඩා රු.මිලියන 0.163 කින් වැඩි කුලී වටිනාකමකට ගිවිසුම්ගතවී තිබීම හේතුවෙන් වසර 02 ක කාලයක් සඳහා රු. මිලියන 3.912 ක කුලී මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. එසේම

ගොඩනැගිලි අවශ්‍යතාවය වර්ග අඩි **15000** සිට **16000** ක් ලෙස දැන්වීම් පලකර තිබියදී වර්ග අඩි **14524** ක ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ල රු.මිලියන **2.45**ක මාසික කුලී මුදලකට මිලදී ගැනීමට හැකියාව තිබියදී වර්ග අඩි **19858** ක ගොඩනැගිල්ලක් රු.මිලියන **2.56**කට කුලියට ගැනීම නිසා මාසිකව රු.මිලියන **0.11**ක් බැගින් වැඩිපුර ගෙවීමට සිදුවීමත් ඊට අමතරව ස්ථාවර වත්කම්, පරිගණක ජාලය හා කොටස් වෙන්කිරිම් සහිත එකී ගොඩනැඟිල්ල ලබාගැනීමෙන් ලැබීමට තිබූ ආර්ථික වාසිය අහිමි වී ගොස් තිබුණි. එම හේතුවෙන් අමාත්‍යාංශය විසින් නියමිත කාලවකවානුව තුළදි නිසි තීරණ නොගැනීම නිසා වර්ෂ **2**ක් සඳහා වැඩිපුර කුලී මුදල් ලෙස රු.මිලියන **2.62**ක් හා කාමර වෙන්කිරිම් හා පරිගණක ජාලගත කිරීම සඳහා රු.මිලියන **10.64**ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

- පුනරුත්ථාපන මධ්‍යස්ථාන ආරම්භ කල හැකි කාල වකවානු නිශ්චිතව හඳුනාගත නොහැකි තත්වයක් තුළ සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන **61.80**ක භාණ්ඩ මිලදීගෙන තිබුණි.

අභ්‍යන්තර විගණනය

2018 අංක **19** දරන ජාතික විගණන පනතේ **40 (1)** වගන්තිය හා **40 (2) (1)** වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි.

භාණ්ඩාගාරයේ කටයුතු

විගණන නිරීක්ෂණ

- රජයේ ආදායම් රැස්කිරීම
- සීමා සංශෝධනය නොකිරීම
- මූල්‍ය කල්බදු යටතේ වාහන මිලදී ගැනීම
- ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දුන් යතුරුපැදි
- රාජ්‍ය ණය
- උපයෝජනය නොවූ විදේශ ණය ශේෂය සඳහා ගාස්තු ගෙවීම
- විදේශ ණය ආපසු ගෙවීම
- රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම
- විදේශාධාර ලබා ගැනීම
- රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය
- භාණ්ඩාගාරය අනුමත කළ අත්තිකාරම් ගිණුම්
- මූල්‍ය නොවන වත්කම්
- සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය
- බදු අභියාචනා විසඳීම
- රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය
- කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබාදීම

භාණ්ඩාගාරයේ කටයුතු

මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 22 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 48 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- සැමට ප්‍රතිලාභ විහිදෙන, සියළු පළාත් ආවරණය වන, ආදායම් විෂමතා අවම වන තිරසර ඉහළ ආර්ථික වර්ධනය වේගයක් ඇති කර ගැනීම
- අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය දෙමින් සේවා වියුක්තිය අඩු කර ගැනීම හා ඒක පුද්ගල ආදායම ඉහළ නංවා ගැනීම
- වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුළ මිල ස්ථාවරත්වය ඇති කිරීම
- අයවැය හිඟය හා රාජ්‍ය ණය අඩුකර ගැනීම මගින් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්තිවල අවිනිශ්චිතතාවයන් අවම කිරීම
- ණය පොලී අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුළින් මූල්‍ය සම්පත් ආර්ථික අවශ්‍යතාවන් පුළුල් කිරීම
- රුපියලේ අගය ස්ථාවරත්වය තහවුරු වන පරිදි මූල්‍ය හා ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති හා පොලී අනුපාත ස්ථාවර කර ගැනීම
- දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ආයෝජන දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වාදීම
- පොදු ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දේශීය ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීම
- රජයේ ආදායම් හා වියදම් කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයට හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 22 ක් වෙත එකතුව රු.මිලියන 2,572,396 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 2,529,916 ක් පමණක් උපයෝජනය කර තිබුණි. 2020 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 2,255,020 ක ප්‍රතිපාදන සලසා දී තිබුණු අතර, එම වර්ෂයේදී ඉන් රු.මිලියන 2,158,968 ක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 23 හි දැක්වේ.



රූපසටහන 23 - ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන

රජයේ ආදායම් රැස්කිරීම

මුදල් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 10 ක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වශයෙන් කටයුතු කරනු ලබයි. 2021 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ආදායම් ඇස්තමේන්තුව ප්‍රකාරව එම ආදායම් ගණන්දීමේ නිලධාරීන් අදාළ ආදායම් සංකේත 56 ක් යටතේ රු.මිලියන 1,449,485 ක ආදායමක් දක්වා තිබුණි. අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් එම ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 183,463 කින් අඩු කර පාර්ලිමේන්තුව අනුමත කළ ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. මේ නිසා වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් රු.මිලියන 1,221,931 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් රු.මිලියන 44,091 ක ආදායම් රැස්කර කර ගැනීමට අපොහොසත් වී තිබුණි. මේ අනුව මුදල් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 10 ක් විසින් පාර්ලිමේන්තුව අනුමත කළ ආදායම් ඇස්තමේන්තුවෙන් රු.මිලියන 227,554 ක් හෙවත් මුල් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 15.70 ක ප්‍රමාණයක ආදායම් රැස්කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම දෙපාර්තමේන්තු 10 අතරින් ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තුව අනුමත කළ රු.මිලියන 1,600 ක ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1,200 කින් හෙවත් සියයට 75 කින් වැඩි කර සංශෝධනය කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 135 කින් වැඩිකර රු.මිලියන 2,935 ක ආදායමක් රැස්කර තිබුණි. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්, දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්, ප්‍රධාන තක්සේරුකරු හා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සංශෝධිත ආදායම් ඇස්මේන්මේන්තුව රු.මිලියන 4,719 කින් ඉක්මවා එකතුව රු.මිලියන 683,415 ක ආදායම් රැස්කර තිබුණි. අනෙක් දෙපාර්තමේන්තු 05 ක් විසින් එකතුව රු.මිලියන 587,325 ක සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් එකතුව රු.මිලියන 538,515 ක් ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 48,810 ක ආදායම් රැස්කර ගැනීමට අපොහොසත් වී තිබුණි. විස්තර වගුව 19 හි දැක්වේ.

ආදායම් ගණන්දීමේ නිලධාරී	ආදායම් සංකේත ගණන	මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව ආදායම	සංශෝධිත ඇස්තමේන්තුව අනුව ආදායම	රැස්කළ ආදායම	සංශෝධිත ඇස්තමේන්තුව අනුව	
					ඉක්මවීම	රැස් නොකළ ආදායම
		රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
ආනයන හා අපනයන පාලක	1	1,600	2,800	2,935	135	-
කොම්ප්ට්‍රෝලර් ජනරාල්	1	400	400	188	-	212
ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්	1	0	0	3	3	-
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්	28	666,503	629,215	640,213	10,919	-
භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්	10	51,750	51,800	56,777	4,977	
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්	2	20,000	25,000	15,012	-	9,988
රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්	2	56,000	40,000	30,591	-	9,409
රේගු අධ්‍යක්ෂ ජනරාල්	8	503,107	381,890	354,050	-	27,840
සුරා බදු කොමසාරිස්	2	150,035	140,035	138,674	-	1,361
ප්‍රධාන තක්සේරුකරු	1	90	82	115	33	
එකතුව	56	1,449,485	1,271,222	1,238,479	16,067	48,810

වගුව 19 - 2021 වර්ෂයේ ආදායම් සංකේත 55 ක ඇස්තමේන්තුගත ආදයම හා තථ්‍ය ආදායම

මූලාශ්‍රය - 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා රජයේ මූල්‍ය ප්‍රකාශන

මුදල් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 22 ක් විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සීමා සංශෝධනය නොකිරීම

2020 අංක 7 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ සඳහන් රාජ්‍ය අමාත්‍යාංශයකට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට අදාළව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් කාර්ය වෙනුවෙන් පිළිවෙළින් රු.මිලියන 32 ක් හා රු. මිලියන 17 ක් බැගින් උපරිම වියදම් සීමාවන් පනවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම අමාත්‍යාංශය හා කාර්යාලය විසින් එම සීමාවන් පිළිවෙළින් රු.1,401,679 කින් හා රු.208,590 කින් ඉක්මවා අත්තිකාරම් ගෙවා තිබුණි. එසේම තවත් රාජ්‍ය අමාත්‍යාංශයකට අදාළව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් කාර්යයක්

වෙනුවෙන් රු. මිලියන 525 ක් අවම ලැබීම් සීමාවක් පනවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 457.95 ක ලැබීම් රැස්කර තිබුණි. ඒ අනුව රු. මිලියන 67.05 කින් සීමාවට ළඟා වී නොතිබුණි. එමෙන්ම 2021 වර්ෂයේ ක්‍රියාත්මක නොවූ කොමිෂන් සභා කාර්යාල දෙකක් වෙනුවෙන් වාර්ෂික විසර්ජන පනත මගින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් කාර්යයන් දෙකක් වෙනුවෙන් පිළිවෙලින් රු.500,000 ක් හා රු.200,000 බැගින් අවම ලැබීම් සීමාවන් පනවා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉන් කිසිදු ලැබීමක් වාර්තා වී නොතිබුණි. තවත් රාජ්‍ය අමාත්‍යාංශයක උපරිම හර ශේෂ සීමාව ලෙස රු. මිලියන 20 ක් ලෙස දක්වා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ශේෂය රු. මිලියන 24.6 ක් වී තිබුණි. ඒ අනුව හර ශේෂ සීමාව රු.මිලියන 4.6 කින් ඉක්මවා තිබුණි. විසර්ජන පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම සීමා නොඉක්මවීම 2022 මැයි 31 දින හෝ ඊට පෙර සීමා සංශෝධනයන් කළ යුතුව තිබුණත්, 2022 අගෝස්තු 31 දින වන විටත් එම සීමාවන් සංශෝධනය කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

මූල්‍ය කල්බදු යටතේ වාහන මිලදී ගැනීම

2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගන්නා ලද එකතුව රු. මිලියන 4,229.68 ක් වූ වාහන පවරා ගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කර තිබුණ ද, එම පවරා දීම අවසාන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දුන් යතුරුපැදි

2014 ජූලි 23 දිනැති අංක 02/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දුන් යතුරුපැදිවල ලියාපදිංචි අයිතිය වර්ෂ 5 ක කාලයකට පසුව පෞද්ගලික නමට පැවරෙන නමුත්, එම මෝටර් සයිකල් පවරා ගැනීමේ කටයුතු අවසාන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

රාජ්‍ය ණය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු රාජ්‍ය ණය ශේෂය රු.බිලියන 16,826.83 ක් වුවද, ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දක්වා ඇත.

- 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ණය වාර්තා කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන CS-DRMS 2000+ Report 854 – 1 හි ඇතුළත් වූ ණය ගිවිසුම් 8 කට අදාළව එකතුව රු.මිලියන 311,191 ක විදේශ ණය වටිනාකම, රජයේ මූල්‍ය ප්‍රකාශන වලින් මුළුමනින්ම ඉවත් කර තිබුණි.

- රජය විසින් 2021 වර්ෂයේ ඇතිකර ගත් ගිවිසුම්ගත බැඳීම් යටතේ වූ ණය ගිවිසුමකට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 589 ක් වූ ණය ශේෂය, රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

- ඉහත සඳහන් ණය ගිවිසුම් 08 ක් තුළ වූ ණය ශේෂවලින් හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ලබා ගෙන තිබුණු ණයවලින් රු.මිලියන 161,332 ක ශේෂයක් ආපසු ගෙවිය යුතුව තිබුණි. එම ණය ශේෂය 2017 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය විසින් බාර ගෙන තිබුණි. නමුත් එම ණය ශේෂය 2021 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලින් ද එම ණය ශේෂය ඉවත්කර තිබුණි. මෙම ණය ශේෂය සඳහා වන ණය සේවාකරණය භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලැබේ.

- CS-DRMS 2000+ Report 854 – 1 වාර්තාවේ ණය ගිවිසුම් දෙකකට අදාළව ණය ව්‍යවහාර මුදල (Loan Currency) යුරෝ (EUR) ලෙස සලකා තිබුණද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය වි.ගැ.හි (XDR) සහ එ.ජ.ඩොලර් (USD) වශයෙන් සලකා තිබුණි. මේ හේතුවෙන් එකම ණය ශේෂ සඳහා වෙනස් ණය ව්‍යවහාර මුදල්වලට අදාළ විනිමය අනුපාත භාවිතා කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රාජ්‍ය ණය ශේෂය රු.මිලියන 340 කින් වැඩිවීමට හා රු.මිලියන 285 ක අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

- CS-DRMS 2000+ Report 854 – 1 වාර්තාව අනුව ණය අංක 2021026 හි වර්ෂය තුළ උපලබ්ධි වී ඇති ණය වටිනාකම රු. මිලියන 64,910.4 ක් වී තිබුණත්, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 64,983.8 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ණය වටිනාකම රු.මිලියන 73.4 කින් වැඩියෙන් දක්වා තිබුණි.

- 2021 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ 854-1 වාර්තාව අනුව විවිධ ප්‍රදායකයන් විසින් ශ්‍රී ලංකා රජය වෙත ලබාදී තිබුණු ණය ශේෂ, එම ආයතනවලින් විගණනයට ඉදිරිපත් කළ ශේෂ තහවුරු කිරීම්වල ඇතුළත් ණය ශේෂ හා සන්සන්දනය කිරීමේදී, එකතුව එ.ජ.ඩොලර් 1,800,227ක් හෙවත් රු.මිලියන 360.82 කින් යුතු ණය ශේෂ 02 ක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොතිබුණි.

- 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ණය මූලාශ්‍රය වන CS-DRMS 2000+ Report 854 – 1 වාර්තාවේ ඇතුළත් ණය අංක 2001042 යටතේ රු.මිලියන 240 ක ණය ශේෂයයක් පැවතුණත්. එම ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

- ණය ගිවිසුම් දෙකකට අදාළව රු.1,481,264 ක සෘණ ණය ශේෂ රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු අතර එම ණය ශේෂයන් සෘණ අගයන් ගැනීමට සහ එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට අදාළ පැහැදිලි කිරීමක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

- මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සටහන් අංක 29 (i) ට අදාළ තොරතුරු CS-DRMS 2000+ Report 854 – 1 හි ඇතුළත් නොවූ අතර රු. මිලියන 20,247 ක් වන එම වටිනාකම තහවුරු කර ගත හැකි මූලාශ්‍ර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ණය ශේෂය එ.ජ.ඩොලර් 34,130,219,447 ක් වී තිබුණි. එදිනට පැවැති විනිමය අනුපාතය වූ රු.200.43 ක් සමඟ ගැලපූ විට ණය ශේෂයේ රුපියල් වටිනාකම රු.බිලියන 6,841 වී තිබුණි. 2022 මැයි 30 දිනට පැවැති විනිමය අනුපාතය රු.360.76 ක් වීම නිසා එම විදේශ ණය ශේෂයේ වටිනාකම රු. බිලියන 12,313 ක් වී තිබුණි. විනිමය අනුපාතය වෙනස්වීම නිසා ණය ශේෂයට සිදුවන ප්‍රමාණාත්මක බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

උපයෝජනය නොවූ විදේශ ණය ශේෂය සඳහා ගාස්තු ගෙවීම

2014 හා 2016 වර්ෂවලදී ගිවිසුම්ගත වී ඇති නමුත් 2020 වර්ෂය අවසාන වන විටත් එම ණය ගිවිසුම්වලට අදාළව විෂය පථය සීමාවීම, සවිස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම ප්‍රමාදවීම, ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදවීම් සහ COVID 19 වසංගත තත්ත්වයන් නිසා එම විදේශ ණය උපයෝජනය නොකිරීම නිසා ගිවිසුම් ප්‍රකාරව බැඳීම් ගාස්තු ලෙස එ.ජ.ඩො. 93,175,883 ක්ද, යුරෝ 1,328,347 ක් හා රෙන්මිබින් යුවාන් 70,213,890 ක් ගෙවා තිබුණි. විස්තර වගුව 20 හි දැක්වේ.

ව්‍යාපෘතියේ නම	උපයෝජනය නොකළ ණය ශේෂය	බැඳීම් ගාස්තු අනුපාතය උපයෝජනය නොකළ මුදලින්	ගෙවා තිබුණු බැඳීම් ගාස්තුව
බෙලිඅත්ත සිට වැටිය දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය	එ.ජ.ඩොලර් 80,938,153	සියයට 0.25	එ.ජ.ඩොලර් 2,641,904
නාගරික සෞඛ්‍යාරක්ෂණ සහ සනීපාරක්ෂණ මූල පිරීම් ව්‍යාපෘතිය	යුරෝ 73,243,437	සියයට 0.5	යුරෝ 562,354
අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය	යුරෝ 50,135,990	සියයට 0.5	යුරෝ 379,487
ආනමඩුව ඒකාබද්ධ ජලසම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම	යුරෝ 17,274,470	සියයට 0.5	යුරෝ 18,223
විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	යුරෝ 37,938,128	සියයට 0.75	යුරෝ 368,283

මාතර සිට බෙලිඅත්ත දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	එ.ජ.ඩොලර් 19,511,551	සියයට 0.25	එ.ජ.ඩොලර් 56,089,787
පිටත වට රවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස ක්‍රියාත්මක කිරීම	එ.ජ.ඩොලර් 140,728,238	සියයට 0.25	එ.ජ.ඩොලර් 32,212,172
මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	රෙන්මිබින් යුවාන් 540,370,717	සියයට 0.25	රෙන්මිබින් යුවාන් 51,295,324
හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රයේ මාර්ග සහ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	යුවාන් 1,489,711	සියයට 0.25	රෙන්මිබින් යුවාන් 18,918,566
අඹතලේ ජලසම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	එ.ජ.ඩොලර් 53,129,531	සියයට 0.5	එ.ජ.ඩොලර් 53,132,020

වගුව 20 - උපයෝජනය නොකළ ණය ශේෂය මත අය කළ බැදීම් ගාස්තු ගෙවීම

මූලාශ්‍රය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්තාව

විදේශ ණය ආපසු ගෙවීම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව සමාලෝචිත වර්ෂයේදී ලබා ගෙන තිබුණු විදේශ ණයවල වටිනාකම රු.මිලියන 516,606 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවන ලද ණය වාරිකවල වටිනාකම රු.මිලියන 530,507 ක් වී තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේදී ණය වාරික ගෙවීම වර්ෂය තුළදී ලබාගෙන තිබුණු ණය ප්‍රමාණයට වඩා රු.මිලියන 13,901 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබා ගෙන තිබුණු විදේශ ණය ප්‍රමාණය ඉක්මවා විදේශීය ණය ගෙවීම නිසා රු.මිලියන 13,901 ක විදේශ විනිමය ඌනතාවයක් සිදු වි තිබුණි. විදේශ ණය ලබා ගැනිම හා ආපසු ගෙවීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත.

- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක TO/S&A/03/08/05 හා 2022 පෙබරවාරි 25 දිනැති ලිපිය මඟින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2021 වර්ෂයේදී හා 2020 වර්ෂයේදී හෝ ඊට පෙර උපලබ්ධි වූ නමුත් 2021 වර්ෂය අවසන් වන විටත් ගිණුම්ගත නොකළ විදේශ ණයවල 2021 දෙසැම්බර් 31 දිනට වටිනාකම පිළිවෙලින් රු.මිලියන 16,883.6 ක් හා රු.මිලියන 21 ක් විය. කෙසේ වුවද, එම ලිපියේ ඇතුළත් වටිනාකම හා තථ්‍ය ගණනය කිරීම් වටිනාකම් අතර වෙනසක් ද නිරීක්ෂණය විය.

- ඉහත ලිපියෙහි ඇමුණුම 03 ට අනුව 2021 වර්ෂයේදී ගිණුම් ගත කළ එහෙත් 2020 වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල උපලබ්ධි වූ විදේශ ණය වල වටිනාකම රු. මිලියන 5,671 ක් බව දන්වා තිබුණි. ඒ අනුව අදාළ වර්ෂය තුළ උපලබ්ධි වුවත්, එම වර්ෂය තුළ සමහර විදේශ ණය ගිණුම්ගත

නොකිරීම දිගින් දිගටම සිදු කරන බව තව දුරටත් නිරීක්ෂණය විය.

- 2022 අප්‍රේල් 21 දිනැති අංක SA/MAA/02/02/03/VO(iii) දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව, විදේශ ණය හා සම්බන්ධ සටහන් අංක 29 (ii), (iii) හා (iv) අනුව ගණනය කළ සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවන ලද ණය වාරිකවල වටිනාකම රු. මිලියන 514,154 ක් වී තිබුණි. නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව එය රු.මිලියන 530,508 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 16,354 ක වෙනසක් අනාවරණය විය. මෙම වෙනසට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- 2022 ජනවාරි 19 දින මුද්‍රණය කළ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ CS-DRMS 814-1 වාර්තාව අනුව විදේශ ණය ගිවිසුම් 19 කට අදාළව උපලබ්ධි වූ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,208 ක් වී තිබුණි. එම වටිනාකම 2021 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. නමුත් 2022 මැයි 19 දින මුද්‍රණය කළ ඉහත සඳහන් 814-1 වාර්තාව අනුව එම ණය ගිවිසුම් 19 ට අදාළ 2021 වර්ෂයේ උපලබ්ධි වූ විදේශ ණය වශයෙන් රු.මිලියන 39,174 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල 2021 වර්ෂයට අදාළ උපලබ්ධි වූ විදේශ ණය ප්‍රමාණය රු.මිලියන 23,966 ක් අඩුවෙන් දක්වා තිබුණි.

- 2022 මැයි 19 දින මුද්‍රණය කළ 2021 දෙසැම්බර් 31 දිනට අදාළ 814-1 වාර්තාවෙහි ණය අංක 2016028 ට අදාළව එ.ජ.ඩො. 729,484.66 ක් හෙවත් රු.146,217,030 ක සෘණ උපලබ්ධි වීමක් ලෙස දක්වා තිබුණි. ණය ගිවිසුමට අදාළ ව්‍යාපෘතියට ලබාදුන් මූලික අත්තිකාරමෙන් ව්‍යාපෘතිය අවසාන වන විට ඉතිරි වූ ප්‍රමාණය ආපසු ගෙවීම ඇතුළත් වී තිබුණද, එම ආපසු ගෙවීම රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම

රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කර තිබූ ගිණුම්කරණ ක්‍රමවේද / පදනම් වරින්වර වෙනස් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල සංගතභාවය ආරක්ෂා වී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

- 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල අවම්ල ගිණුම් ගත නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 318,246 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම අවම්ල ගිණුම්ගත කිරීම සඳහා රු.බිලියන 318 ක ප්‍රතිපාදන සලසා ගත යුතුව තිබුණත්, ප්‍රායෝගිකව එවැනි විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් සලසා ගැනීම අයවැය හිඟය ඉහළ යාමට හේතුවන හෙයින් 2016 වර්ෂයට පෙර නිකුත් කළ බැඳුම්කරවලට අදාළ අවම්ල එම බැඳුම්කර කල්පිරෙන

වර්ෂයේදී ගැලපීම් කිරීමටත්, එතෙක් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් ලෙස එම බැඳුම්කර මුහුණත අගය හෙළිදරව් කිරීමටත් පියවර ගෙන ඇති බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දිනට එසේ ප්‍රතිපාදන ලබාගැනීමකින් තොරව එම වටිනාකම ගිණුම්ගත කර තිබුණු අතර එම ශේෂය 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

- 2020 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල මහ බැංකු අත්තිකාරම, දේශීය ණයක් ලෙස වර්ගීකරණය කර ඊට හේතු ද ඉදිරිපත් කර තිබුණි. නමුත් 2021 වර්ෂයේදී එම මහ බැංකු අත්තිකාරම් ශේෂය වූ රු.මිලියන 150.1 ක්, දේශීය ණය වර්ගීකරණයෙන් ඉවත් කර වෙනමම අයිතමයක් ලෙස දක්වා තිබුණි.

- විදේශ ණයවලට අදාළව මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

විදේශාධාර ලබා ගැනීම

1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගනුදෙනු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉටු කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2021 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 2 ක් විසින් ව්‍යාපෘති 7 ක් සඳහා රු.මිලියන 24.77 ක විදේශ ප්‍රදාන ඍජුවම ලබා ගෙන තිබුණත්, එම ප්‍රදාන රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොතිබුණි.

- 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය ආරම්භවීමත් සමඟ විවිධ විදේශ රාජ්‍යයන්, දේශීය/විදේශීය ආයතන/සංවිධාන/පුද්ගලයන් සහ දේශීය/විදේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ඒ යටතේ රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වෙත 2020 හා 2021 වර්ෂවලදී වටිනාකම තක්සේරු කළ මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර/පරිත්‍යාග වශයෙන් රු.මිලියන 1,949 ක් ලැබී තිබුණත්, එම පරිත්‍යාග මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම 2020 හා 2021 වර්ෂවලදී ඉහත සඳහන් කළ පාර්ශවයන්ගෙන් ලැබී තිබුණු භාණ්ඩ අයිතම 162,465 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය

2021 දෙසැම්බර් 31 දිනට රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 760,777.41 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජය විසින් ලබා දුන් රු.මිලියන 8,169 ක උපකරණයක් සීමාසහිත මිල්කෝ (පෞද්ගලික) සමාගම විසින් නොගෙවා

තිබුණු අතර, භාණ්ඩාගාරය විසින් එම ණය මුදල කපාහැර තිබුණු අතර, ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේ කපාහැර තිබුණු ආදායම එම සමාගමේ ප්‍රාග්ධනයට රජයේ දායක විමක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. එම ගනුදෙනුව වාර්ෂික විසර්ජන පනතෙන් ප්‍රතිපාදන ලබා ගෙන සිදු කළ යුතුව තිබුණත්, එසේ සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- රාජ්‍ය සංස්ථා සහ කොටස් හිමිකාරීත්වය දරන රාජ්‍ය ව්‍යාපාර සහ සමාගම් 13 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2021 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 439,639 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 411,874 ක් වීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකානශ තුළ රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 27,765 ක් අඩුවෙන් දක්වා තිබුණි.

- 2021 දෙසැම්බර් 31 දිනට රජයට අයත් සීමිත සමාගම් 5 ක් විසින් ඉදිරිපත් කළ සෘජු ශේෂ සනාථකිරීම්වල රජයේ මුළු ප්‍රාග්ධන දායකත්වයේ වටිනාකම සඳහන් වී නොතිබුණු අතර කොටසක වෙළඳපල වටිනාකම දක්වා තිබුණි. තවද රජයේ මූල්‍ය ප්‍රකාශනවල එම ආයතනයන්හි කොටස් හිමිකාරීත්වයේ වටිනාකම කොටස්වල නාමික අගය පදනම් කරගෙන හඳුනාගෙන රු.මිලියන 38 ක් ලෙස දක්වා තිබුණි.

- රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශීර්ෂ 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 කුලී හා වැඩ අත්තිකාරම් ශේෂය රු.මිලියන 8.52 ක් වී තිබුණි. 2021 වර්ෂයේ එම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව කුලි හා වැඩ අත්තිකාරම් ගිණුමේ ශේෂයක් නොතිබුණි.

භාණ්ඩාගාරය අනුමත කළ අත්තිකාරම් ගිණුම්

2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර අනුමත අත්තිකාරම් ගිණුම්වල ශේෂ එකතුව ලෙස රු.මිලියන 15,727.68 ක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ශේෂ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

- 2021 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ ගණනාවක සිට පැවත එන රජයේ අනුමත භාණ්ඩාගාර අත්තිකාරම් ගිණුම් යටතේ එකතුව රු.මිලියන 1,373 ක හර ශේෂ හා එකතුව රු.මිලියන 19.92 ක බැර ශේෂ පැවැතුණි. එම ශේෂ සම්බන්ධව දිගින් දිගට විගණනයේදී කළ විමසුම් වලදී මු.රෙ. 518 ප්‍රකාරව කටයුතු කර ඒවා වසා දැමීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. එම අත්තිකාරම් ගිණුම්වලින් ගිණුම් තුනක ශේෂ 2022 වර්ෂයේදී නිරවුල් කර වසා දමා තිබුණි. ඉතිරි අත්තිකාරම් ගිණුම්වල

ශේෂයයන් 2022 මැයි 19 දින වන විටත් වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

- ශීර්ෂ 111 - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රු.මිලියන 1,221.65 ක ගබඩා සහ අනෙකුත් අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂයක් පැවැතුණද, ඊට හේතු විමසීමේදී කිසිදු පදනමක් නොමැතිව නාමමාත්‍රිකව මෙම ශේෂය පවත්වාගෙන යන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඊට අදාළව විගණන විමසුම් වරින් වර නිකුත් කර තිබුණත්, 2022 මැයි 20 දින වන විටත් ඒ සඳහා කඩිනම් පියවර ගෙන නොතිබුණි.

මූල්‍ය නොවන වත්කම්

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වශයෙන් රු.මිලියන 1,850,007.34 ක් දක්වා තිබුණි. එම ශේෂය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

- 2017 මාර්තු 20 දිනැති අංක MF/NB/01/CM/2017/85 දරන "ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකුවලින් ලබාගත් ණය සහ පොලී ගිණුම්වලට ඇතුළත් කිරීම" යන මැයෙන් මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් පුද්ගල අනන්‍යතා මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම රජයේ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණු අතර 2017 අප්‍රේල් 05 දිනැති අංක අමප/17/0632/719/062 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණද, විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම වත්කම ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

- 2006 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රාජ්‍ය ආයෝජන වශයෙන් එකතුව රු.බිලියන 8,199 ක ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශවල භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි. නමුත් 2021 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වශයෙන් ඉන් රු.බිලියන 1,850 ක් පමණක් වත්කම් වශයෙන් හඳුනා ගෙන ගිණුම්ගත කර තිබුණි. එම වියදම තුළ වූ උප ණය රු.බිලියන 173 ක්ද, රාජ්‍ය ව්‍යවසායන් වෙත කරන ලද ප්‍රාග්ධන දායකත්වය රු.බිලියන 761 ක් වශයෙන් එකතුව රු. බිලියන 934 ක් මූල්‍ය වත්කම් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් වශයෙන් එකතුව රු.බිලියන 2,784 ක් ගිණුම් ගත කර තිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශවල සඳහන් කර තිබුණු භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්වල එකතුව රු.බිලියන 8,199 කින් රු.බිලියන 5,415 ක් හෙවත් සියයට 66 ක් වටිනා වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට අපොහොසත් වී තිබුණි. 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා

කාල පරාසය තුළ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර නොතිබුණු අතර, එය 2015 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීම ආරම්භ කර තිබුණි.

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය

මුදල් අමාත්‍යාංශය යටතේ දේශීය අරමුදල්, විදේශ ණය හා ආධාර යොදවා ක්‍රියාත්මක කරන සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 8 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එමෙන්ම, මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා එකතුව රු.මිලියන 489 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘතිවල කාර්යසාධනය මන්දගාමී ස්වරූපයක් ගැනීම හේතුවෙන් සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 65 ක් හෙවත් රු.මිලියන 5.2 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 489 ක ප්‍රතිපාදනවලින් එම ව්‍යාපෘතිය වෙනුවෙන් කිසිදු උපයෝජනයක් නොකර, රු. මිලියන 313 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

බදු අභියාචනා විසඳීම

2016 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනා 1024 ක් ලැබී තිබුණු අතර, ඒවා අතරින් මතභේදකාරී බදු මුදල රු.මිලියන 113,154 ක් වූ අභියාචනා 569 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් විභාග කිරීම ආරම්භ කර නොතිබුණි. විමසීම ආරම්භ නොකළ අභියාචනා 569 කින් 227 ක් එනම් සියයට 40 ක අභියාචනා ලියාපදිංචි කළ දින සිට 2021 දෙසැම්බර් 31 දිනය වන විටත් විමසීම ආරම්භ නොකර වර්ෂ 02 (දින 721) ක් ඉක්මවා පැවතුණි. ඊට අදාළ මතභේදකාරී බදු මුදලෙහි වටිනාකම රු.මිලියන 47,727 ක් විය.

රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය ඇතුළත් වේ. මහා භාණ්ඩාගාරය විසින් බොහෝ රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙකු පත්කර තිබුණද, 2020 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන් 19 කට අදාළව නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුළත් නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් 105 ක් අනාවරණය කර තිබුණි. එම නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූලවන ලෙස කටයුතු කිරීමට රාජ්‍ය ව්‍යවසායන් පෙළඹවීම භාණ්ඩාගාර නියෝජිතයා මගින් සිදු කර ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වන ආයතන 300 ක් අතරින් ආයතන 119 ක් රාජ්‍ය ව්‍යාපාර සතු උප සමාගම් වන අතර මෙම උපසමාගම් දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණයට ලක් නොවන බව ද නිරීක්ෂණය විය.

කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබාදීම

කාලීනවූත්, නිවැරදිවූත්, දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායි ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර වී

තිබුණි. සමාලෝචිත වර්ෂයේදි දත්ත වාර්තා **62** ක් වෙබ් අඩවියට නිකුත් කිරීමටත්, දත්ත වාර්තා **23** ක් මුද්‍රණය කර අදාළ දින දර්ශනයේ සඳහන් කාලවකවානු තුළ නිකුත් කළ යුතුව තිබුණි. එම වාර්තාවලින් කිසිදු වාර්තාවක් නියමිත දිනවලදී නිකුත් කර නොතිබුණු අතර, මාස **01** ක සිට මාස **11** ක් දක්වා කාලපරාසයකින් ප්‍රමාදයකින් පසුව ඒවා නිකුත් කර තිබුණි.

කෘෂිකර්ම අංශය

විගණන නිරීක්ෂණ

- කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබාගත් ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම අවසන් කිරීම
- “ජීව තුරු උදාන” ජාතික වැඩසටහන
- කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය හා ගොවීන්ට දිරිදීමනා ලබාදීමට අදාළ ප්‍රචාරණ වියදම්
- ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණ ව්‍යාපෘතිය
- පුරන් කුඹුරු අස්වැද්දවීමේ විශේෂ වැඩ සටහන
- ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
- රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගම
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු උපයෝජනය නොවන වතුයායන්
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු උපයෝජනය නොවන වත්කම්

කෘෂිකර්ම අංශය

ස්වභාවික සම්පත් තිරසාර කලමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් හා වාණිජමය නැඹුරුවකින් යුතුව ගෝලීය තරඟකාරී නිෂ්පාදනයක් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත්කර ගැනීම තුළින් ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යයක්ෂම,ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ගොඩනැගීම ප්‍රධාන ඉලක්කය ලෙස හඳුනාගෙන තිබුණි. උක්ත අරමුණ ඉටුකර ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශ 02 ක්, දෙපාර්තමේන්තු 03 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 14 ක් සඳහා පහත කාර්යභාරයන් ඉටුකිරීමට අයවැය ප්‍රතිපාදන ලබාදී තිබුණි.

- සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම සඳහා එක් එක් ඉලක්ක කණ්ඩායම්වලට ගැලපෙන කෘෂි තාක්ෂණික දැනුම පුළුල් කිරීම.
- තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම.
- කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා ආදාළ සියලු ආයතන ඒකාබද්ධ කෙරෙන යාන්ත්‍රණයක් සහිත ප්‍රවේශයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
- කාෂිකර්මාන්තයේදී යොදන රසායනික පළිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරිම.
- කෘෂිකාර්මික කටයුතු වලට අවශ්‍ය පරිදි මූල්‍ය සම්පත්, වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම.
- සෘජු නිෂ්පාදකයින්, සැකසුම් ආයතන, තොග වෙළෙඳ සමාගම් සහ අපනයන සමාගම් අතර සැපයුම් සබඳතා ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබාදීම.
- නිෂ්පාදන අලෙවිකරණ පහසුකම් සඳහා නව උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- අස්වනු නෙළන අවස්ථාවන්හිදී රජයේ සැලසුම් සහගත මැදිහත් වීම මගින් නිෂ්පාදකයින්ගේ අදායම පහළ වැටීම නියාමනය කිරීම.
- දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවමකර ගැනීම.
- ප්‍රමිතියෙන් යුතු බීජ හා පැලෑටි ගොවි ජනතාවට ලබාදීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.
- ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතාවයන් අනුව ජල සැපයුම් කළමනාකරණය කිරීම.
- විවිධ භූගෝලීය ප්‍රදේශවලට ගැලපෙන පරිදි පශු සම්පත් හඳුන්වාදීම සඳහා පර්යේෂණ සිදු කිරීම් හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම.

- පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම.
- ජාතික පශු සම්පත් මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තෘණ වර්ග හඳුන්වා දීම.
- මධ්‍ය හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම.
- රජයේ සත්ව ගොවිපොළවල් උපරිම ලෙස භාවිතා කිරීමේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.
- කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට දිරිමත් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම.
- සත්ව ගොවිපොළවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායි අධීක්ෂණ පද්ධති හඳුන්වා දීම.
- පශු වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන් සඳහා පහසුකම් සැලැසීම.
- දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයේ සාධාරණ මිල ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණය වැඩ පිළිවෙලක් ආදාළ ආයතන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම
- කාබනික පොහොර භාවිතය හා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කාබනික එළවළු හා පලතුරු පරිභෝජනය ගෘහ මට්ටමෙන් පුළුල් කිරීම සඳහා සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ගෙවතු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං හා කව්පි ළූණු සහ අල වැනි භෝග නිෂ්පාදනය වැඩි කිරීම මගින් එම නිෂ්පාදන ආනයන අවම කිරීම.
- අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම සහ අගය එකතු කිරීමෙන් අපනයනය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා කෘෂි අස්වනු එක්රැස් කිරීමේ සහ සැකැසීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම.
- එළවළු, පලතුරු ආශ්‍රිත අපනයන නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම
- ආනයන බීජවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිළිගත් ප්‍රමිති සහතික තුළ එම ආනයනයන් සිදු කිරීම නියාමනය කිරීම.
- ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම.
- ආවේණික ප්‍රවේණි ගුණයෙන් යුතු සහ ලෙඩ රෝග වලට හා දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තුදෙන, අධි ඵලදා බීජ පැළ වර්ග හඳුන්වාදීම.
- රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය.

- නව තාක්ෂණික ක්‍රමවේදයන් තුළ භූ ජලය, බිම් සකස් කිරීම, බීජ හා පැලෑටි තෝරා ගැනීම, පොහොර යෙදීම, පෙර හා පසු අස්වනු හා සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් පූර්ණ අධ්‍යයනයන් සිදු කර ගොවින් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- තාක්ෂණික කෘෂිකර්මාන්තයක් වෙත යොමුවීම සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික උපකරණ, ඉඩම් භාවිතය, මූල්‍ය දායකත්වය මගින් වෙළඳපොළ වටිනාකම එකතුකළ කාර්මික නිෂ්පාදන සඳහා යොමුවීම.
- අස්වනු නෙළීමේදීත්, ප්‍රවාහනයේදීත්, ගොඩබෑමේදීත් සිදුවන අපතේයාම වලක්වා ගැනීම සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශ ඒකාබද්ධ කර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම මගින් වැඩි අස්වනු ලැබෙන ක්‍රමවේදයන් හඳුන්වා දීම මගින් ජල පරිභෝජනයේ ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම.
- වී හා ධාන්‍ය වර්ග ගම්මිරිස්, කරාබු නැටි, කොකෝවා ඇතුළු ප්‍රධාන භෝග මෙන්ම එළවළු, පලතුරු හා ගෙවතු වගා සඳහා තාක්ෂණික වගා ක්‍රමයන්, උසස් බීජ හා පැලෑටි මෙන්ම නියමිත ප්‍රමිතියෙන් යුත් පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම.
- දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ උසස් මට්ටමේ පොහොර වර්ග රට තුළ නිෂ්පාදනය කිරීම දිරිගැන්වීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත සහ ඒ යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත එකතුව රු.මිලියන 76,221.40 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 53,013.00 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු.මිලියන 23,208.40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර රූපසටහන 24 හි දැක්වේ.



	කෘෂිකර්ම අමාත්‍යාංශය	වී හා ධාන්‍ය,කාබනික ආහාර,එළවළු, පළතුරු,මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය...	කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන හා සැපයුම් නියාමන රාජ්‍ය අමාත්‍යාංශය	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	එකතුව
ශුද්ධ ප්‍රතිපාදන රු.මිලියන	16,786.80	8,720.60	35,554.20	10,013.30	5,146.50	76,221.40
වියදම	11,924.20	5,463.60	21,627.40	8,950.80	5,047.00	53,013.00
ඉතිරිය	4,862.60	3,257.00	13,926.80	1,062.50	99.50	23,208.40

රූපසටහන 24 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

කෘෂිකාර්මික අංශය නියෝජනය කරන ව්‍යවස්ථාපිත ආයතනයන් වෙත පැවරුණු උක්ත කාර්යභාරය ඉටුකිරීම සම්බන්ධ විගණන පරීක්ෂාවන්හිදී පහත කරුණු අනාවරණය විය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබාගත් ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම අවසන් කිරීම

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලියටගෙන තිබූ ගොඩනැගිල්ලේ අයිතිකාර පෞද්ගලික සමාගම හා කෘෂිකර්ම අමාත්‍යාංශය අතර වූ අංක. 2178 දරන බදු ගිවිසුමෙහි, බදු ගිවිසුම් කාලය අවසන් වීමට පෙර අවශ්‍ය වුවහොත් බදු ගැනුම්කරුට සහ බදු දීමනාකරුට ගිවිසුම අවසන් කළ හැකි ආකාරය සම්බන්ධයෙන් වන කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත්ව නොතිබීම නිසා වසර 5 කට කුලියටගෙන තිබූ ගොඩනැගිල්ල සිව්වැනි අවුරුද්දේදී ආපසු භාර දෙන අවස්ථාව වනවිට ඉතිරිව තිබූ බදු කාලයට සමානුපාතිකව කුලී ප්‍රමාණයක් අඩු කර ගැනීමට තිබූ අවස්ථාව අහිමිවීම හේතුවෙන් ගොඩනැගිල්ල භාවිතා නොකළ කාලපරිච්ඡේදයට අදාළව රු. මිලියන 310.94 ක බදු මුදලක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.

බදු දේපළෙන් ඉවත්වීමේදී, බදු කාලය තුළ බදුගැණුම්කාර පාර්ශවයෙන් බදු ගොඩනැගිල්ලට සිදුවී ඇති හානිය සම්බන්ධයෙන් දෙපාර්ශවයේ එකගත්වයෙන් සුදුසු තාක්ෂණික ආයතනයක් මගින් අලාභානි වාර්තාවක් කැඳවිය යුතු බවට ගිවිසුම තුළ කොන්දේසි ඇතුළත්කර නොතිබුණි. බදු කාලය තුළ බදුගැණුම්කාර පාර්ශවයෙන් බදු ගොඩනැගිල්ලට සිදුවී ඇති හානිය තක්සේරු කිරීමට අමාත්‍යාංශයෙහි ඉංජිනේරු අංශයේ හා තක්සේරු දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් එක්ව 2021 මාර්තු, අප්‍රේල් කාලය තුළ සිදුකර තිබූ පරීක්ෂාව සඳහා සහභාගී වන ලෙස බදු දීමනාකාර පාර්ශවය වෙත දැනුම්දී තිබුණද, ඔවුන් අදාළ පරීක්ෂාව සඳහා සහභාගීවීම ප්‍රතික්ෂේපකර තිබුණු අතර කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි නිලධාරීන් විසින් සිදුකර තිබූ තක්සේරුවට අනුව ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය රු.මිලියන 12.71 ක් ලෙසත් බදු දීමනාකාර සමාගම විසින් සිදුකර තිබූ තක්සේරුවට අනුව ගොඩනැගිල්ලට සිදුවූ හානිය රු. මිලියන 28.25 ක් ලෙසත් තක්සේරුකර වාර්තා සකස් කර තිබීම හේතුවෙන් පාර්ශවයන් අතර හානි පාඩු සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයන් නිර්මාණය වී තිබීම හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට රු. මිලියන 15.54 ක වැඩිපුර බැරකමක් ඇතිවීමේ අවදානමක් නිර්මාණය වී තිබුණි.

ගිවිසුම් කොන්දේසි අංක II අනුව, ගිවිසුම අවසන්වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනා කරු විසින් රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල බදුගැණුම්කරු වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. එහෙත් බදු ගැණුම්කරු බදු දේපළ භාරදී ගිවිසුම අවසන් කිරීමට ක්‍රියාකරන ලද සෑම අවස්ථාවකදීම බදු දීමනාකාර පාර්ශවය ඊට එරෙහිවීම හා ගිවිසුමේ මූලික කොන්දේසි වලට අනනුකූලව ක්‍රියාකරමින් ඇති නිසා උක්ත තැන්පතුව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

“ජීව තුරු උදාන“ ජාතික වැඩසටහන

ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 5 ට අඩු ළදරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව “ජීව තුරු උදාන“ ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා 2021 මැයි 04 දිනැති අංක. අමප/21/0689/323/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සහයෝගයෙන් සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසමකින්ම තෝරාගත් ප්‍රතිලාභි පවුල් 100 ක් වන පරිදි මුරුංගා පැළ දසලක්ෂයක් ගෙවතු දසලක්ෂයක සිටු වීම සඳහා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයේ ආහාර සුරක්ෂිතතාවය වැය විෂයෙන් (425-2-3-004-2509) රු.මිලියන 55.62ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 41.96 ක් පිරිවැය වූ මුරුංගා පැළ 999,211 ක් බෙදා හැර තිබුණි. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 අප්‍රේල් 05 දිනැති අංක. 03/2021 දරන චක්‍රලේඛය මගින් ඉහත සඳහන් ප්‍රතිලාභි පවුල් වල ගෙවතු දසලක්ෂයක මුරුංගා පැළ සිටුවීමට උපදෙස් ලබා දී ඇතත්, චක්‍රලේඛ

විධිවිධානයන්ට පටහැනිව රු. මිලියන 2.35 ක් වටිනා පැළ 56,025 ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි.

කෘෂිකර්ම වී හා ධාන්‍ය කාබනික ආහාර එළවළු, පළතුරු, මිරිස් හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය මගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 21 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර මුරුංගා පැළ 418,363 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන 516 ක් සඳහා බෙදා දීම වෙනුවෙන් රු.මිලියන 17.59 ක් හා දැනුවත් කිරීම් වෙනුවෙන් රු.මිලියන 0.35 ක් වැයකර තිබුණි. මෙම වැඩසටහනේ අරමුණු ලඟාකර ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය නිසි අධීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර බස්නාහිර පළාත තුළ සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී බෙදා දීමට තිබුණු පැළ නිසියාකාරව බෙදා නොදීම, ගොවිජන සේවා මධ්‍යස්ථානවල පැළ මැරීම, පැළ ලබාගත් පුද්ගලයින් එම පැළ නිසියාකාරයෙන් සිටුවා නඩත්තු නොකිරීම සහ ලබාදුන් පැළ සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 17.94 ක් අනාර්ථික ලෙස දරා ඇති බව විගණනයට අනාවරණය විය.

කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය හා ගොවීන්ට දිරිදීමනා ලබාදීමට අදාළ ප්‍රචාරණ වියදම්

කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය හා ගොවීන්ට දිරිදීමනා ලබාදීම සම්බන්ධව ගොවිජන සේවා මධ්‍යස්ථානවල කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් මාර්ග ගත ක්‍රමයට (Online) පුහුණු කිරීම සිදුකර තිබියදී, කාබනික පොහොර නිෂ්පාදනය භාවිතය හා දිරිදීමනා ගෙවීම් සම්බන්ධව දැනුවත් කිරීමේ රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මාධ්‍ය ආයතන 06 කට රු. මිලියන 21.66 ක මුදලක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ ගොවීන් හට වර්ෂාව අඩු කාලවලදී වගාවන් සඳහා අවම ජල ප්‍රමාණයකින් වගා කිරීමට සහ වර්තමානයේ පවතින බලශක්ති අර්බුදයට විසඳුම් ලෙස සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සඳහා 2005 – 2008 වර්ෂවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රු. මිලියන 2,327.27 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම ප්‍රතිපාදනවලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට සූර්යබල සූක්ෂම ජල පද්ධති 7,231 ක් ලබා දී තිබුණි. මෙම පද්ධතීන් සඳහා 2018 වර්ෂය අවසන් වන විට සියලුම මුදල් අයකර අවසන් කළ යුතු වුවද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු කොමසාරිස් ජනරාල් අමතන ලද 2020 ජූලි 03 දිනැති ලිපිය අනුව වර්ෂය අවසානයට අයවිය යුතු මුදල රු. මිලියන 2,264.75 ක් විය. 2022 වර්ෂය වන විට ගොවි බැංකු වල රඳවා තිබුණු මුදලින් රු.මිලියන 4.17 ක මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ගෙවා තිබුණි. තවදුරටත් ගොවීන්ගෙන් අය

කළ කිළිනොච්චිය, බදුල්ල සහ යාපනය යන දිස්ත්‍රික් කාර්යාලවල ගොවි බැංකුවල රු. මිලියන 1.85 ක මුදලක් රඳවාගෙන තිබුණි. 2022 වර්ෂය වන විට ලබා දී තිබුණු පද්ධතිවලින් සියයට 90 ක් අස්ථානගතව, අභාවිතව, ගොවීන්ගේ තොරතුරු සොයාගත නොහැකිව සහ අක්‍රියව පැවති බව නිරීක්ෂණය වූයෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

පුරන් කුඹුරු අස්වැද්දවීමේ විශේෂ වැඩ සටහන

පුරන් කුඹුරු අස්වැද්දවීමේ විශේෂ වැඩ සටහන යටතේ 2020/21 වර්ෂයේදී රු.මිලියන 25 ක් ණය මුදලක් ලෙස ගොවීන්ට ප්‍රදානය කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල වෙත නිදහස්කර තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාල විසින් එම මුදලින් රු.මිලියන 10.52 ක් ගොවීන් වෙත ලබා දී නොතිබුණි.

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

2019 සිට 2021 වර්ෂ 03 කාල සීමාව තුළදී මණ්ඩලය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුව ආහාර තාක්ෂණ ඒකකය මගින් සිදුකළ මව්පෝෂ ව්‍යාපෘතිය, සුවපෝෂ ව්‍යාපෘතිය, තෝසේ පිටි නිෂ්පාදන ව්‍යාපෘතිය, සෝයා ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය, පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති සියල්ලම යන්ත්‍ර අක්‍රිය වීම හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලු නිසා නතර කර තිබුණි.

1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කිරීම වෙනුවෙන් 2017 සහ 2018 වර්ෂවලදී රු.මිලියන 3.37 ක වියදමක් දරා තිබුණු අතර එම පස් අධිවේගී මාර්ගවලට විකිණීමෙන් රු.මිලියන 81.13 ක ආදායමක් ලබාගෙන තිබුණි. පස් ඉවත් කිරීමේ වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර රු.මිලියන 77.76 ක් ස්ථාවර තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි.

රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගම

පසුගිය වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දෙන ලද පරිදි පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3,000 ක් Global Gap සහතිකකරණ ක්‍රමවේදයට අනුව 2018/2019 වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතකරණය ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීමේ හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන පිහිට වූ රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රු. මිලියන 5.9 ක පොලී රහිත ණයක් ලබා දී තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මස වන විට ගෙවිලියන්

ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් GAP (Good Agriculture Practice) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කළද 2021 දෙසැම්බර් වන විටත් එකදු ගෙවිලියක් හෝ අපේක්ෂිත මට්ටමට ළගා වී නොතිබුණු අතර භාරකාර අරමුදල විසින් ලබා දුන් ණය මුදලද මෙතෙක් අයකරගෙන නොතිබුණි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු උපයෝජනය නොවන වතුයායන්

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හෙක්ටයාර ලේඛනය අනුව 2021 දෙසැම්බර් 31 දිනට , තේ හා අනෙකුත් භෝග වගා කරන වතු 15ට අදාළව පවතින මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 10,164 ක් වන නමුත්, ඉන් භාවිතා කර ඇති ප්‍රමාණය හෙක්ටයාර 4790 ක් පමණක් බව නිරීක්ෂණය විය. ඉන් තේ වගාව සඳහා හෙක්ටයාර 3573 ක්ද, අනෙකුත් වගාවන් සඳහා හෙක්ටයාර 1217 ක්ද භාවිතා කර තිබුණි. ඉතිරි භූමි ප්‍රමාණය වන හෙක්ටයාර 5374 ක් එනම් සියයට 53 ක ප්‍රමාණය ඌන උපයෝජනය වී ඇති බව දක්නට ලැබුණි. එම ඌන උපයෝජිත ඉඩම්වල වගා කිරීමට හෝ බාහිර පාර්ශවයන්ට බද්දට දීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. තවද, හෙක්ටයාර වාර්තාවට (Hectarage Statement) අනුව 2021 දෙසැම්බර 31 දිනට රබර් වගාකරන භූමි ප්‍රමාණය හෙක්ටයාර 770 ක් වන අතර, එය රබර් වගාවට වෙන් කරන ලද මුළු භූමි ප්‍රමාණය වන හෙක්ටයාර 2167 න් සියයට 35.5 ක් වැනි අඩු ප්‍රමාණයක් වන බව නිරීක්ෂණය විය. කුමාරවත්ත හා දියළුම යන වතුයායන්හි රබර් වගා කරන අතර, රබර් වගා කර ඇති භූමි ප්‍රමාණයෙන් දියළුම වතුයායේ වගාකර ඇති ප්‍රමාණය සියයට 15 ක් වැනි පහළ අගයක් ගෙන තිබුණි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු උපයෝජනය නොවන වත්කම්

ජනතා වතු සංවර්ධන මණ්ඩලය තුළ සමාලෝචිත වර්ෂය අවසන් වන විට වතුයායන් 15 හි තේ කර්මාන්තශාලා 15 ක් හා රබර් කර්මාන්තශාලා 2ක් පවතින නමුත් වර්තමානය වන විට ක්‍රියාකාරී කර්මාන්තශාලා ගණන 7 කි. ඉන් කර්මාන්තශාලා 4 ක් බාහිර පාර්ශවයන්ට බදු දී ඇති අතර, ඉතිරි කර්මාන්තශාලා 3 පමණක් මණ්ඩලයේ වතුයායන්හි තේ දළු සැකසීමේ කටයුතු සඳහා භාවිතයට ගෙන තිබුණි. ඉතිරි ධාරිතාවය 77,000 ක් වන තේ කර්මාන්තශාලා 8 වර්තමානය වන විට අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. මීට පෙර විගණන විමසුම් මඟින්ද මේ පිළිබඳ දක්වා තිබූ නමුත් මෙම අක්‍රීය කර්මාන්තශාලා අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර නොතිබුණි. මේ හේතුවෙන් වතුයායන්හි තේ දළු බාහිර පාර්ශවයන්ට විකිණීමට සිදු වී ඇත. තවද, අක්‍රීයව පවතින කර්මාන්තශාලා අබලන්ව පවතින අතර මෙම කර්මාන්තශාලාවල පවතින වටිනා යන්ත්‍රසූත්‍ර දිරායමින් පවතින බව නිරීක්ෂණය විය. කුමාරවත්ත හා දියළුම වතුවල පවතින රබර් කර්මාන්තශාලා දෙක ද වර්තමානය වන විට අක්‍රීය තත්ත්වයේ පවතී.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය

විගණන නිරීක්ෂණ

- සැලසුම් කරන ලද කාර්යයන්
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය හා පසුවිපරම
- අපේක්ෂිත අරමුණු ඉටු නොවීම
- වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබීම

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය

මත්ස්‍ය පරිභෝජනය වැඩිකිරීම මගින් ඉහළ පෝෂණ මට්ටමක් සහිත ජනතාවක් ඇති කිරීමත්, ඉහළ විදේශ විනිමය ඉපයීමක් ලබාදීමත් හා ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා වැඩි කිරීමෙන් ධීවර ප්‍රජාවට උසස් ජීවන මට්ටමක් ලබාදීමත්, මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂිත ප්‍රතිඵල වී තිබුණි. එම ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය, විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 6 ක් විසින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටු කළ යුතුව තිබුණි.

- වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත නව ධීවර වරායන් ඉදිකිරීම.
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම.
- ටින් මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරි ගැන්වීම .
- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම.
- උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම.
- ධීවර ප්‍රජාව සඳහා ඵලදායි බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.
- සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම.
- අපනයනය වෙළඳපල ඉලක්ක කර ගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- වැව් කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම.
- මහා පරිමාණ බෝට්ටුවල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම.
- බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම.
- නවීන සංනිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියළුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම.

- මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහන් ආරම්භ කිරීම.
- පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
- ධීවරයින් සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීම සඳහා ධීවර අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 9,214 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 7,158 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 2,056 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 25 හි දැක්වේ.



	ධීවර අමාත්‍යාංශය	විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන	4,177	4,226	811	9,214
වියදම රු.මිලියන	3,158	3,261	739	7,158
ඉතිරිය රු.මිලියන	1,019	965	72	2,056

රූපසටහන 25 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම
මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ධීවර අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සැලසුම් කරන ලද කාර්යයන්

- ධීවර අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව මඟින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 9 ක් හඳුන්වා දී තිබුණ ද 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම, ධීවර වරායන් නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත ධීවර වරායන් ඉදිකිරීම හැර අනෙකුත් කාර්යයන් වන වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වාදීම, අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම, ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම, නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම, උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම, ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම හා සාගර විශ්ව විද්‍යාලය භාවිතාකර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර නොතිබුණි. උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යය වෙනුවෙන් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා තීරණ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට පමණක් කටයුතු කර තිබුණි.

- විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව මඟින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 8 ක් හඳුන්වා දී තිබුණ ද 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව වැව්, කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම සහ මහ පරිමාණ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම හැර අනෙකුත් කාර්යයන් වන අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, බහුදින ධීවර

යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම, නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම, මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝකිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහන් ආරම්භ කිරීම, පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම හා ධීවරයින් සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම යන කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය හා පසුවිපරම

- ධීවර අමාත්‍යාංශය සතු වත්කමක් ද නොවන 2021 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි ද ඇතුළත් නොවන හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ධීවර අමාත්‍යාංශයේ කලපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීමේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 39.012ක් වැයකර තිබු බැවින් කලපු සංරක්ෂණ හා සංවර්ධනය කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනවන විට එම නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 22 ක් පමණක් වූ අතර භෞතික ප්‍රගතිය විගණනයට අනාවරණය නොවීය.

- ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ නව තාක්ෂණය හඳුන්වාදීමේ වැය විෂයය මඟින් නාරා ආයතනය වෙත රු.මිලියන 10.13 ක් වැය කර තිබුණ ද නව තාක්ෂණය හඳුන්වාදීම මඟින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට හා මසුන් නිෂ්පාදනයට වැය වන ගමන් කාලය අඩු කිරීමට හඳුන්වා දුන් තාක්ෂණ ක්‍රම භාවිතය පිළිබඳ පසුවිපරමක් ධීවර අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.

- 2021 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නාරා ආයතනය වෙත ධීවර අමාත්‍යාංශය විසින් රු. මිලියන 20.28 ක් ලබා දී තිබූ අතර එයින් රු. මිලියන 12.04 ක මුදලක් වියදම් කර තිබුණි. එයට අදාළ වියදම් විස්තර ඉදිරිපත් කර නොතිබිය දී හා කාර්යක්ෂමතාව පිළිබඳව පසුවිපරමක් හෝ ඇගයීමක් සිදු නොකර, ව්‍යාපෘති අවශ්‍යතාවයක් ද හඳුනා නොගෙන නැවත රු.මිලියන 4.9 ක් නාරා ආයතනයට ලබා දී තිබුණි.

- 2021 වර්ෂයේ සංවර්ධන සහායන් හා නව තාක්ෂණය හඳුන්වාදීමේ වැය විෂයය මඟින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රු. මිලියන 8.51 ක් වැයකර ටැබ් යන්ත්‍ර 110 ක් මිලදී ගෙන තිබුණු අතර ඒවා බෙදා දුන් ආකාරය හෝ

එමඟින් අපේක්ෂිත කාර්යයන් ඉටුවීම පිළිබඳව පසුවිපරමක් හෝ ඇගයීමක් ධීවර අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි.

- කලපු 10 ක් හා වැව් 100 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ රු.මිලියන 1000 ක මුදලින් යන්ත්‍ර 03 ක් මිලට ගැනීම සඳහා රු.මිලියන 180 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණි. අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ ලංසුව කිසිම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේපකර ඊට පරිබාහිර අයකු තෝරාගෙන ලංසු ප්‍රදානය කර 2018 ජූලි 17 දින රු. මිලියන 42.57 ක සංචලන අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එම සංචලන අත්තිකාරමට අදාළව ලබා දී තිබුණු අත්තිකාරම් සුරක්ෂණය ව්‍යාජ ලෙස සකස් කළ එකක් බව මාස 6 කට පසුව හඳුනාගෙන අදාළ අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන තිබුණ ද ව්‍යාජ අත්තිකාරම් සුරක්ෂණ ඉදිරිපත් කර වංචනිකව රජයේ මුදල් අවභාවිතා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර හෝ සැපයුම්කරුට එරෙහිව කිසිඳු නීතිමය පියවරක් ගෙන නොතිබුණු අතර මුදල් රෙගුලාසි 705 ප්‍රකාරව සැපයුම්කරු අසාදු ලේඛනගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

- උක්ත උපකරණයේ ව්‍යුහගත සැලසුම්, භාවිතා කළ අමුද්‍රව්‍ය, අමතර කොටස් සහ එංජිම ආදී කරුණු පරීක්ෂා කිරීමට අමාත්‍යාංශයේ හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ද ඇතුලුව නිලධාරීන් 4 දෙනෙකු ඇමරිකා එක්සත් ජනපදයේ විදේශීය සංචාරයකට සහභාගි වීම වෙනුවෙන් රු.435,499 ක් ගෙවා තිබුණත් අදාළ යන්ත්‍ර ලැබී නොතිබුණු හෙයින් අමාත්‍යාංශය විසින් ඉලක්ක කරන ලද කාර්යභාරය වර්ෂ 4 ක් ගතව ඇතත් ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

- දොඩන්දූව ධීවර වරාය සංවර්ධනයට 2021 වර්ෂය සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද රු.මිලියන 25 ක මුදලින් ඉලක්ක කළ මීටර 60ක් පහලට ජැටි බිත්තිය (Quay Wall) ඉදිකිරීමේ කාර්යය සඳහා රු.මිලියන 7.63ක් පමණක් වැයකර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ කාර්යයේ භෞතික ප්‍රගතිය ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

- ගොඩබෑමේ ස්ථාන හා නැංගුරම්පළවල් 8 ක් සංවර්ධනයට රු.මිලියන 18 ක් වෙන්කර තිබුණ ද මූලික වියදම් සඳහා රු.මිලියන 1.9 ක් පමණක් වැය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 11 ක් පමණක් වූ අතර භෞතික ප්‍රගතිය අනාවරණය නොවීය.

- ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ඇති කිරීම සඳහා අදාළ නීතිරීති හා අණ පනත්වලට අනුකූලව ජාතික අයවැය හා රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන

වැඩපිළිවෙළ යටතේ ධීවර රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාවස්ථාපිත ආයතනයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම් කිරීම රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් යටතේ දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය, ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව හා ලංකා ධීවර සංස්ථාව යන ව්‍යාවස්ථාපිත ආයතනයන් සඳහා වෙන්කළ රු.මිලියන 2,441.45 ක මුදලින් රු.මිලියන 1,742.97 ක මුදලක් වැයකර තිබුණද රාජ්‍ය අමාත්‍යාංශය විසින් ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ඇති කිරීමට දායක කරගන්නා ව්‍යාවස්ථාපිත ආයතනවල කාර්යයන්හි නිමැවුම ප්‍රමාණාත්මකව හඳුනා ගැනීම, පසුවිපරම් කිරීම හා ඇගයීම් කිරීම සිදුකර නොතිබුණි.

අපේක්ෂිත අරමුණු ඉටු නොවීම

හම්බන්තොට ධීවර වරාය සංවර්ධනයට 2021 වර්ෂය සඳහා රු.මිලියන 20ක ප්‍රතිපාදන සලසා තිබුණ ද රු.මිලියන 9 කට අදාළ කාර්යයක් පමණක් සැලසුම්කර රු.මිලියන 1.05 ක් වැයකර තිබූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

නව තාක්ෂණය හඳුන්වාදීම යටතේ මත්ස්‍ය ගහනය වැඩි කිරීමේ අරමුණින් සමුද්‍රීය පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අතහැර දැමූ ධීවර යාත්‍රා, බස්රථ, දුම්රිය මැදිරි යොදාගෙන ගිල්වීමේ ව්‍යාපෘතිය ත්‍රිකුණාමලය, යාපනය, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්කවල 2020 ජූලි මාසයේ දී ආරම්භ කර 2021 දෙසැම්බර් අවසන් කර තිබුණු අතර ඒ සඳහා ඉකුත් වර්ෂය තුළදී හා සමාලෝචිත වර්ෂය තුළ දී ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ධීවර වරාය නීතිගත සංස්ථාවට රු.මිලියන 18.27 ක්ද, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට රු.මිලියන 10.95 ක්ද ගෙවා තිබුණ ද ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකර නොතිබූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේ ද යන්න අනාවරණය නොවීය.

වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබීම

2020 අගෝස්තු 28 දිනැති අංක. 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

කර්මාන්ත අංශය

විගණන නිරීක්ෂණ

- කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර
- රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (CERA)
- ලංකා ඛනිජ වැලි සමාගම
- බී.සී.සී ලංකා සමාගම
- පරන්තන් කෙමිකල් සමාගම
- ලංකා පිඟන් සංස්ථාව
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
- ජාතික ශිල්ප සභාව
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

කර්මාන්ත අංශය

කර්මාන්ත විවිධාංගීකරණයක් හරහා දේශීය, කලාපීය හා ජාත්‍යන්තර සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් ගෝලීය තරඟකාරිත්වය තුළ සාපේක්ෂ ලාභයන් වෙත ළඟාවීම සඳහා දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නවීන ක්‍රමෝපායන් හරහා ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම මෙම ක්ෂේත්‍රයන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව තිබුණි.

- සියළුම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු අදාළ ආයතන සමඟ ඒකාබද්ධව නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාක්මක කිරීම.
- ආනයන අපනයන ක්‍රියාවලිය බාධාවකින් තොරව සහ අවම කාලයක් වැයවන පරිදි කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා "තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්" ස්ථාපනය කිරීම.
- අපනයන ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියළු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- පවත්නා කර්මාන්තයන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත්, ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්තයන් යළි නඟා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමක් කිරීම සඳහා වැඩපිළිවෙක් සැකසීම.
- දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව එරාවූර් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ඇඟළුම් කර්මාන්තපුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් ලබාදීම.
- දැනට භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණය භාවිත කර ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමක් කිරීමට යොදා ගැනීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් වෙත රු.මිලියන 8,539 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 6,124 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු.මිලියන 2,415 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර රූපසටහන 26 හි දැක්වේ.



	කර්මාන්ත අමාත්‍යාංශය	වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය	4,275	3,239	1,025	8,539
වියදම	3,227	2,213	684	6,124
ඉතිරිය	1,048	1,026	341	2,415

රූපසටහන 26 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් ඉහත කාර්යභාරයන් ඉටුකිරීමට පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත විශේෂ කරුණු අනාවරණය විය.

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර

- අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර 33 හි ඇති ඉඩම් කට්ටි 1001කින් ඉඩම් කට්ටි 791 ක් විවිධ ආයෝජන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට ලබා දී තිබූ අතර ඉඩම් කට්ටි 78ක් (මධ්‍යම පළාතේ නාලන්ද හිස් ඉඩම් කට්ටි 09 හා උතුරු පළාතේ කට්ටි 23 හැර) නිශ්කාර්යව පැවතිණි. මධ්‍යම පළාතේ නාලන්ද කර්මාන්තපුරයේ මුළු බිම් කට්ටි 38න් 08ක් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව 2018 වර්ෂයේ සිට කර්මාන්ත පවත්වාගෙන යන අතර උතුරු පළාතේ ඉඩම් කට්ටි 31 න් 08ක් පමණක් කර්මාන්තකරුවන්ට ලබා දී තිබුණි. අමාත්‍යාංශය විසින් 1997 වර්ෂයේ සිට කර්මාන්තපුරයන්හි රු.මිලියන 105.878ක් පමණ වැයකර ඉදිකළ පරිපාලන ගොඩනැගිලි 14 හි වටිනාකම කිසිදු මූල්‍ය ප්‍රකාශනයක ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර දකුණු පළාතේ බටඅත කර්මාන්තපුරයේ ඉදිකරන ලද පරිපාලන ගොඩනැගිල්ල මේ වන විට භාවිතයට ගත නොහැකිව අබලන් තත්ත්වයේ පැවතිණි.

- මිනුවන්ගොඩ කර්මාන්තපුරයෙන් අක්කර 2ක භූමි ප්‍රමාණයක් 2002 වර්ෂයේ දී

ජපානයෙන් ගෙන්වන ලද වාහන කොටස් එකලස් කිරීමේ කටයුතු වල නිරත සමාගමකට ලබා දී තිබුණි. එසේ වුවද වසර 9කට ආසන්න කාලයක් මෙහි ව්‍යාපාර කටයුතු නවතා දමා තිබුණු අතර බදු ඔප්පුවක් ලබාදී නොමැති බැවින් විශාල බදු මුදලක් අයවීමට ද තිබුණි. ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී මෙම ස්ථානයේ වාහන එකලස් කිරීම සිදුකරමින් නොපැවති අතර වර්ග අඩි 3000 ක පමණ ගොඩනැගිලි 2ක් නිශ්කාර්යව පැවතිණි.

- මහර කර්මාන්තපුරයේ පර්චස් 49.5කින් යුත් බිම් කට්ටිය 2007 වර්ෂයේ දී වානේ සහ දැවමය නිවාස සහ කාර්යාලීය ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගමකට ලබා දී තිබුණු අතර ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී ව්‍යාපෘති වාර්තාවේ ඉදිරිපත් කරන ලද ව්‍යාපාර කටයුතු සිදු නොවන බවත් සේවකයින් 100 වෙනුවට තිදෙනෙකු පමණ ව්‍යාපාර කටයුතු වල යෙදෙන බවත් ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොකෙරෙන බවත් 2007 වසරේ සිට බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බවත් අනාවරණය විය.

රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (CERA)

අමාත්‍ය මණ්ඩල තීරණ අංක. 039/723/1424/16 අනුව ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින්, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාළව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය හා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු.මි.120ක් පමණ වැය කර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් නවීකරණය කරන ලද ගොඩනැගිල්ල හා මිලදී ගෙන තිබූ යන්ත්‍ර සූත්‍ර වර්ෂ 2017 සිට 2022 දක්වා වර්ෂ 05කට අධික කාලයක් නිශ්කාර්යව හා සමහර භාණ්ඩ මළ බැඳෙමින් හා විනාශ වෙමින් පවතින බව නිරීක්ෂණය විය. එසේ වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවාගෙන තිබූ විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් මස සිට මසකට රු.725,000 බැගින් මාස 11ක කාලයක් සඳහා වැටුප් හා දීමනා ලෙස රු.මි.11ක් පමණ ගෙවා තිබුණි.

ලංකා ඛනිජ වැලි සමාගම

- සමාලෝචිත වර්ෂයේ දී ඉල්මනයිට්, හයිටයි ඉල්මනයිට්, රූටයිල් හා ස(ර්)කෝන් අයවැයගත නිෂ්පාදනය ලබා කර ගැනීමට ඛනිජ වැලි සමාගමට නොහැකි වී තිබුණු අතර Low Grade Zircon crude, Final Talien, Hydro sized Fines සහ හයිටයි ඉල්මනයිට් වලින් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. එසේම ඇස්තමේන්තු ආදායමට වඩා Rutile සියයට 85 කින් හා Zircon සියයට 75කින් අඩු වී තිබුණි. හයිටයි ඉල්මනයිට් කිසිදු අලෙවියක් සිදු නොවීම හේතුවෙන් එම ගබඩා පිරීයාම නිසා අනාරක්ෂිතව එළිමහනේද ගොඩගසා පැවතිණි. 2021 වර්ෂයට අදාළව ටෙන්ඩරයක් මඟින් ඉල්මනයිට් විකුණුම් සිදු වී නොතිබුණු අතර 2020 ඔක්තෝබර් 28 දිනැති මෙ.ටොන් 85,000ක ටෙන්ඩරයේ ඉතිරි මෙ.ටොන් 79,947 ක ප්‍රමාණයක්

සමාලෝචිත වර්ෂයේ දී අලෙවිය ලෙස සටහන් කර තිබුණි. ලංසුකරු සමඟ එළඹී ගිවිසුමෙහි 5වන කොන්දේසියට අනුව දින 130ක් ඇතුළත තම තොගය කොටස් 4කින් (මෙ.ටො.25,000, 20,000, 20,000, 20,000) නිදහස් කරගත යුතුව තිබුණ ද එය 2021 අගෝස්තු 15 දක්වා වීමෙන් තවත් වැඩිපුර දින 150 ක පමණ ප්‍රමාදයක් සිදුවී තිබුණි. එසේම ඇ.ඩො. 12,495,000ක් වූ ටෙන්ඩරයේ දෙවන හා තුන්වන මුදල් ගෙවීම් ප්‍රමාද වුවද හතර වන ගෙවීම වෙනුවෙන් පමණක් ප්‍රමාද ගාස්තු වශයෙන් රු.මිලියන 1.108ක් අදාළ මිලදී ගැනුම්කරුගෙන් අය කරගෙන තිබුණි. ගැනුම්කරු විසින් ඉල්මනයිට් තොගය නිසි පරිදි ඉවත් කර නොගැනීම හේතුවෙන් හා ගබඩා වල ධාරිතාවය ඉක්මවා ගොස් තිබීම නිසා 2021 මාර්තු දක්වා " Block B " යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු නවතා දමා තිබීම නිසා යන්ත්‍රාගාරයේ සියලුම කටයුතු ඇනහිට තිබුණි. මේ නිසා මානව සම්පත් ඇතුළු සියළුම සම්පත් නිශ්කාර්ය වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ දී වටිනාකම රු.මිලියන 403.42ක ස්ථාවර තැන්පතු 4ක් කල් පිරීමට පෙර මුදල් කර ගැනීම හේතුවෙන් ලැබීමට තිබූ රු.මිලියන 1.476ක පොලී ආදායමක් සමාගමට අහිමි වී ගොස් තිබුණි. එසේම 2021 ජනවාරි 01 දිනට වටිනාකම රු.මිලියන 2,293.5ක් වූ ස්ථාවර තැන්පතු සමාගම සතු වූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය රු.මිලියන 1,500 ක් ද 2022 ජූනි වන විට රු.මිලියන 1,300 ක් ද වී තිබුණි. මින් රු.මිලියන 500ක් ආනයන සඳහා ඇප වශයෙන් තැබීමෙන් ශේෂය රු.මිලියන 800 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඛනිජ වැලි අලෙවිය සිදු නොවීම නිසා සමාගම පවත්වාගෙන යාමට අවශ්‍ය වියදම් පියවා ගැනීමට මෙම ස්ථාවර තැන්පතු මුදල් කරගෙන තිබුණි.

- ඉතා පොහොසත්, බර ඛනිජ සංයුතියක් කෝකිලායි කලපුව ආශ්‍රිතව පවතින බව ගවේෂණ වාර්තා මඟින් හෙළිවීමෙන් පසු මෙහි නව යන්ත්‍රාගාරයක් ඉදිකිරිමට සැලසුම් කර රු.මිලියන 2.25ක මුදලකට හෙක්ටයාර් 17.69ක ඉඩමක් 2013 වර්ෂයේ දී මෙම ප්‍රදේශයෙන් මිලදී ගෙන තිබුණි. ඉඩම නිසි පරිදි පවරාගෙන නව යන්ත්‍රාගාරයක් ඉදිකිරීමටත් පෙර 2013 අගෝස්තු මස ඒ සඳහා අවශ්‍ය රු.මිලියන 39.34ක් වටිනා වත්කම් මිලදී ගෙන එම වත්කම් සියල්ල පුල්මුඩේ යන්ත්‍රාගාරයේ වෙනත් ස්ථානවල ස්ථාපිත කර නිශ්කාර්යව තිබූ අතර, ඇතැම් යන්ත්‍ර ගබඩාවේ නිශ්කාර්යව ගොඩ ගසා තිබුණි. Block A පැරණි යන්ත්‍රාගාරයේ සවිකර තිබූ කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගන්නා ලද Spiral 24 ක් 2013 වර්ෂයේ සිට නිශ්කාර්යව පවතින අතර Block A නව යන්ත්‍රාගාරය ක්‍රියාත්මක කිරීමේ දී ගලවා දමා එළිමහනේ අනාරක්ෂිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා බලපත්‍ර ලබාගැනීමේ අපහසුව තිබියදී හා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර 2015 ජූනි 25 දින සේවකයන් 117

දෙනෙකු බඳවාගෙන පසුව පුල්මුඩේ යන්ත්‍රාගාරයේ විවිධ ස්ථාන සඳහා ඔවුන්ව අනුයුක්ත කර තිබුණි. මේ නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් තිබුණි.

- කෝකිලායි හි නව යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 1000ක් වෙන් කර තිබුණද 2022 ජූනි අවසන් වන විටත් ව්‍යාපෘති යෝජනාව (Project Report) සකස් කිරීම නිම කර කැබිනට් අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2022 ජනවාරි 01 දින කෝකිලායි ප්‍රදේශයේ සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී එහි පස් පිරිවීම් කටයුතු සිදු කරමින් පැවති අතර ව්‍යාපෘති යෝජනාව සකස් කර නොමැති නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 17.8ක වියදමක් ද දරා තිබුණි.

බී.සී.සී ලංකා සමාගම

- බී.සී.සී සමාගමට අයත් අක්කර 12 රූඩ් 3 පර්චස් 8.77ක් වූ භූමි ප්‍රමාණයෙන් 2015 දෙසැම්බර් 17 දිනැති අංක 15/1874/702/010-VII දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් සහ 2016 අප්‍රේල් 20 දිනැති අංක 16/0597/731/009-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අක්කර 6ක බිම් කොටසක් කොළඹ අධිකරණ පියස ඉදිකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණද, රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ පටිපාටිය අනුව ඉඩම් පැවරීම හා වන්දි ලබා ගැනීමේ කටයුතු මේ දක්වා නිම වී නොතිබුණි.

- 2013 වර්ෂයේ දී රු.මිලියන 8,195කට තක්සේරු කර තිබූ මෙම භූමි භාගය තුළ වර්ග අඩි 118,345කින් යුත් ගබඩා 32ක් හා තෙල් මෙ.ටොන් 3,500ක ධාරිතාවයකින් යුතු තෙල් ටැංකි 3ක් පැවතිණි. මෙම ගබඩා වර්ග අඩියක් රු.55ත් - 70ත් අතර මුදලකට කුලියට දී තිබූ අතර වර්ග අඩි 5,140ක් වූ General Stores – First Floor වර්ග අඩියක් රු.30කට ලබා දී තිබුණි. ඉහල වාණිජ වටිනාකමකින් යුතු සමාගම් භූමිය තුළ පවතින මෙම ගබඩා නිසි අළුත්වැඩියාවක් සිදු කර නොමැති වීමෙන් මෙසේ අඩු මුදලකට ලබා දීමට සිදුවී තිබුණි.

පරන්තන් කෙමිකල් සමාගම

- 1986 වසරේ සිට පරන්තන් නිෂ්පාදනාගාරයේ ක්ලෝරීන් නිෂ්පාදනය නවතා දැමීම හේතුවෙන් මෙරටට අවශ්‍ය කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් මුළුමනින්ම ආනයනය මඟින් සපුරාගෙන තිබුණි. පරන්තන්හි පිහිටා ඇති අක්කර 227 ක භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ යෝජනා කර තිබූ අතර 2020 වර්ෂයේ දී ශක්‍යතා අධ්‍යයනයක් හා පරිසර බලපෑම් තක්සේරුවක් කර ඒ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 7.6ක හා රු.මිලියන 2.1ක වියදම් දරා තිබුණ ද යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

- කෝස්ටික් සෝඩා ලයි සඳහා ඇති ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, කෝස්ටික් වටිනාකමක් එකතු කිරීම හා පරන්තන් කෙමිකල්ස් ආයතනයට දැනට ලබාගත නොහැකි වෙළඳපල වෙත ළඟා වීමේ අරමුණින් කෝස්ටික් සෝඩා දියර සෑදීමේ ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් 30 දින කළුතර නාගොඩ කර්මාන්තපුරයේ ආරම්භ කර 2016 අප්‍රේල් 25 දින අවසන් කර තිබුණි. එසේ වුවද මෙම කෝස්ටික් සෝඩා දියර සකසන යන්ත්‍රය යකඩ වලින් සාදා තිබීම නිසා යකඩ හා කෝස්ටික් සෝඩා දියර ප්‍රතික්‍රියා කර යකඩ කෝස්ටික් සෝඩා ලයි සමඟ මිශ්‍ර වී ඒවා අලෙවි කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. මෙම කෝස්ටික් සෝඩා දියර යන්ත්‍රය සැකසීමට පෙර කෝස්ටික් සෝඩා පතුරු සමඟ යකඩ මිශ්‍ර වන බව අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා ආයතනයට රු.මිලියන 2.1ක අලාභයක් සිදු වී තිබුණි.

ලංකා පිඟන් සංස්ථාව

1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රාහක සංස්ථා පනත යටතේ ස්ථාපිත කළ ලංකා සෙරමික් ආයතනය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ පිඟන් සංස්ථාව නමින් ස්ථාපිත කර ඇත. 1990 පෞද්ගලීකරණ වැඩ පිළිවෙල යටතේ උළු ගඩොල් ඒකකය ලංකා පිඟන් සංස්ථාව නමින් දැනට පවත්වාගෙන යනු ලබයි. 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කළ ස්වේච්ඡාවෙන් විශ්‍රාමගැනීමේ යෝජනා ක්‍රමය මඟින් ස්ථිර කාර්ය මණ්ඩලය 32 දක්වා අඩුකර ඇත. සංස්ථාව සතු කම්හල් 9 න් 2022 වර්ෂය වන විට එක් කම්හලක පමණක් නිෂ්පාදන සිදු කරන අතර ඉතිරි සියළු කම්හල් වසා දමා ඇත. ශ්‍රී ලංකාවේ මැටි හා මැටි ආශ්‍රිත නිෂ්පාදනය නම් වූ පුළුල් අරමුණු හා පරමාර්ථ පෙරදැරිව සංස්ථාව සංස්ථාපනය කර තිබුණද පැතලි උළු සහ මුද්‍රන් උළු නිෂ්පාදනයේ නිරතවී සිටීම හැර තරඟකාරීත්වයට මුහුණ දීමට සහ කාලීන අවශ්‍යතා අනුව නිෂ්පාදනවල ස්වරූපය වෙනස් කිරීමට ඉලක්ක වෙළඳපොල අරමුණු කරගෙන, නිෂ්පාදන විවිධාංගීකරණයක් කිරීම සඳහා සංස්ථාව කටයුතු කර නොතිබුණි.

- සංස්ථාව සතු කම්හල් භූමි 09 න් 07 ක ඉඩම් වල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් කම්හල් බදු දීම සම්බන්ධයෙන් 2010 වර්ෂයේ අනුමත කළ අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති අතර කිසිදු නිෂ්පාදනයක් සිදු නොවන කම්හල් 6 සඳහා වාර්ෂිකව නිෂ්පාදන පිරිවැය හා පරිපාලන වියදම් වශයෙන් රු මිලියන 8ක් පමණ වැය කිරීමට සිදුවී තිබුණි. ඔඩ්ඩුසුඩාන් කම්හල සංස්ථාවේ පාලනය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා 2020 ජුලි 09 දිනැති අංක අ.ම.ප/20/0989/224/002-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. 2020 වර්ෂය තුළ රු. මිලියන 3ක් හා 2021 වර්ෂයේ රු.මිලියන 1 ක් අළුත්වැඩියා හා අනෙකුත් වියදම් වශයෙන් දරා තිබුණ ද 2022 ජනවාරි වන විටත් කම්හලේ

නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

- නිෂ්පාදන කටයුතු සිදු කරන එරගම කම්හල සතු අක්කර 231ක් වූ භූමියෙන් අක්කර 50ක පමණ කුඹුරු ඉඩම බාහිර පාර්ශවයකට බදු දී තිබුණ ද කම්හල් භූමිය හා ගඩොල් කපන භූමි ප්‍රමාණය හැර ඉතිරි වූ ඉඩම් ඵලදායී ආයෝජනයට යොදාගෙන නොතිබුණි. දැනටමත් කුඹුරු ඉඩම් වලින් අක්කර 3½ ක් පමණ පෞද්ගලික අයකු විසින් අත්පත් කරගෙන ඇත. අක්කර 94ක් පමණ වූ මහියංගනය ඉඩමෙහි පවුල් 125ක් පමණ 2015 වර්ෂයට පෙර සිට අනවසරයෙන් පදිංචි වී ඇති බැවින් කම්හල් ප්‍රදේශය හැර ඉතිරි බිම් ඵලදායී ආයෝජනයක් වෙනුවෙන් යොදා ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත මඟින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ දැක්ම ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා මඟ පෙන්වීම සහ නායකත්වය ලබාදීම වන අතර මෙහෙවර වශයෙන් රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක සිමෙන්ති සහ අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම වේ. නමුත් වර්තමානය වන විට සංස්ථාව විසින් සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිඳු නිෂ්පාදනයක් සිදුකරනු නොලබයි. සංස්ථාවේ ආදායම් මාර්ග සංස්ථාව සතු අක්කර 5,164ක් වූ අරුවක්කාලු හුණු ගල් නිධිය බදුදීම, පලාවි පිහිටි අක්කර 12ක් රූඩ් 3 පර්චස් 30ක් වූ ඉඩම බදුදීම හා කොල්ලුපිටිය පිහිටි පර්චස් 89.07ක් වූ ඉඩම රථගාලක් පවත්වාගෙන යාමෙන් ආදායම් ඉපයීම පමණක් වේ.

- සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි දෙක හා නළ පද්ධති ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබූ බැවින් 2010 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මේ සඳහා බදු කුලී ආදායම වූ රු. මිලියන 185ක මුදලක් අයකර ගැනීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී ඇත.

- සංස්ථාව හා පුත්තලම සිමෙන්ති කම්පැනි ලිමිටඩ් හෙවත් වර්තමාන සියැම් සිටි සිමෙන්ති ලංකා ලිමිටඩ් අතර 1996 අගෝස්තු 23 දින අත්සන් කරන ලද අංක 495 දරන ගිවිසුම මඟින් අරුවක්කාලු හුණුගල් සහිත ඉඩම වාර්ෂික ස්ථාවර බදු කුලී පදනම මත වසර 50කට බදු දීමට ගිවිසුම් ගතව තිබූ අතර 2019 නොවැම්බර් 07 දින අත්සන් කළ අංක 268 දරණ අතිරේක බදු ගිවිසුම මඟින් සියයට දොළහක බදු කුලිය වැඩිවීමේ ප්‍රතිශතය මත 2019 වර්ෂයේ සිට බදු කුලී ආදායම ඇමරිකන් ඩොලර් 319,118ක් ලෙස වැඩි කර තිබුණි. නමුත් 1993 සිට 2018 දක්වා පළමු ගිවිසුමෙන් අහිමි වූ වාර්ෂික බදු කුලිය ලබා ගැනීම පිළිබඳ තීරණයකට එළඹීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී ඇති අතර අතිරේක බදු ගිවිසුම සඳහා

නීතිපතිවරයාගේ අනුමැතිය මෙම වාර්තාවේ දින වන විටත් ලබාදී නොතිබුණි.

- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වූ පර්චස් 89.07ක් වූ කොල්ලුපිටිය ඉඩම 2008 වර්ෂයේ දී ලංකා බැංකුවට උකස් කර ලබාගෙන තිබූ ණය මුදල 2017 වර්ෂයේ දී රු. මිලියන 97.7කට ප්‍රතිව්‍යුහගත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු. මිලියන 58.7ක් වේ. ලබාගත් මෙම ණය මුදල වෙනුවෙන් 2021 වර්ෂයේ රු.මිලියන 5.5 ක පොලී මුදලක් ගෙවා ඇතත්, එකී ඉඩම බදු දීමෙන් වර්ෂයේ ලද කුලී ආදායම රු. මිලියන 4.8 පමණක් වී තිබුණි. රු.මිලියන 735ක් පමණ වටිනා ඉතාමත් ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් මෙම ඉඩම, 2021 සැප්තැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මිශ්‍ර ආයෝජන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් අවසන් කර නොතිබුණු අතර දේපළ ඵලදායී ආයෝජනයක් සඳහා යොදා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

- රට තුළ පැවති යුද්ධය නිසා නිෂ්පාදන කටයුතු නවතා දැමූ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාවේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්තශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමට අංක අමප/21/0175/320/004 හා 2021 පෙබරවාරි 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් තීරණය කර තිබුණි. ඊට සමගාමීව අංක PFD/PMD/01/CM/2021/041 හා 2021 පෙබරවාරි 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කර්මාන්ත ශාලාවේ සුන්බුන් යකඩ හා ලෝහ පිළිබඳ අයිතම ලැයිස්තු සකස් කර, ඉවත් කළ හැකි ගොඩනැගිලි ආකෘති, යන්ත්‍ර හා සුන්බුන් ලෝහ වල වටිනාකම තීරණය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමට තීරණය කර තිබුණි. එහෙත් එම කාර්යයන් මේ දක්වා සම්පූර්ණ කර නොතිබුණි. යුද්ධය නිමා කොට වසර 13ක් ගතවී ඇතත් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කොට සංස්ථාව සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගෙන දේශීය ආර්ථිකයට දායකත්වයක් ලබාදීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වි තිබුණි.

ජාතික ශිල්ප සභාව

- පනත ප්‍රකාරව සභාවේ අරමුණු අතර හස්ත කර්මාන්ත සඳහා වන දේශීය අමුද්‍රව්‍ය සුලබ කිරීම මඟින් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනයන් ඉහළ නැංවීම ප්‍රධාන අරමුණක් වන අතර ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් 2021 වර්ෂයේ දී අමුද්‍රව්‍ය බැංකු 9ක් පළාත් අනුව ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 10.5ක උපකරණ මිලට ගෙන තිබුණි. අමුද්‍රව්‍ය බැංකු ස්ථාපිත කිරීම

සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව ඊට අදාළ යන්ත්‍රෝපකරණ සපයාගත යුතු වුවත් අමුද්‍රව්‍ය බැංකු 9ක් (උතුරු හා නැගෙනහිර පළාත් හැර) සඳහා මිලදී ගත් උපකරණ අදාළ මධ්‍යස්ථානවලට නිකුත් කිරීමට නොහැකිව මෙම වාර්තාවේ දින වන විටත් වරාගොඩ පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා කර තිබුණි.

- 2021 වර්ෂය තුළ ජාතික ශිල්ප සභාව සතු පුහුණු මධ්‍යස්ථාන 85ක් අතුරින් පුහුණු මධ්‍යස්ථාන 56ක පමණක් පුහුණු පාඨමාලා ක්‍රියාක්මක කර තිබුණි. 2021 වර්ෂය තුළ පුහුණු පාඨමාලා 70ක් සඳහා ආරම්භයේදී ආධුනිකයින් 737 දෙනෙකු බඳවාගෙන තිබුණද 2021 සැප්තැම්බර් වන විට ආධුනිකයින් සංඛ්‍යාව 350 දක්වා අඩුවී තිබුණි. ඉන් පුහුණු පාඨමාලා 27ක් අවසානයේදී කිසිම පුහුණු ආධුනිකයෙකු බිහි කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. සභාව විසින් හඳුන්වා දී ඇති හස්ත කර්මාන්ත පුහුණු ක්ෂේත්‍ර 17ක් අතුරින් පාඨමාලා 6 ක් සඳහා පමණක් NVQ සුදුසුකම් ලබා දී තිබුණු අතර අනෙකුත් ක්‍රියාත්මක පාඨමාලා NVQ මට්ටමට උසස් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. 2021 වර්ෂයේ සංශෝධිත අයවැය මඟින් පුහුණු පාඨමාලා වලට අදාළව පුහුණු දීමනා, අමුද්‍රව්‍ය හා උපකරණ ලබා දීම වෙනුවෙන් රු. මිලියන 9ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද රු. මිලියන 6ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

- ශිල්ප සභාව සතු හෙක්ටයාර් 1.1165ක භූමි ප්‍රමාණයක වැඩ මඩු 18ක්, ප්‍රදර්ශනාගාරයක්, කාර්යාල ගොඩනැගිල්ලක්, නේවාසිකාගාරයක් සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා වන ගොඩනැගිලි වලින් සමන්විත සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානය රු. මිලියන 47.7කට තක්සේරු කර දඹුල්ල ප්‍රාදේශිය ලේකම් විසින් පැවරුම් පත්‍රයක් මඟින් 2013 වර්ෂයේදී ශිල්ප සභාව වෙත පවරා දී තිබුණි. එසේ වුවත් 2021 මාර්තු මාසය වනවිට කොවිඩ් වසංගතය හේතුවෙන් සියළු කුටි වසා දමා තිබුණි. අලෙවි කුටි, ගොඩනැගිලි නැවත පිළියෙල කර දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ශණය වන පරිදි සකස් කොට සභාව සතු වත්කමෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් රු.මිලියන 47.7 ක් වූ දේපල නිශ්කාර්ය වී තිබුණි.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

- සැපයුම්කරුවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය 2013 වර්ෂයේ දී රුපියල් මිලියන 200ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ණය මුදල මාසික වාරික ලෙස වසරක් තුළ ගෙවීමටත් ණය මුදල මත සියයට 9 ක පොලී ප්‍රතිශතයක් ගෙවීමටත් නියමිතව තිබුණද නියමිත පරිදි වාරික මුදල් හා පොලී නොගෙවීම හේතුවෙන් 2020 වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු

ණය මුදල හා පොලී පිළිවෙලින් රු.මිලියන 1,255ක් හා රු.මිලියන 158.4ක් වී තිබුණි. පොලී මුදලින් රු.මිලියන 8.32කට 2020 සැප්තැම්බර් 24 දින බැංකුව විසින් පමා සහන ණයයක් සලසා දී තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත 2020 දෙසැම්බර් 31ට ගෙවිය යුතු පොලිය රු. මිලියන 4.17ක් සහ ණය මුදල රු. මිලියන 166.72ක් ව පවතින අතර ණය පොලී නොගෙවීම මත ප්‍රාග්ධනිත වූ රු. මිලියන 8.32ක ණය පොලියටද පොලී ගණනය වීමෙන් මණ්ඩලයට අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

- මණ්ඩලය විසින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා 2012 – 2018 කාලය තුළදී ලබාගත් රුපියල් මිලියන 950ක ණය මුදලට අදාළව රු. මිලියන 238.78ක මුදලක් පොලී වශයෙන් ලංකා බැංකුව වෙත ගෙවා තිබුණි. 2019 වර්ෂාවසානය වන විට ශේෂව පැවති රු.මිලියන 273ක් නව ණය මුදල් 03ක් ලෙස ප්‍රතිලේඛනගත කර තිබුණි. උක්ත ණය මුදල් වලට අදාළව වාරික ගෙවීම් සඳහා මාස 06ක අනුග්‍රාහක කාලයක් ලබා දී තිබුණු අතර එම කාල සීමාවද 2020 අප්‍රේල් මාසයෙන් අවසන්ව තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට ණය මුදල් වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 28.08ක වාරික මුදල් සහ රු. මිලියන 21.83ක පොලී මුදල් විගණිත දින වූ 2021 දෙසැම්බර් 31 වන විටත් ගෙවීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

- වර්ග අඩි 44,000 ක සිව් මහල් ගොඩනැගිල්ලක් වූ කොටුව ලක්සල ගොඩනැගිල්ල 2013 වර්ෂයේ දී නවීකරණය කිරීම සඳහා ටෙන්ඩර් පරිපාටියෙයෙන් බැහැරව ICTAD සුදුසුකම් නොමැති පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට පවරා ප්‍රසම්පාදන උපදෙස් නොසලකා රු. මිලියන 45.45ක් වැය කර තිබුණි. මේ පිළිබඳව ICTAD ආයතනය මගින් ලබාදුන් වාර්තාව අනුව භෞතික වැඩ වටිනාකම අඩුකළ පසු කොන්ත්‍රාත්කරුගෙන් රු.මිලියන 30 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතුව තිබුණි. එම ඉදිකිරීම් අතරමඟ නවතා තිබීම හේතුවෙන් උක්ත වර්ග අඩි 44,000 ක භූමි ප්‍රමාණයෙන් වර්ග අඩි 1,200 ක ප්‍රදර්ශනාගාර පවත්වාගෙන යන භූමි ප්‍රමාණය හැර සෙසු ප්‍රමාණය වසර 08කට ආසන්න කාලයක් පුරා භාවිතයට ගත නොහැකිව නිශ්කාර්යව පවතී. විශාල ආර්ථික වටිනාකමක් ඇති මෙම ගොඩනැගිල්ල නවීකරණ කටයුතු අතරමඟ නවතා දැමීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවති අතර, මණ්ඩලයට වාර්ෂිකව උපයාගත හැකිව තිබූ විශාල ආදායමක් අහිමිවී තිබුණි.

- කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබූ වටිනාකම රු. මිලියන

48.32ක් වූ අක්කර 2 පර්චස් 21ක මොරටුව, කටුබැද්ද භූමියේ තිබෙන වර්ග අඩි 39,364 කින් යුත් ගොඩනැගිලි පහෙන් ප්‍රදර්ශනාගාරය, රජයේ විගණන අංශය, මිලදී ගැනීම් අංශය හා ගබඩාව හැරුණු විට, ලක්සල වඩුකර්මාන්ත ශාලාව හා නේවාසිකාගාර පවතින ආසන්න වශයෙන් වර්ග අඩි 15,000ක ඉඩ ප්‍රමාණය හා වඩු කම්හල සතු වත්කම් 2012 වර්ෂයේ පමණ සිට නිශ්කාර්යව පවතී

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්බන්ධ විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂ කර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුළින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සපයමින් රාජ්‍ය ප්‍රතිපත්තිමය රාමුව තුළ කර්මාන්තයේ සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම, අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර හා පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ.

- බාහිර පාර්ශවයන්ට බදු දී තිබූ දෙපාර්තමේන්තුවට අයත් බලවේග පේෂකර්ම ආයතනවලින් ආයතන 04 ක් බදු ගිවිසුම කඩකර වසර 3ත් වසර 22 ත් අතර කාලයක් ගතවී තිබුණද එම කාලය තුළ කිසිදු මුදලක් අය කරගෙන නොතිබුණු අතර 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුකරුවන්ගෙන් අය විය යුතු බදු මුදල රු. මිලියන 13.87 ක් විය. ඉන් එක් බදුකරුවෙකු බදු දේපළ ඇපයට තබා ණය මුදලක්ද ලබාගෙන ඇති අතර රු. මිලියන 8.91 ක බදු ගෙවීම් පැහැර හැර තිබුණි. තවත් බදු දේපළකින් රු. මිලියන 2.76 ක් අයවිය යුතු අතර දැනට අනවසරයෙන් අයෙකු පදිංචිවී ඇත. එක් ආයතනයකින් අයවිය යුතු හිඟ බදු රු.521,000 ක් සම්බන්ධයෙන් බේරුම්කරණය වෙත යොමු වී නොතිබුණි. මේ අනුව හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතු වුවද එසේ කර නොතිබුණි.

- ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පේෂකර්ම ගම්මාන 10 ක් පිහිටුවා ඒ ආශ්‍රිතව අයදුම්කරුවෝ 150 දෙනෙකු පුහුණු කර අවශ්‍ය උපකරණ ලබාදීමට සැලසුම්කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ගම්මාන 5 ක් ආශ්‍රිතව අයදුම්කරුවන් 73 දෙනෙකු සඳහා පුහුණුව ලබාදී තිබූ අතර එම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු. මිලියන 24.68 ක් වටිනා අත්යන්ත්‍ර ආශ්‍රිත උපකරණ 2022 අප්‍රේල් 30 දින වන විටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

ඉඩම් කටයුතු

විගණන නිරීක්ෂණ

- බිම් සවිය වැඩසටහන
- ඉඩම් අත්පත් කර ගැනීම
- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය
- ඉඩම් බදු ආදායම් කළමනාකරණය
- ඉලක්ක කරා ළඟා නොවීම
- කාබනික පොහොර ව්‍යාපෘතිය
- කාර්ය සාධනය අඩුවීම
- ඉඩම් පරිහරණ පනත ක්‍රියාවට නැංවීම

ඉඩම් කටයුතු

තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම ඉඩම් අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. ඉඩම් අමාත්‍යාංශය හා ඒ යටතේ ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 04 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 02 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමුද්‍රව්‍ය ගැටලුවට පිළියමක් ලෙස වගා සමුපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම.

- මහවැලි, උමා ඔය, මොරගහකන්ද වැනි විශාල වාරි මාර්ග ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින්, නිවාස සහ අනෙකුත් දේපළ, ඉඩම් හා කෘෂි කාර්මික ඉඩම් සඳහා නිසි තක්සේරුවක් සිදු කොට කඩිනමින් වන්දි ලබාදීමට අදාළ ආයතන සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
- රජයේ ඉඩම් සහ පොදු ව්‍යාපෘති වශයෙන් අත්පත් කර ගන්නා ඉඩම් කෘෂි වගාවන් සඳහා බදු පදනම යටතේ ලබා දීම සහ ගොවීන්ට වගා කටයුතු කිරීම සඳහා වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම.
- වතු සමාගම්වලට හා රජයේ ගොවිපොළවලට වෙන් කර දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දේශීය හා විදේශීය ඉල්ලුමක් ඇති මල් වර්ග සහ කාබනික වගාවන් ඇති කිරීම සහ දේශගුණයට ගැළපෙන අතිරේක බෝග වගාවන් ව්‍යාප්ත කිරීම.
- ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක, ස්වභාවික සම්පත්, නාගරීකරණය සහ අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඉඩම් පරිහරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- යාවත්කාලීන ඉඩම් තොරතුරු පද්ධතියක් ඇති කිරීම හා පවත්වා ගෙන යාම.
- ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් කඩිනමින් ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණික ප්‍රවේශයක් සහිත කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම.
- ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හා ඉඩම් ලබා දීමේ ක්‍රියාවලිය සමාලෝචනයට ලක්කොට ඉඩම් අහිමි අඩු ආදායම්ලාභීන් සඳහා ඵලදායී නිෂ්පාදන කටයුතු සඳහා සංවර්ධන හා ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් කඩිනමින් නිදහස් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- බිම් සවිය ඉඩම් අයිතිය තහවුරු කිරීමේ වැඩපිළිවෙළ කඩිනම් කිරීම, ඉඩම් විකිණීමෙන් ඉඩම් අහිමි ප්‍රජාවක් බිහි වීම වළක්වාලීම සහ ඉඩම් අයිතිය මත බැංකු,

මූල්‍ය හා රක්ෂණ කටයුතු ලබා ගැනීමේ ප්‍රතිපත්තීන් හා නීතිමය රාමුවක් ගොඩනැගීම.

- අවශේෂ ඉඩම් පරිහරණය පිළිබඳ නිරවුල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබා දීම.
- මහජනතාව වෙත ලබා දී ඇති රජයේ ඉඩම් ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.
- තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්වීමේ ව්‍යාපෘතියක් ලෙස රජයේ ඉඩම්වල ආයෝජන අවස්ථා ලබා දෙමින් ඉඩම් කැබලි ලක්ෂයක්, බැංකු සහ අදාළ අනිකුත් ආයතන සම්බන්ධීකරණය කරමින් තරුණයන් වෙත ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- සංවර්ධන යෝජනා ක්‍රම සඳහා අත්පත් කරගෙන ඇති මෙතෙක් භාවිතයට නොගත් පෞද්ගලික ඉඩම් සංවර්ධන අවශ්‍යතාවයන් නිසි තක්සේරුවකට ලක් කිරීමෙන් පසුව එම ඉඩම් ඵලදායී ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2021 වර්ෂයේදී ඉඩම් අමාත්‍යාංශයට හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු 4 කට එකතුව රු.මිලියන 10,517 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 8,541 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු.මිලියන 1,976 ක ප්‍රතිපාදන ඉතිරිය වී තිබුණි. විස්තර රූපසටහන 27 හි දැක්වේ.



	ඉඩම් අමාත්‍යාංශය	ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	මිනින්දෝරු දෙපාර්තමේන්තුව	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	3415	608	635	4714	580	565	10517
වියදම රු.මිලියන	2667	269	496	4075	509	525	8541
ඉතිරිය රු.මිලියන	748	339	139	639	71	40	1976

රූපසටහන 27 - ලබා දී තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

බිම් සවිය වැඩසටහන

- සමාලෝචිත වර්ෂයේදී හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩසටහන යටතේ හිමිකම් සහතික 60,000 ක් නිකුත් කිරීමට සැලසුම් කර රු.මිලියන 124 ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, වර්ෂය තුළ නිකුත් කර තිබුණු හිමිකම් සහතික සංඛ්‍යාව 13,907 ක් වූ අතර දරන ලද තත්‍ය වියදම රු.මිලියන 94.4 ක් විය. ඒ අනුව සහතිකයක් නිකුත් කිරීමට ඇස්තමේන්තු ගත වියදම රු.2,067 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.6,788 ක් වැයකර තිබුණි.

- සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහන යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් නිකුත්කරන ලද හිමිකම් සහතිකපත් සංඛ්‍යාව 22,485 ක් වූ අතර, හිමිකරුවන් වෙත නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව 13,907 ක් පමණක් විය. හිමිකම් සහතික බෙදා හැරීමේ පවතින දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවදුරටත් හිමිකරුවන් අතර බෙදා හැරීමට ඉතිරිව තිබුණු හිමිකම් සහතිකපත්‍ර සංඛ්‍යාව 21,231 ක් වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම වැඩසටහන යටතේ හිමිකම් සහතික නිකුත්කිරීම සම්බන්ධයෙන් ඇති වූ නිරවුල් කළ නොහැකි විවිධ ගැටලු හේතුවෙන් පසෙක තබන ලද මුළු ලිපිගොනු සංඛ්‍යාව 455,271 ක් වූ අතර, වැලිගෙපොළ, රත්මලාන, දෙහිවල සහ නල්ලූර් ප්‍රාදේශීය කාර්යාලවල පසෙක තබන ලද ගොනු පිළිබඳ තොරතුරු අනාවරණය කරගෙන නොතිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ක පමණක් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණු අතර ඉතිරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 265 ක මෙය ආරම්භ කිරීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි. තවද, ආරම්භ කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 3899 න් මිනුම් කටයුතු අවසන් කර තිබුණේ කොට්ඨාශ 1394 ක පමණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවතුණි.

ඉඩම් අත්පත් කර ගැනීම

1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීම් පනතේ 35 වගන්තිය අනුව, ඉඩමක් හෝ පරවශතාවක් අත්කරගැනීම සඳහා 38 වන වගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයට පෙරාතුව වන්දි මුදල් ඒ තැනැත්තාට හෝ උසාවියට නොගෙවනු ලැබුණු අවස්ථාවක, අදාළ ආඥාව නිකුත්කළ දිනයේ සිට වන්දි ගෙවීම කරන දිනය දක්වා නියමිත ප්‍රමාණයක පොලිය සමග වන්දි මුදල ගෙවිය යුතු වුවත්, පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු නොකිරීමේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද මුළු පොලී මුදල වූ

රු.මිලියන 1,206.32 න් රු.මිලියන 602.13 ක් හෙවත් සියයට 50 ක් වසර 15 කට වැඩි කාලයකට පෙර ඉඩම් අත්පත් කිරීම් වෙනුවෙන් දරා තිබුණු පොලී වියදම් විය.

රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) 2013 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ වෙනුවෙන් දරා ඇති පිරිවැය රු.මිලියන 159.46 ක් වී තිබුණි. වර්ෂ 07 කට වැඩි කාලයක සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණ ද, පද්ධතියට ඇතුළත් කළ ඉඩම් කැබලි තොරතුරු ප්‍රමාණය 1,306,917 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ සැලසුම් කළ ඉඩම් කැබලි 100,000 න් 62,785 ක් පමණක් පද්ධතියට ඇතුළත් කර තිබුණි.

ඉඩම් බදු ආදායම් කළමනාකරණය

ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අන්තර් පළාත් ගොවි ජනපදවලින් ඉඩම් බදු ආදායම් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂය අවසන්වන විට පැවති රු.මිලියන 84.92 ක හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. හිඟ ආදායමෙන් සියයට 53 ක් හෙවත් රු.මිලියන 45.15 ක් වසර 2 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර, සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායමෙන් අයකරගෙන තිබුණු මුදල රු.මිලියන 5.18 ක් පමණක් විය.

ඉලක්ක කරා ළඟා නොවීම

- සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව “ශ්‍රී ලංකාව තුළ කෘෂි, වාණිජ, සංචාරක වෙනත් සේවා නිෂ්පාදන අංශ නියෝජනය කරමින් විවිධ නිෂ්පාදනයන්හි නියැලී සිටින එමෙන්ම එවැනි ව්‍යවසායකත්ව හැකියාව ඇතත්, ඒ සඳහා මූලික සම්පත් සහ රාජ්‍ය සහය තවමත් ලැබී නොමැති තරුණයින් තෝරාගෙන ඔවුන් වෙත ඉඩම් හිමිකම ලබාදීම මඟින් දේශීය නිෂ්පාදන දිරිගැන්වීම සහ ඊට අවශ්‍ය ආයතනික සහය ලබාදීමේ” අරමුණින් ක්‍රියාත්මක කළ වැඩසටහනක් මඟින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉඩම් කැබලි 20,000 ක් ලබාදීමට ඉඩම් අමාත්‍යාංශය මගින් සැලසුම් කර තිබුණද, ඉඩම් කැබලි 402 ක් හෙවත් සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 2 ක් පමණක් ලබා දී තිබුණි.

- සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව නාගරික සංවර්ධනය, පහත් බිම් සංවර්ධනය, ගම් පුළුල් කිරීම, වාරිමාර්ග කටයුතු යනාදී වශයෙන් ක්ෂේත්‍ර 11 ක් යටතේ ඉඩම් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණද, එයින් ක්ෂේත්‍ර 07 ක් යටතේ පමණක් ඉඩම් අත්පත් කර ගැනීම ආරම්භ කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අත්පත් කර ගැනීමට සැලසුම් කළ ඉඩම් හෙක්ටයාර් 7383 න් ඉඩම් හෙක්ටයාර් 707 ක් හෙවත් සියයට 10 ක් පමණක් පවරාගෙන තිබුණි. ඒ අනුව සැලසුම් කළ පරිදි රජයේ

අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් පවරා ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

- ඉඩම් අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉඩම් තොරතුරු රැස් කිරීමේ දීප ව්‍යාප්ත සංගණනයක් 2020 වර්ෂයේ අවසන් කාර්තුවේ ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා සංගණන ආකෘති පත්‍ර මිලියන 10 ක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් නොමිලේ මුද්‍රණය කර දිවයින පුරා ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි බෙදා හැර තිබුණි. අදාළ සංගණන කටයුතුවල ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

කාබනික පොහොර ව්‍යාපෘතිය

- ඉඩම් අමාත්‍යාංශය විසින් රු.මිලියන 302 ක වියදමක් දරා පොහොර මෙට්‍රික් ටොන් 6,156.23 ක් නිෂ්පාදනය කර තිබුණු අතර, 1988 අංක 68 දරන පොහොර පනතේ 2 (1) (2) වගන්ති ප්‍රකාරව පොහොර නිෂ්පාදනය සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවත් මෙතෙක් ලබා ගෙන නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනය කරන ලද පොහොර කිලෝග්‍රෑම් 777,720 ක් කිලෝග්‍රෑම් 1 ක් රු.15 බැගින් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙත අලෙවි කර තිබුණ ද ඒ සඳහා ලැබිය යුතු රු.මිලියන 11.67 ක ආදායම හිඟ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තාකර නොතිබුණි.

කාර්යසාධනය අඩුවීම

- "ඉඩම් තොරතුරු සැපයීමේ සඳා ප්‍රමුඛයා" වන දැක්ම පෙරදැරි කර ගෙන "වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම" මෙහෙවර කර ගත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර, ඒ අනුව මායිම් ගල් දමා සිදු කරන ව්‍යවස්ථාපිත මැනුම් සඳහා එක් නිලධාරියෙකුගේ මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20 ක් වන අතර ඉඩම් කැබලි නම් 30 කි. අනෙකුත් මැනුම් සඳහා ඉඩමේ හෙක්ටයාර් ප්‍රමාණය 30 ක් හා මනින ලද දුර කි.මී.5 ක් ලෙස ප්‍රගතිය ගණනය කරනු ලැබේ. වර්ෂ 15 කටත් පෙර පිහිටුවාගත් මෙම සම්මත, මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග සමාලෝචනය කර, දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර පරිදි ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවක් සැපයීම සඳහා යාවත්කාලීන කර නොතිබුණු නමුත්, 2018 සිට 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් යටතේ නවීන මැනුම් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 430 ඉක්ම වූ මුදලක් වැය කර තිබුණි.

- **2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව, මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත් තහවුරු කිරීම අරමුණු කරගෙන ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාව විසින් ඉදිරිපත් කර තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 143 ක් වුවත් සභාව විසින් එම පැමිණිලිවලින් සියයට 27 ක් හෙවත් පැමිණිලි 39 ක් පමණක් විසඳා තිබුණි. වාර්ෂිකව විසඳීමට පවතින පැමිණිලි සංඛ්‍යාව ක්‍රමක් ක්‍රමයෙන් වැඩි වෙමින් පැවතුණද, එම පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදු කරන පුද්ගලයින් සම්බන්ධව සොයා බැලීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගද අනුගමනය කර නොතිබුණි.**

ඉඩම් පරිහරණ පනත ක්‍රියාවට නැංවීම

2010 මැයි 20 දිනැති අංක 1654/21 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයක් මඟින් ස්ථාපිත කර තිබුණු ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස පරිහරණය කිරීම වන අතර, පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර හා ප්‍රශස්ත ලෙස භූමි පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහායවීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙවර වේ. එම දැක්ම සහ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීමට හා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සැකසීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී ඇත.

ප්‍රවාහන අංශය

විගණන නිරීක්ෂණ

- කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණ දක්වා වූ දුම්රිය මාර්ගය ව්‍යාපෘතිය
- කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
- කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය
- Park & Ride ව්‍යාපෘතිය
- ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම
- වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම
- සුඛෝපභෝගි බස්රථවල කැමරා හා ජී.පී.එස් (GPS)පද්ධතිය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම
- ඉන්දියානු ණය පහසුකම් යටතේ බස්රථ මිළ දී ගැනීම
- බස් රථ ප්‍රමාණවත් නොවීම
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඉඩම්
- ශ්‍රී ලංගම වාහන වලට දැඩි හානි සිදුකිරීම
- දුම්රිය මැදිරි 160 ක් මිල දී ගැනීම
- මහනුවර - ගැටඹේ අතර ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය
- මහව - අනුරාධපුර - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ග පිළිසකර කිරීම සඳහා වූ ව්‍යාපෘතිය
- කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය - ශක්‍යතා අධ්‍යනය
- දුම්රිය රක්ෂිත ඉඩම් බදු දීම
- දුම්රිය ඉඩම් පැවරීම
- එම් 6 ක්ලාස් ලොකෝස් සඳහා අමතර කොටස් මිළ දී ගැනීම
- නිශ්කාර්ය වත්කම්
- සපයා නොමැති භාණ්ඩ සඳහා ගෙවීම් කිරීම
- නිරවුල් නොකළ ණයවර ලිපි
- ශ්‍රී ලංකා දුම්රිය ප්‍රධාන සැලැස්ම
- ආදායම
- හිඟ හිටි ආදායම් අයකර නොගැනීම

ප්‍රවාහන අංශය

ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීම උදෙසා නවතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම මෙම අංශයේ මෙහෙවර වී තිබුණි. එම මෙහෙවර ඉටු කර ගැනීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය හා ඒ යටතේ රාජ්‍ය අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත ආයතන 05 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.
- පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මාර්ග තදබදය, මගී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වාදීම.
- රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ - ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.
- දුම්රිය හා බස්රථ නැවතුම් පොළවල් ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය.
- දුම්රිය හා බස්රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස්රථ නඩත්තු කිරීම.
- බස්රථ නිෂ්පාදනය හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.
- තොරතුරු තාක්ෂණයේ යෙදීම මඟින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත් කිරීම.
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පළවල් වල පොදු පහසුකම් සංවර්ධනය කිරීම.
- වත්මන් බස් සංචිත ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස්රථ හඳුන්වා දීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද හරිත ප්‍රවාහනයට අනුකූල කර ගැනීම සඳහා වැඩපිළිවෙල සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- දුම්රිය මැදිරි, බස් රථ, මොටර් රථ දේශිය වශයෙන් නිෂ්පාදනය කිරීම, අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීමට ආයෝජකයින්

දිරිගන්වන ප්‍රවාහන සේවයක් ගොඩනැගීම.

- පාසල් බස්රථ සේවා හා සිසුන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ ශක්තිමත් කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම.
- මගී හා ප්‍රවාහන සේවය ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රවාහන සේවාවන් ඉහළ ප්‍රමිතියක් තුළ නියාමනය කිරීම.
- රියදුරු බලපත් නිකුත් කිරීමේ හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා ඉවත් කොට කාර්යක්ෂම සේවාවක් ලබා දීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයට, රාජ්‍ය අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු දෙකකට පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 67,680 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් එකතුව රු. මිලියන 59,273 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 12.42 හෙවත් රු.මිලියන 8,407 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි. විස්තර රූපසටහන 28 හි දැක්වේ.



	ප්‍රවාහන අමාත්‍යාංශය	රාජ්‍ය අමාත්‍යාංශය	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදන රු.මිලියන	7,086	14,408	42,899	3,287	67,680
වියදම රු.මිලියන	3,989	12,845	40,416	2,023	59,273
ඉතිරිය රු.මිලියන	3,097	1,563	2,483	1264	8,407

රූපසටහන 28 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණ දක්වා වූ දුම්රිය මාර්ගය ව්‍යාපෘතිය

කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණ දක්වා වූ නව දුම්රිය මාර්ගයන් පිළිබඳව සිදුකළ ශක්‍යතා අධ්‍යයනයක් 2009 වර්ෂයේදී සිදුකර දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන කේන්ද්‍ර කොට භාණ්ඩ ප්‍රවාහන දුම්රියන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2010 වර්ෂයේදී ආරම්භ කිරීමට යෙදුනු කුරුණෑගල හබරණ දුම්රිය මාර්ගය සඳහා 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ දේශීය අරමුදල් යටතේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් රු.මිලියන 1,032.76 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ මුළු ප්‍රතිපාදනයෙන් 46% ක් පමණක් වැය කර තිබූ අතර සියයට 54 ක් වූ රු.මිලියන 555.91 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

2024 වර්ෂය වන විට ඉඩම් කැබලි 4090 ක් පවරා ගෙන වන්දි ගෙවීම් අවසන් කළ යුතු වුවත් 2022 ජනවාරි 24 වන විට වන්දි ගෙවා අවසන් කර තිබුණේ ඉඩම් කට්ටි 133 ක් පමණි.

කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා අරමුණු 05 ක් ඔස්සේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ අතර මෙම කාර්යය සාර්ථකව ඉටුකරලීම සඳහා 2019 අගෝස්තු 20 දින අත්සන් කරනු ලැබූ ඇ.ඩො.මිලියන 160 ක් වූ ණය ගිවිසුම 2019 සැප්තැම්බර් 06 දින සිට ක්‍රියාවට නංවා තිබුණි. ව්‍යාපෘති කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතා ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුව යටතේ රු.මිලියන 3200 ක්ද දේශීය අරමුදල් ප්‍රතිපාදන යටතේ රු.මිලියන 235 ක්ද වෙන්කර තිබුණද දේශීය අරමුදල් ප්‍රභවය යටතේ වැයකිරීම රු.මිලියන 96 ක් හෙවත් සියයට 41 ක තරම් ප්‍රමාණයක් වී තිබුණි.

එසේම ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ වූ ප්‍රතිපාදනයෙන් වැය කළ මුදල රු.මිලියන 2012 ක් පමණක් වීම හේතුවෙන් හා සමස්ථ ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඌන උපයෝජනය හේතුවෙන් ප්‍රයාපන ගාස්තු ලෙස රු.මිලියන 83 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවා තිබුණි.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

ශක්‍යතා අධ්‍යයන සංවර්ධනය, ප්‍රවාහන ව්‍යාපෘති සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම සහ ප්‍රවාහන ව්‍යාපෘති සඳහා සහාය ලබාදීමට ප්‍රතිපාදන ඇති කිරීම වැනි කාර්යයන් අරමුණුගතව මුළු පිරිවැය රු.මිලියන 1,654 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 11.36 ක් ප්‍රතිපාදන ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. ව්‍යාපෘති

කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සඳහා වාර්ෂික ඇස්තමේන්තු මඟින් ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේ රු.මිලියන 350 ක්ද දේශීය අරමුදල් ප්‍රභවය යටතේ රු.මිලියන 1578 ක්ද වෙන්කර තිබුණද ව්‍යාපෘතියේ දුම්රිය මාර්ග දෙපස පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමේ කාර්ය සාධනය අවම මට්ටමක පැවතීම හේතුවෙන් දේශීය අරමුදල් මඟින් වූ උපයෝජනය රු.මිලියන 264 ක් හෙවත් එම ප්‍රතිපාදනයෙන් 17% ක ප්‍රමාණයක් වී තිබුණි.

- 2021 අවසාන වන විට අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කරවීම නිවාස ඒකක 2,036 ක කිරීමට සැලැසුම් සකස් කළද, නිවාස ඒකක 484 ක පමණක් නැවත පදිංචි කිරීම් සිදුකර තිබුණි.

Park & Ride ව්‍යාපෘතිය

Park & Ride ව්‍යාපෘතිය ධාවනය සඳහා ඉලක්කගත බස්රථ ගණන කොළඹ දිස්ත්‍රික්කයේ බස්රථ 18 ක් ද, මහනුවර දිස්ත්‍රික්කයේ බස්රථ 06 ක් ද විය. මේ සම්බන්ධයෙන් ධාවනය හා ආදායම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එහෙත් Park & Ride ව්‍යාපෘතිය සඳහා GPS යන්ත්‍ර 25 ක් බස්රථ සඳහා සවි කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මුදල් වැය කර තිබුණු අතර, එම බස්රථ ධාවනය නොකරන අතර, කැමරා භාර දී නොතිබුණි. තවද, 2022 ජුනි 16 දින වන විට නැවත අශෝක් ලේලන්ඩ් ආයතනයේ බස්රථ 10 ක් කුලී පදනම මත ගෙන Park & Ride ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.

ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2018 මාර්තු 20 දින ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමග රු.මිලියන 61.01 ක වටිනාකමක ගිවිසුමකට එළඹී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම කාර්යය 2018 ජුනි 20 දින නිම කළ යුතු වුවද 2022 ජුනි 16 වන දින වන විටද මෙම ඉදි කිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. මේ වන විට ගෙවා ඇති සම්පූර්ණ මුදල රු.මිලියන 26.77 ක් වන අතර මෙහි ඉදිකිරීම පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට බැහැරව කිරීම නිසා මණ්ඩලයට රු. මිලියන 2.10 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු ගිවිසුම් පරිදි ඉදි කිරීම් නිම නොකිරීම නිසා මණ්ඩලයට ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක වීමෙන් ලබා ගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. එසේම විගණන පරීක්ෂණ අවස්ථාවේදී රු.මිලියන 12.61 ක් වටිනා ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07 ක් එම භූමියේ කිසිදු ආරක්ෂිත පියවරකින් තොරව ගොඩගසා තිබුණු අතර තැන්පත් කර තිබූ ඉන්ධන ටැංකිවල පියන් කොන්ත්‍රාත්කරු විසින් ඉවත් කර ගෙන ගොස් තිබුණි.

වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පළාත් 09 තුළ වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි

කිරීම සඳහා අදාළ උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහන වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබු අතර, මෙම මධ්‍යස්ථාන ඉදි කිරීම ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන අතරින් කුරුණෑගල හා මැදවච්චිය යන මධ්‍යස්ථාන ඉදි කිරීම් නිමකර විවෘත කර තිබුණ ද , නීතිමය ගැටලුවක් නිසා වසා පැවතුණි. එම මධ්‍යස්ථාන වල වටිනාකම රු.මිලියන 18.75 ක් වන මෙම යන්ත්‍ර සූත්‍ර නිෂ්කාර්යව පැවතුණු අතර, මෙම වත්කම් භාවිතා කිරීමට සුදුසු පරිදි අදාළ සිවිල් වැඩ ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වන රු.මිලියන 89.84 කින් රු.මිලියන 22.48 ක මුදලක් පමණක් විගණිත දිනය වූ 2022 අප්‍රේල් 30 වන විට වැයකර තිබුණි. 2022 මැයි 30 දින වන විටද එම ඉදි කරන ලද මධ්‍යස්ථාන නිෂ්කාර්යව පැවතුණි.

සුඛෝපභෝගී බස්රථවල කැමරා හා ජී.පී.එස් (GPS) පද්ධතිය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සුඛෝපභෝගී බස්රථ 125 ක් සඳහා කැමරා හා ජී.පී.එස් (GPS)පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මණ්ඩලය පුද්ගලික සමාගමක් සමඟ රු.මිලියන 33.63 ක ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට පෙර මූලික ශක්‍යතා අධ්‍යනයක්, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය හා ප්‍රතිඵල පුරෝකථනය කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. සුඛෝපභෝගී බස්රථ 125 ක් සඳහා ජී.පී.එස් (GPS) මෘදුකාංග සහ උපාංග සවි කිරීමෙන් අදාළ ප්‍රසම්පාදන ගිවිසුමෙහි 8 වන වගන්තිය අනුව අය කළ යුතුව ඇති ප්‍රමාද ගාස්තු වන රු.මිලියන 3.36 ක් සැපයුම්කරුවන්ගෙන් අය කර ගෙන නොතිබුණි.

ඉන්දියානු ණය පහසුකම් යටතේ බස්රථ මිළ දී ගැනීම

ඉන්දියානු ණය පහසුකම් යටතේ බස්රථ 600 ක් රථ ඇණියට එකතු කිරීම සඳහා රු.මිලියන 3506 ක් ඇස්තමේන්තු කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ලින්ක්ස් ආසන 32 බස්රථ 500 ක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර, සැපයුම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එහෙත් පවතින ඩොලරයේ වැඩි වීම මත මූල්‍ය ගැටලුවකට රජය මුහුණ දීම සහ බස්රථ 500 ක් මිලදී ගැනීමට ණය මුදල ප්‍රමාණවත් නොවීම නිසා සියයට 20 අත්තිකාරමක් පමණක් ගෙවා නැවත බස්රථ මිලදී ගැනීම නවතා තිබුණි. ආසන 43 බස්රථ 100 මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩලය විසින් නවතා තිබූ අතර ඒ වෙනුවට විදුලි බස්රථ මිලදී ගැනීමට ඇති හැකියාව සොයා බැලීමට තීරණය කර තිබුණි.

බස් රථ ප්‍රමාණවත් නොවීම

2022 ජුනි 16 දින වන විට ශ්‍රී ලංගම දෛනික බස් රථ අවශ්‍යතාවය 7,339 ක් වූ අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව පවතින බස්රථ ඇණිය 6,951 කි. මෙයින් සියයට 32 ක් ධාවනය නොවන තත්වයේ පැවතුණි. ධාවනය වන බස් රථ 4,718 න්

බස්රථ 2,742 ක් අවුරුදු 10 ට වඩා පැරණි ඒවා විය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඉඩම්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාල, ඩිපෝ, රියදුරු පුහුණු පාසල් හා ප්‍රාදේශීය වැඩපොළ වශයෙන් ලබන අතර, ඒවා විවිධ ප්‍රදේශයන්හි ස්ථාපනය කර තිබුණි. එම ආයතන පිහිටි ඉඩම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතිය ඇති, බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම්, පැවරීමක් හෝ වෙනත් යම් ආකාරයකට ලබාගෙන ඇති මණ්ඩලය සතු සියලු ඉඩම් පිළිබඳව මණ්ඩලය විසින් යාවත්කාලීන කරන ලද ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. මණ්ඩලය සතු සියලු ඉඩම් හඳුනා ගැනීම, අයිතිය නිරවුල් කර ගැනීම හා ඒවායේ වටිනාකම තක්සේරු කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. මණ්ඩලය සතුව ඇති භාවිතයේ ඇති ඉඩම් අනාරක්ෂිතව වල්බිහිවී පැවතුණි.

ශ්‍රී ලංගම වාහන වලට දැඩි හානි සිදුකිරීම

2022 මැයි මස 09 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයට අයත් වාහන 02 ක් හා ගම්පොල ඩිපෝවට අයත් වාහනයක් ද ඇතුළුව රු.මිලියන 7.3 ක් වටිනා වාහන 03 ක් අරගල භූමියේදී ඇති වූ ගැටුමේදී දැඩි ලෙස හානි වී තිබුණි.

එමෙන්ම ඩිපෝ 12 කට අයත් රු.මිලියන 60.90 ක පිරිවැය වූ බස් රථ 18 ක් ද අරගලය පැවති කාලය තුළ හානි වී තිබූ අතර, එහි ශුද්ධ අගය රු.මිලියන 11.63 ක් විය.

දුම්රිය මැදිරි 160 ක් මිල දී ගැනීම

ඉන්දීය ණය ආධාර යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 82.6 (රු. මිලියන 11,564) ක් වැයකර දුම්රිය මැදිරි 160 ක් මිලදී ගෙන තිබුණද මේ දක්වා දුම්රිය ධාවනයට යොදවා ගෙන තිබුණේ මැදිරි 107 ක් පමණි. ඒ අනුව මැදිරි 53 ක් මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

සකස් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව එක් මැදිරියක් ගෙන්වීමේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 0.3 වුවද වරාය ගාස්තු, රේගු ගාස්තු, රක්ෂණ ගාස්තු, ප්‍රවාහන ගාස්තු එකතු කළ විට එහි සත්‍ය වියදම ඇමරිකානු ඩොලර් මිලියන 0.558 ක් වී තිබුණි.

දුම්රිය මැදිරි 160 න් දුම්රිය මැදිරි 10ක් පමණක් භාර ගෙන ඒ අනුව අනෙකුත් දුම්රිය මැදිරි 150, පරීක්ෂා කිරීමකින් තොරව ලබා ගැනීමට සුදුසු බවට නිර්දේශ කර තිබීම හේතුවෙන්, පහත පරිදි තාක්ෂණික පිරිවිතරයන්ගෙන් බැහැර වීම් තිබුණු බව නිරීක්ෂණය විය.

- දුම්රිය මැදිරි වල දිග, පළල හා උස ප්‍රමිතියට වඩා වැඩි කර තිබුණි.

- පවත්වාගෙන යා යුතු ධාවන වේගය 120 kmh-1 වුව ද පිරිවිතරයට අනුව වක්‍ර (curve) වල අවම අරය මීටර් 150 ක් වුවද අංගන වල පවත්නා වක්‍ර වල (curve) අරය මීටර් 90 ක් වීම හේතුවෙන් දුම්රිය වේගයෙන් ගමන් කරවීම දුම්රිය පීලි පැනීම් හා අනතුරු වලට හේතු වන බව

නිරීක්ෂණය වූ අතර මෙය වැලැක්වීම සඳහා වේග සීමා පැනවීම තුළින් අනෙකුත් දුම්රිය වලටද බලපෑම් ඇති වී තිබුණි.

- පිරිවිතරයේ සඳහන් ප්‍රමාණයට වඩා, තුන්වන පන්තියේ ආසන 82, දෙවන පන්තියේ ආසන 82 හා වායුසමනය කරන ලද ලද මැදිරි වල ආසන 70 වශයෙන් ආසන 234 ක් අඩු වී තිබුණි.

- රේල් හිසේ සිට දුම්රිය වේදිකාවට පැවතිය යුතු සම්මත උසට වඩා, මෙම දුම්රිය පොළොව තෙක් 400mm ක් එනම් අගල් 16 ක් උසින් වැඩි වී තිබුණි.

මහනුවර - ගැටඹේ අතර ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

මහනුවර - ගැටඹේ අතර ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා රු.මිලියන 47 ක වටිනාකමක් වෙනුවෙන් පුද්ගලික ආයතනයක් සමග ගිවිසුම් ගතවී තිබුණු අතර එහි ඉදිකිරීම් කටයුතු 2018 ජූලි 30 දිනට පෙර (අවසන් කාලය දීර්ඝ කිරීම) නිමකළ යුතුව පැවතිය ද මෙතෙක් ව්‍යාපෘතියේ වැඩ නිමකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද, 1/720 සිට 1/830 දක්වා හා 1/900 සිට 1/980 දක්වා මුළු දිග මීටර් 190 ක පමණ කොටසක ඉදි කිරීම් කටයුතු වලින් කොන්ත්‍රාත්කරු ඉවත් වී තිබුණු අතර, එම කොටස දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් පිළිසකර කිරීමට එකඟවී තිබුණද, මේ දක්වා නිමකර නොතිබුණි. මෙහිදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ප්‍රමිතියට අනුව ABC ඇතිරීම 10" ලෙසට තිබිය යුතු වුවත්, භෞතික පරීක්ෂාවේදී එය 9.5", 7.25", 9.6" ආදී වශයෙන් ප්‍රමිතියෙන් බැහැර වී තිබුණු අතර Ballast යෙදීමේදී 8" වෙනුවට 6.75", 6", 7.5" ආදී වශයෙන් ප්‍රමිතියෙන් බැහැර වී තිබුණි.

- මෙම ද්විත්ව මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් දුම්රිය රක්ෂිතය තුළ පදිංචි වී සිටි අනවසර පදිංචිකරුවන් 116 දෙනෙකු ඉවත් කිරීමට අධිකරණ නියෝගයක් ලබා දී තිබුණද, මේ වන විටත් නිවාස 95 ක් ඉවත් කිරීමට අපොහොසත් වී තිබුණි.

- ලොට් අංක 01 සිට 28 දක්වා හා ලොට් අංක 73 සිට 88 දක්වා පදිංචිකරුවන් 44 දෙනෙකුට මහනුවර පල්ලෙකැලේ ප්‍රදේශයෙන් විකල්ප ඉඩම් ලබා දී තිබුණද, වෙල්ලස්ස ග්‍රාමසේවක වසමට අයත් පදිංචිකරුවන් 17 දෙනෙකු තව දුරටත් දුම්රිය රක්ෂිතය තුළ පදිංචි වී තිබුණි.

- ඉවත් කිරීමේ නියෝග ලැබූ පදිංචිකරුවන් 35 දෙනෙකු ඉවත් නොවී තවදුරටත් එහිම රැඳී සිටිනු ලබන බව නිරීක්ෂණය විය.

- ද්විත්ව මාර්ගයේ පළමු අදියරේ වැඩ අවසන් වී නොතිබියදී එහි දෙවන අදියර වන ගැටඹේ සිට සරසවි උයන දක්වා මාර්ග පද්ධතිය ඉදිකිරීම සඳහා වැඩ ඇරඹීමේ දීමනාවක් ලෙස රු.මිලියන 567ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

මහව - අනුරාධපුර - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ග පිළිසකර කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

ඉන්දීය එක්සිම් බැංකුව සමඟ එළඹි ණය ගිවිසුමේ කොන්දේසිවලට යටත්ව මහව-අනුරාධපුර-ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පිළිසකර කිරීම සඳහා Ircon International Limited ආයතනය සමග ඇති කර ගන්නා ලද එකඟතාවයට අනුව සියයට 19.26 ක වට්ටමකට යටත්ව කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර සාකච්ඡා සම්මුති සිදු කිරීමට අනෙකුත් ලංසුකරුවන් වෙත අවස්ථාව ලබාදී නොතිබුණි.

මාර්ගය පුනරුත්ථාපනයට සමගාමීවම සංඥා පද්ධතිය ස්ථාපනය කළ යුතු වුවද සංඥා පද්ධතිය ස්ථාපනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් හා ඒ සඳහා වන වැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. තවද එම කාර්යය කොන්ත්‍රාත්කරු ලවා සිදු කර ගනු ලබන්නේද යන්න හෝ දෙපාර්තමේන්තු සංඥා අංශය විසින් සිදු කරන්නේ ද යන්න පිළිබඳව මේ දක්වා අවසන් තීරණයකට එළඹ තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

අදාළ මාර්ග කොටසෙහි දුම්රිය හරස් මාර්ග (Level Crossing) 78 ක් හඳුනාගෙන තිබූ අතර එයින් 09 ක් දැනට බාධක සහිතව පූර්ණ ආරක්ෂිත ගේට්ටු වන අතර 01 ක් බෙල් ඇන්ඩ් ලයිට්, ඉබියතුරු දැමූ ගේට්ටු දෙකක් හා ඉතිරි ප්‍රමාණය මිනිසුන් විසින් පාලනය කරන ගේට්ටු බව නිරීක්ෂණය විය. මාර්ගය ඉදි කිරීමෙන් අනතුරුව මෙම ගේට්ටු සඳහා ස්ථිර මාර්ග ආරක්ෂණ වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙන් අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය සියයට 39 ක් වන අතර භෞතික ප්‍රගතිය සියයට 38.5 ක් විය. නමුත් ළඟාකරගෙන තිබූ මූල්‍ය ප්‍රගතිය සියයට 23 ක් හා භෞතික ප්‍රගතිය සියයට 27 ක් බව නිරීක්ෂණය විය. මෙයට හේතු වශයෙන් ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන වෙන් නොවීම හා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන ලබා නොදීම බව පෙන්වා තිබුණි. ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම පිළිබඳ සැලකීමේ දී එවැනි තත්ත්වයක් නොමැති බව නිරීක්ෂණය විය.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය - ශක්‍යතා අධ්‍යනය

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ වසර 20 ක කාලය තුළ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ඇතුළත් ශක්‍යතා අධ්‍යන වාර්තාව හා විස්තරාත්මක සැලසුම් 2021 වර්ෂයේ මාර්තු මස නිමකර අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. මෙම ශක්‍යතා අධ්‍යනය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ රු.මිලියන 1,446ක මුදලක් වැය කර තිබූ අතර එම ණය සඳහා වූ ණය වාරිකය වූ ඇමරිකානු ඩොලර් 275,000 බැගින් අර්ධ වාර්ෂිකව 2022 මාර්තු 15 සහ 2022 සැප්තැම්බර් 15 ගෙවීමට නියමිතව තිබුණි. එබැවින් උක්ත ශක්‍යතා අධ්‍යනය ක්‍රියාත්මක නොකොට නිශ්කාර්යව පැවතීම තුළින් ආර්ථිකයට කිසිදු

ප්‍රයෝජනයක් නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

දුම්රිය රක්ෂිත ඉඩම් බදු දීම

දුම්රිය ඉඩම් බදු දීමේදී විධිමත් පරිදි ගිවිසුම්වලට නොඑළඹීම, අනවසර පරිහරණය, අනවසර ඉදිකිරීම්, අතුරු බදු දීම්, ගිවිසුම් කොන්දේසි කඩ කිරීම්, ආදායම් නිසි පරිදි අය නොකිරීම හා ඒවායේ අයිතිය පිළිබඳ ගැටළු මතුවන අවස්ථා නිරීක්ෂණය විය.

අංක L-4731 (LC-32933) යටතේ නීත්‍යානුකූලව වෙනත් පුද්ගලයෙකුට බදු ලබා දී තිබුණු ගම්පොළ, දුම්රිය ස්ථානය අසල දුම්රිය රක්ෂිත ඉඩම හා තවත් කොටසක් එකතු කර, අක්කර 02 යි, රූඩ් 02 යි, පර්චස් 35.3 ක්, ගම්පොළ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- අංක 16/1370/724/054 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ III යෝජනාව ප්‍රකාරව ත්‍රෛපාර්ශවීය අවබෝධතා ගිවිසුමකට එළඹීමට පෙර, ඒ සඳහා නීතිපතිතුමාගේ නිශ්කාශනය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත තීරණය කරණු ලබන බද්දකට යටත්ව මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදිය යුතු බවට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා නිර්දේශ කර තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- ගම්පොළ නගර මධ්‍යයේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් 10 දින මුල්ගල තබා තිබුණු අතර, අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමේ 12 වන කොන්දේසිය ප්‍රකාරව, 2019 පෙබරවාරි 20 දින තෙක් මෙම ගිවිසුම වලංගු වන බව දක්වා තිබුණි. ඒ අනුව මේ දක්වාම ඉදි කිරීම් අරඹා නොතිබුණු අතර අරමුණු ඉටු නොවීම මත මෙම දෙපාර්තමේන්තුව සතු ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

දුම්රිය ඉඩම් පැවරීම

"පිබිදෙමු පොළොන්නරුව" සංවර්ධන වැඩසටහන යටතේ මුලා මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා අක්කර 03 රූඩ් 17 පර්චස් 09 ක වපසරියක් ඇති දුම්රිය ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබුණු නමුත් ගිවිසුම් කාලය තුළ එනම් 2022 පෙබරවාරි 21 දින තෙක්ම එම අරමුණු ඉටුකර නොතිබු අතර අපේක්ෂිත මූල්‍ය සමාගම් ද එම ව්‍යාපෘතිය යටතේ ඉඩකඩ වෙන් කර ගැනීම සිදු කර ගෙන නොතිබුණි. මේ අනුව අදාළ අරමුණු ඉටුකර ගැනීමට පරීක්ෂණ දිනය වූ 2022 දෙසැම්බර් 16 දින වන තෙක්ම අපොහොසත් වී තිබූ බැවින් ඒ සඳහා වෙන් කර තිබූ දුම්රිය ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීමට පරිපාලනය කටයුතු කර නොතිබුණි.

එම් 6 ක්ලාස් ලොකෝස් සඳහා අමතර කොටස් මිළ දී ගැනීම

එම්6 ක්ලාස් ලොකෝස් සඳහා අමතර කොටස් මිළ දී ගැනීමේ දී භාණ්ඩ හිඟයක් හෝ හානි වීමක් සම්බන්ධයෙන් භාණ්ඩ වරායට ලැබී දින 45 ක් ඇතුළත සැපයුම්කරුට දැන්විය යුතු වුවත් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුට භාණ්ඩ අඩුවෙන් එවා ඇති බව දැනුම් දී ඇත්තේ වසර 03 කට පසුව බැවින් රු.මිලියන 12 ක් වූ හිඟ භාණ්ඩ සැපයීම හෝ වටිනාකම ආපසු ගෙවීම සැපයුම්කරු ප්‍රතික්ෂේප කර තිබුණ අතර මේ වෙනුවෙන් දරා ඇති රු.මිලියන 14.54 කට ආසන්න මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

නිශ්කාර්ය වත්කම්

එස් 8 ක්ලාස් ලොකෝස් සඳහා අමතර කොටස් මිළ දී ගැනීමේ දී 2019 අප්‍රේල් 10 දින දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු.මිලියන 16 ක් වටිනා අමතර කොටස් තොගය 2021 දෙසැම්බර් 31 දින දක්වා ම භාවිතයට නොගෙන ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

සපයා නොමැති භාණ්ඩ සඳහා ගෙවීම් කිරීම

භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, දුම්රිය දෙපාර්තමේන්තුවට සපයා නොමැති භාණ්ඩ සඳහා රු.මිලියන 90 ක් ගෙවා තිබුණි.

නිරවුල් නොකළ ණයවර ලිපි

2021 වර්ෂය අවසානයට දුම්රිය දෙපාර්තමේන්තුවේ නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු.මිලියන 616ක් වූ අතර එයින් සියයට 19 ක් වූ රු.මිලියන 116 ක් වර්ෂ 02 ත් 23 ත් අතර පැරණි ශේෂයන් විය. මුදල් ගෙවා වර්ෂ 02 කට වැඩි කාලයක් ගත වී ඇතත් මෙම ශේෂයන් නිරවුල් නොවීමට හේතු විගණනයට ඉදිරිපත් නොවූ අතර රු.මිලියන 116 කට වැඩි මෙම ගෙවීම් සපයා නොමැති භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවා ඇති මුදල්ද යන්න විගණනයේදී මතභේදකාරී විය.

ශ්‍රී ලංකා දුම්රිය ප්‍රධාන සැලැස්ම

2017 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධාන (ගිවිසුම් අංක TA 9382-SRI 27.10.2017) යටතේ ලද ඇමරිකන් ඩොලර් මිලියන 1.5 ක් වැය කර දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන මෙහෙයුම් සැලැස්මක් (Master plan) සකස් කිරීම සඳහා 2017 ඔක්තෝබර් 27 දින ගිවිසුමකට එළඹ තිබූ අතර ව්‍යාපෘතිය 2022 ජූනි 30 දින නිමා කළ යුතු වුවද 2021 ජූනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. ආසියානු බැංකු මූලාශ්‍ර වලට අනුව 2021 ජූලි 05 දින වන විට මේ සඳහා නිදහස් කළ ප්‍රතිපාදන ඇ.ඩො. 1,056,555.63 ක් විය. එසේ වුවද සකස් කරන ලද මෙහෙයුම් සැලැස්ම පිළිබඳ විස්තර ඉදිරිපත් නොවූ අතරම ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් ප්‍රදානයන් ප්‍රවාහන අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු තුළ හෝ මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත්ව නොතිබුණි.

ආදායම

රු.මිලියන 2,678 ක් වූ 2021 වර්ෂයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපර්තමේන්තුවේ ආදායම, රු.මිලියන 4,566 ක් වූ 2020 වර්ෂයේ ආදායමට වඩා සියයට 41 කින් ද, රු.මිලියන 7,901 ක් වූ 2019 වර්ෂයේ ආදායමට සාපේක්ෂව සියයට 66 කින්ද අඩු වී තිබුණි.

හිඟ හිටි ආදායම් අයකර නොගැනීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු. මිලියන 809.66 ක් වී තිබුණි. එම හිඟහිටි ආදායමෙන් 1987 ට පෙර සිට රජයේ ආයතන 197 කින් අයවිය යුතු රු. මිලියන 7.38 කින් හා 1990 ත් 2020 ත් අතර කාලය තුළ රජයේ ආයතන 187 කින් අයවිය යුතු රු.මිලියන 1.76 ක් වශයෙන් රු.මිලියන 9.13 ක හිඟ බලපත්‍ර ශේෂයක් නිරීක්ෂණය විය. තවද දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 31 කින් එකතුව රු. මිලියන 120.47 ක් හිඟ හිටිව පැවතුණු අතර ඒ තුළ වූ ආයතන 16 කින් ලැබිය යුතු රු. මිලියන 20.31 ක් වර්ෂ 21 කට වඩා පැරණි වූ අතර වසර 05 ක් ඉක්මවූ හිඟ වෙළඳ බිල්පත් වටිනාකම රු.මිලියන 1.7 ක්ද විය. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට දුම්රිය ස්ථානවලින් අයවිය යුතු හිඟ මගී ආදායම රු.මිලියන 12.75 ක් විය.

වරාය හා නාවික කටයුතු

විගණන නිරීක්ෂණ

- ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ආනයනය කිරීම
- බහලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස
- නැව් බඩු මෙහෙයුම් කටයුතු
- කොළඹ වරාය වෙත යාත්‍රා පැමිණීම (ආගමනය)
- පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම
- නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඌන උපයෝජනය
- හම්බන්තොට වරාය ඉදිරිකිරිම සඳහා ලබා ගත් විදේශ ණය
- පරිපාලිත සමාගමක් විසින් ලබා ගත් ණය වෙනුවෙන් ඇපවීම
- CCTV කැමරා පද්ධතිය සවි නොකිරිම
- රේගුව විසින් පනවා තිබුණු දණ්ඩනය
- වරාය අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්
- වත්කම් සමාලෝචනය
- මුදල් පනතට හා වරායවල් පිළිබඳ අධිකාරී පනතට අනුකූල නොවීම්
- වරාය පනතට අනුකූල නොවීම
- විධිමත්ව ඉඩම් පවරා නොතිබීම
- සම්බන්ධිත පාර්ශව ගණුදෙනු
- අනාර්ථික වියදම්
- හානිපූර්ණය
- ප්‍රාග්ධනිත නොකල හඳුනා නොගත් මිලදී ගැනීම්
- ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාදී නොමැති කොටස් හිමිකම
- මානව සම්පත් කළමනාකරණය
- පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් නොකිරීම
- ප්‍රමාද වූ ව්‍යාපෘති
- පර්යන්ත සේවා ගිවිසුම්වලට පටහැනිව නැව් නියෝජිත ආයතන සඳහා ප්‍රතිධාන ලබාදීම

වරාය හා නාවික කටයුතු

දකුණු ආසියානු කලාපයේ නාවික ක්‍රියාකාරකම්වල වඩාත්ම තරගකාරී කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමෙන් උසස් තත්වයේ සහ පරිශීලක හිතකාමී නාවික සේවාවක් සැපයීමේ දැක්මකින් යුතුව ක්‍රියාත්මක වන වරාය හා නාවික අමාත්‍යාංශය හා ඒ යටතේ ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල 03ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- කොළඹ සහ හම්බන්තොට මුහුදු වරායන් වාණිජ හා මගී වරායන් ලෙස සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම.
- හම්බන්තොට වරාය කාර්මික හා සේවා වරායක් ලෙස සංවර්ධනය කිරීම සහ නැව් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ නැව් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වැනි සේවාවන් සැපයීම සඳහා දේශීය ව්‍යාපාර සඳහා පහසුකම් ඇති කිරීම.
- පුද්ගලික අංශයේ සහභාගිත්වයෙන් පෑලියගොඩ, වේයන්ගොඩ සහ රත්මලාන යන ප්‍රදේශවල මාර්ග හා දුම්රිය සම්බන්ධතාව පදනම් කරගත් බහාලුම් අංගන සංවර්ධනය කිරීම.
- ප්‍රති නැව්ගත කිරීම හැසිරවීමේ ධාරිතාවය, ගුදම් පහසුකම් බහාලුම් අංගන, සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන වැඩිදියුණු කිරීම.
- කලාපීය අවශ්‍යතාවයන් සහ ජාතික ආර්ථිකයේ අවශ්‍යතා අනුව ගාල්ල, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමලය වරායන් සංවර්ධනය කිරීම.
- ජාතික කර්මාන්තයක් වශයෙන් ධීවර, නාවික හා සංචාරක ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය බෝට්ටු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.
- විදේශ වෙළෙඳපල අවශ්‍යතා ඉලක්ක කර ගනිමින් අපනයනය සඳහා නැව් හා බෝට්ටු නඩත්තු, අළුත්වැඩියා හා නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම හා දිරිගැන්වීම.
- නැව් හා බෝට්ටු නිෂ්පාදන සඳහා අවශ්‍ය ඉංජිනේරු හා තාක්ෂණික පහසුකම්, එම නිෂ්පාදන සඳහා අවශ්‍ය තටාංගන හා යටිතල පහසුකම් සංවර්ධනය.
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව සමග සම්බන්ධීකරණය.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා වරාය හා නාවික අමාත්‍යාංශයට හා ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත එකතුව රු.මිලියන 2,883 ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් රු. මිලියන 1,612 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 29 හි දැක්වේ.



	වරාය හා නාවික අමාත්‍යාංශය	ගුදම්පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	එකතුව
ප්‍රතිපාදන රු.මිලියන	1,625	1,258	2,883
වියදම් රු.මිලියන	1,407	205	1,612
ඉතිරිය රු.මිලියන	218	1,053	1,271

රූපසටහන 29 - ඇස්තමේන්තුගත හා සත්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

වරාය හා නාවික අමාත්‍යාංශය හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල 03 ක් විසින් ඉහත සඳහන් කාර්යන් හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන යටතේ කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම සඳහා වූ රු. මිලියන 380 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස ඉතිරිය සියයට 24 ක් ද කුළුණු මතින් ඉදිවන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. මිලියන 210 කින් ඉතිරිය සියයට 48 ක්ද විය. තවද මෙම ව්‍යාපෘති 2 හි සැලසුම් කල ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කල පරිදි වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නොහැකි වීම නිසා කාර්යසාධනය පිළිවෙලින් සියයට 75 සහ සියයට 12 යන මට්ටම් වල පැවතුණි.

රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ආනයනය කිරීම

2016 ජනවාරි 13 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාරව විදේශාධාර ව්‍යාපෘතිද ඇතුළුව සියලුම රාජ්‍ය ආයතන විසින් 2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ආනයනය කිරීම සීමාසහිත ලංකා නැව් සංස්ථාව මඟින් කළ යුතුව තිබුණි. එසේම 2016 පෙබරවාරි 18 දිනැති අංක 03 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය මඟින්ද, 2016 අගෝස්තු 11 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත ලබාදී තිබූ උපදෙස්

මහින්ද රාජපක්ෂ වරාය අංශයේ භාණ්ඩ ආනයනය සී/ස ලංකා නැව් සංස්ථාව මගින් සිදුකළ යුතු බවට සඳහන් කර තිබුණි.

කෙසේ වුවද, සමාගමේ සේවය ලබාගන්නා රාජ්‍ය ආයතන සංඛ්‍යාව සීමාවී පැවති අතර, විශාල වශයෙන් ආනයන කටයුතුවල යෙදෙන රාජ්‍ය ආයතන සමාගමේ සේවා ලබාගෙන නොතිබුණි. එසේම, ඇතැම් රාජ්‍ය ආයතන වෙනත් විදේශීය නැව් සමාගම් මගින් ආනයනයන් සිදු කර ගැනීම සඳහා ඉල්ලීම් කර තිබුණු බව අනාවරණය විය. 2017 වර්ෂයේදී එවැනි ඉල්ලීම් කර තිබූ අවස්ථා 700කට අධික සංඛ්‍යාවක් සඳහා ද 2018 වර්ෂයේදී අවස්ථා 538 ක් සඳහා ද 2019 වර්ෂයේදී අවස්ථා 486 සඳහා ද 2020 වර්ෂයේදී අවස්ථා 492 ක් සඳහා ද 2021 වර්ෂයේදී අවස්ථා 347 සඳහා ද සමාගම විසින් අත්හැරීමේ නිවේදන ලිපි (waivers) නිකුත් කර වෙනත් ආයතන මගින් ආනයන පහසුකම් සලසා ගැනීමට ඉඩ සලසා තිබුණි. මේ අනුව රාජ්‍ය ආයතන විසින් සිදුකරනු ලබන භාණ්ඩ ආනයනය කිරීම් හා සම්බන්ධ ව්‍යාපාරික අවස්ථාවන් සමාගම වෙත ලබාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාවට නංවා නොතිබුණු බව නිරීක්ෂණය විය. ඉහත සඳහන් චක්‍රලේඛ මගින් සමාගමේ වෙළඳපල කොටස පුළුල් කර ගැනීම සඳහා සලසා තිබුණු රාජ්‍ය අනුග්‍රහයන් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමට සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

බහලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස

2021 වර්ෂය සඳහා ලෝකයේ වරායවල බහාලුම් මෙහෙයුම් පිළිබඳව ඇල්ෆාලයින් සංවිධානය විසින් නිකුත් කරන ලද ශ්‍රේණිගත කිරීමේ වාර්තාව (Alpha Liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Units) 7,249,358 ක් මෙහෙයුම් සිදු කරමින් මෙම වර්ෂයේදී ලෝකයේ වරාය අතරින් 22 වෙනි ස්ථානයේ රැඳී සිටී. එම වාර්තාව අනුව 2020 වර්ෂයට සාපේක්ෂව කොළඹ වරායේ බහලුම් මෙහෙයුම් කටයුතුවල සියයට 5.8 ක වර්ධනයක් ලඟාකරගෙන තිබූ අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්තවල එම වැඩිවීම සියයට 4.8 ක් වී තිබුණි.

නැව් බඩු මෙහෙයුම් කටයුතු

කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායන් වෙත 2017 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව 4,942 ක් වී තිබුණත්, 2021 වර්ෂය වන විට එම සංඛ්‍යාව 4,180 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, මෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම් ඒකක ගණන 2016 දී මිලියන 5.7 ක සිට 2021 වර්ෂයේදී මිලියන 7.2 ක් දක්වා වැඩිවී තිබුණි. එසේම මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය 2018 වර්ෂයේදී මෙ.ටො.මිලියන 10.1 ක සිට 2021 වර්ෂය වන විට මෙ.ටො.මිලියන 9.2 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර වගුව 21 හි දැක්වේ.

විස්තරය	2016	2017	2018	2019	2020	2021
පැමිණි නැව් සංඛ්‍යාව	5,023	4,942	4,933	4,708	4,337	4,180
මෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම් ඒකක ගණන (ඒකක 000)	5,735	6,209	7,047	7,228	6,854	7,249
මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (මෙ.ටොන් 000)	8,197	9,210	10,136	9,530	8,894	9,229

වගුව 21 - ප්‍රධාන වරායන්වල මෙහෙයවන ලද බහලුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය

මූලාශ්‍රය :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

කොළඹ වරාය වෙත යාත්‍රා පැමිණීම (ආගමනය)

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී කොළඹ වරාය වෙත බහලුම්ගත යාත්‍රා පැමිණීම යාත්‍රා 131 කින් හෙවත් සියයට 3.4 කින් අඩු වී තිබුණි. 2016 වර්ෂයේ සිටම බහලුම් යාත්‍රා පැමිණි සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීමක් නිරීක්ෂණය වූ අතර මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ යාත්‍රා වෙනුවට විශාල ප්‍රමාණයේ යාත්‍රා පැමිණීම මේ සඳහා හේතුවී තිබුණි. විස්තර රූපසටහන 30 හි හා රූපසටහන 31 හි පරිදි වේ.



රූපසටහන 30 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - වර්ගීකරණය සහිතව

මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව



	2015	2016	2017	2018	2019	2020	2021
පැමිණි මුළු යාත්‍රා සංඛ්‍යාව	4,197	4,405	4,329	4,331	4,198	3,806	3,675

රූපසටහන 31 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - මුළු යාත්‍රා සංඛ්‍යාව

මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව

පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම

කොළඹ වරාය විසින් 2001 දී බහලුම් ඒකක 1,726,616 ක් මෙහෙයවා තිබූ අතර 2021 වන විට එම සංඛ්‍යාව බහාලුම් ඒකක 7,249,358 දක්වා වර්ධනය වී තිබුණි. මෙම බහාලුම් මෙහෙයුම් කටයුතුවලදී කොළඹ වරාය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපොල කොටස 2001 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසානය දක්වා වර්ෂ විසි එකක කාලය තුළ සියයට 81 ක සිට සියයට 30 ක් දක්වා පහත වැටී තිබුණි. කොළඹ වරාය තුළ දිගුකාලීන බදු පදනම මත පෞද්ගලික අංශය වෙත ලබා දී ඇති වෙනත් පර්යන්ත දෙකක තරඟකාරීව කටයුතු කරන පුද්ගලික සමාගම් දෙකෙන් 2013 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබූ සමාගම සියයට 45 ක වෙළඳපොල කොටසක්ද, 2001 වර්ෂයේදී මෙහෙයුම් ආරම්භ කර තිබූ සමාගම සියයට 25 ක වෙළඳපොල කොටසක්ද 2021 වර්ෂය වන විට හිමිකරගෙන තිබුණි. පසුගිය වර්ෂ විසි එකක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර වගුව 22 පරිදි වේ.

වර්ෂය	ජයා බහාලුම් පර්යන්තය (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් ඒකක මිලියන 2.750)	ප්‍රතිශතය	දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (SAGT) (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් ඒකක මිලියන 1.950)	ප්‍රතිශතය	කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් ඒකක මිලියන 2.400)	ප්‍රතිශතය	එකතුව බහාලුම් ඒකක
2001	1,396,946	81	229,670	19			1,726,616
2002	1,206,694	68	558,025	32			1,764,717
2003	1,334,900	68	624,439	32			1,959,339
2004	1,320,845	59	899,720	41			2,220,565
2005	1,523,794	62	931,526	38			2,455,300
2006	1,743,669	57	1,335,411	43			3,079,078
2007	1,834,734	54	1,546,497	46			3,381,231
2008	1,747,670	53	1,739,668	47			3,687,338
2009	1,714,488	49	1,749,809	51			3,464,297
2010	2,167,173	52	1,970,268	48			4,137,441
2011	2,299,446	54	1,963,441	46			4,262,887
2012	2,316,849	55	1,870,271	45			4,187,120
2013	2,501,863	58	1,746,802	41	57,541	1	4,306,206
2014	2,559,339	52	1,661,940	34	686,636	14	4,907,915
2015	2,252,323	44	1,371,245	26	1,561,899	30	5,185,467
2016	2,100,117	37	1,632,207	28	2,002,599	35	5,734,923
2017	2,010,702	32,	1,809,835	29	2,388,531	39	6,209,068
2018	2,304,534	33	2,066,758	29	2,676,194	38	7,047,486
2019	2,282,618	32	2,052,153	28	2,893,566	40	7,228,337
2020	2,097,804	31	1,872,052	27	2,884,906	42	6,854,762
2021	2,198,334	30	1,838,693	25	3,212,331	45	7,249,358

වගුව 22 - පසුගිය වර්ෂ විසි එකක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර



රූපසටහන 32 - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු

මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2021 කාර්යසාධනය සමාලෝචන වාර්තාව

නැගෙනහිර පර්යන්තයෙහි ඉදිකිරීම් නිමකර තිබූ කොටසෙහි මෙහෙයුම් කටයුතු 2021 වර්ෂයේ සිට ආරම්භ වීම නිසා 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි පර්යන්ත ධාරිතාවය (ඒකක මිලියන 2.75+0.80) ඒකක මිලියන 3.55 දක්වා වැඩි වී තිබුණි.

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහලුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළඳපොල කොටස ක්‍රමානුකූලව පුද්ගලික අංශය වෙත නතු වෙමින් පැවතුණි. අධිකාරියේ බහාලුම් මෙහෙයුම් කටයුතු සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Terminal Occupancy Ratio) සලකා බැලීමේදී 2018, 2019, 2020 හා 2021 වර්ෂවල එය පිළිවෙලින් සියයට 65 ක්, සියයට 70, සියයට 72 ක් හා සියයට 70 ක් වී තිබුණි. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජන අනුපාතය 2021 වර්ෂයේදී සියයට දෙකකින් අඩුවී තිබුණි. තවද, අධිකාරියේ පර්යන්ත ධාරිතා උපයෝජනය සියයට 62 ක් පමණ වී තිබුණි. කෙසේ වුවද, පෞද්ගලික අංශය විසින් මෙහෙයුම් සිදුකරන එක් පර්යන්තයක ධාරිතාව උපයෝජනය සියයට 134 ක් වූ අතර අනෙක් පර්යන්තයේ ධාරිතා උපයෝජනය සියයට 94 ක් බවත් නිරීක්ෂණය විය.

නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඌන උපයෝජනය

කොළඹ වරායේ දැනට ඉදිකර ඇති බහාළුම් හැසිරවීම සඳහා වූ පර්යන්ත (terminal) අතුරින් ගැඹුර (Draft) මීටර් 14.25 ට වඩා වැඩි ගැඹුරු බේසමක් සහිත විශාල ප්‍රමාණයේ නැව් පැමිණිය හැකි පර්යන්ත වන්නේ කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (CICT) හා නැගෙනහිර බහාළුම් පර්යන්තය (ECT) වේ. කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තයේ ධාරිතාවය වසරකට විසිසම ඒකක මිලියන 2.4 ක් වේ. 2021 වර්ෂයේ දී එම පර්යන්තය වෙත නැව් 1,027 ක් පැමිණ තිබූ අතර මුළු බහාළුම්

ඒකක මිලියන 3.2 කට වැඩි සංඛ්‍යාවක් මෙහෙයවා තිබුණි. එය උපරිම ධාරිතාවයද ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලංකා බැංකුවෙන් අරමුදල් සම්පාදිතව බහාළුම් ඒකක මිලියන 0.8 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරැති හා මීටර් 440 ක් දිගැති නැගෙනහිර බහාළුම් පර්යන්තයේ අදියර 1 හි ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණි. ජය බහලු පර්යන්තය සඳහා මිලදීගත් නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි දොඹකර තුනක්, 2020 පෙබරවාරි 07 දිනැති අංක PA/HD/25 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි නැගෙනහිර බහලුම් පර්යන්තයේ (ECT) සවිකර, එහි මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණි. අනතුරුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක. අමප/21/0198/328/005/ටිබීආර් දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නැගෙනහිර බහලුම් පර්යන්තය සංවර්ධනය කිරීම, මෙහෙයුම් උපකරණ මිලදීගැනීමට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පූර්ණ හිමිකාරිත්ව සහිත බහාළුම් පර්යන්තයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2021 වර්ෂය තුළදී බහාළුම් නෞකා 30 ක් (විශාල ප්‍රමාණයේ නොවන) පර්යන්තය වෙත පැමිණ තිබූ අතර බහාළුම් 106,454 ක් මෙහෙයවා තිබුණි. මේ අනුව පර්යන්ත උපයෝජනය සියයට 13.3 ක් පමණක් වී තිබුණි. පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාවය උපරිම ලෙස උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය වන නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි විශාල පරිමාණයේ දොඹකර 03 ක් එ.ජ.ඩො. මිලියන 282.56 ක ඇස්තමේන්තුගත පිරිවැයකට මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොන්ත්‍රාත්කරුවෙකු සමඟ 2021 මැයි මාසයේදී ගිවිසුමකට එළඹ තිබූ අතර 2021 දෙසැම්බර් 18 දින සැපයුම් කොන්ත්‍රාත්තුව ප්‍රදානයකර තිබුණි. ගිවිසුම අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එ.ජ.ඩො. මිලියන 56.51 ක් වූ නමුත් එයින් 2022 ජූනි 20 දක්වා ගෙවා තිබුණු මුදල එ.ජ.ඩො. මිලියන 18 ක් වූ අතර ගිවිසුම්ගත පරිදි ඉතිරි මුදල් ගෙවීමට නොහැකිවී තිබුණි. අධිකාරිය විසින් බැංකුව වෙත අධිකාරියට අයත් ඩොලර් තැන්පතු මගින් අදාළ පරිදි එම මුදල් නිදහස් කිරීමට උපදෙස් ලබා දී තිබුණද, එම ගෙවීම් කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කිරීමට බැංකුවට නොහැකිවී තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ගෙවීම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් දොඹකර ඉදිකිරීම සඳහා සැලසුම් සමාලෝචන රැස්වීම මේ දක්වා පවත්වා නොතිබුණු අතර ඒ අනුව නිෂ්පාදන කටයුතුද ආරම්භ කර නොතිබුණි.

හම්බන්තොට වරාය ඉදිරිකිරිම සඳහා ලබා ගත් විදේශ ණය

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ විදේශ ණයවලින් 2017 නොවැම්බර් 30 දිනට අධිකාරියේ ගිණුම්වල ඉතිරිව පැවති රු. මිලියන 147,746 ක් වූ ණය හා පොළී ශේෂය මහා භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව

අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබූ අතර ඒ හේතුවෙන් එදිනෙන් පසු රජයේ කිසිදු ගිණුමක එම ණය මුදල් ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද අංක. MPS/SEC/2017/32 හා 2017 ජූලි 20 දිනැති "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 අගෝස්තු 04 දින ලබාදී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ඉහත ණය හා පොළී ආපසු ගෙවීමේ වගකීම මහා භාණ්ඩාගාරය සතුවේ. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට ණය වාරික හා පොළී ගෙවා තිබූ අතර 2021 වර්ෂය සඳහා වූ ලේඛන අනුව, 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු ණය ශේෂය රු.මිලියන 165,483 ක් වී තිබුණි. තවද, ඉහත ණය මුදලට අදාළව 2017 නොවැම්බර් 30 දක්වා කාලයට ගණනය කරන ලද විදේශ විනිමය පරිවර්තන සමුච්චිත අලාභය රු.මිලියන 31,545 ක්ද ණය ඉවත් කිරීමත් සමඟ අධිකාරියේ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. 2017 නොවැම්බර් 30 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා වූ විදේශ විනිමය පරිවර්තන සමුච්චිත අලාභය වූ රු.මිලියන 34,072 ක් ද ඇතුළත් 2020 දෙසැම්බර් 31 දිනට, විදේශ විනිමය පරිවර්තන සමුච්චිත අලාභය රු. මිලියන 65,618 ක් සහ 2021 වර්ෂයේ විදේශ විනිමය පරිවර්තන අලාභය ද මහා භාණ්ඩාගාරයේ හෝ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය ශේෂයට අදාළව ගණනය කරන ලද විදේශ විනිමය පරිවර්තන ලාභය/ අලාභය පිළිබඳ තොරතුරු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අවස්ථා කිහිපයකදී අධිකාරියේ සභාපතිවරයා වෙත මෙම ණය මුදල අධිකාරියේ පොත්වලට ඇතුළත් කර ගන්නා ලෙස දැනුම් දී තිබුණි. කෙසේ වුවද 2021 වර්ෂය අවසන් වන විටද ඉහත ණය ශේෂ හා අදාළ විදේශ විනිමය පරිවර්තන ලාභ/ අලාභ ගිණුම්ගත කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය හෝ මහා භාණ්ඩාගාරය කටයුතු කර නොතිබුණි.

පරිපාලිත සමාගමක් විසින් ලබා ගත් ණය වෙනුවෙන් ඇපවීම

2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම විසින් 2014 වර්ෂයේදී නැව්තෙල් මිලදී ගැනීම සඳහා පුද්ගලික බැංකුවකින් එක්සත් ජනපද ඩොලර් මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එයින් එක්සත් ජනපද ඩොලර් මිලියන 22.3 ක් 2022 මැයි 31 දින වන විටත් පියවා නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශ අනුව ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් වත්කම් නොමැති බවද නිරීක්ෂණය විය. කෙසේ වුවද, අදාළ බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේදී කොළඹ දිසා අධිකරණයේ පවරා පවත්වාගෙන යමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් අධිකාරියේ ප්‍රධාන නීති නිලධාරී විසින් රු.මිලියන 4,465 ක් වූ මෙම බැරකම පියවීම සඳහා 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදන සිදු

කරන ලෙස මුදල් අංශ ප්‍රධානී වෙත දන්වා තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37, 10 (අ) ඡේදය අනුව ඉහත වගකීම වෙනුවෙන් අසම්භාව්‍ය බැරකම් වෙන්කිරිමක් සිදුකර නොතිබුණු අතර මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ලාභය රු.මිලියන 4,465 කින් අධිගණනය වී තිබුණි.

CCTV කැමරා පද්ධතිය සවි නොකිරිම

අධි ආරක්‍ෂිත කලාපයක් ලෙස නම් කර තිබෙන වරාය පරිශ්‍රයේ ආරක්‍ෂාව තහවුරු කර ගැනීම පිණිස 2017 හා 2018 වර්ෂවල ප්‍රාග්ධන අයවැය තුලින් සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම් සඳහා පිළිවෙලින් රු. මිලියන 60 ක් හා රු. මිලියන 150 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවිකිරීමට සැලසුම්කර තිබුණි. 2019 හා 2020 වර්ෂ තුළදී ද ඒ සඳහා රු. මිලියන 150 ක් හා රු.මිලියන 600 ක් වශයෙන් වාර්ෂික අයවැයෙන් වෙන්කර තිබූ අතර 2021 මාර්තු 09 දිනැති අංක PA/MD/46 දරන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂකගේ ලිපිය මගින් ද CCTV කැමරා පද්ධතියක් සවිකරන බව දන්වා තිබුණි. එසේම මෙම කාර්ය සඳහා 2020 ජනවාරි 30 දිනැති හා අංක. PFD/DFD/103/CM/03 දරන මුදල් හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවක් (CAPC) හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් (TEC) පත්කිරීමට 2020 පෙබරවාරි 13 දිනැති අංක. අමප/20/0174/222/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද, එම අනුමැතිය අවලංගු කිරීමකින් තොරව CCTV කැමරා පද්ධතිය සවිකිරීම සඳහා 2021 වර්ෂයේදී වෙන්කර තිබූ අයවැය ප්‍රතිපාදන රු.මි. 600 කින් රු.මි.580 ක් කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් අනුව සැලසුම් හා සංවර්ධන කොට්ඨාශයේ උපදේශන කටයුතු සඳහා මාරුකර තිබුණි. ඒ අනුව අධි ආරක්ෂිත කලාපයක් වන වරාය අධිකාරියේ CCTV කැමරා සවිකිරීමේ කාර්යය සිදුකර නොතිබූ අතර මේ හේතුවෙන් ආරක්‍ෂාව පිළිබඳ ගැටළුවකදී අවශ්‍ය තොරතුරු ලබාගැනීමට නොහැකි වීමේ අවධානම බැහැර කල නොහැකි වන අතරම මෙහෙයුම් කටයුතුවල විනිවිදභාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ තහවුරු පරීක්ෂාවන් කල නොහැකි බවද නිරීක්ෂණය විය.

රේගුව විසින් පනවා තිබුණු දණ්ඩනය

2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුව දැනුවත් කිරීමකින් තොරව අධිකාරිය විසින් ආනයනය කරන ලද දොඹකර 27 ක් සම්බන්ධයෙන් රේගුව විසින් පනවා තිබූ රු.මිලියන 1,580 ක් වූ රේගු දණ්ඩනය ලිහිල් කරගැනීම සඳහා රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව රේගු විමර්ශණයක තීන්දුවක් මත මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් සිදු කල හැකි වුවද, අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් ගිණුම්වල රු.මිලියන 957.9 ක අසම්භාව්‍ය බැරකමක් වෙන්කර තිබුණි. ඉහත කරුණ සම්බන්ධයෙන් අධිකාරිය අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව නිශ්ප්‍රභා කොට තිබූ අතර

අභියාචනාධිකරණයේ නියෝගයට එරෙහිව 2020 වර්ෂයේ දී අධිකාරිය විසින් අභියාචනා පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබුණි. කෙසේ වුවද, 2022 මාර්තු 09 දිනැති මුදල් අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව අමාත්‍ය මණ්ඩල තීරණයක් මත රේගු දණ්ඩනය රු.මිලියන 50 ක් දක්වා අඩු කිරීමට අනුමැතිය ලබාදී තිබුණි.

වරාය අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්

හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල වෙනුවෙන් අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ගෙවන ලද වාරික මුදල රු. මිලියන 4,406 ක් හා මුද්දර ගාස්තු රු. මිලියන 372 ක් ද ඇතුළුව රු.මිලියන 4,778 ක මුදල 2022 අප්‍රේල් 30 දින දක්වාම අධිකාරිය වෙත ලැබී නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් ශේෂ සනාථන අධිකාරිය විසින් කැඳවා තිබුණද මහා භාණ්ඩාගාරය විසින් එම සනාථන තහවුරු කර නොතිබුණු අතරම 2021 වර්ෂය සඳහා වූ ජනරජ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ තුළ මෙම ශේෂය ඇතුළත් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. මේ නිසා මෙම මුදල ලැබීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෙල් ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුවෙන් ලබාගෙන තිබූ ඩොලර් ණය මුදල සඳහා වාරික මුදල් මහා භාණ්ඩාගාරය විසින් නියමිත වේලාවට නොගෙවීම හේතුවෙන් අධිකාරිය නමින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන එක්සත් ජනපද ඩොලර් ගිණුමෙන් 2018 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 0.64 එනම් රු.මිලියන 377.84 ක් බැංකුව විසින් අයකරගෙන තිබුණි. අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ 2021 දෙසැම්බර් 31 දිනට ඉහත මුදල මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණ ද 2022 අප්‍රේල් 30 දින දක්වාම මුදල් ලැබී නොතිබුණු අතර එම මුදල් ලැබීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

වත්කම් සමාලෝචනය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිශ්‍ර අංශයේ ඉඩම් ලේඛනය අනුව රු. මිලියන 633.94 ක් වටිනා ඉඩම් කැබලි 19 ක් වෙනත් ආයතන වෙත බදු පදනම මත ලබාදී ඇති බව දක්වා තිබූ නමුත් මූල්‍ය අංශය විසින් පවත්වාගෙන යනු ලබන ආයෝජන දේපල පිළිබඳ ලේඛනයට එම ඉඩම් ඇතුළත්කර නොතිබුණි. මේ හේතුවෙන් වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන දේපල රු. මිලියන 633.94 කින් ඌනගණනය වී තිබුණු අතර ඉඩම් වටිනාකම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරන ලද වත්කම් සමාලෝචන කමිටු වාර්තාව අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු.මිලියන 403.68 ක්වූ මෙහෙයුම් ගොඩනැඟිලි හා ඉදිකිරීම් සහ රු.මිලියන 181.9 ක් වූ යන්ත්‍ර හා උපකරණ භෞතිකව හඳුනාගැනීමට නොහැකිවීම නිසා එම වත්කම්වල පැවැත්ම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

මුදල් පනතට හා වරායවල් පිළිබඳ අධිකාරී පනතට අනුකූල නොවීම

1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේම 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 30 වගන්තිය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරන ලද වත්කම්වල අගය සහ අධිකාරියට ලබාදුන් මූල්‍යමය දායකත්වය මත වර්ෂයකට සියයට 8 ක් (අවම වශයෙන් රු.මිලියන 607) නොඉක්මවන ලාභාංශයක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. එසේ වුවද 2016 සිට 2021 දක්වා වර්ෂවලදී අධිකාරිය ලබා තිබූ එකතුව රු.මිලියන 69,687 ක් වූ ශුද්ධ ලාභ වලින් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණේ රු.මිලියන 600 ක් පමණි. තවද ඉහත ලාභ තුළ දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික අංශය වෙත ලබා දී ඇති දකුණු ආසියාතික පිවිසුම් පර්යන්තය (SAGT) හා කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) යන පර්යන්තවල මෙහෙයුම් කටයුතුවල නිරතව සිටින සමාගම් දෙකෙන් අධිකාරිය විසින් 2016 සිට 2021 දක්වා කාලය සඳහා පමණක් අයකර තිබූ එකතුව රු.මිලියන 13,021 ක් වූ බදු කුලී හා එම කාලය සඳහා රාජ්‍ය භාගය ලෙස අයකරගත් එකතුව රු. මිලියන 19,582 ක් ද ඇතුළත් වී තිබුණි. මෙම ආදායම් වරාය සෘජු මෙහෙයුම් ආදායම් නොවන බව තව දුරටත් නිරීක්ෂණය විය.

වරාය පනතට අනුකූල නොවීම

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 37 (i) වගන්තිය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අයකරනු ලැබිය හැකි ගාස්තු, මුදල් විෂයභාර අමාත්‍යවරයාගෙන් විමසා අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතුවේ. එලෙස අනුමැතිය ලබාගෙන 2019 වර්ෂයේදී සංශෝධනය කරන ලද ගාස්තු අයක්‍රම ලේඛනයේ (Tariff-2019) 24 වන අයිතමය අනුව ප්‍රතිඅපනයනයට අදාළ බහාලුම් ඉවත්කර ගැනීම සඳහා ලබාදෙන ගබඩා ගාස්තු වලින් නිදහස් කාලය දින 21 ක් වුවද නැව් නියෝජිත ආයතන සමග ඇතිකරගත් පර්යන්ත සේවා ගිවිසුම්වල (Terminal service agreement) ඒ සඳහා දින 45 ක් දක්වා සහන කාලයක් ලබාදී තිබුණි. එසේ ගබඩා ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ ප්‍රතිධාන (Rebates on storage) රු.මිලියන 2,286.44 ක් වූ අතර ගාස්තු අයක්‍රම ලේඛනයේ (Tariff-2019) සඳහන් කොන්දේසි වලට වඩා වෙනස් කොන්දේසි සහිතව පර්යන්ත සේවා ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ සඳහා මුදල් විෂයභාර අමාත්‍යවරයාගෙන් විමසා ලබාගත් අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 39 (1) වගන්තිය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යම් මාර්ගස්ථ මඩුවල තබන ලද බඩු අදාළ කාලය අවසන් වූ පසු, 40 වන වගන්තියේ විධිවිධාන වලට හානියක් නොමැතිව අධිකාරිය විසින් ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය. එසේම එම විකිණීමෙන් ලද මුදලින් අදාළ රේගු බදු ගෙවා, අධිකාරියේ ගුදම් ගාස්තු හා පරිපාලන වියදම් අඩුකරගෙන ඉතිරියක් වේ නම් එම මුදල් මහා භාණ්ඩාගාරයට යැවිය යුතුවේ. අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේදී එසේ වෙන්දේසියේ විකිණීමෙන් ලද මුදල් වලින් 2021 දෙසැම්බර් 31 දිනට පැවති නිරවුල් නොකල ශේෂය රු.මිලියන 385.14 ක් බව නිරීක්ෂණය වූ අතර ඒ තුළ 2015 සිට 2020 දක්වා ලද වෙන්දේසි ආදායම්වලින් අදාළ පාර්ශවයන් වෙත නිරවුල් නොකල රු.මිලියන 336.58 ක ශේෂයක් පැවතුණි. එසේම, 2010 වසරේ සිට 2014 දක්වා සිදුකරන ලද වෙන්දේසි වලට අදාළ නිරවුල් නොකරන ලද ශේෂය තුළ අධිකාරියේ කොටස ලෙස රු.මිලියන 63.31 ක් පෙර වර්ෂ ආදායමට හඳුනාගැනීමට කටයුතු කර තිබුණ ද එයින් රු.මිලියන 52.57 ක වෙන්දේසි ආදායමෙන් ශ්‍රී ලංකා රේගුවට ගෙවිය යුතු රේගු ගාස්තු සහ මහා භාණ්ඩාගාරයට සිදුකල යුතු දායකත්වය හඳුනාගෙන ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

විධිමත්ව ඉඩම් පවරා නොතිබීම

පිඹුරුපත් අංක. සීඔ/සීඔඑල්/2012/1047 දරණ කොළඹ ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ගිණුම්ගත වටිනාකම රු.මිලියන 604.5 ක් වූ ඉඩම් අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක ඉඩම නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාර දී තිබුණද විධිමත් ක්‍රියාමාර්ග අනුව වටිනාකම පොත්වලින් ඉවත්කර, හිමිකම් ඔප්පුවක් මගින් ඉඩම පවරාදී නොතිබුණි.

පිඹුරුපත් අංක. එල්/එස්/එම්අයිඑස්/344 දරණ කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන ගිණුම්ගත වටිනාකම රු.මිලියන 947.5 ක් වූ අක්කර 02 ක ඉඩම රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබු නමුත් ඉඩම තක්සේරු කර නීත්‍යානුකූලව පවරා දීමට හා වටිනාකම පොත්වලින් ඉවත්කිරීමට මෙම වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 18, 19 හා 21 ඡේද අනුව මූල්‍ය වර්ෂයට අදාළව සම්බන්ධිත පාර්ශවයන් සමඟ පැවති ගනුදෙනුවල ස්වරූපය, ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන වලට සිදුවී ඇති බලපෑම පිළිබඳව පරිශීලකයන්ට තේරුම් ගැනීමට අවශ්‍ය වන තොරතුරු සම්බන්ධිත පාර්ශව ගණුදෙනු යටතේ හෙළිදරව් කලයුතු වේ. එසේ වුවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හම්බන්තොට වරායේ වත්කම් දිගුකාලීන බදු පදනම මත පැවරීම වෙනුවෙන්, 2017 වර්ෂයේදී හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා (HIPS) සමාගමෙන් හා හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ (HIPG) සමාගමෙන් ලැබී තිබූ රු.මිලියන 169,479 න් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයට බැර කර තිබූ වාර්ෂික විලම්භිත බදුකුලී ආදායම වූ රු.මිලියන 1,713 ක් හා නව තෙල් ටැංකියක් සහ ගිනි ආරක්ෂණ

පද්ධතියක් ඉදිකිරීම සඳහා ජයා කන්ටේනර් ටර්මිනල් සමාගමෙන් 2021 වර්ෂයේදී අධිකාරියට රු.මිලියන 95.7 ක් ලබාදීම යන සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකල ගනුදෙනු වලට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

අනාර්ථික වියදම්

දක්ෂිණ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අරමුණින් ගාල්ල වරායේ බහු කාර්ය පර්යන්තයක් ඉදිකිරීම, 2006 මාර්තු 28 දින ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ඇති කර ගන්නා ලද ණය ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක කිරීමට එකඟව තිබුණි. ලෝක උරුමයක් ලෙස නම්කර ඇති ගාලු කොටුව ආශ්‍රිතව මෙම ඉදිකිරීම් සිදු කිරීම සඳහා යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ඒ සඳහා වසර 3 කට අධික කාලයක් ගතවීම හේතුවෙන් ණය ප්‍රදානකරු විසින් ණය කාලසීමාව දීර්ඝ නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර තිබුණි. මේ අනුව මේ සඳහා වැය කරන ලද රු. මිලියන 418 ක් වූ උපදේශන ගාස්තු සමාලෝචිත වර්ෂයේ දී ද මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙනයන වැඩ යටතේ දක්වා තිබුණි. මීට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විගණන කමිටුව ගනු ලැබූ තීරණයකට අනුව මෙම මුදල ගිණුම් ගත කල යුතු ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත සමාලෝචන මණ්ඩලයෙන් 2021 අප්‍රේල් 04 වන දින අධිකාරිය විමසීමක් කර තිබුණ ද ඊට අදාළ උපදෙස් මෙතෙක් ලැබී නොතිබුණු අතර එම වියදම ප්‍රාග්ධන හෝ අයභාර වියදමක් ලෙස 2021 දෙසැම්බර් 31 දින දක්වාම හඳුනාගෙන නොතිබුණි.

හානිපූර්ණය

2019 දෙසැම්බර් 04 වන දින නෞකාවක් කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තයෙහි ගැටීම නිසා සිදුවූ අනතුර හේතුවෙන් ජය බහාලුම් පර්යන්තයේ ජල වාරකය (Caisson), වේග වළක්වනය (Fenders), වරාය වේදිකා බිත්තිය (Quay wall) යනාදියට හානි සිදුවී තිබුණි. එම හානිය රු.මිලියන 315.90 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එසේම ඉහත හානිය වෙනුවෙන් රු.මිලියන 384.42 ක මුදලක් 2019 දෙසැම්බර් 30 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබී තිබුණද වේග වළක්වනය හැර අනෙකුත් අළුත්වැඩියා කිරීමේ කටයුතු 2022 මැයි 31 දක්වාම සිදුකර නොතිබුණි.

ප්‍රාග්ධනිත නොකල හඳුනා නොගත් මිලදී ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 55 වන ඡේදය අනුව මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ අවස්ථාවේ සිට දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම සිදු කල යුතුය. එහෙත් 2019 දෙසැම්බර් 23 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබී මෙහෙයුම් කටයුතු සඳහා යොදාගෙන තිබුණු රු.මිලියන 495 ක් වූ දියත්‍ර යාත්‍රා දෙකෙහි වටිනාකම 2021 දෙසැම්බර් 31 දින දක්වාම ප්‍රාග්ධනිත කර අදාළ පරිදි ක්ෂය කිරීම සිදුකර නොතිබුණි. මෙම ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ "අයවැය ප්‍රතිපාදන නොමැති විදේශ මිලදී ගැනීම්

අත්තිකාරම්" ගිණුමේ ඇතුළත් කර තිබුණි. මේ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දේපළ, පිරියත හා උපකරණ ඉහත ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

තවද, එම විදේශ මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 1,808.56 ක් වූ ශේෂය තුළ ගෙවීම් අවසන් කර තිබූ නමුත් වියදම් ලෙස ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට හෝ හඳුනාගත් ප්‍රතිපත්තියක් මත වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු නොකල රු.මිලියන 223.57 ක් වූ අමතර කොටස් මිලදී ගැනීම් පැවතුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය හා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අධිගණනය/ ඌනගණනය වී තිබුණි. තවද, ඉතිරි ශේෂය තුළද දැනටමත් ලැබී ඇති නමුත් ප්‍රාග්ධනීකරණය නොකළ වත්කම් හා හඳුනානොගත් වියදම් මෙම ගිණුමේ දීර්ඝ කාලීනව පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාදී නොමැති කොටස් හිමිකම

2010 වර්ෂයේදී දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (South Asia Gateway Terminal Ltd-SAGT) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය භුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අදාළ කොටස් හිමිකම අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාළ සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට 2020 වර්ෂයේ ශේෂ සනාථන මගින් පිළිතුරු ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම සමග ගිවිසුම්ගත බැඳීමක් නොතිබීම හේතුවෙන් අධිකාරිය වෙත අදාළ සමාගමේ කොටස් ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවති අතර, අධිකාරිය ඉහත ලැබිය යුතු කොටස් වටිනාකම සඳහා හානිකරණ වෙන්කිරීමක් ද සිදුකර නොතිබුණි. එසේම, 2022 පෙබරවාරි 02 දින ශේෂ සනාථ කරන ලෙස ඉල්ලීමක් කර තිබුණ ද ශේෂ සනාථන ඉදිරිපත්කර නොතිබුණි.

මානව සම්පත් කළමනාකරණය

2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 (i) ඡේදය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ලිපිය අනුව ආයතනය විසින් බඳවාගැනීමේ කාර්යය පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කෙටුම්පත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2019 පෙබරවාරි 12 දිනැති අංක MPS/AD/06/83-2017 දරණ වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද ලිපිය අනුව ශ්‍රී ලංකා

වරාය අධිකාරියේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කර ගන්නා තෙක් අධිකාරියේ සියළු බඳවාගැනීම් හා උසස්කිරීම් නොකරන ලෙස දන්වා තිබූ නමුත් අධිකාරිය විසින් 2021 වර්ෂය තුළ පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ප්‍රාථමික සේවා ශ්‍රේණියට අයත් තනතුරු සඳහා උසස්වීම් 227 ක් ලබාදී තිබුණි.

පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් නොකිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශයේ 2.2.5 වගන්තිය අනුව පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කල යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා සකස් කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් මෙතෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ප්‍රමාද වූ ව්‍යාපෘති

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් දැනට ප්‍රධාන මෙහෙයුම් කටයුතු සිදු කරන ජය බහලු පර්යන්තයේ දිග මීටර් 600 ක් පමණක් වීම නිසා දිග මීටර් 330 ක් වූ විශාල ප්‍රමාණයේ නෞකා 2 ක් එකවර හැසිරවීම අපහසුවීම හේතුවෙන් අධිකාරියට ව්‍යාපාරික අවස්ථාවන් අහිමිවී යන බැවින් එම පර්යන්තය මීටර් 120 කින් දීර්ඝ කිරීමට සහ ගැඹුර මීටර් 15 ක් ලෙස නැවතොට සකස් කිරීමට 2017 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. 2018 නොවැම්බර් 29 දින වරාය අධිකාරිය හා කොන්ත්‍රාත්කරු (China Harbour Engineering Company Ltd) සමග ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 5,035.30 (VAT රහිත) ක් විය. ගිවිසුමේ කොන්දේසි අංක 8.1 අනුව, ගිවිසුම්ගතවී දින 7 කට අඩු නොවන දිනකදී කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමේ නිවේදනය කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කල යුතු වුවද, එයින් වසර 02 ක කාලයකට පසු 2020 නොවැම්බර් 23 දින සංශෝධන සහිතව (Addendum 1) වැඩ ආරම්භ කිරීමේ නිවේදනය නිකුත් කර තිබුණි. කොන්ත්‍රාත්තුව පිළිබඳව නැවත සාකච්ඡාවට බඳුන්කර යෝජිත පරිදි වැඩිදියුණු කිරීම සිදු කිරීම සඳහා 2020 සැප්තැම්බර් 29 දිනැති අංක 20/1403/328/001/TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ නැවත අනුමැතිය ලබා ගැනීම මෙම ප්‍රමාදය සඳහා හේතු වී තිබුණි. සංශෝධනයෙන් පසුව ඉහත කොන්ත්‍රාත්තුව 2022 ජූලි 23 දින වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 30 ක් පමණක් වී තිබුණි.
- උතුරු නැගෙනහිර පිවිසුම් කලාප සංකල්පය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එක්සත්

ජනපද ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු ආනයන සහ අපනයන බැංකුව (එක්සිම් බැංකුව) අතර ඩොලර් ණය මාලා ගිවිසුමකට 2018 ජනවාරි 10 දින අත්සන් තබා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුම අත්සන් කර වසර 4 ක් පමණ ගතවී තිබුණ ද වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2020 මැයි මාසය දක්වා භූමියේ අයිතිය පිළිබඳ පැවති ගැටළු නිරාකරණය කර නොතිබූ අතර එම මාසය දක්වා වරාය ආරක්ෂාව පිළිබඳ නිශ්කාශණ සහතිකය ලබාගත නොහැකිවී තිබුණි. එම සහතිකය ලබා ගැනීමෙන් පසු 2020 ඔක්තෝම්බර් මාසයේදී කළමනාකරණ හා උපදේශන සේවා සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉන්දියානු සමාගමකට ප්‍රදානය කර තිබුණි. ඉහත ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු 2021 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද 2022 මැයි දක්වා ආරම්භ කර නොතිබුණි. 2021 වර්ෂයේ විසර්ජන පනත අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,001 ක් වැය කිරීමට අපේක්ෂා කල ද අදාළ වර්ෂයේදී වැය කර තිබුණේ රු.මිලියන 142.3 ක් පමණි. එය අපේක්ෂිත ප්‍රාග්ධන වියදමින් සියයට 14.2 ක් පමණක් වී තිබුණි. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට ඩොලර් මිලියන 45.27 ක් වූ ණය මුදලින් වැය කර තිබූ ප්‍රමාණය ඩොලර් මිලියන 0.745 ක් පමණක් වූ අතර අරමුදල් භාවිතා නොකිරීම හේතුවෙන් ණය ගිවිසුමේ 7.1 ඡේදය ප්‍රකාරව වෙන්කර ලබා නොගත් ණය ප්‍රමාණය මත කැපවීමේ ගාස්තු (Commitment charges) ලෙස ඇමෙරිකානු ඩොලර් 9,537.34 (රු. මිලියන 1.94) ක මුදලක් ඉන්දියාවේ එක්සිම් බැංකුව වෙත ගෙවීමට වරාය අධිකාරියට සිදු වී තිබුණු අතර එය අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

පර්යන්ත සේවා ගිවිසුම්වලට පටහැනිව නැව් නියෝජිත ආයතන සඳහා ප්‍රතිධාන ලබාදීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැව් නියෝජිත ආයතන සඳහා ධාරිතා ප්‍රතිධාන (Volume rebates) ලබාදීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග පර්යන්ත සේවා ගිවිසුම් (Terminal service agreements) ඇතිකරගත් නැව් නියෝජිත ආයතන සඳහා ගිවිසුමෙහි එකඟ වූ අවම ක්‍රියාකාරී සීමාවන් (Minimum TEU's to qualify for the rebates scheme) පාදක කරගනු ලබන අතර 2020 වර්ෂය තුළදී එසේ ළඟාකරගත යුතු අවම ක්‍රියාකාරී සීමාවට වඩා අඩු ක්‍රියාකාරී මට්ටම් සහිත නැව් නියෝජිත ආයතනයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ රු.මිලියන 26.95 ක ධාරිතා ප්‍රතිධාන ලබාදී තිබුණි.

මහාමාර්ග අංශය

විෂයයන්

- මහාමාර්ග අමාත්‍යාංශය
- ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය
- මාර්ග සංවර්ධන අධිකාරිය

මහාමාර්ග අංශය

මහා මාර්ග ජාලය රටක වඩාත් වටිනාම සහ වඩාත් සුවිශාල වූ සමාජයීය වත්කමක් ලෙස සැලකෙන අතර එය ආර්ථික, සමාජීය සංස්කෘතිමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද සමාජ සුභසාධනය උදෙසා ඉතා වැදගත් අංගයක් ලෙස පිළිගෙන ඇත. ඒ අනුව ආර්ථික අංශවලට සමානව සේවා හා යටිතල පහසුකම් සැපයීමෙන් නාගරික හා ග්‍රාමීය සංවර්ධනයේ විෂමතාවයට පිළියමක් වශයෙන් "කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" මූලික අවශතාවයක් ලෙස රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති තුළින් හඳුනාගෙන ඇත. රට තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම උදෙසා රජය විසින් නිරන්තරයෙන් ආයෝජනයන් සිදුකරනු ලබන අතර, ප්‍රවාහන අවශ්‍යතාවයන් වෙනුවෙන් වර්ධනය වන ඉල්ලුම සපුරාලීම උදෙසා මහා මාර්ග අංශය සඳහා සමස්ථයක් ලෙස ඉතා ඉහළ ආයෝජනයක් සිදුකරනු ලැබේ. ඒ අනුව ජාතික, පළාත් සහ ග්‍රාමීය මාර්ගද ඇතුළත්ව රටේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මඟින් මඟී ජනතාවට සිය ගමනාන්තය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම, ඉන්ධන පිරිමැස්ම, ගමනාගමන පිරිවැය අවම වීම, මාර්ග තදබදය අවම වීම යන සාධක හේතුවෙන් මෙම අංශය සඳහා සිදුකරනු ලබන ආයෝජනය ඉතා ඉහළ ආර්ථිකමය වටිනාකමක් උත්පාදනය කරනු ලබන බව නිරීක්ෂණය වී ඇත. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහා මාර්ග අමාත්‍යාංශය, ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුව තිබුණි.

- මාර්ග හා මහාමාර්ග සහ ග්‍රාමීය යටිතල පහසුකම් විෂයට සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සාංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුක්ත වන පරිදි ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- අධිවේගී මාර්ග සංවර්ධනය, ගාස්තු නියම කිරීම, රැස්කිරීම හා නියාමනය කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය මෙහෙයවීම.
- අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු සිදු කිරීම.

ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය, ගාස්තු අයකරන මහාමාර්ගද ඇතුළුව 2021 වර්ෂය

අවසන් වන විට ආසන්න වශයෙන් කි.මී.12,536 කින් යුත් වන අතර එය ‘ඒ’ශ්‍රේණියේ මහාමාර්ග දුර කි.මී. 4,217 කින් ද, ‘බී’ ශ්‍රේණියේ මහාමාර්ග දුර ආසන්න වශයෙන් කි.මී. 8,007 කින් ද, ගස්තු අය කරන මහාමාර්ග දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 312 කින් ද, පාලම් 4,254 කින් ද සමන්විත වේ. 2021 වර්ෂයේදි ජාතික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති රැසක් තුළින් ජාතික මහාමාර්ග හා ගාස්තු අයකරන මහාමාර්ග ජාලයට පුළුල් ප්‍රවේශයක් ලබා දිම සඳහා පහසුකම් සැලසිම මෙන්ම සියලු අභ්‍යන්තර හා ග්‍රාමිය පිවිසුම් මාර්ග සංවර්ධනය කිරිම තුළින් රටේ සමාජ හා ආර්ථික සංවර්ධනයට දායක වී තිබුණි.



ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය

මහාමාර්ග අමාත්‍යාංශය

2021 වර්ෂයේ දී මහාමාර්ග අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ රු.බිලියන 358.3 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.බිලියන 211.6 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මහාමාර්ග අමාත්‍යාංශ සඳහා 2021 වර්ෂය හා ඊට පෙර වසර 5 ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය, එයින් වියදම් කර තිබුණු ප්‍රමාණය හා ඉතිරිය රූපසටහන 33 න් දැක්වේ.



රූපසටහන 33 - පසුගිය වසර 6 ක කාලපරිච්ඡේදය තුළ මහාමාර්ග අමාත්‍යාංශට ලබා දී තිබුණු ප්‍රතිපාදනය සහ උපයෝජනය
මූලාශ්‍රය - වාර්ෂික කාර්ය සාධන වාර්තාව - මහාමාර්ග අමාත්‍යාංශය 2021

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලාංකික ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධන, ගමනාගමනය සබඳතාවන් හා ප්‍රවේශ අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කර නඩත්තු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තති සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන් සැකසීමේ කාර්යභාරය මහාමාර්ග අමාත්‍යාංශය වෙත පැවරී ඇති අතර සහසම්බන්ධ මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ග්‍රාමීය මාර්ග මෙන්ම ඒ හා බැඳුනු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙමින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කිරීම සඳහා වෙනමම ආයතනික ව්‍යුහයක් ඇතිකරමින් අංක 2187/27 දරණ 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින්, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

එසේම මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩ සටහන් මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම යටතේ පුළුල් දැක්මකින් සහ ඉලක්කගත ප්‍රවේශයක් ඔස්සේ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ඒ සඳහා නව ව්‍යාපෘති හා වැඩ සටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක තිරීම, මෙහෙයවීම හා පසු විපරම් කිරීම ප්‍රධාන වශයෙන් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ඉටුකිරීමට අපේක්ෂා කරන ලදී.

ඒ අනුව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් පහත ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අපේක්ෂා කෙරේ.

- ග්‍රාමීය මාර්ග,පාලම් සහ ඒ හා බැඳුනු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම.
- ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන නව ක්‍රමවේද තාක්ෂණයන් සහ යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම.
- ග්‍රාමීය ප්‍රජාව තුළ රැකියා සහ ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රවර්ධනය සහ වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම.
- ප්‍රමුඛතාවය අනුව හඳුනාගනිමින් ග්‍රාමීය මාර්ග, පාලම් හා අනෙකුත් යටිතල පහසුකම් කාර්යක්ෂමව සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරිම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරික්ෂණ වලදී අනාවරණය වූ විගණන නිරික්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- 2021 වර්ෂයේදී ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සහ ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 24,997 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණු අතර ග්‍රාමීය මාර්ග කි.මි. 100,000 ක් ඉටුකිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 20,000ක අතිරේක ප්‍රතිපාදන මහා මාර්ග අමාත්‍යාංශය මඟින් වෙන්කර දී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.මිලියන 9,500 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 8,381 ක් හෙවත් සියයට 88 ක්

වැය කිරීමට අසමත් වී තිබූ අතර ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කල මුළු ප්‍රතිපාදනය වූ රු. 35,497 ක් අතුරින් රු.මිලියන 7,018 ක් වූ ව්‍යාපෘතිවල පමණක් වැඩ අවසන් කර තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 19.6 ක් පමණක් විය. තවද සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ මාර්ග දුර කි.මී. 2839කින්, කි.මි. 536 ක පමණක් වැඩ අවසන්කර තිබූ අතර එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 18.87ක් පමණක් විය.

- ග්‍රාමීය පාලම් ඉදිකිරීම සඳහා අමාත්‍යංශය වෙත ලැබී තිබූ යෝජනා විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රමුඛතා පදනම මත හඳුනාගැනීම සඳහා ආයතන දෙකක් වෙත රු. මිලියන 31.62 ක් ලබා දී තිබුණු අතර එම ආයතන විසින් දිස්ත්‍රික්ක 6ක ඉදිකිරීම් සිදුකල යුතු පාලම් 6,432ක් හඳුනාගෙන ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද, එම පාලම් අතුරින් 2021 දෙසැම්බර් 31 දින වන විට පාලම් 13ක් පමණක් ඉදිකිරීම සඳහා තෝරාගෙන තිබීම නිසා ඉහත ආයතන දෙක වෙනුවෙන් දරා තිබූ මුදල් අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි.

මාර්ග සංවර්ධන අධිකාරිය

- 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 359,479 ක් වූ අතර එය රු.මිලියන 268,313 ක දේශීය බැංකු ණය වලින් හා රු.මිලියන 91,166 ක ණයකර වලින් සමන්විත වේ.එම බැංකු ණය ශේෂය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු ණය රු.මිලියන 245,103 කින් හා බලපත්‍රලාභී වාණිජ බැංකු නොවන ණය රු.මිලියන 114,376 කින් සමන්විත වන අතර රාජ්‍ය බැංකු ණය ශේෂය රු.මිලියන 307,893 ක් හා පෞද්ගලික බැංකු ණය ශේෂය රු.මිලියන 51,586 කින් ද සමන්විත වේ. තවද මෙම සමස්ථ බැංකු ණය වලින් රු.මිලියන 219,744 බැංකු ණය නැවත උපලේඛණ ගත කිරීම හා ණයකර නිකුත් කිරීම කර තිබුණි. මෙම ණය ශේෂයෙන් 2030 සිට 2039 අතර කාලයේ දී ගෙවා අවසන් කිරීමට නියමිත මුදල රු.මිලියන 239,857 කි.

- මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොළිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට උපරිම වශයෙන් සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට පොළිය නියම කොට තිබුණි. කෙසේ නමුත් මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබූ අතර ණය සහ වාරික ගෙවීම සඳහා භාණ්ඩාගාරය වාර්ෂික අයවැය ප්‍රතිපාදන හරහා අධිකාරිය වෙත අරමුදල් සම්පාදනය කෙරේ.

- 2021 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට අයත් A සහ B

ශ්‍රේණි වල මහාමාර්ග ජාලයේ මුළු දුර කිලෝමීටර් 12,225 ක් වූ අතර, එයින් සියයට 26 ක් වූ දුර, එනම් කිලෝමීටර් 3,179 ක් පමණක් එදිනට ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, මුළු මාර්ග ජාලයෙන් සියයට 74 ක් තවදුරටත් ප්‍රාග්ධනිත කිරීමට ඉතිරිව තිබුණි.

- 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3) වගන්තිය අනුව, සකස් කළ යුතු ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තු සඳහා ක්‍රියාකාරී සැලැස්ම, පනතේ 6(1) සහ 7(1) වගන්ති අනුව, පිහිටුවිය යුතු මාර්ග පද්ධති සංවර්ධන උපදේශන සභාව සහ දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිහිටුවා නොතිබුණි.

- සේවක සංඛ්‍යාව 13,000 කට අධික දීප ව්‍යාප්ත විසිරීමක් සහිත ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරිය සතුව සේවක බඳවාගැනීම් හා උසස්වීම් ලබා දීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවාගැනීමේ පටිපාටියක් නොමැති අතර 2005 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවාගැනීම් හා උසස්වීම් පටිපාටියක් ක්‍රියාත්මක වේ. එසේම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් නොසලකා හැර අධ්‍යක්ෂ මණ්ඩල තීරණමත තනතුරු 23 කට අදාළ නිළධාරීන් 268 ක් සඳහා වැරදි වැටුප් පරිමාණයන් අනුව වැටුප් සකස්කර ඒ අනුව ගෙවීම්කර තිබුණි.

- 2021 දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග මෙමෙයුම් හා නඩත්තු කළමනාකරණ අංශය සතු වත්කම් රු.මිලියන 824,859 ක් හා 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ පමණක් ආදායම හා වියදම පිළිවෙලින් රු.මිලියන 8,168 ක් හා රු.මිලියන 3,638 ක් විය. මෙය මාර්ග සංවර්ධන අධිකාරියේ සෙසු මෙහෙයුම් ඒකක වලින් වෙන්වූ ඛණ්ඩයක් ලෙස හඳුනා ගැනීමේ නිර්ණායකයන් අධිවේගී මාර්ග නඩත්තු හා කළමණාකරණ අංශය සපුරා තිබු නමුත් අධිකාරියේ කළමණාකාරීත්වය විසින් අධිවේගී මාර්ග අංශය සාමාන්‍ය මෙහෙයුම් වලින් වෙන් ව හඳුනා ගෙන වාර්තා කර නොතිබුණි. අධිවේගී මාර්ග අංශය වෙනම ඛණ්ඩයක් ලෙස හඳුනා ගැනීමෙන් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස සම්පත් වෙන්කිරීම තුළින් ඉහළ කාර්යසාධනයක් අපේක්ෂා කළ හැකිවිය.

- කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා බැංකුව අතර එළඹි ගිවිසුමේ ගිවිසුම්ගත කාලය අවසන් වී වසර 02 ක් ඉක්මවා ගොස් තිබුණි.ඒ අනුව, නව ගිවිසුමකට නොඑළඹීම මත බැංකුව විසින් අධිකාරි බලය හිමි නොවූ 2020 සහ 2021 වර්ෂ

සඳහා එකතුව රු.මිලියන 12.4 ක් ගනුදෙනු පිරිවැය ලෙසින් අධිවේගී මාර්ග ආදායමෙන් අඩු කර තිබුණි. එසේම, එම මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමය භාවිතා කරන්නන් දිරිමත් කිරීමට මුල් මාස 06 සඳහා පමණක් ලබාදීමට තීරණය කර තිබූ සියයට 10 ක වට්ටම ඉන් පසුවත් ලබාදීම නිසා 2020 සහ 2021 වර්ෂ වලදී අධිකාරියට රු. මිලියන 56.5 ක ආදායමක් අහිමිව තිබුණි.

- අධිවේගී මාර්ග වලින් උපයන ආදායම ගාස්තු අය කරන ජාතික මහා මාර්ග සංවර්ධනයට හා නඩත්තුවට භාවිතා කළයුතු වුවත්, ඊට පරිභාහිර ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග වලින් ඉපයූ රු.මිලියන 61,435 ක ආදායමෙන් එකතුකල අගය මත බදු ගෙවීම සඳහා රු.මිලියන 18,473 ක්, ණය සඳහා වාරික ගෙවීම සඳහා රු.මිලියන 4,052 ක්, අධිකාරියේ වැටුප් ආශ්‍රිත ගෙවීම් සඳහා රු.මිලියන 9,895 ක්, මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.මිලියන 10,713 ක්, පොදු වියදම් හා ව්‍යාපෘති වලට ගෙවීම් සඳහා රු.මිලියන 3,402 ක් සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට පහසුකම් සැපයීම වෙනුවෙන් රු.මිලියන 650 ක් වශයෙන් එකතුව රු.මිලියන 47,185 ක් වැය කර තිබුණි.

- 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය ප්‍රකාරව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, මාර්ග සංවර්ධන අධිකාරියේ කිසිදු පරිපාලිත සමාගමක් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- සමාගම් වල මූල්‍ය, පරිපාලන, මිළදී ගැනීම් හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් විධිමත් හා ඒකාකාරී බවක් ඇතිකරනු පිණිස අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආකෘතිකමය රාමුවක් හෝ මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට මාර්ග සංවර්ධන අධිකාරිය හා රේඛීය අමාත්‍යාංශය මැදිහත්ව කටයුතු කර නොතිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගමක් වන සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2015 ගිණුම් වර්ෂයෙන් පසුව මේ දක්වා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගමක් වන සී/ස මගනැගුම ඉමල්ෂන් (පුද්ගලික) සමාගමෙහි කොටස් අයිතියෙන් සියයට 99 ක් මාර්ග සංවර්ධන අධිකාරිය සතු බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල මාර්ග සංවර්ධන අධිකාරියට හා තවත් පෞද්ගලික පාර්ශවයකට සියයට 50 බැගින් සමාගමේ කොටස් හිමිකම පවතින බව සඳහන් වේ. තවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශණ වල සමාගම විසින් නිකුත් කළ කොටස් සහතිකයකින් සනාථ නොවූ රු.මිලියන 01 ක ආයෝජනයක් සිදුකල

බව සඳහන් වුවද අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන්නේ රු.100 ක ආයෝජන වටිනාකමක් සහ ඉතිරිය අධිකාරිය විසින් සාමාගම වෙත ලබාදුන් ණයක් ලෙසිනි. එසේම, සියයට 99 ක ප්‍රතිශතයට අනුරූපී වූ නියෝජනයක් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය තුළ අධිකාරියට හිමිව නොතිබුණි.

- ප්‍රමුඛතා ව්‍යාපෘති වල දුර්වල සැලසුම් හේතුවෙන්, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 04 කොටසේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2016 වර්ෂයේදී ආරම්භ කළද 2022 පෙබරවාරි 28 අවසන් වන විටත් ව්‍යාපෘතියේ සිවිල් කටයුතු ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් රු.මිලියන 448.87 ක් 2021 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙනුවෙන් වැය කර තිබුණි.

- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 3 කොටස සඳහා වන ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2013 වර්ෂයේදී ස්ථාපිත කළද දීර්ඝ කාලීන ප්‍රමාදයකින් පසුව 2021 අගෝස්තු 20 දින කි.මී.2.25ක දිගින් යුත් මාර්ග කොටසකට අදාළව කොන්ත්‍රාත් 3ක් ප්‍රදානය කරන තෙක් ව්‍යාපෘතියේ සිවිල් වැඩ ආරම්භ කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙනුවෙන් රු. මිලියන 833.83ක් දරා තිබුණි.

- කිලෝමීටර් 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ 2021 දෙසැම්බර් 31 දින වන විට කිලෝ මීටර් 53,517.39 කින් යුත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 71,468 ක් සංවර්ධනය කිරීම සඳහා හඳුනා ගෙන තිබුණි. එදින වන විට උක්ත මාර්ග ව්‍යාපෘති වලින් කිලෝ මීටර් 24,785.04 ක් වූ මාර්ග ව්‍යාපෘති 16,705 ක් සඳහා ඇස්තුමේන්තු සකස් කර තිබූ අතර, ඉන් කොන්ත්‍රාත් වටිනාකම රු.බිලියන 356.44 ක් වූ මාර්ග ව්‍යාපෘති 11,595 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම් අවසන්ව තිබුණි. මෙම වැඩසටහන වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 92.25 ක වියදමක් දරා තිබූ අතර, රු.බිලියන 15.65 ක බිල්පත් සඳහා තවදුරටත් ගෙවිය යුතුව තිබුණි.

- කිලෝමීටර් 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක මාර්ග සංවර්ධනයේ දී මහා මාර්ග සංවර්ධනය සඳහා භාවිතා කරනු ලබන මහා මාර්ග රේට උපලේඛනයන් (HSR) සහ පිරිවිතරයන් භාවිතා කර තිබුණි. නමුත්, උක්ත වැඩසටහන යටතේ සිදුකරන මාර්ග සංවර්ධනයන්ගෙන් වැඩි ප්‍රමානයක් ග්‍රාමීය මාර්ග සංවර්ධනයන් වන බැවින් ඒ සඳහා මහා මාර්ග රේටයන් සහ පිරිවිතරයන් භාවිතා කිරීම ආර්ථික සහ ඵලදායී නොවන හෙයින් ඒ සඳහා ග්‍රාමීය මාර්ග සඳහාම වූ පිරිවිතරයන් සකස් කර අනුගමනය කළ යුතුව තිබුණි.

විදුලිබල අංශය

විගණන නිරීක්ෂණ

- මෙ. වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම
- ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය
- බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
- විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය
- වත්කම් කළමනාකරණය
- කළමනාකරණ දුර්වලතා
- ගල් අඟුරු අඩුවෙන් සැපයීම
- වත්කම් පවරා නොගැනීම
- ගල් අඟුරු සමාගමෙන් අයවිය යුතු මුදල් අයකර නොගැනීම
- ජනන බලපත්‍ර ලබා නොගත් නිෂ්පාදකයන්ගෙන් විදුලිය මිලදී ගැනීම
- වෙනත් ආයතනවලට සේවකයින් නිදහස් කිරීම
- පාරිභෝගිකයින් සතු තැන්පතු සඳහා පොලී නොගෙවීම
- සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම
- දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම
- ණයගැති ශේෂ අයකර ගැනීම
- කෙටුම්පත් සාමූහික ගිවිසුමක් මත වැටුප් ගෙවීම
- සීතාවා ජල විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ලක්විජය බලාගාරය නඩත්තු කිරීම
- වළකාලන පිරිවැය ක්‍රමය (Avoided Cost Method) මත ගෙවීම් කිරීම
- සේවක දීමනා ගෙවීම
- ප්‍රසාද දීමනා ගෙවීම

විදුලිබල අංශය

විදුලිබල අමාත්‍යාංශය හා ඒ යටතේ සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 08ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අඩු වියදම් විදුලි ජනන සම්මිශ්‍රණයක් හා කාර්යක්ෂම බෙදාහැරීමක් සහතික කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව විදුලිබල විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය
- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් සංවර්ධනය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති, තාප බලාගාර, ස්වභාවික බලාගාර සම්මිශ්‍රණ තුළනය කරමින් විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම හා ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
- දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
- කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ ජාත්‍යන්තර තරඟකාරිත්වය පවත්නා පරිදි විදුලිබල පිරිවැය අවම කිරීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා විදුලිබල අමාත්‍යාංශයට හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශය වෙත එකතුව රු.මිලියන 5,808 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 5,445 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 34 හි දැක්වේ.



	විදුලිබල අමාත්‍යාංශය	සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	5,067	741	5,808
වියදම රු.මිලියන	4,918	527	5,445
ඉතිරිය රු.මිලියන	149	214	363

රූපසටහන 34 - ලබා දී තිබූ ශුද්ධ ප්‍රතිපාද ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

විදුලිබල අමාත්‍යාංශය හා ඒ යටතේ පහත සඳහන් රාජ්‍ය අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන විසින් ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

මෙ. වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම

මෙගා වොට් 31 ක ධාරිතාවක් ජාතික විදුලි ජාලය වෙත ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. වර්ෂ 3 ක ප්‍රමාද කාලයකින් පසුව මෙහි වැඩකටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන. 18,809 ක් වූ අතර ඉන් රු. මිලියන. 14,851 ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී තිබුණි. 2021 වර්ෂය අවසන් වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 30 ක් වී තිබුණි. ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම නිසා ලබාගත් ණය මුදල වෙනුවෙන් රු. මිලියන 28 කට ආසන්න එ.ජ.ඩොලර් 177,931 ක් දණ්ඩන ලෙස (commitment charges) ගෙවීමට සිදු වී තිබුණි.

ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය

බස්නාහිර, මධ්‍යම හා උතුරුමැද පළාත්වල ජාල උපපොළ ධාරිතාවය ඉහල නැංවීම හා

සම්ප්‍රේෂණ හානි අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 37,285 ක් වූ අතර මෙය 2015 ජනවාරි මස ආරම්භ කර 2018 ජනවාරි මස නිමකිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ උපදේශන සඳහා වූ විෂයපථය JICA ආයතනය සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමට ප්‍රමාද වීම, කොන්ත්‍රාත් කරුවන්ගේ පූර්ව සුදුසුකම් (PQ) හා ප්‍රසම්පාදන ලේඛන සඳහා JICA අනුමැතිය ලබාගැනීමට ප්‍රමාද වීම යන හේතු මත ව්‍යාපෘතිය නියමිත දිනට නිමකිරීමට නොහැකි වී තිබුණි. 2021 දෙසැම්බර් වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 48 ක් වී තිබුණි.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය

මෙගාවොට් 35 ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 9,424 ක් වූ අතර මෙම ව්‍යාපෘතිය 2013 අගෝස්තු මස ආරම්භ කර 2017 අගෝස්තු මස නිම කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම හා සමාජීය ගැටළු උද්ගතවීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාද වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ අදාළ ණය මුදල නිසි පරිදි උපයෝජනය නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා චීනයේ කාර්මික හා වාණිජ බැංකුව (ICBC) වෙත ආසන්න වශයෙන් එ.ජ.ඩො. 1,197,199.67 ක පමණ මුදලක් 2019 දෙසැම්බර් 16 වන විට දණ්ඩන ලෙස (Commitment chargers) ගෙවා තිබූ අතර ව්‍යාපෘතිය 2022 ජනවාරි මස සිට ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි.

විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

විදුලිබල උත්පාදනය මගින් පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කිරීමේ අරමුණින් නාගදීප, අනලතිවු හා ඩෙල්ෆ් යන කුඩා දූපත් තුනෙහි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,980 ක් වි තිබුණි. ව්‍යාපෘතිය 2019 වර්ෂයේ ආරම්භ කර 2022 වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2021 දෙසැම්බර් 31 වන විටත් ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතින මෙම ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

වත්කම් කළමනාකරණය

2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන, රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධානය කර ඇත. ඒසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට විදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ වටිනාකම රු. මිලියන 365.7 ක් වූ වාහන 42 කින් වටිනාකම රු. මිලියන 227.7 ක් වූ වාහන 19 ක් භෞතිකව අමාත්‍යාංශය සතුව නොපැවතුණි.

කළමනාකරණ දුර්වලතා

- පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම සඳහා කේන්ද්‍රීය

සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වැයවන දීර්ඝ කාලය අවම කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීම සඳහා සුළං, සූර්ය බලය හා වර්ෂාපතනය සඳහා ඵලදායි පුරෝකථන තාක්ෂණයන් හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ගයේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

- ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග ප්‍රකාශයේ ඇතුළත් කාර්යසාධන කාලරාමුව මඟින් ඉලක්ක සහ අපේක්ෂිත ප්‍රතිපත්ති අභිප්‍රායන් සමඟ සම්බන්ධ විය හැකි කාලරාමු හා ඒවා සාක්ෂාත් කර ගැනීමේ වගකීම එක් එක් ආයතන වෙත පවරා ඇත. ඒ අනුව විදුලිබල අමාත්‍යාංශය විසින් බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම හා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම සඳහා කලාපයේ පවතින රටවල් සමග මායිම් හරහා විදුලි සම්ප්‍රේෂණය කිරීමේ ආර්ථික ශක්‍යතාව 2021 වර්ෂය අවසන් වන විට අධ්‍යයනය කර ලේඛනගත කිරීම, බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යසාධනය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර හා බාහිර අවිනිශ්චිතාවයන් පිළිබඳ සොයාබැලීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ප්‍රමාණවත් නියෝජනයක් සමඟින් "බලශක්ති ක්ෂේත්‍ර අවධානම් ඇගයීමේ මණ්ඩලය" ලෙස නම් කරන උසස් මට්ටමේ ස්ථාවර කාරක සභාවක් 2019 වර්ෂය අවසන් වන විට පිහිටුවීම හා පොදු ස්ථාන ආලෝකකරණය ඇතුළුව ග්‍රාමීය, නාගරික හා ප්‍රධාන මාර්ග ආලෝකකරණය සඳහා ආලෝකකරණ ප්‍රමිති 2020 වර්ෂය තුළ හඳුන්වාදී අනිවාර්ය පදනමින් ක්‍රියාවට නැංවීම යන ඉලක්ක හා සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුව තිබුණද, එම වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටුවී නොතිබූ බව නිරීක්ෂණය විය.

ගල් අඟුරු අඩුවෙන් සැපයීම

ගල් අඟුරු සමාගමකින් සැපයූ රු.මිලියන 539.19 ක හිඟ ශේෂයක් වර්ෂ හතක කාලයක සිට ලංකා ගල් අඟුරු සමාගම විසින් එකඟ වූ බේරුම්කරණ ක්‍රමයක් යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

වත්කම් පවරා නොගැනීම

සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සහ සමූහය විසින් පුද්ගලික සමාගමක් සමඟ බද්ධ ව්‍යාපාරයක් ලෙස දූලි අළු (Fly ash) සහ බරින් වැඩි අළු (Bottom Slag) භාවිතා කරමින් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය සහ අලෙවි කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා රු.මිලියන 7.36 ක ආයොජනයක් සිදුකර තිබුණි.කෙසේ වෙතත්,හවුල් ව්‍යාපාර ගිවිසුම අත්හිටුවා ඇති අතර ව්‍යාපාරික හවුල්කරුවකු නොමැතිවීම හේතුවෙන් වත්කම අක්‍රියව පැවතුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

වත්කම් ලංකා විදුලිබල මණ්ඩලයට භාර දීමට තීරණය කර 2016 නොවැම්බර් 10 දින සාමාන්‍යාධිකාරීවරයාට සන්නිවේදනය කර තිබුණත් එම වත්කම 2021 අගෝස්තු 2 වන දින වන විටත් ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවරා ගෙන නොතිබුණි.

ගල් අඟුරු සමාගමෙන් අයවිය යුතු මුදල් අයකර නොගැනීම

ගල් අඟුරු හිඟය සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් ලංකා විදුලිබල මණ්ඩලය වෙත අයවිය යුතු රු. මිලියන 714.96 ක මුදලක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ කිසිඳු අයකර ගැනීමේ පියවරක් නොගෙන හිඟව පැවතුණි.

ජනන බලපත්‍ර ලබා නොගත් නිෂ්පාදකයන්ගෙන් විදුලිය මිලදී ගැනීම

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිවලට පටහැනිව නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රයක් ලබා නොගත් විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) 2021 වර්ෂය තුළදී රු. බිලියන 6.02 ක් වූ ගිගාවෝට් 261.32 ක බලශක්ති මිලදී ගෙන තිබුණි.

වෙනත් ආයතනවලට සේවකයින් නිදහස් කිරීම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.5 වගන්තියට පටහැනිව, රේඛීය අමාත්‍යාංශය සහ මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සඳහා නිදහස් කරන ලද සේවකයන් 65 ක් සඳහා වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස 2021 වර්ෂය තුළදී මණ්ඩලය විසින් රු. මිලියන 105.22 ක් ගෙවා තිබුණි.

පාරිභෝගිකයින් සතු තැන්පතු සඳහා පොලී නොගෙවීම

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණි. 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,357.60 ක් වූ අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. මිලියන 8,089.50 ක් විය.

සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව ඇතැම් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණි. තවද මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ඉහත

විදුලි බලාගාරවලින් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 49 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කරන ලදි.

දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම

- 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක, මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු වී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වර්ෂය තුළදී රු. බිලියන 6.54 ක් වටිනා ගිගාවොට් පැය 267.17 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගෙන තිබුණි.

- ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.37 ක් වන විට විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලාගාර තුනකින් සහ මෙගාවොට් 24 ක අතිරේක බලාගාරයකින් 2021 වර්ෂය තුළදී මිළදී ගත් බලශක්ති ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 21.75 ක්, රු. 25.26 ක්, රු. 24.97 ක් සහ රු. 88.85 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට උපරිම ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි.

ණයගැති ශේෂ අයකර ගැනීම

2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 44,079 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 6,839 ක ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,928 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

කෙටුම්පත් සාමූහික ගිවිසුමක් මත වැටුප් ගෙවීම

අදාළ පාර්ශවයන් එනම් සේවායෝජකයින් සහ සේවක සංගම් විසින් අත්සන් කර නොතිබූ බැවින් නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත් නොවූ කෙටුම්පත් සාමූහික ගිවිසුම් මත පදනම්ව 2021 වර්ෂයේදී මණ්ඩලය විසින් සේවක වැටුප සියයට 25 කින් වැඩි කර ඇති තිබුණි. ඒ අනුව, එම බලයනොලත් ගෙවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ අහිතකර බලපෑම දළ වශයෙන් රු. බිලියන 9.6 කි.

සීතාවක ජල විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

2018-2037 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (පී.එම්.යූ) 2016 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කළ අතර ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් කිරීම සහ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සකස් කිරීම වැනි කටයුතු සිදු කළේය. මෙම ව්‍යාපෘතිය මඟින් 2020 වර්ෂය අවසානයේදී රු. මිලියන 301.19 ක මුළු වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, 2021 පෙබරවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, මෙම ව්‍යාපෘතිය සී/ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්) සමාගම හරහා සංවර්ධනය කිරීමට සහ මෙම කොන්ත්‍රාත්තුව "තනි ප්‍රභව ප්‍රසම්පාදනයක්" ලෙස එම සමාගමට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් කාර්යයන් සඳහා දරන ලද මෙම වියදම වෙනත් ආයෝජකයෙකුට භාවිතා කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය මඟින් දරන ලද රු. මිලියන 301.19 ක් මණ්ඩලයේ වියදමක් ලෙස හඳුනාගැනීමට සිදුවීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය.

ලක්විජය බලාගාරය නඩත්තු කිරීම

China Machinery Engineering Corporation (CMEC) විසින් ඉදිරිපත් කරන ලද පුහුණුකිරීමේ ලේඛනයට අනුව, උපකරණවල ක්‍රියාකාරිත්වය නඩත්තු කිරීම, ප්‍රකෘතිමත් කිරීම හෝ වැඩිදියුණු කිරීමට ඒකකය සඳහා පුළුල් විසුරුවීම් පරීක්ෂා කිරීම (comprehensive disassembling inspection) සහ අලුත්වැඩියා කිරීම සඳහා වන A මට්ටමේ නඩත්තු කාල පරාසය වසර 4 සිට 6 දක්වා විය යුතුය. කෙසේ වෙතත් ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සඳහා A මට්ටමේ නඩත්තුව එම ඒකක ක්‍රියාත්මක කර වසර 7ක් ගතවී ඇතත් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. 2021 වර්ෂය තුළදී ලක්විජය බලාගාරයේ ඒකක 02 සහ 03 සම්බන්ධ බිඳවැටීම් 14 ක් සිදුවී ඇති අතර එමඟින් මෙගා වොට් පැය 663,510 ක බලශක්ති හානියක් සිදුවී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

වළකාලන පිරිවැය ක්‍රමය (Avoided Cost Method) මත ගෙවීම් කිරීම

කුඩා ජලවිදුලි බලාගාර සඳහා මිල නියම කිරීම තථ්‍ය පිරිවැය මත කළ යුතුව තිබුණද වළකාලන ලද පිරිවැය ක්‍රමය (avoided cost method) මත ඇතැම් කුඩා ජල විදුලි බලාගාර සඳහා මිල තීරණය කර තිබුණු අතර මෙම ක්‍රමය කුඩා ජල විදුලි බලාගාරයක තථ්‍ය පිරිවැයට කිසිදු සම්බන්ධයක් නොමැත. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. අංකය DGM/SYC/TCH/41 දරන නි.ස (පද්ධති පාලනය) ලිපියට අනුව ජල විදුලි බලාගාරයක සාමාන්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතු බව සහ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2020 දී මණ්ඩලයේ ජල විදුලි බලාගාරයක ඒකකයක පිරිවැය රු.2.49 ක් බව

දැක්වූවද, 2021 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 19.11 ක් සහ වියළි කාලය සඳහා රු. 20.59 ක් වී තිබුණි.

සේවක දීමනා ගෙවීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත එහි කාර්ය මණ්ඩලය වෙත වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා මණ්ඩලය විසින් ගෙවා ඇති නමුත්, 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට සහ අංක BM/2021/22/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට පටහැනිව, සේවකයින් 323 දෙනෙකුට දීමනා ගෙවීම ඔවුන්ගේ වැටුපෙන් සියයට 65 ඉක්මවා තිබුණි.

ප්‍රසාද දීමනා ගෙවීම

2021 නොවැම්බර් 21 වැනි දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 5.1 වගන්තියට පටහැනිව මණ්ඩලය අඛණ්ඩව පාඩු ලබමින් සිටියද, කෙටුම්පත් සාමූහික ගිවිසුම මත පදනම්ව 2021 වර්ෂයේදී රු. බිලියන 2.7 ක් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

බලශක්ති අංශය

විගණන නිරීක්ෂණ

- බලශක්ති අමාත්‍යාංශයේ කාර්යසාධනය
- ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය
- සපුගස්කන්දේ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම
- උතුරු පළාත සඳහා තොග ගබඩාවක් ස්ථාපිත කිරීම
- පොලිප්ටෝ ලංකා සමාගම
- නියාමන කාර්යභාරයන් විධිමත්ව ඉටු නොකිරීම
- විශේෂ ව්‍යාපෘති කළමනාකරණය
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පාඩු හා හානි
- මානව සම්පත් කළමනාකරණය
- දේශීය ඛනිජ තෙල් වෙළඳපොල
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්වය
- ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්)
- ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීම හා බෙදාහැරීමේ පහසුකම්
- අන්තර් සමාගම් ගණුදෙනු ශේෂයන් සහ ගිවිසුම්
- මාසික උපයෝගිතා ගාස්තුව (MUF)
- පිරිපහදු නැවතුම හා නඩත්තුව - 2021 වර්ෂය
- Ship to Party (SPS) ඉන්ධන බෙදා හැරීමේ ක්‍රමවේදය
- අලෙවි නියෝජිත කොමිස්
- පොදු පරිශීලක පහසුකම්
- SAP පරිගනක පද්ධතිය
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූල නොවීම
- බේරුම්කරණ ගිවිසුමේ (Settlement Agreement) නියමයන් සහ කොන්දේසි පිළිබඳ විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් නොමැති වීම
- ලිඛිත ගිවිසුම් නොමැති වීම
- ඉන්ධන බෙදාහැරීම
- ඉන්ධන බෙදා හැරීම සඳහා කුලී පදනම මත බවුසර් රථ යොදා ගැනීම
- ප්‍රාග්ධන ව්‍යාපෘති
- සේවක ණය

බලශක්ති අංශය

බලශක්ති අමාත්‍යාංශය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය යන ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් පවතින අතර පහත සඳහන් කාර්යන් සහ කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය
- බලශක්ති විෂය භාර අමාත්‍යවරයාගේ මග පෙන්වීම යටතේ බලශක්ති විෂය පථයට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමාත්‍ය මණ්ඩලයට සහ අණපනත් ව්‍යවස්තාදායකට ඉදිරිපත් කිරීම සහ එයට අයත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
- රජය විසින් පිළිගත් ජාතික ප්‍රතිපත්ති සහ නීති රීතිවලට අනුව, අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වාර්ෂික අයවැය තුළින් සැපයෙන ප්‍රතිපාදන තුළ ආංශික ප්‍රතිපත්ති හා සැලසුම් මෙහෙයවීම, මුල්‍ය ප්‍රතිපාදන උපරිම ඵලදායිතාවයකින් යුතුව යෙදවීම සහ අධීක්ෂණය.
- ජාතික ප්‍රතිපත්ති තුළ අමාත්‍යාංශයේ දැක්ම,මෙහෙවර සහ අරමුණු ජනතා අවශ්‍යතා ඉලක්ක කර ගනිමින් අවශ්‍යතාව පරිදි යාවත්කාලින කිරීම
- අමාත්‍යාංශයේ විෂය පථය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රශස්ත කාර්යය මණ්ඩලය නිර්ණය කිරීම සහ විවිධ ආයතන /අංශවලට අනුයුක්ත කර ඇති කාර්යය මණ්ඩලයට නිශ්චිත ලෙස වගකීම් පැවරීම
- අමාත්‍යාංශය යටතේ තිබෙන සංස්ථා හා වෙනත් ආයතන ස්වකීය දැක්ම හා මෙහෙවර ඉටුවන පරිදි කටයුතු කිරීම සඳහා මෙහෙයවීම හා අධීක්ෂණය
- අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති සියලුම ආයතන වල පරිපාලන කටයුතු, ගිණුම් පටිපාටි සහ ප්‍රසම්පාදන කටයුතු නියමිත ප්‍රමිතිවලට අනුව සිදුකිරීමට වගබලා ගැනීම සහ විගණන ක්‍රියාවලිය සඳහා සහය දැක්වීම
- බලශක්ති ක්ෂේත්‍රයට අදාළ රෙගුලාසි, අවසර පත්‍ර, බලපත්‍ර ජනහිතකාමී ලෙස සරල කරමින් ජනතා කේන්ද්‍රීය කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සහ නියාමනය.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් බලශක්ති අමාත්‍යාංශය සඳහා රු. මිලියන 274 ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 228 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 35 හි දැක්වේ.



රූපසටහන 35 - ලබා දී තිබූ ශුද්ධ ප්‍රතිපාද ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

බලශක්ති අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍යය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

බලශක්ති අමාත්‍යාංශයේ කාර්යසාධනය

ඉන්ධන සැපයුමේ ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කිරීමට හා විශ්වාසනීයත්වය ඇතිකිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, පසුවිපරම් කිරීම හා ඇගයීම බලශක්ති අමාත්‍යාංශයේ කාර්යයක් වුවද ශ්‍රී ලංකාවේ ප්‍රධාන තෙල් වෙළඳපල ක්‍රියාකාරීන් වන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම යන ආයතන දෙකම ආවරණය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය මගින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය

භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේ ම අවධානය යොමු වී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමලය වරාය තුළ 1930 වර්ෂයේ සිට ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට පවතින මුළු ටැංකි 99 කින් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 දින ආරම්භ කර තිබුණ ද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකර භාවිතයට ගැනීමට මෙ දක්වා කටයුතු කර නොතිබුණි. තවද, තෙල් ටැංකි සංකීර්ණයේ සංවර්ධන කටයුතුවලට අදාළව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම එක්ව Trinco Petroleum Terminal (Pvt) Ltd නමින් ඒකාබද්ධ සමාගමක් පිහිටවා තිබුණද ඊට අදාළව සංවර්ධන සැලස්මක් හෝ මෙ දක්වා සකස්කර නොතිබුණි.

සපුගස්කන්දේ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම

සපුගස්කන්දේ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට මෙන්ම දේශීය අවශ්‍යතාවය සලකා නව පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී විද්වත් කමිටුවක් විසින් ශක්‍යතා අධ්‍යයන වාර්තා ලබාදී තිබුණද තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට හෝ නව පිරිපහදුවක් ස්ථාපිත කිරීමට මේ දක්වා නොහැකිවී තිබේ.

උතුරු පළාත සඳහා තොග ගබඩාවක් ස්ථාපිත කිරීම

කන්කසන්තුරේ පිහිටි ඉන්ධන තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට 2011 වර්ෂයේදී සිමෙන්ති සංස්ථාව විසින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) වෙත දන්වා තිබූ දින සිට මේ දක්වා උතුරු පළාත සඳහා තොග ගබඩාවක් ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. තවද, 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සුදුසු ඉඩමක් සොයා ගන්නා තෙක් පවතින තොග ගබඩාවම නවීකරණය හා පුළුල් කිරීම සිදු කර පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී තිබුණද මේ දක්වා එම ව්‍යාපෘතිය ඉටු කිරීමටද නොහැකි වී තිබුණි.

පොලිප්ටෝ ලංකා සමාගම

2008 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ස්ථාපිත කරන ලද පොලිප්ටෝ ලංකා සමාගම ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතී. මෙහි කර්මාන්ත ශාලාව හොරණ ප්‍රදේශයේ පිහිටුවා ඇති අතර ප්ලාස්ටික්, පොලිතින් ඝන අපද්‍රව්‍ය යොදාගෙන ඉන්ධන නිපදවීම මෙහි ප්‍රධාන කාර්ය වන අතර, අමාත්‍යාංශයට සියයට 60 ක්, නිමැවුම්කරුට සියයට 30 ක් හා මොරටුව විශ්ව විද්‍යාලයේ ඛනිජ සම්පත් පර්යේෂණ පීඨයට සියයට 10 ක හිමිකාරත්වයක් පවතී. මෙම සමාගම දැනට අක්‍රීය තත්ත්වයේ පවතින අතර, රජය මගින් ලබාදී ඇති මිලියන 80 කට අධික වත්කම් හා අනෙකුත් පහසුකම් මෙන්ම අදාළ ආයෝජකයාගේ ආයෝජනයද නිසි ප්‍රතිඵලයක් නොමැති අනාර්ථික ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කෙරේ. එසේම, මෙම සමාගම සක්‍රීය කර ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට කිසිඳු විධිමත් වැඩපිළිවෙලක් පවතින බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

නියාමන කාර්යභාරයන් විධිමත්ව ඉටු නොකිරීම

ඉන්ධන සැපයුම් දාමයෙහි ගුණාත්මක බව හා විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා එම කටයුතු විධිමත්ව නියාමනය බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණ හා කාර්යය වේ. ඛනිජ තෙල්, නැව් තෙල්, තාර, ලිහිසි තෙල් ආදී ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ශ්‍රී ලංකාවට ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම් ආදී කටයුතු නිසි කළමනාකරණයකට යටත්ව සිදුවන බවටත්, නිසි ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදන සාධාරණ මුදලකට අඛණ්ඩව පාරිභෝගිකයා වෙත ලබා දෙන බවට සහතික වීමත්, ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ප්‍රමිතීන් ගොඩ නැගීම, රසායනිකයන් එකතු කිරීම, ගබඩා ධාරිතාව මැනීමේ නව ක්‍රමවේද, ඉන්ධන වර්ණ

ගැන්වීම ආදිය පිළිබඳව පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය ආදී කටයුතු මෙම නියාමන කාර්යයන්ට ඇතුළත් වේ.

- ඛනිජ තෙල් ආශ්‍රිත පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් සඳහා ප්‍රමිත ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය මගින් සකස් කර තිබුණද, ශ්‍රී ලංකාව තුළ එම ප්‍රමිත අනුගමනය කිරීම අනිවාර්ය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැදීමට අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකාව තුළ මේ දක්වා එම ඉන්ධන වල ප්‍රමිතීන් පරීක්ෂා කිරීමේ බලයලත් ආයතනයක් ස්ථාපිත කර නොමැති අතර ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැකසීමට අමාත්‍යාංශය මේ දක්වා අපොහොසත් වී තිබුණි.

- 2016 අගෝස්තු 31 දිනැති හා අංක අමය/16/1576/19/06 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඛනිජ තෙල් අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධ යෝජනාවක් පරිදි මහජන උපයෝගිතා කොමිසමේ නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවයක් මගින් ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳව රසායනාගාර පරීක්ෂණ සිදු කළ හැකි අති නවීන හා අංග සම්පූර්ණ ඛනිජ තෙල් පර්යේෂණාගාරයක් කාර්මික තාක්ෂණ ආයතනයෙහි ස්ථාපිත කර තිබේ. එසේ වුවද, මේ දක්වා එකී තාක්ෂණික සහය ලබාගැනීමට හෝ එම ආයතනය සමඟ එකඟතාවයකට හෝ අවබෝධතා ගිවිසුමකට හෝ එළඹීමට අමාත්‍යාංශය කටයුතු කර ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව, ස්වාධීන තෙවන පාර්ශවයක් මගින් ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳව රසායනාගාර පරීක්ෂණ සිදුකරවා ගැනීමේ හැකියාව විධිමත්ව උපයෝජනය කර ගැනීමට අමාත්‍යාංශය මේ දක්වා අපොහොසත් වී ඇති අතර එම හේතුවෙන් එකී ඛනිජ තෙල් පර්යේෂණාගාරය දීර්ඝ කාලයක සිට ඌණ උපයෝජිතව/ නිෂ්කාර්යව පවතී.

- එක් එක් ඛනිජතෙල් නිෂ්පාදනය සඳහා රටේ පවතින ඉල්ලුම් තත්ත්වය, විනිමය අවශ්‍යතාවයන්, රටේ අනෙකුත් ආනයන හා නිෂ්පාදන ප්‍රමුඛතාවන් ආදිය පිළිබඳව විධිමත් හා අනෙකුත් ආයතන සමග අන්තර් සම්බන්ධතාවයකින් යුතුව කාලීනව තොරතුරු ගලා එන සහ ඒ මත ඇගයීම් සිදු කිරීමට හැකි තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය තුළ ඇති බවට තහවුරු නොවුණි. ඒ අනුව, රටේ අවශ්‍යතාවයට උචිත ලෙස ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඒ ඒ ක්ෂේත්‍ර සඳහා අනුමැතීන් ලබාදීම සහ නියාමන කටයුතු සිදු කරන්නේද යන්න ගැටළු සහගත වේ.

- නැව් තෙල් හා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම

  බලශක්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක DEVF/6/1/23(II) හා 2022 පෙබරවාරි 15 දිනැති ලිපිය හා උපලේඛණය 1 හි 07 අනුව නැව්තෙල් වෙළඳාම සඳහා ලිඛිත අධිකාරිය ලත් පුද්ගලයන් විසින් තම මාසික නැව්තෙල් කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ඊළඟ මාසයේ

18 දින හෝ ඊට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද, 2021 වර්ෂයේ දී ලිඛිත අධිකාරිය ලත් සමාගම් 13ක් විසින් විධිමත් පරිදි මාසික නැව්තෙල් කටයුතු පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර, ඒ අතුරින් සමාගම් 05 ක් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. තවද නියමිත දිනට වාර්තා ඉදිරිපත් නොකළ ආයතන 08 කට අදාළව අයකර ගත යුතුව තිබූ රු. 180,000 කට වැඩි ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබූ අතර එම ආයතනවලට එරෙහිව මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- තාර ආනයනය හා නියාමනය

  ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 පෙබරවාරි 07 දිනැති අංක 2018/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව තාර ආනයනකරුවන් විසින් තාර ආනයනයට අදාළව කාර්තුමය වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 හා 2021 වර්ෂවලට අදාළව ආනයනකරුවන්ගෙන් කාර්තුමය වාර්තා ලබාගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. තවද, නියමිත පරිදි කාර්තුමය වාර්තා ඉදිරිපත් නොකළ ආයතනවලට එරෙහිව අමාත්‍යාංශය විසින් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

විශේෂ ව්‍යාපෘති කළමනාකරණය

- 2007 වසරේ දී සිදුකරන ලද ජාත්‍යන්තර ලංසු කැඳවීම අනුව මන්නාරම් ද්‍රෝණියේ M2 ගවේෂණ බිම් කොටසේ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සඳහා තෝරාගත් කෙයාර්න් ලංකා පුද්ගලික සමාගම 2011 දී සිදුකරන ලද කැනීම් අනුව ස්වභාවික වායු නිධි දෙකක් ඇති බවට සොයා ගෙන තිබුණි. මෙම සමාගම මන්නාරම් ද්‍රෝණියේ පර්යේෂණ කටයුතු අතරමග නවතා 2015 ඔක්තෝබර් 15 දින ගිවිසුම අවසන් කර තිබුණි. තවද, මෙහි ගවේෂණ කටයුතු සහ ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේ දී ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් IHG Global සමාගම තෝරාගෙන 2016 දෙසැම්බර් සිට 2018 අගෝස්තු දක්වා අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා ඇ.ඩො. 300,000 ක් එනම් එවකට පැවති විනිමය අනුපාත අනුව රු. 46,610,853 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, මෙම බිම් කොටසේ ගවේශණ කටයුතු සිදුකිරීමට හෝ හඳුනාගත් නිධි දෙකෙහි ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස්කිරීමට අමාත්‍යාංශය මේ දක්වා අපොහොසත් වී තිබේ.

- 2012 වර්ෂයේ දී ආරම්භ කර තිබූ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන් ගතව සිදුකරන ගුරුත්ව හා චුම්බක සමීක්ෂණ මඟින් දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය කඩිනම්ව නිම කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශය අසමත්ව තිබූ අතර,

2019 අගෝස්තු 15 වන දින Bell Geospace සමාගම සමග එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව එහි කටයුතු 2020 වර්ෂය තුළ අවසන් විය යුතුව තිබුණි. එසේ වුවද, මේ දක්වා එම කටයුතු අවසන් කර ඇති බවට තහවුරු සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

- ශ්‍රී ලංකා සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කර ගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය හා නාරා ආයතනය අතර 2015 සැප්තැම්බර් 30 දින ගිවිසුමකට එළඹ 2018 සැප්තැම්බර් 28 දින වන විට ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත් මිල වූ රු. 37,165,283 ක් නාරා ආයතනය වෙත ගෙවා තිබුණි. එසේ වුවද, දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි පුහුණු නිලධාරීන් නොමැති වීම සහ අවශ්‍ය යටිතළ පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ස්ථාපිත කර විධිමත්ව උපයෝජනය කර ගැනීමට මේ දක්වා නොහැකි තිබුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- පලාලි ගුවන් තොටුපළ කලාපීය ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 575ක් ඇස්තමේන්තු කර තිබුණි. 2019 ජූනි 06 දිනැති අංක 18/1229 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ව්‍යාපෘතිය 2020 දෙවන කාර්තුව අවසානයේ දී පර්යන්තය ඉදිකිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂාකර තිබූ අතර, 2021 වර්ෂයේදී ගබඩා ටැංකි සහ බෙදා හැරීමේ මොඩියුල, ඉන්ධන පිරවුම්හල් ආදිය සඳහා ද්‍රව්‍ය/උපකරණ මිලදී ගැනීමට ලංසු කැඳවීම, ආනයනය කිරීමට හා ගුවන් තොටුපළේ උපකරණ ස්ථාපනය කිරීමට ඉලක්ක කර තිබුණි. එසේ වුවද, 2021 වර්ෂයේ මෙම කාර්යයන් ඉටුකර නොතිබූ අතර සමස්ථ ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 3 ක් පමණ වී තිබුණි.

- කොළඹ වරායේ ගබඩා ඉදිකිරීම සඳහා රු. මිලියන 75 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඒ සඳහා 2021 වර්ෂයට අදාළව රු. මිලියන 39 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ ඉදිකිරීම් කටයුතු වලින් 40% ක් සම්පූර්ණ කිරීමට ඉලක්කගත කර තිබුණද, ව්‍යාපෘතිය මේ දක්වා ආරම්භකර නොතිබුණි.

- කෙරවලපිටිය වෙරළ තීරයේ සිට කෙරවලපිටිය සහ කැලණිතිස්ස බලාගාර දක්වා කිලෝමීටර 5 ක් පමණ දුරින් පිහිටි පාවෙන ගබඩා ප්‍රතිනිර්මාණය කිරීමේ ඒකකයේ (FSRU) සිට ප්‍රති වායුකෘත ද්‍රව ස්වභාවික වායු (R-LNG) නල මාර්ගයක් ඉදිකිරීම සඳහා ඩොලර් මිලියන හතළිහකක් (40) ඇස්තමේන්තු කර තිබුණි. 2021 වර්ෂයේදී මෙහි සියයට 5 ට අඩු ප්‍රගතියක් තිබූ බව වාර්තා කර තිබුණි.

පාඩු හා හානි

2021 දෙසැම්බර් 31 දිනට අවම වශයෙන් වසර 4 ක කාලයක් ඉක්මවූ කපා නොහල ඉදිරියට ගෙන යන ලද පාඩු හා අත්හැරීම්

වශයෙන් එකතුව රු, 1,064,226 ක් වූ රිය අනතුරු 17ක් වාර්තා කර තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර පාඩුව ආපසු අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

මානව සම්පත් කළමනාකරණය

- 2021 වර්ෂය අවසානයේදී බලශක්ති අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 93 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 70 ක් විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 07 ක් ඇතුළුව පුරප්පාඩු 23 ක් පැවතුණි. විස්තර වගුව 23 හි දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය ලෙස
ජ්‍යෙෂ්ඨ මට්ටම	20	13	07	35
ද්විතීක මට්ටම	03	01	02	67
තෘතීක මට්ටම	47	35	12	26
ප්‍රාථමික මට්ටම	23	21	02	9
එකතුව	93	70	23	25

වගුව 23 : බලශක්ති අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

- තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකිවීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණි, ද්විතීය මට්ටම, තෘතීය මට්ටම ඇතුලු සියලුම මට්ටම්වල අඛණ්ඩව පුරප්පාඩු පැවැතුණි.

- ලිහිසි තෙල්, තාර, නැව් තෙල් ව්‍යාපාරය ආදී කටයුතු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදීම හා ඒ ඒ අංශවල මූලික නියාමන කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ. මෙම ක්ෂේත්‍ර පාලනයට හා නියාමනයට ඒ ඒ විෂයට අදාළ විශේෂිත තාක්ෂණික දැනුමක් සහිත වෘත්තිය නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අත්‍යාවශ්‍ය වුවද, අමාත්‍යාංශය තුළ එවැනි වෘත්තිය නිලධාරීන් නොමැති බවටත් එකී කාර්යයන් විධිමත්ව ඉටු කිරීමට හැකි වන ලෙස ආයතනික රාමුව සකස් කොට නොමැති බවටත් නිරීක්ෂණය කෙරේ.

දේශීය ඛනිජ තෙල් වෙළඳපොල

2021 වර්ෂයේදී සමස්ථ ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන

3,465 ක් වැය කර තිබූ අතර වර්ෂයේ දේශීය බනිජ තෙල් වෙළඳපොලෙන් සියයට 85 කට වැඩි සැපයුමක් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් සිදු කර තිබුණි. සමස්ත බනිජ තෙල් වෙළඳපොලේ වෙනස්වීම් වල ප්‍රතිපලයක් ලෙස, 2021 වසරේදී බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල පෙර වර්ෂයේදී පැවති එ.ජ. ඩොලර් 45.57 මිලට සාපේක්ෂව එ.ජ. ඩොලර් 68.86 ක් දක්වා සියයට 51.1 කින් ඉහළ ගොස් තිබුණි. 2021 වසර තුළ දී සපුගස්කන්ද පිරිපහදුව විවිධ අවස්ථාවලදී වසා දැමීම හේතුවෙන් පිරිපහදු නිෂ්පාදනය සමස්තයක් වශයෙන් සියයට 24.7 කින් පහළ වැටුණු අතර, ආනයනය කරනු ලැබූ පිරිපහදු කල නිෂ්පාදන පිරිවැය වසර තුළදී සියයට 75 කින් ඉහළ ගොස් තිබුණි.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්වය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.මිලියන 18,554.53 ක දළ අලාභයක් වාර්තාකර තිබූ අතර එය ඉකුත් වර්ෂයේදී වාර්තාකළ දළ ලාභය වූ රු.මිලියන 55,250.86 ට සාපේක්ෂව රු. මිලියන 73,805.39 ක අඩුවීමකි. එමෙන්ම ප්‍රවර්ථන වර්ෂයේදී රු. මිලියන 82,208.12 ක බදු පෙර ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණු අතර ඉකුත් වර්ෂයේදී රු. මිලියන 2,370.96 ක ලාභයක් ලබා තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංස්ථාවේ බදු පෙර ලාභය රු. මිලියන 84,579.07 කින් අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂයේ රු. මිලියන 21,840.76 ක්ව පැවති විනිමය අනුපාත විචලනයේ අවාසිය සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 33,220.08 දක්වා රු. මිලියන 11,379.32 කින් වැඩි වී තිබුණි.

විගණනයට ඉදිරිපත් කරන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට මුළු වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු. මිලියන 161,079.76 ක් වූ අතර එය පෙර වර්ෂයේ වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම වූ රු. මිලියන 141,103.47 ක වටිනාකමට සාපේක්ෂව සියයට 14.16 කින් ඉහළ ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේ ණය ගැති ශේෂය රාජ්‍ය අංශයේ ණයගැතියන් රු. මිලියන 146,955.21 කින් හා පෞද්ගලික අංශයේ ණය ගැතියන් රු. මිලියන 14,124.55 කින් සමන්විත විය. ඉන් ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙතින් සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල පිළිවෙලින් රු. මිලියන 83,031.65 ක් හා රු. මිලියන 62,111.12 ක් වී තිබුණි.

ඉකුත් වර්ෂය අවසානයේදී රු. මිලියන 275,208.58 ක්ව පැවති (නැවත සකස් කරන ලද) සංස්ථාවේ සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 357,504.43 දක්වා රු. මිලියන 82,295.85 කින් ඉහළ ගොස් තිබුණි. පසුගිය වසරවල සිදු වූ අධික අලාභ, විනිමය අනුපාතික වෙනස්කම් වල අඛණ්ඩ බලපෑම, නුසුදුසු මිලකරණ ප්‍රතිපත්තිය සහ පසුගිය වසර වලදී සිදු වූ හෙජින් ගනුදෙනු හේතුවෙන් සංස්ථාව ලැබූ අධික පාඩු වල සෘණාත්මක බලපෑම

හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් තවදුරටත් සෘණ අගයක් ගෙන තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව මතභේදයට තුඩු දී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 5 ක සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය (බදු පසු ලාභය) රූපසටහන 36 මගින් දැක්වේ.



රූපසටහන 36 : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 5 ක මූල්‍ය ප්‍රතිඵලය

මූලාශ්‍රය - සංස්ථාවේ විගණිත මූල්‍ය ප්‍රකාශන

ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2007 සිට 2009 දක්වා කාලය තුළ තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදුකරනලද ඉදිරි සුරකුම් ගනුදෙනුවලට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට රටට සිදු වූ මුළු පාඩුව රු. මිලියන 14,028 ක් පමණ වී තිබුණි. තවද, සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ ඉහළ වාණිජ අධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර එම නඩුව 2021 වර්ෂය අවසානය වන විටද විභාග වෙමින් පැවතුණි.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීම හා බෙදාහැරීමේ පහසුකම්

ලංකා ඛණිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත් කොළොන්නාව හා මුතුරාජවෙල පිහිටි ප්‍රධාන ඉන්ධන ගබඩා ඇතුලුව දිවයින පුරා පිහිටි ගබඩා 14 මගින් ද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සපුගස්කන්ද නව පර්යන්තයෙන්ද ලංකා ඉන්දියන් තෙල් සමාගම ත්‍රිකුණාමලයේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණයෙන්ද ඉන්ධන ගබඩාකර ගැනීමේ කටයුතු සහ නිකුත් කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ තෙල් ප්‍රවාහනය නළ හා ගොඩබිම් ප්‍රවාහන යන ක්‍රමවේදයන් මඟින් සිදු කරනු ලබන අතර ඒ අනුව තෙල් ප්‍රවාහනය සඳහා ප්‍රධාන නළ පද්ධති 4 ක් භාවිතා කරනු ලබන අතර බවුසර් හා දුම්රිය ගැල් මඟින් ගොඩබිම හරහා ප්‍රවාහන කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ඛණිජතෙල් ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වීමට සමගාමීව ඛණිජතෙල් කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු නොකළහොත් ඉන්ධන ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි ගැටලුකාරී තත්ත්වය හඳුනාගැනීම සඳහා සිදුකරන ලද විශේෂ විගණනයට අදාළ වාර්තාව (ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීම හා බෙදාහැරීම පිළිබඳව විශේෂ විගණන වාර්තාව) 2020 අගෝස්තු 28 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එහිදී පහත කරුණු ද පාර්ලිමේන්තුවේ විශේෂ අවධානයට යොමු කරන ලදී.

- මෙම වාර්තාවට අනුව ඉන්ධන නැවක් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ගොඩබෑම ආරම්භ කරන අවස්ථාව වන විට එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන්ව සලකා බැලීමේ දී ගබඩාවල දැනට පවතින ඩීසල්, පෙට්‍රල්, ගුවන්යානා ඉන්ධන හා භූමිතෙල් ප්‍රමාණය රටේ අවශ්‍යතාවයෙන් පිළිවෙලින් දින 13 ත්, දින 08 ත් සහ දින 06 ක් දක්වා අඩු වූ අවස්ථා නිරීක්ෂණය වී තිබූ අතර තවද, දැනට පවතින ගබඩා ධාරිතාවය නොවෙනස්ව පැවතියහොත් පුරෝකථනය කළ ඉන්ධන ඉල්ලුම අනුව 2026 වර්ෂය වන විට එය පිළිවෙලින් දින 09 ත්, දින 06 ත් සහ දින 05 දක්වා අඩුවිය හැකි බවට හෙවත් කිසියම් හේතුවක් මත තෙල් නැවක් මෙකී දින ගණනට වඩා ප්‍රමාද වුවහොත් රටේ පවත්නා ඉන්ධන සැපයුම අක්‍රීය වීමේ දැඩි අවදානමක් ඇති බවට නිරීක්ෂණය කර තිබුණි.

- දැනට පවතින ප්‍රධාන ඉන්ධන නල පද්ධති 04 අතරින් ආනයනික පිරිපහදු නිෂ්පාදනවලින් සියයට 70 ක පමණ ප්‍රමාණයක් කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා වූ දැනට වසර 48 සිට වසර 75 දක්වා පැරණි නළ පද්ධතිය හරහා ගොඩබානු ලබන අතර මෙම පද්ධතියෙහි නල 05 න් 02 ක් අක්‍රීය තත්ත්වයෙන් පවතින අතර අනෙකුත් නළ ද නිතර නිතර කාන්දුවීම් වාර්තා වේ. ඒ අනුව කොලොන්නාව පර්යන්තය වෙත අඟල් 10 ක පමණ කුඩා ඉතා පැරණි නිතර කාන්දුවීම් වලට ලක් වන නළයකින් සමස්ත පිරිපහදු ඉන්ධනවලින් සියයට 70 ක් ගොඩබෑම හේතුවෙන් ගොඩබෑම සඳහා අධික කාලයක් ගත වීම සහ එම හේතුවෙන් නැව් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වීම මෙන්ම නළයට යම් හානියක් සිදුවුවහොත් එමඟින් දැඩි පුද්ගල හා දේපළ හානියක් සිදුවීමේ ඉහළ අවදානමක් ද පවතින බවද නිරීක්ෂණය කර තිබුණි. තවද, පර්යන්ත අතර අන්තර හුවමාරු නළ පද්ධතියක් නොමැති බවද නිරීක්ෂණය කර තිබුණි.

- ඛනිජතෙල් ගොඩබිම් ප්‍රවාහනයේ දී බවුසර් මඟින් ප්‍රවාහනය කරනු වෙනුවට දුම්රිය ගැල් මඟින් ප්‍රවාහනයේ ඇතිවන පිරිවැයේ ඉතිරිය දුම්රිය ගැල් ප්‍රවාහනයට සාපේක්ෂව සියයට 87 සිට සියයට 235 දක්වා ඉහළ අගයක් ගත්ත ද බවුසර් මඟින් ප්‍රවාහනය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇති බවට විගණනය මඟින් හඳුනාගෙන තිබූ අතර එය පාරිසරික හානි ඉහළ යාම, වාහන තදබදය වැඩිවීම වැනි අවදානම් කෙරේ ද හේතු විය හැකි බවට ද හඳුනාගෙන තිබුණි.

- රට තුළ ප්‍රමාණවත් ඉන්ධන ගබඩා පද්ධතියක් හා ඊට අනුබද්ධ ප්‍රවාහන පහසුකම් ඇතුළු යටිතල පහසුකම් ස්ථාපිත කර නොමැති වීම හේතුවෙන් විධිමත් තොග පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කල නොහැකි වීම, රටට වාසිදායක ලෙස ජාත්‍යන්තර ඉන්ධන මිලදී ගැනීම් ගිවිසුම් සඳහා යොමු වීමට නොහැකි වීම, හදිසි මිලදී ගැනීම් සිදුකිරීමට සිදුවීම හේතුවෙන් ඉහළ පිරිවැයකට මෙන්ම අඩු ගුණාත්මකභාවයකින් යුතු නිෂ්පාදන

ආනයනය කිරීමට සිදු වීම, ඉන්ධන ගබඩා හැසිරවීම වඩා සංකීර්ණ කටයුත්තක් බවට පත්ව තිබීම, රටේ ඉන්ධන සැපයුම අඩාලවීම හේතුවෙන් සමස්ථ ආර්ථික ක්‍රියාවලිය බිඳවැටීම, නඩත්තු කටයුතු විධිමත්ව සංවිධානය කිරීමට අපහසුවීම, දැඩි පාරිසරික හානි සිදුවීම, අධික වාහන තදබදයට හේතුවීම, රටේ ස්වභාවික පිහිටීම අනුව පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි නැව් තෙල් වෙළඳාම වැනි ජාත්‍යන්තර ව්‍යාපාරික අවස්ථා රටෙන් ගිලිහී යාම වැනි අතිශය අහිතකර අවධානම් තත්ත්වයන් රට තුළ පැනනැගී ඇති බවට වාර්තාව මගින් අනාවරණය කර තිබුණි.

- ඒ අනුව රටේ ආර්ථිකය පැවැත්ම තීරණය වන ප්‍රධානතම බලශක්ති ප්‍රභවය වන ඉන්ධන සැපයුමට අදාළව යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දැනට පවතින ඉන්ධන ගබඩා ධාරිතාවය ඉහළ නැංවීම, දැනට පවතින නළ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ඉන්ධන ගොඩබිම් ප්‍රවාහනය සඳහා දුම්රිය ගැල් භාවිතයට ප්‍රමුඛතාවය ලබා දීම මේ සඳහා වන පිරිවැය හා අවදානම අඩු කිරීමට අත්‍යවශ්‍ය බවට අවධාරණය කර තිබුණි.

- ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව පිහිටා ඇති තෙල් ටැංකි සංකීර්ණය රටේ ඛණිජතෙල් සම්පාදන ක්‍රියාවලියට ඉතා පහසුවෙන් උපයෝගී කර ගත හැකි වුවද මේ දක්වා එම සංකීර්ණය සක්‍රීය ලෙස උපයෝජනය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව රට තුළ ඛණිජ තෙල් සම්පාදන ක්‍රියාවලියට අදාළව දැනට පැනනැගී ඇති අවධානම් තත්ත්වය මඟහැරවීමට හැකිවන ලෙසත්, විදේශ විනිමය උත්පාදනය කරන ජාත්‍යන්තර ව්‍යාපාර අවස්ථාවන් පුළුල් කරගත හැකිවන ලෙසත් රටේ අනාගත ඉන්ධන අවශ්‍යතාවය පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදුකර එකී අවශ්‍යතාවයන්ට උචිත ආකාරයට ඉන්ධන ගබඩා ධාරිතාවය ඉහළ නැංවීමට හැකිවන ලෙසත් දැනට දශක 9 ක පමණ කාලයක් නිෂ්කාර්යව සහ/හෝ ඌණ උපයෝගීව පවතින ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය විධිමත් නෛතික රාමුවක් ඇතුළත ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගැනීමට පියවර ගන්නා අතර ඛණිජතෙල් ආනයනය, පිරිපහදුව, බෙදා හැරීම හා විකිණීම ආදී කටයුතු සක්‍රීය ලෙස විෂයගත සමස්ථ දත්ත හා ක්‍රියාකාරීත්වය නියාමනය හා පාලනය කල හැකි පරිදි නීති පද්ධතියක් හා ස්වාධීන ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීමත්, බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කර යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය බව මෙම වාර්තාවෙන් අවධාරණය කර තිබුණි.

- එසේ උවද එකී නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් විධිමත්ව හා කඩිනම්ව ඇගයීමට ලක්කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම තුළින් බලශක්ති ක්ෂේත්‍රයේ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමට අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත

සංස්ථාව හෝ ලංකා ඛණිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මේ දක්වා කටයුතු කර ඇතිබවට අණාවරණය නොවුණි

අන්තර් සමාගම් ගණුදෙනු ශේෂයන් සහ ගිවිසුම්

රාජ්‍ය සංස්ථාවක් විසින් යම් නිශ්චිත අරමුණක් උදෙසා ස්ථාපිත කර ඇති උප සමාගම්වල කටයුතු විධිමත්ව අධීක්ෂණය කිරීමට සහ මග පෙන්වීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තකි. එසේ වුවද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එහි පරිපාලිත සමාගම වූ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමගමෙහි කටයුතු විධිමත්ව සමාලෝචනය කර නොමැති බව නිරීක්ෂණය වේ. 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3(ආ) ඡේදයට අනුව මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අර්ධ වර්ෂයකට වරක් හෝ උප සමාගම් වල කාර්ය සාධනය සමාලෝචනය කර කාර්ය සාධන වාර්තාවක් පිළියෙළ කර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතු වුවද, එසේ කර නොතිබුණි. තවද එකී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගනු ලබන තීරණ පිළිබඳව විධිමත් දැනුවත්භාවයක් සංස්ථාව සතුව නොතිබුණි. උදාහරණ ලෙස; සංස්ථාව මගින් සිදු කරනු ලබන ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තක් වන නැව් සඳහා ඉන්ධන සැපයීමේ ව්‍යාපාරය, එම උපසමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ක්‍රියාත්මක කර තිබුනද ඒ පිළිබඳව සංස්ථාව කිසිදු දැනුවත් වීමක් සිදු වී නොතිබුණි. එමෙන්ම, අන්තර් සමාගම් ගනුදෙනු පිළිබඳ විධිමත් සම්බන්ධීකරණයක් ආයතන දෙක අතර නොතිබීම හේතුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ දෙපාර්ශවයේ ජංගම ගිණුම් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසානයේදී එය රු.මිලියන 692.47 ක වෙනසක් බව නිරීක්ෂණය විය.

මාසික උපයෝගිතා ගාස්තුව (MUF)

2013 ඔක්තෝම්බර් 29 දිනැති අංක 38/1140 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට අනුව, සංස්ථාව සතු සියලුම අලෙවි නියෝජිත (CODO) පිරවුම්හල්වලින් සහ භාණ්ඩාගාරය සතු වෙළෙඳුන් විසින් පවත්වාගෙන යනු ලබන (TODO) පිරවුම්හල්වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් (MUF) 2014 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි අයකර ගැනීමට තීරණය කර තිබුණි. මෙම තීරණය නියමිත පරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවට අහිමිවූ ආදායම රුපියල් මිලියන 501.223 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ දී සමුච්චිත අහිමිවූ ආදායම රුපියල් මිලියන 3,557 ක් වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල මේ පිළිබඳව කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම සහ ජංගම වත්කම් සහ රඳවා ගත් ඉපැයීම් එම ප්‍රමාණවලින් අඩුවෙන් දක්වා තිබුණි. 2022 ජූලි 01 දින සිට MUF අයකිරීම ක්‍රියාත්මක කර ඇති බවට සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා තිබුණද ඒ දක්වා අය වියයුතු රු. මිලියන

3,557 ක් වූ සමුච්චිත මුදල අයකර ගැනීමට මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

පිරිපහදු නැවතුම හා නඩත්තුව - 2021 වර්ෂය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ මහා පිරිපහදු නැවතුම හා නඩත්තුව 2021 වර්ෂයේ පෙබරවාරි මස 15 වන දින සිට මාර්තු මස 21 වන දින දක්වා පැවතුණි. අදාළ කාලපරිච්ඡේදය තුළ නියමිත පරිදි පැමිණීමේ හා පිටවීමේ ලේඛණ නඩත්තු කර නොතිබූ අතර එකිනෙකට නොගැලපෙන පැමිණීමේ හා පිටවීමේ දිනයන් පදනම් කරගෙන මහා පිරිපහදු නැවතුමට අදාළ දීමනා ගණනය කර ගෙවීම් කර තිබුණි. තවද පිරිපහදු කාර්යාංශ නිවේදන අංක R/RM/03/2021ට පටහැනිව රු. මි. 42.6 ක පිරිපහදු නැවතුම් දීමනා හා රු.මි. 5.693 ක හිලවු නිවාඩු දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

Ship to Party (SPS) ඉන්ධන බෙදා හැරීමේ ක්‍රමවේදය

සංස්ථාව විසින් අලෙවි නියෝජිතයින් මගින් ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහරින විට අලෙවි නියෝජිතයින්ට කොමිස් මුදලක් ගෙවනු ලබන අතර සෘජුවම පාරිභෝගිකයාට අලෙවි කරනු ලබන අවස්ථාවකදී කොමිස් ගෙවනු නොලැබේ. මීට අමතරව කළමනාකාරිත්වය විසින් තෝරාගත් අලෙවි නියෝජිතයින්ට අදාළ කොමිස් මුදල් ද ලබා දී සෘජුවම පාරිභෝගිකයින් වෙත ඉන්ධන බෙදා හැරීමේ ක්‍රමවේදයක් Ship to Party (SPS) නමින් 2008 සිට ක්‍රියාත්මක කර තිබුණි. සංස්ථාවට සෘජුවම පාරිභෝගිකයාට අලෙවි කිරීමේ හැකියාව තිබියදී නියෝජිතයින්ට අතිරේක කොමිස් මුදලක් ගෙවමින් මෙවනි ඉන්ධන බෙදා හැරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ පදනම විගණනයේදී පැහැදිලි නොවිය. විගණනයට ඉදිරිපත්කරන ලද තොරතුරු අනුව, 2021 වර්ෂයේදී පමණක් තෝරාගත් අලෙවි නියෝජිතයින් 5 දෙනෙකුට මෙම ක්‍රමය යටතේ ඉන්ධන බෙදාහැරීම හේතුවෙන් රු.මිලියන 132.453 ක අතිරේක කොමිස් මුදලක් ගෙවා තිබුණි.

අලෙවි නියෝජිත කොමිස්

2019 ජුලි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව ඛනිජ තෙල්වල දේශීය වෙළඳපොළ මිල උච්ඡාවචනයන්ගේ බලපෑම මත බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස් (Dealer Commissions) ප්‍රමාණය උච්ඡාවචනයවීම මත සංස්ථාවට හා බෙදුම්කරුවන්ට වන අහිතකර බලපෑම බැහැර කිරීම සඳහා පහත රූපසටහනේ පරිදි ඉහළ හා පහළ සීමාවන්ට (Upper and Lower Cap) යටත්ව කොමිස් ප්‍රතිශතය තීරණය කර තිබුණි.

විස්තරය	ඔක්ටේන් 92 පෙට්‍රල් රු.	ඔක්ටේන් 95 පෙට්‍රල් රු.	ලංකා ඔටෝ ඩීසල් රු.	ලංකා සුපර් ඩීසල් රු.
ඉහළ සීමාව (Upper Cap)	162.00	170.00	121.00	145.00
පහළ සීමාව (Lower Cap)	117.00	128.00	95.00	110.00

- වර්තමානයේ දී රට තුළ පවතින විදේශ විනිමය හිගය හේතුවෙන් ඇතිවී තිබෙන ආර්ථික අර්බුධයේ බලපෑම මත දේශීය ඛනිජතෙල් නිෂ්පාදනවල මිල ගණන් සීග්‍රයෙන් ඉහළ ගියද, සංස්ථාවේ නොසැළකිලිමත්කම හේතුවෙන් ඉහත සඳහන් ඉහළ සීමාව (Upper Cap) නොසළකා බෙදුම්කරුවන්ට කොමිස් ගෙවා තිබුණි. ඒ අනුව බෙදුම්කරුවන්ට වැඩිපුර ගෙවා තිබූ කොමිස් මුදල ආපසු අයකර ගැනීමට යාමේදී ඊට එරෙහිව බෙදුම්කරුවන් කීහිප දෙනෙකු විසින් නඩු පවරා තිබූ අතර, ඔවුන් විසින් ගරු අධිකරණයෙන් තාවකාලික තහනම් නියෝගයක්ද ලබාගෙන තිබුණි. අනතුරුව, ගරු අධිකරණය විසින් 2022 ජූලි 15 දින එම තහනම් නියෝගය ඉවත්කර අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස් තීරණය කිරීමට බලය ඇති බවට ලබාදී තිබූ තීරණය අනුව සංස්ථාව විසින් 2022 ජූලි 17 දින සිට එම තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. එසේ උවද, සංස්ථාවේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතියට යටත්ව 2022 ජූලි 26 දින සිට ඉහළ සීමාවන් නොසළකා බෙදුම්කරුවන්ට කොමිස් ගෙවීමට කටයුතු කර තිබූ අතර මේ දක්වා ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බවට තහවුරු නොවුණි. ඒ අනුව, ඛනිජතෙල් ආනයනය කිරීම සඳහා ඩොලර් සපයා ගැනීමට අවශ්‍ය රුපියල් ප්‍රමාණය සපයා ගැනීමේ අර්බුදයකට මුහුණ දී ඇති සංස්ථාව විසින් ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට පටහැනිව 2022 සැප්තැම්බර් 15 වන විට වැඩිපුර ගෙවා තිබූ කොමිස් මුදල රු.මිලියන 6,500 ඉක්මවා තිබුණි.

- විගණනයට ලැබී ඇති තොරතුරු අනුව රටෙහි පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් සංස්ථාව විසින් බෙදුම්කරුවන්ට ලබාදෙන දෛනික ඛනිජ තෙල් ප්‍රමාණය සාමාන්‍ය ඛනිජතෙල් සැපයුමෙන් තුනෙන් දෙකක (2/3) මට්ටමට පමණ සීමාකර (QR ක්‍රමය හරහා) තිබූ බව නිරීක්ෂණය වේ. එසේ තිබියදී, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව 2022 ජූලි 26 දින ගෙවිය යුතු නියමිත කොමිස් මුදල රු. මිලියන 30.7 ක් වුවද,

එම තීරණය නොසළකා රු. මිලියන 98.6 ක් ගෙවීම හේතුවෙන් එක් දිනක් තුළ වැඩිපුර ගෙවා තිබූ කොමිස් මුදල රු. මිලියන 67.9 ක් වූ අතර එදින සිට මාසයක් තුළ වැඩිපුර ගෙවා තිබූ කොමිස් මුදල රු. මිලියන 1,960 ඉක්මවා තිබුණි. ඒ අනුව, දෛනික ඛනිජ තෙල් සැපයීම සීමා කර ඇති පසුබිමක වුවද ඉහළ සීමාව නොසළකා කොමිස් ගෙවීම හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම පහත දැක්වේ.

	දිනකට රු.මිලියන	මාසයකට රු.මිලියන	වසරකට රු.මිලියන
බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස්			
අනුමත පදනම අනුව ගෙවියයුතු මුදල	30.7	921	11,052
දැනට ගෙවනු ලබන මුදල	98.6	2,958	35,496
වැඩිවීම	67.9	2,037	24,444
අනුමත මුදලට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රතිශතය	221	221	221

ඉහත දක්වා ඇති පරිදි වැඩිපුර ගෙවීමට සිදුවන කොමිස් මුදල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් සඳහා ගෙවනු ලබන අතිකාල දීමනා, ප්‍රසාද දීමනා හා වෙනත් සියලු දීමනා ඇතුළු සමස්ථ සේවක (පිරිපහදුවේ සේවකයින් ද ඇතුළුව) පිරිවැය මෙන් හතර ගුණයකට අධික බවත් හා එය වසරකදී නව ඉන්ධන පිරවුම්හල් (ඉඩම හැර) 400 ඉක්මවා ඉදිකිරීමට වැයවන මුදලට හා සමානවන බවටත් නිරීක්ෂණය විය.

- සංස්ථා විසින් පසුගිය වසර පහ තුළ තාර, ලිහිසි තෙල්, කෘෂි නිෂ්පාදන සහ රාජ්‍ය අංශ පාරිභෝගිකයන් සඳහා ගෙවන ලද කොමිස් මුදල්ද ඇතුළුව සමස්ථ අලෙවි නියෝජිත කොමිස් පිරිවැය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වර්ෂය	රු. මිලියන
2017	10,995
2018	13,541
2019	14,132
2020	12,402
2021	14,486
ඉදිරි මාස 12 සඳහා ඇස්තමේන්තුව	35,496

ඉහත තොරතුරු අනුව, ඉදිරි මාස 12 ක කාලය සඳහා ඇස්තමේන්තුගත මුළු අලෙවි කොමිස් පිරිවැය ඉකුත් වසරවල දරන ලද සාමාන්‍ය අලෙවි නියෝජිත කොමිස් වියදම්වලට සාපේක්ෂව ඉතා අධික මෙන්ම අසාමාන්‍ය තත්ත්වයක් බවත්, රටේ ඉන්ධන සැපයුම සාමාන්‍ය තත්ත්වයට පත් වූ පසු මෙම වියදම

තවදුරටත් වැඩි වීමේ හැකියාවක් පවතින බවත් නිරීක්ෂණය කෙරේ.

- 2022 මැයි 23 දිනැති අංක 22/0673/522/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මිල සූත්‍රය පදනම්ව ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය විකුණුම් මිල තීරණය කිරීමේදී වැඩිපුර ගෙවනු ලබන අලෙවි නියෝජිත කොමිස් මුදල හේතුවෙන් ලීටරයක පිරිවැයට ඇති බලපෑම පහත පරිදි වේ.

	පෙට්‍රල් (ලීටර් 1 ක)		ඩීසල් (ලීටර් 1 ක)	
	92 Oct	95 Oct	LAD	LSD
දේශීය වෙළඳපල මිල	450.00	540.00	430.00	510.00
ඉහළ සීමාව (Upper Cap)	162.00	170.00	121.00	145.00
මිල සූත්‍රය අනුව නියෝජිත කොමිස්	13.50	16.20	12.90	15.30
සත්‍ය වශයෙන් ගෙවියයුතු කොමිස් මුදල	4.86	5.10	3.63	4.35
කොමිස් වැඩිපුර ගෙවීම මත ලීටරයකට වැඩිපුර අයකරන මිල	8.64	11.10	9.27	10.95

ඒ අනුව, මිල සූත්‍රය පදනම්ව මිල තීරණය කිරීමේදී නියෝජිත කොමිස් මුදල් වැඩිපුර ගෙවීම මත සෑම ඛනිජ තෙල් නිෂ්පාදනයකම විකුණුම් මිල ඉහත දක්වා ඇති පරිදි ඉහළ යාමක් සිදුවන අතර, ඒ හේතුවෙන් ඛනිජ තෙල් පාරිභෝගිකයින්ට ඔවුන් විසින් පරිභෝජනය කරනු ලබන සෑම ඉන්ධන ලීටරයක් සඳහාම නියෝජිත කොමිස් මුදල් වැඩිපුර ගෙවීම මත ඇතිවූ මිල වැඩිවීමේ අවාසිය දරා ගැනීමට සිදුවනු ඇත. එසේ නැත්නම් මිල වැඩි කිරීමේ වාසිය සංස්ථාවට අහිමි වීම හේතුවෙන් සංස්ථාවේ දැනට පවතින ඍණ ශුද්ධ වත්කම් තත්ත්වය තවදුරටත් පිරිහීමට ලක්විය හැකි අතර, දැනට මූල්‍ය අර්බුදයකට මුහුණපා සිටින සංස්ථාවේ රජයේ අනුග්‍රහයකින් තොරව දිගින් දිගටම පවත්වා ගෙන යාමට (Going Concern) අහිතකර බලපෑමක් ඇති විය හැකි බව නිරීක්ෂණය කෙරේ.

- අලෙවි නියෝජිත කොමිස් අනුමත සීමාවන් ද ඉක්මවා ගෙවීම් කිරීම සඳහා තීරණය ගැනීමේදී ඉන් ආයතනයට සිදුවන මූල්‍ය බලපෑම පිළිබඳ නිසි පරිදි ඇගයීමක් සිදු කර තිබේද යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය. ඒ අනුව, සංස්ථාවේ වර්තමාන හා අනාගත අභියෝග සඳහා සැළසුම් සකස් කිරීමේදී නිසි මූල්‍ය ඇගයීමකින් තොරව ගනු ලබන කළමනාකරණ තීරණවල බලපෑම ආයතනයේ පැවැත්මට හා මහජන

සුභසාධනයට අහිතකර ලෙස බලපානු ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

පොදු පරිශීලක පහසුකම්

- ශ්‍රී ලංකා රජය (GOSL), ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ඇති කර ගත් 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුමේ 15 වන වගන්තිය ප්‍රකාරව එය 2008 දෙසැම්බර් 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. එබැවින්, ආයතනවල පාලන ක්‍රියා පටිපාටි, පර්යන්ත ගාස්තු ඇතුළු ප්‍රවාහන ගාස්තු සහ ප්‍රවාහන වියදම් තීරණය කිරීම සඳහා භාවිතා කරන මිල සූත්‍රය (2011 දී අවසන් වරට සංශෝධනය කරන ලද) ඇතුළු ගිවිසුම යටතේ ආවරණය වන පොදු පරිශීලක පහසුකම් සියලු සම්බන්ධිත පාර්ශවයන්ගේ එකඟතාවයෙන් සංශෝධනය කර නොතිබුණි.

- ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2019 මැයි මස 13 වන දින ලංකා ඉන්දියන් තෙල් සමාගම(LIOC) පාර්ශවකරුවෙකු ලෙස නොගෙන ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සමඟ පමණක් ගිවිසුමකට එළඹ තිබු අතර එම ගිවිසුමට අනුව ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම පිළිබඳ නියමයන් සහ කොන්දේසි සහ මෙහෙයුම් ගාස්තු තීරණය කරන ආකාරය පිළිබඳ එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුමේ ප්‍රධාන පරිශීලකයෙකු සහ පාර්ශවකරුවෙකු වන LIOC වෙත බලපාන එම විෂයයට අදාළ නියමයන් සහ කොන්දේසි නිර්වචනය කර නොතිබුණි. එබැවින්, සංස්ථාව සහ ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) අතර ඇති කර ඇති නියමයන් සහ කොන්දේසි ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඇතිවිය හැකි අහිතකර තත්වයන් සහ පිරිවැය සංස්ථාව විසින් දැරිය යුතු බව නිරීක්ෂණය විය.

- වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින විනිමය අර්බුදය හේතුවෙන් ඉන්ධන ආනයනය සීමා සහිත වීම හා ඉල්ලුමට සාපේක්ෂව ඛනිජතෙල් තොග සීමාවීම හේතුවෙන් ඉන්ධන බෙදාහැරීම සීමා වී ඇති තත්ත්වයක් තුළ පවතින සීමිත ඉන්ධන තොග නිසි කළමනාකරණයෙන් යුක්තව, ප්‍රමුඛතාවයන් හඳුනාගනිමින් දිවයින පුරා බෙදාහැරීමේ ජාතික වැඩපිළිවෙලකට සංස්ථාවේ මැදිහත් වීම ඉතා ඉහල මට්ටමක තිබිය යුතු වුවත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් අලෙවි නියෝජිතයන්ගෙන් හා ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන ඉන්ධන ඇනවුම් සඳහා ඉන්ධන නිකුත් කිරීමට අදාළ සියලු කාර්යයයන් CPSTL ආයතනයට සිය අභිමතය පරිදි සිදුකිරීමට ඉඩහැරීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් වූ සංස්ථාවේ වගකීම නිසි පරිදි ඉටු නොවන බව නිරීක්ෂණය වේ.

SAP පරිගනක පද්ධතිය

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් SAP පරිගනක පද්ධතිය 2005 වර්ෂයේදී හඳුන්වා දුන් අනුවාදය (SAP ECC 6.0) 2010 අප්‍රේල් මස 01 දින සිට මේ දක්වා කිසිදු යාවත්කාලීන කිරීමකින් තොරව භාවිතා කරනු ලබයි. බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් 2021 අප්‍රේල් මස 09 දිනැති අංක ADM/12/01/19 දරන ලිපිය මඟින් CPC සහ CPSTL හි සභාපතිවරයන්ට පද්ධතිය භාවිතය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සහ මුදලට වටිනාකමක් විගණනයක් කරන ලෙසත් ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. තවද 2021 ජූලි 22 දිනැති අංක 07/1252 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය මඟින්ද SAP පද්ධතිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුවේ යෝජනා ලබා ගෙන අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් SAP පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කඩිනම් පියවර මේ වනවිටත් ගෙන නොතිබුණි.

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූල නොවීම

- යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි මාර්ගොපදේශයන්ට අනුකූලව අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව එකඟතාවය මත අනුමත කර ගත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාවලියක් (SORAP) සකස් කිරීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර කොන්ත්‍රාත් පදනම අනුව සේවකයින් පත් කිරීම සඳහා ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට පටහැනිව ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගමවිසින් වෘත්තීය සමිති නායකයින්ට මෝටර් රථ 02ක් හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය සතු ව්‍යවසාය (SOEs) සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි මාර්ගෝපදේශයන්ට පටහැනිව බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයාට මෝටර් රථ 02ක් පවරා තිබුණි.

බේරුම්කරණ ගිවිසුමේ (Settlement Agreement) නියමයන් සහ කොන්දේසි පිළිබඳ විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් නොමැති වීම

ශ්‍රී ලංකා රජය හා ලංකා ඉන්දියන් ඔයිල් සමාගම අතර ගිවිසගත් 2007 ජනවාරි 05 දිනැති බේරුම්කරණ ගිවිසුමේ 03 වන වගන්තියට අනුව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සඳහා චීන වරාය පර්යන්තයේ සිට ඉන්ධන බෙදාහැරීම හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සපුගස්කන්ද පිරිපහදුවේ සිට ඉන්ධන බෙදාහැරීම පිළිවෙළින් රටේ

බනිජ තෙල් අවශ්‍යතාවයෙන් සියයට 5 බැගින් උපරිමයකට සීමාකර ඇත. කෙසේ වෙතත්, එම කොන්දේසි වලට අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් නොතිබුණි.

ලිඛිත ගිවිසුම් නොමැති වීම

ව්‍යාපාරයක් සුමටව පවත්වාගෙන යාමට සහ පිරිවැය අවම කර ගැනීම සඳහා ආයතනයකට උපකාරක සේවාවක් සපයන පාර්ශ්වයන් අතර නිසි එකඟතාවයක් පවත්වා ගත යුතු වුවද, අදාළ සියලුම ව්‍යාපාරික කටයුතු ආවරණය වන පරිදි ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර කිසියම් ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට (MOU) හෝ එළඹ නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එක් එක් පාර්ශ්වයේ ක්‍රියා පටිපාටි, භූමිකාවන් සහ වගකීම් නිසි ලෙස නිර්වචනය කර නොතිබුණි.

ඉන්ධන බෙදාහැරීම

ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ අලෙවිකරණ ආයතන වන ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ලංකා ඉන්දියන් තෙල් සමාගමට අයත් ඉන්ධන ගබඩා කිරීම සහ එම ආයතයන්හි උපදෙස් අනුව රට පුරා සිටින බලයලත් අලෙවි නියෝජිතයන් සහ පාරිභෝගිකයන් වෙත ඉන්ධන බෙදා හැරීමයි.

- කෙසේ වෙතත්, ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් අලෙවි නියෝජිතයින්ගෙන් හා ගනුදෙනුකරුවන්ගෙන් ඇණවුම් භාර ගැනීම, නිකුත් කරන ඉන්ධන ප්‍රමාණය, ඉන්ධන නිකුත් කරන දිනය, ඉන්වොයිසිය පිළියෙළ කිරීම, ඊට අදාළ මුදල් එකතුකිරීම ආදී අලෙවිකරණය හා සම්බන්ධ තීරණය ගැනීමට අදාළ බොහෝ ක්‍රියාකාරකම් සමාගම විසින් සිදු කරනු ලබන අතර ලංකා ඉන්දියන් තෙල් සමාගමට අයත් එම කටයුතු එම සමාගම විසින්ම සිදුකරනු ලැබේ. තවද, එම ක්‍රියාකාරකම් 2003 දෙසැම්බර් 30 දිනැති පොදු පරිශීලක පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුමෙන්ද ආවරණය වී නොමැත.

- රට තුළ පවතින ආර්ථික අර්බුදකාරී තත්වය හේතුවෙන් සීමිත ඉන්ධන තොග බෙදාහැරීම සඳහා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රමුඛතා ලැයිස්තුවක් නිකුත් කලද සමාගම විසින් එම ලැයිස්තුව නොසලකා ඉන්ධන නිෂ්පාදන බෙදාහැර තිබුණි. මෙහිදී ප්‍රමුඛතා ලැයිස්තුව තුළ ඇතුළත් ස්ථාන වලට ඉන්ධන බෙදා නොහැර ඇති අවස්ථා මෙන්ම සමාගමේ බෙදාහැරීමේ අංශය විසින් සිය අභිමතය පරිදි ඉන්ධන බෙදාහැරීමේ අවස්ථා නිරීක්ෂණය විය.

ඉන්ධන බෙදා හැරීම සඳහා කුලී පදනම මත බවුසර් රථ යොදා ගැනීම

ලංකා බනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම, ඉන්ධන බෙදා හැරීම සඳහා සමාගම සතු බවුසර් රථ 147 ක් සහ කුලී පදනම මත ලබා ගත් බවුසර් රථ 653 ක ඇණියක් උපයෝගී කරගනු ලැබේ. මෙහිදී ඉන්ධන බෙදා හැරීම සඳහා සමාගම සතු බවුසර් ප්‍රශස්ත ලෙස

භාවිතා කර නොතිබූ අතර මෙම ඌණ උපයෝජනය හේතුවෙන් සමාගමට අවම වශයෙන් දරන ලද ස්ථාවර පිරිවැය හෝ ආවරණය කරගැනීමට නොහැකි වී තිබුණි. කුලී පදනම මත බවුසර් රථ ලියාපදිංචි කිරීමේදී ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර එම රථ යොදාවාගැනීමේ විධිමත් හා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදක් අනුගමනය කර නොතිබුණි.

ප්‍රාග්ධන ව්‍යාපෘති

ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් කොලොන්නාව තොග ගබඩා පර්යන්තයේ ඝන මීටර් 93,000 ක ධාරිතාවයකින් යුතු තෙල් ටැංකි 9 ක් ඉදිකිරීම සඳහා සාමාගම් දෙකකට ලබාදී තිබූ අතර එම ව්‍යාපෘති 2022 වර්ෂය හා 2023 වර්ෂවලදී නිමකිරීමට සැලසුම්කර තිබුණි.

- ඉන්ධන ටැංකි 03 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පුද්ගලික සමාගමකට රු. 942,474,240 කට ප්‍රදානය කර තිබුණද සමාගම විසින් ඒ සඳහා මූලික ඉදිකිරීම් පිරිවැය ගණනය කිරීම සඳහා මිල ගණන් ඇතුළත්ව ප්‍රමාණ බිල්පතක් (BOQ) සකස් කර නොතිබුණි. තවද දේශීය සමාගමක් වන තෝරාගත් ලංසුකරුට අමුද්‍රව්‍ය සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සැළැකියයුතු ප්‍රමාණයක් දේශීයව සපයා ගැනීමට හැකියාව තිබුණද ඒ පිළිබඳව විධිමත් ඇගයීමකින් තොරව සමස්ථ ව්‍යාපෘතිය සඳහාම විදේශීය මුදලින් (USD) ඉදිරිපත්කර තිබූ මිල ගණනින් අනුමතකර තිබුණි. විනිමය අනුපාතවල අහිතකර උච්චාවචනයන් හේතුවෙන් සමාගම විසින් මේ සඳහා රු. මිලියන 69 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

- ව්‍යාපෘතිවල ප්‍රගතිය මේ වනවිට ඉතා පහළ මට්ටමක පවතින අතර, ඉන්ධන ටැංකි 06 ක ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීම හේතුවෙන් අපේක්ෂිත කාල රාමුව තුළදී ව්‍යාපෘති නිමකිරීම දුෂ්කර බවත් නිරීක්ෂණය කෙරේ.

සේවක ණය

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යන ආයතන දෙකම සිය කාර්ය මණ්ඩලය සඳහා විවිධ ණය යෝජනා ක්‍රම ගණනාවක් හඳුන්වා දී ඇති අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු හිඟ ණය ශේෂය පිළිවෙලින් රු. බිලියන 3.359 හා බිලියන 4.314 ක් වී තිබුණි.

- ආයතන විසින් සැලකිය යුතු සේවක ණය කළඹක් පවත්වාගෙන ගොස් තිබුණද එය කළමනාකරණය සම්බන්ධයෙන් නිසි මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණු අතර, ඒ සඳහා අවශ්‍ය විශේෂඥ උපදෙස් ආයතන අභ්‍යන්තරව හෝ බාහිරව ලබාගෙන නොතිබුණි. එමෙන්ම, ණය ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ආයතන අපොහොසත් වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්,

සමාලෝචිත වර්ෂය අවසානයේ දී පැහැර හරින ලද ණය ශේෂ පිළිවෙලින් රු. මිලියන 41.44 හා මිලියන 16.67 ක් වී තිබුණි.

- 1985 ජුලි 01 දිනැති අංක 1063 දරන චක්‍රලේඛයට අනුව මාසික ණය වාරික ඇතුළු වෙනත් අඩු කිරීම් සේවක වැටුපෙන් සියයට 50 කට වැඩි නොවිය යුතු වුවද, ආයතනවල සේවකයන්ගෙන් සැළකියයුතු ප්‍රතිශතයක මාසික ණය වාරිකය ඔවුන්ගේ වැටුපෙන් සියයට 50 ඉක්මවා තිබුණි.

- සේවකයින්ගේ මූලික වැටුප සම්පූර්ණයෙන්ම හෝ ඊට වැඩියෙන් හෝ සැලකියයුතු ප්‍රතිශතයක් ණය ආපසු ගෙවීම සඳහා භාවිතා කිරීමට සිදුවීම හේතුවෙන්, අතිකාල වැඩ කිරීමේ සැබෑ අවශ්‍යතාවක් ආයතන වෙත නොතිබුණද, සේවකයින්ට ඔහුන්ගේ මූලික ඉපයීම ණය ගෙවීමට හා අනෙකුත් වියදම් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අතිකාල සේවයේ යෙදවීමට සිදුව ඇති බවට නිරීක්ෂණය වේ. ඒ අනුව සංස්ථාවේ සමස්ථ සේවකයින්ගෙන් සියයට 40ට වැඩි ප්‍රමාණයක් සඳහා හා සමාගමේ සමස්ථ සේවකයින්ගෙන් සියයට 50 ට වැඩි ප්‍රමාණයකට ඔහුන්ගේ මූලික වැටුපෙන් සියයට 50 ඉක්මවා අතිකාල ගෙවා තිබුණි. ඒ අනුව ණය ආපසු ගෙවීමේ හැකියාව නොසලකා අනුචිත ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සේවකයන් ණය ලබාගැනීම සඳහා පෙළඹවීමක් ඇතිකරන අතර එය ආයතනවල අතිකාල වියදම් අනවශ්‍ය ලෙස ඉහල යාමටද සෘජුව බලපා තිබුණි.

- ආයතන විසින් සිය සේවකයින් වෙනුවෙන් විශාල ණය කළඹක් පවත්වාගෙන යාමට අති විශාල මුදලක් වෙන්කිරීම හේතුවෙන් ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම හේතුවෙන් ඉතා හදිසි සහ වැදගත් ප්‍රාග්ධන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ප්‍රමාද කිරීමට හෝ අත්හැරීමට සිදුවීම, හා එය කළමණාකරණය කිරීම සඳහා අනවශ්‍ය ලෙස කාලය හා සම්පත් යෙදවීමට සිදුවීම ආදී ගැටලු පිළිබඳව සළකා සේවක ණය යෝජනා ක්‍රමය වාණිජ බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට ලබා දීම කෙරෙහි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී අවස්ථා කිහිපයකදී අවධාරණය කර තිබුණද ආයතන විසින් මේ දක්වා ඒ පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි.

වාරිමාර්ග හා ජල සම්පත්

විගණන නිරීක්ෂණ

- ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්
- ගිං නිල්වලා හැරවුම් ව්‍යපෘතිය
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
- ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම
- මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති
- බස්නාගොඩ ජලාශය ඉදිකිරීම
- තිස්ස වැවේ රොන්මඩ ඉවත් කිරීම
- අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ හරිත දේශගුණික අරමුදල
- මහවැලි අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘතිවලට ලබාදී තිබූ ඉඩම් සංවර්ධනය නොකිරීම
- සංචාරක බංගලා උපයෝජනය
- සමාගම් ඇවර කිරීම

වාරිමාර්ග හා ජල සම්පත්

වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ වන ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු දෙකක්, ව්‍යවස්ථාපිත මණ්ඩල තුනක් හා ව්‍යාපෘති දෙකක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා " ප්‍රශස්ත වාරි කළමනාකරණයක් " ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත් වලට අනුකූලව වාරිමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම, ජලපවහන හා ගංවතුර පාලනය කිරීම, ජලාශ හා වාරි පහසුකම් සංවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය සඳහා අවශ්‍ය ජලය මනා කළමනාකරණයක් යටතේ සපයාදීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවක් වෙත **2021** වර්ෂයේදී එකතුව රු.මිලියන **54,404** ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන **45,833** ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන **37** හි දැක්වේ.



	වාරිමාර්ග අමාත්‍යාංශය	ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදන රු.මිලියන	36,621	3,114	14,669	54,404
වියදම රු.මිලියන	31,438	2,657	11,738	45,833
ඉතිරිය රු.මිලියන	5,183	457	2,931	8,571

රූපසටහන 37 - ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා සත්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 153,915.7 ක් වූ තල්පිටිගල ජලාශය, ඵලදායීතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය, ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය හා උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය යන සංවර්ධන ව්‍යාපෘති 4 ක් සැලසුම් කළ කාලයමෙන් දෙගුණයකටත් වැඩි කාලයක් ගත වී තිබුණද නිම කර නොතිබීම නිසා එම ව්‍යාපෘති වෙනුවෙන් වර්ෂ 14 ක කාල සීමාවක් තුළ දරා ඇති රු. මිලියන 90,294.5 ක පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිඳු දායකත්වයක් ලැබී නොතිබුණි.

ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය

- 2014 නොවැම්බර් 05 දින ඇමරිකානු ඩොලර් මිලියන 690 ක EPC කොන්ත්‍රාත් ගිවිසුමකට චීන සමාගමක් සමඟ එළඹී තිබුණු අතර පූර්ව වැඩ අත්තිකාරම් ලෙස රු. මිලියන 4,011.05 කට සමාන ඇමරිකානු ඩොලර් 29,989,000 ක් ගෙවා තිබුණි. ගිවිසුමේ කොන්දේසි අනුව වර්ෂයක් තුළ ඉටු නොකිරීම මත දෙපාර්ෂවයේ ඒකඟතාවයකින් තොරව ගිවිසුම අවලංගු වන අතර ඒ අනුව 2015

නොවැම්බර් 05 දින සිට ගිවිසුම අවලංගු වී තිබුණි. ඒ අනුව අත්තිකාරම් ඇපකරය මුදල් බවට පත් කර ගැනීමට හැකියාව තිබුණද අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අත්තිකාරම් මුදල ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස සලකා, එය මූලික දත්ත රැස් කිරීම, මැනුම් කටයුතු, භූගෝලීය නිරීක්ෂණ කටයුතු, ශක්‍යතා අධ්‍යයන වාර්තාව යාවත්කාලීන කිරීම හා මූලික සැලසුම සඳහා පිරිවැය ලෙස හඳුනාගෙන තිබුණි. එම කටයුතු මාස 8 කින් නිමකල යුතු බවට අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. හඳුනාගත් වැඩ කොටස්වලට අදාළ සම්පූර්ණ මුදල වූ රු.මිලියන 4,011.05 එකවර ගෙවා වර්ෂ 05 ක් ගතවී තිබුණද කාර්යය නිමකර නොතිබුණි.

- ව්‍යාපෘතිය සඳහා බඳවාගත් කාර්යය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා වශයෙන් වර්ෂ 05 ක කාලය තුළ රු.මිලියන 57 දරා තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු වර්ෂ 08ක් ප්‍රමාද වීම තුළ අනාර්ථික හා අතිරේක වැය බරක් වී තිබුණි.

- අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/01/ASP/2016/01/Vo දරන 2016 ජුනි 23 දිනැති ලිපියෙන් ව්‍යාපෘතිය නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් සිදු කිරීමට නිර්දේශ කරන බවත් ඊට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද ඒලෙස සිදු නොකර 2017 ජූලි 20 දින ගිං ගඟ හා නිල්වලා ගඟ යන කොටස් 2 හිම අධ්‍යනයක් සිදු කිරීමට අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.

- මෙම නිර්දේශ නොසලකා UNESCO සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයක් අසල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම නිසා අදාළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල අනුමැතිය ලබා ගැනීමට නොහැකිවීම හා මහජන විරෝධතා ඇති වී තිබුණි. ඒ අනුව සිදුකරනු ලබන අධ්‍යනයක් හා සැලසුම් නිෂ්කාර්ය වී තිබුණි.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව මූලස්ථාන වැඩ සඳහා ඇ.ඩො.මි. 529 හෙවත් රු.මිලියන 74,325.75 හා සෙසු පිරිවැය හා යටිගං පෙදෙස සංවර්ධනය සඳහා රු. මිලියන 15,474.25 ක් මූල්‍යනයට අපේක්ෂා කර තිබුණි. 2020 අවසානයට මූලස්ථාන වැඩ සඳහා දේශීය අරමුදල්වලින් රු.මිලියන 72,153.17 හා විදේශීය අරමුදල් රු. මිලියන 6,522.85 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වර්ෂ 7 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට අපේක්ෂා කළද 2021 දෙසැම්බර් 25 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මඟින් මූල්‍යනය කිරීම යටතේ තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව

කොන්ත්‍රාත්කරු තෝරාගෙන ගිවිසුමකට එළඹී තිබුණි. 2013 ඉරානයට පනවන ලද සම්බාධක හේතුවෙන් දේශීය මුදලින් ව්‍යාපෘතිය සිදුකර තිබුණි.

- ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභයක් වූ විදුලි බලය ජනන පද්ධතියට අමතරව මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම. ව්‍යාපෘති ප්‍රදේශයේ පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම ඩයබරා හා පුහුල්පොල ඉදි කෙරෙන ජලාශ මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානිය ජල අවශ්‍යතා සැපයීම යන ප්‍රතිලාභ ලබා ගැනිමට නොහැකි වි තිබුණි.

- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමහෙඟි ඇති වූ ජල කාන්දුව හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු වන්දි රු.1,931,346,396 රජයේ මුදලින් ගෙවා තිබුණු අතර ඉන් රු.889,789,252 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

- 2015 නොවැම්බර් 15 දින සිට 2021 දෙසැම්බර් 25 දක්වා ව්‍යපෘති කාලය දීර්ඝ කිරීම සිදු කර තිබුණු අතර EPC කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් 0.01% වශයෙන් උපරිමය 5% ක් දක්වා, අයකල හැකිව තිබූ ප්‍රමාද ගාස්තුව ඇමරිකානු ඩොලර් මිලියන 26.453 ක් විය. කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද ඇමරිකානු ඩොලර් 6,631,364 ක මුදලින්, අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ඉන් ඇමරිකානු ඩොලර් 5,305,091 ක් ආපසු ගෙවා තිබුණි. ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ප්‍රතිලාභ අහිමිවීම පිළිබඳව තක්සේරුකරුවන් කාලය දීර්ඝ කිරීමට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ඇතුළත් කර නොතිබුණි. තවද ප්‍රමාදය මඟින් සිදුවන බලපෑම පිළිබඳව ව්‍යාපෘති ඒකකය මඟින් කොන්ත්‍රාත් සමාගම දැන්වූ බවට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

- කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් අතිරේක වියදම් හා බිල්පත් සඳහා ගෙවීම් ප්‍රමාද වීම වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක අමතර ගාස්තුවක් ඉල්ලා තිබුණි. EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එම ඉල්ලීම විධිමත් ලෙස ප්‍රතික්ෂේප කර ඒ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදන අංශ දැනුවත් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතිය තුලින් අපේක්ෂා කල ප්‍රතිලාභ 2022 මැයි වන විටත්ලබාගත නොහැකි වී තිබුණි.

ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

වඩමාරච්චි කලපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මගින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී දේශීය අරමුදල් රු.මිලියන 2000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර එම වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

බෙන්තර ගඟ දකුණු ඉවුරු ජලාපවාහන කරදිය වැලක්වීමේ ව්‍යාපෘතිය මූලික සැලැස්ම අනුව රු.මිලියන 298 ක දේශීය අරමුදලින් 2015 වසරේ දී ආරම්භ කර 2017 වසරේදී අවසන් කිරීමට නියමිතව තිබුණු අතර 2021 වර්ෂය දක්වා කාලය දීර්ඝ කර තිබුණි. 2015 සිට 2021 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය සඳහා රු.මි. 95,194 ක් වැයකර තිබුණු අතර 2021 වර්ෂයේදී රු.මිලියන 100 ක් ලැබී තිබුණි. එම මුදලින් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ව්‍යාපෘති වියදම රු.මිලියන 69.95 ක් වැයකර තිබුණු අතර රු.මිලියන 30.05 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට ප්‍රවර්තන වර්ෂය අවසාන දින වන විට රු. මිලියන 165,144 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ අපේක්ෂිත පිරිවැයෙන් සියයට 55 ක් දරා තිබූ නමුත් භෞතික ඉදිකිරීම් වලින් සියයට 35 ක් පමණක් නිමකර තිබුණි.

බස්නාගොඩ ජලාශය ඉදිකිරීම

ගම්පහ, අත්තනගල්ල හා මීනුවන්ගොඩ ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතිය යටතේ බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට 2016 මාර්තු 21 දින එළඹ තිබුණද 2022 වන විටද ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි. 2020 වර්ෂය වන විට රු.මිලියන 560 ක් වැයකර ජලනල එලීම හා අනෙකුත් කටයුතු සිදුකර තිබුණද ඉදිකිරීම ප්‍රමාද වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.

තිස්ස වැවේ රොන්මඩ ඉවත් කිරීම.

- වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට විසින් සි/ස ගජා හෝල්ඩින් (පුද්ගලික) සමාගම සමග 2021 වර්ෂයේ ගිවිසුමකට එළඹ තිබුණි. වැවේ වපසරිය වූ අක්කර 120 න් සියයට 17 ක් අනවසරයෙන් වගා කටයුතු සඳහා යොදාගැනීම, වැව වටේ පිහිටි හෝටල්, නිවාස 50 ක් අනවසරයෙන් භාවිතා කරන බව 2019 හඳුනාගෙන තිබුණ ද ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම, වැවේ සීමාවන් හඳුනාගැනීමකින් තොරව ආරම්භ කිරීම, වර්ෂ 10 ක කාලයක් තුළ වැව් පතුලෙහි මට්ටම නිර්ණය නොකිරීම, ජල විදුලි අංශයේ පතුලෙහි මට්ටම සඳහා ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිතයෙන් සිදු කිරීමට ඉල්ලීම සඳහා ක්‍රියාමාර්ග නොගැනීම යන අඩුපාඩු තිබියදී ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. තවද මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇති පාරිසරික නිර්දේශ අංක 7.1 වගන්තිය

ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙන් වෙළඳ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. රොන්මඩ නිස්සාරණය කර ලබාගෙන තිබූ වැලි අලෙවි කිරීමට හැකියාව තිබුණ ද ගිවිසුමේ කොන්දේසි අංක 33 ප්‍රකාරව වාණිජ කටයුත්තක් ලෙස සිදු වූවානම් රාජ්‍ය භාගය අයකුළ යුතු වුවත් එලෙස සිදු කර නොතිබුණි.

- යන්ත්‍ර ආධාරයෙන් වැව තුළින් ලබාගන්නා ලද රොන් මඩ කිසිලෙසකින්වත් වැව තුළ සේදීම නොකළ යුතු අතර වැවෙහි හෝ ප්‍රධාන ඇලෙහි ජලය අපවිත්‍ර නොකළ යුතු බව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 10 වගන්තියේ ඇතුළත් වුවද ඊට පටහැනිව තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් තාවකාලිකව ලබා දී ඇති වැඩ බිම තුළ මෙම ව්‍යාපෘතිය අවසන් වන තෙක් වැලි නිස්සාරණය කිරීම පවත්වාගෙන යාමට එකඟතාවය ලබා දී තිබුණි.

- කැලෑ ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු අනුව, ඉවත් කර ගනු ලබන මතුපිට පස් කියුබ් 01 ක් සඳහා රු.1,120 බැගින් වූ ඉඩම් පරිහරණ ගාස්තුවක් අයකිරීමේ හැකියාවක් පැවතියද එම කොන්දේසිය ගිවිසුමට ඇතුළත් කර නොතිබීම නිසා ව්‍යාපෘති වාර්තා අනුව දිනකට කියුබ් 100 බැගින් මාසිකව ඉවත් කිරීමට අපේක්ෂිත කියුබ් 2,400 ක් වෙනුවෙන් අයකර ගත හැකිව තිබූ වටිනාකම රු.2,688,000 ක් විය. ඒ අනුව ගිවිසුම් කාලය වූ මාස 12 ක් තුළ රජයට අහිමි වී ඇති මුදල රු.32,265,000 ක් විය.

අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන් ඔය ජලාශය ඉදි කිරිම හේතුවෙන් අහිමි වූ වනාන්තර වෙනුවෙන් නැවත වන වගා කිරීම සඳහා අනුරාධපුර දිසා වන කාර්යාලයට රු.මිලියන 12 ක් ලබා දී තිබුණි. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 209.1 ක පැල 110000 ක් රෝපණය කිරීමේදී ජලාශයේ FSL හා HFL මට්ටම අතර පිහිටි ඉඩම්වල යෝග්‍යතාවය පිලිබඳ ඇගයීමකින් තොරව පැල සිටුවීම නිසාත් ව්‍යාපෘති පාරිසරික වාර්තාවේ බලපෑම තක්සේරු අවශ්‍යතාවයන්ට අනුකූලව වන වගා කටයුතු සිදු නොකිරීම නිසාත්, ජලාශය පිරීමේදී එම ප්‍රදේශ ජලයෙන් යටවීම හේතුවෙන් සිටුවන ලද පැල වලින් සියයට 90 කට වැඩ ප්‍රමාණයක් විනාශ වී තිබුණි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ හරිත දේශගුණික අරමුදල

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාස හේතුවෙන් කුඩා වතු හිමියන් මුහුණ දෙන ගැටලු අවම කිරීම ප්‍රධාන අරමුණ කොටගෙන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ හරිත දේශගුණික

අරමුදල (GCF) ශ්‍රී ලංකා රජයට ඇමරිකානු ඩොලර් මිලියන 38.084 (රුපියල් මිලියන 5,499.71) ලබා දීම සඳහා 2017 ජුනි 07 වන දින ප්‍රදාන ගිවිසුමකට එළඹ තිබුණි. යථෝක්ත ගිවිසුමට අනුව මහාවැලි සංවර්ධන පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය (Executing Entity) වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ප්‍රතීතනය ලත් ආයතනය (Accredited Entity) වේ. FAA හි 3 වන වගන්තියට අනුව, ප්‍රතීතනය ලත් ආයතනය (UNDP) විසින් ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය (MMDE) වෙත ඇ.ඩො. මිලියන 38.084 මුදලක් ප්‍රදානයක් ආකාරයෙන් ලබා දීමට නියමිතව තිබුණි. එසේ වුවද, හරිත දේශගුණික අරමුදල පසුගිය වසර 03 තුළ ඇමරිකානු ඩොලර් මිලියන 20.4 (රුපියල් මිලියන 3,774) ක් UNDP වෙත ලබා දී තිබුණද 2020 දෙසැම්බර් 31 වන විට MMDE වෙත ලබා දී තිබුණේ ඇමරිකානු ඩොලර් මිලියන 5.7 (රුපියල් මිලියන 1020) ක් පමණි. එනම්, ඉතිරි ඇමරිකානු ඩොලර් මිලියන 14.7 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා UNDP විසින් වැය කර තිබුණි.

මහවැලි අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘතිවලට ලබාදී තිබූ ඉඩම් සංවර්ධනය නොකිරීම

විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින් 695 දෙනෙකු වෙත හෙක්ටයාර 6,879 ක් මුළු ඉඩම් ප්‍රමාණයක් ලබාදී තිබුණි. ඉන් පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 3,284 ක් වූ අතර ඌන සංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 2,023 ක් ද, අසංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 1,572 ක් ද වශයෙන් පැවතුණි. මේ අනුව ලබාදුන් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 52 ක් ඌන සංවර්ධිත හා අසංවර්ධිත ඉඩම් වශයෙන් පැවතුණු අතර එම ඉඩම් නැවත පවරාගෙන වෙනත් ආයෝජකයින්ට ලබාදීමට කටයුතුකර නොතිබුණි.

සංචාරක බංගලා උපයෝජනය

අධිකාරිය සතු සංචාරක බංගලා සංඛ්‍යාව 27 ක් වන අතර, එම සංචාරක බංගලා 27 ම ආදායම ඉක්මවා වියදම් දරා තිබීම හේතුවෙන් 2021 වර්ෂයේ අලාභය රු. මිලියන 36.39 ක් වී තිබුණි. තවද අධිකාරිය සතු පැල තවාන් 11 කින් පැල තවාන් 08 ක් ම අලාභ ලබා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අලාභය රු.මිලියන 35.08 ක් විය.

සමාගම් ඈවර කිරීම

මහවැලි අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ පුද්ගලික සමාගම 2019 වර්ෂයේදී ද ඈවර කිරීම සඳහා තීරණය කර තිබුණද, 2021 වර්ෂයේදී ද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

විගණන නිරීක්ෂණ

- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයුම
- නල ජල හා නල මළාපවහන පහසුකම් ආවරණය
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල
- ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ මහා කොළඹ ජල හා අපජල කලමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ ආරම්භ කල ව්‍යාපෘති.
- අඹතලේ පද්ධති පුනරුත්ථාපන හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය
- අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘති අදියර I හා අදියර II
- මහ කොළඹ ජලය හා අප ජලය කලමණාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය II
- මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
- ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය
- සැමට ජලය වැඩසටහන
- ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති
- ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශ මධ්‍යස්ථානය
- ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
- ග්‍රාමීය හා ප්‍රදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
- ජල සම්පත් මණ්ඩල

ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව න්‍යාය පත්‍රය - 2030 හි අරමුණු අංක 6 යටතේ සැමට තිරසර ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම ප්‍රධාන කාර්යය සාධක දර්ශකයක් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට අනුකූලව රජයේ සෞභාග්‍යයේ දැක්ම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළද වර්ෂ 2025 වන විට සැමට පිරිසිදු පානීය ජල සැපයුමක් ලබා දීමට සැලසුම් කොට තිබූ අතර එම ඉලක්කය කරා ළඟා වීමට ජල සම්පාදන අමාත්‍යාංශය හා ඒ යටතේ වන ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ජල සම්පත් මණ්ඩලයත් ප්‍රධාන ව්‍යවස්ථාපිත ආයතනයන් ලෙස කටයුතු කරන අතර අමාත්‍යාංශ සෘජු අධීක්ෂණයට යටත් වන හා අමාත්‍යාංශය මඟින් ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක කරන ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියද ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයද ඒ යටතේ වන ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවද පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කල යුතුව තිබුණි.

- සැමට ජලය ලබාදීම සඳහා නව ජල සම්පාදන හා ජලපවාහන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය හා වාරිමාර්ග අමාත්‍යාංශය විෂයපථයන් යටතේ ඇති පිළිවෙලින් ග්‍රාමීය වැව්, ජලාශ හා වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් භූගත ජල සුරක්ෂිතතාවය හා ග්‍රාමීය හා නාගරික ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම.
- පානීය ජලනල පද්ධතියේ හා බෙදා හැරීමේ දී සිදු කරන නාස්තිය හා ජලය අපතේ යෑම වළක්වා ගැනීම.
- ප්‍රජා ජල සම්පාදන සහ ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම.
- ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම.
- ග්‍රාමීය පළාත් වල පානීය ජල සැපයුම ස්ථාවර කර ගැනීම,ජලාශ හා ජල පෝෂිත මාර්ග සංවර්ධනය හා ජල සංරක්ෂණ කටයුතු
- ජාතික වාරිමාර්ග පද්ධතිය මගින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන ව්‍යාපෘති ආශ්‍රිතව ජලය බෙදාහැරීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම.

ඉහත සඳහන් කාර්යභාර ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ජල සම්පාදන අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව වෙත එකතුව රු. මිලියන 105,706 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණද, ඉන් උපයෝජනය කොට තිබුනේ රු. මිලියන 54,217.2ක් හෙවත් සියයට 57ක් පමණක් බව නිරීක්ෂණය විය. විස්තර රූපසටහන 38 හි දැක්වේ.



	ජල සම්පාදන අමාත්‍යාංශය	රාජ්‍ය අමාත්‍යාංශය	ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදන රු. මිලියන	101,291.10	1,452.47	2,962.30	105,705.90
වියදම රු. මිලියන	52,193.50	806.8	1,216.90	54,217.20
ඉතිරිය රු. මිලියන	49097.6	645.67	1745.4	51488.7

රූපසටහන 38 : ශුද්ධ ප්‍රතිපාදනය හා උපයෝජනය

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ජල සම්පාදන අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශයත් ඒ යටතේ පවත්නා වූ ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යය භාරය ඉටු කිරීම පිළිබඳ සිදු කල නියැඳි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයුම

- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම ඉලක්ක කර ගනිමින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශය සෘජු අධීක්ෂණය යටතේ මහා පරිමාණ විදේශාධාර ජල සැපයුම් ව්‍යාපෘති 22ක්ද, අපවහන ව්‍යාපෘති 3ක්ද, දේශීය මූල්‍යමය යටතේ ක්‍රියාත්මක ජල සැපයුම් ව්‍යාපෘති 11ක්ද වශයෙන් මුළු ව්‍යාපෘති 36ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත් ඉන් ව්‍යාපෘති 25 ක් සම්බන්ධයෙන් වර්ෂය ආරම්භයේදී අපේක්ෂා කල භෞතික ප්‍රගතිය ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත්ව තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති 5ක්ද, දේශීය මූල්‍යමය යටතේ ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 6ක්ද වර්ෂය තුළ අවසන් කිරීමට සැලසුම් කොට තිබුණද මණ්ඩලය ඊට අපොහොසත්ව තිබුණි. තවද වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ විදේශ මූල්‍යන ව්‍යාපෘති 16ක් සහ දේශීය මූල්‍යන ව්‍යාපෘති 6ක් සම්බන්ධයෙන් දින 184 සිට දින 1779 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් දක්නට වූ අතර කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල

කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ගැටළු යනාදිය හේතුවෙන් ප්‍රමාද වී තිබූ එම ව්‍යාපෘති සඳහා අවස්ථා 1 සිට අවස්ථා 9 දක්වා කාල දිගුවන්ද ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

- අමාත්‍යංශ අධීක්ෂණය යටතේ ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක කර තිබූ රත්නපුර, කෑගල්ල , මොණරාගල යනාදී දිස්ත්‍රික්ක 7ක් තුළ ක්‍රියාත්මකව පවතින ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණද එදිනට ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීමට නොහැකි වූයෙන් නැවත එය 2022 මාර්තු 31 දින හා 2023 මාර්තු 31 දින දක්වා අවස්ථා 2කදී දීර්ඝ කර තිබුණි.

නල ජල හා නල මළාපවහන පහසුකම් ආවරණය

ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2022- 2025 වර්ෂයන් සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම, සැමට ජලය ව්‍යාපෘතිය යටතේ ලබා දීමට අපේක්ෂා කර තිබූ නව ජල සම්බන්ධතා සංඛ්‍යාවද ඇතුළත් වන පරිදි සංශෝධනය කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ නව ජල සම්බන්ධතා 301,762 ලබා දීමට මුලදී සැලසුම් කොට පසුව එය ජල සම්බන්ධතා 215,000ක් දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලය ලබා දුන් සත්‍ය ජල සම්බන්ධතා සංඛ්‍යාව 192,087 ක් පමණක් විය. පසුගිය වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ නව ජල සම්බන්ධතා සංඛ්‍යාවේ වර්ධනයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මනුගත විකුණුම් ආදායම වර්ධනය වී තිබුනේ සියයට 1ක් වැනි සුළු ප්‍රතිශතයකින් පමණි. තවද සමාලෝචිත වර්ෂය තුළ නල මලපවහන ආවරණය මුළු ජනගහනයෙන් සියයට 2.1ක් දක්වා ඉහල නැංවීමට අපේක්ෂා කොට තිබුණද, මහා පරිමාණ මලපවහන ව්‍යාපෘති 3ක් අවසන්ව තවත් මහා පරිමාණ මලපවහන ව්‍යාපෘති 3ක් වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවතියදී මණ්ඩලයට ලබා කර ගත හැකිව තිබූ මුළු මලාපවහන ආවරණය සියයට 2.08ක් පමණක් විය. මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 23.09ක් දක්වා අඩු කර ගැනීමට ඉලක්ක ගත කොට තිබුණද වර්ෂය අවසානයට වූ සත්‍ය ප්‍රතිඵලය සියයට 25.82ක් විය. එය පසුගිය වසරට වඩා සියයට 1.19ක වැඩි වීමකි. කොළඹ නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 34.75ක් වැනි ඉතා ඉහල මට්ටමක පැවති අතර දෙහිවල, නුවර - උතුර, නුවර - දකුණ සහ ගාල්ල යන ප්‍රාදේශිකයන්හි සියයට 30කට වඩා වැඩි ආදායම් නොලබන ජල ප්‍රතිශතයක් වාර්තා වී තිබුණි. මණ්ඩලයේ කාර්යය සාධක දර්ශකයන්හි ඉලක්ක ගත හා සත්‍ය ප්‍රගතිය සම්බන්ධ විස්තර වගුව 24 හි දක්වා ඇත.

කාර්ය සාධන දර්ශකය	ඒකකය	2020	
		ඉලක්ක	ළඟා කරගත්
ආරක්ෂිත පානීය ජල ආවරණය	ජනගහනයෙන් %	99.6	95.8
ආරක්ෂිත නල ජල ආවරණය	ජනගහනයෙන් %	59.5	55.8
නව ජල සැපයුම් සම්බන්ධතා	සංඛ්‍යාව	215,000	192,087
ආරක්ෂිත නල මලාපවහන පහසුකම්	ජනගහනයෙන් %	2.12	2.08
ආදායම් නොලබන ජල සැපයුම්			
කොළඹ නගරය	ජනගහනයෙන් %	32	34.75
දිවයින පුරා	ජනගහනයෙන් %	23.09	25.82

වගුව 24 - මණ්ඩලයේ කාර්යය සාධක දර්ශකයන්හි ඉලක්ක ගත හා තත්‍ය ප්‍රගතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය පිළිබඳ සාරාංශයක් වගුව 25 හි දැක්වේ.

	2021 රු. මිලියන	2020 රු. මිලියන
ආදායම	28,935.44	27,761.78
විකුණුම් පිරිවැය	(19162.95)	16,754.65
දළ ලාභය	9,772.5	11,007.13
මෙහෙයුම් ලාභය	(3,087.15)	(385.11)
බදු පෙර ලාභය	(2,996.69)	642.78
මුළු වත්කම්	785,467.18	699,281.44
ස්කන්ධය	497.70	456.82
දිගු කාලීන ණය		
ජංගම නොවන	227,420.93	198,175.77
ජංගම	12,578.84	2,920.57

වගුව 25 : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය පිළිබඳ සාරාංශය

ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 642.78ක බදු පෙර ලාභය සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 2,996.69ක බදු පෙර අලාභයක් දක්වා විශාල වශයෙන් පිරිහී තිබුණි. මනුගත විකුණුම්හි සාපේක්ෂ අඩුවීම, පිරිපහදු ජල නිශ්පාදනයට සෘජුව සම්බන්ධ වන පුද්ගලික පිරිවැයෙහි සාපේක්ෂ ඉහළ යාම සහ අනෙකුත් නිශ්පාදන පිරිවැයෙහි සාපේක්ෂ වැඩිවීම

මණ්ඩලයේ දළ ලාභ ආන්තිකය සියයට 6කින් පහල බැසීමෙට හේතුවී තිබුණි. ඊට අමතරව පරිපාලන වියදම් හා මූල්‍ය පිරිවැය පිළිවෙලින් සියයට 10කින් හා සියයට 38කින් ඉහළ යාම හේතුවෙන් මණ්ඩලයේ ඉකුත් වර්ෂයේදී වූ බදු පෙර ලාභය සමාලෝචිත වර්ෂයේ දී බදු පෙර අලාභයක් දක්වා පහළ බැසීමට හේතු වී තිබුණි. තවද, මණ්ඩලයේ ද්‍රවශීලතා අනුපාත වන ජංගම හා ක්ෂණික අනුපාතයන්ද පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් වාර 0.45කින් හා 0.41කින් පහළ බැස තිබූ අතර මණ්ඩලයේ මුළු ණය ගැනීම් පසුගිය වසරට සාපේක්ෂව සියයට 19කින් ඉහළ යාම හේතුවෙන් එහි තෝලන අනුපාතයද සියයට 53 සිට සියයට 58 දක්වා සියයට 5කින් පසුගිය වර්ෂය හා සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි.

ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ මහා කොළඹ ජල හා අපජල කලමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ ආරම්භ කල ව්‍යාපෘති.

මෙම වැඩසටහන යටතේ කොළඹ නගරයේ 2012 වර්ෂයේ සිට පැවත එන සියයට 49 ක් වූ ආදායම් නොලබන ජල අනුපාතය 2020 වසර වන විට සියයට 18 දක්වා අඩු මට්ටමකට ගෙනඒම, කොළඹ නගරයේ පැය 24 පුරා ගුණාත්මක ජල සැපයුමක් අඛණ්ඩව ලබාදීම හා ආයතන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමත් ප්‍රධාන අරමුණ විය. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය දායකත්වය යටතේ පිළිවෙලින් ව්‍යාපෘති I, II හා III වශයෙන් මහාපරිමාණ ව්‍යාපෘති 3 ක් පිළිවෙලින් 2013, 2014 හා 2016 වර්ෂයන්හිදි ආරම්භ කර 2016, 2019 හා 2020 වන විට නිමකිරීමට මූලිකව සැලසුම් කර තිබුණ ද එම දිනයන්ට නිමකිරීමට අපොහොසත් වීම තුළ පිළිවෙලින් 2021 ජූනි 30 හා 2022 ඔක්තෝම්බර් 22 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබිණි. ඉහත ව්‍යාපෘතීන් යටතේ කොළඹ නගරය දිස්ත්‍රික් මිණුම් කලාප 77 කට බෙදා පද්ධති පුනරුත්ථාපනය කර ආදායම් නොලබන ජල අනුපාතය සියයට 18ට අඩු කිරීමට මූලිකව සැලසුම් කලද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් ආදායම් නොවන ජල අනුපාතය සියයට 18ට අඩු කර භාර දී තිබූ එම දිස්ත්‍රික් මිණුම් කලාප සංඛ්‍යාව 29 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2021 දෙසැම්බර් 31 දින වන විටත් කොළඹ නගරයේ ආදායම් නොවන ජල අනුපාතය සියයට 34.75 මට්ටමේ පැවතිණි. මෙහිදී විගණනයේ ගණනය කිරීම් වලට අනුව ආදායම් නොවන ජල අනුපාතය සියයට 1 කින් අඩුකරගතහොත් මණ්ඩලයේ ආදායම රු.මිලියන 40.03 කින් වැඩි කර ගත හැකිවනු ඇත. කෙසේ වුවද, මෙම වැඩසටහන යටතේ පූර්ණ ප්‍රතිලාභ මණ්ඩලයට අත්කර ගැනීමට නොහැකිවුවද, ලබාගත් ණය මුදල් වෙනුවෙන් රජය විසින් පිළිවෙලින් රු.මිලියන1,124.29 ක පොලී ගාස්තු ප්‍රමාණයක් හා ණය මුදල්හි ඌණ උපයෝජනය මත රු.මිලියන 203.97 බැඳීම් ගාස්තු ගෙවීම් සිදුකර තිබුණි.

අඹතලේ පද්ධති පුනරුත්ථාපන හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අඹතලේ ජල පවිත්‍රාගාරයන්හි සාමාන්‍ය මාසිකව වැයවන රු.මිලියන 67 කට අධික බලශක්ති පිරිවැය අවමකරගැනීම සඳහා අඩු කාර්යක්ෂමතාවයකින් යුතු හා පැරණි පොම්ප ඉවත්කර ඒ වෙනුවට නව පොම්ප

ප්‍රතිස්ථාපනය කිරීමත්, වර්ෂ 70 ත් 100 ත් අතර පැරණි කුඩා සම්ප්‍රේෂණ නල පද්ධතීන් වෙනුවට ධාරිතාවයෙන් ඉහල නල ඇතිරීම් තුලින් ඝර්ෂණ අලාභ (Friction cost) අවම කිරීමත් විය. මෙහි ව්‍යාපෘති කටයුතු 2014 සැප්තැම්බර් ආරම්භ කර 2019 ජුනි වන විට වර්ෂ 4 මාස 9 කින් නිම කිරීමට මූලිකව සැලසුම් කලද, එම දිනට නිම කිරීමට අපොහොසත් වීම තුළ 2023 ජූනි දක්වා තවත් අවුරුදු 04 කින් කාලය දීර්ඝ කර තිබුණි. එහෙත් 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කටයුතු ආරම්භ කර අවුරුදු 7 කට වැඩි කාලයක් ඉක්ම ගියද අත්කරගත් සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 58.83 ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක් වූ අතර කිසිදු ප්‍රධාන කොන්ත්‍රාත්තුවක් මෙම දින වන විට නිම වී නොතිබුණි. ඒ අනුව 2023 ජූනි දක්වා වූ ඉතිරි අවුරුදු 1 ½ තුළ ඉතිරි සියයට 43.17 ක ප්‍රගතිය අත්කරගත හැකි වේද යන්න සැක සහිත වේ. එහෙත් මෙම දුර්වල කාර්යසාධනය හේතුවෙන් වූ ඌණ ණය උපයෝජනය මත ණය ප්‍රදාන ආයතනයට රු.මිලියන 358.71 කට සමාන ඇ.එ.ජ.ඩො. මිලියන 2.19 ක බැදීම් ගාස්තු වටිනාකමක් රජය විසින් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සැලසුම් කල කාලය තුළ නිම නොවීම මත මේ වන විට දෛනිකව දරනු ලබන ඉහල ශක්ති පිරිවැයට අමතරව ඉදිරියේදී වැඩිකිරීමට නියමිත බලශක්ති පිරිවැයද සැලකිය යුතු මට්ටමකින් අඩුකර ගැනීමට මණ්ඩලයට තිබූ මහඟු අවස්ථාව මඟහැරී ඇත.

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘති අදියර I හා අදියර II

දිවයිනේ අනෙකුත් ප්‍රදේශයන්ට සාපේක්ෂව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ දන්තමය ආබාධ හා නිදන්ගත වකුගඩු රෝගය සීඝ්‍ර ලෙස පැතිරී ඇති සීමිත පිරිපහදු නල ජල සැපයුමක් හා ගුණාත්මක තත්වයේ ජල පරිභෝජනයක් සිදු නොවන නොගැඹුරු භූගත ජල මූලාශ්‍ර භාවිතයට ගනු ලබන ප්‍රදේශයන්ට ප්‍රමුඛත්වය ලබා දී එම ප්‍රදේශයන්හි ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීමේ අරමුණින් කඩිනමින් ආරම්භ කර කෙටිකලකින් නිම කිරීමේ අපේක්ෂාවෙන් මෙම අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘති අදියර I හා අදියර II යනුවෙන් ව්‍යාපෘති 02 ක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ආරම්භ කර ඇති අතර ඉන් අනුරාධපුර උතුර අදියර I යටතේ රඹෑව හා මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන අතර එහි ව්‍යාපෘති කටයුතු 2013 පෙබරවාරි ආරම්භ කර 2018 පෙබරවාරි වන විට වසර 05 කින් නිම කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් එදිනට නිම කිරීමට අපොහොසත් වීම තුළ එහි කාලය 2022 ජූලි 05 දින දක්වා කාල දිගුවන් ලබාගෙන තිබුණි. එහෙත් 2022 ජූනි 30 දින වන විට මෙහි ව්‍යාපෘති කටයුතු ආරම්භ කර වසර 09 මාස 04 ක් ගත වුවද සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 97.46 ක මට්ටමක වූ අතර කිසිදු ඉදිකිරීමක් පූර්ණ ලෙස ඉදිකර මණ්ඩලය වෙත භාර දී නොතිබුණි. මේ සඳහා දුර්වල කාර්යසාධනය හා ප්‍රදාන නල එලීම් කොන්ත්‍රාත්තුව වන Lot-B හි මේ වන විට ඇති වී ඇති ප්‍රමාදය දැඩිව බලපා තිබුණි. මීට

අමතරව හොරොව්පතාන, පදවිය, කහටගස්දිගිලිය හා කැබතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල ජනතාව ඉලක්ක කරගෙන ආරම්භ කර ඇති ඉහත අනුරාධපුර උතුර අදියර II හි ව්‍යාපෘති කටයුතු 2017 ජුනි ආරම්භ කර 2024 ජුනි වන විට අවුරුදු 07 කාල පරිච්ඡේදයකින් නිම කිරීමට සැලසුම් කර තිබුණද, 2022 ජුනි 30 දින වන විට අවුරුදු 05 ක කාලයක් ගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් වූ කිසිදු ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර නොතිබුණි. ඒ අනුව රජය විසින් ප්‍රමුඛතා පදනමෙන් කෙටි කලක් තුළ ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කල මෙම ව්‍යාපෘතීන්හි දිගින් දිගටම සිදුවී ඇති ප්‍රමාදයන් හේතුවෙන් ඒවා ආරම්භ කිරීමෙන් රජය හා මහජනයා අපේක්ෂා කල අරමුණු කාලීනව ඉටුවී නොමැති බවට වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

මහ කොළඹ ජලය හා අප ජලය කලමණාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය II

- යථෝක්ත ව්‍යාපෘතිය ආරම්භකර 2021 දෙසැම්බර් 31 දිනට වසර 7ක් ගතවී තිබුණද පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ඉදිකිරීම් සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් මේ දක්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. එහෙත් ඒ සඳහා ඉඩම අත්පත්කරගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබියදීත් වාස්තු විද්‍යාත්මක සංකල්පීය සැලැසුම් සහ ඉදිකිරීම් යනාදිය වශයෙන් අවස්ථා 03 කදී උපදේශන සේවා කොන්ත්‍රාත් 03 ක් ප්‍රදානය කර තිබුණි. පසුව ඉඩමෙහි ප්‍රමාණය සහ ගොඩනැගිල්ලෙහි විෂය පථය වෙනස්වීම ඇතුළුව ඉඩම් පවරාගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම මත එම කොන්ත්‍රාත්තුන් අවලංගු කර තිබූ අතර ඒ සඳහා දරන ලද වියදම රු.මිලියන 28.19ක් විය. මීට අමතරව 2022 ඔක්තෝබර් 24 දින ව්‍යාපෘතියේ ණය ගිවිසුම අවසන් වන බැවින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නව ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබාදී නොතිබීම හේතුවෙන් ඉහත ඉදිකිරීම් සිදුවේද යන්න සැක සහිතය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට උපදේශන සේවා ගාස්තු ලෙස දරන ලද රු.මිලියන 28.19 ඇතුළු ඉඩම් පවරාගැනීමේ ගාස්තු ලෙස දරන ලද රු.මිලියන 1.45 ක වියදම ව්‍යාපෘතියට අනාර්ථික වියදමක් වී තිබුණි.

- 2018 ඔක්තෝම්බර් 16 වන දින රු.මිලියන 54.26 පිරිවැයකට වෙබ් යෙදවුම් සහ පුහුණුව සඳහා GIS මෘදුකාංගය සංවර්ධනය කර සැපයීම සහ ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලද අතර එය වර්ෂයක් ඇතුළත නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය විසින් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල 40 ක විස්තීර්ණ හා ආයතනික GIS පද්ධතිය ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. කොන්ත්‍රාත්තුව යටතේ මූලික විෂය පථය සම්පූර්ණව තිබුණද ප්‍රධාන කාර්යාලය විසින් මූලික විෂය පථය වෙනස් කර ඇති බැවින් කොන්ත්‍රාත්තුව යටතේ පද්ධතිය නවීකරණය මේ වන තෙක් සම්පූර්ණ කර

නොමැති විය. ඊට අමතරව මෙම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව දෙවන වසරේ සිට අදාළ සමාගමට නඩත්තු කිරීමට ඇ.එ.ජ.ඩො. 21,600 ක් සෑම අවුරුද්දක් පාසා ගෙවීමට නියමිතව ඇති බැවින් මෙවැනි විශාල නඩත්තු ගාස්තුවක් මණ්ඩලයට ගෙවීමට හැකිවේද යන්න විගණනයට සැකසහිත විය.

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර 2017 සැප්තැම්බර් වන විට නිමකිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, සැලසුම් අනුමත කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් නැවතත් 2022 දෙසැම්බර් 31 දින දක්වා කාල දිගුවක් ලබා දී තිබුණි. කොලෝන් ගෝලොබල් ආයතනයට 2013 නොවැම්බර් මස ප්‍රදානය කරන ලද ප්‍රධාන අපවහන ජාලය සැලසුම් කිරීම හා ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝබර් වන විට නිම කිරීමට නියමිත වුවද කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය නිසා 2022 මැයි 31 දක්වා කාලය දීර්ඝ කිරීම් අවස්ථා 03 ක් ලබා දී තිබුණි. ෆිඩික් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 8.4 පරිදි කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීම් ලබාදිය හැකි වුවත් එහි ඡේද අංක 19.4 පරිදි කාල ප්‍රමාදය වෙනුවෙන් ගෙවීම් ඉල්ලුම් කල නොහැක. එසේ තිබියදීත් ආරවුල් සමථකරන තීරණය මත පිලිවෙළින් අතිරේක සැලසුම් පරිවැය ලෙස රු.මිලියන 52.12 කුත් කාල ප්‍රමාදයට හා මිල උච්චාවචන ලෙස රු.මිලියන 1,698.38 කුත් කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟ වී තිබූ අතර ඉන් රු.මිලියන 52.12 ක් 2022 මාර්තු මස ගෙවා තිබුණි.

ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය

2017 පෙබරවාරි ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2020 පෙබරවාරි වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, කොන්ත්‍රාකරුවන්ගේ අකාර්යක්ෂමතා හා දුර්වල ව්‍යාපෘති කළමනාකරණය නිසා 2022 දෙසැම්බර් දක්වා කාලය දීර්ඝ කර තිබුණි. ෆිඩික් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 19.4 පරිදි කාලය දීර්ඝ කිරීම් සඳහා කොන්ත්‍රාත්කරුට අතිරේක පිරිවැය ඉල්ලීම් කිරීමට නොහැකි වුවද කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාව මත සිදු කල කාලය දීර්ඝ කිරීම් සඳහා විචලන නියෝග 12 මඟින් අතිරේක මූල්‍ය ගාස්තු ලෙස යුරෝ 330,183.98 ක් හා ශ්‍රී ලංකා රු.මිලියන 3.01 ක් ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ ඡේද අංක 8.5.4 ප්‍රකාරව ව්‍යාපෘතිය ආරම්භයේදීම කොන්ත්‍රාක්කරු විසින් වාහන සැපයිය යුතු වුවද 2020 සැප්තැම්බර් මස එනම් ව්‍යාපෘතිය නිම වීමට ආසන්නයේදී කොන්ත්‍රාත්කරු වාහන ලබා දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය ආරම්භයේදී වාහන මිලදී නොගැනීම නිසා වාහන කුලී ලෙස රු.මිලියන 14.99 ක් ව්‍යාපෘතිය කාලය තුළ විචලන නියෝග මගින් වැය කර තිබුණි.

සැමට ජලය වැඩසටහන

2025 වර්ෂය වන විට සැමට පිරිසිදු පානීය ජලය ලබා දීමේ අපේක්ෂාවෙන් ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා 2020, 2021 හා

2022 යන වර්ෂයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 24,568ක්, රු. මිලියන 29,568ක් හා රු. මිලියන 17,000ක් අයවැය ඇස්තමේන්තුව තුළ වෙන් කොට තිබූ අතර 2021හා 2022 මැයි 31 දින දක්වා රු.මිලියන 9,427 ක් පමණක් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ජල සම්පාදන මණ්ඩලයට අමාත්‍යාංශය හරහා ලැබී තිබුණි. ව්‍යාපෘතිය සඳහා බඳවාගත් සමස්ථ ව්‍යාපෘති නිලධාරීන් 176 දෙනෙකු අංක 02/2020 හා 2020 ඔක්තෝබර් 26 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනිව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියක්ද රහිතව බඳවාගෙන තිබූ අතර බඳවා ගත් දින සිට 2022 ජූලි 31 දින දක්වා රු. මිලියන 216.7ක් වැටුප් හා දීමනා වශයෙන් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් ආනයනය කරන ලද DI හා HDPE නල ඇතුළු අනෙකුත් උපාංග වරායෙන් නිදහස් කර ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ගැනීමකින් තොරව සිදු කල ආනයන වෙනුවෙන් රු.මිලියන 33.3ක් ප්‍රමාද ගාස්තු වශයෙන් 2022 ජුනි අවසානය වන විට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබූ අතර එදිනට වරායට ලැබී තිබූ නමුත් නිදහස් කර ගැනීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ ආනයනික බහාලුම් 207ක් වෙනුවෙන් වරායේ ප්‍රමාද ගාස්තු වශයෙන් ආසන්න වශයෙන් රු.මිලියන 813.12ක් ගෙවිය යුතුව තිබුණි. කෙසේ වෙතත් එදිනට නිදහස් කර ගන්නා ලද රු. මිලියන 234.37ක් වූ DI නල වලින් එකදු නලයක් හෝ 2022 ජූලි මස අවසානය වන විට එලා නොතිබූ අතර HDPE නල වලින් සියයට 40කට ආසන්න ප්‍රමාණයක් කිසිදු එලීම් කටයුත්තක් සඳහා භාවිතා නොකර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන 10කට අයත් ගබඩාවන්හි නිශ්කාර්යව ගොඩ ගසා තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය යටතේ ප්‍රධානය කොට තිබූ කොන්ත්‍රාත් බොහෝ ප්‍රමාණයක වැඩ 2022 ජූලි මස අවසානය වන විට නවතා තිබූයෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල 2025 වර්ෂය අවසානය වන විට ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විගණනයේදී දැඩි අවිනිශ්චිතතාවයක් පවතී.

ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රජා ජල අභිමානී වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කොට තිබූ ජල ව්‍යාපෘති 275කින් ජල ව්‍යාපෘති 105ක ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 දිනට සියයට 50 කට වඩා පහල මට්ටමකින් පැවති බව නිරීක්ෂණය විය. ඒ අතරින් 2021 වර්ෂය තුළ ආරම්භ කොට එම වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කොට තිබූ පිරිවැය රු.මිලියන 603.15ක ව්‍යාපෘති 81කින් පිරිවැය රු. මිලියන 591.96ක් වූ ජල ව්‍යාපෘති 76ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම නොකොට පැවතුන අතර 2019 වර්ෂය තුළ ගාල්ල හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ආරම්භ කොට එම වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කල ජල සැපයුම් ව්‍යාපෘති 05ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් නිම නොකොට පැවතුනි. මීට අමතරව සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ ජලයේ ගුණත්වය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කල රු. මිලියන 101 ක පිරිවැයකින් යුතු ව්‍යාපෘති 21කින් පිරිවැය රු. මිලියන 72.7ක් වූ ව්‍යාපෘති 16 ක්

සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි. ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ ව්‍යාපෘති 9කට අදාළව ඉටු නොකල කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 2.58 ක මුදල් 2020 හා 2021 වර්ෂයන් තුළදී ප්‍රජා මූල සංවිධානයන්ට ගෙවා තිබුණි.

ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශ මධ්‍යස්ථානය

චීන රජයේ ප්‍රදානයක් ලෙස රු. මිලියන 1,950 ක පිරිවැයක් දරා ඉදිකළ ජල තාක්ෂණය සඳහා වන චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්ෂයේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානය 2021 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා රජය වෙත භාර දී තිබුණ ද, විගණිත දින වූ 2022 ජනවාරි 10 දින වන විටත් මෙමගින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

- ජල සම්පාදන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මඟින් තෝරා ගත් දිස්ත්‍රික්ක 07ක් තුළ නල ජල සැපයුම් හා වැඩි දියුණු කල සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවිෂ්ඨය වැඩි කිරීම හා සම්බන්ධිත ආයතන වල ධාරිතාවය ශක්තිමත් කිරීමත් අරමුණු කරගෙන තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය නියමිත කාල පරිච්ජේදය තුළ නිම නොකිරීම මත අවස්ථා දෙකකදී 2023 දෙසැම්බර් 31 දින දක්වා කාල දිගුවන් දෙකක් ලබා දී තිබුණි. නියැදි පරීක්ෂාවට ලක්වූ නාගරික, ග්‍රාමීය සහ වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ යෝජනා ක්‍රම 19 ක 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතියේ දින 178 සිට දින 1463ක් දක්වාද, සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් 06ක ප්‍රගතියෙහි දින 197 සිට දින 505 දක්වා වූ ප්‍රමාදයක් පැවතුණි. තවද, දුර්වල කාර්ය සාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට ගෙවන ලද රු. මිලියන 140.65ක් වූ අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා කාර්යක්ෂමව උපයෝජනය නොකිරීමට ඉඩ හරිමින් තවත් කොන්ත්‍රාත් 02ක් ප්‍රදානය කොට තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය මත අත්හිටුවන ලද කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පොන්නගර් පාතියපුරම් ජල යෝජනා ක්‍රමය 2018 ඔක්තෝබර් 20 දින අවසන් කිරීමට නියමිතව තිබුණද ඒ සඳහා වූ ඉතිරි වැඩ සඳහා ප්‍රදානය කල කොන්ත්‍රාත්තුව 2022 මාර්තු 31 දින වන විටත් නිම වී නොතිබුණි.

- දිස්ත්‍රික්ක 07 තුළ ව්‍යාපෘති කාලච්ජේදය පුරා වැසිකිළි 24000ක් නිම කිරීමට සැලසුම් කොට තිබුණද වැසිකිළි ඉදිකිරීම් 1302ක වැඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණි. විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ඒකක 84ක් කෑගල්ල, මොණරාගල හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන් තුළ ඉදිකිරීමට සැලසුම් කර තිබුණද එවැනි ඒකක 43ක් පමණක් කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කයන්හි

ඉදිකර තිබූ අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් අත්හිටුවා තිබුණි. තවද බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි ආදී වාසී සනීපාරක්ෂක ඒකක 566ක් ඉදිකිරීමට සැලසුම්කොට තිබුණද ඒකක 154ක වැඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භ කොට නොතිබුණි.

ග්‍රාමීය හා ප්‍රදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

- අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 775ක ප්‍රතිපාදන වෙන්කර ගනිමින් අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති එකක් ද, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාපෘති හතරක් ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ ව්‍යාපෘති තුනක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ව්‍යාපෘති දෙකක්ද, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අතරින් රු. මිලියන 61.21 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ මඩුපල්ලි ජල සම්පාදන ව්‍යාපෘතියට හා ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් 10 ක් සම්බන්ධයෙන් කිසිදු භෞතික ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.

- අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබූ වැසි ජල ටැංකි ඉදිකිරීමේ වැඩසටහනේ මූලික අරමුණ වනුයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල නල පද්ධතිය මගින් ජලය ලබා දීමට නොහැකි ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබා දීම වුව ද, විධිමත් ක්‍රමවේදයක් මත ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හේතුවෙන් ප්‍රතිලාභ අත්‍යවශ්‍ය පුද්ගලයන්ට එය ලබා දී නොතිබූ බවත් ටැංකි සඳහා රැස්වන ජලය පානය සඳහා සුදුසු තත්ත්වයට පත් කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බවත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද වැසි ජල ටැංකි නියදියක් සඳහා සිදු කළ භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

ජල සම්පත් මණ්ඩල

- 2021 ජූලි 12 දින අමාත්‍ය මණ්ඩලය විසින් ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට සඳහා නියෝග කර තිබුණද, 2021 වර්ෂය අවසානය තෙක් අදාළ කෙටුම්පත නීතිපතිවරයාට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. පනත සංශෝධනය කර ගැනිමට කටයුතු නොකිරිම නිසා පනත සංශෝධනය කිරීමේ අරමුණ ලෙස හඳුනාගෙන ඇති වැරදි සහ ඊට අදාළ දඬුවම් පැමිණවීමේදී පැන නගින ගැටලු සහ භූගත ජලය අවභාවිතා කිරිම හා අසීමාන්තික ලෙස උකහා ගැනීමේ ගැටලු සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.
- 1978 වර්ෂයේ සිට ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගොස්තිබූ හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.මිලියන 12.77ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු

බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද, ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකොට තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබාදී තිබියදී, නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු කිරීමකින් තොරව මණ්ඩලය විසින්, අවුරුදු 45 ක් පමණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රයෙන් සහ ඉඩමෙන් ඉවත්වී ප්‍රධාන කාර්යාලය 2021 ජූලි 18 දින සිට කුලී ගොඩනැගිල්ලකට ගෙන ගොස් තිබුණි. එසේ වුවත් මෙමගින් මණ්ඩලයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතුවලට සිදුවූ බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

- නාගරික සංවර්ධන අධිකාරියට අයත්, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩම 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වාර්ෂිකව රු.මිලියන 2.7 ක බදු මුදලක් තීරණය කර තිබුණද එකී ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග විධිමත් ගිවිසුමකට එළැඹීමකින් තොරව 2016 වර්ෂයේ සිට වාර්ෂික බදු කුලී ගෙවීමට කටයුතු කර තිබුණි. මෙම ඉඩම සැලසුම්කල පරිදි භාවිතයට ගෙන නොතිබුණු අතර මේ දක්වා එකී ඉඩම සඳහා ගෙවූ රු.මිලියන 10.75 ක බදු කුලී නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

- මහනගර හා බස්නාහිර සංවර්ධන ආමාත්‍යවරයා විසින් 2016 නොවැම්බර් 24 දින ඉදිරිපත් කර තිබූ අංක 16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කර තිබූ යෝජනා සඳහා 2016 දෙසැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/16/2500/724/099 යටතේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම මුදල් අයකිරීමකින් තොරව නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමටත් බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 40 ක ඉඩම නාමික බිම් කුලියක් අයකිරීමේ පදනමින් වසර 30 ක කාලසීමාවක් සඳහා ජලසම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. ඒ පිළිබඳ කටයුතු කිරීමකින් තොරව අග්‍රාමාත්‍ය ලේකම් විසින් 2021 අප්‍රේල් 29 දින ඉදිරිපත් කර තිබූ අංක PMO/2/13/20/bldg දරණ ලිපිය මගින් කර තිබූ ඉල්ලීමක් මත ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කර ගැනීමට කටයුතු

කර තිබුණි. එම ඉඩම හා ගොඩනැගිල්ල අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත භාර දීමේ ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. එම භූමියේ පිහිටි ගොඩනැගිලි වෙනුවට වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් අමාත්‍යංශය මගින් ලබාදෙන බව එකී ලිපියේ සඳහන් වුවද, ඒ අනුව අදාළ ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය නිශ්කාෂණ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේ විසර්ජන පනත මගින්ද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ප්‍රධාන කාර්යාලය 2021 ජූලි මස 19 දින සිට රාජගිරියේ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක් මාසිකව රු.950,000 කුලී මුදලක් යටතේ ලබාගෙන ඊට ගෙනගොස් තිබුණි. එකී ගොඩනැගිල්ලේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා රු. 671,985 ක පිරිවැයක් දරා තිබුණි. 2021 වර්ෂය අවසන්වන විට එකී ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 4.75 කුලී මුදලක් ගෙවා තිබුණි. අදාළ ගිවිසුම වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු වන ලෙස එළඹ තිබීම හේතුවෙන් 2022 ජූලි මස 18 දිනට පසු ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙනයාමට සිදුවී තිබුණි.

- ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කලමණාකරණය කිරිම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීමට ජල සම්පත් මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සකස් කරන ලද ව්‍යාපෘති යොජනාවක් පදනම් කොට ගෙන, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරිම සඳහා වාරිමාර්ග අමාත්‍යවරයා විසින් 2015 ජූලි මස 10 දින අංක 05/2015 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ප්‍රථමයෙන් වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා නෙදර්ලන්තයේ රෝයල් අයිකල් කැම්ප් (Eijkelkamp Earth Sampling Group) ආයතනය වෙත යුරෝ මිලියන 20.63 පිරිවැයක් මත පිරිනැමීම සඳහා 2017 ඔක්තෝම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි.

මෙම ව්‍යාපෘතිය යටතේ යූරෝ මිලියන 2.24 ක් හෙවත් රු. මිලියන 393.976 ක් වටිනා අධි තාක්ෂණික විදුම් යන්ත්‍ර (MS – FT Drilling rig mountel truck) 02 ක් භාවිතයේ යොදවා තිබුණි. ව්‍යාපෘතිය අවසන්වීමෙන් පසු මෙම යන්ත්‍ර 02 ක ජල සම්පත් මණ්ඩලයට පවරාදීමට නියමිතව තිබුණි. එසේ වුවද මේ වන තෙක් එම යන්ත්‍ර භාරගෙන ක්‍රියාකිරීමට අවශ්‍ය නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට ඒ සඳහා

අවශ්‍ය පුහුණු ලබාදීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- 1964 අංක 29 දරන සහ සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ විධිවිධාන අනුව අංක 2010/23 හා 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත්කර ඇති නියෝග ක්‍රියාත්මක නොකිරීම.

නියෝග අංක 01

කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, සඳහා ජල සම්පත් මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ගතයුතු වුවත් මෙතෙක් එකී කිසිදු වගා ළිඳක් සඳහා මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

නියෝග අංක 02

නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 67 පමණක් ලියාපදිංචි වී තිබුණි. එසේම ලියාපදිංචි නොවී සිටි ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහාප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ආයතනය විසින් ගෙන නොතිබුණි. ඉහත ලියාපදිංචි ආයතනය විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු ගැඹුරු හෝ නොගැඹුරු නළළිං හි දත්තයන් ඇතුළත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් ජල සම්පත් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් මෙතෙක් ලියාපදිංචි වූ ආයතන 67 අතරින් කිසිදු ආයතනයක් ඉහත වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

නියෝග අංක 03

ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ අයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 40 ක් මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණ ද කිසිදු ආයතනයක් ඉහත වාර්තා මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි.

වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා වූ ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධව තත්ත්ව වාර්තාවක් (Perimeter Protection Report) ජල සම්පත් මණ්ඩලයෙන් ලබා ගත යුතු වේ. එහි විධිවිධාන ප්‍රකාරව කිසිදු ආයතනයක් අදාළ තත්ව වාර්තාව ලබා ගෙන නොතිබුණි.

නියෝග අංක 05

ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය උපයෝගී කරගනිමින් නිෂ්පාදන හා සේවා කටයුතු සිදුකරනු ලබන ආයතන

හෝ ස්ථාන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයන්හි දී එකී නිෂ්පාදන හෝ සේවා ස්ථානයන් වලට ඇතුලු වී පරීක්ෂා කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තෙක් ලියාපදිංචි වී තිබූ පානීය ජල බෝතල් කිරීමේ කර්මාන්ත ශාලා 40 ක කිසිඳු ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට නොතිබුණි.

නියෝග අංක 06

ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකරන රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයන් හෝ රාජ්‍ය නොවන සංවිධානයන් හෝ පුද්ගලයෙකුට එරෙහිව 1964 අංක 29 දරන සහ සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

අධ්‍යාපනය

විගණන නිරීක්ෂණ

- අධ්‍යාපන අමාත්‍යාංශය
- වැඩසටහන්වල ඵලදායීතාව ඇගයීමට ලක් නොකිරීම
- විදේශ ණය සහ ආධාර ව්‍යාපෘති
- යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව
- ප්‍රසම්පාදනයන්
- පෙල පොත් මුද්‍රණය
- ආර්ථික නොවන ගනුදෙනු
- ඌන උපයෝජිත වත්කම්

අධ්‍යාපනය

දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නඟා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායන් මගින් ළමා මිතුරු අධ්‍යාපන, නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ඨ උසස් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කරදීම උදෙසා පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකළ යුතුව පැවතුණි.

- ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ''දැනුමෙන් පිරිපුන් සමාජයක්'' බිහිකිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදුකිරීම, නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව අධ්‍යාපන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය,රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම.
- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම
- සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශය අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම.
- පාසල් ගුරුවරුන්ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසදීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන,රීති,රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම.
- පාසල් අවශ්‍යතාව සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිසැලසුම් කිරීම
- ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම.
- විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.
- විශ්ව විද්‍යාල තුළ සහ නේවාසිකාගාරයන්හි පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම.

- දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහිකිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂය මාලා සංශෝධනය කිරීම.
- විශ්වවිද්‍යාල සඳහා තොරතුරු තාක්‍ෂණ පහසුකම් ලබාදීම.
- මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරා ගැනීම හා එහි පහසුකම් පුළුල් කිරීම.
- සාගර විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම.
- සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරීම සඳහා පියවර ගැනීම.
- විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරිගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම.
- නවක වද සංස්කෘතිය සියලු විශ්වවිද්‍යාලවලින් හා උසස් අධ්‍යාපන ආයතන වලින් තුරන් කිරීමට කටයුතු කිරීම.
- සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, හා දෙපාර්තමේන්තු 02 ක් රාජ්‍ය අමාත්‍යාංශ 02 ක් වෙත එකතුව රු.මිලියන 81,163 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 73,063 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 39 හි දැක්වේ.



	අධ්‍යාපන අමාත්‍යාංශය	විභාග දෙපාර්තමේන්තුව	අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව	දහම් පාසල්,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	67,227	5,472	289	4,931	3,244	81,163
වියදම රු.මිලියන	61,663	3,822	136	4,949	2,493	73,063
ඉතිරිය රු.මිලියන	5,564	1,650	153	-18	751	8,100

රූපසටහන 39 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

අධ්‍යාපනය

අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශ 02 ක්, දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 02 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකළ කාර්යය සහ කර්තව්‍යය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය

- 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතෙහි 25 වන වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 5 ත් 14 ත් අතර වයස් සීමාවේ පසුවන දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදීමට පෞද්ගලික පාසල් ආරම්භ නොකල යුතු වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව ව්‍යාපාරික ආයතන ලෙස පෞද්ගලික පාසල්වලට අමතරව ජාත්‍යන්තර පාසල් 391 ක් හා ආගමික පාසල් ලෙස මද්‍රසා පාසල් 317 ක් පවත්වාගෙන ගොස් තිබුණද ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත් වී නොතිබුණි.

- අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003, 2016, 2018 හා 2019 වර්ෂවල නිර්දේශ ඉදිරිපත්කර තිබුණි. එසේ වුවද 2021 වර්ෂය අවසාන වන විටත් නිශ්චිත සහ ස්ථිරසාර ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස්කර නොතිබුණි.

- කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ 2021 වර්ෂය තුළදී දින 229 ක් පාසල් පැවැත්වීමට නියමිතව තිබුණද බස්නාහිර පළාත තුළ දින 102 ක් හා සෙසු පළාත් වල දින 143ක් පමණක් පාසල් පවත්වා තිබුණු අතර 2022 අප්‍රේල් 08 දින දක්වා පාසල් වර්ෂය දීර්ඝ කර තිබුණි. දරුවන්ට වූ ඉගෙනීමේ පාඩුවේ තරම තක්සේරු කර නොතිබු අතර අහිමි වූ පාසල් දින වල විෂය කොටස් ආවරණය සඳහා දුරස්ථ ඉගැන්වීම් ක්‍රියාවලියට යොමු වුවද සංඥා ගැටලු හා අවශ්‍ය තාක්ෂණික පහසුකම් නොමැති වීම, සිසුන්ට මාර්ගතව ඒවාට සම්බන්ධවීමට නොහැකිවීම, දෙමාපියන්ගේ දුර්වල ආර්ථික තත්වය හේතුවෙන් මාර්ගගත අධ්‍යාපනයට සම්බන්ධ වීමට අපහසුතා ඇතිවීම, ගුරුවරුන් බහුතරයකට දුරස්ථ අධ්‍යාපනය සම්බන්ධව අඩු දැනුමක් පැවතිම යන ගැටළු පැවතීම නිසා එම ක්‍රමයෙන් සාර්ථක ප්‍රතිපල අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 හා 2021 වර්ෂවලදී සිසු ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා 2021 සහ 2022 වර්ෂවලදී ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් දින 100 ක කඩිනම් වැඩසටහනක් පිළියෙල කර

ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණ ද එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

- නියැදි පරීක්ෂාවට අනුව දිවයිනේ පාසල් 26 කට අයත් අක්කර 49 රූඩ් 02 පර්.33ක්ද, ගුරු විද්‍යාල 03කට අයත් අක්කර 07 රූඩ් 01 පර්චස් 25 ක් හා විද්‍යා පීඨයක් සතුව පැවති අක්කර 91 පර්චස් 24 ක්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

- ගුණ ඥානබල සපිරි සිසු පරපුරක් ගොඩනැගීම සඳහා වන කේන්ද්‍රීය සපිරි පාසල් පද්ධතියක් ප්‍රතිනිර්මාණය කිරීමේ "ළඟම පාසල හොඳම පාසල " ජාතික වැඩසටහන 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද රු.මිලියන 7.3 ක් වැයකර තිබුණු පලාත් 03 ක විදුහල්පති නිල නිවාස 5 ක හා ගුරු නිවාස 9 ක 2022 ජූලි 05 වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර, භෞතික ප්‍රගතියක් නොමැති නමුත්, රු.මිලියන 6.52 ක් වැය කර තිබුණු විදුහල්පති නිල නිවසක් හා ගුරු නිවසක් ද පැවතුණි. මෙම ව්‍යාපෘතියට අදාළව පලාත් 07 ක් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩ ආරම්භ කර තිබුණු නමුත් අවසන් කිරීමට පෙර ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2,331 ක්වූ ව්‍යාපෘති 117 ක් අත්හැර තිබුණු අතර එම ව්‍යාපෘති වෙනුවෙන් 2022 මාර්තු 31 දිනට රු.මිලියන 1,851 ක් ගෙවා තවදුරටත් රු.මිලියන 1,756 ක් ගෙවීමට තිබුණි.

- ශ්‍රී ලංකාවේ සමස්ථ ගුරු කාර්ය මණ්ඩලයම උපාධිධාරීන් බවට පත්කිරිම, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්ව විද්‍යාල පීඨ තත්වයට උසස් කිරිම යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2019 දෙසැම්බර් 02 දින ඉදිරිපත් කර තිබු අතර ඒ සඳහා වු ප්‍රතිපත්තිමය අනුමැතිය 2019 දෙසැම්බර් 31 දිනැති අමප/19/3353/219/006 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දී තිබුණි. එසේ වුවද අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි ඇතුළත් යොජනාවෙහි සඳහන් පරිදි මේ සම්බන්ධ විශේෂඥ කමිටුවක් පත්කර අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය වැඩසටහන් සකස් කිරිමේ අදියරෙහි පැවතුණි.

- ගුරු ශික්ෂණලාභින් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨ 19 ක් පිහිටුවා තිබුණු අතර, ඒ සඳහා වාර්ෂිකව රු.මිලියන 2,200 කට අධික මුදලක් ඒකාබද්ධ අරමුදලින් වැයකර තිබුණි. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් සිසුන්ගෙන් අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා ශික්ෂණලාභීන් වාර්ෂිකව ඇතුළත් කරගත යුතුව තිබුණි. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා 2018 වර්ෂයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත ශික්ෂණලාභීන් බඳවා ගැනීම්

2021 වර්ෂයේදීද අවසන් වී නොතිබුණු අතර 2019 සහ 2020 වර්ෂවල අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත ශික්ෂණලාභීන් බඳවා ගැනීම 2022 මැයි 22 වන විටත් සිදුකර නොතිබුණි.

- 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන හා 2018 ජනවාරි 24 දිනැති අංක. 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතනයක් වෙතින් සේවාවන් ලබන මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටු කරන බවට ලිඛිත බැදීමක් ආකාරයෙන් සෑම රාජ්‍ය ආයතනයක්ම පුරවැසි - සේවාලාභී ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම කල යුතු වුවද, විවිධ සේවාවන් සපයන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි - සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම හා පවත්වාගෙන යාම 2021 වර්ෂය අවසාන වන විටද සිදුකර නොතිබුණි.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණු වැඩසටහනක් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයට රු. මිලියන 3.73 ක් ලබාදී තිබුණු අතර, මෙම මුදල අදාළ පුහුණු ආයතනයට ගෙවා ඇතත් මෙම පුහුණු කාර්යය ඉටුකර ගැනීමට 2021 වර්ෂය අවසානය වන විටද නොහැකි වී තිබුණි.

වැඩසටහන්වල ඵලදායීතාව ඇගයීමට ලක් නොකිරීම

2020 වර්ෂයේ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පාසල් වසා දැමීම හේතුවෙන් අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති වූ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා "ගුරු ගෙදර" අධ්‍යාපනික වැඩ සටහන් විකාශනය කිරීම වෙනුවෙන් 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 28.6 ක් හා රු.මිලියන 198.3 ක් ලෙස එකතුව රු.මිලියන 226.9 ක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික රූපවාහිනිය වෙත ගෙවා තිබුණ ද මෙම වැඩ සටහන්වල ඵලදායීතාවය සම්බන්ධයෙන් ඇගයීමට ලක් කර නොතිබුණි.

විදේශ ණය සහ ආධාර ව්‍යාපෘති

- හෝමාගම උතුරු පිටිපන ජාතික මට්ටමේ විෂයානුබද්ධ අන්තර්ගත/ මෘදුකාංග හා පරිගනක යෙදවුම් නිර්මාණය කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව අනුව යෝජිතව තිබුණද පසුව 2018 ජුනි 13 දිනැති අංක අමප/18/1142/835/005 දරන අමාත්‍ය මණ්ඩල තිරණයට අනුව කුලියාපිටිය නාරංගලවත්ත භූමිය ඒ සඳහා නිර්දේශ කර තිබුණි. නැවත 2020 ජනවාරි මස 09 දින අංක අමප/19/3468/219/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව හෝමාගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරන අක්කර 08 ක් වන ඉඩමෙන් භාවිතයට

අධ්‍යාපනය

නොගන්නා කොටස යොදා ගැනීමට තීරණය කර තිබුණි. මෙලෙස ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට අදාළ යෝජිත ඉඩම් වරින්වර වෙනස් කිරීම නිසා ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම 2019 වර්ෂයේ අත්සන් කළද ව්‍යාපෘතිය සක්‍රියව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර ව්‍යාපෘති කාල සීමාව ද ඉක්මවා තිබුණි.

- 2018 ජුනි 13 දිනැති අංක අමප/18/1142/835/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දකුණු පළාත සඳහා නිල්වලා විද්‍යාපීය භූමියෙහි ද නැගෙනහිර පළාත සඳහා අඩ්ඩාලච්චේනෙයි විද්‍යාපීය භූමියෙහිද පළාත් තොරතුරු තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන 2 ක් ඉදිකිරිම සඳහා අනුමැතිය ලැබී තිබුණි. පසුව 2021 ජූලි 26 දිනැති අංක අමප/21/1324/308/113 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දකුණු පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය දකුණු පළාත් සභාවට අයත් ගාල්ල පණාගමුව අමරසිංහ පාසල් භූමියේ ඉදිකිරිමටත්, 2021 සැප්තැම්බර් 28 දිනැති අංක. අමප/21/1655/308/113-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නැගෙනහිර පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇතුළු වරාය පාරේ මුලික පිඹුරු අංක 528 හි කැබලි අංක 1 ඉඩම යොදා ගැනීමට තීරණය කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේ ණය ගිවිසුම අත්සන් කළද වරින්වර මාධ්‍යස්ථාන ඉදිකිරීමේ ස්ථාන වෙනස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සක්‍රිය කිරිමට නොහැකි වී තිබුණි. අංක SRI/31-2573 දරන 2021 නොවැම්බර් 09 දිනැති කොරියානු EXIM බැංකුව විසින් ඉදිරිපත් කරන ලද ලිපියෙන් මෙම ව්‍යාපෘතියේ මධ්‍යස්ථාන ඉදිකිරීමට යෝජිත ස්ථානය නැවත නැවතත් වෙනස් නොකරන බවට සහතිකයක් ඉල්ලුම්කර තිබුණි. එම සහතිකය ඉදිරිපත්කර නොතිබුණු අතර 2019 – 2021 ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමටද නොහැකි වී තිබුණි.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්තිවල තාක්‍ෂණ විෂය උගන්වන ගුරුවරුන්ගේ ඌණතාවය අවම කිරීම, තාක්‍ෂණ විෂය හදාරන සිසුන්ට ගුරු තාක්‍ෂණලාභීන් ලෙස උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසීම, තාක්‍ෂණ විෂය උගන්වන ගුරුවරුන්ට තම වෘත්තිය සංවර්ධනය සඳහා තාක්‍ෂණ විෂයට අදාළව ගුරු පුහුණුව ලබාදීම ආදී කරුණු පදනම් කර ගනිමින් තාක්ෂණ විෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම සඳහා 2017 ජනවාරි 18 දිනැති අංක. අමප/16/2647/742/036-1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලබාදී තිබුණි. 2017 අප්‍රේල් 19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබු 2017 අංක 93 දරණ ආඥාවේ සඳහන් දැන්වීම මඟින් අදාළ ඉදිකිරීම සඳහා කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාරංගොල්ල ප්‍රදේශයේ ඉඩමක භුක්තිය අධ්‍යාපන ලේකම්වරයා වෙත පවරා තිබුණි. කොරියානු රජයේ ආධාර මත ඉදිකිරීමට සැලසුම් කරන ලද මෙම

ව්‍යාපෘතියට 2019 සහ 2020 වර්ෂයන් තුළ මුල්ගල් තැබීම ඇතුළු වියදම් සඳහා "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය මගින් රු.මිලියන 15.3 ක මුදලක් වැයකර තිබුණද, ව්‍යාපෘතියේ වැඩ කටයුතු මේ වන විට නවතා දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය කාර්යයන් ප්‍රමාද වීම හේතුවෙන් සංශෝධිත කාර්යබද්ධ පත්‍රිකාවට අනුව කොරියානු ජනරජයට අනුබද්ධිත අන්තර්ජාතික කොරියානු සහයෝගිතා එජන්සිය (KOICA) ව්‍යාපෘතියෙහි ඉදිකිරීම්වලින් ඉවත් වී එහි වගකීම අමාත්‍යාංශයට පවරා දී තිබුණද විගණිත දිනය වූ 2022 මැයි 31 වන තෙක් මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

- 2005 වර්ෂයේ ආරම්භකර 2008 සැප්තැම්බර් මස 24 දිනැති අංක. අමප/08/1742/316/086 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබුණු අතර ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා පිළියෙල කළ කෙටුම්පත් පනත 2008 වර්ෂයේදී නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පනතේ කටයුතු අවසන් කර නොතිබුණි.
- කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම හා ගෙවීම් කිරීම පනතක් මගින් සිදුවිය යුතුව තිබුණු නමුත් පනත අනුමතව නොතිබියදී 2006 ඔක්තෝබර් 04 දිනැති අංක. අමප/08/1742/316/087 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම හා ගෙවීම්කිරීම සිදුකර තිබුණි. එසේ වුවද 2016 අප්‍රේල් 27 දිනැති අංක DMS/0039/TEM දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව ප්‍රංශයේ පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා සම්බන්ධීකරණ නිලධාරී තනතුරක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අනුමත කල නොහැකි බව දන්වා තිබියදී ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය වෙත සම්බන්ධීකරණ නිලධාරිනියක් අනුයුක්ත කර ඇයගේ පාරිශ්‍රමිකය වශයෙන් 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.මිලියන 35.65 ක ප්‍රතිපාදනයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.
- යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලට අයත් රු.මිලියන 10.26 ක මුදලක් 2015 වර්ෂයේදී බැංකු ජංගම ගිණුමක තැන්පත් කර ශිෂ්‍යත්ව ලබා දීම 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. වසර දෙකක් පමණ ගතවන තෙක් අරමුදල ඌණ උපයෝජිතව පැවති අතර මෙම ශිෂ්‍යත්ව ලබාදීම 2021 මැයි මස සිට නවතා දමා තිබුණි.

ප්‍රසම්පාදනයන්

- ප්‍රශ්නපත්‍රවල මනා නිමාවක් ලබා ගැනීම මගින් විභාග අපේක්ෂකයින්ගේ

විශ්වාසනීයත්වය නංවාලීම හා රහස්‍ය භාවය උපරිමයෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් විභාග දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී රු.මිලියන 546 ක වියදමක් දරා Wide web digital printing මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. 2022 වර්ෂයේ පවත්වන ලද 2021 වර්ෂයට අදාළ අධ්‍යපන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර පිටපත් 4,898,000 ක් මුද්‍රණය කර තිබුණද මෙම මුද්‍රණ යන්ත්‍රයෙන් පිටපත් 509,000 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. එය සමස්ත මුද්‍රිත ප්‍රශ්න පත්‍ර වලින් සියයට 10 ක් විය. 2022 වර්ෂයේ පවත්වන ලද 2021 වර්ෂයට අදාළ අධ්‍යපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර පිටපත් 7,845,825 ක් මුද්‍රණය කර තිබුණු අතර මෙම මුද්‍රණ යන්ත්‍රයෙන් පිටපත් 46,125 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. එය සමස්ථ ප්‍රශ්න පත්‍ර වලින් සියයට 0.58 ක තරම් අඩු ප්‍රමාණයක් වී තිබුණි. තවද මෙම යන්ත්‍රය සඳහා රු.මිලියන 8.4 වැයකර 2018 වර්ෂයේදී මිලදීගෙන තිබුණු යන්ත්‍රයේ Wrapping Solution කොටස ප්‍රයෝජනයට නොගෙන මිලදීගත් දින සිට නිශ්කාර්යව පැවතුණි.

- 2011 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් මතු වූ ගැටළු විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද විද්වත් කමිටු යෝජනාවකට අනුව පාසැල් විභාග සහ ආයතනික විභාග පැවැත්වීම, ඇගයීම් කටයුතු සඳහා පාසල් වසා දැමීම අඩු කිරීම, උත්තරපත්‍ර එක්රැස්කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට සහ උත්තරපත්‍ර පැනල් කිරීමේ කාර්යයන් ආරක්ෂාකාරීව සිදු කිරීමට විභාග දෙපාර්තමේන්තුවට භාවිතා කිරීම සඳහා 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර 2019 පෙබරවාරි 02 දින අවසන් කිරීමට නියමිත සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල, රු. මිලියන 564 ක කොන්ත්‍රාත් මුදලකට අංක.13/1030/530/01/15 සහ 2014 මැයි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී ඇතත් 2022 ජූලි 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ඉදිකිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යංශයට රු.මිලියන 58 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව රු.මිලියන 200 ක් ද වශයෙන් රු.මිලියන 258 ක මුදලක් ගෙවීම් කර තිබුණි.
- ජාතික අධ්‍යාපන ආයතනයට අදාළව දෙස් විදෙස් ගුරු සිසුන් 100 දෙනෙකුට නේවාසික පහසුකම් ලබා දීමේ අරමුණින් රු.මිලියන 198 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ මීපේ දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2015 අයවැය මඟින් යෝජනා වී තිබුණි. ඒ අනුව 2018 පෙබරවාරි 20 දින එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2019 දෙසැම්බර් 05 දින නිමකළ යුතුව තිබුණ ද 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 151 ක් වැය කර තිබුණු අතර අවස්ථා 06 කදී දින දීර්ඝ කිරීම්ද ලබා

ගෙන තිබුණි. එහෙත් 2021 ජූලි 11 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපොහොසත් වී තිබුණි. තවද, මෙම ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය 2021 දෙසැම්බර් 31 දක්වාම ලබා ගෙන නොතිබුණි.

පෙල පොත් මුද්‍රණය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ වාර්ෂික පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන පොත් මුද්‍රණය කිරීම හා ඊට අවශ්‍යය ගබඩා පහසුකම් ප්‍රමාණවත්ව නොතිබීම හේතුවෙන් 2018 හා 2021 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 84 ක් හා රු.මිලියන 8.5ක් වටිනා පොත් අපහරණය කර තිබුණු අතර නැවතත් 2021 වර්ෂය අවසානයට රු. මිලියන 9.7 ක් වටිනා පොත් අපහරණය කල යුතු බවට හඳුනාගෙන තිබුණි.

ආර්ථික නොවන ගනුදෙනු

වර්ග අඩි 10,000 කින් යුක්ත මාසික කුලිය රු.650,000 ක කුලී පදනම මත පවත්වාගෙන ගොස් තිබූ නුගේගොඩ පිහිටි ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රය 2021 ජූලි 01 දින සිට මාසික කුලිය රු.මිලියන 1.42 වන වර්ග අඩි 4,748 කින් යුක්ත වූ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය වෙත මාරු කර තිබුණි. එම නිසා ගොඩනැගිලි කුලිය, විදුලිය, ජලය, ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා වෙනුවෙන් දරනු ලැබූ රු.මිලියන 8.1 ක සාමාන්‍ය වාර්ෂික වියදම රු.මිලියන 17.1 ක් දක්වා වැඩිවීම හේතුවෙන් රු.මිලියන 9 ක අමතර වැයක් දැරීමට කොමිෂන් සභාවට සිදුවී තිබුණි.

ඌන උපයෝජිත වත්කම්

2021 අයවැය යෝජනා යටතේ කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි "e තක්ෂිලාව" ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ භාවිතය සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් පළාත් 09 හි පිහිටි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ චිත්‍රාගාර ඉදිකිරීමේ යෝජනාව මත උපකරණ මිලදී ගෙන තිබුණ ද පළාත් 05 ක චිත්‍රාගාර 2022 මැයි 31 දක්වාම ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම පළාත් වෙත ලබා දී තිබූ පිරිවැය රු.මිලියන 15.3 ක් වූ උපකරණ නිශ්ක්‍රීයව පැවතුණි.

උසස් අධ්‍යාපනය

විගණන නිරීක්ෂණ

- ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාද
- අධිකාරී බලය නොලත් ගනුදෙනු
- පශ්චාත් උපාධි පාඨමාලා අවලංගු කරගෙන තිබුණු ප්‍රදානලාභීන් වෙත ගෙවන ලද මුදල් නැවත අයකර නොගැනීම
- විශ්වවිද්‍යාලවල සිසු පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම
- පර්යේෂණ දීමනාලාභීන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම
- විශ්වවිද්‍යාවල අරමුදල් ඌන උපයෝජිතව පැවතීම
- ඌන උපයෝජිත වත්කම්
- උපදේශන සේවා බාහිර පාර්ශවයකින් ලබා ගැනීම
- බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් අය විය යුතු මුදල් අයකරගෙන නොතිබීම
- සිසුන්ගෙන් අය කරගෙන ඇති මුදල් වලට අදාළ කාර්යයන් ඉටු නොකිරීම
- ආර්ථික නොවන ගනුදෙනු

උසස් අධ්‍යාපනය

රට තුළ ක්‍රියාත්මක අධ්‍යාපන ක්‍රමවේදයට අනුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් පසු උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසෙන දරුවන් නවීන තාක්ෂණ ලෝකයට ගැළපෙන බුද්ධිමතෙකු ලෙස සමාජයට මුදා හැරීමේ වගකීම මෙම අංශයට පැවරී ඇත. උසස් අධ්‍යාපනයට දේශීය මෙන්ම විදේශීය අධ්‍යාපන අවස්ථාවන් විවර කර දීම, එහි ගුණාත්මකභාවය ඉහල නැංවීම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය ඉහල නැංවීම, පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී අංශ සඳහා දායකත්වය ලබාදීම දක්වා උසස් අධ්‍යාපන අංශයේ කාර්යභාරය විහිදී යයි.

එසේම මෙම උසස් අධ්‍යාපන අවස්ථා ළඟාකර ගැනීම සඳහා උසස් අධ්‍යාපන අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඒ යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 39 ක් විසින් පහත කාර්යයන් ඉටු කල යුතුව තිබුණි.

- ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මගින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතන මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.
- උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම.
- එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම, නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරී සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා උසස් අධ්‍යාපන අංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පිළිවෙලින් රු.මිලියන 19,322 ක හා රු.මිලියන 62,395 ක ප්‍රතිපාදන 2021 වර්ෂය තුළ පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් පිළිවෙලින් රු.මිලියන 17,579 හා රු.මිලියන 59,038 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 40 හි දැක්වේ.



	උසස් අධ්‍යාපන අංශය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	එකතුව	
ප්‍රතිපාදන රු.මිලියන	19,322	62,395	81,717	
වියදම රු.මිලියන	17,597	59,038	76,635	
ඉතිරිය රු.මිලියන	1,743	3,357	5,100	

රූපසටහන 40 - ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ සිදුකළ නියදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාද

2021 අප්‍රේල් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත දැනට පවතින ජාතික සෞඛ්‍ය ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා සේවය ලබාගත හැකි වෛද්‍යවරු සංඛ්‍යාව ඉහළ නැංවීමේ අරමුණින් මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමට තීරණය කර තිබුණ ද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හඳුනාගත් පෞද්ගලික ඉඩම අත්පත් කර නොගැනීම හේතුවෙන් නව වෛද්‍ය පීඨයට අවශ්‍ය ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම හා ඉදිකිරීම ආදී කටයුතු ඉටුකර ගැනීම සඳහා කුවේට් අරමුදල සමඟ ගිවිසුම්ගත වීමේ කටයුතු ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මේ සඳහා වෙන් කර තිබූ රු.මිලියන 200 ක දේශීය ප්‍රතිපාදන ද උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

සෞදි රජය සමඟ අත්සන් කරන ලද ගිවිසුමක් මත රු.මිලියන 4,077 ක ව්‍යාපෘති අගයකට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් 24 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 31 වනවිට නිම කළ යුතුව තිබුණ ද ව්‍යාපෘති කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කිරීමෙන් අනතුරුව, 2024 මැයි 31 දින වැඩ නිම කළ යුතුව තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 168.66 ක

වියදමක් දරා ළඟාකර ගෙන තිබූ භෞතික ප්‍රගතිය සියයට 29 පමණක් විය.

රුහුණු විශ්වවිද්‍යාලයේ රු.මිලියන 1,180 ක ඇස්තමේන්තුවක් මත ඉදිකරගෙන යනු ලබන මහල් 12 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල 2017 ඔක්තෝබර් 30 දින ආරම්භ කර 2019 නොවැම්බර් 23 දින වනවිට නිමකල යුතුව තිබුණ ද කොන්ත්‍රාත්කාර පාර්ශවයේ සිදුව තිබූ ප්‍රමාදය මත 2019 දෙසැම්බර් 23 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර අත්තිකාරම් බැඳුම්කරය මුදල් කරන ලෙස බැංකුව වෙත දන්වා තිබුණ ද කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ රු.මිලියන 155.3 ක් වූ අත්තිකාරම් මුදල අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ රු.මිලියන 252.3 ක් වටිනා පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වර්ෂයකින් නිම කිරීමේ කොන්දේසිය මත 2019 ඔක්තෝබර් 02 දින ප්‍රදානය කර තිබුණි. 2019 නොවැම්බර් 18 දින රු.මිලියන 14.51 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ අනුව වසර 2 කට වඩා වැඩි කාලයක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත රජයේ මුදල් රඳවා තබාගැනීමට ඉඩකඩ සලසා තිබුණු අතර එම මුදල් නැවත අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

අධිකාරී බලය නොලත් ගනුදෙනු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී රු.350,000 ක මාසික කුලියකට ලබාගෙන තිබුණු වර්ග අඩි 3,337 කින් යුත් වෝඩ් පෙදෙසෙහි පිහිටි ගොඩනැගිල්ලේ කල්බදු ගිවිසුම අවලංගු කර වර්ග 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ලක් රු.950,000 ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා 2020 නොවැම්බර් 09 දින අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු.350,000 ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව රු.4,200,000 ක අමතර මුදලක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවීමට කටයුතු කර තිබුණි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන නිලධාරීන් 39 දෙනෙකු හා අනධ්‍යයන නිලධාරීන් 179 දෙනෙකු බඳවාගෙන 2021 වර්ෂය සඳහා රු.මිලියන 100.6 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි.

පශ්චාත් උපාධි පාඨමාලා අවලංගු කරගෙන තිබුණු ප්‍රදානලාභීන් වෙත ගෙවන ලද මුදල් නැවත අයකර නොගැනීම

2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ප්‍රදානලාභීන් 416 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 725.6 ක් ලබා දී තිබුණු නමුත් ඉන් ප්‍රදානලාභීන් 143 දෙනෙකු පශ්චාත් උපාධි හැදෑරීම අවලංගු කරවා ගෙන තිබුණි. පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම අවලංගු කර ගෙන තිබුණු කාර්යමණ්ඩල සාමාජිකයින් 14 දෙනෙකු තනතුරු අතහැර යාම හේතුවෙන් ඔවුන් වෙත රු.මිලියන 24.04 ක ප්‍රදාන ලබා දී වසර 05 සිට වසර 10 දක්වා කාලයක් ගත වී තිබුණු නමුත් නැවත අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දක්වාම අපොහොසත් වී තිබුණි.

විශ්වවිද්‍යාලවල සිසු පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම

2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු 192 සිට 220 අතර පරාසයක පුරප්පාඩු පැවතුණ ද එම පුරප්පාඩු වෙනුවෙන් නැවත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සිසුන් 798 කට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි.

පර්යේෂණ දීමනාලාභීන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම

රුහුණු විශ්වවිද්‍යාලයේ කරාපිටිය වෛද්‍ය පීඨයේ අධ්‍යනාංශ 17 ක අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 358 දෙනෙකු වෙත එකතුව රු.මිලියන 137.3 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණ ද පර්යේෂණ දීමනාලාභීන් විසින් පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු අන්තර් පර්යේෂණ වාර්තා ඉකුත් වර්ෂ 04 ක සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

විශ්වවිද්‍යාවල අරමුදල් ඌන උපයෝජිතව පැවතීම

මොරටුව විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.මිලියන 9.6 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 22 ක් වර්ෂ 03 ක සිට වර්ෂ 11 ක කාලපරිච්ඡේදයක් දක්වා උපයෝජනය කර නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට අක්‍රීය තත්ත්වයේ පැවති ශිෂ්‍යත්ව අරමුදල් 22 ක එකතුව වූ රු.මිලියන 3.4 ක් යොදාගෙන "සම්මාන හා ශිෂ්‍යත්ව" නමින් නව ගිණුමක් ආරම්භ කර රු.මිලියන 10 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් එම ගිණුමට මාරු කර තිබුණ ද ඊට අදාළ ශිෂ්‍යත්ව පිරිනැමීමේ නිර්ණායක හඳුනාගෙන නොතිබුණි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති පර්යේෂණ අරමුදල් 21 ක්, බාහිර පර්යේෂණ අරමුදල් 54 ක් සහ විශේෂ අරමුදල් 37 ක් වශයෙන් වූ අරමුදල් 112 ක එකතුව රු.මිලියන 633 ක්

සමාලෝචිත වර්ෂය තුළ අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

ඌන උපයෝජිත වත්කම්

දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ ඉදිකර ඇති නායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ නිම කිරීමට නියමිතව තිබූ මහල් 05 කින් මහල් 03 ක් පමණක් රු.මිලියන 113.8 ක වියදමින් නිමකර 2017 පෙබරවාරි 21 දින ආයතනයට භාර දී තිබුණ ද ඉතිරි මහල් දෙකේ වැඩ නිම නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල 2021 දෙසැම්බර් 31 දක්වාම නිශ්කාර්යව පැවතුණි.

උපදේශන සේවා බාහිර පාර්ශවයකින් ලබා ගැනීම

මොරටුව විශ්වවිද්‍යාලය විසින් පරිබාහිර පාර්ශවයන් වෙත සපයන ලද ඉංජිනේරු උපදේශන සේවා තුළින් රු.මිලියන 292.6 ක ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ උපයා තිබුණ ද විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කරගෙන යනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 7.4 ක් සමාලෝචිත වර්ෂය තුළ ද වැය කර තිබුණි.

බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් අය විය යුතු මුදල් අයකරගෙන නොතිබීම

මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 36 දෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.මිලියන 55.3 ක් වූ බැඳුම්කර මුදල තුළ වසර 25 ක් ඉක්මවා තිබුණු ආචාර්යවරු 09 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 5.8 ක් පැවතුණි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් 41 දෙනෙකු නැවත සේවයට වාර්තාකර නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.මිලියන 117.3 ක බැඳුම්කර මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි 1989 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරින් 31 දෙනෙකු ආපසු සේවයට වාර්තා නොකිරීම නිසා අයකර ගත යුතු රු.මිලියන 71.4 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගැනීමට අපොහොසත් වී තිබූ අතර මේ තුළ 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 11 දෙනෙකුගෙන් ගිවිසුම් කඩකල දින සිට අයවිය යුතු එකතුව රු.මිලියන 19.9 ක් හා නිලධාරීන් 09 දෙනෙකුගෙන් 2017 වර්ෂයේ සිට අයවිය යුතු එකතුව රු.මිලියන 9.8 ක මුදලක් පැවතුණි.

සිසුන්ගෙන් අය කරගෙන ඇති මුදල් වලට අදාළ කාර්යයන් ඉටු නොකිරීම

2020 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ පාඨමාලා, සම්මන්ත්‍රණ හා විභාග පැවැත්වීම සඳහා සිසුන්ගෙන් රු.මිලියන 115.2 ක් අයකර තිබුණු නමුත් අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි.

ආර්ථික නොවන ගනුදෙනු

දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ විදුලි වියදම් අවම කර ගැනීමේ අරමුණින් රු.මිලියන 19.8 ක් වැයකර සූර්ය බල ශක්ති පද්ධතියක් ස්ථාපිත කර, 2019 ජුනි 07 දින වැඩ නිම කර තිබුණ ද පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තොග විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට ආයතනය අපොහොසත් වී තිබීම හේතුවෙන් 2019 ජුනි සිට 2021 දෙසැම්බර් දක්වා ආයතනය විදුලිය වෙනුවෙන් දරා ඇති රු.මිලියන 3.4 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය

විගණන නිරීක්ෂණ

- පාඨමාලා සඳහා සිසු සහභාගිත්වය අඩුවීම
- වෘත්තීය පුහුණු වැඩසටහන්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම
- ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය යෝජනා ක්‍රමය ප්‍රමණවත් ලෙස ක්‍රියාත්මක නොකිරීම
- අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම
- ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්
- මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති
- නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්
- නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
- නිපුණතා සම්මත යාවත්කාලීන නොකිරීම
- ආධුනිකයන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයේදී සිදු වී ඇති අක්‍රමිකතා
- අනාර්ථික ගනුදෙනු
- කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
- අරමුදල් ඌන උපයෝජනය

නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය

නිපුණත්වයෙන් හෙබි ශ්‍රම බලකායක් යන දැක්ම ඇතිව ගුණාත්මකභාවයෙන් පිරි වෘත්තීය පුහුණුවක් ලබාදීම තුලින් වැඩ ලෝකයට අවශ්‍ය මානව සම්පත් පදනමක් ගොඩනැංවීමේ මෙහෙවර පෙරදැරිව "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව 2021 – 2030 නිපුණතා සංවර්ධන දශකය ඇරඹීම තුලින් තාක්ෂණය පදනම් කරගත් සමාජයක් නිර්මාණය කිරීම උදෙසා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපනය, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ආයතන 18 ක් හා එක් දෙපාර්තමේන්තුවක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකල යුතුව තිබුණි.

- අධ්‍යාපන සුදුසුකම් නොසලකා තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය ලබාදීම.
- සියළුම වෘත්තීය පුහුණු ආයතන ඇගයීමට ලක්කරමින් "One TVET" සංකල්පය යටතේ සියළුම වෘත්තීය පුහුණු ආයතන ජාලගත කිරීම.
- ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය පුළුල් කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 7 කින් යුත් වර්තමාන ක්‍රමය මට්ටම් 10 දක්වා වැඩි කිරීම.
- පශ්චාත් උපාධි මට්ටම දක්වා වෘත්තීය අධ්‍යාපනය හැදෑරීමට අධ්‍යාපන අවස්ථා ලබාදීම.
- තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ වෙනත් භාෂා ඇතුළත් කරමින් මෘදු කුසලතා සංවර්ධනය සඳහා විෂයමාලා සංශෝධනය කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොල කෙරෙහි අවධානය යොමු කරන වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීමට පියවර ගැනීම.
- තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වය ස්ථාපිත කිරීම.
- පුරවර විශ්වවිද්‍යාල පිහිටුවීම.
- අන්තර්ජාලය, කෘත්‍රිම බුද්ධිය, ජෛව තාක්ෂණය, රොබෝ විද්‍යාව, Augmented Reality, Cloud Computing, නැනෝ තාක්ෂණය සහ ත්‍රිමාණ මුද්‍රණ භාවිතය උපරිම කිරීම මඟින් ශ්‍රී ලංකාව නවෝත්පාදන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීම.
- පර්යේෂකයින්ගේ නවෝත්පාදන සහ පර්යේෂණ සඳහා පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීම සහ එම පර්යේෂණ සැලසුම් සඳහා හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා වන පද්ධතිය කාර්යක්ෂම කිරීම.
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.
- පර්යේෂණ සඳහා දායකවන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබාදීම.
- නවෝත්පාදන නිෂ්පාදන දේශීය වෙළඳ නාමයක් යටතේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය

දේශීය හෝ විදේශීය ආයෝජකයින් හඳුන්වාදීම.

- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ආයෝජකයින්ට සහ අදාළ පරිශීලකයින්ට ලබාදීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.

මෙම අමාත්‍යාංශයේ ඉහත කාර්යයභාරය ඉටුකරගනු ලැබීම සඳහා 2021 වර්ෂයේදී වෙන්කරන ලද ප්‍රතිපාදනය රු. මිලියන 13,978.1 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 10,534.4 ක් උපයෝජනය කර තිබූ නමුත් රු. මිලියන 3,442.7 ක් හෙවත් සියයට 23 ක් උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 41 හි දැක්වේ.



	නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	11,048	2,930.10	13,978.10
වියදම රු.මිලියන	8,448	2,086.40	10,534.40
ඉතිරිය රු.මිලියන	2,599	843.7	3,442.70

රූපසටහන 41 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

පාඨමාලා සඳහා සිසු සහභාගිත්වය අඩුවීම

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පසුගිය වසර 05 ක කාලය තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඉල්ලුම වාර්ෂිකව ඉහළ මට්ටමක පැවතියද වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව පාඨමාලා සඳහා බඳවා ගැනීම්

ඉහළ දැමීමට කළමනාකරණය විසින් කටයුතු නොකර සියයට 20 ක් එනම් වාර්ෂිකව 600 ක් වැනි ස්ථාවර අගයකට සිසුන් අවම සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. එසේම ප්‍රාදේශීය මධ්‍යස්ථාන 3 හිද බඳවාගනු ලබන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට හා පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව වැඩි කිරීමට අවධානය යොමු කර නොතිබුණි. එම නිසා උසස් පෙළ විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වූ සිසුන්ට රැකියා සඳහා වෘත්තීය පුහුණුව ලබා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී තිබුණි.

වෘත්තීය පුහුණු වැඩසටහන්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම

- වෘත්තීය පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අදාළව ප්‍රමාණවත් පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා ගැනීම හා ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා විෂය ක්ෂේත්‍රයට අදාළව ප්‍රමාණවත් පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට අවස්ථාව ලබාදීම කල යුතු වුවද, පළපුරුදු උපදේශක හිඟය හා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් නොමැතිවීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

- අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථානවල ඇතැම් පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය අඩු බැවින්, සිසුන් වෙනුවෙන් දරනු ලබන පොදුකාර්ය හා දේශන පිරිවැය ගණනය කිරීමේදී එක් සිසුවෙකු වෙනුවෙන් විශාල පිරිවැයක් රජය දරන බව නිරීක්ෂණය විය.

ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය යෝජනා ක්‍රමය ප්‍රමණවත් ලෙස ක්‍රියාත්මක නොකිරීම

- අදියර 02 ක් යටතේ ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ 2020 වර්ෂයේ කිසිදු ණය ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචි කර නොතිබියදී, සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 90 ක් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසා තිබුණි. නිසි ණය මුදල් සැලසුමක් නොමැති වීම හා ඉලක්කගත ප්‍රතිලාභීන් ගණන තීරණය කර නොතිබීම හේතුවෙන් වෙන්කරන ලද මුදලින් රු.මිලියන 80 ක් එනම් සියයට 89 ක් වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණි. වර්ෂය තුළදී ණයලාභීන් තිදෙනෙක් පමණක් ලියාපදිංචි කර ඔවුන් වෙත රු. ලක්ෂ 05 බැගින් රු. මිලියන 1.5 ක් බෙදා දී තිබුණි.

- ණය ගිවිසුම ප්‍රකාරව ස්වයං රැකියා ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික උපකරණ හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ණය ලබාදිය හැකි වුවද, සියයට 38 කට ආසන්න පිරිසක් ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා ණය ලබාගෙන තිබුණද, සියයට 14 කට ආසන්න ප්‍රතිශතයක් අදාළ ණය මුදල් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ මැදිහත්වීම හා පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව විගණනයේදී අනාවරණය විය.

අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

- 2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට් පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනාගන්නා ලද නගර විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, වර්ෂය අවසන් වන විට රු. මිලියන 6.11 ක් වැය කර නගර විශ්වවිද්‍යාල 03 ක පමණක් මූලික ඉදිකිරීම් හා ඉඩම් පවරාගැනීම් කටයුතු ආරම්භ කර තිබුණි.

- වෘත්තීය අධ්‍යාපනයට යොමුවන ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණ කරමින් තරුණ ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගෙන වෘත්තීය පුහුණුවේ යෙදෙන සිසුන් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය යොජනා යටතේ රු. මිලියන 500 ක ප්‍රතිපාදන වලින් සිසුන් 55,000 කට ශිෂ්‍යාධාර ලබාදීමට ඉලක්ක කර තිබුණද වර්ෂය අවසන් වන විට සිසුන් 26,730 කට රු. මිලියන 142.4 ක් පමණක් ශිෂ්‍යාධාර ලෙස ලබාදී තිබුණි.

- ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 756 කට ආංශික නිපුණතා සංවර්ධන අරමුදල මඟින් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා මහල් 06 කින් යුත් නේවාසිකාගාරයක් අත්තිඩිය ප්‍රදේශයේ 2018 වර්ෂයේ ආරම්භ කර 2020 ඔක්තෝබර් 25 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉදිකිරීම සඳහා රු.මිලියන 559.7 ක් වැය කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 75 ක් පමණ විය.

ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

- 2017 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රු. මිලියන 434 ක පිරිවැයක් දරමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2019 වර්ෂයේදී උපදේශාත්මක සේවා ලබා ගැනීම හා කාර්යමණ්ඩල නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 8.9 ක් වැයකර තිබුණද, විද්‍යායතනය ඉදි නොකිරීම හේතුවෙන් ඉදිකරන ලද නේවාසිකාගාරය 2021 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

- කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක පිරිවැයක් යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී ලැබී තිබූ අනුමැතිය මත 2018 වර්ෂයේදී උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු. මිලියන 6 ක් වැයකර තිබුණි. එහෙත් 2022 ජූනි 30 දක්වා ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැය කරන ලද මුදල් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

- 2017 වසරේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව 2018 වර්ෂයේ ආරම්භ කර එම

වර්ෂය අවසාන වන විට නිම කිරීමේ අරමුණ ඇතිව රු. මිලියන 80 ක් පිරිවැය වූ සමාජයීය නවෝත්පාදන පරීක්ෂණාගාරයක් (Social Innovation Lab) ආරම්භ කිරීමේ යෝජනාව ඉදිරිපත් වී තිබුණි. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් හා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) අධ්‍යක්ෂ විසින් එකඟතාවයට පැමිණ අත්සන් තබා තිබුණු අතර එහි මෙහෙයුම් කටයුතු සඳහා 2017 සිට 2018 වර්ෂය දක්වා රු. මිලියන 35 ක් වැයකර තිබුණද, එම වියදමට අදාළ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව වැයකරන ලද රු. මිලියන 35 නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී අනාවරණය විය.

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පන්තිකාමර, දේශනශාලා සහ විද්‍යාගාර පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් මට්ටක්කුලිය ප්‍රධාන කාර්යාලය තුළ පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී අයවැය යෝජනා යටතේ ලබා දී තිබූ රු. මිලියන 300 ක අතිරේක ප්‍රතිපාදනෙන් වර්ෂය තුළදී ඇස්තමේන්තු සකස් කිරීම හා පාංශු පරීක්ෂාව සඳහා රු. මිලියන 6.5 ක් වැයකර තිබුණද 2021 වර්ෂය අවසානය වන විටත් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කර නොමැති වීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට බාහිර පාර්ශවයකින් ගොඩනැගිල්ලක් කුලියට ගෙන 2021 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 96.4 ක් ගොඩනැගිලි කුලී ලෙසත් ජලය විදුලිය හා අනෙකුත් වියදම් ලෙස රු. මිලියන 13.5 ක් ද ඇතුළුව එකතුව රු. මිලියන 109.9 ක වියදමක් දරා තිබුණි.

මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

- 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරන කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද 2021 වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු මාස 24 ක් තුළ නිම කිරීම සඳහා රු. මිලියන 2,819.71 ක් ඇස්තමේන්තුගත කර තිබුණද ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

- විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන හරහා 2030 වසරේදී සංවර්ධිත දේශයක් බවට පත් කිරීම දැක්ම කරගත් පර්යේෂණ හා නව නිපැයුම් අංශයට අදාළව සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් ව්‍යාපෘති 05 ක් සඳහා රු. මිලියන 80 ක් වෙන් කරවා තිබුණද ඉන් වැයකර තිබුණේ රු. මිලියන 7.68 ක් පමණක් වන අතර එය වෙන් කරන ලද මුදලින් සියයට 9.6 කි.

නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

- වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පවතින ඔරුගොඩවත්ත කොරියන් ටෙක් ආයතනය වෙත කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය ඉදිකිරීමේ කොරියානු ණය ව්‍යාපෘතියෙන් 2019 වර්ෂයේදී ලබාදී තිබුණු එකතුව රු. මිලියන 15.7 ක උපකරණ 157 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණු අතර එකතුව රු. මිලියන 1.8 ක් වටිනා උපකරණ 07 ක් අක්‍රිය වී පැවතුණි. එසේම එම ආයතනයට වෛද්‍ය හෝ හෙද තනතුරු අනුමත වී නොතිබියදී රු. මිලියන 3.5ක වටිනාකමැති වෛද්‍යවරුන් විසින් භාවිතයට ගනු ලබන වෛද්‍ය උපකරණ හා ඖෂධ ලබාදී තිබු අතර එම ඖෂධ වර්ග භාවිතයකින් තොරව කල් ඉකුත් වි තිබුණි.

- නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමේ අරමුණින් 2017 හා 2018 වර්ෂ තුළදී දීර්ඝකාලීන බදු පදනම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත එකතුව රු. මිලියන 43.3 ක් ගෙවීම් කර ලබාගෙන තිබුණු ඉඩම් 02 ක් අදාළ අරමුණු සඳහා යොදා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

- අහංගම පැවති හෝටල් පාසැල, පූර්ව ශක්‍යතා අධ්‍යනයකින් තොරව සංචාරක හෝටලයක් බවට පත්කිරීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත නිපුණතා ආංශික සංවර්ධන අරමුදල් යටතේ රු.මිලියන 124.7 ක් වැයකර 2016 හා 2018 කාල පරිච්ඡේදය තුළ නවීකරණ කටයුතු සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 37.6 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණි. එසේ වුවද අදාළ අරමුණු සඳහා භාවිතා කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.

- පොතුවිල් හා කරෙයිනගර් හෝටල් පාසල් 02 ක අරක්කැමි පාඨමාලාව සඳහා එකතුව රු. මිලියන 14.9 ක පුහුණු උපකරණ මිලදීගෙන තිබුණද එම පාඨමාලා ආරම්භ කිරීමට පියවර නොගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් දක්වාම එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

- ආධුනිකයන් සඳහා නවාතැන් පහසුකම් ලබාදීමේ අරමුණින් ජාතික පුහුණු මධ්‍යස්ථානයක කාමර 16 ක්, හෝටල් පාසැල් 02 ක්, දෙමහල් ගොඩනැගිලි 02 ක ඉදිකර තිබුණු කාමර 12 ක නේවාසිකාගාර ආරම්භ කිරීම සඳහා, නේවාසිකාගාර පාලක පාලිකා තනතුරු හා අනෙකුත් උපකාරක තනතුරු සඳහා බඳවා ගැනීම් කර නොතිබීම සහ ජල පහසුකම් ලබාදී නොතිබීම නිසා එම ගොඩනැගිලි හා උපකරණ 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

- උපයෝජනය කිරීමේ මූලික සැලසුම් සකස් කිරීමකින් තොරව හා වෘත්තීය පුහුණු අධිකාරියේ අරමුණට පටහැනි ලෙස අම්පාර හා යාපනය දිස්ත්‍රික්කවල එකතුව රු. මිලියන 91 ක් වැයකර සංචාරකයින් සඳහා ලබාදීමේ අරමුණින් ඉදිකර තිබුණු හොටල් කාමර 22 ක් හා මිලදීගෙන තිබුණු රු. මිලියන 6.1 ක ගෘහ උපකරණ 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

- කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ආධුනිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන ලීබඩු අලෙවි කිරීමේ අරමුණින් 2014 හා 2016 කාලපරිච්ඡේදය තුළ රු. 18.8 ක් වැයකර ආයතන භූමියේ ප්‍රදර්ශනාගාරයක් ඉදිකර තිබුණද එම ගොඩනැගිල්ල වර්තමානය දක්වාම භාවිතයකින් තොරව නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

- ඔරුගොඩවත්ත මෝටර්රථ කාර්මික ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ රු. මිලියන 9.1 ක් වැයකර 2019 දෙසැම්බර් මාසයේ ඉදිකිරීම් නිමකර තිබුණු ශිෂ්‍ය නේවාසිකාගාරය හා කාර්යමණ්ඩල නේවාසිකාගාරයත් ඒ සඳහා මිලදී ගෙන තිබූ උපකරණත් 2021 වර්ෂය අවසානය දක්වාම කිසිඳු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

- The Asia Foundation ආයතනයෙන් 2019 ඔක්තෝබර් 29 දින ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබුණු රු. මිලියන 1.1 ක් වටිනා පුස්තකාල පොත් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 11 දින වන විටත් පුස්තකාල වෙත නිකුත් කිරීමෙන් තොරව ගබඩාවේ තබා තිබුණි.

- නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය විසින් භෞතීය නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදා හැරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් සඳහා චීන නියෝජිත ආයතනයක් සමඟ 2013 වසරේ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද 2022 වසර වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබූ තලගල ප්‍රදේශයේ පිහිටි අක්කර 12 ක භූමිය 2019 වර්ෂයේ සිට ඌණ උපයෝජිතව පැවතුණි.

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේශණ හා කැණීම් කටයුතු සඳහා ඡායා පිටපත් ලබාගැනීමේ අරමුණින් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය විසින් රු. මිලියන 10.7 ක් වැයකර නියමුවන් රහිත යානයක් 2016 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණද විගණිත දිනය වූ 2022 මැයි 25 දින වන විටත් අදාළ යානය භාවිතයට ගෙන නොතිබුණි.

- ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2021 වර්ෂය තුළදී පරිගණක ඇතුළු උපාංග මිලදී ගැනීමට රු.මිලියන 4.52 ක් වැය කර තිබුණි. මධ්‍යස්ථානයේ දැනට සිටින නිලධාරි සංඛ්‍යාව 143 ක් වුවත් ආයතනය සතු භාවිතයට ගත හැකි පරිගණක (Desktop, Laptop, Notebook, Tablet) 222 ක් වූයෙන් පරිගණක අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව ඉක්මවා පරිගණක යන්ත්‍ර 79 ක් නිෂ්කාර්යව මිලටගෙන ඇති බව නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

- 2020 ජනවාරි 27 දිනැති අංක PED/ 2020 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව, නව සභාපතිවරුන් පත්කිරීමේදී කිසිදු නව බඳවාගැනීමක් සිදු නොකල යුතු බව දන්වා තිබියදී වෘත්තීය පුහුණු අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය තුළ නොමැති උපදේශක තනතුරු දෙකක් සඳහා බඳවාගැනීම් සිදුකර 2021 වර්ෂය තුළ දීමනා හා ඉන්ධන දීමනා ලෙස එකතුව රු. මිලියන 1.7 ක් ගෙවීම් කර තිබුණි.
- භාණ්ඩාගාර ලේකම්ගේ 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව දැනට ලබන වැටුපට අතිරේකව චක්‍රලේඛයෙන් අනුමත දීමනාවන් හැර වෙනත් කිසිදු විශේෂ දීමනාවක් නොලබන නිලධරයන් සඳහා පමණක් 2017 ඔක්තෝබර් 01 දින සිට වෘත්තීය දීමනාවක් ගෙවිය හැකි වුවත් මූලික වැටුපෙන් 1/3 දීමනාවක් ලබා ගන්නා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරීන් 9 දෙනෙකු සඳහා සහ වෘත්තීය පුහුණු අධිකාරියේ නිලධාරීන් 8 දෙනෙකු සඳහා පිළිවෙලින් 2018 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා එකතුව රු.මිලියන 2.7 ක් හා 2017 ඔක්තෝබර් සිට 2021 දෙසැම්බර් දක්වා එකතුව රු. මිලියන 1.7 ක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි.

නිපුණතා සම්මත යාවත්කාලීන නොකිරීම

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 2 වගන්තිය හා 17 වගන්තිය හා ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු සුදුසුකම් රාමුව සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි (Nation Vocational Qualification Frame Work of Sri Lanka, Operation Manual – 2009) 3.1.7 වගන්තිය අනුව වර්ෂ 03 කට වරක් නිපුණතා සම්මත යාවත්කාලීන කලයුතු අතර වේගයෙන් වෙනස් වන තාක්ෂණික ක්ෂේත්‍රයන් සඳහා ඊට වඩා අඩු කාලයක් තුළ යාවත්කාලීන කිරීම් සිදුකල යුතු වුවත් ක්ෂේත්‍ර 11 කට අදාළ නිපුණතා සම්මත හා පාඩම්මාලා වසර 01 සිට වසර 10 දක්වා කාලයක සිට යාවත්කාලීන කර නොතිබුණි.

ආධුනිකයන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයේදී සිදු වී ඇති අක්‍රමිකතා

- ඔරුගොඩවත්ත මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 2020 වර්ෂය සඳහා පූර්ණකාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවාගැනීමේ විවෘත තරඟ

විභාගයේදී විභාග ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු සටහන් පත්‍ර මුද්‍රණය කිරීම, විභාග පැවැත්වීම, පිළිතුරු පත්‍ර පරීක්ෂා කර ලකුණු ලබාදීම හා ආධුනිකයින් තෝරා ගැනීමේ කටයුතු විනිවිදභාවයෙන් තොරව වංචනික අයුරින් සිදුකිරිම හේතුවෙන් සුදුසුකම් ලබා තිබුණු ආධුනිකයින් 30 දෙනෙකු සිටියදී සුදුසුකම් නොලැබූ ආධුනිකයින් 20 දෙනෙකු තෝරාගෙන තිබුණි. මෙම කරුණු පෙන්වා දී වසර 1 කුත් මාස 09 ක් ගත වී තිබුණද විනිවිදභාවයෙන් තොරව අක්‍රමිකතා සිදුකල නිලධාරීන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක්ම කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- කාර්මික තාක්ෂණ ආයතනයේ විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරින් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 17 ක් වූ මුදල 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

- ඖෂධ පරීක්ෂණ රසායනාගාර සේවාවන් ලබාගැනීම සඳහා විදේශ රටවලට විශාල ගාස්තුවක් වැය කිරීමට සිදුවීම වැළැක්වීම සඳහා රු. මිලියන 99 ක් වැයකර කාර්මික තාක්ෂණ ආයතනය තුළ ඖෂධ රසායනාගාරයක් පිහිටුවා තිබුණද විදේශ රටවලින් සිදුකර ගනු ලබන පරීක්ෂණ කටයුතු මෙම රසායනාගාරයෙන් සිදුකර ගැනීමට යොමු නොවීම නිසා රසායනාගාරය පිහිටුවීමේ අරමුණ ඉටුනොවීම හේතුවෙන් පරීක්ෂණ මත විදේශ විනිමය වැයවීම වළක්වා ගැනීමට නොහැකිවී තිබුණි.

- ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් නැනෝ පොහොර සංවර්ධන තාක්ෂණය පැවරීම් සඳහා 2012 මාර්තු 15 වැනි දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ ඇත.එහිදී තාක්ෂණික හුවමාරුවේ මුළු වටිනාකම ඇමරිකානු ඩොලර් 2,250,000 ක් වූ අතර එය වාරික හතරකින් ආපසු අයකර ගැනිමට නියමිතව පැවතුණි. 2013 ජුනි 30 වන දින ඇමරිකානු ඩොලර් 750,000 ක මුදලකට ඉන්වොයිසිය නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය ආපසු අයකරගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් වාරික මුදල වූ ඇමරිකානු ඩොලර් 500,000 ක් සඳහා ඉන්වොයිසිය නිකුත් කර නොතිබුණි.

- ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ සහ ඉකුත් වර්ෂය තුළ පර්යේෂණ හා සංවර්ධන පිරිවැය ලෙස පිළිවෙළින් රු.මිලියන 182.9 ක් සහ රු.මිලියන 155.6 ක් වැය කර ඇතත් පර්යේෂණ මඟින් සොයාගන්නා ලද ජාතික වැදගත්කමකින් යුත් නව නිපැයුම් සඳහා වෙළඳපොළක් නිර්මාණය කිරීමට සමාගම අසමත් වී තිබුණි.

- සාගර විශ්ව විද්‍යාලය විසින් නොමිලේ පවත්වාගෙන යන උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ ප්‍රවර්ධන කටයුතු අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මධ්‍යස්ථාන 8 ක් සඳහා 2018, 2019 හා 2020 වර්ෂ වලදී ලියාපදිංචි කරගෙන තිබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 569, 787 හා 695 ක් විය. ඒ අනුව 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ඒකක ශිෂ්‍ය පිරිවැය පිළිවෙලින් රු.මිලියන 0.7, රු. මිලියන 0.6 ක් හා රු.මිලියන 0.7 ක් වශයෙන් දරා තිබුණි.

අනාර්ථික ගනුදෙනු

- ජාතික පර්යේෂණ සභාවේ ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ වසර 05 කින් නිම කළයුතු වුවද 2014 වර්ෂයේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ට කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීමේ පර්යේෂණය වසර 07 ක් ඉක්මවා තිබුණ ද 2021 දෙසැම්බර් 31 දක්වාම නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

- කිරි නිෂ්පාදනය අතින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කිරීම සඳහා වූ පර්යේෂණය රු. මිලියන 41.7 ක් වැයකර 2020 වර්ෂයේ නිමකර තිබුණ ද, පර්යේෂණය මඟින් හඳුනාගත් තාක්ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමක් ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකර නොතිබුණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟාවීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි.

- ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා වූ පරීක්ෂණය ක්ෂේත්‍ර භෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට ලබාදී තිබූ අතර පර්යේෂණයෙන් වැඩිදියුණු කළ වී, බඩඉරිඟු, මුං ඇට හා අමු මිරිස් ප්‍රභේද පිළිබඳ ප්‍රතිඵලය සමාජගත කිරීම හා එහි ප්‍රගතිය ජාතික පර්යේෂණ සභාව වෙත ලබාගැනීම, ඇගයීම හා පසුවිපරම් කිරීම සිදුවී නොතිබුණි.

කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පීඨ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු. මිලියන 14.5 ක මුදලකට 2016 සැප්තැම්බර් 10 වන දින පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර 2019 සැප්තැම්බර් 12 වන දින රු. මිලියන 2.9 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 22 වන විට නිම කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ කාර්යය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර රජයේ මුදල් වසර 2 කට වැඩි කාලයක් බාහිර පාර්ශවයක් වෙත අත රඳවා තිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලබාගෙන තිබූ

කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය 2021 ජුනි 19 දින ඉකුත් වී ඇති අතර එය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

අරමුදල් ඌන උපයෝජනය

ජාතික පර්යේෂණ සභාව විසින් වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් වැය වන ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ සඳහා ඇස්තමේන්තුගත වියදම් සිදුවන කාල රාමු හඳුනාගැනීම හා ඒ අනුව අග්‍රිම අවශ්‍යතා සැලසුම් සකස් කර ප්‍රදාන ලබාගෙන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට අවුරුදු 03 සිට අවුරුදු 07 දක්වා කාල පරාසය තුළ (පර්යේෂණ 05 කට අදාළ) එකතුව රු.මිලියන 64.30 ක් උපයෝජනය නොකර ජංගම ගිණුම්වල පැවතුණි.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු

විගණන නිරීක්ෂණ

- ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්
- කළමනාකරණ දුර්වලතා
- නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
- අවිධිමත් ගනුදෙනු
- පාඩු හා හානි
- සැලැසුම් කිරීම
- ප්‍රසම්පාදනයන්
- ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්
- කාර්යයසාධනය
- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය
- කාර්යභාරයන් ඉටු නොකිරීම

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු 08 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන 11 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථානවලට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා "සසුන් උදාව" ජාතික වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.
- ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීති අණපනත් සුදුසු පරිදි සංශෝධනය කිරීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කොට එය සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය පදනම සකස් කිරීම.
- ජනාධිපති කාර්යසාධක බලකාය හා ඒකාබද්ධ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය හා නීතිමය පසුබිම සකස් කිරීම.
- සියළුම ආගම්වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම.
- ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පවතින ආයතනවල ඵලදායිතාව ඉහළ දැමීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම.
- දේශීයත්වය මුල්කරගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
- අංග සම්පූර්ණ " නාට්‍ය නිකේතනයක්" ස්ථාපිත කිරීම හා කලාකරුවන්ගේ වෘත්තීය සුරක්ෂිතාවය තහවුරු කෙරෙන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකැසීම.
- කලාත්මක නිර්මාණ සංස්කරණය සහ ප්‍රදර්ශනනය සඳහා විශේෂිත පහසුකම් සැලැසීම.
- සම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කර ගැනීමේ සංචාරක හෝටල් සහ සංචාරක ආරක්ෂණ සහිත ස්ථානවල ඉඩකඩ ලබාදීමේ වැඩපිළිවෙලවල් සංචාරක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.
- නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමණාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමඟ සම්බන්ධීකරණය.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 08 ක් වෙත එකතුව රු.මිලියන 9,263 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 7,014 ක් පමණක් උපයෝජනය

කර තිබුණි. ඒ අනුව රු.මිලියන 2,249 ක ප්‍රතිපාදන උපයෝජන නොකර ඉතිරි කර තිබුණි. විස්තර රූපසටහන 42 හි දැක්වේ.



	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ජාතික උරුමය, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය (රු. මිලියන)	2,238	604	1,566	196	279	318	1,656	482	409	1,515	9,263
වියදම (රු. මිලියන)	1,690	350	1,466	155	202	270	1,115	375	270	1,121	7,014
ඉතිරිය (රු. මිලියන)	548	254	100	41	77	48	541	107	139	394	2,249

රූපසටහන 42 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම
මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

- සීමිත මිල ගණන් කැඳවීමෙන්, ICTAD ලියාපදිංචිය පවතීද යන්න තහවුරු කර ගැනීමෙන් සහ ඊට අවශ්‍ය සම්පත් හා කාර්යමණ්ඩලය කොන්ත්‍රාත්කරු සතුව පවතීද යන්න සලකා බැලීමෙන් තොරව පිළිවෙලින් රු.මිලියන 14.66 ක් රු. මිලියන 19.99 ක් හා රු. මිලියන 11.08 ක් වූ මාවතගම, බමුණාකොටුව හා පොල්ගහවෙල යන සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම් සංස්කෘතික

සංරක්ෂණ හා ඉදිකිරීම් පුද්ගලික සමාගමට පවරා තිබූ අතර පිළිවෙලින් 2016 දෙසැම්බර් 25, 2016 දෙසැම්බර් 23 හා 2017 ජනවාරි 03 යන දිනවල නිමකල යුතු අදාළ ඉදිකිරීම් 2021 දෙසැම්බර් වන විටද නිම කර භාර දී නොතිබුණි.

- හම්බන්තොට කෞතුකාගාරයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 22.51 ක ව්‍යාපෘතියකට 2015 නොවැම්බර් 30 දින ගිවිසුමකට එළඹී තිබුණි. 2016 අප්‍රේල් 30 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 18.09 ක් ගෙවීම් කර තිබූ අතර, පවතින අඩුපාඩු සකසා දීමේ එකඟතාවය මත මෙම ගොඩනැගිල්ල භාරගෙන තිබුණද, එම අඩුපාඩු 2021 දෙසැම්බර් 31 දක්වා සම්පූර්ණ කරගෙන නොතිබුණි.

- 2021 අගෝස්තු 04 දින රු.මිලියන 98.55 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කරන ලද ජාතික කෞතුකාගාරයේ පුස්තකාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 ජනවාරි 31 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. 2022 මාර්තු මස වන විට කාර්යය අවසන් කිරීමේ කාලය අවසන් වී මාස 02 ක් ගතවී තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 23.43 ක් ගෙවීම් කර තිබූ එම ව්‍යාපෘතියේ භෞතික කාර්යය සාධනය සියයට 35 ක් විය.

කළමනාකරණ දුර්වලතා

- වෙසක් උත්සවය පැවැත්වීමට සැලසුම් කර තිබූ යාපනය දිස්ත්‍රික්කයේ විහාරස්ථානවලට අදාළව සිදුකරන ලද ප්‍රතිසංස්කරණ සඳහා වෙන් කර තිබූ මුදලින් රු. මිලියන 4.5 ක් වැය කර ප්‍රතිසංස්කරණය කරන ලද නාගදීප විහාරස්ථානයේ විහාර මන්දිරයේ සහ රු.මිලියන 2.77 ක් වැය කර ඉදිකර තිබූ විදේශීය සහ දේශීය බැතිමතුන් වෙනුවෙන් වූ වැසිකිළි පද්ධතියේ ජල කාන්දුවීම් තවදුරටත් පැවතුණි.

  තවද, පැවැත්වීමට සැලසුම්කර තිබූ රාජ්‍ය වෙසක් උත්සවය කොවිඩ් මර්ධන මාර්ගෝපදේශ අනුව අවලංගු කර තිබුණද වෙසක් උත්සවය වෙනුවෙන් තාවකාලික තොරණක් ඉදිකිරීම සහ වේදිකාවක් සකස් කිරීම සඳහා අවශ්‍ය රෙදි ආවරණ (canopy) සඳහා නාවික හමුදාව වෙත ගෙවා තිබූ එකතුව රු.මිලියන 1.49 ක මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේදී සිදුව තිබූ අපහසුතා හා ගැටළු මඟහරවා ගැනීම පිණිස අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම 2008 නොවැම්බර් 17 දින ලියාපදිංචි කර තිබුණද සමාගම විසින් 2009 සිට 2010 කාලසීමාව තුළ

භාරගන්නා ලද අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල ඉදිකිරීම්, සියයට 5 ක පමණ ආන්තිකයක් තබා ගෙන උප කොන්ත්‍රාත්කරුවන්ට පවරා ඉටුකරවා ගැනීම තුළ එම අපහසුතා හා ගැටළු තවදුරටත් පැවතුණි.

තවද, අමාත්‍යාංශයේ පූර්ණ හිමිකාරිත්වය සතු මෙම සමාගමේ 2018/2019, 2019/2020 හා 2020/2021 යන මූල්‍ය වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර වර්තමානයේ සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති සමාගම ඈවර කිරීමට 2021 ජූලි 05 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙතින් ඉල්ලා ඇතත් ඈවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දිනය වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

- 2020 ජනවාරි 09 දිනැති අංක SA/AMP/Deposit/Transfer දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව නෙළුම් පොකුණ රඟහල වෙනම ව්‍යාපෘතියක් ලෙස සලකා, එය නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අයවැය මගින් සලසා ගැනීමටත් උපයන ලද ආදායම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා සුදුසු ආදායම් ශීර්ෂයකට බැර කිරීමටත් විගණිත දින දක්වා කටයුතු කර නොතිබූ අතර අංක 6000-0-0-020-009-0 දරන තැන්පත් ගිණුම මගින් ගණුදෙනු මෙහෙයවා තිබුණි.

- නෙළුම් පොකුණ රඟහලේ විදුලි පරිභෝජන වියදම, රට තුළ නිරෝධායන ඇඳිරිනීතිය පනවා තිබූ 2021 මැයි හා ජූනි මාසවල පිළිවෙලින් රු.මිලියන 1.45 ක්, රු.මිලියන 1.26 ක් හා ක්‍රියාකාරකම් කිසිවක් සිදුකර නොතිබූ 2021 සැප්තැම්බර් මාසයේ රු.මිලියන 1.52ක් වැනි ඉතා ඉහල අගයක් ගෙන තිබුණි. තවද, මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් අය ක්‍රමය වූ General Purpose–03 යටතේ kva-209152249 මනු කියවීම් වර්ගයෙන් ඒකකයට අයකරන මිල ඉතා ඉහල අගයක් ගෙන තිබුණද මෙම අයක්‍රමය වෙනස්කරගෙන විදුලි ගාස්තු අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 8.12.4, 5.4.6 හා 5.4.8ට පටහැනිව, මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කාර්යය නිමකිරීමට පෙර හා කාර්යය නිමකර ඇති බවට සහතිකයක් නොමැතිව 2021 දෙසැම්බර් 15 දින රු.මිලියන 2 ක් වූ සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල ගෙවා තිබූ අතර විගණිත දිනය වූ 2022 මාර්තු 31 වන විටත් මහජනතාවට ප්‍රවේශ විය හැකි ආකාරයට වෙබ් අඩවිය ක්‍රියාකාරි තත්ත්වයේ නොපැවතුණි. ගෙවීම කිරීමේදී රඳවා ගැනීම් මුදලක් අඩු කරගෙන

නොතිබූ කාර්යය නිමකර වසර 1ක් දක්වා වූ කොන්ත්‍රාත්තුවේ නඩත්තු කාලය ආවරණය වන පරිදි ලබාගත යුතු කාර්යසාධන බැඳුම්කරය කාර්යය ආරම්භ කල දින සිට මාස 6ක් දක්වා පමණක් ලබා ගෙන තිබුණි.

- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ පනතක් මගින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර අරමුදල වසා දැමීමට හෝ නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

අවිධිමත් ගනුදෙනු

- නෙළුම් පොකුණ රඟහලෙහි නඩත්තුව සම්බන්ධ චීන තාක්ෂණික සහයෝගිතා ගිවිසුම අනුව, චීන සමාගමට නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍ර හා උපාංග බදු නොගෙවා ආනයනය කර ගැනීමට ඉඩපහසුකම් සලසා තිබූ අතර 2021 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ චීන සමාගම ආනයනය කල භාණ්ඩ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් අවස්ථා 09 කදී රු.මිලියන 14.37 ක් රේගු බදු ගෙවා තිබුණි. ආනයනය කරන ලද භාණ්ඩවල හිමිකම ශ්‍රී ලංකාවට පැවරී තිබූ අතර ගබඩාවෙහි තිබූ නඩත්තු කටයුතු සඳහා ආනයනය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ වර්ග 19 ක අයිතම 74 ක් රඟහල වෙත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31 දින දක්වා වර්ෂ 10 ක කාලසීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එහි නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව 2013 වර්ෂයේදී එම බදු කාලසීමාව වර්ෂ 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමටද හස්ත කර්මාන්ත මණ්ඩලය කටයුතු කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2021 ජූලි 31 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම රු.මිලියන 91.92 ක් විය. තවද, 2021 අගෝස්තු මස සිට ගෙවිය යුතු මාසික කුළී මුදල නව බදු ගිවිසුම ප්‍රකාරව සිදු කළ යුතු වුවත්, දෙපාර්ශවයේම එකඟතාවයකින් යුතුව අත්සන් කළ යුතු නව බදු ගිවිසුමකට එළඹීමට සහ ඒ අනුව බදු කුළී ගෙවීමකින් තොරව අනවසරයෙන් හස්ත කර්මාන්ත මණ්ඩලය මෙම ගොඩනැගිල්ල භාවිතා කරමින් තිබුණි.

පාඩු හා හානි

- නෙළුම් පොකුණ රඟහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාළව එක් ආයතනයක් ලංසු 02 ක් ඉදිරිපත් කර තිබූ අතර රු.2,999,000ක මිල පළමු ලංසුව ලෙසත්, රු.5,400,000ක මිල දෙවන ලංසුව ලෙසත් ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් දක්වා තිබුණද, තාක්ෂණික ඇගයීම් කමිටුව රු.5,400,000 ක මිල පළමු ලංසුව ලෙසත් රු.2,999,000 ක මිල දෙවන ලංසුව ලෙසත් සටහන් කර ලංසු ඇගයීමේදී දෙවන ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. මෙහිදී වෙනත් ආයතනයක් ඉදිරිපත් කර තිබූ රු.4,800,000ක මිල අවම මිල ලෙස පිළිගෙන යන්ත්‍රය එම සමාගමෙන් මිලදී ගැනීමට නිර්දේශ කර තිබීමෙන් අමාත්‍යාංශයට රු.මිලියන 1.8 ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි.

- කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි වර්ග අඩි 6039ක ගොඩනැගිල්ලක් මාසිකව රු.මිලියන 1 ක බදු කුලියකට ලබා ගෙන තිබූ අතර එම බදු කුලී ගිවිසුම 2020 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වුවද, ඒ වන විට නව ස්ථානයක් තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් එම ගිවිසුම 2021 ජනවාරි 31 දක්වා මාස 3කින් දීර්ඝ කර තිබුණි. කාර්යාල පරිශ්‍රය සඳහා අවශ්‍ය බිම් ප්‍රමාණය වර්ග අඩි 3400 ක් වුවද කලින් ගිවිසුම මාස 03 කට දීර්ඝ කිරීම හේතුවෙන් වර්ග අඩි 6039ක් සඳහා ගිවිසුම් ගත වීමට සිදුව තිබූ අතර ඒ සඳහා අතිරේකව ගෙවන ලද රු.මිලියන 18 ක වියදම අමාත්‍යාංශයට සිදුවූ පාඩුවක් විය.

සැලැසුම් කිරීම

- කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් වූ 2017 අගෝස්තු 15 දිනැති අංක MSEW/CM/13/2017 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කන්ද උඩරට උරුමය සුරැකීමට අදාළව ව්‍යාපෘති 4 ක් හඳුන්වා දී තිබුණද එම ව්‍යාපෘති 04 මත පදනම්ව එහි ක්‍රියාකාරකම් සැලසුම් කර නොතිබූ අතර මණ්ඩලයේ සංශෝධිත ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් රු.මිලියන 9.02ක ප්‍රතිපාදන වෙන් කල ව්‍යාපෘති 5 ක් වර්ෂය තුළ ක්‍රියත්මක කර නොතිබුණි.

- කලාකරු රක්ෂණ යෝජනා ක්‍රමය එක් ආයතනයක් යටතේ ක්‍රියාත්මක කළ යුතු වුවද, නාට්‍ය කලාකරුවන් සඳහා වූ ප්‍රේක්ෂා කලාකරු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ටවර්හෝල් රඟහල පදනම වෙත රු. මිලියන 15ක් ද, සියලු කලාකරුවන්ට හදිසි අනතුරු හා වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ජාතික උරුමය, ප්‍රාසාංගික කලා සහ ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත රු. මිලියන 10ක් ද වූ ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණි.

- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් වූ කලාකරුවන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීම වෙනුවෙන් රු.100,000ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර කලාකරුවන් සඳහා ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සඳහා රු. මිලියන 2 ක ප්‍රතිපාදන ලබාදී එම කාර්යයන් ආයතන 02 විසින්ම ඉටු කර ඒ සඳහා වියදම් දරා තිබුණි.

- ජාතික සාහිත්‍ය උත්සවය, පෙරහැර ආධාර හා පොසොන් තේවිසි පූජාව සහ අගහිඟ කලාකරුවන්ට ආධාර යන කාර්යයන් වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 4 ක්, රු.මිලියන 4 ක් හා රු. මිලියන 32ක් ප්‍රතිපාදන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට ලබාදී තිබූ අතර ඒ හා සමාන කාර්යයන් වූ ජාතික සාහිත්‍ය කලා උළෙල, පෙරහැර හා වෙනත් සංස්කෘතිකාංග සඳහා දායකත්වය සහ ශිල්පීන්ට ජීවනාධාර සැපයීම වෙනුවෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහාද පිළිවෙලින් රු.මිලියන 20ක, රු. මිලියන 10ක හා රු.මිලියන 5ක ප්‍රතිපාදන ලබාදී එම කාර්යයන් ආයතන 02 විසින්ම ඉටු කර ඒ සඳහා වියදම් දරා තිබුණි.

ප්‍රසම්පාදනයන්

- රු. මිලියන 16.38 ක මුදලක් වැය කරමින්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහා නායක චාරිකාරාමයේ ප්‍රතිසංස්කරණ කටයුතු, ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් සහ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කිරීමෙන් තොරව නාවික හමුදාවට පවරා තිබූ අතර 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබූ අළුත්වැඩියා කටයුතු මෙම වාර්තාවේ දිනය වන විටත් නිම කර නොතිබුණි. තවද, අදාළ ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශයට පටහැනිව තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව 2021 වර්ෂයේදී බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් දහම්පාසැල් පෙළපොත් හා දහම්පාසල් අයදුම්පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත රු. මිලියන 202.73 ක් ගෙවීම් කර තිබුණි.

- ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය සඳහා 2011 සැප්තැම්බර් මස ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව 2013 නොවැම්බර් මස රඟහල කඩා ඉවත් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 3.64 ක පිරිවැයක් දරා තිබුණි. එසේ වුවද 2014 පෙබරවාරි රඟහල නවීකරණය සඳහා

නැවත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණි.

ගොඩනැගිල්ල නිමකර නිසිපරිදි භාර දී නොතිබියදී රු. මිලියන 38.66 ක් වූ අවසාන ගෙවීමද කර තිබූ අතර කාර්ය නිමකල බවට සහතිකයක් නොමැතිව රු. මිලියන 19.33 ක රඳවා ගැනීම් මුදලින් සියයට 50ක් එනම් රු. මිලියන 9.66ක් ද ගෙවා තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු. මිලියන 38.66 ක මුදල ද නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඊට අමතරව කාර්යය නිම කිරීමට ගතවූ වසර 03 ක කාල ප්‍රමාදය හේතුවෙන් බිල්පත්වල පැවති මිල විචලතා සඳහා රු. මිලියන 9.26 ක් ගෙවා තිබූ අතර එය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුවක් විය.

- අවස්ථා 04 කදී රු. මිලියන 69 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබූ ජාතික කලාභවන වැඩි දියුණු කර සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රු. මිලියන 11.78 කට ඇස්තමේන්තු කර තිබූ ගොඩනැගිල්ලේ පොළව, බිත්ති හා සිවිලිම නිම කිරීම බාහිර පෞද්ගලික පාර්ශවයක් වෙතින් ඉටු කරවා ගෙන තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන අධිකාරියේ අනුමැතිය ලබා නොතිබුණි. ඒ සඳහා අදාළ ඇස්තමේන්තුව රු. මිලියන 7.87 කින් ඉක්මවා රු. මිලියන 19.65ක් එම ආයතනය වෙත ගෙවා තිබූ අතර සිදු කරන ලද කාර්යයන් පිළිබඳ උපදේශන සේවා ආයතනය විසින් නිසි අධීක්ෂණයක් හා ඇගයීමක් සිදු කර නොතිබුණි.

  තවද, 2 වන අදියර ඉදිකිරීම් සඳහා රු. මිලියන 108.12ක් 2021 දෙසැම්බර් 31 වන විට වැය කර තිබූ අතර 2021 ජූලි 22 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් රු.මිලියන 92.49ක ප්‍රතිපාදන පමණක් අනුමත කර තිබූ බැවින් අනුමැතිය රහිතව රු. මිලියන 15.63ක් වැය කර තිබුණි.

- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 992 ක වටිනාකමකට ඉදිකිරීම් කාර්යය සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගම වෙතද, උපදේශකත්ව කාර්යය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතද පවරා තිබුණි. එහි ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලසීමාව 2019 ජනවාරි 07 දින සිට 2020 ජූලි 07 දක්වා විය. එම කාලසීමාව නැවත 2021 මැයි 18 දින දක්වා දීර්ඝ කර තිබුණි. නැවතත් එම කාලසීමාව 2024 ජූලි 30 දින දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ නමුත්, ඒ සඳහා අනුමැතිය 2022 අප්‍රේල් මස දක්වා ලැබී නොතිබූ අතර,

ගොඩනැගිල්ල සහ අනෙකුත් ප්‍රතිසංස්කරණ කාර්යයන්ද 2022 මැයි මස වනවිටත් අවසන් කර නොතිබුණි.

වත්කම් කළමනාකරණය

- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් ලේඛන කාණ්ඩ 700 කින් පමණ සමන්විත ජාතික වටිනාකමක් සහිත පොත්පත්, ලේඛන, පෞරාණික ගිවිසුම්, පුස්කොළ පොත් හා රහස්‍ය ලේඛන ආදී ප්‍රවේණිගත වත්කම් විශාල ප්‍රමාණයක් පවතී. මෙම මිල කළ නොහැකි වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබූ අතර, එම වත්කම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- පුරාවිද්‍යාත්මක විවිධ කැණීම් වලදී හමු වූ වංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් දීර්ඝ කාලයක සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය, රසායනාගාර අංශය සහ කලාප කාර්යාලවල විධිමත්ව ලේඛනගත කිරීමකින් තොරව පැවතුණි. 2020 විගණකාධිපති වාර්තාව ප්‍රකාරව මෙම කාසි ලේඛනගත කිරීම් ආරම්භ කර තිබුණද, 2022 අප්‍රේල් මස වන විටත් එම කාර්යයන් නිම කර නොතිබුණි.

ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන්, මහාවංසය සම්බන්ධ දැනුවත් කිරීමේ හා හඳුන්වාදීමේ වැඩසටහන, වලිසිංහ හරිස්චන්ද්‍ර කේන්ද්‍රයේ තාප්පය ඉදිකිරීම සහ මිහින්තලයේ උතුරු දකුණු මිතුරු සෙවනෙහි වායුසමන යන්ත්‍ර සවිකිරීම හා බිම් සැකසුම් වෙනුවෙන් පිළිවෙලින් රු.2,000,000ක, රු.800,000ක සහ රු.300,000ක ප්‍රතිපාදන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත වෙන්කර තිබුණද වර්ෂය තුළ අදාළ කාර්ය සිදු නොකර එම ප්‍රතිපාදනවලින් ඊට පරිබාහිර වූ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.1,285,867 ක්, රු.669,405 ක් සහ රු.97,189 ක් වැයකර තිබුණි.

- ආධාර අවශ්‍යවන අඟහිඟ කලාකරුවන්ට ආධාර ලබා දීමට 206-2-3-4-1508 වැය විෂයය යටතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත වෙන්කර තිබූ ප්‍රතිපාදන භාවිතා කර කලාභූෂණ සම්මානලාභීන්ට ත්‍යාග ලෙස අයෙකුට රු.25,000 බැගින් 170 දෙනෙකු සඳහා රු.මිලියන 4.25ක් ගෙවා තිබුණි.

කාර්යයසාධනය

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛනාරක්ෂක කටයුතු වලට සම්බන්ධ වෘත්තීය නිලධාරීන් 61 දෙනකුගේ පුරප්පාඩු පවතින අතර, එසේ ආයතනය තුළ සිටින වෘත්තීය නිලධාරීන්ගේ දැඩි හිඟය ලේඛන කළමනාකරණයට මෙන්ම අධි ලේඛන කළමනාකරණයට හා එම කාර්යයන් වල ප්‍රමාදයට හේතුවී තිබුණි.

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

2012 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ඇමරිකානු අරමුදල් දායකත්වය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 323.8 ක් වූ රජගලතැන්න පුරාවිද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතියට 2021 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තු අනුව ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 31.07 ක් වූ නමුත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතියේ විවිධ කටයුතු අත්හිටුවීම හේතුවෙන් වර්ෂය තුළ කැණීම් වැඩබිම් 02 ක් සහ සංරක්ෂණ වැඩබිම් 05 ක කටයුතු අවසන් කර තිබුණි. ඒ අනුව සංශෝධිත ප්‍රතිපාදනයෙන් රු. මිලියන 17.9 ක මුදලක් වැයකර සියයට 58 ක මූල්‍ය ප්‍රගතියක් හා සියයට 77 ක භෞතික ප්‍රගතියක් ලබා කරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී නිම කළ යුතුව තිබුණද වර්තමානය වන විට ඇති වී තිබෙන මූල්‍ය හා විවිධ බාධාවන් නිසා එම කාර්යයන් එදිනට නිම කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

කාර්යභාරයන් ඉටු නොකිරීම

- කැළණි විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම සඳහා රාජ්‍ය සංස්ථාවකින් පරිත්‍යාග ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු. මිලියන 1.49 ක මුදලක් 2020 දෙසැම්බර් 11 දින රජයේ ආදායමට බැර කර තිබුණි. 2021 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරියගේ මූලිකත්වයෙන් පැවති රැස්වීමකදී ලබාදුන් උපදෙස් අනුව එම මුදල් නැවත ලබාගෙන එම අරමුණු හා කාර්යයන් ඉටු කිරීමට උපදෙස් ලබාදී තිබුණද, එම උපදෙස් ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි.

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවස්තු ආරක්ෂක ඒකකය ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 වර්ෂය තුළ පුරාවස්තු පනත උල්ලංඝනය කිරීමේ අවස්ථා 232 කට අදාළව අධිකරණයේ නඩු පවරා තිබුණි. එම නඩු අතර පුරාවස්තු සොරකම් කිරීමේ අවස්ථා 03 ක්, පුරාවස්තු විනාශ කිරීම් සම්බන්ධ නඩු 14 ක්, අනවසර කැණීම් සම්බන්ධ නඩු 199 ක්, අනවසර අත්පත් කරගැනීම් සම්බන්ධ නඩු 02 ක් සහ වෙනත් නඩු 14 ක් පවරා තිබුණි. වර්ෂය තුළදී නඩු 122 ක් අවසන් කර තිබූ අතර, එමඟින් එකතුව රු. මිලියන 38.86 ක දඩ මුදල් අයකරගෙන තිබුණි. නමුත් 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළ පුරාවස්තු සොරකම් කිරීම් සහ විනාශ කිරීම් සිද්ධීන් පිළිවෙලින් 273, 121 සහ 383 ක් වාර්තා වී තිබූ අතර, ඒ අනුව මෙම සිද්ධීන් කාලීනව වර්ධනය වී තිබුණි.

- 1998 වර්ෂයේදී අත්තනගල්ල ඔයෙන් හමු වූ වසර 1270 ක් පමණ පැරණි අඩි 59 අඟල් 11 ක් පමණ දිගින් යුතු ඉපැරණි පාරුවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් රැගෙනවිත්, කොළඹ ජාතික කෞතුකාගාර භූමියේ ජල ටැංකියක තැන්පත් කර තිබුණි. මෙම පාරුව සංරක්ෂණය කිරීමේ කාර්යභාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය වන

පොලිඑතිලීන් සහ ග්ලයිකෝල් නැමති රසායන ද්‍රව්‍යයද රු.මිලියන 04 ක් පමණ වැය කර මිලදීගෙන තිබුණි. නමුත්, 2001 වර්ෂය දක්වාම එම රසායන ද්‍රව්‍ය භාවිතා කර එම පාරුව සංරක්ෂණය කිරීම සිදු කර නොතිබූ අතර, එම රසායන ද්‍රව්‍ය වෙනත් කාර්යයන් දෙකකට භාවිතා කර තිබුණු අතර සංරක්ෂණ ක්‍රමවේදය හා කාර්යය නියමිත කාල රාමුව තුළ යෝග්‍ය පරිදි සිදු නොකිරීම නිසා 2021 වර්ෂය අවසාන වන විට පාරුවේ දැව කොටස් දැඩි ලෙස දිරාපත් වී පාරුව සම්පූර්ණයෙන්ම විනාශයට භාජනය වී තිබුණි.

කම්කරු අංශය

විගණන නිරීක්ෂණ

- තැන්පත් ශේෂයන්
- කළමණාකරණ දුර්වලතා
- මහජනයා වෙත සේවා ඉටු කිරීම
- කාර්යභාරයන් ඉටු නොකිරීම
- ප්‍රසම්පාදනයන්
- ශ්‍රම වාසනා අරමුදල
- ජාතික ප්‍රමිති පිහිටුවීම
- සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොවූ මුදල්
- මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි අභ්‍යන්තර නිර්මිත සැකසීම
- ආයෝජන ප්‍රතිලාභ අඩු වීම
- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම

කම්කරු අංශය

කම්කරු නීති ප්‍රඥප්ති ප්‍රමිති සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමඟ සබඳතා පවත්වා ගනිමින්, කම්කරු ප්‍රජා ආරක්ෂණය, සුබසාධනය සිදු කිරීම හා කාර්මික සාමය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම කම්කරු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වෘත්තීමය ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ ශ්‍රම බලකායක් විදේශ රැකියා වෙළඳපොල සඳහා බිහිකිරීම පිණිස රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීමට සහ නියමිත නීති සහ අණ පණත්වලට අනුකූලව කම්කරු විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජනය හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කාර්යය වන අතර අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි විෂයන්, කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම මගින් අමාත්‍යාංශයේ දැක්මවන "තෘප්තිමත් ඵලදායී ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්" යන්න සාක්ෂාත් කරගැනීමට කටයුතු කරනු ලබයි.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 5,628 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 3,665.2 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,962.8 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 43 හි දැක්වේ.



රූපසටහන 43 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකාවට අදාළ ශ්‍රම බලකායේ ප්‍රධාන ලක්ෂණ කීපයක් පහතින් දැක්වේ.

විස්තරය	පිරිමි	ගැහැණු	එකතුව
ශ්‍රම බලකාය (මිලියන)	5,621	2,932	8,553
රැකියා නියුක්ති ජනගහණය (මිලියන)	5,414	2,699	8,113
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය (සියයට)	71	31.8	49.9
රැකියා විරහිත ජනගහණය (මිලියන)	207	233	440

වගුව 26 - ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

තැන්පත් ශේෂයන්

- 2021 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 10 ක වන්දි මුදල් කම්කරු අමාත්‍යාංශයේ 6000-0-0-17-0-26 දරන පොදු තැන්පත් ගිණුමෙහි රදවා තිබුණි. මේ තුළ ඇතුළත් වන්දි ලැබී වසර 2 ඉක්මවූ වටිනාකම රු.මිලියන 0.53 ක් වූ අතර වන්දි මුදල් තැන්පත් කර වසර 1 ත් 2 ත් අතර අගය රු.මිලියන 1.37 ක් විය. තැන්පත් කර මාස 6 ත් වසරත් අතර අගය රු.මිලියන 2.97 ක් විය.

- විවිධ හේතූන් මත හිමිකරුවන් වෙත ලබානොදුන් වන්දි මුදල්වලින් රු.මිලියන 2.02 ක් සඳහා වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් ආරම්භකර තිබුණි. මෙම මුදල් ගිණුම්වල තැන්පත් කර මාස 22 සිට මාස 48 දක්වා කාලයක් ගතවී තිබුණද උසාවි කටයුතු අවසන් නොවීම හේතුවෙන් හිමිකරුවන් වෙත නිදහස් කිරීමට නොහැකි වී තිබුණි.

කළමණාකරණ දුර්වලතා

- 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතෙහි XII කොටසේ 57 (1) වගන්තිය අනුව සේවකයෙකුට සේවයේ යෙදී සිටියදී අනතුරක් සිදු වී දින 14 ක් තුළ සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස් වෙත වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවද මේ සඳහා කිසියම් ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු මාස 5 සිට අවුරුදු 12 දක්වා ප්‍රමාද වී ලැබී තිබූ බව ලේඛණ අනුව අනාවරණය විය.

- යහපත් රැකියා වාතාවරණයක් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම (සුනිසි මෙහෙවර) සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබූ රු.මිලියන 45 ක ප්‍රතිපාදනය උපයෝජනය කරමින් වෙනත් මූලධන වැය විෂයයන් 03 ක් සඳහා රු.මිලියන 11.86 ක්ද 2021 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු කාර්යයක් වෙනුවෙන් රු.මිලියන 3.03 ක් වශයෙන් රු.මිලියන 14.89 ක් වැය කර තිබුණි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති ඵලදායීතා සංවර්ධන නිලධාරීන් 690 සඳහා 2021 වසරේ දී වැටුප් ලෙස රු.මිලියන 383.4 ක් ගෙවා තිබුණි. ඵලදායීතා සංකල්ප ක්‍රියාත්මක කිරීම එම නිලධාරීන්ගේ ප්‍රධාන කාර්යයක් වුවද එම සංකල්ප ක්‍රියාත්මක කිරීම ඉතාමත් අවම මට්ටමක පැවති අතර ඇතැම් නිලධාරීන්ට ඵලදායීතා සංකල්ප පිළිබඳ විධිමත් අවබෝධයක්ද නොතිබුණි. ප්‍රධාන කාර්යාලය විසින් එම නිලධාරීන්ගේ කාර්යභාරය විධිමත් පරිදි නියාමනයක් සිදුවී නොතිබීමෙන් එම නිලධාරීන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් ඵලදායීතාවය දුර්වල මට්ටමක පැවතුණි.

- 1980 ජූලි වර්ජකයන්ට දීමනා ගෙවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අයදුම්පත් නිර්දේශ කිරීමේදී කම්කරු අමාත්‍යාංශය විසින් එකම ප්‍රතිලාභීන්ගේ අයදුම්පත් දෙකක් නිර්දේශ කිරීම හේතුවෙන් රු.මිලියනයක වැඩිපුර ගෙවීමක් සිදුව තිබූ බව පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වාදීමෙන් පසුව අදාළ දත්ත පද්ධතිය නිවැරදි කල බව විගණනය වෙත දන්වා තිබුණද, 2022 වර්ෂයට කරන ලද ගෙවීම් අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන කලද 2022 වර්ෂයට පෙර ගෙවීම් කරන ලද ප්‍රතිලාභීන් පිළිබඳ අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව දත්ත පද්ධතිය

යාවත්කාලීන නොවීම මත එම පුද්ගලයින් සඳහා නැවත අයදුම්පත් නිර්දේශ කිරීමේ අවධානම තවදුරටත් පැවතුණි. මාණ්ඩලික නිලධාරියෙකු විසින් අයදුම්පතෙහි නිවරද්‍යතාවය පරීක්ෂා කලද දත්ත පද්ධතිය යාවත්කාලීනවීම අධීක්ෂණය කර නොතිබුණි.

- රු.මිලියන 26.8 ක් වැය කර අම්පාර සංචාරක බංගලාව ඉදිකරන ලද ඉඩම 2022 මැයි මස වන විටද කම්කරු අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2021 වර්ෂයේදීද රු.මිලියන 5 ක් වැය කරමින් එම ඉඩමෙහි රියදුරන් සඳහා නවාතැන් ගැනීමට ස්ථානයක් (Drivers Lodge) ඉදිකිරීමට කටයුතු කර තිබුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් ගිණුමෙහි පැවති ශේෂය නිරාකරණය කර ගැනීම සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 10 ට වඩා වැඩි අගයක් බැර වී තිබෙන ආයතනවල ගිණුම් නිවැරදි කර කේවල ගිණුම්වලට ගිණුම්ගත කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර මෙම ව්‍යාපෘතියෙන් ආයතන 23 කට අයත් රු.මිලියන 920.12 ක අරමුදලක් නිරවුල් කලයුතුව තිබුණි. 2021 සැප්තැම්බර් 07 දිනට අනුව මෙම ආයතන අතරින් කලාප 09 කට අයත් ආයතන 10 ක නිරවුල් කල යුතුව තිබූ රු.මිලියන 262.8 කින් රු.මිලියන 44.05 ක් පමණක් නිරවුල් වී තිබුණි. ඒ අනුව නිරවුල් නොවීමේ ප්‍රතිශතය සියයට 52 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවති අතර නිරවුල් නොවූ වටිනාකම රු.මිලියන 218.76 ක් වී තිබුණි.

- මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ ස්ථාපිත කාර්යාලවලින් ස්ථාපිත දිනයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 171.46 ක කුලී මුදල් කම්කරු දෙපාර්තමේන්තුව වෙත හිඟව පැවතුණි. අවුරුදු 2 ට වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතින ඉඩකඩ ප්‍රමාණය වර්ග අඩි 102,725 ක් වන අතර එයින් වර්ග අඩි 39,180 ක මාසික තක්සේරු කුලිය රු.මිලියන 6.98 ක් විය. (4, 5, 28-31 මහල් හැර) ඒ අනුව 2021 වර්ෂය සඳහා රු.මිලියන 83.77 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

මහජනයා වෙත සේවා ඉටු කිරීම

- 2021 නොවැම්බර් 30 දින වන විට කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු අතරින් මාරක අනතුරු 140 ක් හා මාරක නොවන අනතුරු 424 ක් සඳහා වන්දි අයකර දීමේ ක්‍රියාවලිය අවසන්ව නොතිබුණු අතර අනතුර වාර්තා වී වසර 5 ඉක්මවූ මාරක අනතුරු 14 ක් හා මාරක නොවන අනතුරු 29 ක් ද මේ තුළ ඇතුළත්ව තිබුණි.

- කම්කරු වන්දි උසාවියේ තීරණයන්ට එරෙහිව අභියාචනා කරන ලද ගොනු 13 කට අදාළ සේවායෝජක විසින් වන්දි කාර්යාලයේ තැන්පත් කරන ලද රු.මිලියන 4.95 ක් සඳහා ඉතිරි කිරීම් ගිණුම් ආරම්භ කර තිබූ අතර මින් රු.මිලියන 3.73 ක ඉතිරි කිරීම් තැන්පත් ගිණුම් 10 ක් ආරම්භ කර වසර 1 ත් 4 ත් අතර කාලයක් ගතවී තිබුණි.

- රැකියාවේ යෙදී සිටියදී සිදුවන මාරක අනතුරු හේතුවෙන් මියයන සේවකයින්ගේ බාලවයස්කාර දරුවන්ට හිමිවන වන්දි මුදල් ඔවුන් වයස් පූර්ණත්වයට පත්වන තෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වන්දි කොමසාරිස් නමින් වූ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර වයස් පූර්ණත්වයට පත්වූ පසු ඔවුන් වෙත නිදහස් කිරීම සිදුකල යුතු වුවද 2021 දෙසැම්බර් 20 වන විට පැවති එලෙස වයස් පූර්ණත්වයට පත්ව නිදහස් නොකල ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.මිලියන 6.1 ක් විය.

- අගතියට පත් පාර්ශවය සඳහා හිමිවිය යුතු බවට වන්දි උසාවියේදී තීරණය වුවද නඩු නියෝගය අනුව සේවායෝජක වන්දි මුදල නොගෙවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට නඩු 46 ක් වරෙන්තු වශයෙන් පැවති අතර එමගින් හිමිවිය යුතු වන්දි මුදල රු.මිලියන 13.4 ක් විය. මෙ අතර වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්ම වූ නඩු 10 කට අදාළ රු.මිලියන 1.87 ක් ද වසර 5 – 10 ත් අතර නඩු 21 කට අදාළ රු.මිලියන 6.92 ක් හා අවුරුදු 1 – 4 අතර නඩු 15 කට අදාළ රු.මිලියන 4.63 ක් ද ඇතුළත් විය. මේ ආකාරයට වන්දි උසාවිය මගින් තීරණය වුවද වන්දිලාභියාට මෙම මුදල නොලැබීම මත වන්දි කොමසාරිස් කාර්යාලයේ අරමුණු ඉටු වී නොතිබුණි.

කාර්යභාරයන් ඉටු නොකිරීම

- ප්‍රතිලාභ නිසි ලෙස නොලැබීම සම්බන්ධයෙන් සේවකයන් වෙතින් කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට කරනු ලැබූ පැමිණිලිවලින් 2021 දෙසැම්බර් 31 දින වන විට විශේෂ විමර්ශන අංශය වෙත යොමු කළ 2015 සහ 2020 කාලයට අදාළ විසඳා නොමැති පැමිණිලි සංඛ්‍යාව 96 ක් වූ අතර එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 31 ක් විය.

- 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යනු ලබන ආයතන සංඛ්‍යාව, විගණනයට ලබා දුන් තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට 117 ක් විය. එදිනට ආයතන 30 ක අරමුදල්වල මුළු ශේෂ එකතුව රු.මිලියන 106,794 විය . එම අරමුදල් විධිමත් පරිදි නියාමනය කිරීමට අපොහොසත් වීමෙන් ලියාපදිංචි ආයතන සංඛ්‍යාව නිවැරදිව හඳුනා නොගැනීම, දායක මුදල් නොගෙවීමේ අවස්ථා හෙළිදරව් වීම හා අධිභාර ක්‍රියාත්මක නොවීම, එම ආයතනවල නිලධාරීන් විසින් වංචනික ලෙස මුදල් ලබාගැනීම, සේවායෝජක

ආයතනවල ව්‍යවස්ථා ඉදිරිපත් නොවීම, පැමිණිලි විභාග කිරීමට ක්‍රියාත්මක නොවීම හා අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සක්‍රීයව ක්‍රියාත්මක නොවන ආයතන/ අරමුදල්, 2021 දෙසැම්බර් 31 දිනට අරමුදල්වල ශේෂය හා හිඟ දායක මුදල් හඳුනා නොගැනීම, ආයතන පරීක්ෂා කිරීම පිළිබඳ විධිමත් තොරතුරු ඉදිරිපත් නොවීම, පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ප්‍රමාණවත් නිලධාරීන් මණ්ඩලයක් නොමැතිවීම හා පනතේ වගන්ති යාවත්කාලීන නොවීම හේතුවෙන් විවිධ අර්බුධ මතුවී මෙම අංශයේ කටයුතු අකර්මන්‍ය වී තිබුණි.

- විධිමත් නියාමනයක් නොමැතිවීම හේතුවෙන් පොල්වගා කිරීමේ මණ්ඩලයේ අනුමත සේවක අර්ථසාධක අරමුදලින් රු.මිලියන 73.8 ක් එහි නිලධාරීන් වංචා කර තිබූ අතර සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම නියමිත දිනට දායක මුදල් නොගෙවීම හේතුවෙන් 2019, 2020 සහ 2021 වර්ෂ තුන සඳහා රු.මිලියන 107 ක අධිභාර ගෙවිය යුතුව තිබුණි.

ප්‍රසම්පාදනයන්

- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඉටුකර ගැනීම සඳහා 2021 වර්ෂය තුළදී රු.මිලියන 397.4 ක් වටිනා කොන්ත්‍රාත් 13 ක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පිරිනමා තිබුණද ලබාදී ඇති ඉදිකිරීම් කාර්යයන් අතරින් රු.මිලියන 143.7 ක් වටිනා කාර්යයන් 08 ක් කම්කරු දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් වී නොතිබුණි.
- 'මෙහෙවර පියස' ගොඩනැගිල්ල ඉදිකරන ලද පෞද්ගලික ඉදිකිරීම් සමාගම සමඟ 2013 ඔක්තෝබර් 03 එළඹ තිබූ ගිවිසුමට අනුව මාස 36 කින් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට එකඟ වී තිබූ නමුත් 2019 අප්‍රේල් 30 තෙක් ප්‍රමාද ගාස්තු ගෙවීමට යටත්ව කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

- 2020 විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි අන්තර් ගෙවීම් සහතික (IPC) 13 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 21.8 ක් අදාළ පෞද්ගලික ඉදිකිරීම් සමාගමට 2020 වර්ෂයේදී ගෙවා තිබුණද කොන්ත්‍රාත්තුව ප්‍රමාදවීම සම්බන්ධයෙන් එම ආයතනයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රම වාසනා අරමුදල

බදුල්ල දිස්ත්‍රික්කයේ වතු කම්කරු ජනතාව (Estate Labour Workers) සඳහා සනීපාරක්ෂක වැසිකිළි 200 ක් ශ්‍රම වාසනා අරමුදලින් ඉදිකිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඇති අරමුදල සතු මුදලින් රු.මිලියන 10 ක මුදලක් 2021 පෙබරවාරි මාසයේදී ලබාදී තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 5.95 ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රතිලාභීන් වෙත ගෙවීම හා ව්‍යාපෘතියේ අනෙකුත් වියදම් ලෙස රු.මිලියන 0.23 ක් වැයකර තිබුණි. 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ සහ 2019 අංක 15 දරණ සංශෝධිත පනතේ අරමුණු අනුව සේවා නියුක්තිකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කලයුතු වුවද, එම අරමුණුවලට බාහිරව අඩුආදායම් ලාභීන් 140 දෙනෙකු වෙත මෙම වැසිකිළි ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ සලසා දී තිබුණු අතර එය මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාවෙන් සියයට 70 ක් විය.

ජාතික ප්‍රමිති පිහිටුවීම

2009 අංක 38 දරණ වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 3 (1) (ග) උපවගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිති පිහිටුවීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන කටයුතු කල යුතු වුවද 2021 වර්ෂය අවසන් වන විටත් එම ප්‍රමිති පිහිටුවා නොතිබුණි.

සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොවූ මුදල්

2021 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික අරමුදල තුළ කම්කරු කොමසාරිස් නමින් පැවති ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් දෙපාර්තමේන්තුව විසින් අයකරගෙන තිබූ රු.මිලියන 11,456 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 301 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙනයනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 70,832 ක ශේෂයක් අදාළ සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු. මිලියන 956 ක් ද, ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 2,117 ක් ද, ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන්

රු.මිලියන 353 ක් ද සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම් කාරක සභා මඟින් ද නියෝග කර තිබුණි.

මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි අභ්‍යන්තර නිර්මිත සැකසීම

මෙහෙවර පියසෙහි පිහිටි සේවක අර්ථසාධක අරමුදලේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කාර්යය වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිසි පරිදි අනුගමනය කිරීමෙන් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලබාගත් රු.මිලියන 135.3 ක් වූ මුලු පිරිවැය ඇස්තමේන්තුව අනුමත කර එම සම්පූර්ණ මුදලම 2020 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණද 2022 අප්‍රේල් 30 දින වන විටත් අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

ආයෝජන ප්‍රතිලාභ අඩු වීම

2021 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල විසින් ලැයිස්තුගත සමාගම් 11 ක සිදුකර තිබූ රු.මිලියන 7,386 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2019, 2020 හා 2021 යන වර්ෂයන් 3 හිද, ලැයිස්තුගත සමාගම් 08 ක සිදුකර තිබූ රු.මිලියන 9,486 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2021 වර්ෂයේදී ද ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. 2010 වර්ෂයේ දී ගුවන් සමාගමක සිදුකරන ලද රු.මිලියන 500 ක ආයෝජන සඳහා අදාළ ආයෝජන කරන ලද අවස්ථාවේ සිටම කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි.

තවද, ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයෙන් රු.මිලියන 5000 ක් එනම් සියයට 53 ක් 2013 වර්ෂයේ දී කැන්විල් හෝල්ඩින්ග්ස් හෝටල් සංකීර්ණය ඉදිකිරීම සඳහා ආයෝජනය කර තිබූ අතර එම හෝටල් සංකීර්ණය ඉදිකිරීමට අදාළ ශ්‍රැන්හයිට් කොළඹ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු 2020 ජූලි මාසයේදී නැවත ආරම්භ කලද සැලසුම් කල අයුරින් 2021 දෙසැම්බර් 27 වන විටත් හෝටල් සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. එබැවින් උක්ත ආයෝජනය සිදු කර වර්ෂ 8 ක කාලයක් ගතවී තිබුණද එම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි. එසේම, සේවක අර්ථසාධක අරමුදල විසින් 2021 වර්ෂයේ දී සිදුකරන ලද සාමාන්‍ය කොටස් විකුණුම් වලින් සමාගම් 05 ක සිදුකර තිබූ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 93.39 ක් වූ කොටස් අලෙවියෙන් රු.මිලියන 53.76 ක ප්‍රාග්ධන අලාභයක් ලබා තිබුණි.

සේවක අර්ථසාධක අරමුදල විසින් 2021 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳපොලෙහි සිදුකරන ලද රු.මිලියන 84,067 ක් වූ සමස්ත ආයෝජනයෙන් රු.මිලියන 9,681 ක් හෙවත් සියයට 12 ක් හෝටල් ක්ෂේත්‍රයෙහි සමාගම් 11 ක ආයෝජනය කර තිබුණි. එම ආයෝජනයන්හි 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ අගය රු.මිලියන 2,660 කින් අඩු වී තිබුණු අතර එම ආයෝජන සඳහා 2021

වර්ෂයේ දී කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. 2019 හා 2020 වර්ෂවලදී මෙම ආයෝජන මත ලද ප්‍රතිලාභය පිළිවෙලින් රු.මිලියන 103.18 ක් හා රු.මිලියන 47.40 ක් හෙවත් සියයට 2.47 ක් හා සියයට 0.98 ක් විය. තවද, සමාගම් 7 ක සිදුකර තිබූ රු.මිලියන 3,174.54 ක ආයෝජන සඳහා 2020 හා 2019 වර්ෂවලදී ද කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම

අරමුදලේ සාමාජිකයන්ට නව හැඳුනුම්පත් නිකුත් කිරීම සහ නැවත ලියාපදිංචි කිරීමේ පරිගණක කටයුතු සඳහා කාඩ්පත් 15,000 ක් රු.මිලියන 12.61 කට 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද, මෙම කාඩ්පත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. තවද, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 17.67 ක් වැයකර මිලදී ගන්නා ලද යන්ත්‍ර 35 කින් 2 ක් අපහරණය කර තිබුණු අතර ඉතිරි යන්ත්‍ර 33 සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

සෞඛ්‍ය අංශය

විගණන නිරීක්ෂණ

- සෞඛ්‍ය අමාත්‍යාංශය
- ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය
- ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
- ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල
- දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය
- ආයුර්වේද දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය අංශය

දේශයේ ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමේ දැක්මකින් යුතුව, සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ රාජ්‍ය අමාත්‍යාංශ 03 ක්, දෙපාර්තමේන්තු 01 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 13 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- සෞඛ්‍ය හා පෝෂණ විෂයයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා යටතේ පවතින විෂයයන්, අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදුකිරීම
- මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාළ ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සම්පාදනය කිරීම
- මහජන සෞඛ්‍යය හා පෝෂණය වැඩිදියුණු කිරීමට වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම
- අන්තර් ජාතික නිරෝධායන හා සනීපාරක්ෂාවට අදාළ නීතිරීති ක්‍රියාත්මක කිරීම
- පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය, ප්‍රමිතීන් හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය
- ලාභ නොලබන ප්‍රජා වෛද්‍ය සත්කාරක ආයතනවල වැඩකටයුතු නියාමනය හා අධීක්ෂණය
- වසංගත, බෝවන හා බෝ නොවන රෝග තත්ත්ව පාලනය, වැළැක්වීම හා ප්‍රතිකාර සඳහා මෙහෙයුම් දියත් කිරීම
- පාසල් සෞඛ්‍ය වැඩසටහනට අදාළ වෛද්‍ය සහ මුඛ සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම
- වතු අංශය සඳහා වන සෞඛ්‍ය සේවාවන් පිළිබඳ කටයුතු, සාමාන්‍ය සනීපාරක්ෂාව, ත්‍රිපෝෂ බෙදාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රෝහල් හා රෝහල් සේවකයින් පරිපාලනය
- පුහුණුවීම් කටයුතු මෙහෙයවන සියලු දෙපාර්තමේන්තු හා එම සේවාවන් පරිපාලනය හා සංවිධානය සහ අනෙකුත් උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතන සම්බන්ධීකරණය
- ජාතික රුධිර පාරවිලයන සේවාවන් පිළිබඳ කටයුතු, ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳ කටයුතු, ශ්‍රී ලංකා වෛද්‍ය සේවාවට අදාළ පරිපාලනය හා පිරිස් කළමනාකරණය
- වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්හී ගුණාත්මකභාවය සහ නිපුණතා වැඩිකිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ඇති කිරීම
- සෞඛ්‍ය අංශයට අදාළ පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීමට නව උපක්‍රම හඳුන්වා දීම හා ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් පිළිබඳ කටයුතු සිදු කිරීම

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට, ඒ යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ 03 කට හා දෙපාර්තමේන්තුවකට එකතුව රු.මිලියන 344,750 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 313,766 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු. මිලියන 30,979 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර රූපසටහන 44 හි දැක්වේ.



	සෞඛ්‍ය අමාත්‍යාංශය	ප්‍රාථමික සෞඛ්‍ය සේවා,වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය	දේශීය වෛදකම් ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	ආයුර්වේද දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන	176,861	12,724	151,980	417	2,769	344,751
වියදම රු. මිලියන	154,776	12,264	144,081	393	2,251	313,765
ඉතිරිය රු. මිලියන	22,085	460	7,899	24	518	30,986

රූපසටහන 44 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය

- **අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණු හා අමාත්‍යාංශය ඇතුළත එදිනට සේවයේ නියුක්තව සිටි නිශ්චිතව තනතුරු නාම සඳහන් විධායක ශ්‍රේණියේ නිලධාරීන් 78**

දෙනෙකු වෙත විශේෂ දීමනාවක් ගෙවීම සඳහා **2016** ජූලි **12** දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය පදනම් කර ගෙන අමාත්‍යාංශයෙන් පිටත රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු විධායක නිලධාරීන් වෙත මෙම දීමනාව ගෙවිය නොහැකි නමුත් ඊට පටහැනිව කටයුතු කරමින් **2022** පෙබරවාරි **18** දින වන විට විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කර තිබුණු ආයතන හා රෝහල් **40** ක සේවයේ නියුක්ත විධායක නිලධාරීන් වෙත **2016** සිට **2020** දක්වාවූ වර්ෂ **04** ක් තුළදී රු.මිලියන **20.41** ක් විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් විවිධ සේවා කාණ්ඩ වෙන වෙනම සලකා බලා දීමනා ගෙවීමට තීරණය කර තිබීම හේතුවෙන් දීමනා ලැබිය යුතු හා නොලැබිය යුතු කාණ්ඩ හඳුනා ගැනීමකින් තොරව දීමනා ගෙවන බවත්, අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත දැනට ගෙවනු ලබන සියලුම දීමනා පිළිබඳව දැඩි සමාලෝචනයක් සිදුකර දීමනා ගෙවීමේ නව ක්‍රමවේදයක් **2017** ජනවාරි **01** දින සිට ක්‍රියාත්මක කළ යුතු බවත්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් **2016** ජුනි **04** දිනැති ලිපිය මගින් අවධාරණය කර තිබුණු නමුත් **2022** අප්‍රේල් **15** දින වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට පැයකට ගෙවන මෙම විශේෂ දීමනාව නව වැටුප් පරිමාණයට අදාළව සංශෝධනය කිරීමටත්, මසකට ගෙවිය හැකි රු.**10,000** උපරිම දීමනා සීමාව ඉවත්කර මසකට පැය **80** ක් දක්වා අතිකාල සේවයේ යෙදිය හැකි කාලය වැඩිකිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. එම අනුමැතිය පදනම් කර ගෙන දීමනා ගෙවීමේදී කලින් පැවති දීමනාවට සාපේක්ෂව ඉහළ දීමනාවක් ගෙවීමට සිදුව තිබුණු අතර, යම් නිලධාරියෙකු සාමාන්‍ය රාජකාරියට අමතරව උපරිම වශයෙන් සේවයේ යෙදවූයේ නම් එම නිලධාරියාට කලින් ලබාගත් දීමනාවට සාපේක්ෂව සියයට **456** සිට සියයට **942** ක් දක්වා වූ ඉහළ අගයක් සහිත දීමනාවක් ලබා ගැනීමේ හැකියාව ලැබී තිබුණි. තවද අමාත්‍යාංශයෙන් පිටත රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතනවල සේවයේ නියුතු විධායක නිලධාරීන් වෙතද මෙම දීමනා වැඩිවීම ගෙවා තිබුණු අතර **2022** පෙබරවාරි **18** දින වන විට විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කර තිබුණු රෝහල් හා ආයතන **15** ක සේවයේ නියුතු විධායක නිලධාරීන් වෙත **2021** වර්ෂය තුළදී ගෙවා තිබුණු විශේෂ දීමනාවල එකතුව රු.මිලියන **6.27** ක් විය.

- වෛද්‍ය පරිපාලන පශ්චාද් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය නිලධාරීන්ට ප්‍රමුඛත්වය ලබා නොදී ඕනෑම පශ්චාද් උපාධි සුදුසුකමක් සහිත සියළුම වෛද්‍ය නිලධාරීන්ට හා දන්ත වෛද්‍ය නිලධාරීන්ට නියෝජ්‍ය පරිපාලන තනතුරුවලට ඇතුළත්වීමට සමාන අවස්ථාවක් ලබාදී තිබුණු බැවින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව **2021** අප්‍රේල් **15** දිනට රෝග නිවාරණය හා රෝගී

සත්කාරක සේවා පිළිබඳව විශේෂඥතාවය ලබා ගෙන තිබුණු වෛද්‍ය නිලධාරීන් 79 දෙනෙකු අමාත්‍යාංශයේ පරිපාලන තනතුරුවලට පත් කර තිබුණි. එබැවින් එම වෛද්‍ය නිලධාරීන්ට රෝග නිවාරණය හා රෝගී සත්කාරක සේවා පිළිබඳ විශේෂඥතාවය ලබාගැනීම සඳහා රජය විසින් වැයකළ මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණු බවත්, විශේෂඥතාවය ලබාගත් අදාළ අංශවල ප්‍රතිකාක සහ නිවාරණ සේවා පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ හිඟයක් පවතින බවත් නිරීක්ෂණය විය. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන තනතුරු සඳහා පත්වීමේ හැකියාව ඇත්තේ නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වසර 03 ක් සම්පූර්ණ කර ඇති වෛද්‍ය පරිපාලන සහ ප්‍රජා වෛද්‍ය විශේෂඥතාවය සහිත නිලධාරීන් සඳහා පමණක් බැවින් හා වෙනත් පශ්චාද් උපාධි විශේෂඥතාවය සහිතව නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන සේවයට ඇතුළත්වී ඇති වෛද්‍ය නිලධාරීන් හට විශ්‍රාම ගන්නා තෙක් එම තනතුරේම සේවයේ යෙදීමට සිදුවී තිබුණු බැවින් වෛද්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥතාවය ලබාගෙන නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට ඇතුළත්වීමට බලාපොරොත්තුවෙන් සිටින නිලධාරීන්ට එම තනතුරු ලබා ගැනීමේ අවස්ථාව අහිමිවී තිබුණු බවත්, 2021 නොවැම්බර් 25 දින වන විට වෛද්‍ය පරිපාලන විශේෂඥතාවය සහිත නිලධාරීන් 110 ක් පත්වීම් අපේක්ෂාවෙන් සිටින බවත්, එම නිලධාරීන් වෛද්‍ය පරිපාලන සේවයට අන්තර්ග්‍රහණය කර නොමැති බවත් තහවුරු විය. ඒ අනුව වෛද්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥතාවය ලබාගෙන සිටින මෙම වෛද්‍ය නිලධාරීන් 110 දෙනා ඒ වන විට රෝග නිවාරණය හා රෝගී සත්කාරක සේවාවලට අදාළ තනතුරුවල යොදවා තිබුණේද නැතහොත් කිසිදු තනතුරකට පත් නොකර වේතන හා දීමනා ගෙවන්නේද යන්න අනාවරණය නොකෙරුණි. දිවයින පුරා පැවති ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ තනතුරු 250 කින් තනතුරු 160 ක්ම පුරප්පාඩුවී තිබුණු නමුත් ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥතාවය ලද නිලධාරීන් 80 දෙනෙකු වෛද්‍ය පරිපාලන තනතුරුවලට පත්කර තිබුණි.

- විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, තනතුරු 15 ක් සඳහා පත් කර තිබුණු නිලධාරීන් 281 දෙනෙකු ත්‍රිවිධ හමුදා රෝහල්, බන්ධනාගාර හා පොලිස් රෝහල්, ශ්‍රීමත් ජනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය රෝහල, ඖෂධ නිෂ්පාදන සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය, අභ්‍යන්තර වෙළඳ ආහාර සුරක්ෂණ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වැනි අමාත්‍යාංශයෙන් බාහිර වෙනත් ආයතන 11 ක සේවයේ යොදවා තිබුණි. එම නිලධාරීන් පූර්ණ වශයෙන් හෝ ද්විතීයන

පදනමෙන් හෝ එම ආයතනවලට මුදාහැර එම ආයතනවලින් වැටුප් ගෙවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඔවුන් එම ආයතනවල සක්‍රීය සේවයේ නිරත වන්නේද යන්න තහවුරු කර ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඒ හේතුවෙන් අමාත්‍යාංශය සඳහා අනුමත තනතුරුවල පුරප්පාඩු නිර්මාණය වී තිබුණු නමුත් එම පුරප්පාඩු පිරවීමට නොහැකිවී තිබුණි. නිලධාරීන් 110 දෙනෙකු වර්ෂ 04 කට වඩා වැඩි කාලයක් එම ආයතනවල සේවයේ යොදවා තිබුණු අතර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව 2020 ජනවාරි මාසයේ සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 21 ක් තුළදී ඔවුන් වෙත අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණු වැටුප් හා දීමනා රු.මිලියන 615.24 ක් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. නිලධාරීන් 12 දෙනෙකු වෙත අමාත්‍යාංශය විසින් වැටුප් හා දීමනා ගෙවා නොතිබුණු නමුත් එම නිලධාරීන්ගේ පරිපාලන කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු අතර ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙත පූර්ණකාලීනව අනුයුක්ත කර තිබුණු වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු වෙත අමාත්‍යාංශය විසින් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

- විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, 2020 වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති 62 ක් අතරින් ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 31,650.38 ක් වූ ව්‍යාපෘති 30 ක කොන්ත්‍රාත්කරු හා උපදේශක (Contractor and Consultant/Engineer) යන තනතුරු දෙකම එකම ආයතනයක් වෙත පවරා තිබුණු බවත්, ඒ හේතුවෙන් ව්‍යාපෘතියක් වඩා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම කෙරෙහි මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සාධාරණත්වය, ස්වාධීනත්වය හා විනිවිදභාවය ආරක්ෂා කිරීම කෙරෙහිද බලපෑම් සිදුවිය හැකි බවත් නිරීක්ෂණය විය. 1991 වර්ෂයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ අත්සන් කර තිබුණු ගිවිසුමකට අනුව 2021 වර්ෂය දක්වා උපදේශන කාර්යයන් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව එම කාර්යාංශය වෙත පවරා තිබුණු අතර 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 62 ක අතරින් ව්‍යාපෘති 52 ක උපදේශන සේවා සැපයීම එම කාර්යාංශය වෙත පවරා තිබුණි. ඒ අනුවද තරඟකාරීත්වය තුළින් ලබා ගත හැකිව තිබුණු ආර්ථික වාසි අහිමිවී තිබුණි. අමාත්‍යාංශය තුළ අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා), සිවිල්, යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරුවන්, සැලසුම් ශිල්පීන් සහ කාර්මික නිලධාරීන් ඇතුළු ඉදිකිරීම් ක්ෂේත්‍රයට අයත් නිලධාරීන් 43 දෙනෙකුගෙන් සමන්විත ඉංජිනේරු අංශයක් තිබියදී, ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මෙන්ම රෝහල් විසින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන නවීකරණ

කටයුතු හා අළුත්වැඩියාවන් සඳහාද සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සහ වැඩ අධීක්ෂණ කටයුතු ගාස්තු ගෙවීමේ පදනම මත ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වැනි බාහිර ආයතන වෙත පවරා තිබුණි.

- 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු අතර 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු විය. භාණ්ඩාගාර ලේකම්වරයා විසින් එවා තිබුණු ලිපියේ දැක්වෙන කරුණුවලට පටහැනිව කටයුතු කරමින් ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිතයෙන් තොරව වර්තමාන වැටුප පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් සඳහා රු.මිලියන 41,895 ක්ද, අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 32,415 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 74,310 ක් ගෙවා තිබුණි. එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 77 ක් පමණ වී තිබුණි.

- 2021 වර්ෂය තුළදී සීමාවාසික වෛද්‍යවරයෙකු වෙත මාසික පුහුණු දීමනා ලෙස රු.48,950 ක් හා ජීවන වියදම් දීමනා ලෙස රු.7,800 ක් පමණක් ගෙවිය හැකි අතර අමාත්‍යාංශය විසින් පළාත් සභා රෝහල් වෙත පුහුණුව සඳහා අනුයුක්ත කර තිබුණු සීමාවාසික වෛද්‍යවරුන් වෙත පළාත් සභා විසින් ගෙවන එම දීමනා, අමාත්‍යාංශය විසින් එම පළාත් සභා වෙත ප්‍රතිපූරණය කළ යුතුය. එසේ වුවද, පළාත් සභා රෝහල් 20 ක නියැදියෙන් රෝහල් 14 ක සීමාවාසික වෛද්‍යවරුන් වෙත මාසික පුහුණු දීමනාව හා ජීවන වියදම් දීමනාවට අමතරව රු.750 ක මාසික දීමනාවක්ද ගෙවා තිබුණි. තවද, 2019 අප්‍රේල් 22 දිනැති අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් අනුමත කර තිබුණු රු.2,500 ක මාසික දීමනාව සීමාවාසික වෛද්‍යවරුන් වෙත ගෙවිය නොහැකි වුවද, පළාත් සභා රෝහල් 11 ක සීමාවාසික වෛද්‍යවරුන් වෙත එම දීමනාවද ගෙවා තිබුණි. එපරිදි සීමාවාසික වෛද්‍යවරුන් වෙත නිත්‍යානුකූලව හිමි නොවන දීමනා රු.මිලියන 8.47 ක් 2021 වර්ෂය තුළදී පමණක් අදාළ පළාත් සභා විසින් ගෙවා තිබුණු අතර එම මුදල අමාත්‍යාංශය විසින් පළාත් සභා වෙත ප්‍රතිපූරණය කර තිබුණි.

- හොරණ මූලික රෝහලේ සයමහල් ශල්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2015 සැප්තැම්බර් 16 දින ලබාදී තිබුණු රු.මිලියන 1,333.04 ක මූලික ඇස්තමේන්තුව පදනම් කරගෙන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියට යටත්ව පිරිමැවුම් කර ඉදිකිරීමේ පදනම මත රු.මිලියන 1,333.04 ක බදු සහිත කොන්ත්‍රාත් වටිනාකමකට මාස 24 ක් ඇතුළත වැඩ නිම කිරීමේ කොන්දේසියට යටත්ව 2017 නොවැම්බර් 27 දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත එම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය අනුව දින 14 ක් ඇතුළත වැඩ ආරම්භ කළ යුතු වුවද, ඉදිකිරීම් භූමියේ පැවති ගැටළු හේතුවෙන් වැඩ ආරම්භ කිරීමට හැකියාවක් නොමැති බව දැන දැනම ඒ බව නොසලකා 2017 දෙසැම්බර් 15 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස බදු සහිතව රු.මිලියන 221.14 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:9:1 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීද නොතිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවූ දින සිට මාස 06 කට පසුව වැඩ ආරම්භකර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 19,065 ක ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසුව 2022 වර්ෂය දක්වා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉදිකිරීම්වල සතුටුදායක ප්‍රගතියක් පවත්වාගෙන නොයාම හේතුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු.මිලියන 4.82 ක් පමණක් ආවරණය කර ගැනීමට හැකිවී තිබුණු අතර 2022 ජනවාරි 25 දින වන විටත් වැඩ නිමකර නොතිබුණි. 2016 ජුනි 15 දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් රු.මිලියන 2,465.99 ක සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර එම අතිරේක ඇස්තමේන්තුවට අදාළව තොරතුරු ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ලබාදී නොතිබීම හේතුවෙන් අනුමත ඇස්තමේන්තුව මත සිදුකළ හැකි කටයුතු නිම කිරීමට 2022 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

- ද සොයිසා කාන්තා රෝහලේ බිළිඳු මළ සිරුරු, ගබ්සා කොටස්, අජීවී ශරීර අවයව හා වැදෑමහ වැනි මෘත ශරීර කොටස් ඉවත් කර වළ දැමීම සඳහා 2019 දෙසැම්බර් මාසයේ සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 2.24 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. බැහැර කිරීම් ඒකකයක මූලික පිරිවැය ඇස්තුමේන්තුවක් සකස් කර නොතිබීම, කොන්ත්‍රාත්කරුවන්ගේ තාරාදියක් යොදා ගැනීමට ඉඩ හැරීම, එම තරාදි යාවත්කාලීනව ක්‍රමාංකනය කර ඇති බව තහවුරු කර නොගැනීම, ජලය ඉවත් කර වැදෑමහ බර මිනුම් කිරීමේ ක්‍රමවේදයක්

හඳුන්වා නොදීම, බැහැර කිරීම් සඳහා වැඩි බර ප්‍රමාණයක් යෙදීමට ඉඩහැරීම හා නීත්‍යානුකූලව මෙම බැහැර කිරීම් සිදුකරන බව තහවුරු කර නොගැනීම වැනි කරුණු හේතුවෙන් මෘත ශරීර කොටස් බැහැර කිරීම සම්බන්ධයෙන් රෝහල් අභ්‍යන්තර පාලනය සහ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය. වැදැමහ කිලෝග්‍රෑම් 01ක්, බිළිඳු මළ සිරුරක්, ගබ්සා කොටස් කිලෝග්‍රෑම් 01 ක් සහ ශරීර අවයව කිලෝග්‍රෑම් 01 ක් බැහැර කිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් කිසිඳු සැසඳීමකින් තොරව 2020 වර්ෂයේ ඒකක මිල ගණන් වලට සාපේක්ෂව 2021 වර්ෂයේදී එම ද්‍රව්‍ය ඒකකයක් වෙනුවෙන් සියයට 521 සිට සියයට 6371 ක් දක්වා වූ අවාසිදායක මිල විචලනයන් සහිතව කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබුණු ඒකක මිල ගණන් මත පදනම්ව රෝහල විසින් ගෙවීම් කර තිබුණි. ඒ හේතුවෙන් 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ අජීවී ශරීර කොටස් බැහැර කිරීමේ වියදම සියයට 8070 කින් සහ ගබ්සා කොටස් බැහැර කිරීමේ වියදම සියයට 696 කින් ඉහල ගොස් තිබුණි. 2021 දෙසැම්බර් 21 දින සිට 2022 ජනවාරි 25 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රෝහල තුළ සිදුකර තිබුණු දරු ප්‍රසූත 553 කින් ඉවත් කර තිබුණු වැදැමහවල බර කිලෝග්‍රෑම් 550 ක් සහිත බඳුන් බහා තිබුණු ශීතකරණයේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් එම බඳුන්වල ජලය එකතුවී තිබුණු බව 2022 ජනවාරි 26 දින සිදුකර තිබුණු භෞතික විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ජලය සමඟ වැදැමහ ඒකකයක සාමාන්‍ය බර ග්‍රෑම් 995 ක් විය. එසේම 2022 පෙබරවාරි 02 හා 03 යන දිනවලදී සිදුකර තිබුණු දරු ප්‍රසූති 19 කදී බැහැර කර තිබුණු වැදැමහවල බර ග්‍රෑම් 10,700 ක් වූයෙන් වැදැමහ ඒකකයක සාමාන්‍ය බර ග්‍රෑම් 563 ක් විය. අන්තර්ජාලයෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව දරු ප්‍රසූතියේ දී බැහැර කරන වැදැමහක බර පරාසය ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 800 දක්වා විහිදෙන බවත් එය ශීතකරණයේ ගබඩා කිරීම නිසා එකතුවන ජලය සමඟ වැදැමහක බර කිලෝග්‍රෑම් 01 ක් වන බවත් නිරීක්ෂණය විය. එම නිර්නායකය මත ගණනය කළ විට 2019 නොවැම්බර් 29 දින සිට 2021 ඔක්තෝබර් 26 දින දක්වා වූ වර්ෂ 01 මාස 11 ක කාලපරිච්ඡේදය තුළදී වැදෑහම කිලෝග්‍රෑම් 29,616 ක් වෙනුවෙන් රු.මිලියන 1.02 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

- 2021 ජනවාරි සිට 2022 ජනවාරි දක්වා වූ වර්ෂයක කාලපරිච්ඡේදය තුළදී කළුතර ශික්ෂණ රෝහලේ රෝගීන්ට සහ කණිෂ්ඨ සේවකයින්ට පිසූ ආහාර සැපයීමට අවශ්‍ය අමු ආහාර ද්‍රව්‍ය සැපයුම්කරුවන් දෙදෙනකු විසින් සපයා තිබුණි. 2020/2021 හා 2021/2022 යන වර්ෂ සඳහා ආහාර, පළතුරු හා අනෙකුත් ද්‍රව්‍ය වර්ග පිළිවෙලින් 111 ක හා 148 ක මාසික අවශ්‍යතාවයක් හඳුනාගෙන තිබුණු නමුත්

විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු 2021 වර්ෂයේ මුල් මාස 04 හි අමු ආහාර සැපයීම සම්බන්ධයෙන් වූ තොරතුරුවලට අනුව, ඇණවුම් කළ ප්‍රමාණය මාසික අවශ්‍යතාවයෙන් සියයට 75 ඉක්මවූ අයිතම ගණන ඉතා අඩු ප්‍රමාණයක් බවත්, මාස 04 තුළ ඇණවුම් නොකළ අයිතම සංඛ්‍යාව මුළු අයිතම සංඛ්‍යාවෙන් සියයට 45 ක් පමණ වූ බවත්, එසේ ඇණවුම් නොකළ අයිතම සඳහා මාස 04 වෙනුවෙන් වූ කොන්ත්‍රාත් වටිනාකම රු.1,978,640 ක් වූ බවත් නිරීක්ෂණය විය. එසේම පළමු මාස 04 හි සත්‍ය වශයෙන්ම සැපයූ අමු ආහාරවල වටිනාකම ඇස්තමේන්තුගත මාසික අවශ්‍යතාවයෙහි වටිනාකමින් සියයට 47 ක් පමණ විය. ඒ අනුව කිසිදු තාර්කික ක්‍රමවේදයකින් තොරව මාසික ද්‍රව්‍ය අවශ්‍යතාවය ඇස්තමේන්තු කර ඇති බවත්, එමගින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සංකීර්ණ තත්ත්වයට පත්කර තරඟකාරීත්වය සීමා කර තිබුණු බවත්, මෙම තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබාගෙන සිටින කොන්ත්‍රාත්කරුවන් කිහිප දෙනෙකු රෝහල විසින් ඇණවුම් නොකරන හා අඩුවෙන් ඇණවුම් කරන ද්‍රව්‍ය සඳහා අඩු මිලකුත්, වැඩිපුර ඇණවුම් කරන ද්‍රව්‍ය සඳහා වැඩි මිලකුත් ඉදිරිපත් කර කොන්ත්‍රාත්තුව ලබාගන්නා බවත්, කොන්ත්‍රාත්කරු විසින් සාපේක්ෂව අඩු ඒකක මිලක් ඉදිරිපත් කර තිබුණු ද්‍රව්‍ය ඇණවුම් කිරීමෙන් රෝහල් බලධාරීන් වැළකී තිබුණු බවත්, අනවශ්‍ය අයිතම ඉවත් කර තාත්වික ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම මගින් මෙම ප්‍රසම්පාදනය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව වෙත පවරා ප්‍රමාදයන් අවම කළ හැකිව තිබුණු බවත් නිරීක්ෂණය විය. සේවක ආහාර අපතේ යාම අවමකර ගැනීම සඳහා යම් කිසි ආහාර ප්‍රමාණයක් කපාහැරීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබීමෙන් විගණනය කළ 2022 ජනවාරි 10 දින සිට 2022 ජනවාරි 21 දින දක්වා වූ කාල පරාසය තුළ පිසින ලද ආහාර විශාල ප්‍රමාණයන්ගෙන් ඉතිරිවීම් පැවති බවත්, සමහර දිනවලදී කිලෝග්‍රෑම් 34 ඉක්මවා පිසින ලද බත් ඉතිරිවී තිබුණු බවත් නිරීක්ෂණය විය. 2022 ජනවාරි 10 විගණනය ආරම්භ කළ දින උදය, දිවා හා රාත්‍රී සේවක ආහාර ඇණවුම් කළ සේවක සංඛ්‍යාව පිළිවෙළින් 300 ක්, 280 ක් හා 85 ක් වුවද, 2022 ජනවාරි 20 දින වන විට එම සේවක සංඛ්‍යාව පිළිවෙළින් 110 ක්, 225 ක් හා 65 ක් දක්වා අඩුකිරීමට හැකිවී තිබුණි. ඒ අනුව රෝහල් බලධාරීන් සේවක ආහාර ලබාදීමේ ක්‍රියාවලිය නිසි අධීක්ෂණයකට ලක් කලේ නම් සේවක ආහාර සඳහා වැයවන වාර්ෂික වියදමෙන් සියයට 40 ක් පමණ අඩු කර ගැනීමට හැකියාව තිබුණු බව නිරීක්ෂණය විය.

- ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණු රු.මිලියන 40 ක මූල්‍ය සීමාව ඉක්මවා එකක් සඳහා රු.මිලියන 10.6 ක් බැගින් රු.මිලියන 53 ක් වැයකර වායු සමීකරණය කරන ලද සුඛෝපභෝගී ආසන 54 ක් සහිත බස් රථ 05 ක් හෙද විදුහල් 05 ක් සඳහා 2018 අප්‍රේල්

මාසයේදී මිලදී ගෙන තිබුණි. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදී ගෙන තිබුණු මෙම බස් රථ හෙද විදුහල් පිහිටි පළාත්වල මාර්ගවල ධාවනය කිරීමේ අපහසුතාවය නිසාද, සමහර හෙද විදුහල් පරිශ්‍රවලට ඇතුළත් කළ නොහැකිවීම නිසාද, විවිධ තාක්ෂණික දෝෂ නිසාද ඌන උපයෝජිතව ගාල් කර තිබුණි. 2018 අප්‍රේල් මාසයේ සිට 2021 දෙසැම්බර් 31 දින වන විට ගතවී තිබුණු මාස 44 ක කාලය තුළදී බස්රථ 05 හි ධාවනය කර තිබුණු මුළු දුර කිලෝ මීටර් 94,260 ක් පමණක් වූ අතර බස්රථයක් මාසයක් තුළ ධාවනය කරන ලද සාමාන්‍ය දුර ප්‍රමාණය කිලෝ මීටර් 428 ක් පමණක් විය. එසේම ඉන්ධන ලීටරයකට කිලෝ මීටර් 1.2 සිට කිලෝ මීටර් 3 දක්වා දුරක් පමණක් ධාවනය කර තිබුණු බව දෛනික ධාවන සටහන් අනුව තහවුරු විය.

- 2021 අංක 09 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් 2020 මැයි 20 දින සිට බලාත්මක වන පරිදි කොවිඩ් 19 වසංගතය හමුවේ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, තාක්ෂණික උපකරණ, උපාංග හා ඒවායේ කොටස් ඇතුළු යන්ත්‍ර සූත්‍ර සහ මෙවලම්, රෝහල් හෝ වෛද්‍ය ගෘහ භාණ්ඩ සහ ඖෂධ, රසායනික ද්‍රව්‍ය සහ එවැනි අයිතම එකතු කළ අගය මත බදුවලින් නිදහස් කර තිබුණු නමුත්, ඒ බව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන, රෝහල් හා ව්‍යාපෘති වෙත දැනුවත් කර නොතිබුණු අතර ඒ පිළිබඳව පසුවිපරමක් සිදුකරද නොතිබුණි. ඒ හේතුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 04 ක් මගින් කොවිඩ් 19 වසංගතය පාලනය කිරීම සඳහා මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයුම් වෙනුවෙන් රු.මිලියන 130.57 ක එකතු කළ අගය මත බදු සැපයුම්කරුවන් 74 දෙදෙනෙකු වෙත ගෙවා තිබුණි. ඊට අමතරව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2020 ජුනි සිට 2021 අගෝස්තු දක්වා කාලය තුළදී රු.මිලියන 159.10 ක එකතු කළ අගය මත බදු සැපයුම්කරුවන් තිදෙනෙකු වෙත ගෙවා තිබුණු බව අංක FIB/05/2021 දරන 2022 පෙබරවාරි 02 දිනැති අභ්‍යන්තර විගණන විමසුමට අනුව තහවුරු විය.

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන 60 ක් සතු ඉඩම් හා ගොඩනැගිලි උපයෝජනය පිළිබඳව විගණනය කිරීම සඳහා ඉල්ලුම් කළ තොරතුරු, අමාත්‍යාංශය ඇතුළුව අනෙකුත් රෝහල් හා ආයතන 25 ක් වෙතින් මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් නොකෙරුණි. රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන 35 ක් විසින් ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව, රෝහල් 02 ක් සතු ඉඩම් සඳහා විධිමත් ඔප්පු පිළියෙල

සෞඛ්‍ය අංශය

කර නොතිබුණු අතර රෝහල් 03 ක් සතු ඉඩම් සඳහා රජයේ අනුමත මිනුම්දෝරු සැලසුම් පිළියෙල කර නොතිබුණි. එසේම රෝහල් 19 ක් සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම්වල පවුල් 169 ක් පමණද, රත්නපුර ශික්ෂණ රෝහලට අයත් ඉඩම්වල පවුල් 36 ක්ද, මුල්ලේරියාව නැගෙනහිර කොළඹ මූලික රෝහලට අයත් ඉඩම්වල පවුල් 40 ක්ද, ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට අයත් හෙක්ටයාර් 0.1764 ක බිම් කොටස් 04 ක පවුල් 04 ක්ද, නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලට අයත් හෙක්ටයාර් 0.4401 ක ඉඩම් කොටස් 07 ක 12 දෙනෙකුද, ගම්පොල මූලික රෝහල සතු තක්සේරු කර නොමැති පර්චස් 05 ක ඉඩමක එක් පුද්ගලයෙකුද අනවසරයෙන් පදිංචිව සිටින නමුත් අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම් කොටස් ආපසු ලබා ගැනීමට වගකිව යුතු පාර්ශවයන් විධිමත් හා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. කෑගල්ල මහ රෝහලට අයත් වර්ග අඩි 225 ක පරිපාලන ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිට රු.8,500 ක මාසික කුලියට ලංකා බැංකුව වෙතද, වටිනාකම තක්සේරු කර නොතිබුණු නමුත් දළ වශයෙන් රු.මිලියන 20.00 ක් පමණ වටිනා නාදෙණිය වත්ත යන ඉඩමෙන් පර්චස් 40 ක පමණ කොටසක් වසර 50 කට අධික කාලයක සිට ලංකා විදුලිබල මණ්ඩලය වෙතද සහ ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට අයත් ඉඩමෙන් පර්චස් 20 ක් පමණ 1996 අප්‍රේල් 10 දින සිට කරාපිටිය මහජන බැංකුව වෙතද ලබාදී තිබුණු නමුත්, ඊට අදාළ ලිඛිත ගිවිසුම් හෝ පැවරීම් ලිපි එම රෝහල් සතුව නොතිබුණි. මහනුවර ජාතික රෝහල සතු ඉඩමක පොලිස් දෙපාර්තමේන්තුව විසින් හන්තාන සිසිල ගොඩනැගිල්ලද, හැදල ලාදුරු රෝහල සතු ප්‍රමාණය හා වටිනාකම තහවුරු කර නොගත් ඉඩම්වල සිංහ සමාජය, හේකිත්ත ක්‍රිස්තුරාජ විද්‍යාලය, රණවිරු සම්පත් කේන්ද්‍රය, හින්දු කෝවිල, ගංගාතිලක විහාරය, නාවික පොලිස් ඒකකය යන ආයතන පිහිටුවා තිබුණු නමුත් එම ඉඩම් නිරවුල් කර ගැනීමට හෝ පවරා දීමට කටයුතු කර නොතිබුණි.

- කාසල් වීදියේ කාන්තා රෝහල විසින් 2018 අගෝස්තු සිට 2019 ජනවාරි දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රෝහල් පවිත්‍රතා සේවය ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී, පවිත්‍රතා සේවකයින්ගේ මාසික පැමිණීමේ ලේඛන සහ වැටුප් වාර්තා පරීක්ෂාවකින් තොරව ගෙවීම් කර තිබීම හේතුවෙන් රු. මිලියන 3.85 ක්ද, 2018 ජූලි 16 දිනැති අංක 2080/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, පවිත්‍රතා සේවා කර්මාන්ත සේවයේ නියුතු වූවන් සඳහා රජය මගින් වැඩිකර තිබුණු දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 දෙසැම්බර් 17 දිනැතිව ලබාදී තිබුණු කොන්දේසි 04 කට පටහැනිව හිඟ වැටුප්

ගෙවීම හේතුවෙන් රු. මිලියන 3.35 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 7.20 ක් සැපයුම්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි.

ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

- 2021 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය තුළ වෛද්‍ය සැපයුම් අයිතම 21,678 ක් ඇතුළත් කර තිබුණි. ඉල්ලුම් කරන ලද පරිමාව වෙනස්වීම, හදිසි ඇණවුම් ස්ථාපනය කිරීම, අඩංගු ඇසුරුම වෙනස්වීම, පෙති වෙනුවට කරල් සැපයුම් කිරීම, කමිටු අනුමැතිය නොමැති ඇතැම් අයිතම අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කිරීම සහ සැපයුම්කරුවන්ගේ පිරිවිතර වෙනස්වීම වැනි විවිධ අවශ්‍යතාවයන් මත ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටු අනුමැතිය නොලද වෛද්‍ය සැපයුම් අයිතම 8,258 ක් පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණි. ඒ අනුව පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණු මුළු වෛද්‍ය සැපයුම් අයිතම සංඛ්‍යාවෙන් සියයට 38 ක්ම වට්ටෝරු සමාලෝචන කමිටු අනුමැතිය නොලත් අයිතම විය. එසේම වෛද්‍ය සැපයුම් අංශය විසින් 2021 වර්ෂය සඳහා වට්ටෝරු සමාලෝචන කමිටු අනුමැතිය නොලද පිරිවැය රු.මිලියන 67,520 ක්වූ වෛද්‍ය සැපයුම් අයිතම 104 ක් මිලදී ගෙන තිබුණි.

- 2022 අප්‍රේල් 22 දින වන විට තොග ශුන්‍ය වූ වැදගත් (Vital) ඖෂධයක් වූ හෘද රෝග සඳහා භාවිතා කරන Streptokianse එන්නතේ 2022 වර්ෂය වෙනුවෙන් වූ ඇණවුම 2021 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණු නමුත් සැපයුම්කරුවන්ගෙන් ලංසු ඉදිරිපත් නොවීම නිසා දෙවරක් ටෙන්ඩරය අවලංගු කර නැවත ලංසු කැඳවා තිබුණි. 2022 මාර්තු මාසය වන විටත් ටෙන්ඩරය ඇගයීම් මට්ටමේ පැවති බැවින් තොග හිඟයක් නිර්මාණය වී තිබුණි.

- Streptokianse එන්නත භාවිතා කිරීමේදී ඇතිවී තිබුණු අතුරු ආබාධ හේතුවෙන් එම එන්නත වෙනුවට Tenecteplase 40mg එන්නත මිලදී ගෙන තිබුණි. Tenecteplase 40mg එන්නත සඳහා ඉකුත් වර්ෂවලදී නිකුත් කර තිබුණු ඇණවුම් සඳහා ලැබීමට නියමිත තොග ප්‍රමාණවත් බැවින් 2022 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ ඇණවුම අවලංගු කිරීමට 2021 සැප්තැම්බර් 14 දින වෛද්‍ය සැපයීම් අංශය තීරණය කර තිබුණි. නමුත් 2022 අප්‍රේල් 22 දින වන විට වෛද්‍ය සැපයීම් අංශය තුළ මාස 02 කට වඩා අඩු කාලයක් සඳහා තොග පවතින බැවින් තොග හිඟයක් නිර්මාණය වී තිබුණි.

- ඇණවුම නිකුත් කර මාස 24 කට වඩා වැඩි කාලයකට පසුව ණයවර ලිපි නිකුත් කර තිබීම හා විවිධ හේතු මත ඇණවුම් සංශෝධනය කර තිබීම වැනි හේතු මත නිර්වින්දන කටයුතු සඳහා භාවිතා කරන Suxamethonium chloride එන්නත 2022 අප්‍රේල් 22 දින වන විට වෛද්‍ය සැපයීම් අංශය තුළ සති 02 කට වඩා අඩු කාලයක් සඳහා පමණක් තොග පැවති අතර රෝහල්

තුළ මාස 02කට වඩා අඩු කාලයක් සඳහා තොග පැවතුණි.

- ඇණවුම නිකුත් කර මාස 27 කට වඩා වැඩි කාලයකට පසුව ණයවර ලිපි නිකුත් කර තිබීම, විවිධ හේතු මත ඇණවුම් ප්‍රතික්ෂේප කර තිබීම හා අවලංගු කර තිබීම සහ 2022 වර්ෂය වෙනුවෙන් කිසිඳු ඇණවුමක් වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කර නොතිබීම වැනි හේතු මත අත්‍යාවශ්‍ය ඖෂධයක් වූ ආසාත්මිකතාවන් සඳහා භාවිතා කරන Cetirizine HCL සිරප් ඖෂධය 2022 අප්‍රේල් 22 දින වන විට තොග ශූන්‍යවී තිබුණු අතර රෝහල්වල සති 05 කට පමණ ප්‍රමාණවත් තොග පමණක් පැවතුණි. 2022 අප්‍රේල් 22 දින වන විට කාසල් වීදියේ කාන්තා රෝහල, කුරුණෑගල ශික්ෂණ රෝහල හා බදුල්ල මහ රෝහල යන රෝහල්වල තොග මට්ටම් ශූන්‍ය වී තිබුණි.

- 2021 වර්ෂය සඳහා වූ ඇණවුමෙහි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී නිවැරදි තීරණ නොගැනීම හා නිසි පරිදි සැලසුම් නොකිරීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු මට්ටමේ සිට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු මට්ටම දක්වා විතැන්වීම, ඇණවුමේ ප්‍රමාණය වරින්වර වෙනස් කිරීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වෙතින් රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වෙත හුවමාරු වීමත්, නැවතත් කොන්ත්‍රාත් වටිනාකම ඉහළ යාම මත රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු මට්ටමේ සිට අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු වෙත විතැන් වීමත් ආදී වූ කරුණු හේතුවෙන් ඖෂධ තොගය ලැබීමට ආසන්න වශයෙන් වර්ෂ 02 ක කාලයක් ගතවී තිබීම, 2022 වර්ෂය වෙනුවෙන් 2021 පෙබරවාරි 23 නිකුත් කර තිබුණු ඇණවුමද ඇගයීම් මට්ටමේ පැවතීම හේතුවෙන් අත්‍යාවශ්‍ය ජීවිතාරක්ෂක ඖෂධයක් වන Meropenem1g එන්නත 2022 අප්‍රේල් 22 දින වන විට වෛද්‍ය සැපයීම් අංශයේත්, රෝහල්වලත් මාසයකට අඩු තොග ප්‍රමාණයක් පමණක් පවතින බව නිරීක්ෂණය විය. මෙම ප්‍රමාදය හේතුවෙන් එකක් රු.481 කට මිලදී ගත හැකිව තිබුණු මෙම ඖෂධය 2021 වර්ෂයේදී රජයේ රෝහල් විසින් එකක් රු.1,956 ත් රු.4,697 ත් අතර වූ විවිධ මිල ගණන් යටතේ රු.මිලියන 49.52 ක් වැයකර දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණි.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

- 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 142 වගන්තිය ප්‍රකාරව 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කර තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග අංක 4 හි දක්වා තිබුණු පරිදි ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක්ම ලේඛනගත කිරීමට එක් පොදු ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් ඖෂධ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත ලද දිනය, ඉල්ලුම් පත්‍රයේ අංකය, නිෂ්පාදකයාගේ නම, නිෂ්පාදිත රට, බලය ලත් ආනයනකරු, ඖෂධීය නාමය, එම ඖෂධය ඖෂධීය

සංයෝගයක් නම් එහි සක්‍රීය සංඝටකවල ඖෂධීය නාමයන්, ඖෂධයේ වෙළඳනාමය, ඖෂධයේ මාත්‍රා ආකාරය, ඖෂධයේ ප්‍රබලතාවය, ඉල්ලුම් පත්‍රයේ වර්ගය (නව හෝ අළුත් කිරීමක් සඳහා වන අයදුම්පතක්ද යන බව) ඖෂධයේ වර්ගය ආදී වූ විස්තර මෙන්ම ඒ ඒ අයදුම්පත වෙනුවෙන් ලද මුදල් පිළිබඳ විස්තර, ඒ ඒ අයදුම්පත ඖෂධ නියාමන අංශය වෙත ඇගයීම සඳහා ඉදිරිපත් කළ දිනය, ඒ ඒ අංශ විසින් ප්‍රතික්ෂේපිත අයදුම්පත් ප්‍රමාණය හා අනුමත කළ අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශවල තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශ විසින් ලියාපදිංචියට ගත කළ කාලය ආදී වූ තොරතුරු විගණනය සඳහා ලබාගත නොහැකි විය. ඒ අනුව ඖෂධ ලියාපදිංචිය සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

- අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 මැයි 03 දින ප්‍රදානය කර තිබුණි. මෙම ලේඛන සහ කාර්යප්‍රවාහ කළමනාකරණ පද්ධතිය සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීම Operational Expenditure Financing මොඩලය අනුව ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගතවී තිබුණු අතර 2019 ජූනි මාසයේ සිට 2021 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් සමාගම වෙත රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා හෝ මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු සමහර තොරතුරු මකා දමා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන විමර්ශන කටයුතු අවසන් වන තෙක් හා 2022 ජූලි 27 දින වන විටත් සේවාව අක්‍රීය තත්වයට පත්වී තිබුණි. එසේම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය උපදේශනය, කළමනාකාරීත්වය හා තාක්ෂණික උපදෙස් ලබාගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ 2018 ජූනි 25 දින වර්ෂයක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්ෂ 05 ක් වූ කොන්ත්‍රාත් කාලයට සමාන්තරව එම ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳ සැලකිලිමත් වීමට, මුරපද වෙනස් කිරීමට හෝ තොරතුරු අවභාවිතා කිරීම වැළැක්වීමට කටයුතු කර නොතිබුණු අතර පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමෙන් පසු manual හා automation පද්ධති දෙක සමාන්තරව ක්‍රියාත්මක කර අධිකාරියේ අභ්‍යන්තර වැඩ ප්‍රවාහය (workflow) පිළිබඳ විගණන පරීක්ෂණයක් (Audit trial) සිදුකර නොතිබුණි. එමෙන්ම ලිපිගොනු කළමනාකරණය, සංරක්ෂණය හා ලේඛන පිටපත් ආරක්ෂිතව වර්ෂ 05 ක් දක්වා අදාළ දත්ත සමඟ ගබඩා කිරීමේ හැකියාව, දිනපතා, සතිපතා හා මාසිකව ස්වයංක්‍රීය පිටපත් ලබා ගැනීම හා වෘත්තීමය වගකීම් රක්ෂණාවරණ ලබාගැනීම පිළිබඳව

තහවුරුවක් ලබා ගැනීම යන කරුණු කෙරෙහි කළමනාකරණය සැලකිලිමත්වී නොතිබුණු අතර අදාළ දත්ත හා ඇමුණුම් තොරතුරුවල ආරක්ෂිත පිටපත් ලබා නොගෙන සමාගම වෙත ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, පිරිවැය රු.7,558,128 ක් වූ මෙම පද්ධතිය තුළ වූ වත්කම් ප්‍රාග්ධනගත කළ යුතු වුවද, ඒ වෙනුවට එම මුදල ලාභයට එරෙහිව කපාහැර තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා මකාදමා තිබූ දත්ත නැවත ස්ථාපනය කිරීම සඳහා පත්කළ විශේෂඥ කමිටු වාර්තා අනුව පද්ධතියෙන් මකා දමා තිබූ දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බවට 2022 ජූලි 15 දිනැති වාර්තාව මගින් ඉදිරිපත් කර තිබුණු අතර 2022 ජූලි 27 දින වන විටත් මෙම පද්ධතිය නැවත භාවිතයට ගන්නේද නැද්ද යන්න පිළිබඳව තීරණය කර නොතිබුණි. මෙම පද්ධතියේ කටයුතු අක්‍රීය කළ පසු තාවකාලික පිළියමක් ලෙස ගූගල් යෙදුමක් (Google Form) භාවිතයෙන් ඖෂධ, උපකරණ ආදිය ලියාපදිංචි කටයුතු සිදුකළද එහි ඇතිවූ ගැටළු හේතුවෙන් මෙම ක්‍රමය අඩුපාඩු සහිතව පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

- ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ කාර්යමණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටියේ පවතින වැටුප් විෂමතා ඉවත්කොට වැටුප් පරිමාණ නැවත යාවත්කාලීන කිරීම, මානව සම්පත් ගැටළු විසඳීම, උසස්වීම් ලබාදීමේ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම හා ආයතනික සංවිධාන ධූරාවලිය විධිමත්ව සැකසීමේ අරමුණින් බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කිරීමට සුදුසු විශේෂඥ දැනුමක් සහ අත්දැකීම් සහිත පුද්ගලයෙකුගේ සේවාව ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ උපදේශකවරයෙකු බඳවා ගෙන තිබුණි. කාර්ය පැවරුමේ වටිනාකම රු.මිලියන 3.04 ක් වූ අතර 2020 ඔක්තෝබර් 20 දිනැති ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ගිවිසුම් ගත මුදලින් සියයට 25 ක්වූ රු.මිලියන 0.76 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශකයින් තෝරාගැනීම හා සේවා නියුක්ත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4, 3.5, 4.2, 4.4 හා 6.4.4 මාර්ගෝපදේශ වලින් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත පදනම්ව මෙම උපදේශකවරයා තෝරාපත් කරගෙන තිබුණි. ගිවිසුම ප්‍රකාරව ප්‍රසම්පාදනය පිරිනැමූ දින සිට මාස 04 ක් තුළ අදාළ කාර්යය නිම කළ යුතු වුවද, මෙම වාර්තාවේ දිනය වන විට වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණු නමුත් බඳවාගැනීමේ පටිපාටිය සකස් කිරීමේ කටයුතු නිමකරවා ගැනීමට නොහැකි වී තිබුණි.

- රසායනාගාර කාර්යමණ්ඩලය විසින් රාත්‍රී කාලය තුළ සිදුකරන රසායනාගාර පරීක්ෂණ සඳහා කැලි පදනම මත දීමනා ගෙවීමේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2006 මැයි 10 දිනැති පොදු චක්‍රලේඛ ලිපියට අනුකූල නොවන ලෙස

රාත්‍රී කාලයේ සේවයේ යෙදෙන වෛද්‍ය රසායනාගාර තාක්ෂණික නිලධාරීන් විසින් ඉල්ලුම් කරනු ලබන සියලුම පරීක්ෂණ සඳහා කැලී පදනම මත ගෙවීම් සිදු කර තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා කාලය තුළ විවිධ රසායනාගාර පරීක්ෂණ 154,687ක් සඳහා රු.මිලියන 3.48 ක දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

- ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 2013 අගෝස්තු 29 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමට හා එහි ගනුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2022 අප්‍රේල් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

- රජයේ රෝහල් සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීමට හා රෝහල් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමේ අරමුණින්, සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය 1998 සැප්තැම්බර් මාසයේදී හඳුන්වාදී තිබුණු අතර සෑම දිනුම් අදින වාරයකටම ප්‍රථමයෙන් එම වාරයේ අරමුදලින් කෙරෙන කාර්යය හඳුනාගෙන ප්‍රකාශයට පත් කර එකී කාර්යය ඉටු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම 2020 හා 2021 වර්ෂ සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නිකුත් කිරීම සඳහා අරමුදලේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුළත් වැඩ සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස 2020 මාර්තු 06 දින භාණ්ඩාගාර මෙහෙයුම් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලීමක් කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් එවැනි වැඩ සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. ලොතරැයි ආදායමෙන් කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් අරමුදල සතුව නොපැවතීම හේතුවෙන් 2021 දසැම්බර් 31 දින වනවිට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.මිලියන 113.55 ක් නිදහස් කරවා ගැනීමට නොහැකිවී තිබුණි. 2014 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 428.49 ක් ලොතරැයි ආදායම් ලෙස ලැබී තිබුණු අතර ඉන් රෝහල් උපකරණ මිලදීගැනීම හා රෝහල් අළුත්වැඩියාකිරීම ආදී අරමුණුගත කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 20.58 ක් හා රු.මිලියන 156.75 ක් ලෙස එකතුව රු.මිලියන 177.33 පමණක් වැයකර තිබුණි. ලොතරැයි ආදායම් උපයෝජනය සියයට 41 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

- අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකි වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් හා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කර ගන්නා ආකාරය පිළිබඳ වැඩ සැලසුම් පිළියෙළ කර නොතිබුණි. කෙසේ වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විට පොදු අරමුදලට ලැබී තිබුණු මුළු මුදල රු.මිලියන 599.75 ක්වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදලින් වැයකර තිබුණු මුදල රු.මිලියන 33.46 ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 6 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

- ශ්‍රී ලංකාව පුරා ආරණ්‍ය 565 ක භික්ෂූන් වහන්සේලාට සුවධරණී කැපකරු වෛද්‍ය සේවා සැපයීමට ආරම්භ කළ ව්‍යාපෘතියක කැපකරු වෛද්‍යවරුන් ලෙස පත්කිරීමට අපේක්ෂිත පාරම්පරික වෛද්‍යවරුන් වෙත ලබාදීම සඳහා රු. මිලියන 2.9 ක් වැයකර ඖෂධ රැගෙන යන ගමන් මළු 1,000 ක් මිලදී ගෙන තිබුණි. ආරණ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පත්කළ හැකි උපරිම කැපකරු වෛද්‍යවරුන් සංඛ්‍යාව 565 ක් වන බැවින් වැඩිපුර ගමන් මළු 435 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 1.26 ක් වැය කර තිබුණු අතර එය නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය. තවද, 2022 අප්‍රේල් 08 දින වන විටත් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක පාරම්පරික වෛද්‍යවරුන් 105 දෙනෙකුට පමණක් ගමන් මළු බෙදාදී තිබුණු බවත්, එදිනට ගමන් මළු 895 ක් ඉතිරිවී තිබුණු බවත්, කැළණිය රජමහා විහාරයේදී පවත්වා තිබුණු බෙදාහැරීමේ උත්සවය සඳහා රු.223,300 ක් වැයකර තිබුණු බවත්, ගමන් මළු 1,000 මිලදී ගැනීම සහ ඒවා නිකුත් කිරීම පිළිබඳ දත්ත හා තොරතුරු තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

- මහජනතාව තුළ සෞඛ්‍යාරක්ෂිත දේශීය ආහාර භාවිතය ප්‍රචලිත කිරීම හා බෝ නොවන රෝගවලින් ජනතාව මුදාගැනීමේ අරමුණින් පෝෂදායී දේශීය ආහාර අලෙවි කිරීම සඳහා දිවයින පුරා පෝෂණ මන්දිර අලෙවිහල් ස්ථාපිත කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 1.8 ක හා රු.මිලියන 5 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ අනුව එම වර්ෂ දෙක තුළදී පිළිවෙලින් රු.මිලියන 1.68 ක් හා රු.මිලියන 4.85 ක් වශයෙන් එකතුව රු.මිලියන 6.53 ක් වැයකර තිබුණු අතර ඉන් රු.මිලියන 5 ක් හෙවත් සියයට 77 ක්ම ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් වැයකර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දින වන විට පෝෂණ මන්දිර 35 ක් ඉදිකර තිබුණු නමුත් ඒවා ක්‍රියාත්මක තත්වයේ පවතින්නේද සහ අරමුණ ඉටුවන්නේද යන්න පිළිබඳ කිසිඳු පසු විපරමක් අමාත්‍යාංශ විසින් සිදුකර නොතිබුණි.

ආයුර්වේද දෙපාර්තමේන්තුව

- 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පවත්වා ගෙන යාමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රම භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.

- ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදී තිබුණු අතර එහි සාර්ථකත්වය මත ව්‍යාපෘති ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු විය. නමුත් එපරිදි කටයුතු නොකර 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 897.2 ක් වැය කර වර්ෂ 16 ක් තිස්සේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීම සම්බන්ධව 2005 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- දේශීය ඖෂධ මගින් කොවිඩ් 19 වසංගතය පාලනය කිරීමට එකක් රු.1,000 ක් පිරිවැය වූ සුවධරණී ඖෂධ මංජුසා ලක්ෂ 60 ක් බෙදා දීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ආරම්භයේදී බස්නාහිර පළාතට ඖෂධ මංජුසා 250,000 ක් සැපයීමට පරිපූරක ප්‍රතිපාදන රු.මිලියන 250 ක් වෙන්කර ගෙන ඉන් රු.මිලියන 142.56 ක් වැය කර තිබුණි. ඖෂධ මංජුසා සැකසීමේ සියළුම කාර්යයන් එක් සැපයුම්කරුවෙකු වෙත ලබා දීමට හැකිවන පරිදි මිලගණන් කැඳවීමෙන් ගතවන කාලය, නිෂ්පාදනවල තත්ත්වය, අපතය හා පිරිවැය අවම කරගැනීම යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු නොකොට ඖෂධ හා කැඳ නිෂ්පාදනයට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද, ඇසුරුම් මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, කාඩ්බෝඩ් පෙට්ටි හා අත්පත්‍රිකා මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, ඖෂධ හා කැඳ ඇසුරුම් කිරීමට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද වශයෙන් සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි. තවද, ලංසු ඇගයීමේදී පැවති විවිධ අඩුපාඩු පසුව සම්පූර්ණ කිරීමට යටත්ව සැපයුම්කරුවන් තෝරා ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොසලකා කටයුතු කිරීම, සියලුම ප්‍රසම්පාදනයන් නියමිත දිනට අවසන් නොකිරීම, ප්‍රසම්පාදන

මණ්ඩලයේ අනුමැතිය රහිතව කාලය දීර්ඝ කිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම, මිල කමිටුවේ මිල ගණන් ඉක්මවා ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය. ඖෂධ මංජුසා සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා නොකිරීම, අක්‍රමවත් බෙදාහැරීම, ඖෂධ පිරවීමටත් පෙර ඇසුරුම්වල කල් ඉකුත් වීමේ දිනය මුද්‍රණය කර තිබීම හේතුවෙන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වූ සේ සලකා ඉවත් කිරීම, කල් ඉකුත්වීමට පෙර ඖෂධ භාවිතා කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රතිලාභීන්ට ලැබී නොතිබීම, ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ඖෂධ ලැබීම සහ භාවිතය පිළිබඳ අධීක්ෂණය සහ පසුවිපරම් නොකිරීම, බස්නාහිර පළාතට බෙදා හැරීමට සැලසුම් කළ මංජුසා **250,000** කින් **183,776** ක්ම ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් බෙදා හැර තිබීම, දින **60** ක් තුළ දිවයින පුරා මංජුසා ලක්ෂ **60** ක් බෙදාහැරීම සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද **2021** දෙසැම්බර් **31** දිනට දින **122** ක් ගතව තිබුණද ව්‍යාපෘතියෙන් සියයට **05** ක්වත් අවසන්කර නොතිබීම, යනාදී අඩුපාඩු මෙම ප්‍රසම්පාදනය තුළ පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

ක්‍රීඩා කටයුතු

විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් දිනා ගත් ජාත්‍යන්තර ජයග්‍රහණ
- අරමුදල් උපයෝජනය
- ක්‍රීඩා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම
- ජාතික ක්‍රීඩා සංගම් විසින් 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම.
- නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති
- ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්
- ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනය
- වත්කම් කළමනාකරණය
- වාර්ෂික ක්‍රියාකාරි සැලසුම්

ක්‍රීඩා කටයුතු

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහි කිරීම හා විනයගරුක, ක්‍රීඩාශීලී සමාජයක් ඇති කිරීම තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමට දායකවීම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මෙහෙවර වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ වන ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ඇතුළුව ව්‍යවස්ථාපිත ආයතන 10 ක්, ක්‍රීඩා අරමුදලක් හා ක්‍රීඩා සංගම් 66 ක් මඟින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අභිමානවත් ජව සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම.
- නියමිත නීති හා අණපනත් වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජනය හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධ ආයතන වල විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත, ඒ යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ වෙත හා දෙපාර්තමේන්තු 02ක් වෙත එකතුව රු.මිලියන 16,085 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 7,661 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු.මිලියන 8,424 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර රූපසටහන 45 හි දැක්වේ.



	තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදන රු.මිලියන	10,138	3,369	2,080	498	16,085
වියදම	4,667	1,016	1,520	458	7,661
ඉතිරිය	5,471	2,353	560	40	8,424

රූපසටහන 45 : ශුද්ධ ප්‍රතිපාදනය හා උපයෝජනය

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් දිනා ගත් ජාත්‍යන්තර ජයග්‍රහණ

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් ජාත්‍යන්තර තරගාවලි 11කට සහභාගී වී හෙල්ල විසි කිරීමේ ඉසව්වෙන් ලෝක වාර්තාවක් පිහිටුවීමට සමත් වී තිබුණු අතර අනෙකුත් ජයග්‍රහණ ලෙස රන් 08 ක් රිදී 04 ක් සහ ලෝකඩ 13 ක් වශයෙන් පදක්කම් 25ක් ලබා ගෙන තිබුණි.

අරමුදල් උපයෝජනය

- තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය රු.මිලියන 10,137.7 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,666.6 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5,471.1 ක් හෙවත් සියයට 54 ක් ඉතිරි වී තිබුණි.

- ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,369.8 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,016.3 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,353.4 ක් හෙවත් සියයට 70 ක් ඉතිරි වී තිබුණි.

ක්‍රීඩා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම

අභිමානවත් තුලිත පෞරුෂත්වයකින් යුතු ජව සම්පන්න, තරුණ ප්‍රජාවක් හා ජවසම්පන්න නිරෝගීමත් විනය ගරුක සමාජයක් බිහි කිරීම සඳහා ක්‍රියාශීලී පරපුරක් නිර්මාණය කිරීමට "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අනුකූලව අංක 2187/27 දරණ හා 2020 අගෝස්තු 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් තරුණ ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය නියමිත නීති හා අණපනත් වලට අනුකූලව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව නගා සිටුවීම උදෙසා තරුණ හා ක්‍රීඩා විෂයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සිදු කළ යුතු වුවත් යාවත්කාලීන කරන ලද ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් 2022 මැයි 19 වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

ජාතික ක්‍රීඩා සංගම් විසින් 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම.

2016 ඔක්තොම්බර් 27 දිනැති අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇති ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවල III වන කොටස 7 (xiii) වගන්තිය අනුව සියළුම ජාතික ක්‍රීඩා සංගම් විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ජාතික ක්‍රීඩා සංගම් 9 ක මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2022 අගෝස්තු මාසය වන විටද ඉදිරිපත් කර නොතිබුණි. තවද ශ්‍රී ලංකා මේස පන්දු සංගමය විසින් 2019 සිට 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණද සංගමයට ජාත්‍යන්තර තරගාවලි හා උසස් දක්ෂතා වැඩසටහන යටතේ 2021 වර්ෂයේ දී රු.මිලියන 5.4 ක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රදානය කර තිබුණි.

නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් රු. මිලියන 1,622 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන රු. මිලියන 37ක් වියදම් කර තිබුණු ව්‍යාපෘති 5ක් සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 1155 ක් ප්‍රතිපාදන සලසා ගෙන රු.මිලියන 324 ක් වියදම් කර තිබුණු ව්‍යාපාති 13 ක් නිම නොකර අත්හැර දමා තිබීම හේතුවෙන් මෙතෙක් වැයකර ඇති රු. මිලියන 361 ක මුදල නිශ්කාර්යය වියදමක් වී තිබුණි.

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

- තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ රු. මිලියන 1,049 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන රු. මිලියන 143 ක් වියදම් කර තිබුණු ව්‍යාපෘති 11 ක ඉටු කිරීමේ ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය.

- ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රීඩා පාසල් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීමට අදාළ ක්‍රීඩකයෙක් බිහි කිරීම සඳහා ළමා වියේ සිටම දක්ෂතා සහිත දරුවන් හඳුනාගෙන

ඔවුන්ට නිසි පෝෂණය හා පුහුණුව සහිතව රැක බලා ගැනීම සඳහා සංවර්ධනය කළ යුතු ක්‍රීඩා පාසල් 16 ක් ප්‍රමුඛතා පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව තෝරාගෙන තිබුණි. ඒ සඳහා රු.මිලියන 211 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී පාසල් 11 ක වැඩ ආරම්භ කර රු.මිලියන 159 ක් වියදම් කර තිබුණු අතර පාසල් 03 ක පමණක් වැඩ අවසන් කර තිබුණි.

- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාකයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ එකතුව රු.මිලියන 58.3 ක් වූ මුදලක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වූ 2019 දෙසැම්බර් 18 දින සිට මාස 06 ක් තුළ ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබුණද 2021 වර්ෂයේ අවසානය වන තෙක් ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය වෙත ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කර තිබූ 2014 හා 2015 වර්ෂ වලදී ආරම්භ කරන ලද රු. මිලියන 47.4 ක් වටිනා ව්‍යාපෘති හතරක් පළාත් පාලන ආයතනවල හා නාගරික සංවර්ධන අධිකාරියේ අවශ්‍ය අනුමැතීන් ලබා නොගැනීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් වැඩ නවත්වන ලද මෙම ව්‍යාපෘතිවල අගය මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණු අතර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම

මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුවේ ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම ඉලක්ක කර ගනිමින් රැකියා කුසලතා සහිත මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 20 ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එයින් රු.මිලියන 1.9 ක් එනම් සියයට 9 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම 2021 දෙසැම්බර් 31 දින වනවිටත් නිමකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනය

මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුවේ වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව යෝජනා වැඩසටහන් 09 ක් සඳහා 2021 වර්ෂයට අදාළව සංශෝධිත ඇස්තමේන්තුව අනුව රු.මිලියන 159ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 104.6 ක්

වැයකර එමඟින් රැකියා අපේක්ෂකයින් 77,124 ක් ලියාපදිංචි කර රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා 7,759 ක් පමණක් ලබාදී තිබුණි. 2021 රටතුළ පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ රට වරින් වර වසා දැමීම හේතුවෙන් පසුගිය වසර තුළ නියමිත ඉලක්ක ලගාකර ගැනීමට නොහැකි වී තිබුණු බවට මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරුණු දක්වා තිබුණි.

වත්කම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 751 ප්‍රකාර සියළු වත්කම් ලේඛනගත කල යුතු බව දක්වා තිබුණද තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සතු 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. මිලියන 12.1 ක් වූ 630 KVA Sound Proof ජෙනරේටරය වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි.

වාර්ෂික ක්‍රියාකාරි සැලසුම්

2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) ඡේදයේ ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරි සැලැසුම් සකස් කර පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂයට අදාළව ක්‍රියාකාරි සැලසුම් ඉදිරිපත් කර තිබුණේ ක්‍රීඩා සංගම් 65 කින් ක්‍රීඩා සංගම් 19 ක් පමණි.

විදේශ කටයුතු

විගණන නිරීක්ෂණ

- අග්‍රිම ගිණුමේ ශේෂය නිරවුල් නොකිරීම
- කල් ඉකුත් වූ තැන්පතු
- නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විදේශ කටයුතු

ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම උදෙසා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මිත්‍රශීලී හා නොබැඳි විදේශ ප්‍රතිපත්තිය ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණ පණත්වලට අනුකූලව විදේශ විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසු විපරම් කිරීම විදේශ අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

විදේශ අමාත්‍යාංශය හා ඒ යටතේ රාජ්‍ය අමාත්‍යාංශයක්, ව්‍යවස්ථාපිත ආයතනයක්, තානාපති කාර්යාල 36 ක්, මහ කොමසාරිස් කාර්යාල 13 ක්, කොන්සල් ජනරාල් කාර්යාල 13 ක්, එක්සත් ජාතීන් සඳහා නිත්‍ය දූත මණ්ඩල 02 ක්, නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල 01 ක් හා ශ්‍රී ලංකා නියෝජිත කාර්යාලයක් විසින් ඉහත කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කරනු ලබයි.

ඇෆ්ගනිස්ථානයේ කාබුල් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2021 වර්ෂයේදී වසා දමන ලදි.

විදේශ අමාත්‍යාංශයට හා ඒ යටතේ වන රාජ්‍ය අමාත්‍යාංශයට ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2021 වර්ෂයේදී එකතුව රු.මිලියන 12,849 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 11,452 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 46 හි දැක්වේ.



	විදේශ අමාත්‍යාංශය	කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	එකතුව
ප්‍රතිපාදනය රු. මිලියන	12,689	160	12,849
වියදම රු. මිලියන	11,376	76	11,452
ඉතිරිය රු. මිලියන	1,313	84	1,397

රූපසටහන 46 - ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීමේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අග්‍රිම ගිණුමේ ශේෂය නිරවුල් නොකිරීම

සමාලෝචිත වර්ෂය අවසාන වන විට විදේශ අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් දෙකක පිළිවෙළින් රු. මිලියන 89.92 ක් හා රු. මිලියන 365.24 ක් වශයෙන් එකතුව රු. මිලියන 455.16 ක ශේෂයක් පැවතුණි.

නිරවුල් නොකළ රු.මිලියන 89.92 ක් වූ අග්‍රිම ශේෂයෙන් රු. මිලියන 60.05 ක ශේෂය විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දී තිබූ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 248 කින් සමන්විත වී තිබුණි. එම නිවාස ඇප / ආරක්ෂිත තැන්පතු 248 න් රු. මිලියන 0.48 ක ඇප තැන්පතුව හැර රු. මිලියන 59.57 ක් වූ ඉතිරි නිවාස ඇප තැන්පතු 247 ක්ම මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු විය. එම තැන්පතු වටිනාකමින් රු. මිලියන 12.44 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු. මිලියන 43.29 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20 ක් අතර පරාසයකද, රු. මිලියන 3.84 ක් වූ ඉතිරිය වර්ෂ 07 ක් ඉක්මවා තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 250 දරණ අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඉතිරි නිරවුල් නොකළ රු. මිලියන 29.87 ක් වූ තත් කාර්යය අතුරු අග්‍රිම 127 ක් පැවති අතර ඉන් රු. මිලියන 0.70 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබූ අතර, රු. මිලියන 12.84 ක් වර්ෂ 10 ක සිට

වර්ෂ 20 ක් අතර පරාසයක හා ඉතිරි රු.මිලියන 16.33 ක් වර්ෂ 07 ක් ඉක්මවා තිබුණද මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද නිරවුල් නොකළ තත්කාර්යය අතුරු අග්‍රිම 127 න් අග්‍රිම 72 කට අදාළ එකතුව රු. මිලියන 23.29 ක් කුමන කරුණක් සඳහා ලබා දී තිබුණේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.

අනෙක් අග්‍රිම ගිණුමෙහි රු. මිලියන 365.24 ක ශේෂයක් වූ අතර ඒ තුළ විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු. මිලියන 344.21 ක් පැවතිණි. එම ආරක්ෂිත තැන්පතු වලින් රු.මිලියන 19.54 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 46 කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු. මිලියන 3.02 ක් වර්ෂ 10 ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු.මිලියන 16.52 ක් වර්ෂ 04 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයක් ගත වී තිබූ තැන්පතු විය. අග්‍රිම ශේෂයෙන් ඉතිරි රු. මිලියන 21.03 ක තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර ඒ තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු. මිලියන 3.93 ක් ද, 2019 වර්ෂයට අදාළ රු. මිලියන 2.43 ක් හා 2020 වර්ෂයට අදාළ රු. මිලියන 4.27 ක් ද විය. එම තත්කාර්යය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් මු.රෙ. 371 හි සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

කල් ඉකුත් වූ තැන්පතු

තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් යනතුරුත් හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් රු. මිලියන 32.60 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

- මැලේසියාවේ ක්වාලාලම්පූර් විදේශ දූත මණ්ඩලය 2007 වර්ෂයේදී රිගින්ට් 3,661,000 කට ඉඩමක් මිලදී ගෙන තිබුණද ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් කාර්යාල ගොඩනැගිලි කුලී වශයෙන් 2021 වර්ෂයේ දී රු. මිලියන 19.36 ක් ගෙවා තිබුණි.

- 1972 වර්ෂයේදී මිලදී ගෙන තිබූ ස්වීඩනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති නිල නිවාස ගොඩනැගිල්ල 2012 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර භාවිතයට නොගැනීම හේතුවෙන් නිල නිවාස කුලී වශයෙන් 2021 වර්ෂයේදී රු.මිලියන 17.88 ක් ගෙවා තිබුණි.

- 1976 වර්ෂයේදී මිලදී ගෙන තිබූ කෙන්යාවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාසය පිළිවෙලින් 2021 වර්ෂයේ හා 2014 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර

තිබුණි. එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර භාවිතයට නොගැනීම හේතුවෙන් කාර්යාල කුලී හා නිල නිවාස කුලී වශයෙන් 2021 වර්ෂයේදී රු. මිලියන 12.48 ක් ගෙවා තිබුණි.

- ඕස්ට්‍රේලියාවේ කැන්බරා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාසය පිළිවෙලින් 2012 වර්ෂයේ හා 2007 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

විදේශ රැකියා ක්ෂේත්‍රය

විගණන නිරීක්ෂණ

- විදේශ රැකියා සඳහා යොමුවීමේ වර්ධනයක් පෙන්නුම් කිරීම
- කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාළ ගිවිසුම යාවත්කාලීන නොවීම
- විගමණික ශ්‍රමිකයින් පිළිබඳ තොරතුරු මාර්ගගත (Online) ක්‍රමයට ලබාගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක නොවීම
- ආර්ථික නොවන ගණුදෙනු
- සාත්තු සේවකයින් ලෙස විදේශගතවන ශ්‍රමිකයින් සඳහා විධිමත් පුහුණුවක් නොලැබීම
- ඊශ්‍රායලය සඳහා සාත්තු සේවකයින් යොමුකිරීමේ ක්‍රමවේදය විධිමත් නොවීම
- විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා අවිධිමත් බඳවාගැනීම්
- අනුමත සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම
- පර්යේෂණ අංශය ආරම්භ කිරීමේ අරමුණ ඉටුනොවීම
- අබුඩාබි හා ඊශ්‍රායල කාර්යාලවල සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා
- මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ සිද්ධීන්ට අදාළ මූලික විමර්ෂණ වාර්තා පිළිබඳ කටයුතු නොකිරීම
- අධිකාරී බලය නොලත් ගනුදෙනු
- ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමෙහි කාර්යයසාධනය
- සමාගම සඳහා ස්ථිර පදනමින් සාමාන්‍යාධිකාරිවරයකු පත් නොකිරීම

විදේශ රැකියා ක්ෂේත්‍රය

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 02 ක් මඟින් මෙම ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් පහත සඳහන් කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටුකළ යුතුව තිබුණි.

- නුපුහුණු ශ්‍රම බලකායක් වෙනුවට විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමික වෙළඳපල අවස්ථාවන් මෙන්ම විදේශ රැකියා වෙළඳපල විවිධාංගීකරණයකට ප්‍රවේශ වීම
- විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට තමන් උපයන විදේශ විනිමය ඵලදායී ලෙස ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීම හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය දිරි ගැන්වීම
- විදේශ රැකියා නිමකර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ ව්‍යාපෘති වැඩපිළිවෙලවල් එම ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා සම්බන්ධ අමාත්‍යාංශ සමඟ ක්‍රියාත්මක කිරීම
- මැදපෙරදිග හා වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම
- පුද්ගලික විදේශ රැකියා නියෝජිතායතන නිසි ක්‍රමවේදයක් යටතේ නියාමනය කිරීම

2021 වර්ෂයේ එම කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය වෙත එකතුව රු. මිලියන 701 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය නිමවන විට ඉන් රු.මිලියන 650 ක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 47 හි දැක්වේ.



රූපසටහන 47 - ප්‍රතිපාදන හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

මෙම ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට සුවිශේෂී දායකත්වයක් ලබාදෙන අතර ශ්‍රී ලංකා මහ බැංකු සංඛ්‍යා ලේඛන අනුව 2021 වර්ෂයේ රු. මිලියන 1,087,188 ක් ඒ තුළින් උපයා තිබුණි. එය වැය කළ හැකි ජාතික ආදායමින් සියයට 6.23 ක් ද, විදේශ විනිමය ඉපයීම් වලින් සියයට 97 ක් ද වී තිබුණි.

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙලඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ, විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ ඉහත දක්වා ඇති රජයේ කාර්යභාරය ඉටුකිරීමේ ප්‍රමුඛතම ආයතනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වන අතර පහත සඳහන් ආයතනික ව්‍යුහය මගින් එහි සේවාව පුළුල් කර තිබුණි.

- විදේශ දූත මණ්ඩල 16 ක කම්කරු සුභසාධන අංශ පිහිටුවා තිබීම.
- විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටළු වලට මුහුණ දුන් විගමනිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා රැඳවුම් නිවාස 12 ක් මෙම සුභසාධන අංශ යටතේ පවත්වාගෙන යාම.
- විගමනික ශ්‍රමිකයන් හුරුකිරීමේ සහ පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 17 ක් පවත්වා ගෙන යාම.
- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල 09 ක් ස්ථාපිත කර තිබීම.

2021 වර්ෂය තුළ කාර්යාංශය විසින් තම සේවාව තුලින් එකතුව රු. මිලියන 3,054 ක ආදායමක් උපයා තිබුණු අතර මුළු වියදම රු.මිලියන 2,421 ක් වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාංශය සතු මුළු ආයෝජන වටිනාකම රු. මිලියන 10,586 ක් වී තිබුණි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු අනුව 2021 වර්ෂයේ කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 122,264 ක් වී තිබුණි. ඉන් 73,717 (60%) ක් ගෘහ සේවක, අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් වී තිබුණි. වෘත්තීය ගණයේ රැකියා සඳහා සහ පුහුණුවලත් රැකියා සඳහා පිටත්වූ සංඛ්‍යා පිළිවෙලින් 8,373 ක් සහ 40,174 ක් වී තිබුණි.



රූපසටහන 48 - සේවා වර්ගීකරණය අනුව විදේශගත වීම - 2021

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

විදේශ රැකියා සඳහා යොමුවීමේ වර්ධනයක් පෙන්නුම් කිරීම

ගෝලීය වසංගත තත්ත්වය ප්‍රධාන කොටගත් විවිධ හේතූන් මත පසුගිය වර්ෂවල රැකියා සඳහා විදේශ ගත වූ ප්‍රමාණය ක්‍රමානුකූලව අඩුවී තිබුණු අතර 2021 වර්ෂයේදී නැවත එහි වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.



රූපසටහන 49 - කාර්යාංශයේ ලියාපදිංචිව රැකියා සඳහා විදේශගත වීම - 2017 සිට 2021
මූලාශ්‍රය : - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2021

රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාළ ගිවිසුම යාවත්කාලීන නොවීම

කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාළව විදේශ රැකියා අමාත්‍යාංශය සහ කොරියානු රජය අතර 2017 නොවැම්බර් 29 දින වර්ෂ 02 ක කාලයකට අදාළව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව, සාධාරණ හේතුවක් නොමැතිව එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීම සඳහා ගිවිසුම අවලංගුවී මාස 06 ක කාලයක් ඉකුත් වුවහොත්, ගිවිසුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හැකියාව පවතී. මේ යටතේ එම රාජ්‍ය වෙත ශ්‍රමිකයින් යොමුකිරීමේ කටයුතු කාර්යාංශය විසින් පමණක් සිදුකළ යුතු අතර පසුගිය වර්ෂ 05 තුළ එකතුව 20,144 ක් රැකියා සඳහා යොමුකර තිබුණි. එහෙත් 2020 වර්ෂයේ ආරම්භ කළ ගිවිසුම යාවත්කාලීන කිරීම 2022 ජූලි වනවිටත් නිමවී නොතිබුණි.

විගමණික ශ්‍රමිකයින් පිළිබඳ තොරතුරු මාර්ගගත (Online) ක්‍රමයට ලබාගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක නොවීම

විගමණික ශ්‍රමිකයන්ගේ පවුල් පැතිකඩවලට අදාළ තොරතුරු පරිගණකගත කර දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට සහ යාවත්කාලීන කරන ලද තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මාර්ගගත (Online) පරිගණක පද්ධතියක් මඟින් එවීම අරමුණු කරගෙන අමාත්‍යාංශය විසින් 2016 හා 2017 වර්ෂවල පරිගණක 277 ක් රු.මිලියන 35.5 ක් වැය කර මිලදීගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා බෙදා හැර තිබුණි. එහෙත් අපේක්ෂිත පරිදි දත්ත පද්ධති නඩත්තු කර අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට යොමු කිරීමට විගණන දිනය වූ 2022 අප්‍රේල් 05 දින වන විටත් නොහැකි වී තිබුණි.

ආර්ථික නොවන ගණුදෙනු

අමාත්‍යාංශ කාර්යාලය සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම දිගින් දිගටම සිදුකර තිබුණු අතර නියැදි පරීක්ෂාවට භාජනය වූ 2016 ජනවාරි සිට 2019 ඔක්තෝබර් දක්වා අවස්ථා දෙකකදී එසේ ලබාගත් ගොඩනැගිලි වෙනුවෙන් එකතුව රු. මිලියන 95.63 ක කුලියක් ද එම ගොඩනැගිලිවල කාමර වෙන් කිරීම සහ බඩු ප්‍රවාහනය සඳහා එකතුව

රු.මිලියන 15.42 ක්ද වැය කර තිබුණි. එමෙන්ම 2019 වර්ෂයේ සිට නැවත නාරාහේන්පිට පිහිටි මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි කාර්යාලය ස්ථාපිත කිරීමට තීරණය කර එහි කාමර වෙන් කිරීම සඳහා රු.මිලියන 34.61 ක ඇස්තමේන්තුවක් මත 2021 වර්ෂයේදි රු.මිලියන 2 ක මූලික ගෙවීමක් සිදුකර තිබුණි.

සාත්තු සේවකයින් ලෙස විදේශගතවන ශ්‍රමිකයින් සඳහා විධිමත් පුහුණුවක් නොලැබීම

ඊශ්‍රායලය සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමේ අරමුණින් කාර්යාංශය විසින් පවත්වනු ලබන සාත්තු සේවක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 3) පුහුණු පාඨමාලාව සඳහා නිර්දේශිත නිපුණතා සම්මත විෂය මාලාවට මාස 03 ක් තුළ නිමකළ යුතු පාඩම් ඒකක 12 ක් ඇතුළත් වුවත්, කාර්යාංශය එම පුහුණු පාඨමාලාව මාස 02 කින් නිමකිරීමට අනුමැතිය ලබාගෙන තිබුණි. අන්තර්ජාතික නිපුණතා මට්ටම් සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණු පැය 260 ආවරණය නොවන පරිදි පාඨමාලාවෙහි කාලය දින 45 ක් හා දින 30 ක් ලෙස අවස්ථා දෙකකදී අනුමැතියකින් තොරව අඩුකර මාර්ගගත ක්‍රමයට පවත්වා තිබුණි. මෙම පුහුණුව නිමකර වසරකට පසුව වීසා අයදුම් කිරීමේදී එම සුදුසුකම් යාවත්කාලීන කිරීමක් අවශ්‍ය බව ඊශ්‍රායල තානාපති කාර්යාලය විසින් දන්වා තිබුණු බැවින් එම ශ්‍රමිකයන්ගෙන් රු. 8,100 ක් අයකර දින 07 ක් තුළ එම විෂය මාලාව නැවත ඉගැන්වීමට කටයුතු කර තිබුණි. එසේම රැකියා අවශ්‍යතාවය අනුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙම පාඨමාලාව පැවැත්විය යුතු වුවත් පුහුණුව සඳහා බඳවාගත් අය සඳහා කෙටිකාලීන ඉංග්‍රීසි පාඨමාලාවක් ගාස්තු අයකර පැවැත්වීමටද කාර්යාංශය කටයුතු කර තිබුණි. පුහුණුව නිමකළ 5,918 දෙනෙකුගෙන් 862 දෙදෙනෙකු පමණක් අදාළ රැකියාව සඳහා විදේශගත වී තිබුණි. කෙසේ වුවද, කාර්යාංශය විසින් මෙම පුහුණු වැඩසටහන් තුළින් රු.මිලියන 84.91 ක මුදලක් උපයාගෙන තිබුණි.

ඊශ්‍රායලය සඳහා සාත්තු සේවකයින් යොමුකිරීමේ ක්‍රමවේදය විධිමත් නොවීම

ඊශ්‍රායල් රජය සමඟ ශ්‍රී ලංකා රජය ඇතිකරගත් ගිවිසුමෙහි, ප්‍රායෝගික පුහුණුවක් සහිත මාස 11 ක හෙද පුහුණු පාඨමාලා සහතිකය හෝ කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන NVQ 03 මට්ටමේ සාත්තු සේවක පුහුණු පාඨමාලා සහතිකය ලබා තිබීම පමණක් මෙම රැකියා සඳහා බඳවාගැනීමේ සුදුසුකම් ලෙස දක්වා තිබීම හේතුවෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ප්‍රායෝගික පුහුණුව සහිත ජාතික වෘත්තීය සුදුසුකම් 04 සහ 03 මට්ටමේ සහතිකය හිමි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පුහුණු මධ්‍යස්ථාන 19 ක විධිමත් පුහුණුවක් නිමකල සිසුන්ට මෙම රැකියාව සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වී තිබුණි.

විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා අවිධිමත් බඳවාගැනීම්

2020 වර්ෂයේදී අනුමත බඳවාගැනීමේ පරිපාටියක් නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩලය

තීරණයක් මත අයදුම්පත් කැඳවා විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා කාර්යාංශය විසින් සකස් කරන ලද නිර්ණායක පදනම් කරගෙන සියරට පේරුව පදනමින් 31 දෙනෙකු සහ දේශීය පදනමින් 67 දෙනෙකු බඳවාගෙන තිබුණි. සියරට පදනමින් හා දේශීය පදනමින් තෝරාගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණයේදී සාපේක්ෂව වැඩි ලකුණු ලබාගත් අය සිටියදී පිළිවෙලින් අඩු ලකුණු ලබාගත් 09 දෙනෙකු සහ 16 දෙනෙකු බඳවාගෙන තිබුණි. මෙම කම්කරු සුභසාධන අංශවල උපදේශක හා තෙවන ලේකම් යන තනතුරු සඳහාද කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ බාහිරින් පුද්ගලයින් දෙදෙනෙකු බඳවාගෙන තිබුණු අතර එම බඳවාගැනීමට අදාළව අයදුම්පත් කැඳවීමට අනුගමනය කරන ලද ක්‍රමවේදය පිළිබඳව තොරතුරු වාර්තා වී නොතිබුණි. එසේම අදාළ තනතුර සඳහා වූ අවම වයස සම්පූර්ණ කර නොතිබුණු අදාළ ක්ෂේත්‍රයේ හෝ එම සේවය පිළිබඳ පළපුරුද්දක් නොමැති නිලධාරියෙකු සිංගප්පූරුවෙහි උපදේශක ලෙස බඳවාගෙන තිබුණි.

අනුමත සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව කාර්යාංශයේ නිලධාරීන් වෙත ආපදා ණය ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 275 දෙනෙකු වෙත එකතුව රු. මිලියන 80.79 ක් වැඩියෙන් ආපදා ණය ලෙස ගෙවා තිබුණි.

පර්යේෂණ අංශය ආරම්භ කිරීමේ අරමුණ ඉටුනොවීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15 (අ)(ඖ)(ඕ) වගන්ති අනුව ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම, සේවා නියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු කිරීම, සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් පිටවීම සහ පෙරළා පැමිණීම සමීක්ෂණය කිරීම සඳහා තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාම අරමුණු කරගෙන පර්යේෂණ අංශය ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය නිමවන විට නිලධාරීන් 13 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණද නියැදි පරීක්ෂාවට භාජනය වූ 2020 සහ 2021 වර්ෂවල පර්යේෂණ 09 ක් සිදුකර ඉන් 04 ක වැඩ අවසන් කර තිබුණි. එහෙත් ඉහත අරමුණු ඉටුවන පරිදි එම පර්යේෂණ සිදුකර නොතිබුණු අතර තොරතුරු දත්ත බැංකුවක්ද පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

අබුඩාබි හා ඊශ්‍රායල කාර්යාලවල සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අබුඩාබි හා ඊශ්‍රායල තානාපති කාර්යාලවල පිහිටි කම්කරු සුභසාධන අංශවල පිළිවෙලින් 2014 වර්ෂයේ රු. මිලියන 1.15 ක සහ 2019 වර්ෂයේ රු. මිලියන1.83 ක මූල්‍ය අක්‍රමිකතා සිදුවී ඇති බව මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව තිබුණි. ඉන් ඊශ්‍රායල තානාපති කාර්යාලයේ වූ මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව රු. මිලියන 91 ක් හා අබුඩාබි තානාපති කාර්යාලයේ සිදුවී තිබූ රු. මිලියන 1.15 ක මූල්‍ය අක්‍රමිකතාවයට

අවුරුදු 08 ක් පමණ ගතවී ඇතත් නැවත අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ සිද්ධීන්ට අදාළ මූලික විමර්ෂණ වාර්තා පිළිබඳ කටයුතු නොකිරීම

2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදවල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සිදුවී ඇති බවට සඳහන්ව තිබූ අක්‍රමිකතා සිද්ධීන් 07 කට අදාළව මූලික විමර්ෂණ සිදුකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් විමර්ෂණ නිලධාරීන් තිදෙනෙකු පත්කර ඊට අදාළ වාර්තා ලබාගෙන තිබුණි. එහෙත් එම වාර්තා පදනම් කර ගෙන විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

අධිකාරී බලය නොලත් ගනුදෙනු

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 45 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ යහපත අරමුණු කරගෙන ආරම්භ කර තිබුණු කම්කරු සුභසාධන අරමුදල සතුව විදේශ බැංකු ජංගම ගිණුම්වල පැවති ශේෂයන්ගේ වටිනාකම රු. මිලියන 223 ක් වී තිබුණි. පනතෙහි 17 (2) සහ 45 (2) වගන්තිවල විධිවිධානයන්ට පටහැනිව කාර්යාංශ අරමුදලට එක්රැස් විය යුතු එකතුව රු. මිලියන 544 ක ආදායමක් කම්කරු සුභසාධන අරමුදලට එක්රැස් කර තිබුණු අතර කාර්යංශ අරමුදලින් ගෙවියයුතු විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා අනුයුක්ත කර තිබූ නිලධාරීන් 56 දෙනෙකුට වැටුප්, දීමනා සහ අනෙකුත් පහසුකම් වෙනුවෙන් එකතුව රු. මිලියන 428.56 ක් කම්කරු සුභසාධන අරමුදලෙන් වැය කර තිබුණි.

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමෙහි කාර්යයසාධනය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පූර්ණ හිමිකාරත්වය මත ක්‍රියාත්මක වන විදේශ රැකියා ඒජන්සි සමාගම මගින් රජයේ සුරක්ෂිතතාවය මත සාපේක්ෂව අඩු පිරිවැයකින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රැකියා සඳහා යොමු කිරීමේ හැකියාව තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ශ්‍රමිකයින් 90 දෙනෙකු පමණක් විදේශගත කර තිබුණු අතර එය වර්ෂයට අදාළව කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශගත වූ මුළු ශ්‍රමික සංඛ්‍යාවෙන් සියයට 0.07 ක පමණ ප්‍රතිශතයකි. විදේශ රැකියා උපදේශකයකු ලෙස කටයුතු කිරීම, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම, රැකියා ඉල්ලුම තෘප්තිමත් කිරීම ඇතුලු අනෙකුත් ප්‍රධාන කාර්යයන් වලින් කිසිවක් සමාලෝචිත වර්ෂයේදීත් සිදුකර නොතිබුණි.

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස්කල ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය අනුව රු. මිලියන 2.1 ක් වැයකර නව රැකියා වෙළඳපලවලට පිවිසීම, විදේශයන්හි ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි අලෙවිකරණ අංශය මඟින්, විදේශ රටවල් හරහා රැකියා අවස්ථාවන් සොයාගැනීම මඟින් සහ වෙබ් හා ඊ-මේල් මාර්ග ඇතුලු ක්‍රම 05 ක් මගින් නව රැකියා ඇනවුම් 84 ක් ලබා ගැනීමට සැලසුම් කලද වර්ෂය තුළ සමාගමට

එම ක්‍රම මගින් රැකියා ඇනවුම් 15 ක් පමණක් ලැබී තිබුණි. එමෙන්ම විදේශ රැකියා වෙළඳපල ප්‍රවර්ධනය සඳහා දේශීයව ක්‍රියාත්මක කිරීමට සැලසුම්කල වැඩසටහන්ද අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි.

සමාගම සඳහා ස්ථිර පදනමින් සාමාන්‍යාධිකාරිවරයකු පත් නොකිරීම

සමාගම සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව විධිමත් පරිදි සාමාන්‍යාධිකාරීවරයකු බඳවාගැනීමට දිගින් දිගටම කටයුතු කර නොතිබුණු අතර සමාගම ආරම්භයේ සිට 2021 වර්ෂය දක්වා වසර 25 ක කාලය තුළ සාමාන්‍යාධිකාරීවරුන් 16 දෙනෙකු පත්කර තිබුණි. ඉන් වසරක කාලයක් සඳහා පමණක් ස්ථිර පදනමින් රේඛීය අමාත්‍යාංශය විසින් නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. 2000 වසරෙන් පසු අවස්ථා 11 කදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ නිලධාරීන් 09 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත විධිමත් ක්‍රමවේදයකින් තොරව එහි සාමාන්‍යාධිකාරී ලෙස සේවයේ යොදවා තිබුණු අතර සමාගමෙහි මූල්‍ය හා පරිපාලන අංශවල ඉහල තනතුරු සඳහාද කාර්යාංශ නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත දිගින් දිගටම පත් කර තිබුණි.

ගුවන් සේවා අංශය

විගණන නිරීක්ෂණ

- ආදායම් එකතු කිරීම
- සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් භාණ්ඩාගාර අනුමැතිය රහිතව දීමනා ගෙවීම
- ජපාන ණය ආධාර යටතේ කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල්කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ණය ඌණ උපයෝජනය හේතුවෙන් බැඳීම් ගාස්තු (Commitment Fee) ගෙවීම
- සිවිල් ගුවන් සේවා පනතට අනුකූල නොවීම
- ගුවන්තොටුපළ ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය
- මත්තල, රත්මලාන, යාපනය හා මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපොලවල කාර්යසාධනය
- ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත භාණ්ඩාගාරය විසින් වරින් වර අතිරේක අරමුදල් සම්පාදනය
- රාජ්‍ය බැංකුවලින් කෙටිකාලීන ණය පහසුකම් ලබා ගැනීම
- ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම
- ගෙවිය යුතු ගිණුම්
- A 350-900 ගුවන් යානා 4ක් සඳහා ගෙවන ලද පෙර ගෙවීම් (Pre-delivery payments) පියවා ගැනීම
- නව ගුවන් යානා 12ක් සහ ගුවන් යානා ප්‍රතිස්ථාපනය කිරීම් 09 ක් මෙහෙයුම් කල්බදු ලබා ගැනීම සඳහා යෝජනා කැඳවීම

ගුවන් සේවා අංශය

ඉහල විදේශ විනිමයක් අරමුණු කරගත් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක් යන දැක්ම මත ක්‍රියාත්මක වන ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 3 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකල යුතුව පැවතුණි.

- අදාළ නීති රීති හා අණපනත්වලට අනුකූලව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම
- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පවතින නිදහස් වෙළඳ කලාප හා කර්මාන්තපුර උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නැංවීම හා නවීකරණය නොපමාව සිදු කිරීම
- කටුනායක ගුවන් තොටුපලේ දෙවන ධාවන පථය සහ මගී පර්යන්තය සංවර්ධනය කිරීම
- කටුනායක ගුවන් තොටුපලේ අභ්‍යන්තර ගුවන් මගී පර්යන්තයක් සංවර්ධනය කිරීම
- නුවරඑළිය ගුවන් තොටුපල ඇතුළු අභ්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම
- මත්තල ගුවන් තොටුපලේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම හා පහසුකම් වැඩි දියුණු කිරීම
- ශ්‍රී ලංකන් ගුවන් සේවය ඉහළ ජාත්‍යන්තර ප්‍රමිතිකරණයක් දක්වා උසස් කිරීම සඳහා කටයුතු කිරීම
- ගුවන් බඩු අපනයනය පුළුල් කිරීම

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත රු.මිලියන 2,086 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 969 ක් පමණක් උපයෝජනය කර තිබුණි.



රූපසටහන 50 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 03ක් විසින් ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආදායම් එකතු කිරීම

ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ආදායම වූ සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් එකතු කරන තොටුපොල බද්ද (Embarkation Levy) යටතේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලික ඇස්තමේන්තුව රු.මිලියන 19,000 ක් වූ අතර කොවිඩ් වසංගතය හේතුවෙන් එම ඇස්තමේන්තුව රු.මිලියන 4,000 ක් දක්වා අඩුකර සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද වර්ෂය තුළදී රු.මිලියන 3,350 ක් එනම් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 84 ක් පමණක් උපයාගෙන තිබුණි.



රූපසටහන 51 - ඇස්තමේන්තුගත ආදායම හා ඉපයූ ආදායම

අයවැයගත ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2021 වර්ෂය සඳහා ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් සඳහා වූ අයවැයගත ප්‍රතිපාදනය රු.මිලියන 169.84 ක් වූ අතර එයින් රු.මිලියන 103.01ක් උපයෝජනය කර රු.මිලියන 66.83 ක් එනම් අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 39ක් ඉතිරි වී තිබුණි.

ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 1,916.12 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එයින් රු.මිලියන 866.02 ක් පමණක් උපයෝජනය කර රු.මිලියන 1,050.1 ක් එනම් සියයට 55ක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. තවද මෙම වර්ෂයට අදාළව ප්‍රතිපාදනය නොකළ වියදමක් වූ මඩකලපුව ගුවන් තොටුපලෙහි ධාවන පථය ඉදිකිරීමට අදාළ මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවියයුතු හිඟ මුදලක් වූ රු.මිලියන 53.6ක් මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි. එමෙන්ම, මෙම ගෙවීම සම්බන්ධ ප්‍රතිපාදන නිදහස් කිරීමේ ලිපියට අමතර මූලාශ්‍ර ලේඛන හෝ ලිඛිත සාක්ෂි කිසිවක් අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි.



රූපසටහන 52 - ප්‍රාග්ධන වියදම්



රූපසටහන 53 - පුනරාවර්තන වියදම්

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් භාණ්ඩාගාර අනුමැතිය රහිතව දීමනා ගෙවීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 18 දිනැති චක්‍රලේඛ අංක: 03/2018 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව දීමනා නොගෙවිය යුතු වුවද, අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලැබූ තීරණයකට අනුව අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් 27 දෙනෙකුට 2018 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි මසකට රුපියල් 50,000 ක කළමනාකරණ දීමනාවක් ගෙවා තිබුණි., සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා ඇති රු.13,061,742ක් ද ඇතුළුව, 2018 වර්ෂයේ සිට 2021 දක්වා රු.50,128,553 ක මුළු දීමනාවක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

ජපාන ණය ආධාර යටතේ කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ පුළුල්කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

2009 වර්ෂයෙන් පසුව රට තුළ ඇති වූ යහපත් වාතාවරණය මත වැඩි වූ ගුවන් මගී අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ පුළුල්කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම සැලසුම්කර තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ,“නව ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්” පැකේජය A ලෙස හා “නව ගුවන්යානා යාත්‍රාංගනය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය” පැකේජය B ලෙස කොටස් දෙකක් යටතේ හඳුනාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ 3 ක් ඇතුළත එනම් 2015 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබුණත් සැලසුම් වෙනස් කිරීම ඇතුළු විවිධ හේතු මත කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වී තිබුණි. ඒ අනුව පලමුවෙන්ම “බී” පැකේජය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර එය 2017 අප්‍රේල් 25 දින ආරම්භ කර 2020 අගෝස්තු 06 දින නිම කර තිබුණි.

ඉහත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 92 ක් නියෝජනය වන ප්‍රධාන ඉදිකිරීම් ඇතුළත් “ඒ” පැකේජය සඳහා 2020 මාර්තු 12 දින කොන්ත්‍රාත්කරු සමඟ ජපන් යෙන් මිලියන 41,554 ක් සහ රු. මිලියන 35,136 ක වටිනාකමට ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ගිවිසුමකට එළඹ තිබුණි. එහි ඉදිකිරීම් කටයුතු කෙරීගෙන යන අතරතුරදී රටේ පවතින වර්තමාන මූල්‍යමය ගැටළු හේතුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 දින ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය මත ණය වාරික ගෙවීම නවතා තිබුණි. මේ හේතුවෙන් ණය ප්‍රදානකරු විසින් අරමුදල් ප්‍රතිපූරණය නොකිරීම මත කොන්ත්‍රාත් ගෙවීම සිදු කල නොහැකි වීමෙන් 2022 ජූලි 25 දින

සිට කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් තාවකාලිකව නවතා දමා තිබුණි.

ණය ඌණ උපයෝජනය හේතුවෙන් බැඳීම් ගාස්තු (Commitment Fee) ගෙවීම

කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල්කිරීමේ ව්‍යාපෘතියේ "ඒ" පැකේජය යටතේ නව ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ල හා ඒ ආශ්‍රිත ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් (JICA) එකතුව ජපන් යෙන් මිලියන 74,397 ක විදේශ ණය මුදලක් ලබා ගැනීම සඳහා පිළිවෙලින් 2012 මාර්තු 28 දින හා 2016 මාර්තු 24 දින ගිවිසුම් 02 කට එළඹ තිබුණි. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම මත 2022 අප්‍රේල් 20 දින වන විට JICA ආයතනය වෙත විදේශ ණය ඌණ උපයෝජනය හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස රු. මිලියන 359.5 ක් ගෙවීමට සිදු වී තිබුණි.

සිවිල් ගුවන් සේවා පනතට අනුකූල නොවීම

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් ගුවන්තොටුපල කළාප ස්ථාපනය හෝ සංවර්ධනය සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එබඳු සැලැස්මක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ගුවන්තොටුපළ ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය

2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනත යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති ගැසට් නිවේදනය මගින් අමාත්‍යවරයා විසින් කටුනායක ගුවන් තොටුපළ, රත්මලාන ගුවන්තොටුපළ, සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම්, ගොඩනැගිලි සහ ව්‍යුහයන්, රත්මලාන, අත්තිඩියේ ගගන සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, ගම්පහ සහ පමුණුගම ගුවන්විදුලි නාවික ආධාරක, පිදුරුතලාගල රේඩාර් මධ්‍යස්ථානය, නුවරඑළියේ නිවාඩු නිකේතනය සහ හෙක්ටයාර් 0.125ක අනුරාධපුර ඉඩම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරා දී තිබුණි. එසේ වුවද, 2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව 2006 අප්‍රේල් 28 දිනැති අංක:PE/COMC/33/02 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය අනුව ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් උපයෝජනය කරන රජයට අයත් ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් චංචල හා නිශ්චල වත්කම් තක්සේරු කර ගිණුම් ගතකල යුතුව පැවතුණි. එසේම එදිනට ගුවන්තොටුපොල සංවර්ධනයට අදාළව මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල පැවති වත්කම් හා වගකීම් පවරාගෙන ශුද්ධ වත්කම් සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කළ යුතුව පැවතුනි. එබැවින් ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් භාවිතා

ගුවන් සේවා අංශය

කරන ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය පිළිබඳ ගැටළු සහගත තත්වයක් පැවතුණි. ඉහත පරිදි කොටස් නිකුත් කිරීමක් 2021 දෙසැම්බර් 31 දක්වා සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගොඩනැගිලි පමණක් නැවත තක්සේරු කර තිබූ අතර, මුළු තක්සේරුව අවසන් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

මත්තල, රත්මලාන, යාපනය හා මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළවල කාර්යසාධනය

- මත්තල ගුවන්තොටුපළේ අපේක්ෂිත වාර්ෂික මගී ධාරිතාව මිලියනයක් පමණ වුවද, පසුගිය වසර පහ තුළ ගුවන්තොටුපොල භාවිතා කරන ලද මුළු මගීන් සංඛ්‍යාව 91,747 ක් පමණක් වූ අතර පසුගිය වසර පහ තුළ මුළු ගුවන් ගමන් සංඛ්‍යාව 2,396 ක් පමණක් වී තිබුණි. 2021 වර්ෂය සඳහා මත්තල ගුවන්තොටුපලේ මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ අලාභය රු. මිලියන 4,440 ක් වූ අතර 2017 වසරේ සිට 2021 වසර දක්වා සමුච්චිත ශුද්ධ අලාභය රු.මිලියන 20,590ක් වී තිබුණි. ඒ අනුව මෙම ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා දරන ලද ඇ.එ.ජ. ඩොලර් මිලියන 247.7 ට සමාන රු.මිලියන 36,564ක් වූ ප්‍රාග්ධන වියදම ඵලදායී ලෙස භාවිත කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, ඉහත ඉදිකිරීම සඳහා ලබාගත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 190 ක ණය සඳහා ණය පොලිය ලෙස මහා භාණ්ඩාගාරය විසින් 2010 සිට 2015 මාර්තු දක්වා රු. මිලියන 1,708 ක් ද සමාගම විසින් 2015 අප්‍රේල් සිට 2022 මාර්තු දක්වා රු. මිලියන 3,532 ක් ද ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට ඉහත ණය මුදලේ ශේෂය ඇ.එ.ජ.ඩොලර් මිලියන 109 ක් වී තිබුණි.

- රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මෙහෙයුම් කටයුතු වලින් ද අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර 2017 සිට 2021 දක්වා සමුච්චිත අලාභය රු.මිලියන 1,693.66 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය රු.මිලියන 461.08 ක් වී තිබුණි. වාර්තා අනුව 2020 සහ 2021 වර්ෂවල ගුවන් යානා සංචලනයන් වසරකට 13 ක් බැගින් පමණක් වූ අතර මගී සංචලනයන් පිළිවෙලින් 60 සහ 28 ක් පමණක් වී තිබුණි.

- යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2019 ඔක්තෝබර් 17 වන දින මගීන් සඳහා විවෘත කර තිබුණි. එය ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා වාර්තා වී ඇති ගුවන් යානා සංචලන සංඛ්‍යාව 142 ක්, මගී සංචලන 4,441 ක් වූ අතර පසුගිය වර්ෂ 03 සඳහාම මෙහෙයුම් කටයුතු වලින් අඛණ්ඩව අලාභ ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම රු.මිලියන 40.74 ක් වී තිබුණු නමුත් කිසිඳු ආදායමක් උපයා නොතිබුණි.

- මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2018 මාර්තු 25 වන දින සිවිල් මෙහෙයුම් කටයුතු සඳහා නැවත විවෘත කර තිබුණි. පසුගිය වසර හතර තුළ කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර පරිපාලන වියදම් ලෙස රුපියල් මිලියන 74.64 ක් දරා තිබුණි. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් 2016 වර්ෂයේදී නව මගී පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 38.4 ක් සහ ධාවන පථය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 482.78 ක් වැය කර තිබූ අතර ඒ සඳහා ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ධාවන පථය ඉදිකිරීමේ අවසාන ගෙවීම් ලෙස රුපියල් මිලියන 53.61 ක් වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ අලාභය රු.මිලියන 45,231.46 ක් වූ අතර සමුච්චිත පාඩුව රු.මිලියන 371,733.52 ක් විය. එදිනට සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.මිලියන 221,308.99 ක් ද මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් රු.මිලියන 289,265.27 ක් ද විය. ඒ අනුව ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙනී ගියද 2022 පෙබරවාරි 07 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා රජයේ සහය ශ්‍රී ලන්කන් ගුවන් සමාගම වෙත ලබා දෙන බව තහවුරු කරමින් භාණ්ඩාගාර ලේකම්ගේ 2022 පෙබරවාරි 24 දිනැති ලිපිය පරිදි මූල්‍ය ප්‍රකාශන දිගුකාලීන පැවැත්මක් ඇත යන උපකල්පනය මත සකස් කර තිබුණි.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත භාණ්ඩාගාරය විසින් වරින් වර අතිරේක අරමුදල් සම්පාදනය

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා භාණ්ඩාගාරය විසින් සමාගම වෙත රු.මිලියන 46,470 ක් (එ.ජ.ඩො. මිලියන 375ක්) වරින් වර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එනම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවීම සඳහා ලබා දී තිබුණි. පසුව 2020 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් එ.ජ.ඩොලර් මිලියන 500 ක අතිරේක ප්‍රාග්ධන යෙදවීමක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර එයින් 2021 අප්‍රේල් දක්වා එ.ජ.ඩොලර් මිලියන 240 ක් ලබා දී තිබුණි. මෙවැනි අහිතකර මූල්‍ය තත්ත්වයක් පැවතියදී , 2021 නොවැම්බර් 15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ ප්‍රසම්පාදන කටයුතු කිසිදු සීමාවකින් තොරව හා රජයේ කිසිදු අධීක්ෂණයකින් තොරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරීමට ආමාත්‍ය මණ්ඩලය තීරණයකර තිබුණි.

රාජ්‍ය බැංකුවලින් කෙටිකාලීන ණය පහසුකම් ලබා ගැනීම

2016/2017 වර්ෂය තුළ මහා භාණ්ඩාගාර ඇපමත ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් කෙටිකාලීන මුදල් අවශ්‍යතා සඳහා එ.ජ.ඩොලර් මිලියන 200 ක් (ආසන්න වශයෙන් රු.මිලියන 31,115 ක්) හා 2017/18 වර්ෂය තුළදී රු.මිලියන 29,439 ක් වූ රුපියල්

ණය පහසුකම් රාජ්‍ය බැංකු 02 ක් මඟින් ලබා ගෙන තිබුණි. තවද 2020/21 වර්ෂය තුළදී එම රාජ්‍ය බැංකු 02 මඟින්ම ඇ.එ.ජ.ඩොලර් මිලියන 75 ක් වූ ණය මුදලක්ද ලබාගෙන තිබුණි. ඒ අනුව 2021 මාර්තු 31 දින වන විට සමස්තයක් වශයෙන් රු.මිලියන 71,621 ක ණය මුදලක් ඉහත රාජ්‍ය බැංකු 02 වෙත පියවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය මුදල් කිසිවක් ගෙවා නොතිබුණි.

ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම

ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම විසින් එ.ජ.ඩොලර් මිලියන 175 ක වටිනාකමකින් යුත් සියයට 5.3 ක වාර්ෂික පොලි අනුපාතයක් යටතේ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවක් 2014 වර්ෂයේදී භාණ්ඩාගාර ඇප මත සිදුකර තිබූ අතර එම බැඳුම්කර නිදහස් කිරීම සඳහා නැවත 2019 ජුනි මාසයේදී ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවක් සියයට 7 ක වාර්ෂික පොලි අනුපාතයක් යටතේ සිදුකර තිබුණි. 2021/22-2024/25 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සංයුක්ත සැලැස්ම අනුව ඉහත බැඳුම්කර නිදහස් කිරීම සඳහා 2024 වර්ෂයේදී නැවත නිකුත් කිරීමට අපේක්ෂා කරන බව දක්වා තිබුණි.

ගෙවිය යුතු ගිණුම්

2021 මැයි 31 දින වන විට ශ්‍රී ලන්කන් ගුවන් සමාගම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඇ.එ.ජ. ඩොලර් මිලියන 311.9ක් ගෙවිය යුතුව පැවති අතර 2021 මාර්තු 31 දිනට ගෙවිය යුතු කල් ඇමූ ගුවන්යානා මෙහෙයුම් කල් බදු කුලී ඇ.එ.ජ. ඩොලර් මිලියන 59 ක් වී තිබුණි.

A 350-900 ගුවන් යානා 4ක් සඳහා ගෙවන ලද පෙර ගෙවීම් (Pre-delivery payments) පියවා ගැනීම

2020 හා 2021 වර්ෂවලදී ලැබීමට නියමිතව තිබූ A350-900 ගුවන්යානා 4 සඳහා 2021 මාර්තු 31 දින වනවිට ලැබීමට පෙර ගෙවීම් (Pre-delivery payments) ලෙස රු. මිලියන 2,528.12 ක් (එ.ජ.ඩො. මිලියන 19.21) ගෙවා තිබුණි.

එක්සත් රාජධානියේ සුපිරි අධිකරණය මඟින්, බරපතල වංචා කාර්යාලය හා SAS එයාර්බස් සමාගම අතර ඇති කරගෙන තිබූ ගිවිසුම අනුමත කරමින් ලබා දෙන ලද තීන්දුවේදී සඳහන් කර ඇති පරිදි එයාර්බස් සමාගමේ සේවකයන් විසින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරිගේ බිරිඳකට අයත් සමාගමකට ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට A 330-300 ගුවන්යානා 6 ක් සහ A 350-300 ගුවන්යානා 4 ක් මිලදී ගැනීම හා A 350-900 ගුවන්යානා 4 ක් කුලී පදනමට ලබා ගැනීමේ ගනුදෙනුවට බලපෑම් සිදුකිරීම සඳහා ඇ.එ.ජ.ඩොලර් මිලියන 16.84ක් දක්වා ගෙවීම් කිරීමට එකඟ වී තිබුණි. නීති උපදෙස් මත පදනම්ව ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් එස් ඒ එස් එයාර්බස් සමාගම මෙම A 350-900 ගුවන්යානා මිලදී ගැනීමේ ගිවිසුම අවසන් කර පූර්ව ගෙවීම් වන්දියක් ද සමඟ අයකර ගැනීම පිළිබඳව 2020 සැප්තැම්බර් 29 දින ලිපියක් (Letter before Action) මඟින් දැනුම් දී තිබුණි.

2021 දෙසැම්බර් 03 දින එයාර්බස් සමාගම සමඟ මූලික සාකච්ඡාවක් පවත්වා තිබූ බව එයාර්බස් සමාගම විසින් එවා තිබූ 2021 දෙසැම්බර් 07 දිනැති ලිපිය මඟින් හෙළිදරව් විය. මේ පිළිබඳ වර්තමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් නොවුනි.

නව ගුවන් යානා 12ක් සහ ගුවන් යානා ප්‍රතිස්ථාපනය කිරීම් 09 ක් මෙහෙයුම් කල්බදු ලබා ගැනීම සඳහා යෝජනා කැඳවීම

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික තත්ත්වය හා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අහිතකර මූල්‍ය තත්ත්වය නොසලකා නව ගුවන් යානා 12ක් සහ ගුවන් යානා ප්‍රතිස්ථාපනය කිරීම් 09 ක් මෙහෙයුම් කල්බදු ලබා ගැනීම සඳහා 2022 අප්‍රේල් 10 දින යෝජනා කැඳවීම් සිදු කර තිබූ අතර එලෙස නව ගුවන් යානා 12 ක් ලබා ගැනීමේ ශක්‍යතාවය හා අවශ්‍යතාවය පිළිබඳ සාධාරණ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොවුනි.

සංචාරක කටයුතු

විගණන නිරීක්ෂණ

- සංචාරකයින් පැමිණීම හා ආදායම අඩුවීම
- සංචාරක අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා අමාත්‍ය කාර්යාලය පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යාම
- අනතුරකට ලක් වී අළුත්වැඩියාව සඳහා යොමු කර තිබුණු ජීප් රථයක් අමාත්‍යාංශයට පවරා ගැනීම
- අනතුරට ලක්වී තිබුණු වාහනයක් ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කිරීමකින් තොරව අලුත්වැඩියා කිරීම
- විදේශ දූත මණ්ඩල වෙත විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් ලබාදීම
- විදේශ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ප්‍රවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා නියෝජිත ආයතනයක් තෝරා ගැනීම
- ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම
- බදු දුන් ඉඩම්වල මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම
- තානායම් බදු දීම
- නවාතැන් සහ සංචාරක පහසුකම් සපයන ස්ථාන අධිකාරියේ ලියාපදිංචි කිරීම

සංචාරක කටයුතු

සංචාරක අමාත්‍යාංශය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පහත සඳහන් දේ ඉටු කළ යුතුව තිබුණි.

- පුළුල් පුද්ගල සහභාගීත්වයෙන් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සැකසීම.
- සංචාරකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වැඩපිළිවෙලක් සකස් කිරීම.
- විදේශීය සංචාරකයින් සඳහා නව ආකර්ශනීය ස්ථාන හඳුනා ගැනීම.
- සංචාරකයින් ආකර්ශනය කර ගැනීම සඳහා ව්‍යාපාරික සම්මන්ත්‍රණ, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැපයීම.
- සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශයට ආයෝජන සහ වෙනත් පහසුකම් සැපයීම.
- ප්‍රධාන සංචාරක නගර සම්බන්ධ කරන මාර්ග මංසන්දි වල සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටු වීම.
- ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මගින් සංචාරක පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.
- ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ශනීය නිපුණතා සංවර්ධන පාඨමාලා හඳුන්වාදීම.
- ගෘහ ආශ්‍රිත සහ ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම.
- සියලුම සංචාරක මාර්ගෝපදේශකයින් සහ රියදුරන් ලියාපදිංචි කිරීම, පුහුණු කිරීම සහ අනන්‍යතාවය සහතික කිරීම සඳහා කටයුතු කිරීම.
- සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යාපාරයක් බිහි කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් හඳුන්වාදීම.
- තොරතුරු තාක්ෂණය මගින් සංචාරකයින්ට පහසුකම් සැලසීම.
- One Stop සංකල්පය යටතේ එක් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හරහා සිදුකිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.
- උසස් තත්ත්වයේ සංචාරක හෝටල් පිහිටුවීම දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වා වැඩි කිරීම.
- ජාතික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ නිවැරදි තොරතුරු සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම සඳහා සංචාරක මගපෙන්වන්නන් හට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශයට සහ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත එකතුව රු. මිලියන 1,857ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව

විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 1,042ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 815 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. විස්තර රූප සටහන 54 හි දැක්වේ.



	සංචාරක අමාත්‍යාංශය	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	742	1,115	1,857
වියදම රු.මිලියන	302	740	1,042
ඉතිරිය රු.මිලියන	440	375	815

රූපසටහන 54 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සංචාරකයින් පැමිණීම හා ආදායම අඩුවීම

ඉකුත් වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත විදේශ සංචාරකයින් 507,704 ක් පැමිණ ඇති අතර සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රමාණය සියයට 61.7 කින් අඩුවී විදේශිය සංචාරකයින් 194,495 දෙනෙකු පැමිණ තිබුණි. කොවිඩ් වසංගතය හේතුවෙන් වරින් වර රට වසා දැමීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. සංචාරක අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන වල කාර්යන් හා කර්තව්‍යයන්ගේද යම් සීමා වීමක් මෙම සංචාරකයින්ගේ පැමිණීම අඩු වීම නිසා සිදු වී තිබුණි. 2021 වර්ෂයේ සංචාරකයින්ගේ පැමිණීම ඉකුත් වසර තුන සමඟ සසඳා රූපසටහන 55 හි දැක්වේ. එමෙන්ම 2018 වර්ෂයේදී සංචාරක ව්‍යාපාරයෙන් රු.මිලියන 711,961 ක ආදායමක් රැස් කර තිබුණත් 2019 වර්ෂයේදී එය රු.මිලියන 646,362 ක් දක්වා අඩු වී තිබුණු අතර 2020 වර්ෂයේදී එම ආදායම සියයට 80.78 කින් හෙවත් රු. මිලියන 522,173 කින් අඩු වී රු.මිලියන

124,189 ක් වී තිබුණි. 2021 වර්ෂයේදී එම ආදායම තවදුරටත් අඩුවී රු.මිලියන 100,620 ක් වී තිබුණි. විදේශ විනිමය අනුව සලකා බලන විට 2018 වර්ෂයේදී එ.ජ.ඩො.මිලියන 4,380.6 කට සාපේක්ෂව 2019 වර්ෂයේදී එ.ජ.ඩො මිලියන 3,606.9 ක් දක්වා අඩු වී තිබුණි. 2020 සහ 2021 වර්ෂ වලදී එම අදායම පිළිවෙළින් එ.ජ.ඩො.මිලියන 682.5 ක් සහ 506.9 ක් දක්වා අඩුවිය. ඒ අනුව 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී එ.ජ.ඩො.මිලියන 2,924.4 ක් හෙවත් සියයට 81.08 කින් අඩුවී තිබූ අතර 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී එය තවත් එ.ජ.ඩො.මිලියන 175.6 කින් අඩුවී තිබුණි. සංචාරක ව්‍යාපාරයෙන් ලද ආදායම 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රමිකව වැඩිවී 2019 වර්ෂයේ සිට 2021 අවසන් වන විට සීඝ්‍ර ලෙස අඩු වී තිබුණි. ඒ පිළිබඳ විස්තර රූපසටහන 56 දැක්වේ.



	2018	2019	2020	2021
පැමිණි විදේශ සංචාරකයින් ගණන	2,333,796	1,913,702	507,704	194,495

රූප සටහන 55 - සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ තුනේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



	2015	2016	2017	2018	2019	2020	2021
සංචාරක ව්‍යාපාරයෙන් ලද අදායම (රු.මිලියන)	405,492	512,293	598,356	711,961	646,362	124,189	100,620

රූප සටහන 56 - සංචාරක ව්‍යාපාරයෙන් ලද අදායම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2013 වර්ෂයේ සිට ක්‍රමිකව වර්ධනය වී 2018 වර්ෂයේදී රු. මිලියන 1,482 ක් දක්වා සංචාරක සංවර්ධන බදු ආදායම වැඩිවී තිබූ අතර 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සංචාරක සංවර්ධන බදු ආදායම සීග්‍ර ලෙස අඩුවී තිබුණි. 2021 වර්ෂයේදී එය රු. මිලියන 809.7 ක් දක්වා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 51 කින් වැඩිවී තිබුණි. එසේම විදේශ සංචාරකයන් සඳහා වන අපගමන බදු ආදායම ද 2013 වර්ෂයේ සිට ක්‍රමිකව වර්ධනය වී 2018 වර්ෂයේදී රු. මිලියන 2,824.9 දක්වා වැඩිවී 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 483.9 දක්වා සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි. විස්තර රූප සටහන 57 හි දැක්වේ.



	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
සංචාරක සංවර්ධන බදු ආදායම (රු.මිලියන)	1014.2	1005.6	1014.8	1276.8	1541.5	1482.1	924.2	537.8	809.9
විදේශ සංචාරකයන් සඳහා අපගමන බද්ද (රු.මිලියන)	1604.9	1779.8	1968.5	2355.4	2378.8	2824.9	2089.2	489.5	483.9

රූප සටහන 57 - සංචාරක සංවර්ධන බදු අදායම හා විදේශ සංචාරකයින් සඳහා අපගමන බද්ද

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා අමාත්‍ය කාර්යාලය පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යාම

ජනාධිපති ලේකම්ගේ අංක. සීඒ1/17/1 සහ 2010 මැයි 14 දිනැති "රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය" අනුව අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා සියලුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යා යුතු බව දැනුම් දී තිබුණ ද, සංචාරක අමාත්‍යාංශය යෝර්ක් වීදියේ, ඇසෙට් ආකේඩ් නම් වූ පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් තිබුණු අතර අමාත්‍ය කාර්යාලය ඉහත ගොඩනැගිල්ලේ හෝ ස්ථානගත නොකර ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් ලබාගත් කාර්යාලයක කුලියට පවත්වාගෙන ගොස් තිබුණි. දරා ඇති කුළී වියදම රු.මිලියන.43.4 ක් විය.

අනතුරකට ලක් වී අළුත්වැඩියාව සඳහා යොමු කර තිබුණු ජීප් රථයක් අමාත්‍යාංශයට පවරා ගැනීම

සංවර්ධන උපාය මාර්ග සහ අන්තර්ජාතික වෙළඳ අමාත්‍යාංශයට අයත්ව තිබියදී, 2019 නොවැම්බර් 24 දින හදිසි අනතුරකට ලක් වී තිබුණු ජීප් රථයක් අළුත්වැඩියාව සඳහා රු.මිලියන 20.8 ක පිරිවැයකට සමාගමක් වෙත යොමු කර තිබිය දී, 2021 ජූලි 22 වන දින සංචාරක අමාත්‍යාංශ ලේකම් නමට පවරා ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, රක්ෂණ ආයතනයට අනුව මෙම රථයේ වෙළඳපල වටිනාකම වන රු.මිලියන 15.5 ක මුදලකට ගර්භිත කිරීම හෝ අලුත්වැඩියාව සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 9.3 ක මුදලක් පමණක් ගෙවීමට හැකිබව අමාත්‍යාංශය වෙත දන්වා තිබුණු බැවින් හිඟ අලුත්වැඩියා වියදම් වටිනාකම රු. මිලියන 11.5 ක වගකීමක් අමාත්‍යාංශයට භාර ගැනීමට සිදු වී තිබුණි.

අනතුරට ලක්වී තිබුණු වාහනයක් ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කිරීමකින් තොරව අලුත්වැඩියා කිරීම

අනතුරට ලක්වී තිබුණු වාහනයක අලුත්වැඩියා කටයුතු නියෝජිත ආයතනයකින් සිදුකරන ලෙස 2021 ඔක්තෝබර් 26 දින සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් ලබා දී තිබියදී, ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කිරීමකින් තොරව, වෙනත් පෞද්ගලික ගරාජයකට මෙම වාහනයේ අලුත්වැඩියාව පවරා ඒ වෙනුවෙන් රු. මිලියන 1.5ක පිරිවැයක් දරා තිබුණි. එය නියෝජිත ආයතනයේ ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 0.2 ක වැඩි මිලක් විය.

විදේශ දූත මණ්ඩල වෙත විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් ලබාදීම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් රටවල් 24ක විදේශ දූත මණ්ඩල වෙත යැවූ විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් වල සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂය වූ රු.මිලියන 44 ක් සඳහා අදාළ ශේෂ සනාථ කිරීම් එකී දූත මණ්ඩල මගින් ඍජුවම නොඑවා විදේශ අමාත්‍යාංශය විසින් එවා තිබුණු අතර සනාථ කළ ශේෂය රු.මිලියන7.5 ක් වූ බැවින් ගිණුම් අතර රු.මිලියන 36.6 ක වෙනසක් විය.

විදේශ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම

අංක CSA/2/3/4 සහ 2006 පෙබරවාරි 21 දිනැති ජනාධිපති චක්‍රලේඛයට අනුව අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා එකවර විදේශ ගමන්හි නොයෙදිය යුතු බවට දන්වා තිබුණද, 2021 ඔක්තෝබර් 05 සිට 08 දක්වා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් ප්‍රංශයේ පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එම දෙදෙනාම එකවර සහභාගි වී තිබුණු අතර ඒ සඳහා නවාතැන්, සංයුක්ත දීමනා සහ ගුවන් ප්‍රවේශ පත්‍ර ඇතුලු වියදම් සඳහා රු.මිලියන 2.5 ක වියදමක් කාර්යාංශයේ මුදලින් ගෙවා තිබුණි. තවද, එකී චක්‍රලේඛය ප්‍රකාරව විදේශ ගමන් සඳහා සහභාගීත්වය අවම විය යුතු බවට

දැනුම් දී තිබියදී, ප්‍රංශය, රුසියාව සහ යුක්රේනයේ පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක, අමාත්‍යවරයාගේ මාධ්‍ය ඒකක ප්‍රධානී, සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ද සහභාගී වී තිබුණු අතර ඔවුන්ගේ නවාතැන්, සංයුක්ත දීමනා සහ ගුවන් ප්‍රවේශ පත්‍ර වෙනුවෙන් රු.මිලියන 7.9 ක් ගෙවා තිබුණි. චක්‍රලේඛය ප්‍රකාරව ගමනට ගතවන කාලය ද ඇතුළත්ව සහභාගි වන කාලය අත්‍යවශයෙන්ම අවම කළයුතු බව දන්වා තිබියදී 2021 සැප්තැම්බර් 06 සිට 10 දක්වා රුසියාවේ සහ යුක්රේනයේ පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක, අමාත්‍යවරයාගේ මාධ්‍ය ඒකක ප්‍රධානී සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා ගමනට දින 07 ක් පෙරාතුව සහභාගි වීම නිසා ඔවුන් සඳහා නවාතැන් සහ සංයුක්ත දීමනා වෙනුවෙන් අමතරව රු.මිලියන 2.4 ක් ගෙවා තිබුණි.

2021 ඔක්තෝබර් 05 සිට 08 දක්වා ප්‍රංශයේ පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව 2021 ඔක්තෝබර් 06 දින ප්‍රවර්ධන සන්ධ්‍යාවක් (Promotional Evening) පැවැත්වීමට සැලසුම් කර පසුව එය අවලංගු කර තිබියදී, අමාත්‍යවරයාගේ උපදෙස් මත එම සන්ධ්‍යාව එදින නොපවත්වා, 2021 නොවැම්බර් 09 දින නැවත පවත්වා තිබුණි. ඒ සඳහා අමාත්‍යවරයා, සංචාරක උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක සහ ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරියෙක් සහභාගී වී රු.මිලියන 3 ක වියදම් දරා තිබුණු අතර සංචාරක ප්‍රවර්ධන සන්ධ්‍යාව ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව පැවැත්වූවා නම් එම වියදම වළක්වා ගැනීමට ඉඩ තිබුණි.

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ප්‍රවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා නියෝජිත ආයතනයක් තෝරා ගැනීම

අංක 08/01/2021 සහ 2021 අගෝස්තු 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව 2021 සැප්තැම්බර් 06 සිට 10 දක්වා රුසියාවේ සහ යුක්රේනයේ පැවත්වූ ප්‍රවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් නියෝජිත ආයතනයක් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර තිබුණු නමුත් එසේ බැහැරවීමට හේතු වූ කරුණු නිශ්චිතව වාර්තා කර නොතිබුණි. වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් නියෝජිත ආයතනයට ගෙවූ මුදල රු.මිලියන 11 ක් විය.

ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම

චීනයේ ප්‍රචාරණ වැඩසටහනක් වෙනුවෙන් එරට ආයතනයක් සමග ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය එළඹි ගිවිසුමට අනුව 2019 පෙබරවාරි 28 දින රු.මිලියන 25 (ඇ.ඩො.137,600) ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් වැඩසටහන අතරමග නවතා දමා තිබුණි. තවද, මැදපෙරදිග පැවැත්වීමට සැලසුම් කර තිබුණු ‘Riyadh Travel Fair

2020" නමැති ප්‍රචාරණ වැඩසටහන වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2019 දී රු.මිලියන 8.1 ක මුදලක් ගෙවා තිබුණු අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය මත එම වැඩසටහන කල් දමා තිබුණි. කෙසේවුවද, 2021 වර්ෂය අවසාන දින වන විටත් මෙම වැඩසටහන් නැවත ආරම්භ කිරීමට හෝ අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

බදු දුන් ඉඩම්වල මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම

2014 වර්ෂයේදී සමාගම් 5 කට අක්කර 35 ක් ද, 2019 සහ 2020 වර්ෂවල තවත් සමාගම් 2 කට අක්කර 16.8 ක් ද වශයෙන් යාල පලටුපාන සංචාරක සංවර්ධන කලාපයේ ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබුණ ද, සමාගම් 2 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. සංචාරක සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා කුච්චවෙලි හි 2011 සහ 2014 වර්ෂවලදී පවරා ගත් ඉඩම් අක්කර 510.086 ක් වූ භූමි ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 49 ක් පමණක් සමාගම් 3කට බදු දී තිබුණ ද එම සමාගම් 3 න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතු වල නිරතව තිබුණි. සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12ක ඉඩම් අක්කර 2055.87 ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන්වලදී අධිකාරියට ලැබී තිබුණ ද, එම දූපත් 12න් දූපත් 05 කට අයත් ඉඩම් අක්කර 206.58 ක් පමණක් 2010, 2011 සහ 2020 වර්ෂවලදී සමාගම් 03 ට බදු දීමට කටයුතු කර තිබුණි. කෙසේවුවද, එම කිසිදු සමාගමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. බදු දී තිබුණු සමාගම්වලින් සමාගම් 2 ක පිළිවෙලින් රු.මිලියන 43 ක් සහ රු. මිලියන 9 ක් වශයෙන් වසර 3 සිට වසර 5 දක්වා බදු කුලිය හිඟව පැවතුණි.

තානායම් බදු දීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු තානායම් 37 න් තානායම් 9 ක් වසර එකේ සිට වසර දහතුනක් දක්වා කාලයක් බදු දී නොතිබීම හේතුවෙන් එකී දේපල ඌන උපයෝජිතව පැවතුණි.

නවාතැන් සහ සංචාරක පහසුකම් සපයන ස්ථාන අධිකාරියේ ලියාපදිංචි කිරීම

2020 වර්ෂයේ දී නවාතැන් සහ සංචාරක පහසුකම් සපයන ස්ථාන ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වූ ස්ථාන සංඛ්‍යාව 5,378 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම සංඛ්‍යාව 5,872 ක් විය. ඒ අනුව අළුතින් ලියාපදිංචි වූ ස්ථාන සංඛ්‍යාව 494 කි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචිය අළුත් කළ ස්ථාන සංඛ්‍යාව 783 ක් පමණක් වූ බැවින් පෙර වර්ෂයේ ලියාපදිංචි කළ ස්ථාන 5,378 න් 4,595 ක්ම ලියාපදිංචිය අලුත්කර නොතිබුණි.

වෙළඳ අංශය

විගණන නිරීක්ෂණ

- වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු ඉටු නොවීම
- සහල් සංචිත පවත්වා ගෙන යාම
- සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් ගබඩා නවීකරණය කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබා දීමේ ව්‍යාපෘතිය
- අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු දේශීය නිෂ්පාදන බෙදාහැරීමේ අරමුණින් කුඩා අලෙවිසැල් ජාලයක් ස්ථාපිත කිරීම
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය
- පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම
- ලංකා සතොස සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව උපකරණ කුළියට ගැනීම
- ලංකා සතොස සමාගමට ලැබිය යුතු ගිණුම්
- රට බීම වෙළඳ සැල් පුරස්කාර
- සීනි මත බදු පැනවීම
- වෙළඳාමේදී භාවිතා වන මිනුම් උපකරණ සහ මිනුම් ප්‍රමිත සත්‍යාපනය කිරීම

වෙළඳ අංශය

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය හා ඒ යටතේ සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයක්ද, දෙපාර්තමේන්තු 05 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන 09 ක්ද විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව ඇත.

- ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.
- වෙළෙඳපොල තුළ භාණ්ඩ වල මිළ අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම
- විවෘත තරඟකාරී වෙළෙඳපොල පරිසරයක ලංකා සතොස සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, සමූපකාර තොග වෙළඳ සංස්ථාව වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීම
- වෙළඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතින් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම
- ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම
- ජාතික වශයෙන් අපනයනය දිරිමත් කිරීම සඳහා නෛතිකමය සහාය, උපදේශක දායකත්වය ලබාදීම
- දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් සංවිධානයට මඟපෙන්වීම
- අධ්‍යාපනයේදී, උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලින් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම

- ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම
- ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතීතන සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපොළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම
- අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී මඟපෙන්වීම හා සම්බන්ධීකරණය
- ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය (GSP) අන්‍යොන්‍ය නොවන වෙළඳ ගිවිසුම් (NMTR), නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2021 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 8,020 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 7,159ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 861 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි විස්තර රූපසටහන 58 හි දැක්වේ.



	වෙළඳ අමාත්‍යාංශය	සමූපකාර සේවා,අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය	ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව	සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	වාණිජ දෙපාර්තමේන්තුව	මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය	සමූපකාර සේවක කොමිෂන් සභාව	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	6,069	770	571	193	160	177	56	24	8,020
වියදම රු.මිලියන	5,403	711	540	131	150	160	45	19	7,159
ඉතිරිය රු.මිලියන	666	59	31	62	10	17	11	5	861

රූපසටහන 58 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාර ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන වලදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු ඉටු නොවීම

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම යන ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණි.

සහල් සංචිත පවත්වා ගෙන යාම

2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණද පසුගිය වර්ෂයන් තුළ දෙපාර්තමේන්තුව විසින් සහල් සංචිතයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. 2021 වර්ෂයේදී දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ අවශ්‍යතාවය මත ශ්‍රී ලංකාව තුළ සහල් මෙට්‍රික් ටොන් 8,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා රු.මිලියන 200 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණි. කෙසේ වෙතත් 2021 ඔක්තෝබර් මාසය දක්වාත් ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා මෙම ප්‍රතිපාදනය උපයෝගී කර නොගැනීම හේතුවෙන් අදාළ ප්‍රතිපාදනය රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත මාරු කර තිබුණි.

සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් ගබඩා නවීකරණය කිරීම

සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් ගබඩා 13 ක් නවීකරණය සඳහා වන කොන්ත්‍රාත් ප්‍රදානය 2019 වසරේ සිදුකර තිබුණු අතර කොන්ත්‍රාත් කාලය දින 30 සිට 180 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. සංස්ථාව විසින් ගබඩා නවීකරණය සඳහා රු.මිලියන 82.5 ක් වැය කර තිබුණු අතර වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 62.4 ක වියදම් ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වුවද 2022 අප්‍රේල් 30 දින වන විට ගබඩා 06 ක නවීකරණ කටයුතු අවසන්වී තිබුණු අතර අනෙකුත් ගබඩා 07හි නවීකරණ කටයුතු වල ප්‍රගතිය සියයට 05 සිට 95 දක්වා වී තිබුණි.

සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබා දීමේ ව්‍යාපෘතිය

2020 මැයි මස 07 වන දිනැති අමප/20/0722/218/010 දරන අමාත්‍ය

මණ්ඩල තීරණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කාරක ප්‍රාග්ධනය ලබා දෙමින්, ඔවුන්ට නැවතත් වී මෝල් ක්‍රියාත්මක කරවා විකිණීම සඳහා සතොස ආයතනය වෙත හෝ අරක්ෂිත තොගයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත සහල් ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 2020 වර්ෂයේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සහල් මෝල් හිමි සමූපකාර සමිති සඳහා ප්‍රමුඛතාවය ලබා දීම , 2020 ජනවාරි මාසයේ ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ලබා දුන් සහන පැකේජය තුලින් ණය පහසුකම් ලබා නොගත් මෝල් හිමියෙකු වීම සහ බැංකු වෙත ණය වාරික ගෙවීම පැහැර හැර නොමැති වීම යන නිර්ණායක වලට යටත්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය තුළ රු.මිලියන 266.7 ක සහ 2021 වර්ෂය තුළ රු.මිලියන 109 ක ණය පහසුකම් ලබා දී තිබුණි.මෙම ණය ලබාදීමේදී එක් එක් සහල් මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ණය සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු අතර එක් එක් සමූපකාර සමිති වල සියළු සාමාජිකයින් ලබා ගත් බැංකු ණය වලින් නොගෙවූ මුළු ණය ප්‍රමාණය හා ගෙවිය යුතු මාසික වාරිකය පදනම් කරගෙන එක් එක් සමිතිය සඳහා ව්‍යාපෘතිය යටතේ ලබා දිය යුතු ණය ප්‍රමාණය තීරණය කර තිබුණි .ණය ලබාදිය යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් පවතින ගැටළු හේතුවෙන් අගතියට පත් පාර්ශව විසින් අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වී තිබුණු අවස්ථාද නිරීක්ෂණය විය. ඒ අනුව ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් නිර්ණායකයන්ට පටහැනිව ණය ලබා දී තිබුණු අතර එම තත්වයන් වළක්වා ගැනීම සඳහා වෙළඳ, වානිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණි.

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු දේශීය නිෂ්පාදන බෙදාහැරීමේ අරමුණින් කුඩා අලෙවිසැල් ජාලයක් ස්ථාපිත කිරීම

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු දේශීය නිෂ්පාදන බෙදාහැරීමේ අරමුණින් කුඩා අලෙවිසැල් ජාලයක් දිවයින පුරා ස්ථාපිත කිරීම සඳහා “Q Shop” සංකල්පය 2020 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. 2021 වර්ෂය අවසන් වන විට Q Shop වෙළෙඳසැල් 20 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළ මේ වෙනුවෙන් රු.මිලියන 34.3 ක මුදලක් ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වුවද, 2022 මාර්තු 28 දින වන විට වෙළෙඳසැල් 08 ක් පමණක් ස්ථාපිත කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක් අලෙවිසැලකට ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2.5 ක් වුවද එම මුදල ඉක්මවා අලෙවිසැල් 5 ක් ඉදි කර තිබූ අතර ඒ සඳහා දරන ලද අමතර පිරිවැය රු.මිලියන 10.87 ක් වී තිබුණි. එසේම මෙම අලෙවිසැල් බහාලුම් පෙට්ටි නවීකරණය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින්

බහාලුම් පෙට්ටි 20 ක් සඳහා ආයෝජන කරන ලද මුදල වෙනුවෙන් වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් 2021 ජනවාරි 26 දින රු.මිලියන 7.2 ක් නිදහස් කර තිබුණි. කෙසේ වෙතත් වෙළෙඳසැල් 08 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර එම බහාලුම් ප්‍රමාණය මිලදී ගත් බවට තහවුරු කර ගැනීම හෝ එම මුදල වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් වෙළඳ, වානිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් පසු විපරම් කර නොතිබුණි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය

- 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර 2021 වර්ෂය වන විට වසර 17 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි.

- 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 13 වන උපවගන්තිය යටතේ 2021 වර්ෂය තුළදී දිස්ත්‍රික් කාර්යාල හැර අධිකාරියේ පාරිභෝගික පැමිණිලි අංශය වෙත ලද 1,557 ක් වූ පැමිණිලි අතුරින් 2021 දෙසැම්බර් 31 දිනට පැමිණිලි 318 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු නිම වී නොතිබුණි.

- 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,647 කින් පැමිණිලි 767 කට 2021 දෙසැම්බර් 31 දින වන විට විසඳුම් ලබා දී තිබුණු අතර පැමිණිලි 194 ක් ඉවත් කර තිබුණි. පැමිණිලි 291 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 168 කට නියෝග නිකුත් කර තිබුණද ඉන් පැමිණිලි 14කට අදාළව නියෝග අත්සන් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් වැටලීම් 9,494 ක් සිදු කර තිබුණු අතර, එය පෙර වර්ෂයේ සිදු කල 15,923 ක් වූ වැටලීම් වලට සාපේක්ෂව සියයට 40 ක පහල වැටීමක් වේ. ඉන් සමාලෝචිත වර්ෂය තුළ නඩු පවරා තිබුණේ වැටලීම් 6,980 කට පමණි.

- පාරිභෝගිකයින්ට ක්ෂණික පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 1977 දුරකථන සේවාව 2013 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර 2021 වර්ෂයේ මහජන පැමිණිලි 8,056 ක් ඊට ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පැමිණිලි 2,646 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර වැටලීම් සිදුකර තිබුණේ පැමිණිලි 816 ක් සම්බන්ධයෙන් පමණි. ක්ෂණික ඇමතුම් සේවාව සඳහා ලද පැමිණිලි වලින් දිස්ත්‍රික්ක 07 ක පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සියයට 15 ත් සියයට 53 ත් අතර විය.

- 2021 අගෝස්තු 12 දිනැති අංක 2240/30 දරන ගැසට් පත්‍රය මඟින් රසායනාගාර පරීක්ෂණ සඳහා මිල පාලනය කර තිබුණ ද එම මිල පාලනය පාරිභෝගිකයා අතරට ගිය බවට සමීක්ෂණ කිරීමට දිස්ත්‍රික්ක 02

කින් වැටලීම් 03 ක් පමණක් සිදුකර තිබුණි.

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 8 (ඌ) වගන්තිය අනුව වෙළඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු වලට අදාළව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම අධිකාරියේ එක් කර්තව්‍යක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2021 වර්ෂයේදී කාබනික කෘෂිකර්ම හා කාබනික නිෂ්පාදන සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ හා වෙළඳපොලෙහි අලෙවි වන විවිධ අත් සේදුම් දියර වර්ග වල අන්තර්ගත ඇල්කොහොල් ප්‍රතිශතය පිළිබඳව සිදුකරන ලද වෙළඳපොල අධ්‍යයන 2 ක් සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 61 (3)(ආ) වගන්තිය ප්‍රකාරව යම් භාණ්ඩයක් ප්‍රමිත හා පිරිවිතර වලට අනුකූල නොවන බව සහ ඒ අනනුකූලතාව නිසා අදාළ භාණ්ඩය යම් ප්‍රයෝජනයකට ගත නොහැකි හෝ පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයකට පත් වී ඇති බව හෙළිදරව් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ භාණ්ඩය හෝ භාණ්ඩ තොගය තහනමට ගෙන නීතිමය පියවර ගතයුතුය. නියැදි පරීක්ෂාවකට අනුව අනාවරණය වූ ප්‍රමිතියෙන් තොර ටින්මාළු අලෙවි කල කඩහිමියන්ට එරෙහිව පමණක් නඩු පවරා තිබුණු නමුත් එම භාණ්ඩ නිෂ්පාදිත සමාගම් 05 කට එරෙහිවද නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම

2021 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 181 ක් වූ අතර ඉන් බලපත්‍ර 30 ක් 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ලද ඉල්ලුම්පත් විය. පනතේ 83(1) වගන්තිය අනුව පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය ඉල්ලුම්පත් ලද දිනයේ සිට අවුරුදු 20 ක් වන බැවින් ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීම සඳහා වසර 06 ත් වසර 13 ත් අතර කාලයක් ගතව තිබීමෙන් වලංගු කාලයෙන් වැඩි කොටසක් ලියාපදිංචි ක්‍රියාවලිය සඳහා වැය වී ඇති බව නිරීක්ෂණය විය. මේ අනුව පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමෙන් ඉල්ලුම්කරු බලාපොරොත්තු වන සුරක්ෂිතභාවය ඉටු වී නොතිබුණි.

ලංකා සතොස සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම

ලංකා සතොස සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර වර්තමානය වන විටත් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා තනතුරක් වන අතර එය ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. අදාළ තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර නොතිබුණ අතර වැටුප් හා දීමනා අවස්ථා කිහිපයකදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා අමාත්‍ය මණ්ඩල තීරණ

මගින් අනුමත කර තිබුණි. එම තනතුරේ කාර්යයභාරය හා රැකියා විස්තරය අනුව නිශ්චිත වැටුපක් අනුමත කර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. 2017 මැයි 16 දිනැති අංක DMS/1741 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට පටහැනිව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ වැටුප් හා දීමනා අනුමත කර තිබුණු අතර ඒ අනුව විධිමත් අනුමැතියකින් තොරව 2019, 2020 හා 2021 වර්ෂ වලදී ගෙවා තිබු වැටුප් හා දීමනා රු.මිලියන 6.5 ක් විය.

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව උපකරණ කුළියට ගැනීම

2019 සිංහල හා හින්දු අවුරුදු උත්සවය ඉලක්ක කර ගෙන ලංකා සතොස අලෙවිසැල්වල තොග වර්ධනය කිරීම සහ අලෙවිය වැඩි කර ගැනීම සඳහා එඬේරමුල්ල තොග ගබඩාවේ මෙහෙයුම් කටයුතු සඳහා මාස 2 කට පමණක් Pallet Jack Cart එකක් රු.7,500 බැගින් 6 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව 2019 වර්ෂයේදී කුළියට ගෙන තිබුණි. මෙම උපකරණයක පැවති මිල රු.55,000 වූ බැවින් මිලදී ගැනීම ආර්ථික පිරිමැසුම්දායක නොවන බව සඳහන් කරමින් කුළියට ගැනීමට තීරණය කර තිබුණද අදාළ සමාගම සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. කෙසේ නමුත් 2022 ජුනි 25 දින වන විට ගබඩා 3 ක මෙහෙයුම් කටයුතු සඳහා අනුමැතියකින් තොරව උපකරණ 59 ක් කුළියට ගෙන තිබුණ අතර වැය කර තිබුණු මුදල රු.මිලියන 9.2 ක් විය. ආර්ථික පිරිමැසුම් බව සැලකිල්ලට ගෙන කටයුතු නොකිරීම නිසා කුළියට ගත් මුදලින් උපකරණ 165 ක් පමණ මිලදී ගැනීම සමාගමට අහිමිව ගොස් තිබුණි.

ලංකා සතොස සමාගමට ලැබිය යුතු ගිණුම්

- ලංකා සතොස සමාගමේ ගොඩනැගිලි කුළියට ගැනීමේ මාර්ගෝපදේශය අනුව ගොඩනැගිලි නොමැති හිස් ඉඩම් සඳහා අනාගතයේ වෙළඳසැල් පටන් ගැනීමේ උපකල්පනය මත අත්තිකාරම් නොගෙවිය යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දින වන විට එළඹ තිබුණු ගිවිසුම් 29 ක් අනුව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා වසර 1 ½ ක අත්තිකාරම් මුදල් ලෙස රු.මිලියන 34.2 ක් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි. එසේ ඉදි කරන ලද ගොඩනැගිලිවලින් භාවිතයට සුදුසු පරිදි ඉදිකිරීම් සිදුකර සමාගමට භාරදී නොතිබුණු ගොඩනැගිලි හිමිකරුවන් 29 දෙනෙකුගෙන් 18 දෙනෙකුට එරෙහිව රු.මිලියන 27.43 ක් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. එසේ වුවද, 2022 ජුනි 15 දින වන විටත් එම මුදලින් කිසිදු මුදලක් අය කර ගෙන නොතිබුණි.

- අමාත්‍ය මණ්ඩල තීරණ අනුව පාරිභෝගිකයන්ට සහන දීමේ අරමුණින් සැමන් හා පරිප්පු යන ආහාර ද්‍රව්‍ය දෙක සඳහා 2020 මාර්තු 18 සිට 2020 අප්‍රේල් 29 දක්වා කාලය තුළ මිල අඩු කිරීම නිසා පිරිවැය මත ගණනය කළ අලාභය රු.මිලියන 705.62 ක් වූ මුදල, මුදල් අමාත්‍යාංශය විසින් සමාගමට පියවා

තිබුණි. සමාගම විසින් ගණනය කර තිබුණු ගැනුම් මිල හා ගැනුම් පිරිවැය අතර වියදම රු. මිලියන 71.99 ක් වූ අතර එයින් රු.මිලියන 42 ක් පියවීමට අංක 21/0563/313/016 හා 2021 අප්‍රේල් 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමත කර තිබුණි. සමාගම විසින් මුදල් අමාත්‍යාංශයෙන් මෙම මුදල ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලීම් කර තිබුණද එය 2022 ජුනි 27 දින වන විටත් ලැබී නොතිබුණි. ඒ අනුව, මුළු මුදල වූ රු. මිලියන 71.99 සමාගමට සිදු වූ පාඩුවක් විය.

රට බීම වෙළඳ සැල් පුරස්කාර

සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් රට බීම වෙළඳ සැල්වල මෙහෙයුම් කටයුතු ලංකා සතොස ලිමිටඩ් විසින් සිදු කරන අතර ඒ සඳහා වාර්ෂිකව සමුපකාර තොග වෙළඳ සංස්ථාවට පුරස්කාර වියදමක් ද රට බීම වෙළඳ සැල් බලපත්‍රය අළුත් කිරීම සඳහා වියදමක්ද දෙපාර්ශවය අතර ගිවිසුමකින් තොරව සමාගම විසින් ගෙවනු ලබයි. මෙම බලපත්‍ර පවරා ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට කටයුතු කළද 2022 ජුනි 25 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. මෙසේ පවරා නොගැනීම නිසා පුරස්කාර වශයෙන් 2020 හා 2021 වර්ෂවලදී රු.මිලියන 16.22 ක අමතර වියදමක් දරා තිබුණි.

සීනි මත බදු පැනවීම

අංක 2197/12 හා 2020 ඔක්තෝබර් 13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2020 ඔක්තෝබර් 14 දින සිට සීනි මත පනවා තිබුණු එතෙක් පැවති බද්ද ශත 25 දක්වා අඩු කර තිබුණු අතර අංක 2201/8 හා 2020 නොවැම්බර් 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සීනි මත පාලන මිලක් නියම කර තිබුණි. බදු අඩු කිරීම හා පාලන මිල නියම කිරීම මත ලංකා සතොස සමාගම මිලදී ගත යුතු මිල රු.80 ක් වූ අතර විකුණුම් මිල රු.85 ක් විය. 2020 ඔක්තෝබර් 14 දින සමාගම සතුව පැවති සීනි තොගය කිලෝ ග්‍රෑම් 919,409 ක් වූ අතර ඒ මත ගණනය කළ රු. මිලියන 37.16 ක් වූ අලාභය මුදල් අමාත්‍යාංශය විසින් ලංකා සතොස සමාගමට පියවා තිබුණි. බද්ද ශත 25 දක්වා අඩු කළද ලංකා සතොස සමාගම විසින් රු.80 ට වඩා වැඩි මිලට ප්‍රසම්පාදනය කර මිලදී ගෙන තිබුණු බැවින් පාලන මිල ඉවත් කළ දිනය වූ 2021 පෙබරවාරි 08 දින වන විට සමාගමට සිදු වූ පාඩුව රු. මිලියන 42.81 ක් විය.

වෙළඳාමේදී භාවිතා වන මිනුම් උපකරණ සහ මිනුම් ප්‍රමිත සත්‍යාපනය කිරීම

වෙළඳාමේදී භාවිතාවන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කළ යුතු වුවද, එසේ සෑම උපකරණයක්ම සත්‍යාපනය කරන බව තහවුරු කරගැනීමේ නිසි ක්‍රමවේදයක් මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර නොතිබුණු අතර දිස්ත්‍රික්ක 12 ක භාවිතා කරනු ලබන මිනුම් ප්‍රමිත නැවත සත්‍යාපනය කිරීම සඳහා සැලසුම් කර තිබුණද කිසිදු දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් එම කාර්යය ඉටු කර නොතිබුණි.

කාන්තා හා ළමා කටයුතු සංවර්ධනය

විගණන නිරීක්ෂණ

- ප්‍රතිපාදන ඉතිරි වීම
- සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක නොවීම
- පාසැල් නිල ඇඳුම් රෙදි නියමිත දිනට නොසැපයීම
- තාක්ෂණික දැනුම ලබානොදී කාන්තා ව්‍යවසායකයින් සඳහා ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් ලබාදීම
- අවදානමට ලක් වූ කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය
- නිෂ්කාර්ය වියදම්
- ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති සම්පාදනය නොකිරීම
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් නොකිරිම
- පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රමාදය
- අරමුදල් උපයෝජනය නොකිරීම
- මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

කාන්තා හා ළමා කටයුතු සංවර්ධනය

කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ වූ දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාපිත මණ්ඩලය හා ව්‍යාපෘතිය විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබාදීම
- නිතර ආපදා අවදානමකට ලක්වන පුද්ගලයන්ට විශේෂයෙන් කාන්තාවන් සහ ළමුනට රැකවරණය හා පහසුකම් සැලසීමටත් දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- සියළු දරුවන්ගේ මන්දපෝෂණය නිම කිරීම සඳහා විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව අදාළ සියළු ආයතන ඒකාබද්ධව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට ජාත්‍යන්තරව පියවර ගැනීම
- දරුවන් සම්බන්ධයෙන් වන ප්‍රමාද වෙමින් ඇති සියළු නඩු විසදීම සඳහා සෑම දිස්ත්‍රික් අධිකරණයකම වෙනම අංශයක් වෙන් කිරීම
- ළමා මධ්‍යස්ථානවල සිටින දරුවන් සඳහා කැපකරු පවුල් ක්‍රමයක් ඇති කිරීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම
- 'ළමා මිතුරු පාසල සංකල්පය' පුළුල් කිරීම
- රාජ්‍ය නියාමනය යටතේ ජාතික පෙර පාසල් ප්‍රතිපත්තිය මත පිහිටා පෙර පාසල් අධ්‍යාපනය පුළුල් කිරීම
- ග්‍රාමීය පාසල් සිසු ආකර්ශිත පාසල් බවට පත්කිරීම
- සියළු පාසල්වල පන්ති කාමර හා සනීපාරක්ෂක උපකරණ,ගුරු ශිෂ්‍ය විවේකාගාර, සෞඛ්‍ය පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- පාසල් පෙළ පොත්, විෂයය නිර්දේශ, ගුරු අත්පොත් ආදිය තොරතුරු තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ එළි දැක්වීමට පියවර ගැනීම

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 30,818 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 23,649 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූප සටහන 59 හි දැක්වේ.



	කාන්තා හා ළමා සංවර්ධනය, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	30,412	406	30,818
වියදම රු.මිලියන	23,248	401	23,649
ඉතිරිය රු.මිලියන	7,164	5	7,169

රූපසටහන 59 - ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රතිපාදන ඉතිරි වීම

- වැය විෂයයන් 43 ක් සඳහා අධි ප්‍රතිපාදන වෙන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 5,768.1 ක් ඉතිරි වී තිබූ අතර එය සියයට 24 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

- මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 3 ක් සඳහා මාරු කරන ලද ප්‍රතිපාදන වලින් සියයට 64 සිට සියයට 100 අතර පරාසයක ඉතිරිවීම් පැවතුණි.

සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක නොවීම

මෙම රක්ෂණාවරණය සඳහා 2021 වර්ෂය තුළ රු.මිලියන 3,700 ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර ඉන් රු. මිලියන 3,331 ක් රක්ෂණ ආයතනය වෙත ගෙවා තිබුණි. රක්ෂණ ආයතන තෝරා ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය නොකර 2018 ඔක්තෝබර් 01 දින සිට 2022 දෙසැම්බර් 01 දක්වා වූ කාලය සඳහා අවස්ථා 5 කදී කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. එම කාලපරිච්ඡේදය තුළදී ශිෂ්‍යයින් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් 33,974 කට ප්‍රතිලාභ නොලැබීම හා සුරක්ෂා පැමිණිලි කවුළුවට ලැබී තිබූ පැමිණිලි 2,422 ක් පරීක්ෂා කර විසඳුමක් ලබා දීමට පියවර ගෙන නොතිබුණි. සිසුන්ගේ හා දෙමාපියන්ගේ

දැනුවත් වීම ඉතා අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රතිලාභ ඉල්ලුම් කරන සංඛ්‍යාව සියයට 0.84 ක් වැනි ඉතා කුඩා ප්‍රතිශතයක් වී තිබුණි.

පාසැල් නිල ඇඳුම් රෙදි නියමිත දිනට නොසැපයීම

2021 වර්ෂය සඳහා නිල ඇඳුම් රෙදි සැපයීම් කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන අනුව 2021 වර්ෂයට අවශ්‍ය සියළු නිල ඇඳුම් 2020 නොවැම්බර් 15 දිනට පෙර පාසැල් වෙත ලබා දිය යුතු වුවද 2020 දෙසැම්බර් 23 දින වන විට කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල වෙත බෙදා අවසන් කල නිල ඇඳුම් රෙදි ප්‍රමාණය මුළු නිල ඇඳුම් රෙදි අවශ්‍යතාවයෙන් සියයට 20ක් වැනි අවම මට්ටමක විය.

තවද, පාසැල් හා කලාප මට්ටමින් ශිෂ්‍ය සංඛ්‍යාව පිලිබඳව යාවත්කාලීන කරන ලද නිවැරදි දත්ත පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 අනුව 2021 වර්ෂයේ ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා අවස්ථා දෙකකදී නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට කටයුතු කර තිබීමෙන් අවශ්‍ය කාලය තුළ පාසැල් දරුවන්ට නිල ඇඳුම් ලබා දීමට නොහැකි වී තිබුණි.

තාක්ෂණික දැනුම ලබානොදී කාන්තා ව්‍යවසායකයින් සඳහා ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් ලබාදීම

අමාත්‍යංශය විසින් රු. මිලියන 3.5 ක් වැය කර කාන්තා ව්‍යවසායකයින් කාණ්ඩ 13 ක් යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඩිජිටල් අලවිකරණ වේදිකාවක් (Digital Marketing Platform) 2020 වර්ෂයේ නිර්මාණය කර තිබුණ ද කාන්තා ග්‍රාමීය ව්‍යවසායකයින්ට ඒ පිළිබඳ නොදැනුවත්භාවය හා තාක්ෂණික දැනුම නොමැතිවීම හේතුවෙන් 2022 මැයි මාසය වන විට කාණ්ඩ 4 ක් යටතේ ව්‍යවසායකයින් 8 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි.

අවදානමට ලක් වු කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

අවදානමට ලක් වු කන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන අම්පාර දිස්ත්‍රික්කයේ ආරම්භ කර ඇති දිරිය වනිතා ඇගළුම් හා පාවහන් ව්‍යාපෘතිය සහ දිරිය වනිතා අත්යන්ත්‍ර නිමවුම් විශේෂ ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යංශය විසින් 2021 වර්ෂය අවසන් වන විට රු.මිලියන 6.9 ක් වැයකර යන්ත්‍රසූත්‍ර හා උපකරණද ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම්ද කර තිබුණි. මෙම දිස්ත්‍රික්කය තුළ ආබාධිත හා වැන්දඹු කාන්තාවන් 20,000ක් පමණ සිටියදී ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් ගණන 20 දෙනෙකු වැනි අවම මට්ටමක පැවතුණි

නිෂ්කාර්ය වියදම්

ත්‍රිපෝෂ සමාගම විසින් පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය මත ජපානයේ සමාගමක නිෂ්පාදිත යන්ත්‍රය 2020 ජූනි මාසයේදී රු.මිලියන 209.3 කට මිලදී ගෙන තිබුණි. එම යන්ත්‍රය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට පෙර පුහුණු කටයුතු සඳහා නිලධාරීන් 4 දෙනෙකු ජපානයට සංචාරය කිරීම සඳහා රු. මිලියන

5.3 ක් හා යන්ත්‍රය තැබීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 19 ක් වැයකර තිබුණි. එහෙත් විගණිත දිනය වූ 2022 අප්‍රේල් මාසය වනවිටත් රු. මිලියන 228.3 ක් වූ යන්ත්‍රය හා ගොඩනැගිල්ල නිෂ්කාර්යව තිබූ අතර පුහුණු කටයුතු වෙනුවෙන් දරන ලද රු. මිලියන 5.3 ක අනාර්ථික වියදමක් විය.

ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති සම්පාදනය නොකිරීම

දෙපාර්තමේන්තුව ආරම්භ වූ 1956 වර්ෂයේ සිට 2021 වර්ෂය වන විට වර්ෂ 65 ක් ගත වී තිබුණත්, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාළ නීති සම්පාදනය කිරීම 2022 අගෝස්තු 31 දක්වාම ඉටු කර නොතිබුණි. තවද විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් සඳහා 2019 මාර්තු 06 වන දින කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණ ද, එම ප්‍රතිපත්තිය 2022 මාර්තු 25 විගණිත දින වන විටත් ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. විවිධ ආර්ථික හෝ සාමාජීය සාධක පදනම් කොට ගෙන අඛණ්ඩ පාසැල් අධ්‍යාපනයේ නියැලීමට අවස්ථාව නොලැබෙන දරුවන් නැවත පාසැල්ගත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණද එම වැඩසටහන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2021 වර්ෂයේදී ළමුන් 2718 දෙනෙකු පාසැල් හැරගොස් තිබුණි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් නොකිරීම

අධිකාරියේ 1929 දුරකතන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අදාළ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට නිර්දේශ ලබාගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත රු. මිලියන 0.9 ක් ගෙවා 2017 වර්ෂයේ ලබාගත් වාර්තාව සඳහා වර්ෂ 4 ක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු වී නොතිබූ අතර පරිගණක පද්ධතියක් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට රු. මිලියන 1.2 ක් ගෙවා තිබුණද දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රමාදය

2020 හා 2021 වර්ෂවල ක්‍රියාකාරි සැලසුම් තුළ අධිකාරියේ ප්‍රධාන කාර්යභාර්යයක් වන පැමිණිලි විසඳීමේ කාර්යභාරය ඇතුළත් කර නොතිබුණු අතර 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී තිබූ 100,592 ක් වූ පැමිණිලි සංඛ්‍යාවෙන් නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ පැමිණිලි සංඛ්‍යාව 47,136ක් විය.

අරමුදල් උපයෝජනය නොකිරීම

ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය

ප්‍රතිපාදන සම්පාදනයට 2010 වර්ෂයේ දී පිහිටුවන ලද ජාතික ළමා ආරක්ෂක අරමුදල 2018 වර්ෂයේ සිට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.8 ක ශේෂයක් පැවතුණි. තවද වර්ෂ 1 සිට වර්ෂ 11 කට වැඩි කාලයක සිට පැවතෙන එකතුව රු. මිලියන 1.9 ක්වූ අරමුදල් 3 ක් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 6000ක් සඳහා ගුරු ඉගෙනුම් අධ්‍යාපන උපකරණ කට්ටල හා කියවීමේ ද්‍රව්‍ය කට්ටල සැපයීම වෙනුවෙන් රු.මිලියන 221.5 ක ප්‍රතිපාදන 2017 වර්ෂයේදී ලබා දී තිබුණද 2021 වර්ෂය අවසන් වන විටත් මධ්‍යස්ථාන 3386 ක් සඳහා එම උපකරණ බෙදා දී නොතිබුණු අතර එය අපේක්ෂිත භෞතික ප්‍රගතියෙන් සියයට 56ක් විය.

ජනමාධ්‍ය අංශය

විගණන නිරීක්ෂණ

- ප්‍රසම්පාදන කටයුතු
- ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු නොකිරීම
- ආදායම් අහිමිවීම
- ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම
- මානව සම්පත් කළමනාකරණ දුර්වලතා
- අයවිය යුතු මුදල් අයකර නොගැනීම
- මෙහෙයුම් ප්‍රතිඵල
- 2020 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ මාධ්‍ය ආවරණය
- මූල්‍ය පාලනය
- වත්කම් ඌණ උපයෝජනය
- අභ්‍යන්තර විමර්ශන
- නිරවුල් නොකළ ශේෂයන්
- තොග කළමනාකරණය
- ගෙවිය යුතු මුදල් නොගෙවීම
- ආයතනය ලියාපදිංචි නොකිරීම
- අධිකාරිය නොලත් ගෙවීම්
- මහජන නියෝජනයන්
- නීතිමය කටයුතු
- ප්‍රකාශයන්හි පිටපත් නොමිලේ නිකුත් කිරීම
- වත්කම් පාලනය
- මෙහෙයුම් දුර්වලතා

ජනමාධ්‍ය අංශය

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු, දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තිමය කුසලතා සංවර්ධනයට කටයුතු කිරීම යන විෂයපථයකින් සමන්විත වූ ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු 03 කින් සමාගම්/ව්‍යවස්ථාපිත ආයතන 08 ක් විසින් පහත සඳහන් කාර්යභාරය හා සුවිශේෂී ප්‍රමුඛතා ඉටු කළයුතුව පැවතුණි.

- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වා දීම වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- තැපැල් සේවාව ජනතා කේන්ද්‍රීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් සේවාවක් බවට පුළුල් කරමින් ඩිජිටල් තැපැල් ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තිමය දැනුම හා අවබෝධය ලබා දීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තීමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු තුනක් වෙත එකතුව රු.මිලියන 21,704 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 19,374 ක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 60 හි දැක්වේ.



	ජනමාධ්‍ය අමාත්‍යාංශය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	මුද්‍රණ දෙපාර්තමේන්තුව	තැපැල් දෙපාර්තමේන්තුව	එකතුව
ප්‍රතිපාදනය රු.මිලියන	2,061	538	3,478	15,627	21,704
වියදම රු.මිලියන	1,539	343	3,166	14,326	19,374
ඉතිරිය රු.මිලියන	522	195	312	1,301	2,330

රූපසටහන 60 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම
මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාර්යය හා සුවිශේෂී ප්‍රමුඛතා ඉටු කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වල සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණ තුලින් අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රසම්පාදන කටයුතු

- 2021 පෙබරවාරි 18 දින වන විට හඳුනාගෙන තිබුණු පරිදි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පරිගණක අවශ්‍යතාවය පරිගණක 42 ක් මිලදී ගැනීම සඳහා 2021 මැයි 31 දින පරිගණක 3 ක් හා 2021 අගෝස්තු 25 දින පරිගණක 39 ක් වශයෙන් අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවා තිබුණි. පරිගණක සියල්ල එකවර මිලදී ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මිල ඉහළ යාම මත පරිගණක 11ක් සඳහා රු.මිලියන 4.19 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

- ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 179.48 ක් වූ අමාත්‍යාංශ පරිශ්‍රය නවීකරණය හා වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත්තුව උප කොටස් 12 ක් යටතේ අවස්ථා 04 කදී මිල කැඳවුම් කර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 113.40 ක් පමණ වැයකර තිබුණද, මෙම ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය පැහැදිලිව හා විධිමත්ව හඳුනාගෙන නොතිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ආ) ප්‍රකාරව ප්‍රමාණවත් නොවන ලංසු සුරක්ෂණ ප්‍රකාශන ආකෘති පත්‍ර විශාල බැහැරවීමක් වුවද නියමිත

ආකෘතියට ලංසු සුරක්ෂණ ඉදිරිපත් නොකිරීම සුළු බැහැරවීමක් සේ සලකා අවම මිල ඉදිරිපත්කල ආයතනයද ඇතුළත්ව ඉදිරිපත්කළ මිලගණන් තාක්ෂණික ඇගයීමක් සිදුකර නිර්දේශය ඉදිරිපත් කරන ලෙස 2021 ජූලි 19 දින අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ උපදේශක ආයතනයට දන්වා තිබුණි. නමුත් උපදේශක ආයතනය විසින් අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය ප්‍රතික්ෂේප කර දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනය නිර්දේශ කර තිබුණි. එසේ වුවද අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව, උපදේශක ආයතනයේ නිර්දේශ නොසලකා නියමිත ආකෘතියට ලංසු සුරක්ෂන ඉදිරිපත් නොකර අවම මිල ඉදිරිපත් කල ආයතනය නිර්දේශ කර තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් සකස්කර ප්‍රසම්පාදන කමිටුවේද අනුමැතිය ඇතිව ප්‍රතිග්‍රහණ ලිපිය 2021 ජූලි 22 ලබාදී ජනමාධ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව අදාළ ආයතනය සමඟ 2022 මාර්තු 29 දින දක්වා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

එසේම, අමාත්‍යාංශයේ විදුලි සෝපාන යන්ත්‍රය සවිකිරීමට අදාළ සිවිල් ඉංජිනේරුමය කාර්යයන් හා විදුලි සෝපානය සැපයීම, සවිකිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීමට අදාළ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා ඉදිරිපත් වී ඇති ලංසු දෙකම ප්‍රතිචාර නොදක්වන බැවින්, අලුතින් ලංසු කැඳවීමට උපදේශන ආයතනය විසින් නිර්දේශ කර තිබුණ ද, අමාත්‍යාංශ ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්වලට අදාළ කොන්ත්‍රාත්කරුට මිල ගණන් කැඳවීමකින් තොරව විදුලි සෝපාන සවිකිරීමේ කොන්ත්‍රාත්තුවද ලබාදී තිබුණි.

- 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව අනුගමනය කළයුතු මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රසම්පාදන ක්‍රමය තීරණය කිරීම, ලංසු කැඳවීම, ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීම, මිල ගණන් විවෘත කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා, ප්‍රසම්පාදන කමිටු වාර්තා, ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීම ඇතුළුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කිසිඳු ක්‍රියාමාර්ගයක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 6 හා 10 වන මැදිරිවල පැවති පියානෝ 03 ක් අළුත්වැඩියා කිරීමේදී අනුගමනය කර නොතිබූ අතර 2020 වර්ෂය සඳහා අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම තුළ ද මෙම කාර්යය ඇතුළත් කර නොතිබුණි. සංස්ථාවේ පාලක (සංගීත) විසින් 2021 අගෝස්තු 09 දින අභ්‍යන්තර විගණන අංශයට ලබාදී ඇති ප්‍රකාශය අනුව පියානෝ අලුත්වැඩියා කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය වනුයේ අලුත්වැඩියා ඉල්ලීම වාදක මණ්ඩලයේ නායකයා විසින් පාලක (සංගීත) ගේ නිර්දේශය මත අධ්‍යක්ෂ

(සංගීත) ගේ අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කිරීම වුවද ඊට පටහැනිව මෙම අලුත්වැඩියාවන් සඳහා වාදක මණ්ඩල නායකගේ ඉල්ලීම් පාලක (සංගීත) ගේ නිර්දේශයකින් තොරව සෘජුව අධ්‍යක්ෂ (සංගීත) මඟින් සභාපති වෙත යොමු කර තිබුණි.

මැදිරි අංක 06 හි පැවති පියානෝව අලුත්වැඩියාව සඳහා රු.මිලියන 0.46 ක් ගෙවා තිබුණු අතර පියානෝවල හඳුනාගැනීමේ අංකයක් නොදන්නා බවත් හා අලුත්වැඩියා කිරීමට පෙර හා පසුව පියානෝවල අභ්‍යන්තර වෙනස්කම් පිළිබඳ කිසිවක් කිව නොහැකි බවත් 2021 අගෝස්තු 09 දින වාදක මණ්ඩල නායක විසින් අභ්‍යන්තර විගණන අංශය වෙත ප්‍රකාශයක් ලබාදී තිබුණද ඔහු විසින්ම නිසි ලෙස අලුත්වැඩියා කර ඇති බව ගෙවීම් වවුචරය සමඟ ඉදිරිපත් කර තිබුණු අනුශාගික ලියවිලිවල සඳහන් කර තිබුණි.

මැදිරි අංක 10 හි පියානෝ 02 අලුත්වැඩියා කිරීම සඳහා බැහැරට රැගෙන ගොස් 2021 මැයි 21 දින සංස්ථා පරිශ්‍රයට රැගෙන එන බවට වාදක මණ්ඩල නායක විසින් දන්වා තිබුණද 2022 අගොස්තු 16 වන දින විටත් ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී නොතිබුණි. තවද සංස්ථාවේ පාලක (සංගීත) විසින් අභ්‍යන්තර විගණන අංශයට ලබාදී ඇති ලිඛිත ප්‍රකාශය අනුව පියානෝවල පෞරාණික වටිනාකම සහ විශ්වාසනීයත්වය රැකගැනීම සඳහා පියානෝ අලුත්වැඩියා කිරීමේදී එම කටයුතු සංස්ථා භූමිය තුළදීම සිදුකිරීම මින් පෙර අනුගමනය කරන ලද ක්‍රමවේදය වුවද මෙම පියානෝ 03 සභාපතිගේ සෘජු මැදිහත්වීම මත ආයතනයෙන් පිටතට රැගෙන ගොස් අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. ඒ අනුව පෞරාණික සහ විශාල වටිනාකමක් සහිත මෙම පියානෝ අලුත්වැඩියාව නිසි ක්‍රමවේදයකට අනුව ඒවායේ ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කර නොතිබුණි. මෙම පියානෝ ඉන්වෙන්ට්‍රිගත කිරීමේදී හඳුනාගැනීමට විශේෂ අංක හා සලකුණු යොදා නොතිබීම හේතුවෙන් සංස්ථාවෙන් පිටතට රැගෙන ගිය පියානෝ 3 නිවැරදිව ආපසු ලැබුණේද යන්න තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් සංස්ථාව සතුව නොතිබුණි.

- රජයේ ආයතන වැඩ සැපයුම් සේවා සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කල යුතු වුවත්, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විසින් 2021 දෙසැම්බර් 31 දින පවත්වන ලද “ආසියානු තරු පලස” සංගීතමය වැඩසටහනට අදාළව ඉසව් කළමනාකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 11.00 ක් වූ එක් සැපයුම්කරුවකු තෝරා ගෙන තිබුණු අතර එමඟින් ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු වන පරිදි අවම පිරිවැයකින් උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි, සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ හා උපරිම අවස්ථා ලබා දීමට හැකිවන ලෙස කටයුතු කර

නොතිබුණි. තවද මෙම තෝරා ගත් ආයතනයේ පැවැත්ම පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ජාල පරිශීලනයේ දී අනාවරණය නොවුණි.

- 2021 වර්ෂයේ බදුල්ල දිසා ගිණුම් කාර්යාලය හා නියෝජ්‍ය තැපැල්පති කාර්යාලයේ රු.මිලියන 4.92 ක් වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 06 ක සියළු ප්‍රසම්පාදන හා පරීක්ෂණ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කර තිබුණද තැපැල් දෙපාර්තමේන්තුව විසින් අදාළ කාර්යය නියමිත පරිදි ඉටු වී ඇති බව සනාථ කර ගෙන නොතිබුණු අතර ගෙවීම්වලින් නිශ්චිත මුදලක්ද රඳවාගෙන නොතිබුණි. එසේම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) ප්‍රකාරව රු.මිලියන 6.92 ක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 07 සඳහා කාර්ය සාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

- වැට් සහිත රු. මිලියන 47.52 කට තැපැල් මුද්‍රා යන්ත්‍ර 50 ක් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14 ට පටහැනිව තැපැල් දෙපාර්තමේන්තුව විසින් මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. එසේම තැපැල් කාර්යාල වල ප්‍රයෝජනය සඳහා රු. මිලියන 1.69 ක් වටිනා ඩොට් මෙට්‍රික්ස් ප්‍රින්ටර්ස් 45 ක් මිලදී ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 2.11.1(ඇ), 2.12, 5.3.1(ඇ), 7.4.1 හා 8.8.1(අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

- පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත්කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනය කිරීම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ කාර්යභාර්යයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විටද අදාළ රීති හා නියෝග සම්පාදනයට ක්‍රියාකර නොතිබුණි.

ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු නොකිරීම

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ප්‍රවෘත්ති විකාශන වෙබ්අඩවි ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් සකස් කිරීම, රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය සහ ශ්‍රී ලංකා රූපවාහිනී පනත සංශෝධනය කිරීම යන ක්‍රියාකාරකම් 2021 වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි.

ආදායම් අහිමිවීම

ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් භෞමික රූපවාහිනී, ගුවන් විදුලි, චන්ද්‍රිකා (Satellite TV), Internet Protocol Television (IPTV), Cable TV සහ Mobile TV යන ආකාරයන් මඟින් විකාශනයන් සිදුකරනු ලබන ආයතන වෙත නිකුත් කරන ලද බලපත්‍ර සඳහා නියමිත කාලය තුළදී ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව බලපත්‍රලාභියාට දැනුම් දෙන බවට කොන්දේසියක් බලපත්‍රවල ඇතුළත් කර තිබුණ ද අමාත්‍යාංශය විසින් බලපත්‍ර ලබා දී තිබු

ආයතන 49 කින් බලපත්‍ර ගාස්තුවක් අයකර ගැනීමට විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි. එසේම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේදී මෙතෙක් නිකුත් කළ බලපත්‍ර සඳහා කිසිදු බලපත්‍ර ගාස්තුවක් අයකර නොතිබුණු අතර වාර්ෂිකව හෝ කාලීනව බලපත්‍ර අලුත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් හඳුන්වාදී නොතිබුණි. ඒ අනුව බලපත්‍ර ගාස්තු හා බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ලෙස ලබාගත හැකිව තිබූ විශාල ආදායමක් රජයට අහිමිවී තිබුණි.

ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

මහජන අදහස් හා සහභාගිත්වය තුලින් රාජ්‍ය ව්‍යුහය තුළ ක්‍රමෝපායිකව තොරතුරු ගලායාම සඳහා අංක අමප/16/1675/702/059 හා 2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපනය කර තිබුණු අතර අපේක්ෂා කල අරමුණු ඉටු නොවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 05 දිනැති අමප/19/3332/203/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එම මධ්‍යස්ථානය අහෝසිකර තිබුණි. රජයේ දස වැදෑරුම් රාජ්‍ය ප්‍රතිපත්තිය හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීමේ අරමුණින් ඉහත කී ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය 2021 ජනවාරි 04 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අලුතින් ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය ලෙස නම්කර ස්ථාපිත කර තිබුණි. පෙර පැවති ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසි කිරීමේදී ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරනු ලැබූ දැනට භාවිතයට නොගන්නා නිශ්චල හා චංචල දේපල මෙම නව ඒකකයට පැවරීමට කටයුතු නොකර කාර්යාල උපකරණ මිලදීගැනීම සඳහා රු. මිලියන 3.511 ක් වැය කර තිබුණි. එසේම එහි සේවය කළ සේවක පිරිසෙන් සැලකිය යුතු කොටසක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති බැවින් එම සේවක සංඛ්‍යාව මඟින් ආවරණය කළ නොහැකි තනතුරු සඳහා පමණක් නව බඳවා ගැනීම් කළයුතු වුවද කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණු අතර 2021 පෙබරවාරි 17 දින සිට 2022 අප්‍රේල් 08 දක්වා වරින් වර නිලධාරීන් 44 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. මෙම කාර්යමණ්ඩලයේ පැමිණීම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණු අතර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ ලිඛිත නිර්දේශයට අනුව එම කාලය තුළ සේවය කළ නිලධාරීන් වෙත රු. මිලියන 18.638 ක දීමනාවක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. එම දීමනා ගෙවීම් වවුචර් වලද නිලධාරීන් විසින් අත්සන් තබා නොතිබූ බැවින් එම මුදල් නිලධාරියා වෙත ප්‍රේෂණය වූ බව සනාථ නොවීය.

මානව සම්පත් කළමනාකරණ දුර්වලතා

- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය දිගින් දිගටම අලාභ ලබන තත්වයක හා කාරක ප්‍රාග්ධන ගැටළු වලට මුහුණ දී ඇති තත්වයක් තුළ කාර්ය මණ්ඩල කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතු වුවත් මාධ්‍ය ජාලය මූල්‍ය වර්ෂය තුළ දී කොන්ත්‍රාත්

පදනමින් සේවකයින් දෙදෙනෙක් ද ,දෛනික පදනමින් සේවකයින් 16 දෙනෙක් ද බඳවා ගෙන තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල අතිරික්ත කාර්යමණ්ඩලය 67 ක් ද,අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු වල නිලධාරීන්ට පෞද්ගලික වන සේ සේවකයන් 113 ක්ද බඳවා ගෙන තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසානයට තැපැල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 2,164 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 62 ක් ඊට ඇතුළත් වී තිබුණි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සමාලෝචිත වර්ෂයයේදී ද අපොහොසත් වී තිබුණි.

- එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සඳහා 2017 ජූනි 6 දින සකස් කරන ලද සේවක සංඛ්‍යාව සඳහා 2022 මැයි 23 දින වන විටත් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර එම සේවක සංඛ්‍යාවට අනුව පොදු සහ කර්තෘ දෙපාර්තමේන්තු සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 658 ක් සහ 327 ක් විය. එසේ වුවද පොදු සහ කර්තෘ දෙපාර්තමේන්තුවල සත්‍ය කාර්ය මණ්ඩල පිළිවෙලින් 875 ක් සහ 423 ක් වූයෙන් අතිරික්ත කාර්ය මණ්ඩලය 313 ක් විය. තවද, 2021 වර්ෂය අවසන් වන විට සේවකයින් 407 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර කාර්ය මණ්ඩලයේ පිරිවැය සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 52 ක් සහ සියයට 62 ක් වී තිබුණි.

අයවිය යුතු මුදල් අයකර නොගැනීම

- 2009 ත් 2015 ත් අතර කාලය තුළදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා සේවයෙන් වෙනත් ආයතන වෙත මුදා හළ නිලධාරීන්ගෙන් සංස්ථාවට ලැබිය යුතු රු. මිලියන 2.758 ක් අයකර ගැනීමට විගණිත දින වන 2022 අගෝස්තු 16 දින වන විටත් කටයුතු කර නොතිබුණි. වෙනත් අයතන වෙත මුදාහැර නැවත සංස්ථා සේවයට වාර්තාකළ නිලධාරිණියකගෙන් අයවියයුතු රු. මිලියන 1.90 ක් හා 2021 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරිනියකගෙන් අයවියයුතු රු. මිලියන 0.119 ක් මෙම ලැබියයුතු මුදලට ඇතුළත් වී තිබුණි.

- 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවාදායක ණයගැති ශේෂය රු. මිලියන 377.27 ක් වූ අතර මුළු ණයගැති ශේෂයෙන් රු.මිලියන 38.96 ක් හෙවත් සියයට 10 ක් සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට නීතිඥ ගාස්තු වශයෙන් රු.මිලියන 1.50 ක් ගෙවා තිබුණි. කාලාවරෝධ නීතිය අනුව වසර 6 ඉක්මවීමට ප්‍රථම ණයගැති ශේෂ අයකරගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය වනවිට වසර 5 ඉක්මවූ ණයගැති ශේෂය රු.මිලියන 100.13 කින් රු.මිලියන 12.08

ක් සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. එසේම මුළු ණයගැති ශේෂයෙන් රු.මිලියන 152.17ක් හෙවත් සියයට 40 ක් මිලියන 5 ට වැඩි වටිනාකම් සහිත රාජ්‍ය ආයතන 08 ක් ඇතුලුව ණයගැතියන් 15 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි. එහි ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග එළඹි විධිමත් ගිවිසුමක් නොමැති වීම නිසා බැංකුවෙන් ලැබිය යුතු රු. මිලියන 10 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගනු ලැබුවද අය කර ගැනීම අවිනිශ්චිත වී තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වර්ෂය ඉක්ම වූ ණයගැති ශේෂය රු.මිලියන 371.58 ක් වී තිබුණු අතර එයින් රු.මිලියන 2.53 ක් සඳහා පමණක් නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 127.24 ක්වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වසර 10 ක් ඉක්මවූ රු.මිලියන 41.47 ක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

- තැපැල් දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂය අවසානයට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පවතින හිඟ ආදායම් ශේෂය රු.මිලියන 101.39ක් වූ අතර එම ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

- රාජ්‍ය මුදල් අධ්‍යක්ෂකගේ 2021 සැප්තැම්බර් 21 දිනැති අංක PED/RED/WO/2021/30 දරන ලිපිය ප්‍රකාරව 2009 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලට අදාළ රු.මිලියන 81.02 ක හිඟ ආදායම් ශේෂ පසු විපරම් කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද එයින් කිසිදු මුදලක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. එසේම 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළ රු.මිලියන 183.40 ක හිඟ ආදායම් ශේෂයෙන් සියයට 14 ක් හෙවත් රු.මිලියන 25.18 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණි.

මෙහෙයුම් ප්‍රතිඵල

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිපල පිළිබඳව සැලකීමේ දී 2017 වර්ෂයේ පැවති අලාභය 2018 වර්ෂයේ දී රු. මිලියන 188.8 ක ලාභයක් බවට පත් ව තිබුණද 2019 වර්ෂය වන විට එය රු. මිලියන 501.16 ක අලාභයක් දක්වා වැඩි වී තිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ බදු පසු අලාභය රු. මිලියන 227.34 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු අලාභය රු. මිලියන 234.3 ක් වුයෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. මිලියන 6.96 කින් අලාභය පහළ යාමක් නිරීක්ෂණය වුවද සමාලෝචිත වර්ෂයේ සේවක වැටුප් ගෙවීම සඳහා රජයෙන් සපයන ලද

පුනරාවර්තන ප්‍රදාන රු. මිලියන 362 න් රු. මිලියන 164 ක් මෙම අලාභය අඩුවීමට හේතුවී තිබුණි. එසේම සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්වය 2020 වර්ෂයේ රු.මිලියන 69.31 ක්වූ අතර 2021 වර්ෂයේ දී එය රු.මිලියන 254.31 ක සෘණ කාරක ප්‍රාග්ධන තත්වයක් දක්වා පහත වැටී තිබුණි. 2020 වර්ෂයේ දී රු. මිලියන 124.71 ක්ව පැවති බැංකු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු. මිලියන 53.57 ක බැංකු අයිරා ශේෂයක් පෙන්නුම් කිරීම හා අනෙකුත් මූල්‍ය වගකීම් රු. මිලියන 146.72 කින් ඉහළ යාම සෘණ කාරක ප්‍රාග්ධන තත්වයක් ඇතිවීමට හේතු වී තිබුණි. 2020 වර්ෂයේ දී 4.9 ක් වශයෙන් වූ ණය ස්කන්ධ අනුපාතය 2021 වර්ෂයේ දී 4.3 ක් අවතෝලන තත්වයක් බවට පත් වී තිබුණි. මෙසේ සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම කාරක ප්‍රාග්ධනයට සහ හිමිකම්වලට අහිතකර ලෙස බලපා තිබුණු අතර භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

- 1971 අංක 38 දරන මුදල් පනතේ 7(1) ඡේදය අනුව ආදායම් ගිණුමේ අන්ත අතිරික්තය එම ගිණුමේ අන්ත ඌනය අවුරුදු 5 ක කාල සීමාවක් තුළ හෝ මුදල් ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මොනයම් කාලසීමාවක් තුළ පියවීමට ප්‍රමාණවත් වන පරිදි නීතිගත සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාම එම නීතිගත සංස්ථාවේ පාලක මණ්ඩලයේ යුතුකම විය යුතු වුවද පසුගිය වසර තුනක කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ක්‍රියාකාරීත්වය එම අපේක්ෂිත තත්ත්වයට ලඟා වී නොතිබුණි. එසේම, සංස්ථාවේ ආසන්න වර්ෂ පහක ශුද්ධ මූල්‍ය ප්‍රතිඵලයේ එකතුව රු. මිලියන 1,345.54 ක ශුද්ධ අලාභයක් වී තිබුණි.

- සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ රු. මිලියන 3,198.5 ක් වූ අතර 2021 වර්ෂය දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. 2016 වර්ෂයේ සමාගමේ අලාභය රු.මිලියන 107.2 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනී සේවයේ අලාභය රු.මිලියන 238.13 ක්ද අයිටීඑන් එෆ්එම් හි අලාභය රු. මිලියන 41.33 ක්ද වසන්තම් එෆ්එම් හි අලාභය රු. මිලියන 10.46 ක් හා වසන්තම් රූපවාහිනීයට රු. මිලියන 46.34 ක ප්‍රදාන ලැබීමෙන් පසුද අලාභය රු. මිලියන 26.06 ක් ද වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මුළු අලාභය රු. මිලියන 315.97 ක් වී තිබුණි.

2020 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ මාධ්‍ය ආවරණය

2020 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ නිල මාධ්‍ය විකාශක ලෙස මාධ්‍ය ආවරණය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා නිලධාරීන් සිව් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් 2021 ජූනි 19 සිට 2021 අගෝස්තු 10 දින දක්වා දින 22

ක කාලයක් ජපානයට ගොස් තිබුණි. මෙම නිලධාරීන්ගේ නවාතැන්, ප්‍රවාහන, ආහාර සහ අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් රු. මිලියන 11.21 ක් ජාතික ඔලිම්පික් කමිටුව වෙත ගුවන් කාලය ලබාදීමේ ප්‍රතිවෙළඳ ගිවිසුමකට යටත්ව සංස්ථාව විසින් ලබා දී තිබුණි. එසේම ශ්‍රී ලංකා ගුවන් සමාගම සමඟ නිලධාරීන් සිව් දෙනාගේ ගුවන් ටිකට්පත් වෙනුවෙන් රු.මිලියන1.04 ක් වටිනා ගුවන් කාලය ලබාදීමේ ප්‍රති වෙළඳ ගිවිසුමකට සංස්ථාව එළඹ තිබුණි. මෙම නිලධාරීන්ට මාධ්‍ය ආවරණය සඳහා වූ අනුග්‍රාහක ආයතනයෙන්ද දීමනා ලබා දී ඇති බැවින් සංස්ථාව විසින් ගෙවන ලද රු.714,560 ක අනියම් දීමනාව නැවත අයකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල නිලධාරීන්ගේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සංස්ථාව දිගින් දිගටම අලාභ ලබන තත්වයක දී ලාභ ඉපයීමට හැකි අවස්ථාවන් නිවැරදිව කළමනාකරණය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ඔලිම්පික් උළෙලේ මාධ්‍ය ආවරණය තුළින් සංස්ථාව රු.මිලියන 57.20 ක අලාභයක් ලබා තිබුණි.

මූල්‍ය පාලනය

- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ කාරක ප්‍රාග්ධනය 2020 වර්ෂයේ රු. මිලියන 620.76 ක් වූ අතර 2021 වර්ෂයේ දී එය රු. මිලියන 399.83 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ පවතින දුර්වලතා හේතුවෙන් එදිනෙදා මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දුෂ්කරතාවයට මුහුණ දී තිබුණි. ප්‍රායෝගිකව කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී කාර්තුමය වශයෙන් මුදල් ලැබීම් හා ගෙවීම් පුරෝකථනය කරමින් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් අයවැයක් පිළියෙල කර මුදල් ප්‍රවාහ සැලසුම් කළ යුතු වුවද එවැනි අයවැය පාලන ක්‍රම භාවිතා කර නොතිබුණි.

- 2021 වර්ෂය දී ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විසින් මිල දී ගෙන ඇති දේශීය ටෙලි නාට්‍ය 8 ක් තුලින් රු.18.35 ක අලාභයක් ලබා තිබුණු අතර මින් පූර්ව දර්ශන මණ්ඩලය මගින් විකාශනයට නුසුදුසු බවට නිර්දේශ කරන ලද "සත් වර්ෂා" ටෙලි නාට්‍යය එහි නිෂ්පාදිකාවගේ අභියාචනාවක් මත නැවත පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලයක් විසින් ලබාදී තිබුණු අනුමැතිය මත පූර්ව දර්ශනය පවත්වා ටෙලි නාට්‍ය විකාශනය කර තිබූ අතර එමගින් මාධ්‍ය ජාලයට රු.මිලියන 5.11 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි.

- 2021 වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම තුළ රු.මිලියන 10.13 ක් වටිනා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සේවකයින්ට ලබා දුන් තෑගි වවුචර් ප්‍රමාණයක් ඇතුළත් වීම නිසා ප්‍රතිවෙළඳ ගණුදෙනු වලින් ගුවන් කාල ආදායමක් ලැබුවද ඊට සාපේක්ෂව මුදල් ප්‍රවාහයක් මාධ්‍ය ජාලය වෙත ගලා ඒමක් සිදු වී නොතිබුණි. එම නිසා මාධ්‍ය ජාලයේ විකුණුම් ආදායම රු.257.57 කින් ඉහළ ගොස් තිබුණද ශුද්ධ කාරක ප්‍රාග්ධනය

රු.මිලියන 220.93 කින් අඩු වී තිබුණි. ඒ අනුව විකුණුම් ආදායමට ශුද්ධ කාරක ප්‍රාග්ධන අනුපාතය ඉකුත් වර්ෂයේදී 1.85 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය 3.52 දක්වා ඉහළ ගොස් තිබුණි.

වත්කම් ඌණ උපයෝජනය

- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විසින් 2015 වර්ෂයේ මිලදී ගත් රු.මිලියන1.59 ක් වටිනා Hot Swappable Power Distribution Rack යන්ත්‍රය මිලදී ගත් දින සිටද 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද පිරිවැය රු. මිලියන1.22 ක් වටිනා Aros Flexus FT- 30, 30KVA UPS Systems වසර 03 ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

- නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරිම සඳහා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මිලදී ගෙන 2021 වර්ෂයේදී රු.මිලියන 733 කට නැවත තක්සේරුකර තිබුණු හෝකන්දර ප්‍රදේශයේ පිහිටි අක්කර 8 ක් විශාල ඉඩමක් 1985 වර්ෂයේ සිට අදාළ කාර්යයට නොයොදවා නිෂ්කාර්යව පැවතුණි.

අභ්‍යන්තර විමර්ශන

තැපැල් දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය ආරම්භයට පවතින මූලික විමර්ශන සංඛ්‍යාව 2,156 ක් වූ අතර සමාලෝචිත වර්ෂයතුළදී ලැබුණු විමර්ශන 407 ක්ද ඇතුළුව මුළු විමර්ශන 2,563 කින් අවසන් හා ඉවත් කරන ලද සංඛ්‍යාව 584 ක් වූයෙන් ඉතිරි විමර්ෂණ සංඛ්‍යාව 1,979 ක් විය. තවද විමර්ශන කටයුතු වල යාවත්කාලීන දත්ත දෙපාර්තමේන්තුවේ වගකිව යුතු නිලධාරියෙකු භාරයේ නොතිබුණි.

නිරවුල් නොකළ ශේෂයන්

දිසා ගිණුම් කාර්යාල 16 ක සේවකයින් 2,366 ක ගේ වර්ෂ 08 ට වඩා පැරණි නිරවුල් නොකළ තැපැල් කාර්යාල ඇප මුදල් ශේෂය රු. මිලියන 4.71 ක් පැවතුණි. වර්ෂ 07 කට වැඩි කාලයක සිට දෙපාර්තමේන්තුව විසින් අක්‍රීය ගිණුම් යාවත්කාලීන කර නොතිබුණු අතර නිලධාරීන් 1,828 ක ගේ පොළී රහිත රු. මිලියන 2.1 ක ඇප මුදල් හා නිලධාරීන් 30 ක ගේ විස්තර රහිත රු. මිලියන 0.67ක ඇප මුදල් ශේෂ පැවතුණි.

තොග කළමනාකරණය

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු. මිලියන 1.97 ක් වටිනා මුද්දර අයිතම 9 ක අතිරික්තයක්ද රු. මිලියන 0.18 ක් වටිනා මුද්දර අයිතම 10 ක ඌනතාවයක් ද විය. එසේම නාරාහේන්පිට මුද්දර අංශයේ රු.මිලියන 2.18ක් වටිනා මුද්දර තොගයක ඌනතාවයක් පැවතුණි.

ගෙවිය යුතු මුදල් නොගෙවීම

- 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2 (1) (අ) වගන්තිය ප්‍රකාරව යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබිය යුතු වුවත්, 1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින්

ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

- 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 27 (2ඒ) වගන්තියට පටහැනිව 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා එකතුව රු. මිලියන 108.2 ක් වූ සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රමාද ගාස්තු සඳහා පනවන ලද අධිභාරය 2021 වර්ෂය අවසන් වන විටත් සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ගෙවා නොතිබුණි.

ආයතනය ලියාපදිංචි නොකිරීම

1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය 2019 වර්ෂය දක්වා අවස්ථා 06 කදී අතිවිශේෂ ගැසට් නිවේදන මඟින් විවිධ අමාත්‍යාංශ යටතට පවරා තිබූ අතර අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළඳ දැන්වීම හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටු කරවා ගැනීමද අනිවාර්ය කර තිබුණි. එසේ වුවද, ආයතනය නීතිමය ඒකකයක් වශයෙන් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.

අධිකාරිය නොලත් ගෙවීම්

- 2020 ඔක්තෝබර් 13 දිනැති 20/විවිධ (064) දරණ අමාත්‍ය මණ්ඩල තීරණ 16.46 (i) (ඇ) ට පටහැනිව විශ්ව විද්‍යාලයක ආචාර්යවරයෙකු වූ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සභාපතිගේ සප්ත වාර්ෂික නිවාඩු 2021 ජනවාරි 20 දින අවසන් වුවද එදින සිට 2021 ජුනි දක්වා කාලයට අදාළ සභාපතිගේ වැටුප ලෙස රු.මිලියන 0.4 ක් ගෙවා තිබුණි.

- 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 03/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 ඡේදය අනුව අධ්‍යාපනය හා නිපුණතා මට්ටම පෞද්ගලිකව සලකාබලා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව සමාන ව්‍යාපාරවල ගෙවනලද වටිනාකම්ද සලකා සභාපතිට සහ අධ්‍යක්ෂක මණ්ඩලයට ගෙවියයුතු දීමනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයකල යුතු වුවද ඊට පටහැනිව 2021 වර්ෂයේදී එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපතිට සහ අධ්‍යක්ෂක මණ්ඩලයට රු.මිලියන 24 ක දීමනා ගෙවා තිබුණි.

- 2020 නොවැම්බර් 26 වන දින ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව 2020 දෙසැම්බර් 07 වන දින ස්වාධීන උපදේශවරයෙකු එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට බඳවා ගෙන තිබුණි. පසුව මෙම උපදේශකවරයා 2020 දෙසැම්බර් 08 වන දින ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත ද, 2021 අගෝස්තු 17 වන දින සෞඛ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත ද සේවයෙන් නිදහස් කර තිබූ අතර, සමාගමට කිසිදු සේවයක් ලබා නොගෙන උපදේශක වැටුප ලෙස රු.මිලියන 1.8 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි.

- අයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය අනුව දැනට සේවකයෙකු ලබන වැටුපෙන් සියයට 65 ක් වනසේ දීමනාවක් 2018 වර්ෂය දක්වා ගෙවීමට අනුමත කර තිබුණි. එසේ වුවද සේවකයන්ගේ මාසික වැටුපෙන් සියයට 65 ඉක්මවා සියයට 104 සිට සියයට 555 ක් දක්වා විවිධ වර්ගයේ දීමනා වර්ග 19 ක් ලබාගන්නා බව රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අංශ දෙකක සිදු කළ නියදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. සමාලෝචිත වර්ෂයේදී එම අංශ දෙක සඳහා ගෙවන ලද එවැනි දීමනා ප්‍රමාණය රු.මිලියන 30.3 ක් වී තිබුණි.

- 2018 ජූලි 02 දිනැති ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ESJ/T/ALLOW/03/0120 දරන ලිපිය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා අවසන් වරට දීමනා අනුමත කරන ලද ලිපියේ කොන්දේසි වලට යටත්ව 2018 දෙසැම්බර් 31 දින දක්වා පමණක් දීමනා ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දී එවැනි අනුමැතියක් රහිතව කැලි පදනම මත දීමනා වශයෙන් රු.මිලියන 557.4 ක් ගෙවා තිබුණි.

- 1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් කඩිනමින් කිරීමට අතිකාල දීමනා වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයකට අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට වර්ෂ 40 ගත වී තිබුණද කැලි පදනම මත දීමනා ගෙවිය යුතු වැඩ කොටස් සහ දීමනා සඳහා ගෙවිය යුතු රේටයන් නිවැරදිව හඳුනා ගැනීමට ක්‍රියානොකර එකම කාර්යයක් වෙනුවෙන් අතිකාල දීමනා හා කැලි පදනම මත දීමනා යන දෙවර්ගයම ගෙවා තිබුණි.

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට සභාපතිවරයෙකු පත්කර නොතිබියදී, පාලක මණ්ඩලයේ සාමාජිකාවක් වන රජයේ මුද්‍රණාලයාධිපතිනියට ආයතනයේ සභාපති ලෙස කටයුතු කිරීම වෙනුවෙන් සභාපති දීමනාව ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 0.6 ක් ගෙවා තිබුණි.

මහජන නියෝජනයන්

පුවත්පත් මණ්ඩල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව 2021 වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතන වලින් ලද පැමිණිලි 33 ක් සහ 2020 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 69ක් ද ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 102 ක් වූ අතර ඉන් පැමිණිලි 37 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශනය වෙමින් පැවතුණි.

නීතිමය කටයුතු

- 1981 ඔක්තෝම්බර් 14 දින අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 162/5 යටතේ "මාධ්‍යවේදීන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය" පළ කර තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විට සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමට එදිරිව අපහාස නඩු 15 ක් ගොනු කර තිබූ අතර ඉන් එක් අපහාස නඩුවක් සඳහා සමාගමට එරෙහිව 2007 නොවැම්බර් 18 වැනි දින සති අන්ත පුවත්පතක් වන "සිළුමිණ" හි පළ වූ ලිපියකට අදාළව පැමිණිලිකරු සමාගමෙන් රු.මිලියන 500 ක් ඉල්ලා තිබුණි. මෙම නඩුව 2010 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී විත්තිකරුවන් සහ සමාගම වෙනුවෙන් පෙනී සිටි සමාගමේ නීතිඥවරයා අදාළ උසාවි කාමරයට පැමිණ නොතිබුණි. එබැවින් පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දීමට අධිකරණය තීරණය කර තිබුණි. සමාගම විසින් මෙම තීන්දුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ සහ සිවිල් අභියාචනා මහාධිකරණයේ පෙත්සම් ගොනුකර තිබුණ ද, එම අභියාචනා දෙකම ප්‍රතික්ෂේප වී තිබුණි.

  අනතුරුව, 2019 අගෝස්තු 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ තීරණ අංක එෆ් 104.19 මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හා මෙම නඩුවට සමාගම වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙකු හා ඔහුගේ සහායකයින් තෝරා ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව ඔවුන්ගේ නීති ගාස්තු ලෙස රු.මිලියන 18.23 ක් 2019 ඔක්තෝබර් 09 දින ගෙවා තිබුණු අතර මෙම නඩුව සඳහා වැරදි උසාවි කාමරයේ පෙනී සිටි නීතිඥවරයා විසින්ම නීතිඥවරුන් තෝරා ගැනීම සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. තවද, මෙම නීතිඥවරයා 2020 අප්‍රේල් 08 දින විශ්‍රාම ගොස් තිබුණු අතර 2020 මැයි 15 දින කොන්ත්‍රාත් පදනම මත නැවත බඳවාගෙන තිබුණි. මේ දක්වා එම නිලධාරියාට එරෙහිව කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර මෙම අපහාස නඩුවද අවසාන වී නොතිබුණි.

- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් තම ආයතනයේ සේවකයෙකුගේ සේවය අවසන් කිරීම කිසිඳු සාධාරණ හා යුක්ති සහගත හේතුවක් නොමැති බවට කම්කරු විනිශ්චය අධිකරණයක් විසින් නිගමනය කිරීම නිසා එම සේවකයාට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 0.522 ක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

ප්‍රකාශයන්හි පිටපත් නොමිලේ නිකුත් කිරීම

සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පරිචයක් වශයෙන් සමාගමේ කළමනාකරණ සමාජිකයින්, ඇතැම් විධායක සේවකයින්, ජනාධිපතිවරයා, අගමැතිවරයා, ජනමාධ්‍ය අමාත්‍යවරයා, අමාත්‍යාංශ ලේකම්වරයා, හිටපු කළමනාකරණ සමාජිකයින්, වසර 20 වැඩි සේවා කාලයක්

සහිත සේවකයින් සහ වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණකර විශ්‍රාම ගිය සේවකයින් සඳහා ප්‍රකාශයන්හි පිටපත් නොමිලේ නොකඩවා නිකුත්කර තිබුණි. ඒ අනුව, 2021 වර්ෂය තුළ ප්‍රධාන පුවත්පත් හතෙන් පිටපත් 1,154,607 ක් සහ වාර සඟරා 14 කින් පිටපත් 87,898 ක් නොමිලේ නිකුත් කර තිබුණි. නොමිලේ නිකුත්කර තිබුණු මුද්‍රිත පිටපත්වලින් වැඩිම පිටපත් ප්‍රමාණයක් දිනමිණ පුවත්පතින් නිකුත් කර තිබුණු අතර, එය මුළු මුද්‍රිත පිටපත් සංඛ්‍යාවෙන් සියයට 22 ක් නියෝජනය වී තිබුණි. මෙම නොමිලේ පිටපත් සඳහා 2021 වර්ෂයේදී රු.මිලියන 84.38 ක් වැයකර තිබුණි.

වත්කම් පාලනය

1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 460 පරිච්ඡේදයේ 44 වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය ලේකම් විසින් මුද්‍රණ දෙපාර්තමේන්තුවට 2003 ජනවාරි 31 දින පවරා තිබූ හෙක්ටයාර් 0.105 ක් වූ ඉඩම රජයේ මුද්‍රණාලීය සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය වෙත බදු කාලය අවසන් වීමෙන් පසු ද පරිහරණය සඳහා ලබා දී තිබුණි. 2003 වර්ෂයේ පවරා තිබුණු මෙම ඉඩම තක්සේරු කර එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට 2021 වර්ෂයේදීද කටයුතුකර නොතිබුණි.

මෙහෙයුම් දුර්වලතා

ශ්‍රී ලංකා පදනම විසින් උසස් ජාතික ඩිප්ලෝමා, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 130 ක් 2021 වර්ෂයේදී පවත්වා තිබුණි. ආයතනය තුළ ස්ථිර කථිකාචාර්යවරු 11 ක් සිටින අතර ඔවුන්ට වාර්ෂික වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.මිලියන 15.6 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු. මිලියන 17.1 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 94 කින් වැඩමුළු 67 ක් සඳහා සම්පූර්ණයෙන් බාහිර කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 27 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ද ඉක්මවා තිබුණි. පාඨමාලා සම්බන්ධීකරණය සඳහා ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතියද පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කර තිබුණි.

පරිසර අංශය

විගණන නිරීක්ෂණ

- ආදායම ලැබීම්
- මූල්‍ය නොවන වත්කම්
- බැරකම්
- ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම
- ව්‍යාපෘති අරමුණු ඉටු නොවීම
- ජාතික පාරිසරික පනත
- අරමුණුවලට පටහැනි වියදම්
- වත්කම් ඌන උපයෝජනය
- ව්‍යාපෘති ප්‍රධාන ඌන උපයෝජනය
- බෝගල ග්‍රැපයිට් සමාගම
- කහටගහ ග්‍රැපයිට් සමාගම
- බලපත්‍ර ලබාදීම හා දීර්ඝ කිරීම
- කරස්නාගල මිනිරන් පතලේ කැණීම්
- ජාතික ඛනිජ ප්‍රතිපත්තිය යටතේ ඛනිජ සඳහා අගය එකතු කිරීම
- රාජ්‍යභාග ආදායම
- කැණීම්වලින් අනතුරුව ඉඩම් පුනරුත්ථාපනය
- විදේශීය අයිතිය ඇති සමාගම් සඳහා ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම
- මනම්පිටිය වැලි ව්‍යාපෘතිය
- කන්තලේ වැලි ව්‍යාපෘතිය
- මුතූර් වැලි ව්‍යාපෘතිය
- කොටිකම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය

පරිසර අංශය

තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් යන දැක්ම හා තිරසර ස්වාභාවික සම්පත් කළමනාකරණය තුළින් පරිසර කළමනාකරණය සඳහා නායකත්වය ලබාදීම පරිසර අමාත්‍යාංශයේ මෙහෙවර වේ. එම මෙහෙවර ඉටු කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 04 ක් වූ මධ්‍යම පරිසර අධිකාරිය, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, GSMB තාක්ෂණික සේවා සමාගම සහ ශ්‍රී ලංකා දේශගුණ අරමුදල් පුද්ගලික සමාගම යන ආයතන විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකළ යුතුව තිබුණි.

- තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පරිසර හා ස්වාභාවික සම්පත් ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාළ පාර්ශවකරුවන්ට දැනුම් දීම හා ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි උපායමාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් වලට අදාළ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය සහ තිරසර පරිසර සංකල්පය මෙන්ම ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමින් ජනතාව දැනුවත් කිරීම.
- ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශවික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමයෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමණාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායන් යෙදීම.
- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.
- යහපත් වූ පරිසර කළමණාකරණය සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන අංශවල හා මහජනතාවගේ කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත එකතුව රු.මිලියන 2,319 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 1,793 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු.මිලියන 526 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර රූපසටහන 61 හි දැක්වේ.



රූපසටහන 61 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආදායම ලැබීම

හයිඩ්‍රොක්ලෝරෆ්ලෝරො කාබන් ශීතකරණ ආනයනයට අදාළ කෝටා බලපත්‍ර නිකුත් කිරීමේදී ආනයන ශීතකාරක කිලෝග්‍රෑමයකට රු. දහයක් වශයෙන් අමාත්‍යාංශය 2021 වර්ෂයේ දී අයකර තිබූ රජයේ ගාස්තුව වූ රු.මිලියන 1.56 ක ආදායම මු.රෙ. 83 ප්‍රකාරව වාර්ෂික ආදායමේ ඇස්තමේන්තුව තුළ හඳුනාගැනීමකින් තොරව විදේශ ප්‍රධාන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක මූල්‍ය ප්‍රකාශනවල ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

මූල්‍ය නොවන වත්කම්

අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් වල ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම යටතේ මධ්‍යම කඳුකරයේ මහනුවර, බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි නිසරු කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 1.17 ක වියදමක් දරා තිබුණි. මෙම පෞද්ගලික ඉඩම් පුනරුත්ථාපනය වෙනුවෙන් දරන ලද ඒවා වන බැවින් අමාත්‍යාංශයේ ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම යටතේ දැක්වීම තුළ අමාත්‍යාංශය සතු වත්කම් අගය වැරදි ලෙස නිරූපණය වන බව නිරීක්ෂණය විය.

බැරකම් හා බැඳීම්

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මඟින් පුද්ගලයින්, සමිති හා සංවිධාන සඳහා රු. මිලියන 15.45 ක බැඳීම් හා බැරකම් ද සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන මඟින් රු. මිලියන 18.19 ක බැඳීම් හා බැරකම් වලට එළඹ තිබුණු බව ගිණුම අනුව නිරීක්ෂණය වුවද එම බැරකම් තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවිය.

ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම

2021- 2030 වර්ෂ වෙනුවෙන් ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් කෙටුම්පත් තත්ත්වයෙන් පැවති බව නිරීක්ෂණය විය.

ව්‍යාපෘති අරමුණු ඉටු නොවීම

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පරිසර සංරක්ෂණ වැඩසටහන වෙනුවෙන් රු. මිලියන

36.46 ක වියදමක් දරා තිබුණද, ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

ජාතික පාරිසරික පනත

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 2021 වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි.

අරමුණුවලට පටහැනි වියදම්

සුරකිමු ගංගා වැඩසටහනේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් වැඩසටහනේ අරමුණු වලට පටහැනිව රු. මිලියන 2.03 ක වියදමක් සිදු කර Electric Cart රථයක් මිලට ගැනීමට කටයුතු කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත්කර තිබූ වැඩසටහන් කළමනාකරුවකු සඳහා 2021 අප්‍රේල් මස සිට වැටුප හා ඉන්ධන දීමනාව වශයෙන් මසකට රු. 170,000 ක් බැගින් ගෙවීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

වත්කම් ඌන උපයෝජනය

පාරිසරික කළමණාකරණ කටයුතු සිදු කිරීමේදී තොරතුරු රැස් කිරීම අරමුණු කර ගෙන රු. මිලියන 1.39 වැයකර 2020 වර්ෂයේදී මිලට ගෙන තිබූ ඩ්‍රෝන යන්ත්‍රය කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබීම, පරිසර නියමු වැඩසටහන යටතේ රු. මිලියන 6.27 ක් වැය කර මිලට ගන්නා ලද පරිසර නියමු කැප් අදාළ කටයුත්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් යොදවා නොතිබීම, දේශගුණික විපර්යාස වැලැක්වීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා මිලට ගත් රු. මිලියන 12.45 ක් වටිනා පරිඝණක 55 ක් ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් යොදවා ගෙන නොතිබීම, සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන යටතේ රු.මිලියන 1.08 ක් වැය කර මිලට ගෙන තිබූ තණකොළ කපන යන්ත්‍ර 60 න් 55 ක් විගණිත දිනය වන විටත් අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

ව්‍යාපෘති ප්‍රදාන ඌන උපයෝජනය

දේශගුණික විපර්යාස වැළැක්වීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ පළමු මාස හතර වෙනුවෙන් ලෝක බැංකුව ප්‍රදානය කරන ලද රු. මිලියන 117.7 ක මුදලින් රු. මිලියන 9.20 ක මුදලක් ව්‍යාපෘති අරමුණ වෙනුවෙන් යොදවා නොගෙන නැවත ලෝක බැංකුව වෙත ප්‍රේෂණය කර තිබුණි.

බෝගල ග්‍රැපයිට් සමාගම

2020 වර්ෂයේදි භාණ්ඩාගාර ලේකම් සහ ජර්මන් සමාගමක් අතර ඇතිකරගත් ගිවිසුමක් අනුව බෝගල ග්‍රැපයිට් සමාගම රජය සතු කොටස් සියයට 50.01 ක් එකී ජර්මන් සමාගමට පවරා තිබූ අතර මෙම ගිවිසුම ප්‍රකාරව මිලදී ගන්නා සමාගම ශ්‍රී ලංකාව තුළ මිනිරන් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනය සහ අලෙවිය සිදුකිරීමට අදාළ යෝජනා රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිසමට භාරදීමටත් එකඟ වී තිබුණි. නමුත්, සමාගම විසින් මිනිරන් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුළ සිදුකර නොතිබූ අතර සමාගම විසින් කැණීම් කරන මිනිරන් අගය එකතු කිරීමකින් තොරව

අමුද්‍රව්‍ය ලෙස තවදුරටත් අපනයනය කරමින් පැවතුණි.

කහටගහ ග්‍රැපයිට් සමාගම

කහටගහ ග්‍රැපයිට් සමාගම කැණීම් සිදුකරන කහටගහ පතලෙහි, කාර්යාංශය විසින් වාර්ෂිකව සහ විශේෂ අවස්ථාවල සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී එහි පවතින අඩුපාඩු පිළිබඳව පරීක්ෂණ වාර්තා මගින් නිරන්තරව දැනුම් දෙමින් කැණීම් බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කර තිබූ අතර අදාළ සමාගම මගින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට පියවර ගෙන නොතිබූ බව පරීක්ෂණ වාර්තා වලින් තහවුරු විය.

බලපත්‍ර ලබාදීම හා දීර්ඝ කිරීම

- සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශයේ කැණීම් ඉංජිනේරුවන් සහ භූ විද්‍යාඥයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික කණ්ඩායමක් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයකින් සහ කමිටු රැස්වීමකින් අනතුරුව සකුරා ග්‍රැපයිට් සමාගම සඳහා වූ කැණීම් බලපත්‍රය වර්ෂයකින් පමණක් දීර්ඝ කිරීමට එම කමිටුවේ අධ්‍යක්ෂ(පාරිසරික බලපෑම් ඇගයීම් හා ප්‍රාදේශීය) විසින් නිර්දේශ කර තිබියදී අදාළ බලපත්‍රය 2021 සිට 2031 දක්වා වර්ෂ 10 කින් දීර්ඝ කිරීමට කාර්යාංශය විසින් පියවර ගෙන තිබූ අතර මේ සඳහා කාර්යාංශය පිහිටුවීම් පනත මගින් හෝ වෙනත් අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් මේ සඳහා විශේෂ බලතල පැවරීමක් සිදුකර නොතිබුණි.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඛනිජ වැලි කැණීම සඳහා 2014 දෙසැම්බර් 09 දින සිට 2024 දෙසැම්බර් 08 දින දක්වා වර්ෂ 10 කට කැණීම් බලපත්‍ර 02 ක් ඇල්කෙමි හෙවි මෙටල්ස් (පුද්) සමාගමට ලබා දී තිබුණි. මෙම බලපත්‍ර ලබාගෙන කැණීම් නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේදී මෙම බලපත්‍ර 02 ක අවලංගු කර 2018 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියක් මත එම බලපත්‍ර නැවත සක්‍රීය කර තිබුණි. 2022 ජුනි 15 විගණන දින වන විටත් කිසිදු කැණීමක් සිදු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ අළුතින් ලියාපදිංචි කරන ලද සමාගමකට මෙම බලපත්‍ර 02 ක පැවරීමට කටයුතු කරමින් පැවතුණි.

- 2017 මාර්තු 29 දිනැති අංක අමප/17/530/704/009 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රජයේ සංවර්ධන කටයුතු සඳහා මහවැලි අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන ගංගා සහ ගංගා ද්‍රෝණිවල පවතින ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමේදී එම ප්‍රදේශවල පුළුල් පාරිසරික බලපෑම් ඇගයීමක් කර අසීමාන්තිකව එම ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීම නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමේ වැදගත්කම ද සැලකිල්ලට ගෙන කාර්යාංශය විසින් ජීඑස්එම්බී තාක්ෂණ සේවා(පුද්) සමාගමට පමණක් කැණීම් බලපත්‍ර ලබාදිය යුතු බව සඳහන් වේ. කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ එම සමාගමට අමතරව

පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මහවැලි අධිකාරියට අයත් මාදුරුඔයෙහි වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාදී තිබුණි.

කරස්නාගල මිනිරන් පතලේ කැණීම්

කරස්නාගල මිනිරන් පතලේ කැණීම් කටයුතු සර්කෝන් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම විසින් සිදුකරන අතර එහි සම්පූර්ණ අයිතිය විදේශීය පාර්ශවයන් වෙත පවතින නිසා ශ්‍රී ලංකාවේ මිනිරන් ගවේෂණය, කැණීම හා දේශීය වෙළඳපල හා විදේශීය වෙළඳපල වෙත අලෙවි කිරීම සඳහා එකී සමාගම 2012 වර්ෂයේදී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ වැඩ කටයුතු ඉටුවී නොතිබූ නිසා එම ගිවිසුම්වල වලංගු කාලය 2018 වර්ෂය දක්වා දීර්ඝ කර තිබූ අතර එම ගිවිසුම්වල වලංගු භාවය පිළිබඳ තවදුරටත් පරීක්ෂා කිරීමකින් තොරව මෙම පතල සඳහා 2019 අගෝස්තු 26 දින සිට 2022 පෙබරවාරි 28 දින දක්වා අවස්ථා 02 කදී කැනීම් බලපත්‍ර නිකුත් කර තිබුණි. 2019-2021 කාලය තුළ මෙම මිනිරන් පතලෙහි මිනිරන් කැණීම් ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබූ අතර 2020 වර්ෂයේදී මිනිරන් ටොන් 01 ක් පමණක් විදේශ රටකට අමුද්‍රව්‍ය ලෙස අපනයනය කර තිබුණි.

ජාතික ඛනිජ ප්‍රතිපත්තිය යටතේ ඛනිජ සඳහා අගය එකතු කිරීම

- 1991 වර්ෂයේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත දැනට භාවිතයේ පවතින ජාතික ඛනිජ ප්‍රතිපත්තිය අනුව පවතින ඛනිජ පාදක කරගත් කර්මාන්ත සඳහා අගය එකතු කිරීම සිදුකල යුතු වුවත් බෝගල ග්‍රැපයිට්, කහටගහ ග්‍රැපයිට්, කරස්නාගල සහ සකුරා ග්‍රැපයිට් යන සමාගම් 4 විසින් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අගය එකතු කිරීමකින් තොරව මිනිරන් කිලෝග්‍රෑම් 1 ක් රු. 282 ත් රු. 415 ත් අතර මිලකට කිලෝ ග්‍රෑම් 7,632,000 ක් රු.මිලියන 2708 ක වටිනාකමකට අපනයනය කර තිබුණි.

- මන්නාරම දිස්ත්‍රික්කයේ ඛනිජ වැලි කැණීම හා අගය එකතු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ වී.වී.එම් ලංකා මිනිරන් (පුද්) සමාගම අතර 2012 වර්ෂයේදී ආයෝජන ගිවිසුමකට එළඹ තිබූ අතර එම ව්‍යාපෘතිය සිදු නොකිරීම නිසා අදාළ ගිවිසුම 2020 පෙබරවාරි 25 දින ලංකා ආයෝජන මණ්ඩලය මගින් අවලංගු කර තිබුණි. මෙම ගිවිසුම් පරීක්ෂා කිරීමකින් තොරව කාර්යාංශය විසින් ත්‍රිකුණාමලය මුතූර් ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා 2017 සිට 2018 වර්ෂය දක්වාද, 2018 ජූලි 12 සිට 2028 ජූලි 11 දක්වා වර්ෂ 10 කටද බලපත්‍රයක් ලබාදී තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම කිසිදු කැණීමක් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ අළුතින් ලියාපදිංචි කරන ලද සමාගමකට මෙම බලපත්‍රය පැවරීමට කටයුතු කරමින් පැවතුණි.

- 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනිමට 2022 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

රාජ්‍යභාග ආදායම

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 26(1) හා 44(ආ) වගන්තිය ප්‍රකාරව රජය වෙනුවෙන් කාර්යාංශය අයකර ගත් රාජ්‍යභාගය භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් 2016 සිට 2021 දක්වා කාලය තුළ භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර කාර්යාංශයේ රඳවාගෙන තිබු රාජ්‍යභාග වටිනාකම රු.මිලියන 3,147 ක් විය.

කැණීම්වලින් අනතුරුව ඉඩම් පුනරුත්ථාපනය

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය ප්‍රකාරව කැණීම්වලින් අනතුරුව මාස 2 සිට වර්ෂ 09 ක් දක්වා කාලය තුළ ඉඩම් පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු වුවද කැණීම් බලපත්‍රලාභීන් 1943 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉහත බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු. මිලියන 439 ක් වූ බැංකු ඇපකර මුදල් කරගෙන තිබුණද එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

විදේශීය අයිතිය ඇති සමාගම් සඳහා ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම

2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන සහ 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රවල සඳහන් විදේශ විනිමය නියෝගය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ පතල් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් විදේශීය අයිතිය සියයට 40 ක ප්‍රතිශතයක් දක්වා විය යුතු අතර එම සීමාව ඉක්මවා විදේශීය අයිතිය පවතී නම් ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු විය. නමුත් ශ්‍රී ලංකාව තුළ මිනිරන් කැණීම් සිදුකරන බෝගල ග්‍රැපයිට් සමාගමේ මුළු කොටස් අයිතියෙන් සියයට 86.55 ක්ම විදේශීය සමාගම් 02 කට අයත් වූ අතර, මෙම සමාගම ලංකා ආයෝජන මණ්ඩලයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන හෝ එම මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුමකට එළඹ නොතිබුණි. මේ පිළිබඳ නොසලකා මෙම සමාගමට මිනිරන් කැණීම් සඳහා කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි.

මනම්පිටිය වැලි ව්‍යාපෘතිය

කියුබ් 1 ක් සඳහා රු.4,830 ක්ව පැවති වැලි මිල රු.6,450 දක්වා රු.1,620 කින් වැඩිකර ඉන් රු.1,000 ක් වැලි ගොඩදමන කම්කරුවන් සඳහා ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණත් එම මුදලින් රු.600 ත් - රු.800 ත් අතර මුදලක් වැලි මංකඩ ලාභීන්ට ගෙවමින් පැවතුණි. එසේම පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික්කවල පවතින ඉහල වැලි මිල පාලනය කිරිම සඳහා

පාරිභෝගික සේවා අධිකාරිය සමග එක්ව පාලන මිලක් පැනවීම කෙරෙහි සමාගමේ අවධානය යොමු වී නොතිබුණි.

මෙම වැලි ව්‍යාපෘතිය සඳහා කැණීම් බලපත්‍ර 211 ක් ලබාගෙන තිබූ අතර ඒ යටතේ වැලි මංකඩ 211 ක් ක්‍රියාත්මක විය යුතු වුවත් වැලි මංකඩ 144 ක් පමණක් ක්‍රියාකාරී මට්ටමේ පැවතුණි. වැලි මංකඩ 61 ක් සඳහා මංකඩ ලාභීන් පත්කර තිබුණත් ඒවා ක්‍රියාත්මක වී නොතිබූ අතර වැලි මංකඩ 06 ක් සඳහා මංකඩ ලාභීන් පත්කර නොතිබුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා 2009 වර්ෂයේ රු.මිලියන 8.88 කට මිලදී ගත් ලෝඩර් යන්ත්‍රයක් කාර්මික දෝෂ හේතුවෙන් 2012 වර්ෂයේ භාවිතයෙන් ඉවත් කර තිබුණි. 2019 වර්ෂයේදී එය නැවත රු.966,595 ක් වැයකර අළුත්වැඩියාවක් කර තිබුණත් එය යථා තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම යන්ත්‍රය ව්‍යාපෘති භූමියේ අනාරක්ෂිතව ගාල් කර තැබීම නිසා එකී කොටස්වල මල බැඳීම් සිදුවී තිබූ අතර රු. මිලියන 2.4 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රයක් කිසිදු ආවරණයක් නොමැතිව වැසි ජලය සහ හිරු රශ්මියට නිරාවරණය වෙමින් අබලන් තත්ත්වයක පැවතුණි.

කන්තලේ වැලි ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කැණීම් කර වැලි ගබඩාවක් වෙත ප්‍රවාහනය කර තිබූ වැලි කියුබ් 46,306 ක ප්‍රමාණයෙන් වැලි කියුබ් 41,773 ක් විකුණා තිබූ අතර ඉතිරි වැලි අලෙවි නොකර මාස 10 ක පමණ කාලයක් තිබීම නිසා සුළං වශයෙන් රොන්මඩ කලවම් වී තිබූ අතර ඉතිරි කියුබ් 4533 ක ප්‍රමාණය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. මෙම ස්ථානයේ වැලි කියුබ් 1000 කට අඩු ප්‍රමාණයක් පමණක් පවතින බව ටෙන්ඩර්කරුවන් විසින් දන්වා තිබූ අතර එහි තිබූ වැලි කියුබ් 875 ක ප්‍රමාණයක් ටෙන්ඩර්කරුවකු වෙත විකුණා තිබුණි. ඒ අනුව වැලි කියුබ් 3658 ක ඌනතාවයක් පැවති අතර එම වැලි තොගයේ පිරිවැය රු. මිලියන 12.1 ක් විය. තවද වැලි මිලදීගත් ගැණුම්කරු සුළං වශයෙන් රොන්මඩ කලවම් වී තිබූ වැලි ව්‍යාපෘති භූමියේම යන්ත්‍රයක් යොදා ගෙන පිරිසිදු කර කියුබ් 01 ක් රු.10,000 බැගින් විකුණන බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව බාහිර පාර්ශවයක් රු.මිලියන 5 කට වඩා වැඩි ලාභයක් උපයා ගෙන තිබූ බව නිරීක්ෂණය වී තිබුණි.

මුතූර් වැලි ව්‍යාපෘතිය

මුතූර් වැලි ව්‍යාපෘතිය සිදුකරන ස්ථානයේ පවතින වැලි ඉදිකිරීමේ කටයුතු සඳහා භාවිතා කරන කොන්ක්‍රීට් සඳහා සුදුසු නොවීම හේතුවෙන් මෙම ස්ථානයෙන් වැලි කැණීම් කර අදාළ ඉදිකිරීම් සඳහා ලබා ගැනීමට ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. සමාගම විසින් කැණීම් බලපත්‍ර 24 ක් ලබා ගෙන මෙම ස්ථානයේ වැලි කැණීම් සිදුකර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භ කල 2020 අගෝස්තු 18 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ වැලි කියුබ් 1,397 ක් කැණීම් කර තිබූ අතර අදාළ කාලය තුළ රු. මිලියන 1.9 ක අලාභයක් සිදු වී තිබුණි.

කොටිකම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය

2017 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කල වැල්ලවාය කොටිකම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේද ආරම්භ කර නොතිබූ අතර කැණීම් කරන තිරුවානා ගබඩා කිරීම සඳහා ඉඩමක් බදු ගැනීම, කැණීම් කරන තිරුවානාවල බර කිරීම සඳහා පාලම් තරාදියක් මිලදී ගැනීම සහ එහි ආරක්ෂාව සඳහා සේවකයන් යෙදවීම ඇතුළු අයභාර සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු.මිලියන 21.71 ක මුදලක් 2017-2021 කාලය තුළ දරා තිබුණි.

වනජීවී හා වන සංරක්ෂණය

විගණන නිරීක්ෂණ

- අලි මිනිස් ගැටුම
- අලි මිනිස් ගැටුම අවම කර ගැනීම සඳහා අලි වැට වෙනුවට අලි අගල් කැපීම
- මුතුරාජවෙල අභය භූමිය
- කළුගල් කඩා ඉවත් කිරීමේ දී අයකල ගාස්තු
- කඩොලාන වනාන්තර ප්‍රතිස්ථාපනය
- පැළ තවාන්වල පැළ බෙදා හැරීම
- රක්ෂිත වනාන්තර නීත්‍යානුකූල නොවන පරිදි අත්පත් කර ගැනීම
- රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාර
- දැව ගබඩා පවත්වාගෙන යාම
- රොබ්ගිල් වැඩබිමේ ගස් හෙලීම
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන ඉදිකිරීම
- පක්ෂීන් මිලදී ගැනීම
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් සිදු කළ ඉදිකිරීම්
- ගෝණපළ ගොවිපලේ ඉදිකරමින් පවතින සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය

වනජීවී හා වන සංරක්ෂණය

වර්තමාන හා අනාගත පරපුර උදෙසා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම දැක්ම කර ගත් සහභාගීත්ව කළමනාකරණය මඟින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම යන මෙහෙවර ඉටු කිරීම සඳහා වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ වන වනජීවී ඊකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පහත සඳහන් කාර්යභාර්යය ඉටුකල යුතුව තිබුණි.

- වනජීවී සම්පත් සංරක්ෂණය
- වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන් හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වඳවී යාමේ තර්ජනයට මුහුණපාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය හා ඊට අදාළ කටයුතු.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට, ඒ යටතේ වන වනජීවී ඊකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු 03 කට ඉහත සඳහන් කාර්යභාර්යය ඉටු කිරීම සඳහා 2021 වර්ෂයේදී එකතුව රු. මිලියන 11,205.65 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 8,105.44 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 62 හි දැක්වේ.



	වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය	රාජ්‍ය අමාත්‍යාංශය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන	1,787.50	128.55	4,527.80	1,286.80	3,475	11,205.65
වියදම රු.මිලියන	1,691.43	83.78	2,731.09	820.14	2,779	8,105.44
ඉතිරිය රු.මිලියන	96.07	44.77	1,796.71	466.66	696	3,100.21

රූපසටහන 62 - ලබා දී තිබූ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අලි මිනිස් ගැටුම

වනසතුන්, වෘක්ෂලතා හා ඒවායේ වාසභූමි වාණිජ ලෙස සහ වෙනත් අනිසි ලෙස භාවිතයට ගැනීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය හා එහි පැවැත්මට බාධාකාරී වී තිබුණි.

සංවර්ධන කටයුතුවලට හා නීති විරෝධීව සිදුවන වන සංහාරය නිසාම භූමි පරිහරණ රටාවේ වෙනස් වීම, භාවිත කළ හැකි සුපෝෂිත වාසස්ථාන පිරිහීම හා අවම වීම, අලීන්ගේ ආහාර හිඟවීම නිසා අලි ගම්වැදීම හා සංවර්ධන කටයුතු නිසා අලි මංකඩ අවහිර කිරීම වැනි හේතුමත අලිමිනිස් ගැටුම සමාලෝචිත වර්ෂය අවසන් වන විට සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි. අලි මිනිස් ගැටුම උග්‍රවීම හේතුවෙන් පසුගිය වර්ෂ 05 ක කාලය තුළ අලි මරණ, මිනිස් මරණ, ශාරීරික හානි හා දේපළ හානි වර්ධනය වීම පිළිබඳ විස්තර වගුව 27 හි දැක්වේ.

	2021	2020	2019	2018	2017
වන අලි මරණ	375	327	407	319	256
මිනිස් මරණ	142*	113	122	96	87
ශාරීරික හානි	58*	75	145	58	77
දේපළ හානි	1326*	850*	2,148*	1,423*	1,425

වගුව 27 - පසුගිය වර්ෂ 05 ක කාලය තුළ අලි මරණ, මිනිස් මරණ, ශාරීරික හානි හා දේපළ හානි වර්ධනය වීම පිළිබඳ විස්තර

*දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වන්දි ගෙවන බැවින් දෙපාර්තමේන්තුව සතුව සම්පූර්ණ තොරතුරු නොමැත.

අලි මිනිස් ගැටුම අවම කර ගැනීම සඳහා අලි වැට වෙනුවට අලි අගල් කැපීම

අගල් කැපීම සඳහා අදාළ නොවන ගොඩනැගිලි ඉදිකිරීමේ රේටයන් පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර තිබීම හේතුවෙන් වාරිමාර්ග රේටය සමඟ සැසඳීමේදී කියුබික් මීටරයක් සඳහා ඇස්තමේන්තුව රු.312 කින් වැඩි වී තිබුණු අතර ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 49.53 කින් වැඩිවී තිබුණු අතර ඒ හේතුවෙන් කියුබික් මීටර් 91,278.09 ක් සඳහා නියමිත පිරිවැයට වඩා රු.මිලියන 28.48 ක් ගෙවා තිබුණි.

අලි අගල භෞතික පරීක්ෂාවේදී, ඝන මීටර් 3000 ක් පස්වලින් ගොඩවී තිබුණු අතර ඒ අනුව පස් ඉවත් කිරීම සඳහා රු.මිලියන 1.5 ක් පමණ වැය කිරීමට සිදුවන බව නිරීක්ෂණය විය. තවද භූ විෂමතාවය නොසළකා පස් කැපීම හේතුවෙන් පස් ඉවත් කිරීමට වර්ෂයකට රු.මිලියන 25.66 ක් වැය කිරීමට සිදු වූ බව නිරීක්ෂණය විය. එසේම අලි අගල කැපීමේ ව්‍යාපෘතිය 2021 ජුනි 03 දින අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක් විය.

මුතුරාජවෙල අභය භූමිය

මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටයාර 1285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභය භූමියක් ලෙස ගැසට් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභයභූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

කළුගල් කඩා ඉවත් කිරීමේ දී අයකල ගාස්තු

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ගැසට් නිවේදනය අනුව 2020 වර්ෂය දක්වා දෙපාර්තමේන්තු කලමනාකරණය යටතේ පවතින ඉඩම්වල පිහිටි කළුගල් කඩා ඉවත් කිරීමේ දී, කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකල ගාස්තු 2020 නොවැම්බර් 13 දිනැති අංක 14/2020 දරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් සියයට 50 ක ප්‍රමාණයකින් අඩු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ආදායම විශාල ලෙස පහළ බසින බැවින් එය රාජ්‍ය ආදායම ද අඩුවීමට හේතුවී තිබුණි.

කඩොලාන වනාන්තර ප්‍රතිස්ථාපනය

කඩොලාන වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය යටතේ මන්නාරම දිසා වන නිලධාරී කාර්යාලය හෙක්ටයාර් 110 ක කඩොලාන නැවත වගා කිරීම සහ කඩොලාන වනාන්තර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘති ආරම්භ කර තිබුණි. මෙහි දී වෙඩිතලතිව් කඩොලාන වනයේ පැළ 70,000 ක් රෝපණය කර තිබුණ ද, ඉන් පැළ කිසිවක් ජීවී තත්ත්වයේ නොතිබුණි. ඒ අනුව අළුතින් පැළ රෝපණය කිරීම අසාර්ථක වී ඇති බැවින් ඒ සඳහා දරන ලද රු.මිලියන 13.02 ක මුදලක් නිශ්කාර්ය වී තිබුණි.

පැළ තවාන්වල පැළ බෙදා හැරීම

2019 වර්ෂයේ ESCAMP ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් රෝපණය කරන ලද මඩු හා වෙට්ටියාර් පැළ තවාන් වල ඇති පැළ 62,046 ක් 2021 දෙසැම්බර් වන විටත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණු බැවින් පැළ නඩත්තු කිරීම වෙනුවෙන් තවත් රු.මිලියන 2.53 ක නිශ්කාර්ය වියදමක් දැරීමට සිදු වී තිබුණි.

රක්ෂිත වනාන්තර නීත්‍යානුකූල නොවන පරිදි අත්පත් කර ගැනීම

වන අපරාධ හඳුනා ගැනීමටත් ඒවා සිදු වීම වැලැක්වීමට හා අවම කර ගැනීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා 2019 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් දක්වා මන්නාරම දිසා වන කාර්යාලය යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර හෙක්ටයාර් 137.03 ක් බාහිර පාර්ශවයන් විසින් නීත්‍යානුකූල නොවන පරිදි අත්පත් කර ගෙන තිබුණි.

රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාර

රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාර තුන වෙත 2021 වර්ෂයේ ලද ඇණවුම් සංඛ්‍යාව 395 ක් වූ අතර, ඉන් ඇණවුම් 99 ක් හෙවත් සියයට 25 කට සමාන ප්‍රමාණයන් වර්ෂය තුළදී නිම කර නොතිබුණු අතර සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට සහ පනත මඟින් නෛතිකව පවරා ඇති ප්‍රධාන කාර්යයන් සඳහා අවධානය යොමු නොකොට බාහිර පාර්ශවයන් විසින් නිෂ්පාදිත විසිතුරු භාණ්ඩ තොගයක් මිලදී ගෙන විකිණීමට සංස්ථාව කටයුතු කර තිබුණි.

රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික සාමාන්‍ය අලෙවිය සැලකිල්ලට නොගෙන නිෂ්පාදන වර්ෂය තුළ නිෂ්පාදනය වැඩි කිරීම තුලින් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 22.88 ක් වටිනා ගෘහ භාණ්ඩ තොගයක් අම්පාර නිෂ්පාදනාගාරයේ අනවශ්‍ය පරිදි ගොඩගැසී තිබුණි. ඒසේම 2018 වර්ෂයටත් පෙර සිට පැවත එන වැද්දුම් අංශයේ අලෙවි නොවී පවතින ගෘහ භාණ්ඩ තොගයේ වටිනාකම රු.මිලියන 36.37 ක් වූ අතර වැඩ නිම නොකරන ලද අයිතම අනුවකට අදාළ ගෘහ භාණ්ඩ තොගයේ වටිනාකම රු.මිලියන 109.59 ක් විය.

දැව ගබඩා පවත්වාගෙන යාම

රාජ්‍ය දැව සංස්ථාව සතුව දැව ගබඩා 52ක් පවතින අතර ඒවායේ නිසි කළමණාකරනයක් නොමැති වීම හේතුවෙන් දැව කඳන් හා ඉරූ දැව තොග දිර්ඝකාලීනව දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉන් අම්පාර දැව ගබඩාව තුළ පමණක් 2015 වර්ෂයේ සිට පැවත එන රජයේ කැළෑ වලින් ලද දැව කඳන් 14,527 ක්ද, 2014 වර්ෂයේ සිට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ දැව කඳන් 3,040 ක්ද, 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ එකතු වූ අම්පාර දැව කඳන් ඝනමීටර් 616 ක් හා 2017 වර්ෂයේ සිට පවතින ඉරූ දැව ඝන ඝනමීටර් 124,928.75 ක් අනාරක්ෂිතව ගොඩගසා තිබුණි.

රොබ්ගිල් වැඩබිමේ ගස් හෙළීම

2018 වර්ෂයේ රොබ්ගිල් වැඩබිමේ යුකලිප්ටස් වර්ගයේ ගස් 2172 ක් පූර්ණ හෙලිමේදී සිදුව තිබූ අක්‍රමිකතාව සම්බන්ධයෙන් විමර්ශනයක්

සිදුකොට තිබුණද, එයට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණයක් සිදු කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීනතාවයන් උපයෝගීකර ගනිමින්, පිළගත් නීතිරීතිවලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම යන මෙහෙවර ඉටු කිරීම සඳහා ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ආරම්භ කර තිබුණු අතර ඒවා ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා රු.මිලියන 1,286.8 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 820.14 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාල පරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 36 ක් හෙවත් රු.මිලියන 466.66 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය, රිදියගම සෆාරි උද්‍යානය හා ගෝනපළ සත්වෝද්‍යාන ගොවිපළ පාලනය වේ.

2021 වර්ෂයේදී සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණ වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන ඉදිකිරීම

රිදියගම සෆාරි උද්‍යානයේ රු.මිලියන 7.2 ක වියදමින් ඉදිකර තිබූ ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන 12 ක වැඩ 2018 මාර්තු 22 වන දින අවසන් කර තිබුණද 2022 අප්‍රේල් වන විටත් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

පක්ෂීන් මිලදී ගැනීම

2020 වර්ෂයේදී රු.මිලියන 66 ක වියදමකින් විදේශීය පක්ෂීන් 136 දෙනෙකු මිලදී ගෙන තිබුණු අතර මෙම පක්ෂීන් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිකිරීමට අපේක්ෂිත හම්බන්තොට සෆාරි උද්‍යානයේ පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබීම හේතුවෙන් පක්ෂීන් 57 දෙනෙකු ප්‍රදර්ශනය කිරීමකින් තොරව සෆාරි උද්‍යානයේ වෙනත් කූඩුවල රඳවා තිබුණි.

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් සිදු කළ ඉදිකිරීම්

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ එළඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිවලට අදාළව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට (Terminate) ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබූ අතර එම ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා නොදී අතරමඟ නවතා දමා තිබුණි. එම ඉදිකිරීම් වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 69.56 ක වියදමක් දරා තිබූ අතර ඉන් සමහර ව්‍යාපෘති වෙනුවෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ Mobilization Advance මුදලෙන් රඳවා

ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.මිලියන 14.36 ක මුදලක් අය කර ගත යුතුව තිබුණි.

ගෝණපළ ගොවිපලේ ඉදිකරමින් පවතින සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය

2019 වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 20.08 ක් වූ ගෝණපල ගොවිපළේ ඉදිකළ සත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 14.31 ක් අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

නාගරික සංවර්ධන සහ නිවාස අංශය

විගණන නිරීක්ෂණ

- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
- නාගරික සංවර්ධන ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජාපවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
- විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය
- මහකොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
    - අරුවක්කාලු කසල රදවනය ඉදිකිරීම් ව්‍යාපෘතියේ A, B හා C පැකේජයන් ක්‍රියාත්මක කිරීම
    - අවශ්‍ය කරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (පැකේජ් D)
- නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය
- සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය
- උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
- කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- නාගරික සංවර්ධන අධිකාරිය
- වෝටර්ස් එජ් සමාගම
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන කිරීමේ සමාගම
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
    - ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය
    - අපේක්ෂිත ඉලක්කයට ළඟා නොවූ / ක්‍රියාත්මක කර නොතිබූ නිවාස ව්‍යාපෘති
    - මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

නාගරික සංවර්ධන සහ නිවාස අංශය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- නාගරික සංවර්ධනය කේන්ද්‍රකරගත් බහුවිධ කුසලතා සහිත රැකියා, ව්‍යාපාර හා ආදායම් මාර්ග පුළුල් කිරීම.
- දේශීය ඉදිකිරීම්කරුවන් සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාව ලබාදීම.
- ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- කම්කරු ශ්‍රම ඌනතාවය සඳහා හැකිතාක් තාක්ෂණික විසඳුම් කරා යොමුවීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබාදීම.
- පුහුණු කම්කරුවන් බිහිකිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ කුසලතා දියුණු කිරීමට වෘත්තීමය අධ්‍යාපනය වෙළඳපල අවශ්‍යතාවය අනුව සම්බන්ධීකරණය.
- ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපදේශන පහසුවෙන් ලබාගැනීම සඳහා දේශීය වෘත්තීය ඉංජිනේරුවන් සහ උසස් තාක්ෂණවේදීන්ගේ දායකත්වය ලබාගැනීම හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දේශීය සලකුණ ජාත්‍යන්තර තලයේ සන්නාමයක් බවට පත්කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කරගැනීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන් ආයතනය, ඉංජිනේරු ආයතනය, විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සමඟ පහසුවෙන් කටයුතු කිරීමේ සම්බන්ධීකරණ යන්ත්‍රණයක් හඳුන්වාදීම.
- උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසෙන නීති පනත් සම්මත කර දේශීය සුළු සහ මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසීම.
- පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා අංග සම්පූර්ණ නිවාස සංකීර්ණ සංවර්ධනය මඟින් නාගරික ශ්‍රම බලකාය සමාජීය වශයෙන් සවිබල ගැන්වීම.
- කොළඹ හා නාගරික තදාසන්න ප්‍රදේශවල මැදි ආදායම්ලාභීන් සඳහා නවීන පහසුකම් සහිත නිවාස සංකීර්ණ සඳහා දිගුකාලීන ණය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය.
- ගංවතුර පාලනය, නාගරික රථගාල්, සාප්පු සංකීර්ණ, ශරීර සුවතා, විනෝදාශ්වාද පහසුකම් සැපයීම.
- පැරණි මහල් නිවාස, නව මහල් නිවාස මඟින් ප්‍රතිස්ථාපනය කිරීම.
- නාගරික පැල්පත්වාසීන් සඳහා නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නවීන නිවාස ලබාදීම හා ප්‍රජා පහසුකම් ලබාදීම.
- මධ්‍යම පාන්තිකයන්ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති හා ණය පහසුකම් සැලසීම.
- කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.
- නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායී මිල යටතේ ඉඩම් ලබාදීම මඟින් නව

නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජකයන් දිරිමත් කිරීම.

- නාගරික වන උයන්, නාගරික හා අර්ධ නාගරික උද්‍යාන, ජල උද්‍යාන හා මාර්ග දෙපස හරිත මංතීරු හඳුන්වාදීම.
- නාගරික අපද්‍රව්‍ය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
- පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගන හා සනීපාරක්ෂක කසල රඳවනයන් ස්ථාපනය කොට අක්‍රමවත් කසල බැහැර කිරීම් වළක්වාලීමට කටයුතු සම්පාදනය කිරීම.
- රෝහල් සහ කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය තාක්ෂණික සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමට අනුගත වන පරිදි නීති ක්‍රමවේදයන් සකස් කිරීම.
- වගකීම රහිත කසල බැහැර කිරීම් වැලැක්වීමට පියවර ගැනීම.
- සියළුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූලව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම.
- සියළු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම ව්‍යාපෘතියේ මූලික කොටසක් ලෙස සැලකීම.
- සමුද්‍ර ඛාදනය වැළැක්වීමට පියවර ගැනීම.
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා මුහුදු තීරයට සහ මුහුදු පත්ලට සිදු වී ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුදුරු පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගංවතුරෙන් තොර වාසස්ථාන ඇතිකිරීම හා පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කරගත් පහත්බිම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අවතැන්වූවන්ට ග්‍රාමීය නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදවීම වැලැක්වීම සඳහා එක් ස්ථානයකින් හෝ අන්තර්ජාලය ඔස්සේ සියළු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දැනට පවතින බලපත්‍ර ලබාදීම ක්‍රමවේදය සරල කිරීම.
- ප්‍රජා නායකත්වය සහ ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම.
- වතු ප්‍රජාව ආශ්‍රිතව නිවාස හා මූලික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- වතු ආශ්‍රිත අඩු මහල් ප්‍රමාණයකින් යුත් නිවාස යෝජනා ක්‍රම වතු හිමියන්ගේ ද දායකත්වය සහිතව හඳුන්වා දීම සහ මෙම නිවාස යෝජනා ක්‍රමය තුළ අංග සම්පූර්ණ සෞඛ්‍ය මධ්‍යස්ථාන, පෙර පාසැල් සහ ප්‍රජා ශාලා ඇතුළු පහසුකම් ද ස්ථාපිත කිරීම.
- වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම .

2021 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශයකට හා දෙපාර්තමේන්තුවකට රු.මිලියන 40,138.01 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 28,296.95 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 63 හි දැක්වේ.



	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	නාගරික සංවර්ධන අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව	එකතුව
ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන	23,386.18	16,353.24	398.59	40,138.01
වියදම රු. මිලියන	16,069.92	12,051.36	175.67	28,296.95
ඉතිරිය රු. මිලියන	7,316.26	4,301.88	222.92	11,841.06

රූපසටහන 63 - ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් යටිතල පහසුකම් සංවර්ධන වෙනත් මූලධන වැයවිෂයය (123-2-7-2506) මඟින් සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 15,718.38 ක් වැයකර තිබුණු නමුත් එම වියදම දැරීම තුළින් පැන නැඟුනු වත්කම් හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමට හැකි වන ආකාරයේ ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම නිසා එම වත්කම් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ වත්කම් ගිණුම්වලට ඇතුළත් වී නොමැති බව නිරීක්ෂණය විය.

නාගරික සංවර්ධන ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජාපවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

නාගරික සංවර්ධන,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජාපවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් යටිතල පහසුකම් සංවර්ධන වෙනත් මූලධන වැයවිෂයය (411-2-3-2506) මගින් සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 8,280.18 ක් වැයකර තිබුණු නමුත් එම වියදම දැරීම තුලින් පැන නැගුනු වත්කම් හඳුනාගෙන ප්‍රාග්ධනීත කිරීමට හැකි වන ආකාරයේ ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම නිසා එම වත්කම් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ වත්කම් ගිණුම්වලට ඇතුළත් වී නොමැති බව නිරීක්ෂණය විය.

විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය

මාලඹේ, හෝමාගම, කඩුවෙල සහ අතුරුගිරිය යන නගර පිහිටි ප්‍රදේශය කලාප 05 කට බෙදා සංවර්ධනය කිරීමට අපේක්ෂිතව විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතියේ එක් සංරචකයක් වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ මාර්ග 04 ක් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ සියලු කටයුතු සම්පූර්ණ කර ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කර ඇති බවට සනාථ කරගැනීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කළ යුතු වුවද, ප්‍රවේශ මාර්ගයට සම්බන්ධිත ඉඩම් කැබලි දෙකක් අත්පත් කරගැනීමේ කටයුතු නිරාකරණය කර ගැනීමෙන් තොරව, හෝමාගම හයිලෙවල් සිට දියගම පාර කටුවාන දක්වා වූ නව ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2019 මාර්තු 11 දින වැඩ ආරම්භ කර දින 547 කින් නිම කිරීමට සැලසුම් කර තිබුනද 2021 දෙසැම්බර් 31 දිනට කල්දිගු 05 ක් ලබා දී තිබුණද මීටර 50 ක දුර ප්‍රමාණයක සංවර්ධන කටයුතු නිමකර හයිලෙවල් මාර්ගයට සම්බන්ධ කිරීමෙන් තොරව, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට තීරණය කර තිබුණි. මෙම සංවර්ධන කටයුතු සඳහා 2021 දෙසැම්බර් 31 වන විට දරන ලද මුළු පිරිවැය, ඉඩම් අත්පත් කර ගැනීම වියදමද ඇතුළත්ව රු.මිලියන 712.49 ක් විය.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 ට අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින්, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා හිමිකම් කියනු ලබන පාර්ශවයන්ට වන්දි වටිනාකම තක්සේරු කිරීමට අදාළව නිවැරදිව කටයුතු නොකිරීම නිසා ප්‍රදේශවාසින්ගේ විරෝධතාවය මත 2018 ඔක්තෝම්බර් 26 දින රු.මිලියන 562.87 කට ප්‍රදානය කර තිබුණු පිටිපන තලගල අදියර 1 මාර්ගය සංවර්ධන කොන්ත්‍රාත්තුව, 2021 නොවැම්බර් 16 දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කිරීමට සිදුව තිබුණි. එබැවින් කොන්ත්‍රාත් ප්‍රදානය කර වර්ෂ 3 ½ පමණ කාලයක්

ගත වී ඇතත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.මිලියන 114.08 ක මුදල් ද රු.මිලියන 11.68 ක අතුරු ගෙවීමද ඵලදායි නොවන මුදල් ආයෝජනය කිරීමක් බවට පත්ව තිබුණි.

මහකොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

ජාතික සන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනේ පරිසර විද්‍යාඥයින් සහ මහනගර හා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ප්‍රධාන ක්‍රමවේදය ලෙස කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා ජීව වායු ඒකක පිහිටුවීම බව හඳුනාගෙන තිබුණු අතර අවසාන තාවකාලික විසඳුම කසළ රඳවනය ඉදිකිරීම බව පෙන්වා දී තිබුණි.

මීතොටමුල්ල කුණුකන්ද නායයාමත් සමඟ එම අවසාන තාවකාලික විසඳුම වන කසළ රඳවනය ඉදිකිරීමට යෝජනා කර 2017-2019 කාලසීමාව තුළ එම ව්‍යාපෘතිය කඩිනමින් නිම කර ලංකාවේ කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලෙස කොළඹ නගරාශ්‍රිතව ජනනය වන නාගරික ඝණ අපද්‍රව්‍ය පුත්තලම අරුවක්කාලු ප්‍රදේශයට සංක්‍රාමණය සහ බැහැරලීම" යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2017 මැයි 16 දිනැති කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන (පැකේජයන්) 4 ක් කොටස් 2ක් යටතේ ඇස්තමේන්තුගත මුදල ඇ.ඩො. මිලියන 120 කට එනම් රු.මිලියන 19,127 කට 2017 නොවැම්බර් 30 දින ජාත්‍යන්තරව ටෙන්ඩර් කැඳවීමට අනුමත කර තිබුණි.

A. කැළණිය කසළ පැටවුම් මධ්‍යස්ථානය හා අරුවක්කාලු කසළ ගොඩබාන ස්ථානය ඉදිකිරීම.

B. සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම.

C. කැළණිය සිට අරුවක්කාලු දක්වා නව දුම්රිය මාර්ග ඉදිකිරීම.

D. අවශ්‍ය කරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.

මෙම සම්පූර්ණ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල ඇ.ඩො. මිලියන 120 වන අතර එහි දේශීය අගය රු.මිලියන 19,127 කි. 2021 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 18,345.02ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘති කාලසීමාව 2022 ජූලි 31 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව එදින දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 18,601.49 ක් වැය කර තිබුණු අතර රු.මිලියන 4,494.61 ක් බිල්පත් සඳහා ගෙවිය යුතුව පැවති බව නිරීක්ෂණය විය.

අරුවක්කාලු කසළ රඳවනය ඉදිකිරීම් ව්‍යාපෘතියේ A, B හා C පැකේජයන් ක්‍රියාත්මක කිරීම

ඉහත ඉදිකිරීම් සඳහා ඇ.ඩො.මිලියන 100.96 වටිනාකමට චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි වෙත 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජූනි 30 වන විට අවසන් කිරීමටද ගිවිසුම්ගතව තිබුණි. ව්‍යාපෘතියෙන් යෝජිත A B හා C පැකේජයන් කොන්ත්‍රාත්කරුට

ප්‍රධානයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ලෝක බැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව විනිවිදභාවයකින් සිදුකර නොමැති බවට ලෝක බැංකු සමාලෝචන කණ්ඩායම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. නමුත් ප්‍රමාදයකින් තොරව මෙම ව්‍යාපෘතිය ඉක්මනින් නිමකළ යුතු බවට හේතු දක්වා එම කොන්ත්‍රාත් ප්‍රධානය නැවත ඇගයීම් සිදු නොකිරීම හේතුවෙන් ලෝක බැංකුව විසින් එකඟ වූ ඇමරිකන් ඩොලර් 700,000 ක ලෝක බැංකු ආධාරද අහිමි වී තිබුණි. එසේ ලෝක බැංකු ආධාරද අහිමිකරගනිමින් ලබාදී තිබූ කොන්ත්‍රාත්තුව, වසර 02ක් ප්‍රමාදවී තිබියදී ව්‍යාපෘති කාලය දිගින් දිගටම දීර්ඝ කරමින් පවතින අතර නිමකළ යුතු දින ඉක්මවා වසර 02ක් ගත වුවද අදාළ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල 2021 දෙසැම්බර් 31 වන විටද ලබාගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් මෙම ඉදිකිරීම් කටයුතු 2022 ජූනි 15 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවා තිබුණි.

අවශ්‍ය කරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (පැකේජ් D)

දුම්රිය එන්ජින් කට්ටල 04 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 8.27 ක් වැයකර ආනයනය කරවා ගෙන තිබුණි. දුම්රිය එන්ජින්වල යාන්ත්‍රික උපාංගවලට අදාළ වගකීම් කාලය 2022 අගෝස්තු 28 දින වන විට ඉකුත් වීමට නියමිතව පැවතියද ගෙන්වා වසර 02 ක් ගතවී පැවතියද අපේක්ෂිත කාර්යය සඳහා යොදවා ගත නොහැකිව දුම්රිය දෙපාර්තමේන්තුවේ අංගනවල ගාල් කර තිබුණු අතර එක් දුම්රිය එන්ජිමක අමතර කොටස් M/S Donfang Electricals International Corporation ආයතනයේ දේශීය නියෝජිත ආයතනය විසින් ගලවා වෙනත් දුම්රිය එන්ජිමකට සවිකර තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

- බහාලුම් වැගන් 34 ක් ප්‍රසම්පාදනය කරගැනීම සඳහා අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියකට අනුව නිෂ්පාදකයන් විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික සැලසුම්වල පැවති දෝෂ ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී නොතිබීම හේතුවෙන් බහාලුම් වැගන් ගෙන ඒමේ කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. ඒ අනුව එහි 2021 දෙසැම්බර් 31 දිනට වාර්ෂික ප්‍රගතිය 0%කි. කෙසේ වුවද මෙම කටයුත්ත සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින සුළු අලුත්වැඩියාවකින් පසු භාවිතයට ගතහැකි යන්ත්‍ර 17 ක් සපයාගැනීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බව ව්‍යාපෘති ප්‍රගතිවාර්තා අනුව නිරීක්ෂණය විය.

- බහාලුම් පෙට්ටි 94 ක් 2020 වර්ෂාවසානයේදී ලැබීමට නියමිතව තිබුණද ඒවා සැපයූ පසු එම පෙට්ටි රඳවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් වෙන්කරගෙන නොමැති බැවින් ඒවා සැපයීම 2021 දෙසැම්බර් 31 දිනට සිදුකර නොතිබූ නමුත් 2022 ජූලි 31 වන

විට ඒවා ආනයනය කර ඇති බව ව්‍යාපෘතිය විසින් දක්වා ඇත.

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය

- කුරුණෑගල, දඹුල්ල, ත්‍රිකුණාමලය හා රත්නපුර නගරවල ප්‍රමුඛ නාගරික ව්‍යාපෘති හඳුනාගැනීම පිණිස ව්‍යාපෘතිය 2019 මාර්තු 06 දින ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,297.14 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.42 ක් වන අතර ඉන් රු. මිලියන 1,064.79 කට සමාන එ.ජ.ඩො මිලියන 5.27 ක ණය ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 මාර්තු 31 වන විට නිමකිරීමට අපේක්ෂා කර තිබුණි.

- නමුත් ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන 1,064.79 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.27 ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 2 මාස 09 ක් ඉකුත් වූ පසු එනම් 2021 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 38 ක් නියෝජනය වන රු.මිලියන 405.68 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.07 ක් පමණක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 අගොස්තු 18 දිනැති හා අංක. ER/AB/US/01(vol-i) දරන ලිපියේ, ව්‍යාපෘති කටයුතු අත්හිටුවීමට කරන ලද තීරණය අනුව එම දින වන විට සිදුකෙරෙමින් පැවති අංශ 3 කට අදාළව ගිවිසුම්ගත උපදේශකවරුන්ගේ සේවය 2020 ඔක්තෝබර් මස සිට අවසන් කර තිබුණි. 2021 වර්ෂය අවසාන වන විට උපදේශන සේවා ආයතන 3 ක් සඳහා රු. මිලියන 413.36 ක් ගෙවා තිබු නමුත් උපදේශන ආයතන 2 ක් විසින් උපදේශන වාර්තා 11 ක් ලබා දීමේ පමා කාලය මාස 01 ත් මාස 08 ත් අතර පැවතියද, කිසිදු ප්‍රමාද ගාස්තුවක් අය කර ගෙන නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අදාළ ප්‍රතිපාදනද උපදේශන සේවා ගිවිසුමෙහි අන්තර්ගතව නොතිබුණි. ඉදිරිපත් කළ උපදේශන වාර්තා අනුව ඉදිරි ව්‍යාපෘති කටයුතු 2022 ජුනි වන විටත් ක්‍රියාත්මකවී නොතිබුණි.

සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය

- කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගවල පවතින අධික රථවාහන තදබදයට දීර්ඝකාලීන විසඳුමක් ලෙස කාර්යක්ෂම පොදු ප්‍රවාහන මාධ්‍යයක අවශ්‍යතාවය සලකා අධිවේගී ප්‍රවාහන පද්ධතියක් ලෙස කුළුණු මත ඉහළින් දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ජාලයක් බස්නාහිර කලාපීය සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය ලෙස ජපාන ජාත්‍යන්තර ආයතනයේ(JICA) ආධාර උපයෝගී කරගෙන ස්ථාපිත කර තිබුණු අතර යෝජිත ව්‍යාපෘතියට අදාළව ශක්‍යතා

අධ්‍යයනයක් සිදු කර සැහැල්ලු දුම්රිය මාර්ග ඉදිකිරීම ශක්‍ය බව හඳුනා ගෙන එයට මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ද ලබා ගෙන තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු මුදල රු.මිලියන 59,100 කි. ඉන් රු.මිලියන 43,037 ක් සියයට 0.1 ක පොලී අනුපාතයකට ද ඉතිරි මුදල ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) යටතේ සියයට 0.01 ක පොලී අනුපාතයකට ද වසර 12 ක සහන කාලයකට ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය 2019 මාර්තු 25 දින ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දින නිමකිරීමට සැලසුම් කර ජපාන සහ ශ්‍රී ලංකා රජයන් 2019 මාර්තු 11 වන දින ගිවිසුමට අත්සන් කර තිබුණි.

නමුත්, 2020 සැප්තැම්බර් 21 වන දින ජනාධිපතිතුමා ගේ උපදෙස් පරිදි ජනාධිපති ලේකම්වරයා විසින්, මෙම ව්‍යාපෘතිය මිල අධික වන අතර ලාභදායී නොවන බවත්, එබැවින් ව්‍යාපෘතිය වසා දැමිය යුතු බවත්, කොළඹ නාගරික ප්‍රවාහන යටිතල පහසුකම් සැපයීම සඳහා සුදුසු ව්‍යාපෘතියක් යෝජනාකරන ලෙසත් ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ඒකපාර්ශවිය අවසන් කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2020 සැප්තැම්බර් 24 දිනැති අංක MT/46/2020 දරන කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර තිබූ නමුත් එම තීරණයට පාදක කරගත් හේතු ඉදිරිපත් කර නොබුණි. ඒ අනුව 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 20/1450/312/002 දරන කැබිනට් තීරණය මගින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයා ව්‍යාපෘතිය අත්හිටුවා ව්‍යාපෘති කාර්යාලය වසා දැමීමට කටයුතු කර තිබුණි.

- ජපාන ජාත්‍යන්තර ආයතනයේ(JICA) ආධාර උපයෝගී කරගෙන ස්ථාපිත කර තිබුණු අතර යෝජිත ව්‍යාපෘතිය ආරම්භකල 2019 වසරේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා JICA අරමුදල්වලින් රුපියල් මිලියන 4,886.75 ක් හා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 917.2 ක් ලෙස එකතුව රුපියල් මිලියන 5,803.95 ක් මෙම ව්‍යාපෘතියට වැයකර තිබුණි. එබැවින් ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතිය අතරමග නවතා දැමීමට තීරණය කිරීම නිසා එතෙක් දරන ලද රු.මිලියන 5803.95 ක මුදල නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි. එමෙන්ම ණය ගිවිසුම අනුව 2019 මැයි 23 ගෙවන ලද රුපියල් මිලියන 102.73 ක් වූ පෙරගෙවුම් ගාස්තු (front end fee) ලෙස දරණ ලද වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා අවශ්‍ය විදුලි බල පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණු වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් මුදලින් අයවිය යුතුව පැවති රුපියල් රු.මිලියන 44 ක මුදලක් අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණු අතර එම මුදල සවලීයකරණ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කමක් ලෙස

නොදක්වා ව්‍යාපෘති වියදමක් ලෙස දක්වා තිබුණි.

- එසේම ව්‍යාපෘතිය අත්හිටුවීම මත ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ ව්‍යාපෘතියේ depot ඉදිකිරීමට අවශ්‍ය හෙක්ටයාර් 21 ක පමණ ඉඩම් අත්පත් කර ගැනීමට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 10.1 වගන්තිය අනුව කටයුතු කර තිබුණු ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- මෙම ව්‍යාපෘතිය අත්හිටුවීම නිසා ව්‍යාපෘතියේ උපදේශන සමාගම විසින් ඉල්ලා තිබුණු ඇ. ඩො.මිලියන 31.36 ක අලාභ මුදල පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සාමාජිකයන් 11 දෙනෙකුගෙන් යුතු කමිටුවක් 2021 පෙබරවාරි 23 දිනැති අංක අමප/21/0221/306/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2021 ජූනි 16 දින පත්කරන ලදි. මෙම කමිටුව වර්ෂයක පමණ කාලයක් ගතකිරීමෙන් අනතුරුව වාර්තාවක් 2022 මැයි මස දී ඉදිරිපත් කර තිබුණි. විගණිත දිනය වන විට විගණනයට ලබා දුන් තොරතුරු අනුව මෙම කමිටුවට තාක්ෂණික සහය ලබා දීම වෙනුවෙන් පමණක් රු.මිලියන 4.8 මුදලක් වැය කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර කමිටුවට යම් පාරිශ්‍රමිකයක් ගෙවා තිබුණේද යන්න විගණනයට තහවුරු නොවීය. තවද එම වාර්තාවේ 3.3 ඡේදය සහ අංක 4 නිර්දේශයට අනුව කාණ්ඩ 3 ඉල්ලීම සම්බන්ධයෙන් උපදේශක සමාගම සමඟ එකඟතාවයකට එළඹීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. එම කමිටු නිර්දේශ සඳහා අනුමැතිය ඉල්ලා 2022 ජූනි 28 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි.

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

- ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරා ගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩි දියුණු කිරීම පිණිස ආරම්භ කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කළ යුතු සහභාගීත්ව නගර කලාප ලෙස මහනුවර, ගාල්ල හා යාපනය නගර තෝරා ගෙන තිබුණි. ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 34,912.48 කට සමාන වන අතර ඉන් රු. මිලියන 27,507 කට සමාන එ.ජ.ඩො මිලියන 202 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 වර්ෂය අවසාන වන විට අවසන් විය යුතු වුවද, ව්‍යාපෘති කාලය 2021 දෙසැම්බර් 31 ක් දක්වා තවත් වර්ෂ 02 කින් දීර්ඝ කර තිබුණද ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද ඇ.ජ.ඩො මිලියන 202 ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 7 ½ ක් ඉකුත් වූ පසුත් එනම් 2021 දෙසැම්බර් 31 දින වනවිට මුළු වෙන්කිරීමෙන් සියයට 52.5 ක් නියෝජනය වන එජඩො මිලියන 106 ක් උපයෝජනය කර නොතිබුණි. 2021 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට

අපොහොසත් වීම මත ලෝක බැංකුව ලබාදීමට එකඟ වූ එ.ජ.ඩො. මිලියන 202 ක ණය මුදලින් පිළිවෙලින් මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය (KMTT) ඉදිකිරීමට වෙන්කළ එ.ජ.ඩො. මිලියන 65 ක් සහ ව්‍යාපෘතිය අවසන් වන 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉතුරුම් (Expected Saving) ලෙස එ.ජ.ඩො. මිලියන 27 ක් ලෙස එකතුව එ.ජ.ඩො. මිලියන 92 ක් ඉවත් කර තිබුණි.

- ගාල්ල නගර ව්‍යාපෘති උපදේශන ආයතනය ලබා දුන් උපදේශන වාර්තාව අනුව ව්‍යාපෘතියේ මූලික අරමුණක් වූ ගාල්ල නගරයේ ජල ගැලීම් පාලනය හඳුනාගෙන තිබූ නමුත් එම ජල රැඳවුම් ප්‍රදේශවලට අයත් ඉඩම් කොටස් අත්කර ගැනීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විට අත්හිටුවා තිබූ අතර තෙත් බිම් කළමනාකරණ සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

- යාපනය නගරය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ රු. මිලියන 3,380.70 (ඇ.ඩො.මි. 19.66 ක) ක් වටිනා උප ව්‍යාපෘති 09 ක කටයුතු 2021 දෙසැම්බර් 31 වන විට අත්හිටුවා තිබීම හේතුවෙන් එම උප ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ ජල ද්‍රෝනියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩු කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම, කොළඹ නගරය අලංකාර කිරීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර 2021 වර්ෂයට ඉලක්කගත පහත කාර්යභාරය වෙනුවෙන් වෙන්කළ රු.මිලියන 10,954 ක මුදලින් රු.මිලියන 10,861 ක් (99%) වැයකර මෙතෙක් අවසන් නොකළ ව්‍යාපෘති සම්බන්ධව ලබාගත් ප්‍රගතිය වගුව 28 පරිදි විය.

අදාළ කාර්යය	ප්‍රගතිය %	
	භෞතික	මූල්‍ය
නොරිස් ඇලමාර්ගය වැඩිදියුණු කිරීම	85	68
මුතුරාජවෙල සහ ටොරින්ටන් ජල ප්‍රවාහන උමංමාර්ග සැලසුම් කිරීම හා ගොඩනැගීම	97	78
අඹතලේ පොම්පාගාරය වැඩිදියුණු කිරීම	100	81
කෝට්ටේ කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය සංවර්ධනය කිරීම	100	69
මාදිවෙල නැගෙනහිර කොටඨාශය වැඩි දියුණු කිරීම අදියර III	100	79
කොලොන්නාව ඇළ හැරවීමේ යෝජනා ක්‍රමය අදියර 4	100	86

ශාන්ත සෙබස්තියන් දකුණු බලාගාරය සැලසුම් කිරීම හා ස්ථාපනය කිරීම	100	87

වගුව 28 : මෙතෙක් අවසන් නොකල ව්‍යාපෘති සම්බන්ධව ලබාගත් ප්‍රගතිය

නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන බල ප්‍රදේශයන් සඳහා ආර්ථික, සමාජීය, පාරිසරික සහ භෞතික වශයෙන් ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස්කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත මගින් නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපනය කර තිබුණි. අධිකාරිය සතුව පරිපාලිත සමාගම් 04 ක් එනම් වෝටර්ස් එජ් සමාගම, නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම, පෑලියගොඩ වෙයාර් හවුස් සමාගම හා රෙස්ට් හවුසස් සමාගම පවතින අතර වෝටර්ස් එජ් සමාගමහි පරිපාලිත සමාගමක් ලෙස වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම පිහිටුවා තිබුණි. තවද ඕෂන් විව් සංවර්ධන සමාගම, කොළඹ ඉඩම් සංවර්ධන සමාගම, ඕනාලි හෝල්ඩින් සමාගම සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි පුද්ගලික සමාගම ලෙස ආශ්‍රිත සමාගම් 04 ක් ස්ථාපනය කර තිබුණි.

- 2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් නාගරික සංවර්ධනය සඳහා ලබාදී ඇති ඉඩම් විශාල ප්‍රමාණයක් පවරාගත් අරමුණට නොයොදවා වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන හෝ වර්ෂ ගණනාවකට පසු අවසතුකර තිබුණි. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

  - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ආදායම් උපයමින් පැවති අක්කර 812.63 (හෙක්ටයර් 320) යුත් මිල්ලෑව වතුයාය යෝජිත හොරණ කර්මාන්තපුරය පිහිටුවීම පිණිස අත්කරගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය 2016 දෙසැම්බර් 21 දිනැති අමාත්‍යය මණ්ඩල තීරණය මගින් ලබාදී 2017 ජුනි 14 දින අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් භුක්තිය භාරගෙන ඇත. උක්ත ව්‍යාපෘතියෙන් වන පරිසර බලපෑම පිළිබඳ කිසිදු ශක්‍යතා අධ්‍යනයක් කිරිමෙන් තොරව හා විකල්ප ඉඩම් පිළිබඳව සොයා බැලීමෙන් තොරව මිල්ලෑව වත්ත, හොරණ කර්මාන්තපුරය සංවර්ධනය සඳහා අත්පත් කරගෙන තිබු අතර ඉඩම අත්පත්කරගැනීම සඳහා පමණක් රු.මිලියන 1360 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරා තිබුණි. වර්තමානය වන විට උක්ත ඉඩම අත්පත් කරගනු ලැබු අරමුණට බැහැරව රජයේ නොයෙකුත් අවශ්‍යතා වෙනුවෙන් (බන්ධනාගාරය ප්‍රතිශ්ඨාපනය වැනි) යොදා ගනිමින් පැවතුනි.

  - ගාල්ල නගර සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.782 ක් වු පුද්ගලයින් කිහිප

දෙනෙකු පදිංචි වී හා ව්‍යාපාර කටයුතුවල නියැලී සිටින ලද දඩැල්ල ඉඩම, ඇලෝසියස් ජාතික පාසල් ක්‍රීඩාංගනය, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය හා ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා අත්පත්කරගැනීමට 2006 මැයි 30 දින සිට කටයුතු සිදුකර තිබුණ අතර එම කාර්යය සඳහා යොදා ගැනීමේ අරමුණින් ඉවත් කර ඉඩමේ කුඩා කොටසක ක්‍රීඩා සංකීර්ණයක් පමණක් 2020 සැප්තැම්බර් 26 දින වන විට ඉදිකිරීම සිදුකර තිබූ අතර ඉඩම අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා වන්දි මුදල් නිරවුල් කිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 281.57 ක් වන්දි හා පොලී වෙනුවෙන් ගෙවා තිබූ අතර වන්දි හා පොලී ගෙවීම් සඳහා 2016 දෙසැම්බර් 07 දින රු. මිලියන 400 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ගෙවීම් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබුණි.

- අධිකාරිය සතු කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතට මායිම්ව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 21.4 ක ඉඩම ප්‍රසිද්ධ මිල කැඳවීමෙන් තොරව අමාත්‍ය මණ්ඩල අනුමැතියට පෙර පුද්ගලික සමාගමක් වෙත බහුමහල් වාණිජ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම පිණිස භුක්තිය ලබාදී තිබුණ අතර පසුව අවබෝධතා ගිවිසුමක් යටතේ දී රු. මිලියන 1,300 කට දීර්ඝ කාලීන බදු පදනමට ඉඩම වසර 30 කට එකඟ වී තිබුණි. නමුත් කිසිඳු සංවර්ධන කටයුත්තක් සිදුනොකර එම ඉඩමෙහි රථගාලක් පවත්වා ආදායම් උපදවා තිබූ අතර ගිවිසුම් ප්‍රකාර උපයාගත් ආදායමින් අධිකාරියට ලැබිය යුතු ආදායම ලබාදී නොතිබියදී හා එකඟ වූ මිලියන 1,300 න් 2013 පෙබරවාරි 28 දින වන වට රු. මිලියන 557 ක් පමණක් අධිකාරියට ගෙවා තිබියදී මුල් සමාගමේ හිමිකරු සතු තවත් සමාගමක නමින් නැවත ගිවිසුම් ගතවි

එදිනට රජයේ තක්සේරුකරුගේ වටිනාකම වූ රු.මිලියන 3,352 ක් ගෙවීමට එකඟවී තිබුණි. එසේ තිබියදී අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතියකින් තොරව රජයේ තක්සේරු වටිනාකමට වඩා රු.මිලියන 330 ක් අඩුවෙන් බදුදීමට එකගවීම හේතුවෙන් මෙම ඉඩම බැහැර කිරීමේදී රු.මිලියන 330 ක අලාභයක් හා දීර්ඝකාලීනව ආදායම අහිමිවී තිබූ අතර වර්තමානය දක්වාම කිසිඳු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි.

– රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ පිහිටි ඉඩම් කොටස් 03 ක් මුල්‍ය හා පරිපාලන ආයතන ඇතුළත් නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 ඔක්තෝබර් 09 දින නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන තිබුණි. නමුත් මෙලෙස පවරාගනු ලැබූ ඉඩමෙන් අක්කර 02 රූඩ් 02 පර්චස් 01 ක ප්‍රමාණය 2015 පෙබරවාරි 02 හා 2016 නොවැම්බර් 18 දින සංවර්ධන කාර්යයක් නොකර මුල් හිමිකරුවන්ට නැවත අවසතුකර තිබූ අතර රූඩ් 01 පර්චස් 12 ක ඉඩම් ප්‍රමාණය කිසිඳු සංවර්ධන කාර්යයක් සඳහා යොදවා නොතිබුණි.

- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියෙහි උපව්‍යාපෘති 21 යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා රු.මිලියන 48,090 ක් වැය කරමින් නිවාස 13,580 ක් ඉදිකර 2013 වර්ෂයේ සිට 2021 දක්වා පවරා ඇති නමුත් නිවාස 12,875 ක් සඳහා 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 3(2) (ආ) වගන්ති ප්‍රකාරව අවශ්‍යතා සම්පූර්ණ කර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි සහතික ලබානොගැනීම හේතුවෙන් හා එම නිවාස වල අයිතිය පැවරිය නොහැකිවීම හේතුවෙන් නඩත්තු කටයුතු නිවාසලාභීන්ට හිමි නොවීම නිසා නඩත්තු වෙනුවෙන් අධිකාරියට රු.මිලියන 813.15 ක විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

- නාගරික සංවර්ධන අධිකාරි පනතේ ව්‍යාපෘතියක් වන කොළඹ නගරයේ පැල්පත් වාසීන්ට ස්ථිර නිවාස 68,000 ක් ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙලට අරමුදල් සපයා ගැනීමේ අරමුණින් අධිකාරිය විසින් 2010 ඔක්තෝබර් මාසයේදී රු.බිලියන 10 ක් වටිනා අවුරුදු 5 කින් නිදහස් කළ යුතු ණයකර නිකුත් කර තිබුණි. එම ණයකර නිදහස් කිරීම සඳහා ලංකා බැංකුවෙන් රු.බිලියන 11 ක ණය පහසුකමක් 2015 වර්ෂයේ ලබාගෙන තිබුණි. එම ණය ගෙවීමට මහාභාණ්ඩාරයෙන් 2017 වර්ෂයේදී රු.බිලියන 8.5 ක් ලබා ගෙන තිබුණි. එහෙත් ණයකර නිකුත්කර වර්ෂ 5 ක් ගතව තිබුණද එමගින් අපේක්‍ෂිත අරමුණු වූ කොළඹ නගරය තුළ ඇති ඉඩම් අක්කර 142 ක් සංවර්ධනය කිරීම සහ ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණු අතර යෝජිත නිවාස ඒකක 68,000 කින් නිවාස ඒකක 12,657 ක් ඉදිකර ඉන් 8407 ක් පමණක්

2019 දෙසැම්බර් 31 දින වන විට ජනතා අයිතියට පවරා තිබුණි. වර්තමානයේදී රු.බිලියන 25 ක ණයකර නිකුත් කිරීම සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි.

- මධ්‍ය ආදායම්ලාභී නිවාස ඒකක 608 කින් සමන්විත ඔවල් විව් නිවාස ව්‍යාපෘතියෙහි නිවාසලාභීන් විසින් රු. මිලියන 4,756.32 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා නිමකර තිබියදී සහ අංගොඩ ලේක් ක්‍රෙස්ට් නිවාස ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 816.3 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත නිවාස ලාභීන් විසින් ගෙවා නිමකර තිබියදීත් එම නිවැසියන් වෙත නීත්‍යානුකූල අයිතිය පැවරීම 2021 සැප්තැම්බර් දක්වාම සිදුකර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහාද ස්වාධිපත්‍ය අධිකාරි සහතිකයද මේ දක්වා ලබාගෙන නොතිබුණි.

- 2017 වසරේ කසල කන්ද නායයාමෙන් අනතුරුව මීතොටමුල්ල පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නාගරික උද්‍යානයක් ඉදිකිරීමට සැලසුම් කර එම කසල කන්ද ස්ථායීකරණය (trial compaction) සඳහා මීටර් 30 සිට මීටර් 12 දක්වා මට්ටම් කර බැලන්කට් ලේයරයක් යෙදීම හා හරිතාගාර වායු විමෝචන ඒකක ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 269.5 කට පෞද්ගලික ආයතනයක් වෙත 2020 ජූනි 09 දින ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 432.95 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබූ අතර 2020 නොවැම්බර් 25 දින වැඩ අවසන්ව භාරදීමේ සහතිකයද නිකුත් කර තිබුණද සැලසුම් කළ පරිදි උද්‍යානයක් ඉදිකර නොතිබුණි. තවද ස්ථායීකරණය කරන ලද කසල පිහිටි ස්ථානය වර්තමානය වන විට නිසි කළමනාකරණයකින් හා අධීක්ෂණයකින් තොරව පවතින අතර මෙම ස්ථානයේ ස්ථාපිත කර ඇති බැහැර වන අප ජලය ඇළමාර්ග වලට හා භූගත ජලයට එකතුවීම වැලැක්වීමට හා අඛණ්ඩ වායු විමෝචන මධ්‍යස්ථානය හරහා ගෑස් එකතුකිරීමේ පද්ධතියද වල් බිහිවී අතහැර දමා ඇති බව 2021 දෙසැම්බර් 23 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

වෝටර්ස් එජ් සමාගම

- වෝටර්ස් එජ් සමාගම විසින් තුන්වන පාර්ශවකරුවන් සමඟ ගිවිසුම්ගත වූ සංවර්ධන ව්‍යාපෘති දෙකක් වන සම්ප්‍රදායික නෘත්‍ය ශාලාවක් ඉදිකිරීම 2018 වර්ෂයේ නිමකළ නමුත් මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක නොවීම හා ළමා උද්‍යානයක් ඉදිකිරීමේ කටයුතු 2018 වර්ෂයේ අවසන් කළයුතු නමුත් 2020 දක්වා අවසන් නොවූ හෙයින් එම ව්‍යාපෘතිවලින් වාර්ෂිකව සමාගමට රු.මිලියන 43.2 ක ආදායමක් අහිමිවී තිබුණි.

- සමාගම් පරිශ්‍රය තුළ විනෝද උද්‍යානයක් ඉදිකිරීම, මූල්‍යනය, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වසර 18 ක කාලයක් සඳහා 2018 වර්ෂයේදී සමාගම විසින් දේශීයව සංස්ථාපනය කරන ලද විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම ක්‍රියාත්මක කරන දිනයේ පවතින විනිමය අනුපාතිකයන්, මධ්‍යම අනුපාතිකය වන රු.153.74 කට ගණනය කරන ලද ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 20000 ට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් වර්ෂයකට ගෙවීමේ පදනම මත දෙපාර්ශවය අතර ගිවිසුම්ගත වී තිබුණි. කෙසේ වුවද අදාළ කොන්ත්‍රාත්කාර සමාගම විසින් 2021 වර්ෂය අවසාන වන විටත් සමාගම වෙත ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 9956 ක් පමණක් ගෙවා තිබූ අතර අදාළ විනෝද උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි.

- සමාගමට නිත්‍යානුකූල හිමිකාරිත්වය ලැබී නොමැති ඇක්ලන්ඩ් හවුස් ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මූලික වියදම් ලෙස රු.මිලියන 11.46 ක් සමාගම විසින් දරා තිබූ අතර පසුව එම ව්‍යාපෘතිය නතරකර තිබුණි.

දරන ලද වියදම අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.

- 2018 වර්ෂයේ වාණිජමය අරමුණු පෙරදැරිව රුපියල් මිලියන 14.8 ක් වටිනා ඔකිඩ්පැල 16,000 ක් විදේශීයව හා තවත් ප්‍රමාණයක් දේශීයව මිලදීගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 68 ක් වැයකර තිබූ නමුත් නිසිපරිදි නඩත්තු කිරීමක් වර්තමානය වන විටද සිදු නොකර තිබූ අතර වර්තමානයේ වාණිජමය අරමුණින් බැහැරවී ආදායම් ඉපයීමක් සිදු නොවී තිබූ බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද 2020 වර්ෂය අවසානයට සංස්ථාව විසින් එලෙස ගැසට් කරන ලද පළාත් ගණන 06 කට සීමාවී තිබුණි. මායිම් ගැසට් කර තිබුණු එම ඉඩම් ප්‍රදේශවල සිදු වන අනවසර ගොඩකිරීම් හා අනවසර පදිංචිවීම් වැළැක්වීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඉහත පනතේ 8 (අ) වන වගන්තිය අනුව ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, සංස්ථාව විසින් ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් 2020 වර්ෂය අවසානයට වර්ෂ 24 ක කාලයක් ගතව තිබුණද ඉන් වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 400 ක් එනම්, සියයට 50 ක පහල අගයක් විය.

- සංස්ථාව විසින් 1996 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාළව ජල රැඳවුම් ප්‍රදේශ 9 ක් තුළ හෙක්ටයාර 400 ක සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 1,104 ක් හඳුනාගෙන තිබුණද එම හඳුනාගත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම සංස්ථාව අපොහොසත්ව තිබුණි.

- 1981 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සංස්ථාව විසින් පවරා ගත් ඉඩම්වලට අදාළ වන්දි මුදල් ගෙවීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩම් වෙනුවෙන් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 47.11 ක් වූ අතර ඊට අදාළව ගෙවිය යුතු පොළිය රු. මිලියන 109.29 ක් විය. ඒ අනුව 2020 වර්ෂය අවසානයට ගෙවිය යුතු වූ පොළිය ඉකුත් වර්ෂයට වඩා රු. මිලියන 1.84 කින් වැඩි වී තිබුණි. එමෙන්ම ඉඩම් පවරා ගැනීම සඳහා අවුරුදු 14 සිට අවුරුදු 39 දක්වා කාල පරාසයක් ගතවී තිබීම හේතුවෙන් මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන්ගේ

පදිංචිවීම වැඩි වී ඇති බව වැඩි දුරටත් අනාවරණය විය.

- සංස්ථාව 2010 ජූලි 14 දින නිකුත් කළ අංක 1662/17 දරණ ගැසට් නිවේදනය පරිදි බස්නාහිර පළාත තුළ පිහිටි ඇල මාර්ගවල රක්ෂිත ඉඩම් (Reservation) ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වුවද 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසානය දක්වා එම රක්ෂිත ඉඩම් හඳුනාගැනීමට හෝ රක්ෂිත ඉඩම්වල පදිංචි අනවසර පදංචිකරුවන් ඉවත් කිරීමට සාධනීය පියවර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

- ජල ගැලීම් පාලනයට ප්‍රධාන වශයෙන් දායකවන සහ ඉහළ ජෛව විවිධත්වයකින් සමන්විත මුතුරාජවෙල අභය භූමියට ආසන්නව පිහිටි ජා ඇල, දැලතුර “සුභද” මාවතේ පිහිටි හෙක්ටයාර 6 ක පමණ පහත් බිම් ප්‍රදේශය ගොඩ කිරීමට එරෙහිව 2006 අංක 35 දරන සංස්ථා පනතේ 2 වගන්තිය අනුව 2020 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

- සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර වසර 07 කට අධික කාලයක් ගතවී ඇති අතර ඒ සඳහා රු.මිලියන 2,387.6 ක් වැය කර තිබුණද එහි කටයුතු නිම වී නොතිබුණු අතර, එහි භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම බලපෑමට ලක්වූ පවුල් සඳහා සමාලෝචිත වර්ෂය තුළ නිවාස කුලී ලෙස රු. මිලියන 1.42 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

- මැදමුලන ඩී ඒ රාජපක්ෂ අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් තවදුරටත් අයවිය යුතු බවට අධිකරණය වෙත වාර්තා කළ හා සංස්ථාවේ ගිණුම්වල දැක්වුණු වටිනාකම අතර වෙනස වූ රු.මිලියන 47.37 ක මුදල එම ව්‍යාපෘතිය වෙනුවෙන් නොදැරූ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම අමතරව වැයකළ වියදම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමකින් තොරව හා මු.රෙ.113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව පොත්වලින් කපා හැරීමට සංස්ථාව විසින් කටයුතු කර තිබුණි.

- මුහුදු වැලි ඝන මීටර් 1,500,000 ක් ගොඩදැමීම සඳහා විදේශීය සමාගමක් සමඟ 2018 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබූ අතර එම කාර්යය ඉටුකරමින් පවතින අතරතුර 2020 පෙබරවාරි 20 දින විධිමත් අනුමැතියකින් තොරව වෙරළ සංරක්ෂණ ව්‍යාපෘතියක් වෙනුවෙන් මෙම යන්ත්‍රය නිදහස් කර තිබුණි. ඒ වන විට ගොඩදමා තිබුණේ වැලි ඝන මීටර් 465,154 ක් පමණක් වුවද ගිවිසුම්ගත කාලය අවසන් වීමට ප්‍රථම සංස්ථාව විසින් 2020 අප්‍රේල් 10 දින සිට ගිවිසුම අවසන් කිරීම

හේතුවෙන් අදාළ සමාගම ඉල්ලා තිබූ රු.බිලියන 2.96 ක මුදල ගෙවීම සඳහා සංස්ථාව වගකීමට බැඳී තිබුණි.

- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 4 දින තීරණය කර ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම වෙත රු. මිලියන 200 ක ණය මුදලක් 2019 මැයි 07 දින වන විට ලබාදී තිබුණු අතර මෙවැනි ඉහළ ප්‍රාග්ධන ආයෝජනයකින් යුතු ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කිසිදු ව්‍යාපෘති ඇගයීමක් හෝ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. සමාගම විසින් රු. මිලියන 382.50 ක වියදමක් දරා දිගු කාලීන වානිජ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බවට තීරණය කර වර්ෂ 2 කට පසු 2020 වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් අදාළ ඉඩම පෞද්ගලික ආයතනයක් වෙත දිගු කාලීන බදු පදනම මත ලබාදීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා සමාගම විසින් දරන ලද රු. මිලියන 382.50 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

- 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 13 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. එසේම පනතේ 10 වන වගන්තිය අනුව අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වන විට පත් කර තිබුණද 2021 වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණුවලට අදාළ කාර්යයන් හඳුනාගෙන නොතිබුණි.

- 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (1) (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට එම ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. සේවා ගාස්තු අයකිරීම නවතන අවස්ථාව වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කර ගෙන තිබූ රු. මිලියන 207.33 ක

සේවා ගාස්තු මුදල 2021 වර්ෂය අවසාන වන විටත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීමට අපොහොසත්ව තිබුණි.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන කිරීමේ සමාගම

- 2021 වර්ෂයේදී කෙරවල පිටිය මුහුදු වැලි සේදීමේ ව්‍යාපෘතිය මගින් රු.මිලියන 46.8 ක ආදායමක් අපේක්ෂා කර තිබුණි. ඒ අනුව මුහුදු වැලි සෝදා සංස්ථාවට සැපයීමේ ව්‍යාපෘතියෙන් 2021 වර්ෂයේදී වැලි කියුබ් 36,000 ක නිෂ්පාදනයක් සැපයීම සඳහා සැලසුම් කර තිබුණද සත්‍ය වශයෙන්ම නිෂ්පාදනය කර තිබුණේ කියුබ් 24,729 ක ප්‍රමාණයකි. එමෙන්ම සමාගම මෙම ව්‍යාපෘතියෙන් 2021 වර්ෂයේදී සත්‍ය වශයෙන් ලැබූ ආදායම රු. මිලියන 32.10 ක් පමණක් වුයෙන් එය අපේක්ෂිත ආදායමෙන් සියයට 68 ක් විය. එසේම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය බැකෝ යන්ත්‍ර හා ටිපර් රථ කුලී පදනම මත ලබා ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් රු.මිලියන 4.48 ක් දරා ඇති අතර එය මුළු ආදායමින් සියයට 15 ක් පමණ විය.

- සමාගමේ මව් ආයතනය වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 04 දින තිරණය කර ඒ සඳහා රු. මිලියන 200 ක ණය මුදලක් සමාගම වෙත ලබාදී එම ණය මුදලද ඇතුළුව සමාගම විසින් රු. මිලියන 382.50 ක වියදමක් දරා දිගු කාලීන වානිජ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ ඉහත ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බවට තීරණය කර වර්ෂ 2 කට පසු 2020 වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් අදාළ ඉඩම පෞද්ගලික ආයතනයක් වෙත දිගු කාලීන බදු පදනම මත ලබාදීමට කටයුතු කර තිබුණු අතර ඒ අනුව ව්‍යාපෘතිය සඳහා සමාගම විසින් දරන ලද රු. මිලියන 382.50 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර එම වර්ෂය තුළම නිවාස ඒකක 12,500 කින් සමන්විත ව්‍යාපෘති 500 ක් ඉදිකිරීමට සැළසුම් කර තිබුණද, 2021 වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් අවසන් කර තිබුණේ ගම්මාන 368 ක් පමණක් වූ අතර ඉදිකර තිබූ නිවාස සංඛ්‍යාව 10,159 ක් විය. ඒ වෙනුවෙන් වැය කර තිබූ මුදල රු.මිලියන 4,798 කි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේදී වෙන්කර තිබූ මුදල රු.මිලියන 176.4 ක් වුවද ඉන් දිස්ත්‍රික්ක 07 කට වෙන්කර තිබූ රු.මිලියන 84.3 කින් රු.මිලියන 47 ක් පමණක් වැයකර තිබුණි. තවද ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ ආදර්ශ ගම්මාන 44 ක නිවාස ඒකක 957 ක ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණි.

අපේක්ෂිත ඉලක්කයට ළඟා නොවූ / ක්‍රියාත්මක කර නොතිබූ නිවාස ව්‍යාපෘති

- 2021 වර්ෂයේදී මිහිඳු නිවාස වැඩ සටහන සඳහා රු.මිලියන 750 ක වියදමින් නිවාස ඒකක 2,000 ක වැඩ ආරම්භ කිරීමට සහ නිවාස ඒකක 500 ක වැඩ නිම කිරීමට සැළසුම් කර තිබුණද නිවාස ඒකක 1,242 ක වැඩ ආරම්භ කර නොතිබුණු අතර නිවාස ඒකක 299 ක වැඩ නිමකර නොතිබුණි. තවද, රු.මිලියන 587.86 ක් විරු සුමිතුරු නිවාස, පාස්කු ප්‍රහාරයට ලක්වූ පවුල් සඳහා නිවාස, සෙවන නිවාස ආධාර යන ව්‍යාපෘතීන් යටතේ වූ නිවාස ඒකක 1,245 ක වැඩ නිම කිරීම සඳහා වෙන්කර තිබුණද කිසිඳු ඉදිකිරීම් කටයුත්තක් සිදුකර නොතිබුණි.

- පැරණි නිවාස සංකීර්ණවල අලුත්වැඩියා සහ නිවාස වන්දි ලබාදීම සඳහා රු.මිලියන 110 ක් 2021 වර්ෂයේදී වෙන්කර තිබුණද එම ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි. මීට අමතරව 2016 සිට 2019 දක්වා ක්‍රියාත්මක කර තිබූ වෙනත් නිවාස ණය සහ ආධාර වැඩසටහන් 13 කට අදාළව නිවාස ඉදිකිරීමට වැඩ ආරම්භ කර තිබූ නිවාස ඒකක 150,770 ක් අතුරින් ඉදිකිරීම් අවසන් කළ නිවාස ඒකක සංඛ්‍යාව 55,225 ක් පමණක් වූ අතර මෙම වැඩසටහන් යටතේ වැඩ ආරම්භ කළ නිවාස ඒකක 4,987 ක ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි.

මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති

2004 සහ 2005 යන වර්ෂවලදී පිළිවෙලින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු නාවල පරංගියා කුඹුර නැමති අක්කර 05 පර්චස් 10ක ඉඩමේ සහ කොළඹ 10 ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 පර්චස් 26.5 ක ඉඩමේ නිවාස සහ වෙළඳ සංකීර්ණ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති 02 ක් ලෙස ඉදිකිරීමට පෞද්ගලික අංශයේ ආයතන සමඟ ගිවිසුම් ගතවී තිබුණි. 2022 සැප්තැම්බර් වන විටත් එම ව්‍යාපෘති කාර්යයන් ඉටු නොවී පැවති අතර එම ආයතන විසින් එම ඉඩම් බැංකුවලට උගස්කර මුදල් උපයා තිබූ බැවින් අධිකාරියට එම ඉඩම්වල අයිතිය නැවත පවරා ගැනීමට නීතිමය කටයුතු වලට යොමුවීමට සිදුවී තිබුණි.

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

- පනතේ 09 (අ)(1) වගන්තියට අනුව සහාධිපත්‍ය දේපලක් තුළ අනවසර ඉදිකිරීම් පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අවස්ථාවෝචිතව ක්‍රියා කළ යුතු වුවත් 2013 සිට 2021 දක්වා ලැබී තිබූ පැමිණිලි 16 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු සිදුකර නොතිබුණි.

- සහාධිපත්‍ය දේපලක කොටසක් ගනු ලැබූ ගැණුම්කරුවෙකු විසින් පොදු පහසුකම් සම්බන්ධයෙන් සිදුකරනු ලබන ලිඛිත පැමිණිල්ලක් සම්බන්ධයෙන් පනතේ 9 (ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළහැකි වුවත් ලැබුණු පැමිණිලි 75 ක්

සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

- 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 (ඉ) අනුව සහාධිපත්‍ය දේපල සඳහා පිහිටවනු ලබන කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම අධිකාරිය විසින් සිදුකළ යුතු වුවත් අධිකාරිය යටතේ 2020 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සංස්ථා 1,079 ස්ථාපිත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය 951 දක්වා අඩුවී තිබුණි. එම 951 කින් ද 557 ක් ක්‍රියාකාරී නොවන මට්ටමක පැවති අතර ඒ අනුව අධිකාරිය නිසි පරිදි නියාමනයන් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

- සහාධිපත්‍ය දේපල නීතිය යටතේ වූ 1982 අංක 45 දරන බද්ධ නිවාස (සංශෝධන) පනතේ වූ ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛන එකතු කිරීම යටතේ 3 (2) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සංස්ථා වල වාර්ෂික මහාසභා රැස්වීම් පැවැත්විය යුතු අතර එහි 8 (4) (අ) අනුව සංස්ථාවේ විගණනය කළ වාර්ෂික ගිණුම් වාර්තා වල පිටපතක් අධිකාරියට ඉදිරිපත් කළ යුතුවේ. නමුත් කළමනාකරණ සංස්ථා 101 ක වාර්ෂික මහා සභා රැස්වීම් මාස 15 සිට මාස 37 දක්වා කාලයක් ගතවී ඇතත් පවත්වා නොතිබුණි. තවද විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමක් සහ අධීක්ෂණයක් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

- 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 07 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කර 2022 ජනවාරි 31 දින වන විට අවසන් කළ යුතු අතර 2021 වර්ෂයේදී භෞතික සැළසුම් කටයුතු සඳහා රු.1,240,938 ක් වැයකර තිබුණි. නමුත් 2022 මාර්තු 31 වන විටත් එය අවසන් කර නොතිබුණි.

- අනුරාධපුර පූජා භූමිය තුළ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේ සිට 2021 දක්වා එකතුව රු.මිලියන 634.7 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර 2021 වර්ෂය වන විට රු.මිලියන 13.41 ක් එනම් සියයට 2.1 ක් පමණක් වසර 05 ක් තුළ වියදම් කර ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම, ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම සහ ඉඩමේ මායිම සලකුණු කිරීම පමණක් සිදුකර තිබුණි. පූජා භූමිය ආශ්‍රිත පදිංචිකරුවන් ලෝලුගස්වැව නගරයට සංක්‍රමණය කරවීම සම්බන්ධයෙන් පැවති සමාජීය ගැටළු පිළිබඳ අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

- **නැගෙනහිර, ඌව, උතුරු යන පළාත්වල කලාපීය භෞතික සැළසුම් 03 ක් සකස් කිරීමට 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද මෙම සැලසුම් සකස් කර නොතිබුණි. ඊට අමතරව ප්‍රාදේශීය ආයතන විසින් සැකසීමට ලබාදුන් භෞතික සැලසුම් (කුඩා නගර හෝ සේවා මධ්‍යස්ථාන) 20 කින් 13 ක සැලසුම් සකස් කිරීම වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.**

පළාත් සභා පිළිබඳ හැඳින්වීම

පළාත් සභා පිළිබඳ හැඳින්වීම

1987 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 154 අ (1) ව්‍යවස්ථාව මඟින් පළාත් සභා පිහිටුවා තිබේ. පළාත් සභා ගණනින් 09 කි. එනම් බස්නාහිර, වයඹ, ඌව, සබරගමුව, මධ්‍යම, නැගෙනහිර, දකුණ, උතුරු මැද, උතුර වශයෙන් වේ.

පළාත් සභාවක් ආණ්ඩුකාරවරයාගේ පාලනය යටතේ පවතින අතර ප්‍රධාන ලේකම්වරයෙකු පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කරනු ලබයි. ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයෙකු කටයුතු කරනු ලබන අතර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 05 දෙනෙකුගෙන් පළාත් සභාවක් සමන්විත වේ.

පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පළාත් සභා රජයේ සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා 1987 අංක 42 දරණ පළාත් සභා පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ. දැනට පවතින පළාත් සභා 09 හි නිල කාලය අවසන්ව ඇති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඉ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එම සභා විසිර ගියා සේ සලකනු ලැබ ඇත. ඒ අනුව " සභාව " නොමැතිව මතු දැක්වෙන දිනවල සිට 1989 අංක 12 දරණ පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 (1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එක් එක් පළාත් සභාවේ ආණ්ඩුකාරවරු විසින් පළාත් සභා පවත්වාගෙන එමින් තිබේ. එක් එක් පළාතේ පැවති අවසන් " පළාත් සභාව " ආරම්භ කළ සහ එහි නිල කාලය අවසන් වූ දින පහත දැක්වේ.

පළාත් සභාව	අන්තිම සභාවේ ආරම්භක දිනය	අන්තිම සභාව අවසන් වූ දිනය
බස්නාහිර	2014.04.22	2019.04.21
වයඹ	2013.10.11	2018.10.10
ඌව	2014.10.09	2019.10.08
සබරගමුව	2012.09.27	2017.09.26
මධ්‍යම	2013.10.09	2018.10.08
නැගෙනහිර	2012.10.01	2017.09.30
දකුණ	2014.04.11	2019.04.10
උතුරු මැද	2012.10.02	2017.10.01
උතුර	2013.10.25	2018.10.23

සෑම පළාත් සභාවක් විසින්ම සභාවේ අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 (1) වගන්තිය ප්‍රකාරව එම ගිණුම් විගණනය විගණකාධිපති විසින් කළ යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පළාත් සභා විසින් උපචිත පදනම, මුදල් පදනම හෝ

වැඩිදියුණු කරන ලද මුදල් පදනම වැනි එකිනෙකට වෙනස් පදනම් භාවිතා කර තිබුණු බවද නිරීක්ෂණය විය. තවද ඇතැම් පළාත් සභා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුවත් ඇතැම් පළාත් සභා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුවත් මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සංසන්දනාත්මකව භාවිතා කිරීමේ හැකියාවක් නොතිබුණි.

පළාත් සභාවක ආදායම ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රදාන, බදු ආදායම හා බදු නොවන ආදායම වැනි විවිධ ප්‍රභවයන්ගෙන් සමන්විත වේ. 2021 වර්ෂයේ පළාත් සභා 09 හි මුළු ආදායම රු. මිලියන 383,222 ක් වූ අතර එය 2020 වර්ෂයේ පළාත් සභා 09 හි මුළු ආදායම වූ රු. මිලියන 346,561 ට වඩා සියයට 11 ක වැඩිවීමකි. එසේම, 2021 වර්ෂයේ පළාත් සභා 09 හි මුළු වියදම රු. මිලියන 361,937 ක් වූ අතර එය 2020 වර්ෂයේ පළාත් සභා 09 හි මුළු වියදම වූ රු. මිලියන 335,001 ට වඩා සියයට 8 ක වැඩිවීමකි.

2021 වර්ෂයේදී පළාත් සභා 09 සඳහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 310,852 ක් ලබාදී තිබුණු අතර එය 2020 වර්ෂයේ ලබාදී තිබුණු රු. මිලියන 284,395 ට වඩා සියයට 9 ක වැඩිවීමකි. එසේම පළාත් සභාවල වියදමෙන් සියයට 85 ක් සඳහාම දායකත්වය ලැබී තිබුණේ භාණ්ඩාගාර ප්‍රදාන වලිනි.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභා සතුව තිබූ රු.මිලියන 247,355 ක් වූ මුළු ජංගම නොවන වත්කම්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 316,256 ක්ව පැවති බව මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය වේ.

බස්නාහිර පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- ඌන උපයෝජිත වත්කම්
- අවිධිමත් ගනුදෙනු
- ආර්ථික නොවූ ගනුදෙනු
- මානව සම්පත් කළමනාකරණය

බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රු. මිලියන 54,478 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 8,377 ක්ද, රජයේ ආදායම් මාරු කිරීම් මගින් රු. මිලියන 6,720 ක් සහ මුද්දර හා උසාවි දඩ ලැබීම් රු. මිලියන 18,200 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 87,775 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 79,497 ක්ද, මූලධන වියදම් සඳහා රු. මිලියන 8,278 ක්ද, වශයෙන් එකතුව රු. මිලියන 87,775 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2021 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 48,965 ක්ද, අභ්‍යන්තර මාර්ග මගින් රු. මිලියන 33,287ක්ද, වශයෙන් එකතුව රු. මිලියන 82,252 ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්තන වියදම රු. මිලියන 66,424 ක් හා මූලධන වියදම රු.මිලියන 4,178 ක් වශයෙන් රු. මිලියන 70,602 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම පිළිබඳ විස්තර රූපසටහන 63 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන	69,135	76,984	81,281	82,058	87,775
තථ්‍ය ආදායම රු. මිලියන	62,584	68,132	66,530	71,471	82,252
ඇස්තමේන්තුගත වියදම රු. මිලියන	69,135	76,984	81,281	82,058	87,775
තථ්‍ය වියදම රු. මිලියන	62,181	69,454	68,971	70,300	70,602

රූපසටහන 63 : ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම

මූලාශ්‍රය - බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

බස්නාහිර පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ඌන උපයෝජිත වත්කම්

- බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති යටතේ මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපලට හඳුන්වාදීමේ ව්‍යාපෘතියට අදාළ ටින් මාළු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා 2020 හා 2021 වර්ෂවලදී රු.මිලියන 19.42 ක් වැයකර තිබුණි.

  මෙම ව්‍යාපෘතියට අදාළ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා නියමිත වල්පිට පුහුණු මධ්‍යස්ථාන භූමියේ ඉදිකරමින් පැවති ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2022 ජූනි 30 දින වනවිටත් අවසන් කර නොතිබුණි. නමුත් එම ගොඩනැගිල්ලේ සවි කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ 2020 දෙසැම්බර් මාසයේදී මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. එම මිලදීගෙන තිබුණු යන්ත්‍ර හා උපකරණ, එම පුහුණු මධ්‍යස්ථානයේ එළිමහනේ 2022 ජනවාරි මාසය වනතෙක් අනාරක්ෂිතව පැවතුණි. තවද මෙම යන්ත්‍ර හා උපකරණවල වගකීම් කාලයද ඉක්මයමින් පැවති අතර දීර්ඝ කාලයක් අනාරක්ෂිත ස්ථානයක භාවිතයට නොගෙන තිබීම හේතුවෙන් යන්ත්‍රවල මලබැඳී තිබූ අතර ඒවායේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් හා අවධානමක් ඇතිවීමේ ඉඩකඩක් පැවතුණි.

- පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් හා රජයට සම්බන්ධ ආයතන මඟින් 1990 වර්ෂයේ සිට අධිකාරියට පවරා ඇති විවිධ ස්ථානවල පිහිටි මුල් පැවරුම් වටිනාකමක් නොමැති පර්චස් 1,698.3 ක ඉඩම් කොටස් 17 ක් අධිකාරිය විසින් ඵලදායී ලෙස භාවිතා කිරීමට, නියාමනය කිරීමට හෝ අධිකාරියට ප්‍රයෝජනවත් නොවන ඉඩම් නැවත පැවරුම් ආයතනවලට පවරා දීමට කටයුතු කර නොතිබූ අතර එයින් අනවසර පදිංචිකරුවන් පරිහරණය කරමින් තිබූ පර්චස් 1,173.1 ක් වූ ඉඩම් කොටස් 12 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- පළාත් පාලන කොමසාරිස් ව්‍යාපෘති බලධාරියා වූ අංක N207183144502 දරන හොරණ මාවක්ඔය පහසුකම් මධ්‍යස්ථානය හා හෙළ බොජුන්හළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 2.13 ක් වැයකර තිබුණි. නමුත් 2022 ජූනි 30 දින වනවිටත් හෙළ බොජුන්හලේ ව්‍යාපාරික කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

අවිධිමත් ගනුදෙනු

2018 ජූලි 18 දින හා අංක 03/2018 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව, සිය ආයතනවල කාර්ය මණ්ඩල වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැලකිය යුතු වන අතර එකී උපදෙස්වලට අනුගතව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවන්හි දී ඒ සම්බන්ධයෙන් වන වගකීම ප්‍රධාන ලේකම්වරයා දැරිය යුතු බව දන්වා තිබුණද එයට පටහැනි ලෙස 2004 අගෝස්තු 01 දින සිට බස්නාහිර පළාත් සභා ලේකම් කාර්යාලයේ නිළධාරීන්ට වැටුපට අමතරව 1/3 ක දීමනාවක් ගෙවා තිබුණි. 2020 සිට 2021 වර්ෂයේ ජූලි දක්වා ගෙවා තිබුණු දීමනාවේ වටිනාකම රු.මිලියන 5.11 කි. තවද, 2019 මාර්තු 29 වන දිනැති අංක PS/PCMD/SD/01/08 දරණ සියළුම ආණ්ඩුකාරවරු ඇමතූ ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි, පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා තීරණය කිරිමේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබියදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමකින් තොරව ඉහත දීමනා ගෙවා තිබුණි.

ආර්ථික නොවූ ගනුදෙනු

- ඉංජිනේරු කාර්යාංශය විසින් ලේඛන කළමනාකරණ පද්ධතියක් සැකසීම සහ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2018 දෙසැම්බර් 28 දින රු.මිලියන 7.5 ක් හා 2021 දෙසැම්බර් 31 දින රු.මිලියන 6.42 ක් වශයෙන් එකතුව රු.මිලියන 13.92 ක් බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය වෙත ගෙවා තිබුණි. 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ලේඛන කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම 2022 ජූනි 30 දිනටත් අවසන් කර නොතිබුණු අතර ලේඛන කළමනාකරණ පද්ධතිය මඟින් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමේ කිසිඳු භෞතික ප්‍රගතියක් කාර්යාංශය අත්පත් කරගෙන නොතිබුණි.

- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 8.63 ක් වැයකර ව්‍යාපාර ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා මෘදුකාංගයක් 2020 ජූනි 16 දින මිලදී ගෙන තිබුණි. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මෘදුකාංගයට තොරතුරු ඇතුළත් කිරීමට ප්‍රවේශ වීමේ පහසුකම ලබා දී නොතිබීම හේතුවෙන් හා බස්නාහිර පළාත තුළ දැනට ලියාපදිංචි වී ඇති ව්‍යාපාර ආයතන පිළිබඳ තොරතුරු ඇතුළත් නොකිරීම හේතුවෙන් 2022 ජූනි 30 දින වනවිටත් මෘදුකාංගය මිලදීගැනීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

මානව සම්පත් කළමනාකරණය

බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ ව්‍යාපෘති හා කාර්යයන් සඳහා අනුමත කාර්ය මණ්ඩලය **346** ක් විය. නමුත් මෙම කාර්ය මණ්ඩලයට අමතරව තදුචිත පදනම යටතේ සේවකයින් **396** ක් හා කොන්ත්‍රාත් පදනම යටතේ **160** ක් වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් **556** ක් සේවයේ යොදවාගෙන තිබුණු අතර මිනිස්බල සැලැස්මක් සකස්කර එයට අනුව කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට **2022** ජුනි **30** දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

මධ්‍යම පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- මූල්‍ය ප්‍රතිඵල
- පළාත් සංවර්ධනය
- වැඩිපුර ගෙවූ දීමනා
- ණය ශේෂය නිරවුල් නොකිරීම
- සාවද්‍ය ගෙවීම්
- පාඩු හා අලාභහානි
- මතභේදයට තුඩුදෙන ගනුදෙනු
- නිෂ්කාර්ය/ ඌන උපයෝජිත වත්කම්
- ප්‍රසම්පාදනය
- අභ්‍යන්තර විගණනය
- නොවිසඳී ඇති විගණන ඡේද

මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන වශයෙන් රු.මිලියන 42,070 ක්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 5,951 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 48,021 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2021 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 43,175 ක්ද, මූලධන වියදම් වශයෙන් රු.මිලියන 6,885 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 50,060 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද 2021 වර්ෂයේ දී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 40,906 ක්ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 4,905 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 45,811 ක ආදායමක් රැස්කර තිබුණි. 2021 වර්ෂයේ දී පුනරාවර්තන වියදම රු.මිලියන 41,676 ක් හා මූලධන වියදම රු.මිලියන 3,527 ක් වශයෙන් රු.මිලියන 45,203 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර රූපසටහන 64 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම	40,620	42,610	46,256	43,403	48,021
තථ්‍ය ආදායම	35,538	37,664	40,066	42,304	45,811
ඇස්තමේන්තුගත වියදම	38,972	42,918	46,335	44,281	50,060
තථ්‍ය වියදම	35,519	36,941	40,312	42,538	45,203

රූපසටහන 64 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම

මූලාශ්‍රය - මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

මධ්‍යම පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.මිලියන 40,297 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.මිලියන 38,096 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 2,201 ක පිරිහීමක් පැවතුණි.

2021 වර්ෂය සඳහා මධ්‍යම පළාත් සභාවේ රු.මිලියන 45,811 ක මුළු ආදායමෙන් රු.මිලියන 40,906 ක් රජයේ ප්‍රදාන වූ අතර රු.මිලියන 45,203 ක මුළු වියදමින් ප්‍රාග්ධන වියදම රු.මිලියන 3,526 ක් විය.

පළාත් සංවර්ධනය

- මධ්‍යම පළාත් සංවර්ධන සැලැස්මට අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2,962 ක වැඩ යෝජනා 1783 කින් රු.මිලියන 16.31 ක් වූ නව වැඩ යෝජනා 08 ක් ආරම්භ කර නොතිබුණු අතර ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 166.37 ක වූ නව වැඩ යෝජනා 29 ක ප්‍රගතිය සියයට 50 කට අඩුවෙන් පැවතුණි. ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 273.26 ක් වූ සම්පූර්ණයෙන් වැඩ නිම නොවූ, “සියයට 50 කට වැඩියෙන් නිමකළ” වශයෙන් දක්වා ඇති වැඩ යෝජනා ගණන 54 ක් විය.

- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2021 වර්ෂයේදී පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව බෙදාහරින ලද උපකරණ හා ද්‍රව්‍ය වෙනුවෙන් ප්‍රතිලාභීන්ගෙන් අයකරගත යුතු රු.මිලියන 2.88 ක මුදලක් 2022 මැයි 26 දින වනවිට ද ප්‍රතිලාභීන්ගෙන් අයකරගෙන නොතිබුණි.

වැඩිපුර ගෙවූ දීමනා

- 2006 දෙසැම්බර් 05 දිනැති අංක NSCC/3/01 Allowances දරණ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සම සභාපතිවරයාගේ ලිපිය අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ සාමාජික මහතුන්ගේ මාසික දීමනාව පිළිවෙලින් රු.15,000 ක් සහ රු.10,000 ක් විය. පළාත් ප්‍රධාන ලේකම්වරුන්ද අමතන ලද භාණ්ඩාගාර, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (i) ආ සහ (ii) ඡේදයන්ට අනුකූලව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව ආණ්ඩුකාර අනුමැතිය මත 2021 වර්ෂය සඳහා පමණක් සභාපතිවරයාට සහ සාමාජික මහත්ම මහත්මීන්ට රු.මිලියන 1.28 ක මාසික දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

- සභා ලේකම් කාර්යාලයේ සභාපතිවරයාට ලබාදී තිබුණු වාහන දෙකෙන් එක් වාහනයක් 2018 මාර්තු 21 දින කාර්මික දෝෂයකට ලක්වීමෙන් අනතුරුව 2018 ජූනි 04 දින සිට සුදුසු වාහනයක් ලබාදෙන තෙක් රු.95,000 ක මාසික දීමනාවක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් ගෙවා තිබුණි. 2018 ජූනි 05 දින ප්‍රධාන ලේකම් විසින් වාහනයක් සභාපතිවරයා වෙත අනුයුක්ත කළ හැකි බව දන්වා තිබුණු අතර, 2020 ජනවාරි 24 වන දින ආණ්ඩුකාර ලේකම් විසින් ජීප් රථය අළුත්වැඩියාව කර සභාපතිවරයා වෙත අනුයුක්ත කරන ලෙස සභා ලේකම්ට දන්වා තිබුණි. එමෙන්ම 2020 ජූනි 01 දින ප්‍රධාන ලේකම් විසින් ජීප් රථය අළුත්වැඩියා කරන තුරු කැබ් රථයක් සභාපතිවරයාට අනුයුක්ත කරන ලෙස ආණ්ඩුකාර ලේකම්ට ද දන්වා තිබුණි. එහෙත් මෙම විකල්ප අවස්ථාවන් කිසිවක් පිළිබඳ නොසලකා 2018 අගෝස්තු මස සිට 2021 නොවැම්බර් මස දක්වා මසකට රු.95,000 බැගින් රු.මිලියන 3.8 ක මුදලක් වාහන දීමනා වශයෙන් සභාපතිවරයා වෙත ගෙවා තිබුණි.

ණය ශේෂය නිරවුල් නොකිරිම

- 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් මාස 03 කට පසුව නොපෙන්වන ලෙසට නිරවුල් කරගෙන තිබිය යුතු ලෙස දන්වා තිබුණ ද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම පළාත් සභාව තුළ හා ඉන් බැහැර වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 422 ක ගේ එකතුව රු.මිලියන 21.12 ක ණය ශේෂ මාස 03 සිට වසර 05 කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි.

- 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ මාස 02 කට පසුව නොපෙන්වන ලෙසට නිරවුල් කර තිබිය යුතු බව දන්වා තිබුණි. එහෙත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම පළාත් සභාව තුළ හා ඉන් බැහැර වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතනවලින් ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 345 ක ගේ ණය ශේෂ එකතුව රු.මිලියන 20.33 ක් මාස 03 සිට වසර 05 කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි.

සාවද්‍ය ගෙවීම්

- හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලයේ වැටුප් සකස් කිරීමේ කාර්යයෙහි නිරතව සිටි නිලධාරියා විසින් ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුම් 06 කට රු.මිලියන 8.14 ක්, ඔහුගේ භාර්යාවගේ බැංකු ගිණුම් 02 කට රු.මිලියන 1.88 ක්, ගිණුම් අංශයේ කාර්යාල කාර්ය සහායකගේ බැංකු ගිණුමකට රු.මිලියන 0.79 ක් සහ හඳුනානොගත් බැංකු ගිණුම් 21 කට රු.මිලියන 2.53 ක් ලෙස එකතුව

රු.මිලියන 13.34 ක මුදලක් අඛණ්ඩව වසර 10 ක කාලසීමාවක් තුළදී දේපල ණය අවකරණ හා ශේෂ වැටුප් උපයෝගී කරගෙන හඟුරන්කෙත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ මහජන බැංකුවේ පළාත් සභා ජංගම ගිණුම මගින් අයථා ලෙස පරිහරණය කර තිබුණි. මෙම මුදලින් 2022 සැප්තැම්බර් 07 දින වන විට රු.මිලියන 2.8 ක මුදලක් තව දුරටත් අයකර ගැනීමට තිබුණි.

- 2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් අංශයේ රාජකාරී කරන නිලධාරීන් දෙදෙනෙකු විසින් වැටුප් ගෙවීමේ දී, ඔවුන්ගේ හා සමීපතමයින්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු.මිලියන 51.96 ක් සහ බැංකු ගිණුම් අංක මගින් තහවුරු නොවන රු.මිලියන 1.07 ක් වශයෙන් රු.මිලියන 53.03 ක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කර තිබුණි. වැටුප් කට්ටලවලට අදාළ ලිපි ගොණු හා ලේඛන, පරිගණක මෘදුකාංග උපස්ථිත (Backup) විධිමත්ව හා සම්පූර්ණව ඉදිරිපත් නොකිරීම සහ මුරපද අමතක වීම, තාක්ෂණ දෝෂයන් පැවතීම හේතුවෙන් පරිගණක 02ක උපස්ථිත (Backup) වලට ප්‍රවේශ වීමට නොහැකිවීම නිසා එම කාල සීමාවට අදාළව වංචා කර ඇති සම්පූර්ණ මුදල නිශ්චිතව හඳුනා ගැනීම ගැටළු සහගත විය.

පාඩු හා අලාභහානි

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට වසර 5 සිට වසර 10 අතර සහ වසර 10 කට වැඩි සිද්ධීන් 90 ක එකතුව රු.මිලියන7.71 ක් විය.

- ඖෂධ අවශ්‍යතාවය හඳුනාගෙන ඇණවුම් කිරීමට කටයුතු නොකිරීමෙන් වූ ඖෂධ අතිරික්තය, අවශ්‍යතාවය සහිත රෝහල් හඳුනාගෙන බෙදාහැරීමට හෝ වෛද්‍ය සැපයුම් අංශය අමතා යැවීමට හෝ කටයුතු නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහනුවර වෛද්‍ය සැපයුම් අංශයේ, මහනුවර ළය රොහලේ හා මාතලේ මහ රෝහලේ රු.මිලියන 15.41 ක ඖෂධ තොග කල් ඉකුත් වී තිබුණු අතර ඉන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වී වසර 03 සිට වසර 14 ක කාලපරාසයක් ගත වී තිබුණි. එමෙන්ම ඉහත ආයතනවල කල් ඉකුත් වීමට ආසන්න රු.මිලියන 10.43 ක ඖෂධ ද පවතින බව නිරීක්ෂණය විය.

- මධ්‍යම පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහන අනතුරු 65 කට අදාළව එකතුව රු.මිලියන 32.53 ක අලාභ හානිය සම්බන්ධයෙන්, අනතුරු සිදු වී වසර 01 සිට වසර 15 අතර කාලයක් ඉක්ම ගොස්

තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාගේ සහ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් 2009 ජූනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(i) අනුව ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කිරීම් තබා ගැනීමට හෝ 2021 ඔක්තෝබර් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(v) හි 07 ඡේදය අනුව පැමිණීමේ හෝ පිටවීමේ ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ දී පෞද්ගලික කාර්යමණ්ඩලයේ සේවකයන් 22 දෙනෙකුට රු.මිලියන 9.25 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි.

නිෂ්කාර්ය/ ඌන උපයෝජිත වත්කම්

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පරිහරණය කරන මැස්ඩා වෑන් රථය අලුත්වැඩියාව සඳහා රු.මිලියන 1.01 ක පිරිවැයක් දැරීමට සිදුවීම මත ගර්හිත වාහනයක් ලෙස සලකා කටයුතු කර තිබුණු අතර එය අපහරණය නොකර වසර 03 කට ආසන්න කාලයක් කාර්යාල භූමියේ රඳවා තිබුණි.

- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් හඳුනාගෙන ඊට අවශ්‍ය තීරණය කරන ලද උපකරණ මිලදී ගැනීමට හා එම ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කළයුතු වුවද එසේ නොකර මිලදී ගෙන තිබුණු රු.මිලියන 14.61 ක උපකරණ, 2022 මාර්තු 04 විගණිත දින වන විට දින 63 සිට වසර 04 යි මාස 08 ක කාලයක් මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ගබඩාවේ රඳවාගෙන තිබුණි.

- මප/කොත්/රතනසාර විද්‍යාල පරිශ්‍රය තුළ රු.මිලියන 6.99 ක වියදමින් 2017 ජූනි 30 දින වැඩ නිමකරන ලද කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල විගණිත දින වන 2021 ජුලි 29 දක්වාම ඌන උපයෝජිතව පැවතුණි.

- 2020 අගෝස්තු මස 20 වන දින වැලිසර පිහිටි ජාතික ක්ෂය රෝග විමර්ශන රසායනාගාරයෙන් (NTRL) ලැබී තිබුණු රසායනාගාරයේ භාවිතා කරන රුධිර පටක සාම්පල හා උපකරණ පරීක්ෂණයෙන් පසු ජීවානුහරණය සිදුකර බාහිර පරිසරයට මුදාහැරීම සඳහා වන රු.මිලියන 1.8ක් වූ Auto clave (50ml) යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම නොතිබීම නිසා භාවිතයට නොගෙන වසරකට වැඩි කාලයක් මහනුවර ළය රෝහලේ නිශ්කාර්යව පැවතුණි.

ප්‍රසම්පාදනය

- 2021 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති යටතේ මිලදී ගැනීම්

සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමඟ එළැඹී ගිවිසුම් අනුව සැපයුම්කරුවන් විසින් උපකරණ ලබාදීමේදී සිදුවී තිබුණු ප්‍රමාදයන් වෙනුවෙන් අයකරගත යුතුව පැවති රු.මිලියන 1.27 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව සමාලෝචිත වර්ෂයට අදාළව මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හෝ වාර්ෂික විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමකින් තොරව රු.මිලියන 3.77 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි.

අභ්‍යන්තර විගණනය

මධ්‍යම පළාත් සභාවේ විගණනයට ලක්කළ යුතු ආයතන 2551 කින් ආයතන 554 ක අභ්‍යන්තර විගණනය සිදු කිරීමට සැලසුම් කර තිබුණද, 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණේ ආයතන 360 ක් වන අතර, ඉන් විගණනයට ලක්කර තිබුණේ ආයතන 194ක් පමණක් විය.

නොවිසඳී ඇති විගණන ඡේද

- 2018 නොවැම්බර් 19 දින අනතුරට පත් තෙල්දෙණිය මූලික රෝහලට අනුයුක්ත ගිලන් රථ අනතුර සම්බන්ධයෙන් පොලිස් වාර්තාව හා මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාව අනුව රථයේ යාන්ත්‍රික දෝෂයක් නොමැතිව රියදුරුගේ අධික වේගය හේතුවෙන් රථය පාලනය කර ගැනීමට නොහැකි වීම නිසා මෙම අනතුර සිදුව ඇති බව දක්වා තිබියදී එම වාර්තා නොසලකා අදාළ අනතුරින් රජයට වූ අලාභය රු.මිලියන 7.41 ක මුදල මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාව මගින් පොතෙන් කපා හැරීමට අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2020 අගෝස්තු 13 දින අනුමත කර අලාභය කපාහැරීමට කටයුතු කරමින් තිබුණි.

- මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් තීන්ත ආලේප කිරීම වෙනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබූ රු.මිලියන 3.11 ක් ඊට අදාළ නිලධාරීන් 14 දෙදෙනෙකු අය කර ගැනීම සඳහා මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018 ජූනි 08 දින මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දන්වා තිබූ අතර එම නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් 2019 මැයි 09 දින මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී තිබුණි. එහෙත් 2022 ජූලි 12 දින වන විට ඉන් නිලධාරීන් 13 ක ගෙන් රු.මිලියන 2.98 ක මුදල් අයකරගෙන නොතිබුණි.

- යුනිසෙෆ් ආයතනය විසින් 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ මධ්‍යම පළාත් සමාජ සුභසාධන

පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු රු.මිලියන **0.9** ක යතුරු පැදි **9** ක් සහ වටිනාකම අනාවරණය කර නොතිබුණු යතුරු පැදි **06** ක් පරිවාස නිලධාරීන් **14** දෙනෙකු සහ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන නිලධාරීවරයෙකු වෙත එම කාලසීමාව තුළදීම ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතුවල නිරතවීමට ලබාදී තිබුණි. එම නිලධාරීන්ගෙන් එක් අයෙකු හැර ඉතිරි **14** දෙනා විසින් **2014** වර්ෂයේ අයවැය යෝජනා මගින් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබා දී තිබූ යතුරු පැදි ලබාගැනීම හේතුවෙන් ඔවුන් විසින් ලබාගත් යතුරු පැදි දෙපාර්තමේන්තුව වෙත ආපසු භාරදිය යුතු වුවද එසේ භාරදී නොතිබුණි.

දකුණු පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- ණය අයකර ගැනීමේ අඩුපාඩු
- වත්කම් කළමනාකරණය
- නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
- ගාස්තු අයකර ගැනීමේ අඩුපාඩු
- සිදුව ඇති පාඩු
- සාක්ෂි ඉදිරිපත් නොකිරීම
- කොන්ත්‍රාත් පරිපාලනය
- ගිවිසුම්වලට පටහැනි වීම

දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රු.මිලියන 40,614 ක් රජයේ ප්‍රදාන මඟින් හා අභ්‍යන්තර මාර්ග වලින් රු.මිලියන 5,143 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 45,757 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමින් රු.මිලියන 42,064 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 6,370 ක් මූලධන වියදම් වශයෙන්ද එකතුව රු.මිලියන 48,434 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 39,506 ක්ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 6,258 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 45,764 ක ආදායමක් රැස්කර තිබුණි. 2021 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 40,985 ක් හා මූලධන වියදම රු.මිලියන 4,220 ක් වශයෙන් එකතුව රු.මිලියන 45,205 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වියදම ඉක්මවූ ආදායම රු. මිලියන 559 ක් වී තිබුණි.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන	35,585	33,911	37,107	39,286	45,757
තථ්‍ය ආදායම රු.මිලියන	34,970	36,061	36,492	40,599	45,764
ඇස්තමේන්තුගත වියදම රු.මිලියන	38,296	33,711	40,561	43,964	48,434
තථ්‍ය වියදම රු.මිලියන	35,548	35,475	37,772	42,254	45,205

රූපසටහන 65 - දකුණු පළාත් සභාවේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම

මූලාශ්‍රය - දකුණු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2017 -2021

දකුණු පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ණය අයකර ගැනීමේ අඩුපාඩු

දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට ආයතනය විසින් අයකර ගත යුතු රු.මිලියන 3.61 ක අක්‍රිය ණය ශේෂයක් 2001 වසරේ සිට පැවත එන අතර එම මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොතිබුණි. ආයතනයේ ජංගම නොවන ලැබිය යුතු දෑ තුළ ඇතුළත් රු. මිලියන 1.65 ක දේශීය බීජ නිෂ්පාදන ණය ශේෂ හා රු. මිලියන 0.55 ක දේශීය බීජ ණය ශේෂය 2002 වසරේ සිට පැවත එන අතර නැවත අයකර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

වත්කම් කළමනාකරණය

දකුණු පළාත් සංවර්ධන අධිකාරියට හිමිකමක් නොමැති අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් සතු අක්කර 52 රූඩ් 02 පර්චස් 01 ක් වූ හුංගම - දකුණු බටඅත සමෝධාන ගොවිපල ව්‍යාපෘති භූමිය දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් 2009 වර්ෂයේ සිට සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 40 ක වියදම් දරා සංවර්ධනය කර තිබූ අතර එම ඉඩමෙන් අක්කර 30 ක් වර්ෂයකට රු.මිලියන 0.28 ක මුදලකට වසර 25 ක කාලයක් සඳහා බදු දීමට කටයුතු කර තිබූ අතර ඉතිරි අක්කර 22 රූඩ් 02 පර්චස් 01 ක් වූ භූමිය වෙනත් කාර්යයක යොදා ගෙන නොතිබූ අතර එම භූමිය මෙතෙක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතුද සිදු කර නොතිබුණි.

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රුහුණු සංචාරක කාර්යාංශයේ වත්කම් තුළ ඇති රු.මිලියන 103 ක් වූ වත්කම් 03 ක් 2018 හා 2019 වර්ෂවල සිට 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. එමෙන්ම, කාර්යාංශයට අයත් අම්බලන්ගොඩ ගොඩහේන තොරතුරු මධ්‍යස්ථානය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 3.7 ක් වියදම් කර තිබූ අතර එම තොරතුරු මධ්‍යස්ථානයේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ගාස්තු අයකර ගැනීමේ අඩුපාඩු

- අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක L/2940 දරන දීර්ඝ කාලීන බදුකරය යටතේ 1965 වර්ෂයේ සිට 1995 ජනවාරි 11 දින දක්වා අකුරැස්ස විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රජයේ ඉඩමක් ලබා දී තිබුණු අතර, 1995 වර්ෂයෙන් පසු විගණිත දිනය වූ 2022 මාර්තු 09 දින දක්වා එනම් වසර 26 ක් දක්වා දීර්ඝ කාලීන බදු ගිවිසුමක් නොමැතිව හා බදුකුලී ගෙවීමෙන් තොරව තවදුරටත් අනවසරයෙන් ඉඩම භුක්තිවිඳින බවත්, 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අය කල යුතු දීර්ඝ කාලීන බදුකුලී එකතුව රු. මිලියන 5.23 ක් සහ 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නව තක්සේරු වාර්තා මත පදනම්වූ බදු කුලියත් අයකරගෙන නොතිබුණි. එමෙන්ම රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ 228 හි 04 ප්‍රකාරව රක්ෂිත

ඉඩම්වල කවුරුන් වුවද පදිංචිවීම වළක්වාලිය යුතු අතර, සමුපකාර සමිතිය විසින් නිල්වලා ගඟ රක්ෂිතය තුළ පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව (Slab) දැමීම දක්වා වැඩ අවසන් කර ඇති ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකරමින් පැවතීම සම්බන්ධයෙන් 1979 අංක 07 දරන සන්තකය ආපසු ලබා ගැනීමේ පනත ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.

- දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ 2021 වර්ෂයේ මුද්දර ගාස්තු අයකිරීම් පිළිබඳ වූ අභියාචනා සම්බන්ධයෙන් 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 03 වන කොටසේ xxiv පරිච්ඡේදය අනුව පළාත් තක්සේරුකරුවකු විසින් කරනු ලබන තක්සේරුවක් පිළිබඳ අතෘප්තියට පත් තැනැත්තෙකු එවන ලද අභියාචනා පිළිබඳ කරන ලද විගණන පරීක්ෂාවේදී රු. මිලියන 19.87 ක මුද්දර ගාස්තු සහ රු.මිලියන 8.26 ක දඩ ගෙවිය යුතු තැනැත්තන් 325 දෙනෙකු විසින් මුද්දර ගාස්තු පිළිබඳ අභියාචනා ඉදිරිපත් කර තිබූ අතර, අභියාචනා ඉදිරිපත් කිරීමෙන් පසු රු.මිලියන 8.88 දක්වා මුද්දර ගාස්තුද රු.මිලියන 1.2 දක්වා මුද්දර ගාස්තු සඳහා පනවන ලද දඩයද අඩුකර තිබුණි. ඒ අනුව දකුණු පළාත්ට අයවිය යුතු මුද්දර ගාස්තු හා ඒ සඳහා පනවන ලද දඩ අභියාචනා කිරීමෙන් පසු පිළිවෙලින් සියයට 53 කින් සහ සියයට 85 කින් අඩුවී තිබුණි.

සිදුවූ ඇති පාඩු

2015 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ඇස්පෝල්ට් නිෂ්පාදන යන්ත්‍රයක් ලබා දී තිබූ අතර, මෙම යන්ත්‍රය මඟින් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂයේ ජූලි මස 09 වන දින දක්වා ඇස්පෝල්ට් නිෂ්පාදන කටයුතු සිදුකර තිබුණි. එහෙත් නිෂ්පාදන කටයුතු නතර කිරීමට යන්ත්‍රයේ කාර්මික දෝෂයක් හෝ වෙනත් හේතුවක් සඳහන් කර නොතිබුණි. ඉන්පසු මෙම යන්ත්‍රය තක්සේරු මණ්ඩලයක් මඟින් රු.මිලියන 10.4 කට තක්සේරු කර 2021 වර්ෂයේදී රු.මිලියන 21.1 කට වෙන්දේසි කර තිබුණි. ඇස්පෝල්ට් නිෂ්පාදනය සඳහා භාවිතා කිරීමේ අරමුණින් යන්ත්‍රය තුළට ඇතුළත් කර තිබූ තාර ලීටර් 28,599 ක් හා ඩීසල් ලීටර් 4,028 ක් එම යන්ත්‍රයේ ටැංකි තුළ තිබුණද, තක්සේරු කිරීමේදී මේ සම්බන්ධයෙන් සැළකිල්ලට ගෙන නොතිබුණි. එසේ ටැංකිය තුළ වූ තාරවල වටිනාකම ආසන්න වශයෙන් රු.මිලියන 2.86 ක් වූ අතර, ඩීසල් වල වටිනාකම ආසන්න වශයෙන් රු.මිලියන 0.4 ක් පමණ වී තිබුණි. මෙලෙස තාර හා ඩීසල් තොගය සමඟ යන්ත්‍රය ගැණුම්කරුට භාරදීම හේතුවෙන් අධිකාරියට සිදු වී තිබූ සමස්ථ පාඩුව ආසන්න වශයෙන් රු.මිලියන 3.26 ක් වී තිබුණි.

සාක්ෂි ඉදිරිපත් නොකිරීම

දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂය සඳහා රු.මිලියන 3.56 ක මුදලක් ගෙවා තිබුණද, එම අපද්‍රව්‍ය එකතු කළ ආකාරය හා අදාළ ආයතනවලට භාරදීම පිළිබඳ විධිමත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

කොන්ත්‍රාත් පරිපාලනය

මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවතින රම්‍යා මොහොට්ටි ළය චිකිත්සාගාරය දැයට කිරුළ වැඩසටහන යටතේ I සහ II අදියර සඳහා රු.මිලියන 90.53 ක ඇස්තමේන්තුවක් සකස්කර පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු.මිලියන 70.13 ක ගිවිසුම් මුදලකට කොන්ත්‍රාත් පවරා විගණන දිනය වූ 2021 ඔක්තෝබර් 07 වන දින වන විට කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 39.28ක මුදලක් ගෙවා තිබුණද ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් ළය චිකිත්සාගාරය කුලී පදනම මත පවත්වා ගෙන යෑමට සිදුවී ඇති අතර විගණන දිනය වන විට රු. මිලියන 3.82 ක කුලී මුදලක් බදුකරු වෙත ගෙවා තිබුණි.

ගිවිසුම්වලට පටහැනි වීම

දකුණු පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියට අනුව අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇතිකර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව කෙලින්ම හෝ අන් අයුරකින් කිසියම් සම්බන්ධතාවයක් ඇති අධිකාරියේ යම් සාමාජිකයෙකු විසින් ඔහුගේ සම්බන්ධතාවයේ ස්වභාවය අධිකාරියේ රැස්වීමකදී හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තා වල වාර්තාගත කරනු ලැබිය යුතුය. තවද අධිකාරිය විසින් ඒ ගිවිසුම් සලකා බැලීමේදී හෝ ඒ පිළිබඳව තීරණයකට එළඹීමේදී ඒ සාමාජිකයා සහභාගී නොවිය යුතුය. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4.3 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සම්බන්ධතා පිළිබඳ අනුකූලතාවයක් නොමැතිව සිටින බවට නිලධාරින් විසින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එවැනි සැක ඇතිවීමේ අවශ්‍යතාවයක් පැනනැගුණහොත් අදාළ නිලධාරියා විසින් ඔහුගේ/ඇයගේ සම්බන්ධතාව ප්‍රකාශයට පත්කොට ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ඉවත්විය යුතුය. කෙසේ වෙතත් එම ප්‍රඥප්තියට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මාර්ග හා පාලම්) ට ඥාති සම්බන්ධතාවයක් ඇති කොන්ත්‍රාත් ආයතන 02 ක් සඳහා 2021 වර්ෂයේදී එකතුව රු. මිලියන 26.47 ක් වූ කොන්ත්‍රාත් 06 ක් ප්‍රදානය කර තිබූ අතර, එම කොන්ත්‍රාත් පිරිනැමීමට අදාළ ප්‍රසම්පාදන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස මෙන්ම එම ගිවිසුම් සම්බන්ධ තීරණ වලට එළඹීමේදී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මාර්ග හා පාලම්) සම්බන්ධ වී තිබුණි.

උතුරු පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- ගිවිසුම් රහිතව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම
- ප්‍රමාණවත් අධිකාරි බලයක් නොමැති ගනුදෙනු
- කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව විසින් **2021** වර්ෂය සඳහා රු. මිලියන **32,556**ක් රජයේ ප්‍රදාන මගින් ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන **1,735**ක් ද වශයෙන් එකතුව රු. මිලියන **34,291**ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන **28,534**ක් ද, මූලධන වියදම් සඳහා රු. මිලියන **5,861**ක් ද වශයෙන් එකතුව රු. මිලියන **34,395**ක් ඇස්තමේන්තු කර තිබුණි. **2021** වර්ෂයේදී රජයේ ප්‍රදානවලින් රු. මිලියන **30,071**ක් ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන **1,415**ක් ද වශයෙන් එකතුව රු.මිලියන **31,486**ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්තන වියදම රු. මිලියන **27,583**ක් සහ මූලධන වියදම රු. මිලියන **3,866**ක් වශයෙන් එකතුව රු. මිලියන **31,389**ක් උපයෝජනය කර තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ **04**ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම සහ වියදම පිළිබඳ විස්තර රූපසටහන **66** මගින් දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන	27,331	26,669	25,200	29,222	34,291
තථ්‍ය ආදායම රු.මිලියන	26,713	26,744	21,558	28,878	31,486
ඇස්තමේන්තුගත වියදම රු.මිලියන	27,351	28,289	24,445	29,242	34,395
තථ්‍ය වියදම රු.මිලියන	24,044	25,572	21,599	28,710	31,389

රූප සටහන 66 - උතුරු පළාත් සභාවේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2017 -2021

උතුරු පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේදී සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ගිවිසුම් රහිතව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම

උතුරු පළාත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් ප්‍රදානය කළ එක් ප්‍රසම්පාදනයක වටිනාකම රු. 500,000කට වඩා වැඩි එකතුව රු.මිලියන 44.92 ක් වූ ප්‍රසම්පාදන 10ක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

ප්‍රමාණවත් අධිකාරි බලයක් නොමැති ගනුදෙනු

වෛද්‍ය නිලධාරී සේවයේ පළමු ශ්‍රේණියට අයත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන පන්තිය යටතට ගැනෙන වෛද්‍ය අධිකාරි තනතුර දරන වෛද්‍ය නිලධාරියෙකුට අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව වෙන්කරන ලද වාහනය සඳහා ලබා දෙන මාසික ගමන් වියදම් දීමනාව වෙනුවෙන් 2015 නොවැම්බර් මාසයේ සිට 2020 ජූලි මාසය දක්වා රු.මිලියන 3.6 ක් ගෙවීම් කර තිබුණි.

කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

උතුරු පළාත තුළ 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ පැවැති ව්‍යාපෘති 18ක් ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටළු විනිශ්චය සහ බේරුම්කරණය (Adjudication and Arbitration) සඳහා ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.මිලියන 7.35ක් වැයකර තිබුණ ද, එම ගැටළු මෙතෙක් නිරාකරණය වී නොතිබුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඉදි කිරීම් ව්‍යාපෘති 08ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 18.26 ක් වැයකර තිබුණ ද, එම ව්‍යාපෘති සියල්ල නිම කිරීමකින් තොරව අත්හැර දමා තිබුණි.

- උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පුලුදියාරු වැවෙන් උස් ගොවිබිම් වෙත යාන්ත්‍රිකව ජලවහනය සඳහා සකස් කළ වාරි යෝජනා ක්‍රමය වෙනුවෙන් රු.මිලියන 32ක් වැයකර 2015 වර්ෂයේදී වැඩ නිමකර තිබුණද, මේ දක්වාම එම ව්‍යාපෘතිය අක්‍රිය තත්ත්වයේ පැවැතුණි.

නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

- උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රු.මිලියන 20.37 ක් වටිනා අබලන්ව පවතින යන්ත්‍රෝපකරණ 13ක් වසර 05ක කාලයක සිට අළුත්වැඩියා නොකර රඳවා තිබුණු අතර ප්‍රයෝජනයට ගත හැකි රු.මිලියන 9.23 ක් වටිනා යන්ත්‍රෝපකරණ 04ක් වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක් තුළ නිෂ්කාර්යව පැවැතුණි.

- උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පාලනයට අයත් පේදුරුතුඩුව මූලික රෝහලේ 2016

ඔක්තෝබර් මාසයේදී ස්ථාපිත කළ දාහක යන්ත්‍රය (Incinerator) අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි. එමගින් ඇතිවන පරිසර දූෂණයට එරෙහිව පැන නැඟුනු මහජන විරෝධතා හේතුවෙන් එය අලුත්වැඩියා කිරීමට ද නොහැකි වී තිබුණි. පසුව යන්ත්‍රය ස්ථාපිත ගොඩනැගිල්ලට 2020 වර්ෂයේදී ගසක් කඩා වැටීමෙන් හානියට පත්වීම නිසා වර්ෂ 02ක කාලයක සිට රු.මිලියන 8ක් වූ එම යන්ත්‍රය අනාරක්ෂිතව දිරාපත් වෙමින් පවතී. ප්‍රමාණවත් අවධානයක් හා ආරක්ෂාවක් නොතිබීම, වගකීම් කාලයෙන් පසු නිසි ලෙස නඩත්තු නොකිරීම සහ නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව නාගරීකරණය වූ ප්‍රදේශයක එම යන්ත්‍රය ස්ථාපිත කිරීම, මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතු වී තිබුණි.

නැගෙනහිර පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- ආදායම් එකතු කිරීම
- වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය
- පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතනවල කාර්යසාධනය
- විදුහල්පති/ ගුරු සේවයේ පුරප්පාඩු

නැගෙනහිර පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රු. මිලියන 34,146 ක් රජයේ ප්‍රදාන මගින් හා අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 2,480 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 36,626 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමෙන් රු. මිලියන 30,643 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 5,983 ක් මූලධන වියදම් වශයෙන් එකතුව රු.මිලයන 36,626 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව, 2021 වර්ෂයේදි රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 31,680 ක්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 2,303 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 33,983 ක ආදායම් රැස්කර තිබුණි. 2021 වර්ෂයේදි පුනරාවර්තන වියදම් රු.මිලියන 30,424 ක් හා මූලධන වියදම් රු.මිලියන 3,508 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 33,932 ක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 4කදී පළාත් සභාව විසින් රැස්කළ ආදායම හා උපයෝජනය පිළිබඳ විස්තර රූපසටහන 67 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම	25,629	29,022	26,442	33,838	36,626
තථ්‍ය ආදායම	22,281	24,320	25,533	31,225	33,983
ඇස්තමේන්තුගත වියදම	26,295	28,355	30,371	33,838	36,626
තථ්‍ය වියදම	23,209	27,143	28,008	31,282	33,932

රූපසටහන 67 - ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම

මූලාශ්‍රය - නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2017-2021

නැගෙනහිර පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේදී සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආදායම් එකතු කිරීම

ආදායම් එකතු කිරීම පළාත් සභා අරමුදලේ කොඳු නාරටිය වුවද, විවිධ වර්ගයේ පළාත් ආදායම් මාර්ග හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට වසර 05 ක් පුරා නැගෙනහිර පළාත් සභාව කටයුතු කර නොතිබුණි. මේ අනුව, පළාත් සභාවේ කාර්යයන් සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ මහා භාණ්ඩාගාරයේ එකවර ප්‍රදාන (Block Grant) මඟින් වන අතර එය 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ රු. මිලියන 18,668 සිට රු. මිලියන 28,163 දක්වා එනම් සියයට 50 කින් වැඩි වී තිබූ අතර, පලාත් සභාවේ ආදායම් එකතු කිරීම රු. මිලියන 3,613 සිට රු.මිලියන 2,303 දක්වා එනම් සියයට 36 කින් සැලකිය යුතු ලෙස පිරිහී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත විවිධ ආදායම රු.මිලියන 426 අයකර ගැනීමටද අපොහොසත්ව තිබුණි. එමෙන්ම පුනරාවර්තන වියදම් රු. මිලියන 22,052 සිට රු. මිලියන 30,424 දක්වා සියයට 38 කින් වැඩි වී තිබුණි.

වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය

- ඇස්තමේන්තු නොමැතිව නැගෙනහිර පළාතේ විවිධ අංශ ක්‍රියාකාරකම්වල ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 5,983 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබුණද, රු. මිලියන 3,517 ක් පමණක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කිරීමට සභාව අසමත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඉටු කර ගැනීමට අපේක්ෂිත රු. මිලියන 2,466 ක කෘෂිකාර්මික වැඩිදියුණු කිරීම්, ජීවනෝපාය සංවර්ධන කටයුතු වැනි පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි.

- "තිරසර කෘෂි සංස්කෘතිය" වැඩ සටහන යටතේ කාබනික කෘෂි කර්මාන්තය සංවර්ධනයට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,000ක ප්‍රතිපාදන ලබාදී තිබුණද ඉන් රු. මිලියන 228.74ක් එනම් මුළු ප්‍රතිපාදන වටිනාකමින් සියයට 23ක් පමණක් භාවිතා කර තිබුණු අතර රු.මිලියන 459.08ක් භාවිතයට නොගෙන තැන්පතු ලෙස රඳවා ගෙන තිබුණි.

  එමෙන්ම ඉතිරි ප්‍රතිපාදන වටිනාකම වූ රු.මිලියන 312.18ක් භාවිතයට නොගෙන නැගෙනහිර පළාත් සභාවේ භාණ්ඩාගාරයට යවා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානවන විට කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ කටයුතු පහල කාර්යය සාධන මට්ටමක පැවතුණි. තවද 2022 වර්ෂයේ අගෝස්තු වන විට මෙම වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී මිලදී ගත් රු. මිලියන 14.81ක් වටිනා ට්‍රැක්ටර් 32ක් ගොවි ප්‍රජාවට ලබාදීමට කටයුතු

නොකර මාස 08ක් පමණ නිෂ්කාර්යව පැවතුණි.

පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතනවල කාර්යසාධනය

සංචාරක කාර්යාංශය සහ නිවාස අධිකාරිය වැනි ව්‍යවස්ථාපිත ආයතන 02 ක් පළාත් සභාවේ ප්‍රඥප්ති අනුව ස්ථාපිත කර 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ස්වයං අරමුදලක් ආරම්භ නොකර ආයතනවල විවිධ කටයුතු සඳහා පළාත් සභා අරමුදලින් රුපියල් මිලියන 159 ක් අග්‍රිම ලෙස ලබා ගෙන තිබුණු අතර සංචාරක සහ නිවාස අංශයේ ජාතික නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ව්‍යවස්ථාපිත ආයතනවල කාර්යය සාධනය දුර්වල මට්ටමක පැවතුණි. එමෙන්ම වසර 03ක් පුරා සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමකින් තොරව හා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොන්ත්‍රාත්/ අනියම් පදනම මත පත් කරන ලද කාර්ය මණ්ඩලය 59 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 44 ක් වැටුප් සහ දීමනා ලෙස ගෙවා තිබුණි.

විදුහල්පති/ ගුරු සේවයේ පුරප්පාඩු

සමාලෝචිත වර්ෂය අවසානවන විට නැගෙනහිර පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 15 කට අදාළව විදුහල්පතිවරු 566ක් හා ගුරුවරු 1509 ක පුරප්පාඩු පැවතියද අම්පාර දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 02ක් යටතේ විදුහල්පතිවරු 20ක් හා නැගෙනහිර පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 06ක ගුරුවරු 664ක් අතිරික්ත ලෙස සේවයේ යොදවා ගෙන තිබුණි.

උතුරු මැද පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
- උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය
- ප්‍රඥප්ති යටතේ පිහිටුවා ඇති අරමුදල් හා ආයතනවල නිෂ්ක්‍රීයව පවතින මුදල්
- පළාත් සංවර්ධන සැලැස්ම
- ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු
- කළමනාකරණ අකාර්යක්ෂමතා
- මෙහෙයුම් අකාර්යක්ෂමතා
- පළාත් වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩා සංකීර්ණය අළුත්වැඩියා කිරීම
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයක් ඉදිකිරීම
- පාසලක පන්ති කාමර ගොඩනැගිල්ලක් ඉදිකිරිම
- අරමුදල් ඌන උපයෝජනය
- නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම
- වත්කම්වලින් ලැබිය යුතු ආදායම්
- නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
- අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්
- අපේක්ෂිත නිමවුම් (output) ලබානොගැනීම
- අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම

උතුරු මැද පළාත් සභාව

උතුරු මැද පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රු.මිලියන 25,637 ක් රජයේ ප්‍රදාන මගින් හා අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 2,651 ක් ද, වශයෙන් එකතුව රු. මිලියන 28,288 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමෙන් රු.මිලියන 22,721 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 5,515 ක් මූලධන වියදම් වශයෙන්ද, එකතුව රු.මිලියන 28,236 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 22,865.8 ක්ද, අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 2,404.3 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 25,270.1 ක ආදායම් රැස් කර තිබුණි. 2021 වර්ෂයේදී පුනරාවර්තන වියදම් රු.මිලියන 24,980.5 ක් හා මූලධන වියදම් රු.මිලියන 43.9 ක් වශයෙන් එකතුව රු.මිලියන 25,024.4 ක් උපයෝජනය කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 4 කදී පළාත් සභාව විසින් රැස්කළ ආදායම හා උපයෝජනය පිළිබඳ විස්තර රූපසටහන 68 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම	29131	22440	25200	25289	28288
තථ්‍ය ආදායම	22827	22974	21558	23077	25270.1
ඇස්තමේන්තුගත වියදම	19606	22236	24445	24524	28236
තථ්‍ය වියදම	23083	28401	21599	21882.6	25024.4

රූපසටහන 68 - ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම

මූලාශ්‍රය - උතුරු මැද පළාත් සභාවේ 2027-2020 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

උතුරු මැද පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේදී සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

- උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයට බඳවාගෙන තිබුණු නිලධාරීන් දෙදෙනෙකු විසින් බඳවා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කළ අධ්‍යාපන සහතික ව්‍යාජ ඒවා බව තහවුරු වී තිබියදීත් එකී නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 8.5 ක මුදලක් ගෙවා තිබුණි. එසේම බඳවා ගත් දිනයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා එකී නිලධාරීන් දෙදෙනා වෙත ගෙවා තිබුණු මුළු වැටුප් හා දීමනා එකතුව රු.මිලියන 12.1ක් විය.

- උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර තනතුරකට 2004 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බඳවා ගෙන තිබුණු නිලධාරියෙකු එදින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ විවිධ අමාත්‍යාංශවලට අනුයුක්ත කර තිබුණු අතර වැටුප් හා දීමනා ලෙස අධිකාරිය විසින් ඔහුට ගෙවා තිබුණු රු.මිලියන 8.2 ක් වූ මුදල එකී නිලධාරියා අනුයුක්තව සේවය කළ අමාත්‍යාංශවලින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා ගෙවනු ලබන මාර්ග සංවර්ධන අධිකාරී දීමනාව ලෙස රු.මිලියන 1ක් ද අධිකාරියෙන් පිටත සේවය කළ කාලය සඳහා එකී නිලධාරියාට ගෙවා තිබුණි.

- 2019 වර්ෂයේදී අවසන් වී ඇති පිබිදෙමු පොලොන්නරුව ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් 2019 වර්ෂයේදී සපයන ලද උපදේශණාත්මක සේවා වෙනුවෙන් ලැබිය යුතු රු.මිලියන 35.9ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අය කරගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

- 2015 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව රජයේ ආයතනවලින් අයවිය යුතුව පවතින මුද්‍රණාල ආදායම් රු.මිලියන 7.2 ක්, යන්ත්‍ර කුලී ආදායම් රු.මිලියන 5.8 ක්, ආරක්ෂක අංශයේ ආදායම් රු.මිලියන 6.3 ක්,වාහන අලුත්වැඩියා අංශයේ ආදායම් රු.මිලියන 10.3 ක්, වාහන සේවා කිරීමේ ආදායම් රු.මිලියන 3.7 ක් සහ ටයර් සේවා මධ්‍යස්ථානයේ ආදායම් රු.මිලියන 1.8 ක් අය නොවී පැවති අතර ඉන් පිළිවෙළින් සියයට 87 ක් වූ රු.මිලියන 6.2 ක්, සියයට 21 ක් වූ රු.මිලියන 1.2 ක්, සියයට 56 ක් වූ රු.මිලියන 3.5 ක්, සියයට 15 ක් වූ රු.මිලියන 1.5 ක්, සියයට 17 ක් වූ රු.මිලියන 0.6 ක් සහ සියයට 37 ක් වූ රු.මිලියන 0.7 ක් අය නොවී පැවතුණු කාලය වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා පරාසයක විය.

- වර්ෂ 13 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින එකතුව රු.මිලියන 16ක එකතු කළ අගය මත බදු සහ රු.මිලියන 9 ක භාණ්ඩ හා සේවා මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ප්‍රඥප්ති යටතේ පිහිටුවා ඇති අරමුදල් හා ආයතනවල නිෂ්ක්‍රීයව පවතින මුදල්

උතුරු මැද පළාත් සභාව විසින් පවත්වාගෙන යනු ලබන උතුරු මැද පළාත් හදිසි අවස්ථා අරමුදල, උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල, උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල, උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල සහ උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.මිලියන 56.8 ක මුදලක් එකී ආයතනවල අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා නොගෙන බැංකු ගිණුම්වල නිෂ්ක්‍රීයව රඳවා ගෙන තිබුණි.

පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ පළාත් සභාව විසින් නව වැඩ යෝජනා හා අවිච්ඡේද වැඩ යෝජනා වශයෙන් යෝජනා 2,440 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 4,313.32 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන ,2431.05 ක් උපයෝජනය කර යෝජනා 1,999 ක කටයුතු සම්පූර්ණයෙන් නිම කර තිබුණි. එම වැඩ යෝජනාවලින් 124 ක කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණු අතර, ඒ සඳහා සලසා තිබුණු රු.මිලියන 129.63 ක ප්‍රතිපාදන ඌන උපයෝජිතව පැවතුණි. වැඩ යෝජනා 107 ක් සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 603.78 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම වැඩ යෝජනා සියයට 50 කට අඩුවෙන් ක්‍රියාත්මක කර තිබුණි. වැඩ යෝජනා වල ප්‍රගතිය වගුව 29 හි දැක්වේ.

විස්තරය	නව වැඩ යෝජනා ගණන	අවිච්ඡේද වැඩ යෝජනා ගණන	මුළු වැඩ යෝජනා ගණන	මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන
සම්පූර්ණයෙන් නිමකළ	1,973	26	1,999	2,431.05
50% කට වඩා වැඩියෙන් නිමකළ	207	03	210	1,148.86
50% කට වඩා අඩුවෙන් නිමකල	107	-	107	603.78
ආරම්භ කර නොතිබූ	124	-	124	129.63
එකතුව	2,411	29	2,440	4,313.32

වගුව 29 - වැඩ යෝජනාවල ප්‍රගතිය
මූලාශ්‍රය - උතුරු මැද පළාත් සභාවේ කාර්යසාධන වාර්තාව

ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

- උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා III/II ශ්‍රේණියේ ආදායම් තක්සේරුකරු/ ජ්‍යෙෂ්ඨ ආදායම් තක්සේරුකරු තනතුරු 11 ක් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමතකර තිබුණු නමුත් 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් ආදායම් සේවයේ නිලධාරීන් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ ආදායම් තක්සේරුකරු/ජ්‍යෙෂ්ඨ ආදායම් තක්සේරුකරු තනතුරුවල ශ්‍රේණිය II/I වශයෙන් දක්වා තිබුණි. එසේ කිරීමෙන් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් 04 දෙනෙකු I ශ්‍රේණියට උසස් කර තිබුණු අතර නිලධාරීන් තිදෙනෙකුට අදාළ ව 2015 අප්‍රේල් 07 දින දක්වා ද එක් නිලධාරියෙකුට අදාළ ව 2015 සැප්තැම්බර් 17 දින දක්වා ද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ද පෙර දිනයන් සඳහා එකී පත්වීම් පෙරදාතම් කර තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 04 කට අදාළව උතුරු මැද පළාත් භාණ්ඩාගාරයට පියවා නොතිබුණු රු.මිලියන 27.9 ක අග්‍රිම ශේෂයන් වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. එම ශේෂයන්ගෙන් සියයට 95 ක් වූ වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන රු.මිලියන 26.4 ක ශේෂයක් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවිය යුතුව තිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

- සමාලෝචිත වර්ෂයේ උතුරු මැද පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.මිලියන 543.4 ක් වූ අතර ඉන් වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.මිලියන 43.4 ක් විය.

- දුර ගමන් සේවා බස් නැවතුම්පොළක් ඉදිකිරීමේ අරමුණ ඇතිව බකමූණ මහවැලි ක්‍රීඩාංගනය ඉදිරිපිට භූමියේ පිහිටි කළුගලක් කඩා ඉවත් කිරීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම, ශක්‍යතා අධ්‍යන සිදුකිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, පරිසර බලපත්‍ර ලබාගැනීම සහ විධිමත් මූල්‍ය පරිපාටි අනුගමනය කිරීම යනාදී ක්‍රියාමාර්ග අනුගමනය නොකර 2015 – 2018 කාල පරිච්ඡේදයේදී ඇලහැර ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 15.7 ක මුදලක් වැයකර තිබුණු නමුත් ඒ පිළිබඳව උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 9.6 ඡේදය ප්‍රකාරව රජයේ නිවාඩු දිනක රාජකාරි සඳහා ගමන් කිරීම නිවාඩු දින වැටුප් ගෙවීමේ කාර්ය සඳහා වැඩ කිරීමක් ලෙස ගණන් නොගත යුතු අතර, එකී ගමන නියම වශයෙන්ම රාජකාරියක් ඉටු කිරීම සඳහාම කරන ලද්දක් නම් ඒ වෙනුවෙන් හිලව් නිවාඩුවක් පමණක්

ලබාගත හැකි නමුත්, පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමූපකාර, වෙළඳ, ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා කාර්යාලයෙන් බැහැර යාම වෙනුවෙන් අවස්ථා 23 කදී රු.368,267 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

- රජයේ අරමුදල් යොදවා සංවර්ධනය කර දැනට පවත්වාගෙන යනු ලබන අක්කර 27 ක ගාලදිවුල්වැව ඔසු උයන, අක්කර 03 ක නඳුන් සෙවණ, තෙලිහිරියාව ඔසු උයන සහ රූඩ් 02 පර්චස් 12 ක පලුගස්වැව ඔසු උයන යනාදියේ හිමිකාරීත්වය පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද නොහැකි වී තිබුණි.

- උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61211 (කාර්යාල කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 39 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 04 දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරියෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුට සහ වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුට අදාළව එකතුව රු.මිලියන 6.98 ක ණය ශේෂයන් මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් අයවීම් හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 08 දෙනෙකුට අදාළව රු.මිලියන 1.05 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් ගතවී තිබුණි.

- උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61201 (පාසල් කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 91 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 505 දෙනෙකුට, මධ්‍යම රජයේ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩලවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 295 දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 21 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 146 දෙනෙකුට, වැඩ තහනම් කළ නිලධාරීන් 20 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් 19 දෙනෙකුට සහ තොරතුරු අනාවරණය කරගත නොහැකි වූ නිලධාරීන් 93 දෙනෙකුට අදාළව එකතුව රු.මිලියන75.5 ක ණය ශේෂයන්

මාස 03 ත් වර්ෂ 31 ත් අතර කාලයක් අයවීම හිඟහිට තිබුණි. එසේම අනෙකුත් පළාත් සභාවල අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 13 දෙනෙකුට සහ මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩලවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 295 කුට අදාළ රු.මිලියන 26.5 ක ණය ශේෂයන් පියවීමට කටයුතු නොකර මාස 03 ත් වර්ෂ 24 ත් අතර කාලයක් ගතවී තිබුණි.

මෙහෙයුම් අකාර්යක්ෂමතා

- අනුරාධපුර ප්‍රාදේශීය ඖෂධ සැපයුම් අංශයේ භෞතික තොග ශේෂයන් වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධතියේ (MSMIS) ශේෂයන් සමඟ සැසඳීමේ පද්ධති තොග සත්‍යාපනය (System Verification) 2018 දෙසැම්බර් 31 දිනෙන් පසුව සිදුකර නොතිබුණු අතර උතුරු මැද පළාතේ ප්‍රාදේශීය රෝහල් 22 ක වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධති (MSMIS) ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- 2016 සිට 2020 දක්වා වූ වර්ෂ 05 ක කාලපරිච්ඡේදයේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵලවලින් පළාත් අනුව 2018 සහ 2019 වර්ෂවල දී 05 වන ස්ථානයේ සිටි උතුරු මැද පළාත 2020 වර්ෂයේදී 07 වන ස්ථානය දක්වා පසුබෑමට ලක්ව තිබුණි. එසේම එකී කාලපරිච්ඡේදයේ අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල වලින් පළාත් අනුව 2018 සහ 2019 වර්ෂවල දී 07 වන ස්ථානයේ සිටි උතුරු මැද පළාත 2020 වර්ෂයේදී 08 වන ස්ථානය දක්වා පසුබෑමට ලක්ව ඇති අතර අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල සැලකීමේදී 2019 වර්ෂයේ දී සියයට 02 ක් වූ ජාතික මට්ටමේ සමත් ප්‍රතිශතය සහ උතුරු මැද පළාතේ සමත් ප්‍රතිශතය අතර පරතරය 2020 වර්ෂයේ දී සියයට 03 දක්වා ඉහළ ගොස් තිබුණි. එසේ වුවත් පළාතේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා පාසල් මට්ටමින් ප්‍රශස්ත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකකර නොතිබුණි.

- උතුරු මැද පළාතේ පාසල්වල ගුරු හා විදුහල්පති පුරප්පාඩු පැවතියදී ගුරුවරුන් 58 දෙනෙකු මාස 01 ත් වර්ෂ 27 ත් දක්වා කාලයක් වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර මුදාහල දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ඔවුන්ට ගෙවා තිබුණු රු.මිලියන 147.35 ක වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම වෙනත් ආයතනවලට මුදාහැර ඇති ගුරුවරුන්ට වැටුප් ගෙවීමේදී ඔවුන්ගේ සේවයට පැමිණීම හා නිවාඩු පිළිබඳ විස්තර අනිවාර්යයෙන්ම ලබාගතයුතු බවට 2021 ජූනි 30 දිනැති උතුරුමැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපියෙන් උපදෙස් දී ඇතත් ගුරුවරුන් 55 දෙනෙකුට අදාළ පැමිණීමේ හා නිවාඩු වාර්තා සහ මුදාහල ආයතන විසින් ගෙවා ඇති දීමනා පිළිබඳ වාර්තා ලබාගෙන නොතිබුණි.

පළාත් වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩා සංකීර්ණය අළුත්වැඩියා කිරීම

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී අනුරාධපුර පළාත් වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩා සංකීර්ණය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.මිලියන 4 ක් ගෙවා තිබුණු අතර මෙම අළුත්වැඩියාවට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 4.2 ක් විය. රු.මිලියන 3.4 ක අවම ලංසුව මත ගිවිසුම්ගතව තිබුණ ද ගිවිසුම්ගත මුදල සියයට 18 කින් එනම් රු.මිලියන 0.6 කින් ඉක්මවා රු.මිලියන 4 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එසේ වුවත් ඉතිරි ලංසුකරුවන් ඉදිරිපත් කළ ලංසු වටිනාකම් කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති මුදලට වඩා රු.9,029 ත් රු.478,219 ත් අතර ප්‍රමාණයකින් අඩුව පැවතුණි.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයක් ඉදිකිරීම

නාච්චාදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉදිකිරීම සඳහා වූ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 37.33 ක් වූ අතර ඉදිරිපත් වී තිබුණු එකම ලංසුව රු.මිලියන 43.04 ක් විය. එකී ලංසුව, ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 5.71 කින් ඉක්මවා තිබුණු නමුත් ඉංජිනේරු ඇස්තමේන්තුවට අදාළ කාර්ය ඉටුකරවා ගැනීමට කොන්ත්‍රාත්කරු එකඟ කරවා ගැනීම හෝ නැවත ලංසු කැඳවීම හෝ සිදු නොකර ලංසුකරුගේ වටිනාකමට 2021 ඔක්තෝබර් 28 දින උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ගිවිසුම්ගතව රු.මිලියන 12.7 ක අත්තිකාරම් මුදල් ද ගෙවා තිබුණි. ඉදිකිරීමට යෝජිත භූමියේ අයිතිය පිළිබඳ නෛතික හා පරිපාලනමය වශයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් නොදක්වා තිබීම හේතුවෙන් පසුව ඇති වූ ගැටළුවක් පදනම් කරගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර පළාත් පාලන ආයතනයක් විසින් එහි ස්ථිර ඉදිකිරීමක් සිදුකර තිබුණි. එසේ වුවත් ගෙවා තිබුණු රු.මිලියන 12.7 ක අත්තිකාරම් මුදල් අයකර ගෙන නොතිබුණි.

පාසලක පන්ති කාමර ගොඩනැඟිල්ලක් ඉදිකිරිම

හොරොව්පතාන දුටුවැව විද්‍යාලයේ 80'x20' ප්‍රමාණයේ පන්ති කාමර ගොඩනැඟිල්ලක් රු.මිලියන 2.4 ක පුද්ගලික ධන පරිත්‍යාගයකින් ඉදිකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

- මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා 2019 ඔක්තෝබර් 23 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය ලබා දී තිබුණු නමුත් එහි ඉදිකිරීම් කටයුතු 2018 ඔක්තෝබර් 18 දින ආරම්භකර තිබුණු අතර එකී ඉදිකිරීම් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශවලට පටහැනිව හා තාක්ෂණික උපදෙස් ලබා ගැනීමකින් තොරව සිදුකර තිබුණි.

- ඉදිකිරීම් කටයුතු සඳහා ද්‍රව්‍ය මිලට ගැනීමට පත්කර තිබුණු විදුහල්පතිවරයා ඇතුළු 12 දෙනෙකුගෙන් සමන්විත කමිටුව විසින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා අනුමත කළ ඇස්තමේන්තු

ප්‍රමාණයන්ට වඩා රු.120,700 ක් වටිනා වැලි කියුබ් 18.4 ක් මිලට ගෙන තිබුණි.

- අඩි 03 අඟල් 06 ක අගුව සහිතව අමානෝ ෂීට් යොදා වහලය ආවරණය කිරීම සඳහා අඩි 02 අඟල් 06 ක පරතරයට දිග අඩි 19 ක වානේ පර්ලින් 56 කින් පේළි 12 ක් යෙදීමට ඇස්තමේන්තුවේ අංක 06 වැඩ විෂයයෙන් අනුමත කර ඇති නමුත් ඊට පටහැනිව අඩි 03 අඟල් 09 ක පරතරය සහිතව පර්ලින් පේළි 08 ක් යොදා තිබුණි. එසේම ඒ මත ඇස්බැස්ටොස් ෂීට් ආවරණය කර තිබුණු අතර පාසල් ගොඩනැගිල්ලේ වහලය ශක්තිමත් නොවීම සිසුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වී තිබුණු අතර වහලය සඳහා භාවිතා නොකළ අඩි 19 වානේ පර්ලින් 19 ක් නැවත රු.73,682 කට අලෙවිකර එම මුදලින් රු.30,500 ක් පමණක් 2020 පෙබරවාරි 14 දින පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකර තිබුණු අතර රු.43,182 ක් අවභාවිතාකර තිබුණි.

- අනුමත ඇස්තමේන්තුවේ අංක 17 වැඩ විෂයය යටතේ ගොඩනැඟිල්ලේ වහලයේ මුදුනේ දිග අඩි 90 ක දුර ප්‍රමාණයක් වැසීම සඳහා ZN/Al Colour bond ridge capping යෙදීමට රු.12,000 ක් වැයකර දිග අඩි100 ක් හා පළල අඩි 02 ක් වූ තහඩු රෝලක් මිලට ගෙන තිබුණු නමුත් එම තහඩු රෝල ගොඩනැඟිල්ලේ වහලයට භාවිතා නොකර එය මිලට ගත් ආයතනයටම නැවත අලෙවිකර මුදල් ලබා ගෙන අවභාවිතා කර තිබුණි.

- අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව පාසල්වල අවිධිමත් ලෙස මුදල් අයකිරීම තහනම් කර තිබියදීත්, මෙම නව ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා පාසලේ ඉගෙනුම ලබන දරුවන්ගේ පවුලකින් රු.400 බැගින් එකතුව රු.60,000 ක මුදලක් එකතුකර ඇති බවත්, ඒ සඳහා ලදුපත් නිකුත් කර නොමැති බවත්, එම මුදල අස්ථානගත වී ඇති බවත්, 2020 අගෝස්තු 17 දින පැවති පාසල් සංවර්ධන සමිතියේ රැස්වීම් වාර්තාවේ සඳහන් කර තිබුණි.

අරමුදල් ඌන උපයෝජනය

- 2021 වර්ෂයේදී අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු, විදේශ ව්‍යාපෘති, ජාතික අයවැය දෙපාර්තමේන්තුව යනාදී මූලාශ්‍ර වලින් උතුරු මැද පළාත් සභාව වෙත රු.මිලියන 1,595 ක් වූ අග්‍රිමයක් ලැබී තිබුණු නමුත් මූලාශ්‍ර 07 කින් ලැබී ඇති රු.මිලියන 422.1 ක් වූ අග්‍රිම ඉතිරිවී තිබුණු අතර එකී ඉතිරිය ලැබී තිබුණු මුළු අග්‍රිමයෙන් සියයට 06 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය.

- 2021 වර්ෂයේදී දේශගුණ සුහුරු ව්‍යාපෘතිය, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP), සෞඛ්‍යභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන සහ වාරි සෞභාග්‍යා යන ව්‍යාපෘති 04 ට අදාළව ඇස්තමේන්තු කළ අග්‍රිමය රු.මිලියන 1,525.6 ක් වූ නමුත් ක්‍රියාත්මක කිරීමේ දුර්වල ප්‍රගතිය

හේතුවෙන් වර්ෂය තුළදී ලැබී ඇති මුළු අග්‍රිමය රු.මිලියන 278.1 ක් විය. එය ඇස්තමේන්තු කළ අග්‍රිමයෙන් සියයට 18 ක් විය.

නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් 592 ක පිහිටි ගුරු හා විදුහල්පති නිවාස 1,510 කින් වර්ග අඩි 831,004 ක නිවාස 981 ක් අළුත්වැඩියා කළයුතු තත්ත්වයේද, වර්ග අඩි 206,719 ක නිවාස 225 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේද පැවති නමුත් අවශ්‍යතාවය හඳුනාගෙන එම ගුරු හා විදුහල්පති නිවාස අළුත්වැඩියා කර විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් වෙත ලබා දීම හෝ අවශ්‍ය නොවන නිවාස කඩා ඉවත්කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

වත්කම්වලින් ලැබිය යුතු ආදායම්

කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විස්කම් පියස ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යන ප්‍රදර්ශනාගාර කඩ කාමර 42 කින් 2016 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව අයවිය යුතු එකතුව රු.මිලියන 1.7 ක් වූ කුලී ආදායම් හිඟ හිටව පැවතුණු අතර එම කඩ කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

2016 ඔක්තෝබර් මාසයේ ගිවිසුම් අත්සන් කර තිබුණු උතුරු මැද පළාතේ පාසල් 03 කට අයත් ගොඩනැගිලි 05 ක ඉදිකිරීම් කටයුතු 2017 අප්‍රේල් 04 දිනට පෙර අවසන් කළයුතුව තිබුණු නමුත් 2022 ජූලි 31 දින වන විටද එම ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. එම නිසා එකී ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් ගෙවා තිබුණු රු.මිලියන 27.2 ක මුදලක් අවුරුදු 05 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

පළාතේ කාබනික ආහාර නිෂ්පාදනය ඉහළ නන්වමින් රැකියා අවස්ථා උත්පාදනය සහ විෂ රසායනික සංඝටක වලින් තොර ආහාර පාරිභෝගිකයන්ට ලබාදෙමින් නිරෝගිමත්, සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහි කිරීම අරමුණු කරගෙන ඉහළ ගුණත්වයෙන් යුතු කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රෝද දෙකේ (02) ට්‍රැක්ටරයට සවිකළ හැකි යන්ත්‍ර 21 ක් රු. 682,500 බැගින්ද, රෝද හතරේ (04) ට්‍රැක්ටරයට සවිකළ හැකි යන්ත්‍ර 90 ක් රු.710,000 ක් බැගින්ද මිලට ගැනීමට රු.මිලියන 77.6 ක් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. එසේ වුවත් යන්ත්‍ර 06 ක් කාබනික පොහොර නිෂ්පාදනයට යොදා ගෙන නොතිබුණු අතර එක් යන්ත්‍රයක් තමන්ගේ වගාවන්ට අවශ්‍ය කාබනික පොහොර පමණක් නිෂ්පාදනය සඳහා යොදවා තිබුණි. එසේම පොහොරවල ප්‍රමිතිය පරීක්ෂාකර ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා යන්ත්‍ර 02 කින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අලෙවි කර ගැනීමට නොහැකි වී තිබුණු බව යන්ත්‍ර 11 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ අතර නිපදවනු ලබන කාබනික පොහොර සඳහා ස්ථාවර මිලක් නොතිබීමත්, ඒවා මිලට ගැනීමට සහ ගොවීන් වෙත බෙදා හැරීමට ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් පිළියෙල කර

නොතිබීමත් හේතුවෙන් එකී පොහොර අදාළ ප්‍රතිලාභීන් විසින් ගබඩාකර තිබුණි.

අපේක්ෂිත නිමවුම් (output) ලබානොගැනීම

- 2021 වර්ෂයේ දී අධීක්ෂණය කිරීමට සැලසුම් සකස් කර තිබුණු කැකිරාව හා කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයන්හි පාසල් 140 කින් පාසල් 27 ක පමණක් අධීක්ෂණ කටයුතු සිදුකර තිබුණු අතර එහි ප්‍රගතිය සියයට 19 ක මට්ටමක පැවතුණි.

- 2021 වර්ෂයේ තඹුත්තේගම, කැකිරාව හා කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයන්හි සමාලෝචනයට භාජනය කර තිබුණු පාසල් 41 කින්, පාසල් 38 කම ගුණාත්මක දර්ශක අගය සියයට 70 ට වඩා අඩු මට්ටමක පැවතුණි.

අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම

විකල්ප බලශක්ති වැඩ සටහන යටතේ 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී උතුරු මැද පළාතේ තෝරාගත් පොදු ස්ථානවල සහ සංචාරක ආකාර්ශනීය ස්ථානවල එකතු වටිනාකම රු.මිලියන 41.8 ක් වූ සූර්ය වීථි ලාම්පු 646 ක් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සවි කර තිබුණි. ප්‍රධාන අමාත්‍යාංශය විසින් මෙම සූර්ය වීථි ලාම්පු 646 පළාත් පාලන ආයතන වෙත බාර දී තිබුණු නමුත් පළාත් පාලන ආයතන විසින් ඒවා නිසි පරිදි නඩත්තු කරන බව, නියමිත ප්‍රමිතියෙන් යුතුව ක්‍රියත්මක වන බව, ඒවායේ භෞතික පැවැත්ම සහ ආරක්ෂාව පිළිබඳව පසුවිපරම් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් වීථි ලාම්පු සවිකර නොතිබීම, සවිකිරීමෙන් පසුව ගලවා ඉවත් කිරීම, අක්‍රිය වීම, සොරුන් විසින් ගැලවීම්, වන සතුන් විසින් හානි කිරීම සහ වාහන අනතුරුවලින් හානී වීම යනා දී හේතූන් නිසා සූර්ය වීථි ලාම්පු 128 ක් භාවිතයේ නොතිබුණු අතර ඒ සඳහා දරන ලද රු.මිලියන 9.2 ක වියදම නිශ්කාර්ය වී තිබුණි.

වයඹ පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- හිඟ ආදායම්
- මෙහෙයුම් අකාර්යක්ෂමතා
- අපේක්ෂිත නිමවුම් (Out put) ලබා නොගැනීම
- කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
- කළමනාකරණ අකාර්යක්ෂමතා
- මතභේදයට තුඩුදෙන ගණුදෙනු

වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රු.මිලියන 38,726 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 6,370 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 45,096 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. 2021 වර්ෂයේ දී පුනරාවර්තන හා මූලධන වියදම් ලෙස පිළිවෙලින් රු.මිලියන 40,424 ක් හා රු.මිලියන 4,672 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 45,096 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 35,385 ක් ද අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 6,791 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 42,176 ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්ථන වියදම රු.මිලියන 36,945 ක් හා මූලධන වියදම රු.මිලියන 1,859 ක් වශයෙන් රු.මිලියන 38,804 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සමස්ථ ආදායමෙන් සියයට 4 ක් පමණක් මූලධන වියදම් සඳහා වෙන් කර තිබීම හේතුවෙන් පළාත් සභාවේ සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වැය කිරීම ඉතා අඩු මට්ටමක පැවතුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 4 කදී පළාත් සභාව විසින් රැස්කළ ආදායම හා උපයෝජනය පිළිබඳ විස්තර රූපසටහන 69 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම	30,918	40,227	38,999	38,278	45,096
තථ්‍ය ආදායම	36,863	32,669	34,791	38,675	42,176
ඇස්තමේන්තුගත වියදම	41,889	40,227	38,999	38,277	45,096
තථ්‍ය වියදම	35,456	32,944	35,818	36,474	38,804

රූප සටහන 69 - වයඹ පළාත් සභාවේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - වයඹ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2017 -2021

වයඹ පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කළ කාර්යභාරයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

හිඟ ආදායම්

ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 07 ක් සඳහා අයකර ගත යුතු රු.මිලියන 266.7 ක් වූ ආදායම හිඟ හිටිව පැවතුණි. ඉන් රු.මිලියන 143.5 ක් වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි.

මෙහෙයුම් අකාර්යක්ෂමතා

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රු.මිලියන 12.9 ක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ රු.මිලියන 7.4 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 20.3 ක ගුණාත්මක තත්ත්වයෙන් අසමත් ඖෂධ පැවති අතර, 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ රු.මිලියන 29.3 ක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ රු.මිලියන 4.6 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 33.9 ක ඖෂධ කල් ඉකුත් වී තිබුණි.

අපේක්ෂිත නිමවුම් (Out put) ලබා නොගැනීම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, විවිධාංගීකරණය කිරීම, ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ අරමුදල් සම්පාදනය මත වයඹ පළාත් සභාවට, 2020 හා 2021 වර්ෂ සඳහා පිළිවෙලින් රු.මිලියන 45 ක් සහ රු.මිලියන 230 ක් ප්‍රතිපාදන ලැබී තිබුණි.

- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන් සඳහා 2019 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන සපයා තිබුණද, ලෝක බැංකු ප්‍රතිපාදන මඟින් අක්මුදල් ලැබී තිබුණේ 2020 වර්ෂයේ සිටය. නමුත් 2019 වර්ෂයේ උක්ත ව්‍යපෘතිය සඳහා අක්මුදල් ලබාදීමක් සිදු නොවුනද, සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) සඳහා වාර්ෂික ගිණුම් සාරාංශ මඟින්, 2019 වර්ෂයේදී වැය විෂය අංක 210-86-04-2001(WB) වන ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා රු.මිලියන 0.5 ක්ද, වැය විෂය අංක 210-86-04-2401(WB) වන කාර්ය මණ්ඩල පුහුණු සඳහා රු.මිලියන 12.7 ක්ද, වැය විෂය අංක 210-86-04-2509(WB) වන වෙනත් සඳහා රු.මිලියන 0.4 ක්ද වශයෙන් මුළු වටිනාකම රු.මිලියන 13.6 ක් වියදම් දරා තිබුණි. ඒ අනුව නිශ්චිත සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ලබාදෙන අක්මුදල් ඊට අනුරූප වියදම් දැරීම සඳහා පමණක් භාවිතා කළ යුතු වුවත්, ලෝක

බැංකු ආධාර යටතේ අරමුදල් සපයා නොතිබියදී වෙනත් ප්‍රභවයන්ට අදාළ වියදම් දැරීම සඳහා ලබාදුන් අත්මුදල් ඊට අනුරූප නොවන කාර්යයන් සඳහා වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

- 2019 වර්ෂයේදී 210-86-4-2401 වැය විෂයට හර කර තිබුණු රු.මිලියන 12.6 ක කාර්ය මණ්ඩල පුහුණු වියදම, 2019 වර්ෂයේදී බඳවාගන්නා ලද නවක ගුරුවරුන් සඳහා හමුදා පුහුණු මධ්‍යස්ථානවලදී සිදු කළ සේවාරම්භක පුහුණු කටයුතු සඳහා වෙනත් පාර්ශවයක් වෙත සිදු කළ ගෙවීම් බව නිරීක්ෂණය විය. අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා අත්මුදල් ලැබී තිබුණේ 2020 වර්ෂයේ සිටය. ඒ අනුව 2019 වර්ෂයේ බඳවාගන්නා ලද නවක ගුරුවරු සඳහා වූ පුහුණුව මෙම ව්‍යාපෘතිය සඳහා වූ පුහුණුව හා සම්බන්ධ සැලැසුම්වල පැවති බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. 2019 වර්ෂයේදී ආණ්ඩුකාරවරයාගේ නියෝග මත වෙනත් අරමුණක් මුදුන් පමුණුවා ගැනීම සඳහා නවක ගුරුවරුන් සඳහා වූ පුහුණුව සිදුකර, පසුව එය 2020 වර්ෂයේ සැලැස්මට ඇතුළත් කිරීම තුළින්, මෙම වියදම සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටන සඳහා සැලසුම් නොකළ වියදමක් බව පැහැදිලි වන අතර පසුව එම වියදම දැරීමට වෙනත් ක්‍රමවේදයක් නොමැති වීම නිසා උක්ත ව්‍යපෘතියේ වියපැහැදම් දර්ශක වලට යොමු ගත කරමින් ව්‍යාපෘතියේ වියදමක් ලෙස කපාහැර තිබුණි.

- අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියෙහි මූලික අරමුණ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන මට්ටම්වල සිසුන් අතර ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ ඩිජිටල් ඉගෙනීම වැඩිදියුණු කිරීම වන අතර එය මනා ලෙස වටහා නොගැනීම මත පළාතේ අධ්‍යාපන ආයතනයන්හි ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන 26.2 ක් ද, 2021 වර්ෂයේදී රු.මිලියන 49.7 ක්ද වියදම් කර තිබුණි. එය උක්ත වර්ෂයන්හි මුළු වියදමෙන් පිළිවෙලින් සියයට 83 ක් සහ සියයට 43 ක් විය.

වයඹ පළාත් සමුපකාර අමාත්‍යාංශය යටතේ උච්චමනි ධීවර ගම්මානයේ නිවාස 135 ක් සහ ධීවර තොටුපලවල් 10 ක් සඳහා 2018 දෙසැම්බර් 21 දින රු.මිලියන 12.2 මුදලක් වැය කර සූර්යබල විදුලිකෝෂ කට්ටල ලබා දී තිබුණද 2022 ජනවාරි 20 දින ඒ සම්බන්ධව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී එම සූර්යබල විදුලිකෝෂ පද්ධතිය මුළුමනින්ම අක්‍රීය තත්ත්වයේ පැවැති අතර මුළු ව්‍යාපෘතියම අසාර්ථක වී තිබුණි.

- කොන්ත්‍රාත්කරුට රඳවුම් මුදල් ආපසු ගෙවීමේදී වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නියමිත පරිපාටියට අනුව සකස් කළ යුතු කාර්මික නිලධාරි වාර්තාවක් නොමැතිව ප්‍රතිලාභී නිවාස 100 ක් හා තොටුපලවල් 10 ක් සඳහා සහ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින්ගේ පසු විපරම් වාර්තාවක් මත නිවාස 35 ක් සඳහා එකතුව නිවාස 135 ක් සහ තොටුපලවල් 10 ක් සඳහා

සම්පූර්ණයෙන්ම අසාර්ථක වූ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 1.2 ක මුදලක් රැඳවුම් මුදල් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.

- සූර්බල විදුලිකෝෂ පද්ධතියට අදාළ උපාංගවල වගකීම් කාලසීමාව වසර 01 ක් වශයෙන් සටහන් කර සැපයීම් කරන ලද ආයතනය විසින් වගකීම් සහතිකය නිවැස්හිමියන්ට සහ එහි අනුපිටපතක් වයඹ පළාත් සමුපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලි බල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර තිබූ පිරිවිතරයන්ට අනුව වගකීම් කාලය පිළිවෙලින් බැටරියට අවම වශයෙන් වසර 02 ක් ද, Solar Panel සඳහා වසර 10 සිට වසර 20 දක්වාද, LED Lamp සඳහා අවමය වසර 02 ක්ද වශයෙන් අනුමත කර තිබුණු අතර එම වගකීම් කාල සීමාව තුළ හෝ අක්‍රිය වූ කිසිදු උපාංගයක් නැවත මාරුකර දීමට සැපයුම් කරන ලද ආයතනය විසින් කටයුතු කර නොතිබුණ අතර ඒ සම්බන්ධයෙන් විධිමත් ලෙස මැදිහත් වීමට අමාත්‍යාංශය පැහැර හැර තිබුණි.

කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

වයඹ ජනකලා කේන්ද්‍රය නැවත සංවර්ධනය කිරීමේදී උපදේශාත්මක සේවා ලබාගැනීම සඳහා උපදේශක ආයතනයක් සමඟ 2016 අගෝස්තු 24 දින ප්‍රධාන අමාත්‍යාංශය ගිවිසගැනීම සිදුකර තිබුණි. එම ආයතනය විසින් ගිවිසුමේ කාර්යයන් අනුව සැලසුම් සකස් කිරීම, කොන්ත්‍රාත් ලියවිලි සකස් කිරීම හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2016 නොවැම්බර් 27 දින වන විට සිදුකර ඉදිකිරීම් අවසන් කිරීම 2017 නොවැම්බර් 27 දින වන විට සිදුකළ යුතු වුවත්, 2018 වර්ෂයේ සැප්තැම්බර් දක්වා සැලසුම්පත් ලබාදීම ප්‍රමාදවීම මත ඉදිකිරීම් අවසන් කිරීමට 2019 ජූලි 23 දින දක්වා කාලය ගතවීම මත මිල වැඩිවීම් ලෙස රු.මිලියන 3.6 ක් හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකිවීමේ අලාභය රු.මිලියන 4.9 ක් වශයෙන් රජයට දැරීමට සිදුවූ මුළු අලාභය රු.මිලියන 8.5 ක් විය.

තවද, උපදේශාත්මක ආයතනය විසින් සකස් කළ BOQ වල සඳහන් වැඩ අයිතම වලින් රු.මිලියන 38.7 ක් පමණක් ඉටුකර රු.මිලියන 100.6 ක් අමතර වැඩ ලෙස එකතුව රු.139.1 ක වියදමක් දරා එම ව්‍යාපෘතිය අදියර 1 ලෙස නම් කර අවසන් කර තිබුණද ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිමවී නොතිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

ප්‍රධාන අමාත්‍යාංශය යටතේ වයඹ පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල ගොඩනැංවීම සඳහා අභ්‍යාස පොත් බෙදා දීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ පාසල් දරුවන්ට සහනදායී මිලට අභ්‍යාස පොත් බෙදාදීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- අලෙවි කිරීම සඳහා රු.මිලියන 33.3 ක් වටිනා අභ්‍යාස පොත් අධ්‍යාපන කාර්යාල, පාසල් හා විවිධ ආයතන වෙත ලබාදී තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට

එම පොත් අලෙවිය වෙනුවෙන් ලැබී තිබුණු මුදල රු.මිලියන 18.7 ක් පමණක් විය. ඒ අනුව රු.මිලියන 14.6 ක් එනම් බෙදාහැර තිබුණු පොත්වල වටිනාකමින් සියයට 44 ක මුදල් හිඟව පැවතුණි.

- පොත් අලෙවි කිරීමෙන් උපයා ගන්නා ලාභය අධ්‍යාපන සංවර්ධන අරමුදලට බැර කිරීම සහ ඒ තුළින් අධ්‍යාපනය සඳහා ආර්ථික අපහසුතා ඇති දරුවන්ට සහන සැලසීම අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණක් වුවත්, 2021 වර්ෂය තුළදී දරුවන්ට සහන සලසා නොතිබුණු බැවින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපෘතිය සමත්වී නොමැති බව නිරීක්ෂණය විය.

පළාත් ආයෝජන වැඩසටහන සඳහා අන්තර්ජාලය පදනම් කරගත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2017 ඔක්තෝබර් 23 දින පළාත් සැලසුම් හා මෙහෙයුම් අංශය වෙත ලැබී තිබුණු රු.මිලියන 5.6 ක ප්‍රතිපාදන මුදලින් ව්‍යාපෘතියේ වැඩ 2019 මාර්තු 31 දින වන විට අවසන් කළ යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය නිම නොවී 2020 වසරේ පැවති නිමවුම් තත්ත්වයේම පැවති බව නිරීක්ෂණය විය. 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 3.8 ක් වියදම් දරා තිබුණද 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා වියදම් දරා නොතිබුණු අතර වසර 04 කට අධික කාලයක් ගතවී ඇතත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොමැතිව රු.මිලියන 1.8 ක් ඉතිරිව තිබුණි.

වයඹ පළාත් සභා අරමුදල් රුපියල් මිලියන 25 ක් වැය කර නිමකළ පම්බල අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 2016 වසරේ ආරම්භ කර ඇති අතර එහි දේශන ශාලාවේ කටයුතු අවසන් කර වෙන්නප්පුව ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණයෙන් යුතුව 2019 වසරේ දී කොන්ත්‍රාත් සමාගම විසින් හලාවත කලාප අධ්‍යාපන කාර්යාලය වෙත භාර දී තිබුණි. අධ්‍යාපන සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ආසන 200ක ධාරිතාවක් පැවතිය ද ගොඩනැගිල්ල භාරදුන් 2019 වසරේ ආරම්භයේ සිට 2021 වසරේ අවසානය දක්වා වසර 03 ක පමණ කාල පරිච්ඡේදය තුළ වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු ලේඛණය අනුව සැසි භාරකරුගේ අත්සනින් යුතුව 90ක පිරිසකගේ සහභාගිත්වයෙන් 2021 මාර්තු මස දී එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි.

මතභේදයට තුඩුදෙන ගණුදෙනු

වයඹ පළාත තුළ අසරණ හා අත්හළ ළමුන් ශාරීරික මානසික හා සදාචාරාත්මක වශයෙන් සංවර්ධනය, සුභසාධනය හා රැකවරණය යන අරමුණු ඉටුකරවා ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සහ සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී තිරසාර සංවර්ධනය අභිමතාර්ථ වෙත ප්‍රමුඛතාවය ලබා දී තිබුණි. මෙහි SDG 04 යටතේ පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම යටතේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 3.9

ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මුදල් රෙගුලාසි **137(5)** ප්‍රකාරව ගෙවීම් අනුමත කිරීමේදී, භාණ්ඩ පරීක්ෂාකොට භාරගෙන තිබෙන බවට හා **138(8)** ප්‍රකාරව වවුචරය නිවැරදිව සහ, සෑම විස්තරයක් අතින්ම සම්පූර්ණ බව ගණන් දීමේ නිලධාරි වගකිව යුතු වුවද භාණ්ඩ නියමාකාරයෙන් ලැබී ඇති බව හා වවුචරය මතුපිට භාණ්ඩ තොග පොතට ඇතුළත් කළ බව සාවද්‍ය ලෙස දක්වා තිබීයදී රු.මිලියන **3.9** ක මුදලක් වවුචර් අංක **372** හා **373** මඟින් ගෙවා තිබුණි. පළාත් මූල්‍ය රීති **164** (ආ) ප්‍රකාරව එම භාණ්ඩ ලැබුණු බවට තොග පොත් වලට ගෙන තිබුණද සත්‍ය වශයෙන්ම භාණ්ඩ **2022** මැයි **27** දින වන විටත් ලැබී නොමැති බැවින් ඉහත අරමුණුද ඉටුවී නොතිබුණි.

සබරගමුව පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- හිඟ හිටි ආදායම
- අමාත්‍ය මණ්ඩල තීරණවලට පටහැනිව කටයුතු කිරීම
- අරමුදල් ඌණ උපයෝජනය
- අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්
- අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම
- නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා රු. මිලියන 36,991 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු. මිලියන 3,200 ක් ද, වශයෙන් එකතුව රු. මිලියන 40,191 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2021 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 33,408 ක් ද මූලධන වියදම් වශයෙන් රු.මිලියන 6,783 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 40,191 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 33,191 ක් ද අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 3,059 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 36,250 ක ආදායම් උපයා තිබූ අතර, ඒ තුළ ඇතුළත් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම රු.මිලියන 128 ක් විය. 2021 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු. මිලියන 31,411 ක් හා මූලධන වියදම රු.මිලියන 2,604 ක් වශයෙන් රු. මිලියන 34,015 ක් උපයෝජනය කර තිබූ අතර, ඒ තුළ ඇතුළත් 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම රු.මිලියන 742 ක් විය.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර රූපසටහන 70 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම	25,709	29,636	32,683	34,083	40,191
තථ්‍ය ආදායම	27,821	27,774	30,622	31,836	36,250
ඇස්තමේන්තුගත වියදම	25,709	29,636	32,683	34,083	40,191
තථ්‍ය වියදම	28,931	26,062	30,071	32,039	34,015

රූපසටහන 70 - සමාලෝචිත වර්ෂයේදි හා ඉකුත් වර්ෂ 4 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම
මූලාශ්‍රය - සබරගමුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන - 2017 - 2021

සබරගමුව පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

හිඟ හිටි ආදායම

- ඉඩම් කොමසාරිස්ගේ අංක 96/5 හා 1996 අගෝස්තු 01 දිනැති චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික බදු මුදල් යම් වර්ෂයක ජනවාරි 01 දින හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 න් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 39.92 ක් වූ වාර්ෂික බදු මුදල් සහ රු.මිලියන 8.67 ක් වූ දඩ මුදල් ද යාවත්කාලීනව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, එම චක්‍රලේඛයේ 7 (i) ඡේදය ප්‍රකාරව බදු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවල ඉඩමේ සන්තකය ආපසු ගැනීමට පියවරගත යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම, උක්ත චක්‍රලේඛයේ 6.11 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළ රු.මිලියන 10.09 ක් හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 කට අදාළ එකතුව රු.මිලියන 5.74 ක් වූ හිඟ දීර්ඝකාලීන බදු මුදල් යාවත්කාලීනව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

අමාත්‍ය මණ්ඩල තීරණවලට පටහැනිව කටයුතු කිරීම

අංක අමප/21/1596/304/134 හා 2021 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද, මුදල් අමාත්‍යවරයාගේ 2021 අගෝස්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 02 (vi) ඡේදය අනුව මූලධන සංවර්ධන වැඩසටහන් යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන භාවිතයෙන් සිදුකරනු ලබන විවිධ ද්‍රව්‍ය භාණ්ඩ හා උපකරණ බෙදා දීම් සමාලෝචනය කර ඒවා අත්හිටුවීමට යෝජනා කර තිබුණි. එසේ තිබිය දී “සංවර්ධන සහයන්” වැය විස්තරය යටතේ දෙවන පරිපූරක මුදල් ප්‍රකාශය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර, එමගින් රු. මිලියන 11.6 ක් වැයකර ස්වේච්ඡා සංවිධානවලට බෙදා දීම සඳහා භාණ්ඩ හා උපකරණ මිල දී ගෙන තිබුණි.

අරමුදල් ඌණ උපයෝජනය

පිරිසිදු එළකිරි නිෂ්පාදනය කිරීම සහ කිරි සැකසුම් මධ්‍යස්ථාන ඇති කිරීම හා නවීකරණ කටයුතු කිරීමේ වැඩසටහන් යටතේ රඹුක්කන, දැරණියගල හා බලංගොඩ පශු වෛද්‍ය කොට්ඨාශ වල ක්‍රියාත්මක කිරීමට පශු සම්පත්, ගොවිපල සංවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත කර තිබූ එකතුව රු.මිලියන 1.32 ක් වූ ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්

සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොර

වගා සඳහා උචිත ලෙස ප්‍රමිතිගතව සංවර්ධනයට අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යාංශය වෙත පරිපූරක මුදල් ප්‍රකාශයක් මඟින් රු.මිලියන 100 ක් අනුමත කර තිබුණි. ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 9.5 ක් වැයකර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට අදාළ නොවන නොදිරන කසල කළමනාකරණය සඳහා අවශ්‍ය උපකරණ 10 ක් මිල දී ගෙන තිබුණි. තවද පළාත් පාලන ආයතන 10 කට එම යන්ත්‍ර ලබා දී තිබුණ ද තෙකලා විදුලි සම්බන්ධතාවය නොතිබීම හේතුවෙන් 2022 ජූලි 10 දින තෙක්ම එම යන්ත්‍ර උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

2017 සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 6.38 ක් වැයකර ඉදිකර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති 05 ක් නිවැරදිව අවශ්‍යතා හඳුනාගෙන විධිමත් සැලසුමකට අනුව ඉදි නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද අදාළ ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

පළාත් සංචාරක කර්මාන්තයේ වර්ධනය උදෙසා පළාත හරහා ගමන් ගන්නා දේශීය හා විදේශීය සංචාරකයින්ට පහසුකම් සහිත ස්ථානයක් ඇතිකිරීමේ අරමුණින් රත්නපුර කොළඹ ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව නාමල්දෙණිය සංචාරක ගිමන්හල 2005 වර්ෂයේදී ඉදිකර තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉදිකර තිබූ මෙම ගොඩනැගිල්ල සඳහා පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2004 වර්ෂයේ සිට 2021 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ එකතුව රු. මිලියන 12.64 ක වියදමක් දරා තිබුණද 2021 වර්ෂය අවසානය වන විට වසර 05 ක් පමණක් විවෘතව පැවති අතර වසර 12 ක්ම මෙම ගොඩනැගිල්ල කිසිදු කාර්යයක් සඳහා භාවිතයට නොගෙන වසා දමා තිබුණි.

ඌව පළාත් සභාව

විගණන නිරීක්ෂණ

- මතභේදයට තුඩුදෙන ගනුදෙනු
- අවිධිමත් ගෙවීම්
- හඳුනාගන්නා ලද පාඩු / අනාර්ථික ගණුදෙනු

ඌව පළාත් සභාව

ඌව පළාත් සභාව විසින් 2021 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 30,683 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එයින් රු. මිලියන 28,984 ක් රජයේ ප්‍රධාන මගින් ලබා ගැනීමට හා රු. මිලියන 1,699 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස් කිරීමටද, ඇස්තමේන්තුකර තිබුණි. එසේ රැස් කළ ආදායමෙන් රු. මිලියන 28,176 ක් පුනරාවර්තන වියදම් සඳහාද රු. මිලියන 4,885 ක් මූලධන වියදම් සඳහාද වැය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රධාන මගින් රු. මිලියන 28,806 ක් ලැබී තිබුණු අතර රු. මිලියන 1,663 අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. එසේ රැස් කළ ආදායමෙන් පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 26,867 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 3,146 ක් වැයකර තිබුණි. ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක් සමඟ සසඳා රූපසටහන 71 හි දැක්වේ.



	2017	2018	2019	2020	2021
ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන	22,261	23,887	26,732	27,607	30,683
තථ්‍ය ආදායම රු.මිලියන	22,944	22,761	28,202	27,507	30,469
ඇස්තමේන්තුගත වියදම රු.මිලියන	22,333	23,887	24,926	27,607	33,061
තථ්‍ය වියදම රු.මිලියන	23,460	23,244	25,134	27,014	30,013

රූපසටහන 71 : ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම හා වියදම

මූලාශ්‍රය - ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන

ඌව පළාත් සභාවට අදාළව 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

මතභේදයට තුඩුදෙන ගනුදෙනු

- 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 හා 2006 නොවැම්බර් 10 දිනැති අංක 6/2006(ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 2006 ජනවාරි 01 දින සිට රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සිදු කිරීමේදී අදාළ නිලධාරීන් පත්කරනු ලැබූ තනතුරට නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවිය යුතුය. එහෙත් 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඌව පළාත් සභාව විසින් බඳවා ගන්නා ලද පාසල් පුස්තකාල සේවක, පාසල් රසායනාගාර සේවක හා පාසල් මුරකරු තනතුරු 778 ක් සඳහා III ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවීම වෙනුවට II ශ්‍රේණියට බඳවාගෙන එම ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා 2006 නොවැම්බර් මස සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා මූලික වැටුප් ලෙස රු. මිලියන 132.8 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ඔක්තෝබර් 18 සහ 2018 දෙසැම්බර් 14 දිනැති ලිපි මගින් ලබාදුන් අනුමැතිය අනුව ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසැල් වල අනධ්‍යන ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සංඛ්‍යාව 2466 නොඉක්මවිය යුතු වුවද, කලාප අධ්‍යාපන කාර්යාල 10 ක් ඉදිරිපත් කර ඇති කාර්යය මණ්ඩල තොරතුරු අනුව 2020 වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට තත්‍ය කාර්යයමණ්ඩලය 2596 ක් වූයෙන් කාර්යමණ්ඩලයේ 130 දෙනෙකු අනුමැතිය ලබානොගෙන බඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

- ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් වල අනධ්‍යයන ප්‍රාථමික ශිල්පීය නොවන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 9.4 ඡේදය අනුව පාසල් පුස්තකාල සේවක, පාසල් රසායනාගාර සේවක හා පාසල් මුරකරු තනතුරු සඳහා බඳවා ගැනීමේදී ඇති වන පුරප්පාඩු මත දැනට සේවයේ නියුතු පාසල් සාමාන්‍ය කම්කරු, පාසල් උද්‍යාන කම්කරු, පාසල් කෘෂිකර්ම කම්කරු හා පාසල් සනීපාරක්ෂක කම්කරු යන සේවකයන් අතරින් සුදුසුකම්ලත් අයගෙන් සියයට 60 ක් ද, සෘජු බඳවා ගැනීම් ලෙසට සියයට 40 ක් ද වශයෙන් අනධ්‍යයන ශිල්පීය නොවන කාර්ය මණ්ඩලයට බඳවාගත යුතුය. එහෙත් එම විධිවිධාන වලට අනුකූල නොවනසේ 2006-2017 කාලය තුළ ඉහත දැක්වෙන අභ්‍යන්තර සේවකයින්ගෙන් බඳවාගත යුතු සේවකයින් 466 දෙනෙකු අනධ්‍යයන ශිල්පීය නොවන කාර්ය මණ්ඩලයට බඳවා නොගෙන එම ප්‍රමාණයද සෘජු පදනම මත බඳවාගෙන තිබුණි.

අවිධිමත් ගෙවීම්

- 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු පළාත් සභාවේ සභාපති තනතුර නාමික තනතුරක් වී තිබියදී සහ පළාත් සභාව සතුව වාහන තිබියදී සභාපතිවරයා හට සුදුසු වාහන ලබාදී වියදම් අවම කිරීම වෙනුවට, මාසිකව ප්‍රවාහන දීමනාවක් ගෙවීමට කටයුතු කිරීම නිසා 2019 ඔක්තෝබර් 08 දින සිට මෙම වාර්තාව නිකුත් කරන දින දක්වා දක්වා මුළු කාල සීමාව තුළ රු.මිලියන 16.3 ක් ප්‍රවාහන දීමනාවක් වශයෙන් ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද සභාපතිවරයා එකී කාලය තුළ පළාත් සභාව වෙත පැමිණීමක් හෝ ඔහු විසින් සිදුකරන ලද රාජකාරි කටයුත්තක් ද නිරීක්ෂණය නොවිණි.

- "රාජ්‍ය වියදම් කළමනාකරණය" යන ශීර්ෂය යටතේ අංක PS/CSA/11-18 හා 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 4.1 ඡේදය මගින් ආණ්ඩුකාරතුමා වෙත මාසිකව උපරිම ඉන්ධන ප්‍රමාණයට අදාළ දීමනාවක් ලබාදී තිබියදී, එකී චක්‍රලේඛයට මුළුමනින්ම පටහැනිව 2020 සැප්තැම්බර් මස සිට 2022 පෙබරවාරි මස අවසානය දක්වා අතිරේක ඉන්ධන ලෙස ඉන්ධන ලීටර් 7895.25 ක් වෙනුවෙන් රු. මිලියන 1.04 ක් ගෙවීම් කර තිබූ අතර ඒ ආකාරයටම ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම් වෙත ද එක් චක්‍රලේඛයට පටහැනිව මාසිකව ගෙවනු ලබන ඉන්ධන දීමනාවට අමතරව අතිරේක ඉන්ධන ලීටර් 3,924 ක් වෙනුවෙන් රු. මිලියන 0.5 ක් ගෙවීම් කර තිබුණි. තවද එක් එක් මාසයේ මුල් දින කිහිපය තුළ මිලදීගෙන තිබූ ඉන්ධන වලට අදාළ බිල්පත් අතිරේක ඉන්ධන මිලදී ගැනීම් ලෙස කිසිසේත් සැලකිය නොහැකි නමුදු එවැනි බිල්පත් සඳහා ද අතිරේක ඉන්ධන ලබා ගැනීම ලෙස දක්වා ගෙවීම් කර තිබූ අතර ආණ්ඩුකාරතුමාට සහ ඔහුගේ සම්බන්ධීකරණ ලේකම් වෙත ඉන්ධන දීමනා ලෙස ගෙවීම් කළ මුදලින් ලබාගත හැකි ඉන්ධන ප්‍රමාණයෙන්, ඔවුන් වෙත ලබාදී තිබුණු නිල වාහන වල සාමාන්‍ය ඉන්ධන පරිභෝජනය අනුව ලීටරයකට ධාවනය කළහැකි දුර ප්‍රමාණය ගණනය කළවිට ධාවනය කළ හැකි උපරිම දුර ප්‍රමාණය ධාවනය කිරීමක් හෝ සිදුකර නොතිබියදීත් විධිමත් ලෙස අධ්‍යයනය කිරීමෙන් තොරව අතිරේක ඉන්ධන මිලදී ගැනීම් ලෙස ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා ගෙවීම් කර තිබුණි.

- අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව පළාත් සභාව විසින් සිය කාර්යමණ්ඩලය වෙත ගෙවනු ලබන දීමනා තීරණය කිරීමෙන් වැළකිය යුතු බව දක්වා තිබුණ ද එයට පටහැනිව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය විසින් සංවිධානය කර තිබූ යුනිසෙෆ් ව්‍යාපෘති වල ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගිවීම වෙනුවෙන්

නිලධාරීන් සාමාන්‍ය රාජකාරී දිනවල සාමාන්‍ය රාජකාරී කාලය තුළ පැය 2 කට අඩු කාලයක් පැවති රැස්වීම් වලට රු.මිලියන 0.2 ක් දීමනා ගෙවීම් කර තිබුණි.

- අංක 03/2018 හා 2018 ජුලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2 ඡේදය මගින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව සිය ආයතන වල කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලබන දීමනා තීරණය කිරීමෙන් වැලකිය යුතු බව දන්වා තිබියදී ඌව පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 30 දෙනෙකුට 2017 අගෝස්තු සිට මෙම වාර්තාව නිකුත් කරන දින දක්වා ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 25 ක් වන පරිදි එකතුව රු. මිලියන 13.2 ක විශේෂ දීමනාවක් ගෙවීම් කර තිබුණි. මෙම මුදලින් රු. මිලියන 7.6 ක් පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු එනම් 2019 ඔක්තෝබර් 08 දින සිට 2022 ජුනි 30 දක්වා එකී කාර්ය මණ්ඩලයට කළයුතු රාජකාරි කටයුතු ද ප්‍රමාණවත් නොමැති කාලවකවානුවක ගෙවීම් කර තිබු අතර රටේ පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවතියේදී එම කාර්යාලයේ නිලධාරීන්ගෙන් සමහර නිලධාරීන් මසකට දින 4 ක් වැනි ඉතා සුළු දින ගණනක් පමණක් සේවය කර තිබියදී මූලික වැටුපෙන් සියයට 25 ක විශේෂ දීමනාවක් ගෙවීම් කර තිබුණි.

- 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 03(1) ඡේදය අනුව රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු සේවා කඩවීමක් සහිතව හෝ රහිතව කලින් දැරූ තනතුරේම නැවත සේවයේ යොදවනු ලබන විටක ඔහු රාජ්‍ය සේවයේ අවසන් වරට ලැබූ වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවිය හැකිය යන්නත් 04 ඡේදය අනුව “අවසන් වරට ලද වැටුප” යන්න නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ ලබමින් සිටින වැටුප වේ යන්නත් එයට අවසන් වැටුප් වර්ධක දිනයේ සිට විශ්‍රාම යන දිනය දක්වා වන වැටුප් වර්ධකයේ උපයාගත් කොටස් ඇතුළත් නොවන බවද දක්වා ඇත. එමෙන්ම චක්‍රලේඛයේ 5 වගන්තිය අනුව විශ්‍රාමික නිලධාරීන්ට ඔවුන් විශ්‍රාම ගන්නා අවස්ථාවේ ලද වැටුප පසු අවස්ථාවකදී සංශෝධනය වන්නේ නම් මිස චක්‍රලේඛයේ 12 වගන්තිය අනුව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කිසිදු නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමේ හැකියාවක් නොමැත. එසේ වුවද ඌව පළාත් සභාවේ විශ්‍රාම ගොස් නැවත සේවයේ පිහිටවූ නිලධාරීන් 14 දෙනෙකුට චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස රු. මිලියන 3.7 ක් ගෙවා තිබුණි.

- 6 වන ඌව පළාත් සභාවේ සිටි සියලු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරීන් 187 දෙනෙකුට ඔවුන්ගේ සේවය අවසන් කිරීම වෙනුවෙන්

ගෙවනු ලබන අවසාන ගෙවීමක් ලෙස දක්වා, එම නිලධාරීන්ට ලබාදුන් මාසික දීමනාවෙන් සියයට 12 ක් වන පරිදි හා ඔවුන් සේවය කළ මාස ගණනට අනුව රු.මිලියන 8.9 ක් පාරිතෝෂිත දීමනාවක් වශයෙන් ගෙවීම් කර තිබුණ ද එකී ගෙවීම 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 5 වගන්තියට අනුකූල නොවන ලෙස අවිධිමත්ව ගෙවීම් කර තිබුණි.

- අංක 21/1596/304/134 දරන හා 2021 අගෝස්තු 28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයේ දැක්වෙන 2.1 වගන්තිය මගින් නියමිත අනුමැතීන් යටතේ ප්‍රතිපාදන වෙන්වී තිබුණද, රජයට මුහුණ දීමට සිදුවී ඇති මූල්‍ය දුෂ්කරතාවය සැලකිල්ලට ගෙන දැනට ආරම්භකර නොමැති වැඩසටහන්, මිලදී ගැනීම්, ඉදිකිරීම්, ගොඩනැගිලි නවීකරණය හා වැඩිදියුණු කිරීම් ආදිය තාවකාලිකව අත්හිටුවීමට ක්‍රියා කරන ලෙසත්, එසේම ගිවිසුම්ගත වී නොමැති නම් එකී කටයුතු සඳහා ගිවිසුම්වලට එළඹීම නතර කරන ලෙසත් දැනුම් දී තිබියදී ඒ පිළිබඳ නොසලකා හරිමින් ඌව පළාත් සභාවේ ආයතන 26 ක් විසින් කාලීනව අත්‍යවශ්‍ය නොවන රු. මිලියන 248.3 ක් වටිනා උපකරණ මිලදී ගැනීම් සහ රු. මිලියන 867 ක් වටිනා ඉදිකිරීම් වලට එළඹ තිබුණි.

හඳුනාගන්නා ලද පාඩු / අනාර්ථික ගණුදෙනු

6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් බවට පත්වූ පළාත් සභාවේ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් 2019 ඔක්තෝබර් 08 දින සිට මෙම වාර්තාව නිකුත් කරන දින දක්වා ඌව පළාත් සභාවට කිසිඳු සේවයක් ලබා ගැනීමෙන් තොරව වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 18.20 ක් ගෙවා තිබුණු අතර අවම වශයෙන් ඔවුන්ගේ පැමිණීම, පිටවීම සටහන් කිරීම සඳහා ලේඛනයක් හෝ නඩත්තු කර නොතිබුණි.